# සංහිඳියාව සඳහා ලිවීම

## කෙටි කතා සහ කාව්‍යය සංග්‍රහයක්

සංස්කරණය

ශ්‍යාම් සෙල්වදොරේ

**Write to Reconcile**

කෘතියේ සිංහල අනුවාදය

2014 ජුනි

ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය
தேசிய சமாதானப் பேரவை
National Peace Council of Sri Lanka

NORWEGIAN EMBASSY

**සංහිඳියාව සඳහා ලිවීම**
කෙටිකතා සහ කාව්‍යය සංග්‍රහයක්

**සංස්කරණය :**
ශ්‍යාම් සෙල්වදොරේ

ISBN : 978-955-1274-66-5

පළමු මුද්‍රණය : 2014 ජුනි

සියලු හිමිකම් ඇවිරිණි
© ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය

**උපදේශකත්වය :**
ආචාර්ය ජෙහාන් පෙරේරා

**සම්බන්ධීකරණය :**
රසිකා සෙනෙවිරත්න

**ප්‍රකාශනය :**
ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය
12/14 පුරාණ විහාර පාර
කොළඹ 06
දුරකථන : 0112854127
ෆැක්ස් : 0112819064
ඊමේල් : info@peace-srilanka.org
වෙබ් : www.peace-srilanka.org

**මූල්‍ය අනුග්‍රහය :**
නෝර්වේජියානු තානාපති කාර්යාලය

**මුද්‍රණය :**
තරංජී ප්‍රින්ට්ස්,
506, හයිලෙවල් පාර, නාවින්න, මහරගම.
දුරකතනය : 0112804773

# පටුන


ආචාර්ය ජෙහාන් පෙරේරා *සිංහල පරිවර්තනය සඳහා හැඳින්වීම* 05

ශ්‍යාම් සෙල්වදොරෙ *ඉංග්‍රීසි මුල් පිටපත සඳහා හැඳින්වීම* 07

නයෝමි මුණවීර *නිවහන : නැවත ගෙදර පැමිනීම හා*
*නිහඬතාව විඳීම පිළිබඳ සිතිවිලිවලිය* 12

ශිලෝනි සුමන්දිරන් *කොඩිය* 26

නිකිණි ජයතුංග *පැපොල් ගස* 47

ශාන් දිසානායක *බලාපොරොත්තුව* 67

නුෂෙල් දි සිල්වා *මුරපොළ* 76

අම්ර්තාංජලී සිවපාලන් *පොළෝතලය මත* 92

ශයිලෙන්ද්‍රී වික්‍රම ආදිත්‍ය *අනාගතවාදී කතාවක්* 107

ශ්‍රෘති වඩුගේ *දහසක් සැමරුම්* 126

රාධිකා කාලිරාජා *කාව්‍යය* 143

නිෆ්රාස් රිෆාස් *ගෙදර වැඩ* 146

අයෝධ්‍යා අමරජීව *ඒ මගේ නිවස විය, ඔවුහු මගේ පවුල වූහ* 168

වසික උඩුරාවන *රණශූරයින් දෙදෙනෙක්* 178

ලාවන්‍යා පරමනාදන් *ළැදරියකගේ අරුණෝදය* 194

ශලිනි අබයසේකර *ආදරය උදෙසා* 208

සාම්බවී සිවාජී *මට වැඩි දවස් නැත* 241

වින්ධ්‍යා බුත්පිටිය *සුරංගනා කතා* 254

සර්මදා සන්තිරසේගරම් *කාව්‍යය* 268

අරිවර්සි මුතුලිංගම් *ඉවසා දරා ගැනීම* 273

සොනාලි වනිගබදුගේ *කාලිගේ බැල්ම* 286

පවන් කලුගල *මියගිය බිළිඳා* 307

කැනිස්ටා ආර්ති ඩෙනිසියස් *හෙළි නොවුන කථාවක්* 322

පැතුම් පුංචිහේවා *විස්මිත රහස්* 335

විදූජා රාජමෝහන් *මැළවෙන කැකුළු* 351

එලිසබෙත් අල්පොන්සස් *කාව්‍යය* 372

ස්තුතිය 375

# සිංහල පරිවර්තනය සඳහා හැඳින්වීම

ජාත්‍යන්තර සම්මානලාභි ගත් කතුවර ශ්‍යාම් සෙල්වදොරේ විසින් සංස්කරණය කරන ලද 'Write to Reconcile' කෘතිය සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් පරිවර්තනය කර සිංහල හා දෙමළ මාධ්‍යයෙන් නිර්මාණකරණයෙහි යෙදීමට අපේක්ෂා කරන සහ නැගී එන ලේඛකයින් උදෙසා ඉදිරිපත් කිරිමට හැකිවීම පිළිබඳව ජාතික සාම මණ්ඩලය ලෙස අපි සතුටු වෙමු. යුද්ධය අවසන් කිරිමෙන් පසුව උතුරෙහි සහ දකුණෙහි විවිධ ප්‍රදේශ ඔස්සේ ගමන් කිරීමට හා එහි වෙසෙන විවිධ ප්‍රජාවන්ට තම කටයුතු සිදු කරගැනීමට ඉඩකඩ පුළුල් වී ඇතත්, තවමත් එම විවිධ ප්‍රජාවන් අතර, විවිධ ජන කණ්ඩායම් ලෙස ගැටළු වලට මුල්විය හැකි තියුණු බෙදීමක් පවතියි.

ලේඛකයින් වීමට අපේක්ෂාවෙන් සිටි සිංහල හා දෙමළ තරුණ ලේඛකයින් පිරිසක් එකට ඒකරාශී කරගැනීම නිසා ශ්‍යාම් සෙලවදොරේ විසින් මූලිකත්වය ගෙන ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිදු කළ මූලික වැයම ඉතාමත් වැදගත් විය. එමගින් වෙනත් ප්‍රජාවක අය සමග එකට එක්වී කටයුතු කිරීමට නොහැකිවීම මත ඔවුන් තුළ ඇතිව තිබූ පටු මානසිකත්වය ජයගැනීමට ඔවුන්ට හැකි විය. දමිළ හා සිංහල මිශ්‍ර වාර්ගිකත්වයක් සහිත ලෝක ප්‍රසිද්ධ ලේඛකයෙකු මෙන්ම ගුරුවරයෙකු විසින් මෙහෙයවන ලද එකම මණ්ඩපයකදී, එක්ව කටයුතු කිරීම හරහා එකිනෙකාගේ දෘෂ්ඨිකෝණයන් අවබෝධ කරගැනීමටත්, සහානුභූතිය ලබාගැනීම සහ එකිනෙකාට අභියෝග කරගැනීමටත් හැකි විය.

මෙම කෘතිය සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් පර්වර්තනය කිරිමේ ව්‍යාපෘතිය හරහා, පුළුල් ප්‍රජාවක් ලෙස සංහිඳියාව ගොඩනැංවීම සඳහා ඇති අවශ්‍යතාවය ආමන්ත්‍රණය කිරීමට ද ජාතික සාම මණ්ඩලය අදහස් කරයි. පුස්තකාල, රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා පාදක සංවිධාන, ආගමික ආයතන හා ප්‍රජා මධ්‍යස්ථාන වැනි මූලික පොදු අධ්‍යාපන ආයතන හරහා පුළුල් ප්‍රජාවකට මෙම සිංහල හා දෙමළ පරිවර්තන නොමිලයේ බෙදා හරිනු ලබයි. මෙම පරිවර්තන කාර්යයට අවශ්‍ය මූල්‍ය ආධාර ලබාදීම සම්බන්ධයෙන් රාජකීය නෝර්වීජියානු තානාපති කාර්යාලයට අපගේ ස්තුතිය පුද කිරිමට කැමැත්තෙමු. එසේම මෙම පොත පරිවර්තනය කිරීමේ

කාර්යයෙහි සිට මුද්‍රණය කිරීම දක්වා වූ සියලුම කාර්යයන්හිදී ආයතනික හා බාහිර වශයෙන් සහසම්බන්ධ වූ සියල්ලන්ටම අපගේ ස්තුතිය පිරිනමනු කැමැත්තෙමු.

අභ්‍යන්තර යුද්ධය ආරම්භ වී දශකයක් පමණ ඉක්මවා ගොස් තිබූ අවස්ථාවක, සාකච්ඡාමය දේශපාලන විසඳුමක් ප්‍රවර්ධනය කිරීම උදෙසා, අපක්ෂපාතී රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස 1995 දි ජාතික සාම මණ්ඩලය ආරම්භ කරන ලද අතර, එතැන් පටන් මේ දක්වා අන්තර් වාර්ගික සාමය ගොඩ නැංවීම පෙරදැරිව විවිධ විෂයයන් ඔස්සේ ප්‍රජාව දැනුවත් කිරීම, ඒ වෙනුවෙන් හඬක් නැගීම හා ප්‍රජා කණ්ඩායම් පෙළ ගැස්වීම කෙරෙහි අපගේ අවධානය යොමු විය.

ආචාර්ය ජෙහාන් පෙරේරා
විධායක අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය

# හැඳින්වීම

'සංහිඳියාව සඳහා ලිවීම' යනු කුමක් පිළිබඳවද සහ සාක්‍ෂාත් කරගෙන ඇත්තේ කුමක් ද යන්න පිළිබඳව පාඨකයාට ලබාගතහැකි හොඳම අවබෝධය වනුයේ, එයට සහභාගි වූ විසි තුන් දෙනාගේ නිර්මාණ කියැවීම බැවින්, මෙම හැඳින්වීම සංක්ෂිප්තය.

පශ්චාත් යුද ශ්‍රී ලංකාවේ සිත් තැවුල් සුවපත් කිරීමට සහ සංවාද සඳහා පහසුකම් සැපයීම උදෙසා දායක වන්නට සාහිත්‍යයට හැකි බවට මගේ ඇති විශ්වාසය තුළින් බිහිවූ 'සංහිඳියාව සඳහා ලිවීම' නිර්මාණාත්මක ලිවීමේ ව්‍යාපෘතියකි. ආචාර සම්පන්න, ඉවසිලිමත් සහ ප්‍රජාතන්ත්‍රවාදි ජන සමාජයක් වර්ධනය කිරීමේ දී සහ පවත්වාගෙන යාමේ දී ප්‍රබන්ධ, කාව්‍ය සහ සම්පූර්ණයෙන් ප්‍රබන්ධිත නොවන සාහිත්‍ය නිර්මාණ වලට, දීර්ඝ සහ වැදගත් ඉතිහාසයක් පවතියි. සාහිත්‍ය, එය කියවන්නාට ඔවුන්ගේම නොවන විවිධ දෘෂ්ටිකෝණයන් සේම දේශපාලනික සහ සංස්කෘතික ධර්මතාවයන්ට සම්ප්‍රවේශ වීමට ඉඩ ලබා දෙයි. හොඳ නිර්මාණශීලී ලිවීම, සහානුභූතියක් ඇතිකිරීමද, පර්යාලෝකය සහ ඉවසිලිමත් බව පුළුල් කිරීම සිදු කරයි. ශ්‍රී ලංකාව තුළ, නිර්මාණාත්මක ලිවීම එහි නොයෙක් ජන කොටස් අතර පාලම් තනන්නට අවස්ථාවක් නිර්මාණය කර දෙයි. යුද වකවානුවේ දී පැවති හා අවාසනාවකට පශ්චාත් යුද සමයේ දී ද නොකඩවා පවතින එකිනෙකට විරුද්ධ කණ්ඩායම් වශයෙන් තියුණු ලෙස බෙදී සිටීමේ තත්ත්වය නිසා, එක් එක් ජන කොටස් විසින් ගැටුම් පිළිබඳ ඔවුන්ගේම ස්ථිර කතන්දරයක් සමග පැමිණ ඇති අතර, ඒ තුළ ඔවුන් නිතරම වින්දිතයින් ලෙස ස්ථාන ගතකොට තිබේ. මෙම ස්ථිර කතන්දර කළු සහ සුදු බවෙන් යුක්ත වෙයි. මේරට විවිධ ජන සමාජයන් අතර පැවති විශ්වාස කළ නොහැකි සංකලනයන් සහ සම්මිශ්‍රණයන් සඳහා ඔවුන් විසින් ඉඩක් තබා නැත; බාහිර සංස්කෘතින්, විවිධ යටත් විජිත පාලනයන්, අපගේ වෙරළෙහි නෞකා නවතා තිබූ අරාබි වෙළෙඳුන් ද අප කව්රුන්ද යන්නට හැඩයක් ලබාදුන්නේය සහ අර්ථ දැක්වූයේ ය යන කාරණාවටද ඔවුන් ඉඩක් තබා නැත; ඔවුන් ආත්ම විභාගයට ඉඩක් තබා ද නැත.

සරලවම මානව වර්ගයා ලෙස අපගේ ක්‍රියාවන් සහ ප්‍රතික්‍රියාවන් අවුල් සහගත සහ දෝෂ සහිත නිසා, ප්‍රබන්ධ, කාව්‍ය සහ සම්පූර්ණයෙන් ප්‍රබන්ධිත නොවන සාහිත්‍ය නිර්මාණ ඉතා හොඳින් රචනාකොට ඇති විටෙක, ඒවා ස්වභාවයෙන්ම මිනිසාගේ අන්තර් ක්‍රියාකාරීත්වයේ සහ මිනිස් ජීවිතයේ අඳුරු පැති ගවේෂණය කිරීමට කැපවී තිබේ. අප කළු සහ සුදු වශයෙන් පවතින්නේ නැත. අභිප්‍රායයන්ගේ සහ අන්තර්ක්‍රියාවන්ගේ සියුම්වූ වෙනස්කම් සහ ගොහොරු සහිත බව හොඳ නිර්මාණශීලී රචනාවකින් නිරූපනය කරන නිසා, අද වන විට ශ්‍රී ලංකාවේ වෙන්ව සිටින ජන සමාජයන් අතර පරස්පර තාවයන් යාකිරීමට සහ සහානුභූතිය වර්ධනය කිරීමට අවශ්‍ය වන්නේද එයයි.

2012 අවසන් භාගයේදී, වයස අවුරුදු 18-29 ත් අතර අය සහ ඕනෑම වයසක ගුරුවරුන් හා මහාචාර්යවරුන් ඇතුළු සියලු ශ්‍රී ලාංකිකයින්ගෙන් මෙම නිර්මාණාත්මක ලිවීමේ ව්‍යාපෘතියෙහි කොටස්කරුවන් වීම සඳහා අයදුම් පත් ඉදිරිපත් කරන ලෙස ආරාධනා කරමින්, සංහිඳියාව සඳහා ලිවීමේ ව්‍යාපෘතිය විසින් දීප ව්‍යාප්ත ඉල්ලුම්පත් කැඳවීමක් සිදුකරන ලදී. සැලකර සිටීමේ සහ තෝරාගැනීමේ ක්‍රියාවලිය බරපතල විය: සහභාගී වීමට විභවතාවක් සහිත ඉල්ලුම්කරුවන්ට තමා විසින් කළ නිර්මාණ කාර්යයක කොටසක් සමග ඔවුන් යෝග්‍ය අපේක්ෂකයන් යැයි සිතන්නේ මන්ද යන්න පිළිබඳ පැහැදිලි කිරීමක් ද එවීමට සිදු විය. මෙම ව්‍යාපෘතිය පිළිවෙලින් කොළඹ සහ යාපනයේ දී පැවැති නිර්මාණාත්මක ලිවීම පිළිබඳ වැඩමුළු දෙකකින් සහ එක් එක් වැඩමුළුව අවසානයේ අන්තර්ජාලය (Online) ඔස්සේ සිදුකල විවෘත සංවාදයකින් ද සමන්විත විය. සම පහසුකම් සපයන්නිය ලෙස නයෝමි මුණවීරගේ සහාය ඇතිව මා විසින් පවත්වන ලද වැඩමුළු අතරතුර, නිර්මාණාත්මක ලේඛනයේ මෙවලම් සහ ශිල්පක්‍රම, සහ ප්‍රබන්ධ වල සිට නිබන්ධ, විවිධාකාර කාව්‍යමය හැඩතල දක්වා සියලු දේ ආවරණය කරමින් සහභාගි වූ අයට මා ඉගැන්වූයෙමි. ගැටුම්, සාමය, සංහිඳියාව, කම්පනය සහ මතකය සම්බන්ධ ගැටළු සමග ගනුදෙනු කිරීම සඳහා නිර්මාණ බිහිකිරීමට විශේෂයෙන් සැලසුම් කරන ලද, පන්ති කාමරය තුළ සිදුකල ක්‍රියාකාරකම් හරහා සහභාගි වූවන් විසින් නිර්මාණාත්මක ලේඛන කොටස් ජනනය කරන ලදී. සහභාගි වූවන් විසින් සංස්කරණය පිළිබඳ මෙවලම් හා ශිල්පීය ක්‍රම ද ඉගෙන ගන්නා ලදී.

අපප විසින් නිරාකරණය කරගැනීමට උත්සාහ ගනිමින් තිබෙන ගැටළු සමග ගනු දෙනු කරන ලද, ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තර වශයෙන් යන දෙකෙහිම අනෙකුත් කලාවන් ගේ සංධර්භය තුළ සිට සහභාගි වන්නන්හට ඔවුන්ගේ නිර්මාණ දෙස බැලීම වැදගත් යැයි මට හැඟී ගියේය. එසේ හෙයින්, පලස්තීනය, චිලී, සියෙරා ලියොන් වැනි ලෝකයේ අනෙකුත් කරදර සහිත ස්ථාන වලින් ගෙන ආ චිත්‍රපට තිරගත කිරීමේ සංධ්‍යාවන් ද තිබිණි. මෙම ගැටළු හා සම්බන්ධ නිර්මාණ කටයුතු කළ දේශීය කලා කරුවන් ද පැමිණියහ. තවදුරටත්, අපි විනෝද චාරිකා දෙකක් සංවිධානය කළෙමු. පළමුවැන්න, ශ්‍රී ලංකාවේ පැරණි සංස්කෘතිය, කලාවේ සහ ගෘහ නිර්මාණ ශිල්පයේ නූතනත්වය සමග අන්තර් ඡේදනය වී ඇත්තේ කෙසේ ද යන්න ඉස්මතු කොට පෙන්වීම අරමුණු කොට ගනිමින් කොළඹ සිදුකල සංස්කෘතික සංචාරයයි. දෙවනුව, උතුරෙහි ඉතිහාසය සහ යුද්ධය විසින් එහි ජනතාවට ගෙනැවිත් ඇති විනාශය කේන්ද්‍ර කොටගත් යාපනය සංචාරයයි.

අන්තර්ජාලය (Online) ඔස්සේ සිදුකල විවෘත සංවාදය දෙක සඳහා, එක් සංවාදයකට එක් නිර්මාණයක් බැගින් සාකච්ඡාව සඳහා ඉදිරිපත් කරන ලදී. මගේ අධීක්ෂණය යටතේ එකිනෙකාගේ නිර්මාණ සඳහා සහභාගි වූවන් විසින් ප්‍රයෝජනවත් ප්‍රතිචාර ලබා දෙන ලදී. සංවාද දෙක අවසානයේදී, එක් එක් සහභාගී වූවන් ඔවුන්ගේ නිර්මාණ දෙකෙන් එක් නිර්මාණයක් ප්‍රකාශණය සඳහා තෝරාගත් අතර, මෙම කෙටිකතා හා කාව්‍ය සංග්‍රහයට තෝරාගත් නිර්මාණය සූදානම් කිරීම සඳහා එක් එක් අයවලුන් සමග මා කටයුතු කළෙමි.

මෙම කෙටිකතා හා කාව්‍ය සංග්‍රහයේ නිර්මාණවලින් සහභාගි වූවන්ගේ විවිධාකාර පසුබිම් සහ අත්දැකීම් මෙන්ම ඔවුන්ගේම දෘෂ්ටිකෝණයන් ගෙන් පරිබාහිර වූ වෙනස් දෘෂ්ටියකින් ලිවීමට දැක්වූ කැපවීම ද පෙන්නුම් කරයි එනම් දෙමළ සිසුන් සිංහල චරිතයන්ගේ දෘෂ්ටිකෝණයෙන්ද, සිංහල සිසුන් දෙමළ චරිතයන්ගේ දෘෂ්ටිකෝණයෙන්ද ලිවීම පිළිබිඹු කරයි. මෙම පරිකල්පනිකව 'අනෙකා' තුළ ජීවත් වීම මෙම කෙටිකතා හා කාව්‍ය සංග්‍රහයේ ඇති වඩාත් දිරිමත් කරවන ලක්ෂණයන්ගෙන් එකකි. මෙම කෙටිකතා හා කාව්‍ය සංග්‍රහයේ බහුවිධ අත්දැකීම් ග්‍රහනය කොටගෙන තිබුණද, සියලුම අත්දැකීම් මෙහි නියෝජනය කරන්නේ නැත. දකුණ සහ නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශවලින් අයදුම්පත් ගෙන්වා

ගැනීමට අප මහත්සේ උත්සාහ කළ ද සුදුසු අපේක්ෂකයින් අයදුම්කර තිබුණේ නැත. එබැවින්, මෙම ගද්‍ය සහ පද්‍ය සංග්‍රහයෙහි, රටෙහි එම ප්‍රදේශවල ජනතාවගේ අත්දැකීම් නියෝජනය නොකරයි. මීළඟ සංහිඳියාව සඳහා ලිවීමේ දී මෙම අසමතුලිතතාව සමනය කිරීමට මෙන්ම ශ්‍රී ලාංකික ඩයස්පෝරාවේ හඬ ද ගෙන ඒමට අපි අපේක්ෂා කරමු.

මම විවිධ විශ්ව විද්‍යාලවලදී නිර්මාණාත්මක ලේඛනය පිළිබඳව උගන්වන අතර, මගෙන් නිතර අසන ප්‍රශ්නයක් වන්නේ ශිෂ්‍යයින්ගේ නිර්මාණ යම් ආකාරයකින් මගේම නිර්මාණ උසස් කරවීමට බලපාන්නේද යන්නයි. සෑම විටම මගේ පිළිතුර වන්නේ 'නැත' යන්නයි. මෙය 'සංහිඳියාව සඳහා ලිවීම' අත්දකින තුරු පමණයි. මේ ව්‍යාපෘතියේ වැඩ කිරීම සහ සහභාගි වූවන් සමග වූ අන්තර් ක්‍රියාකාරිත්වය දහවල් සහ රාත්‍රී කෑම මේසයේදී ඔවුන්ගේ කතා ඇසීමෙන්, ඔවුන්ගේ සාකච්ඡාවලට සවන් දීමෙන් ශ්‍රී ලාංකිකයකු වීමේ අරුත කුමක්ද යන්නෙහි මගේ අවබෝධය පුළුල් කළේය. අද ශ්‍රී ලංකාවේ අප මුහුණ දෙන ප්‍රශ්න පිළිබඳ ඔවුන්ගේ පරිකල්පනික අර්ථ විවරණයන්, ලංකාව ගැන ලිවීමට නවමු සහ සිත්ගන්නා සුළු ප්‍රවේශයන් යෝජනා කිරීම මගින් මගේ නිර්මාණශීලිත්වය පුළුල් කොට තිබේ. මෙම ගද්‍ය සහ පද්‍ය සංග්‍රහය කියවනවිට ඔබගේද දෘෂ්ටිය පුළුල් වනු ඇතැයි මම අපේක්ෂා කරමි.

අවසාන වශයෙන්, අපගේ අනුග්‍රාහකයින් වන රාජකීය නෝර්වේජියානු තානාපති කාර්යාලයට සහ ඇමෙරිකානු මධ්‍යස්ථානයටද, අපගේ ව්‍යාපෘතියට නිවහනක් සපයා දුන් ජාතික සාම මණ්ඩලයටද මගේ කෘතඥතාව පුද කරමි. ඔවුන්ගේ උත්සාහය තුළින් මෙම ව්‍යාපෘතිය සාර්ථක එකක් බවට පත් කල, මා සමග මෙම කටයුත්තෙහි නිරත වූ අපූරු කණ්ඩායමටද මම අතිශයින් කෘතඥ වෙමි.

සමස්ථයක් වශයෙන් ගත් විට මෙම කෙටිකතා සහ කාව්‍යය සංග්‍රහයෙහි අකාරාදියක් නැත. කෙසේවෙතත්, සමහර සහභාගී වූවන්, ඔවුන්ගේ එක් එක් නිර්මාණයට අකාරාදියක් අන්තර්ගත කොට තිබුණි.

ශ්‍යාම් සෙල්වදොරේ

# සංහිඳියාව සඳහා ලිවීම

Write to Reconcile කෙටිකතා සහ කාව්‍යය සංග්‍රහය පරිවර්තනය කිරීමේදි එම නිර්මාණකරුවන්ගේ අත්දැකීම් හා මනෝභාවයන් සමග ආත්මීය වශයෙන් සම්බන්ධ වීමේ වාසනාව මට ලැබිණි. සැබවින්ම තිස් අවුරුද්දක යුද සමය හා ඉන් පසුව එළැඹුණු පශ්චාත් යුද සමය පිළිබඳ ඔවුන්ගේ නිර්මාණාත්මක අදහස් එකලස් කරගන්නට දරා ඇති උත්සාහය පිළිබඳව සතුටු විය හැකිය. මෙම නිර්මාණකරුවන්ගේ අනේකවිධ අත්දැකීම් ඉදිරි මග පෙන්වන පහන්ටැඹක් වන්නේ නම් එය මෙම උත්සාහයෙහි අපේක්ෂිත ප්‍රතිඵලය උදාකර දෙනු ඇත. යුද්ධය සම්බන්ධයෙන්ද, සාමය සම්බන්ධයෙන් මෙන්ම සංහිඳියාව සම්බන්ධයෙන්ද විවිධ මතිමතාන්තර එකිනෙකා තුළ තිබෙන්නට හැකි නමුදු ඔවුන් සියලු දෙනාගේ පොදු පරමාර්ථය වන්නේ හිංසාවෙන් තොර ජීවිතයක් බවද, අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුතු සාමකාමී සහජීවනයක් බවද මේ නිර්මාණ සංග්‍රහය ඉඟි කරයි. මෙම සියලු නිර්මාණකරුවන් අඩු වැඩි වශයෙන් සිය ප්‍රතිභාව විදහා මනාව දක්වා ඇති අතර නයෝමි මුණවීරගේ හැඳින්වීමේ සටහනින් පවා නිර්මාණාත්මක ප්‍රතිභාව විදහා පෙන්වයි.

පරිවර්තකගෙන් අදහසක්

# නිවහන : නැවත ගෙදර පැමිණීම හා නිහඬතාව විඳීම පිළිබඳ සිතිවිලිවලිය

*නයෝමි මුණවීර*

දශකයක පමණ කාලයක් රටින් බැහැරව සිට, මා උපන් රට වන ශ්‍රී ලංකාවට 2013 මුල් භාගයේදී මම ආපසු පැමිණියෙමි. මා රටින් බැහැරව සිටින්නට බොහෝ කරුණු කාරණා තිබුණු නමුදු, දෛවයේ සොඳුරු සිදුවීම් මාලාවක ප්‍රතිඵලයක් වශයෙන්, මගේ ප්‍රථම නවකතාව වූ Island of a Thousand Mirrors එළිදැක්වීම සඳහා ආපසු පැමිණියෙමි. දෙවියන්ගේ තවත් ක්‍රියාවක් මගින් Write to Reconcile සමාරම්භක වසරෙහි දී ශ්‍යාම් සෙල්වදොරෙයි සමග සම සමායෝජක වශයෙන් මම සිහින කාර්යයකට අවතීර්ණ වූයෙමි. තරුණ ලේඛකයෙකුට, ශ්‍යාම්ගේ නම ම ගෞරවයකි. වසර ගණනාවකට පෙර, Funny Boy කියවීමෙන් සහ පසුව Cinnamon Gardens කියවීමට සැලැස්වීමෙන්, මා සහ මා වැනි මිනිසුන් දැකීමටත්, අපගේ උච්චාරණ සහිත, මගේ පවුල වැනි පවුල් ඔහුගේ පොත් පිටුවල, ඔහුගේ වගන්ති අතරෙහි දැකීමෙන් මිල කළ නොහැකි ත්‍යාගයක් ඔහු මට ප්‍රදානය කළේය. අපගේ කතා ද වැදගත්ය යන අදහසින් කුඩා තැන්වලින් පැමිණෙන පාඨකයින් අප ප්‍රමුදිත කරවන මෙය, දුර්ලභ ගණයේ නැවත පැමිණීමකි. සැබවින්ම දශක ගණනාවකට පෙර ශ්‍යාම්, මයිකල් ඔන්ඩච්චි සහ අනෙකුත් අය පැල කළ ශක්‍යතාවෙහි බීජ මත පය පැකිළෙමින් ගමන් කරන විට, මම ද සැබවින්ම මගේ පන්හිඳෙන් වචනයක් ලියන්නට දිරිය උපදවා ගතිමි. ඉදින්, Write to Reconcile ගොඩනගනු ලබන ශ්‍යාම් සහ විසිතුන් දෙනෙකුගෙන් යුතු නොහඳුනන තරුණ පිරිසක් සමග දෙසතියක් වැඩ කිරීමට මා එකඟ වූයේ මහත් සොම්නසිනි.

ඕනෑම සංක්‍රමණිකයෙකු කිව හැකි පරිද්දෙන්, ආපසු පැමිණීම යනු සංකීර්ණ දෙයකි. රට අතහැර ගිය අයෙකුගේ අයිතිය සහ උන්හිටි තැන් පිළිබඳ ප්‍රශ්න හැම විටම තැතිගන්වන සුළුය. ආපසු පැමිණෙන සුවිශේෂ ස්ථානය දශක තුනක් පමණ වන සිවිල් යුද්ධයකට මුහුණ දී තිබෙන කල්හි ඒ ප්‍රශ්න වඩාත් බරපතල වෙයි. නිවහන යනු කුමක්ද? එය තිබෙන්නේ කොහිද? කෙනෙකුට සැබවින්ම ආපසු පැමිණිය හැකිද? මේ සියලු ප්‍රශ්න මගේ ගමන් මල්ලට අසුරා මම කාල කලාප තරණය කොට පෘථිවියේ අනෙක් කොනට ගියෙමි.

කොළඹ එතරම් වෙනස් වී නැත, අප්‍රමාණ සිද්ධස්ථාන වටා යනෙන රථ ගමනාගමනය, උත්කර්ශවත් ලාස් වේගාස් රැස් කදම්භවලින් යුතු බුද්ධ රූප, ලේ ගලන ක්‍රිස්තූන්, කෝවිල්වල අහස උසට නගින දේව රූප යනාදී සියල්ල සිහිපත් කර දුන්නේ මෙම ස්ථානයෙහි, මෙකී සමගාමී ඇදහිලි තිබීම හැම විටම විශාල ශක්තියක් වන්නා සේම විශාලම තර්ජනයක්ද වන බවයි.

මම විශාල වෙනස්කම් අපේක්ෂා කළෙමි. මා තෝන්තු වනු ඇතැයි හැමදෙනාම කීහ. එහෙත් කොළඹ සිට දකුණුබඩ වෙරළ දක්වා දිවෙන නව අධිවේගී මාර්ගය, අපගේ පෙර තිබූ නිසංසල පටු මගෙහි සැදී ඇති බද්ධ නිවාස (Apartment) සංකීර්ණ, විනාඩි පහළොවෙන් පහළොවට අප නවතන ගැටවර සොල්දාදුවන් අඩුවීම, හැරුණු කොට මගේ මතකයේ තිබූ ආකාරයටම නගරය එලෙසින්ම තිබෙන්නේ සමහර විට මෙහි තිබෙන පැරණි දේවලින් අලුත් දේ වැසී යන බව මට පසක් කර දෙමිනි.

ජීවිතයේදී මෙන්ම, ප්‍රබන්ධයේදී ද මට ඉතාමත්ම වැදගත් වන නිවසකට කොළඹ දී, මම පැමිණෙමින් සිටියෙමි. Isalnd of a Thousand Mirrors හි, පළමු කොටස්වල ප්‍රමුඛව දක්වෙන පැරණි, ධවල නිවස එය වූයේය. කෘතිය ප්‍රබන්ධයක් වූවද, කොළඹ නිවසක් ගැන මා සිතන විට මා උපකල්පනය කොටගත් විශේෂිත ස්ථානය එය වූයේය. මෙම නිවස වෛරයෙන් පෙළුණු වෛවාරන්න පවුල් වලින් බෙදාගත් හා පාලනය කළ ස්ථානයක් වූ අතර, ද්‍රවිඩයන් උඩුමහලෙහි ද, සිංහලයන් පහත මාලයේ ද වාසය කළහ, නිවස වියවුල් වූ ජාතියක විස්තීර්ණ වූ රූපකයක් ලෙස නැගී සිටියේය.

මගේ පවුල දශක ගණනාවක් මුහුද අසල මේ ඉඩමෙහි වාසය කළේය. මා තුළ සිටින ඇමෙරිකානුවාට මෙය පෞද්ගලික ඉතිහාසයේ විස්මයජනක කොටසකි. අලුත ඉපදුනු බිළිඳෙක් ලෙස රෝහලේ සිට මා මෙහි රැගෙන ආ දා සිට මට වයස අවුරුදු තුනේදී අප නයිජීරියාවට සංක්‍රමණය වන තුරු අපි මේ නිවසෙහි වාසය කළෙමු. අප්‍රිකාවේ සිට හෝ පසුව ඇමෙරිකාවේ සිට, අපගේ තාවකාලික නිවස ගොඩනගා ගත් හැම දුරබැහැර ස්ථානයක සිටම හැම වසරකම එක් මසක් අපි මේ නිවසට පැමිණියෙමු. මා දනසිටි මුල්ම සහ වඩා ස්ථිරසාර තැන එය විය. මගේ ඥාතී සහෝදරයින් සහ මම අපගේ නිවස සහ පිටත බිත්ති අතර

පටු ඉඩකඩෙහි තදබදව සිටින්නට උත්සාහ කළ මගේ ප්‍රියතම මතකයන් බිය සහ සතුට සමග මුවගට සිනා නංවයි. මගේ පුංචි සිරුර බිත්තියට සිරකොට දෑතින් බිත්ති අල්ලාගෙන, හදවත බියෙන් නතර වී තිබෙන විට, මට දැනුණේ නිවස මා අල්ලාගෙන සිටින බවයි. එය මේ නිවසට පමණක් විශේෂයෙන් දැනෙන දෙයකි. නිවසක් පිළිබඳ පළමු මතකය එයයි. නයිජීරියාවේ දී, අපි නගරයේ සිට ගමට යන විට, මම මෙම නිවස සිහිකොට ගෙන එහි ආධුනික, ළාමක බිම් සැලසුම් ඉතා අමාරුවෙන් ඇන්දෙමි. මේ මම, මගේ දෙමාපියන් සමග සිටි කාමරයයි. මේ ගින්ඩි නැන්දා ඇගේ බලය පතුරාගෙන සිටි තැනයි. මේ මගේ ළමා කළ මිතුරා කෝසල සහ ඔහුගේ පවුලේ උදවිය සිටි කාමරය යි, මා බාල කාලයේ මගේ සුවිශේෂ ඇල්මක් තිබූ විශාල කළු අතින් කරකවන දුරකතනය තැබූ පැති මේසය මෙතනය. හැම කාමරයක ම එහි වාසය කළ අයගේ නම් ප්‍රවේසමෙන් සඳහන් කරනු ලැබිණි. ඇඳීමේ සහ නම් කිරීමේ කාර්යය, පොළවෙහි මේ විශේෂිත බිම් කැබැල්ලෙහි හිමිකම මතකයේ තබාගැනීමට කරන ලද නිරන්තර උත්සාහයක් විය.

මගේ පවුල ශ්‍රී ලංකාව හැර ගියේ 1976 දී ය. අප පලා ගියේ ආර්ථික දුෂ්කරතා, පැමිණීමට තිබූ 'අර්බුදය' පිළිබඳ වර්ධනය වෙමින් පැවති සාක්ෂි සහ ඕනෑම කුඩා ස්ථානයකදී හැමවිටම ඇති විය හැකි අම්හිරි ග්‍රහණය නිසාය. දිවයිනට ආපසු පැමිණීමට පෙර වසර කිහිපයක් පිටමංව සිටිය යුතු යැයි මගේ දෙමාපියන් සිතූහ. උපරිම වශයෙන් අවුරුදු පහක් සිටින්නට ඔවුහු උපකල්පනය කළහ. කෙසේවුවද, 1980 ගණන්වල මුල් භාගයේ දී, එතැන් සිට, යුද්ධය ජාතියේ ඉරණම තීරණය කරනු ඇතැයි යන්න හොඳින් පැහැදිලි කළේය. නොපැහැදිලි සහ අවිනිශ්චිත අනාගතයෙහි, ආපසු පැමිණීම යනු නිරන්තරයෙන් කල් දමනු ලබන්නා වූ සංසිද්ධියකි.

1984දී, නයිජීරියාවේ පැවති දේශපාලන නොසන්සුන් බව හේතුකොට ගෙන, අපි තුන්වැනි සහ අවසාන මහාද්වීපය ලෙසින් ඇමෙරිකාවෙන් සරණාගත තත්ත්වය ලබා ගත්තෙමු. මේ කාලයේදී ම, කොළඹ නිවස දමිළ පවුලකට කුලියට දුන්නෙමු. ඔවුහු නිවස අත්පත් කරගත් අතර වසර ගණනාවක් අපට නිවසට ඇතුලු වීමට හෝ ඉඩ දුන්නේ නැත. අප වාර්ෂිකව පැමිණි අවස්ථාවල දී ත්‍යාගශීලී නැන්දලා

සහ මාමලා සමග අපි නතර වීමු. කොළඹ සිටි එක් පවුලක් හා නුවර සිටි තව පවුලක් ජුනි සහ ජූලි සම්පූර්ණ කාල පරාසය තුළ අපට ආගන්තුක සත්කාර කළහ. (වැඩිහිටියෙක් ලෙස පමණක් ඒ දීර්ඝ සංචාරයන් කෙරෙහි දැක්වූ ආගන්තුක සැලකීම මැන ගන්නට පුළුවන, ඒ අවස්ථාවන් පිළිබඳව මම සැබවින්ම ඔවුන්ට කෘතඥ වෙමි) 1980 මැද භාගයේදී පමණ දෙමළ පවුල නිවසට කුලී ගෙවීම නවතා දැමුවේය. අපි ඇමෙරිකාවේ නව සංක්‍රමණිකයන් වූ අතර අපට මුදල් අසීරුතා දැඩිව තිබිණි. කාමර දෙකක මහල් නිවාසයක සිටි අප එක් කාමරයක තිදෙනා බැගින් නිදාගත්තේ, මේ නුපුරුදු සහ පදිංචියට නුසුදුසු අමුතු ස්ථානය තේරුම් ගැනීමට අරගලයක යෙදෙමිනි. අයවීමට තිබූ පසුගිය කුලී මුදල් ගෙවන ලෙස ඉල්ලමින් මගේ මව මහ රැයේ ශ්‍රී ලංකාවට දුරකතන ඇමතුම් දෙනු මගේ මතකයේ ඇත. ඇගේ ළමා කල නිවහන අපට අහිමි විය, එහෙත් අපට කළ හැකි යමක් තිබුණේ නැත. රටෙහි ඇති වූ බියජනක තත්ත්වය හේතුකොට ගෙන රට අතහැර ගිය මිනිසුන් වූ බැවින්, දුරබැහැර පිහිටි හා ආපදාවට පත් දේශයේ සිදුවීම් ගැන අපට කළ හැකි දෙයක් නොවීය. සැබවින්ම අපට වරදකාරී හැඟීමක් ඇත, ඒ අනෙක් අය සිටියදී අප රට හැරයාමේ වරදකාරී හැඟීමයි. එමෙන්ම මට කියන්නට ලැජ්ජා හිතෙන තවත් කරුණක් නම් කෝපයක් ද ඇත. කෝප වන්නේ, එබඳු පවිත්‍ර වූත්, ජීවිතය හැඩගැස්වීමට බලපාන්නා වූත් පෙර ළමා වියේ මතකය ඔවුන් පැහැරගත් බැවිනි. නිවෙස්වලට වඩා වැඩි දේ එනම්, ජීවිත, ළමයින්, දෙමාපියන්, ජීවත්වීම උදෙසා වටිනා සියලු දේ අනෙකුත් අයට අහිමි වෙමින් තිබූ බව දැන සිටියදීත් නිවසක් අහිමිවීම ද සැබවින්ම අයත්ව තිබුණේ යැයි හැඟුණු අන් දෙයක් අහිමිවීම හා සමාන වූයේය.

මගේ ජීවිතකාලයේ දී සිදුවනු ඇතැයි මා බලාපොරොත්තු නොවූ සිදුවීම් දෙකක් තිබිණි. ඒවා හදිසියේ දිය කිඳුරියන් සොයාගැනීම සහ උඟරන්ට තටු ලැබී වළාකුළු අතරෙහි පියඹා යෑම වැනි මිථ්‍යාවන්ටද වඩා මිථ්‍යාවන් බව හැඟී ගියේය. පළමුවැන්න ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය අවසන් වනු ඇතය යන්නය, දෙවැන්න, අපි යම් දිනෙක අපගේ නිවසට පැමිණෙනු ඇතය යන්නය. හදිසියේම, ඒ දෙකම සිදු විය. 2009 වර්ෂයේදී, බලාපොරොත්තුවක් නොමැතිවම මිනිසුන් හැටපන්දහසකගේ ජීවිත විනාශ කළ, කොටින් සහ රජය අතර වූ විසිපස් වසරක මනුෂ්‍ය ඝාතන

යුද්ධය නිල වශයෙන් නිමාවට පත් විය. සිතූ පරිද්දෙන්ම මේ අහම්බයකින් මෙන් මේ දිවයිනට සාමය උදා විය.

යුද්ධය අවසාන වූ වර්ෂයේ දී, දශක තුනක් පමණ අපගේ නිවස අත්පත් කොට ගෙන සිටි දමිළ පවුල එය හැර ගියේය, නිවස නැවතත් අපට හිමිවිය. ඥාති සහෝදරයෙක් සමග කළ හදිසි කතාබහකින් දැනගන්නට ලැබුණේ දමිළ පවුල යාපනයේ අය වූ බවයි. යුද්ධය විසින් ඔවුන් ඔවුන්ගේ පාරම්පරික ඉඩම් හා නිවෙස්වලින් ඉවත්ව යන්නට බල කරනු ලැබ තිබිණි. ඔවුන් අපගේ නිවස අත්පත් කරගත්තේ කොටින් ඔවුන්ගේ නිවස අත්පත් කරගත් බැවිනි. ඔවුන්ගේ අවාසනාව අපගේ අවාසානාව බවට පත් විය.

ආපසු පැමිණීමට මට තවත් වසර තුනක් ගත විය. තිස්වසරකටත් වැඩි කලකට පෙර, මට වයස දහයේ දී මා අවසාන වරට නිවසින් යන විට තිබූ පරිද්දෙන්ම, මා නිවසට පයගහන විට සියල්ල එලෙසින්ම තිබුණේය. බිම් සැලසුම් ඇඳීමේ පුරුද්ද මවිසින් අතහැර දමනු ලැබ බොහෝ කල් ගත වී තිබුණු අතර, නිවසෙහි සැලැස්ම දැන් නොපැහැදිලි සහ මතකයේ අස්ථිර මීදුම අතරින් යථාර්ථයක් ලෙසින් මතු වූයේය. සැබෑ තැනක්, ස්ථානයක් ! නිවහනක් ? එහෙත් බොහෝ අර්බුද, ගැටළු තිබූ තැනක්. මම නැවතත් දමිළ පවුල ගැන කල්පනා කළෙමි. ඔවුන් මේ ස්ථානයට නිවස යැයි කීවේද? ඉඩම, නිවස, බාග විට පවුල යන ඔවුන්ගේම අවතැන්වීමේ ක්‍රියාවලියේ දී, ඔවුන් මෙහි පැමිණියේ තවත් කුමන කාරණා නිසාද යන්න කවුරු දනිත් ද? එසේ කිරීමෙන් ඔවුහු අපගේ ස්ථානය අත්පත් කරගත්හ.

මට මෙය පෙනෙන්නේ යුද්ධයේ සැඟවුණු බලපෑම් ලෙසිනි. කිසිවෙක් එයින් නිදහස් වන්නේ නැත. නිශ්චල පොකුණක් හරහා දිය රැළි නැගෙන්නාක් මෙන් බලපෑම් වැඩි වර්ධනය වෙයි.

මගේ පවුල සිටියේ ඒ බලපෑමෙන් බොහෝ අග කොටසේය. අනෙක් අයට සියල්ල අහිමි වන විට අපට සිදු වූයේ නිවසක් අහිමිවීම පමණකි. එහෙත් අප සියලු දෙනාට සිදු වූයේ කුමක්ද යන්න තේරුම් ගැනීමට උත්සාහ කිරීමේ දී, අහිමි වූයේ කුමක්ද යන්න අප සලකා බැලිය යුතුය. යුද්ධයේ මිල කොපමණ වූයේද? මට පෙනෙන ආකාරයට ඒ ලැයිස්තුවට: ජීවිතය, අනන්‍යතාව, ළමයි, ගෞරවය (තමාගේ සහ අන්‍යයන්ගේ), කන්‍යාභාවය (බොහෝ ආකාරයේ) ශාරීරික ඒකාබද්ධ බව,

නිවාස, අයිතිය, විවේකය, පාරම්පරික ගම් බිම්, අහිංසක කම, ස්ථිරසාර බව, ආදරය, නින්ද, විශ්වාසය, දෙමාපියන්, පවුල, උදාර බව, ආරක්ෂාව, මිත්‍රත්වය හා පූජනීයත්වය යන සියල්ල ඇතුළත් වෙයි.

මින් ඔබ්බට, මේ අහිමි වීමට මුහුණ දීමට අප කළ යුත්තේ කුමක්ද යන්න අප සිතා බැලිය යුතුය. එයින් ඔබ්බෙහි ජීවත් වීමට අප ඉගෙනගන්නේ කෙසේද? මා දැඩිව විශ්වාස කරන්නේ එසේ කිරීමට නම් අප, අපට හැකි හැම ආකාරයෙන්ම සිදු වූ දේ පිළිබඳව අදහස් හුවමාරු කරගත යුතු බවයඃ වචනය අභිනය, කලාව, නාට්‍යය හා ඉතා සුළු හැම ආකාරවලින්ම, පෙර ඇති වූ වේදනාවන් සමනය කිරීමේ හෘදයංගම ආම්පන්න ලෙස භාවිතා කළ යුතුය.

මේ අරුතින් බලන විට, Write to Reconcile, ලේඛිකාවක්, ගුරුවරියක් හා ශ්‍රී ලාංකිකයෙක් ලෙස වඩාත් වැදගත් මගේ ජීවන අත්දැකීම් වලින් එකක් වෙයි. ප්‍රථම වතාවට මම යුද්ධයේ කතා කියන මිනිසුන්ට, තරුණ ජනතාවට මුහුණ දුන්නෙමි. මෙය මිනිසුන් පහසුවෙන් හෝ නිතර කරන දෙයක් නොවේ. බොහෝ සන්දර්භයන්හි දී බිහිසුණු දේ නිසා සිතෙහි ඇති වන කම්පනය සාකච්ඡා නොකෙරේ. ශ්‍රී ලංකාවේ දී එය නිතරම තහංචි වන්නකි. ඇත්ත වශයෙන්ම, මගේ සංචාරයේ දී, සන්නද්ධ හමුදා මගෙන් ඇසූ ප්‍රශ්නය වූයේ, '2009 දී යුද්ධය අවසන්ව තිබියදීත් ! එය දැන් ඉවරයි. එය වළලා දමා තිබියදීත් ඔබ යුද්ධය ගැන ලියන්නේ ඇයි?' යන්නයි.

දශක ගණනාවක් දීර්ඝ වූ යුද්ධය අවසාන වී අවුරුදු හතරකට පසුව යුද්ධය මියගිය විෂයයක් සේ සැලකීම, 'ඉදිරියට යාම සඳහා' නිශ්ශබ්දව සිටීම සහ සාමූහික සමාව දීමක් අවශ්‍ය බව සිතීම හාස්‍යය උපදවන්නකි. මා සිතන ආකාරයට, සත්‍යය සහ හැඟීම් යටපත් කිරීම, පවුලක හෝ ජාතියක වේවා, පූර්ණ ක්‍රියාකාරිත්වය අක්‍රිය කිරීමට මඟ පාදන්නා වූ භයානක දෙයකි.

ජාතිය, ජනවාර්ගිකත්වය සහ ආගම ආදී වශයෙන් බෙදීම හේතුකොට ගෙන එක් එක් ප්‍රජාවන්ට අහිමි වූ දේ සහ ලැබුණු දේ තෙරුම් ගැනීම සඳහා මිනිසුන් කතාබහ කිරීම අවශ්‍ය බව මම විශ්වාස කරමි. එකිනෙකාගේ පොදු මනුෂ්‍යත්වය දැකීමට පෙර මෙය සිදුවිය යුතුය.

ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකාවේ දැනට මෝදු වෙමින් පවත්නා මුස්ලිම් විරෝධී වාචාල, මතිමතාන්තර දෙස බලන විට, නව 'සතුරෙකුට' එරෙහි එදිරිවාදිකම් වෙත නැඹුරුවීම සැබෑ තර්ජනයකි. යුද්ධයේ පාඩම් අප අමතක කර දමන්නේ නම්, අප සාමූහික අවසිහියකින් කටයුතු කිරීමට තීරණය කරන්නේ නම්, ජාතියේ අනාගතය තවදුරටත් මහා විනාශකාරී තත්ත්වයකට ඇද වැටෙනු ඇත.

Write to Reconcile වූ කලී කුඩා ප්‍රයත්නයකි, එහෙත් එය නිහඬතාව කරා යන නැඹුරුවට විරුද්ධව කෙරෙන බලසම්පන්න උත්සාහයකි. අපි නේවාසික වැඩමුළු දෙකක් පැවැත්වීමු, එකක් කොළඹ අගනුවරදී පැවැත් වූ අතර අනෙක ඉන් සති හයකට පසුව උතුරේ යාපනය නගරයේදී පැවැත්වීමු.

කොළඹ වැඩමුළුවෙහි පළමු දින කිහිපයෙන් එකකදී, මම යාපනයෙන් පැමිණි තරුණ කාන්තාවක ඉදිරියේ නතර වීමි. මගේ පෙළඹවීමෙන්, ඇගේ කවිය මට හඬනගා කියැවූවාය. මා එයට සූදානම්ව සිටියේ නැත. එය අහිමි වූ ළමා කාලයේ කතාවක් විය. යුද්ධය නොපැවති තැන්වල සිටි ළමයින්ට තිබුණු සෙල්ලම් බඩුවලට මම බලවත් ලෙස ආශා කළෙමි. බෝම්බවලින් බේරෙන්නට සිය පවුලේ අය සමග දිව යන අතරතුර, මළ සිරුරු දැකීම ඇයට මතකය. ඇගේ දෑසින් කඳුළු ගලා එනු මම දුටුවෙමි, මගේ හුස්ම හිරවෙනු දැනුනෙන්, මම පන්තියෙන් පිටතට ගොස් නාන කාමරයට ගියේ ඇය ඉදිරියේ නොහඬා සිටිනු පිණිසය. මා යුද්ධය ගැන ලියා ඇතත්, ඒ ගැන දීර්ඝ වශයෙන් පර්යේෂණ කර ඇතත්, මේ තරුණ කාන්තාව වැනි අනෙකුත් මිනිසුන්, සැබවින්ම සමස්ත පරම්පරාවන්ම ඔවුන්ගේ ජීවිත වල වැඩි කාලයක් එහි භය සංතාපය සමග ජීවත්ව ඇති බව, වඩාත් ගැඹුරු සිහිපත් කරදීමත් විය.

ඉන් අනතුරුව, වැඩ මුළු දෙක මුළුල්ලෙහිම, මම කතා ඇසීම සඳහා මගේ දෙසවන් හොඳින් විවර කොටගෙන සිටියෙමි. අන්තිමට ලේඛකයෙක් යනු අන් කෙනෙකුගේ කතාවක් ලියන අයෙකි. එමෙන්ම මේ සහභාගි වූවන්ගෙන් මා උපකල්පනය කළාටත් වැඩිමනක් දෙයක් මම ඉගෙන ගත්තෙමි.

යාපනය සරසවියේ ඉංග්‍රීසි සාහිත්‍ය පිළිබඳ මහාචාර්යවරියක ඇයගේ අට වසරක ස්ථිර පදිංචියක් නොමැති අවතැන් වීම සම්බන්ධ කතා පිළිබඳ අවධානය යොමු කරවූවාය.

'අපි තැනින් තැනට ගියා' ඇය කීවාය. 'අපි අපිට නිදාගන්න පුළුවන් ඕන තැනක නිදාගත්තා, බෝම්බවලින් බේරෙන්න අපි ගස් යටත් නිදාගත්තා.' මේ සියලු තත්ත්වයන් තිබියදී, සරසවිය විවෘතව තැබීමට ගත් උත්සාහයන්ද ඇය විස්තර කළාය. මුළු පීඨයම භාවිත කළ යතුරු ලියන යන්ත්‍රයෙන් විභාග ප්‍රශ්න පත්‍ර යතුරු ලියනය කළ ආකාරය ඇයට මතකය, යන්ත්‍රය තිබුණේ ගල් ගෙඩියක් මතය.

යුද්ධය නිමා වීමෙන් පසුව ඔවුහු නැවත යාපනයේ ඔවුන්ගේ නිවසට ගොස් එය නැවත ගොඩනැංවීය. වෙඩි උණ්ඩ වැදුණු, කැබලිව තිබූ ආකාරයෙන්ම ඉන් එක් බිත්තියක් ඇය ඉතිරිව තැබුවාය. 'ඔයා තරහින්ද?' වෙනත් සහභාගිවන්නෙක් ඇසුවේය. 'නෑ' ඇය කීවාය. 'එහෙම වෙන්නෙ කොහොමද? මගේ මුළු පවුලම හීරීමක්වත් නැතුව දිවි රැකගත්තා. අපි හුඟක් වාසනාවන්තයි' මේ බිත්තිය ඇය එලෙසින්ම තැබුවේ ආරක්ෂක යන්ත්‍රයක් වූ, ආශිර්වාදයක් වූ මේ වාසනාවේ මතකයක් ලෙසිනි. අප සමග එක් මුස්ලිම් තරුණයෙක් සිටි අතර, සියලු කඩ සාප්පු වලට ගිය විට ඔහුට ඇතිවන ඉච්ඡාභංගත්වය ගැන කතා කළේය. ඔහු පෙනෙන්නේ, සිංහලයෙකු මෙනි, එහෙත් ඔහුට ඔහුගේ නම කියූ වහාම, සාප්පුකාරයින් ඔහු සිංහල නොවන බව දැනගන්නා අතර, සැකය වර්ධනය වෙයි. 'දැන්, මම මගේ නම අසංග කියනවා. ඒක ලේසියි' ඔහු කියයි.

යොවුන් සම්මන්ත්‍රණයකට සහභාගි වීමේදී තමා ලැබූ අත්දැකීම් පිළිබඳව තරුණ ශිෂ්‍යාවක අපට කීවාය. සාම ක්‍රියාකාරීන් ඇගේ සම්බන්ධය පිළිබඳව ඇගෙන් ප්‍රශ්න කිරීම සඳහා මැදියම් රැයේදී මිනිස්සු ඇගේ දොරට තට්ටු කළහ. ඔවුන් සමාන්‍ය ඇඳුම් ඇඳ සිටි පොලිස් නිලධාරීහු වූ අතර, පැය ගණනකට පසුව ඔවුහු ඇය හැර ගියහ. එහෙත් ඒ කතාව අප වෙත ඉතිරි කළේ අමිහිරි තිත්ත රසයකි, එය රජයට ඇති බලය අපට සිහිපත් කර දුන් අතර ඒ ගැන ප්‍රශ්න කළ කෙනෙකුට ශාරීරික අන්තරායක් සිදුවීමේ ඇති හැකියාවද සිහිපත් කර දුන්නේය.

ඉදින් අපි යුද්ධය ගැන කතා කළෙමු. අපි අන් කුමක් කළෙමුද? අපි කෑවෙමු. බොහෝ ! පාතරසය, දිවා ආහාරය, රාත්‍රී ආහාරය, රාත්‍රී ආහාරය සහ තේ විවේක දෙකක්, රියෝ අයිස්ක්‍රීම් සහ මගේ ජීවිතයේ රස විඳි වඩා මධුර වූ උකු ෆලූඩා ගැන කිව යුතු නැත. මේ සියලු සප්පායම් අතරතුර, ශ්‍යාම් කථාවස්තුව, ව්‍යූහය, කථා වින්‍යාසය සහ කාව්‍යය පිළිබඳ ඔහුගේ ප්‍රඥාව සහභාගිවූවන් සමග බෙදාහදාගත්තේ, සහභාගිවූවන්ට ඔවුන්ගේ කතා කීමට අවශ්‍ය මෙවලම් සපයා දුන්නේය. ඔහු ලොව පුරා සිනමා නිර්මාණ ඔවුන්ට පෙන්වමින්, හැමදෙනාම ලිවීමට, ලිවීමට සහ ලිවීමට මෙහෙය වූයේය. අනතුරුව ඔහුගේ වචන අපගේ හිත්වල බමමින් තිබිණි, අපගේ ලියන අත් තදවී දරදඬු වී තිබිණි. අපි රාත්‍රී ආහාරය සඳහා ගියෙමු. බත් සහ ව්‍යංජන, පාන් සහ පොල් සම්බෝල, වඩේ සහ බිරියානි සහ වටලප්පම් කමින්, අපි එකිනෙකා හඳුනාගත්තේමු. මෙය වඩාත්ම බලසම්පන්න දෙයයි. ශ්‍රී ලාංකීය තරුණයන්ගෙන් සියයට හැත්තෑවක්, වෙනත් ජන වර්ගයක කෙනෙක් නොදන්නා බව මම කොහේදී හෝ අසා ඇත්තෙමි. මෙයින් අදහස් වන්නේ මිනිසුන් එකිනෙකා පිළබඳ සියලුම ආකාරයේ පැරණි මතිමතාන්තරයන්හි එල්බගෙන ඉතිහාසය, භූමිය හා පොදු අත්දැකීම් බෙදාහදාගත් අය සමග එක්වීම ප්‍රතික්ෂේප කරමින් ඔවුන්ගේම වූ සංස්කෘතික විශ්වාසයන්හි සිරගතව සිටින බවයි.

සියලුම ජන වර්ගයන්ට, ජාතියට සහ ආගම්වලට අයත් තරුණ තරුණියන් විසිතුන් දෙනෙකු මේ කාමරවල එකට එක්වී මිශ්‍රවී එක්ව ගත කළහ, මගේම වූ පූර්ව මත අභියෝගයන්ට ලක්ව සුණු විසුණු වී ගිය බව මට හැඟී ගියේය. දෙමළ මිනිසුන්, සිංහල මිනිසුන්, බර්ගර් මිනිසුන් සහ මුස්ලිම් මිනිසුන් කතාකරන්නේ සහ හැසිරෙන්නේ කෙසේද යන්න පිළිබඳව මා තුළ එක්තරා ආකාරයක වෙනස් අදහස් තිබූ බව මා අවබෝධ කොටගෙන තිබුණේ නැත. 'සිංහල මෙන් පෙනෙන' දෙමළ ගැහැණු ළමයින්ද, 'දෙමළ මෙන් පෙනෙන' සිංහල පිරිමි ළමයින්ද, ක්‍රිස්තියානින් වූ සිංහල හා දෙමළ මිනිසුන්ද, ලන්ඩන් නුවර තරම් දුරබැහැර සිට මේ සඳහා පැමිණි අයෙක්ද, බටහිර හැදුණු වැඩුණු එහෙත් ශ්‍රී ලංකාවට වැඩිහිටියෙක් ලෙසින් පැමිණි අයෙක්ද, මෙහි සිටියහ, එමෙන්ම වෙනස්කම් සහ සමානකම්වල අනෙකුත් බොහෝ සංකරණයන්ද දක්නට තිබිණි. සැබවින්ම මමද මේ අනන්‍යතාව අවුල් වූ අයගෙන් එක් අයෙක් බව මම තේරුම් ගත්තෙමි. දිනක යාපනයේදී,

මා වෙළඳපොළෙන් මිලදී ගත් සල්වාර් කමිසයක් ඇඳගෙන යද්දී, මහත් උනන්දුවෙන් යුතු සහභාගීවන්නෙක්, මා වෙත පැමිණ 'ඔබ සිංහලද දෙමළද්දයි' අවිශ්වාසයෙන් මෙන් ඇසුවේය. 'ඔයා හිතන්නෙ කොහොමද' යි පුදුමයට හා කුතුහලයට පත් වූ මම ඇසුවෙමි. 'හොඳයි ඔයාගෙ නම සිංහල, ඒත් ඔයා අඳින්නෙ දෙමළ වගේ' ඔහු මගේ සල්වාර් කමිසය හා නාසය විදමන (දසකයකට පමණ පෙර සැන්ප්‍රැන්සිස්කෝවේදී විදමන කරගෙන තිබිණි) පෙන්වමින් කීවේය. මටද අනෙක් බොහෝ සහභාගිවන්නන් ජනවාර්ගික වශයෙන් හඳුනා ගැනීම නොහැකි වූවාක් මෙන්ම ඔහුටද මා ජනවාර්ගිකත්වය අනුව හඳුනාගැනීමට නොහැකි වූ බව මම වටහාගතිමි. මෙවැනි නිමේෂයන්ගෙන් පෙන්නුම් කරන්නේ සංස්කෘතික අනන්‍යතාවෙහි වෙනස්වන සහ නොපෙනී යන සලකුණු කාරකයන්ය. ශ්‍රී ලංකාවේ නවීන බහුභාෂිකත්වය තුළ පැරණි ඒකාකාරී අච්චු පෙර ප්‍රමාණයට ක්‍රියාත්මක නොවන බව ඔවුහු පුන පුනා කීහ. සමහර විට, ආරම්භයේ සිටම පැරණි අච්චු පිළිබඳ සාක්ෂි තිබුණේ නැත. ජාතිවාදී කේන්ද්‍රයක් පැවැත්විය නොහැකි වූ අතර, මේ අනුව අපට බලාපොරොත්තු තබා ගත හැකිවිය.

යාපනයේ වැඩමුළුව සඳහා ශ්‍යාම්, අපගේ විස්මිත සමායෝජක අම්රිතා, ඇගේ සහායක ශිරෝමි සහ මම යන සියලු දෙනා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පැරණි අහස්යානයක නැගී උතුරට ගියෙමු. සහභාගිවන්නන් දිගු යාපනය බසයක (ඉතා සීතල) පසුව පැමිණෙන්නට නියමිතව තිබිණි. තුන් වසරකට පෙර මේ අහස් යානය කුමක් සඳහා භාවිතා කරන්නට ඇද්දැයි යන්න දැනගැනීමේ සිතිවිල්ලෙන් මිදෙනු නොහැකිව සිටියදී ශ්‍යාම් වැඩි කලබලයක් නොමැතිව 'මේක මගී ප්‍රවාහන අහස්යානයක්. බෝම්බ දාන එකක් නෙවෙයි' යනුවෙන් කීවේය.

යාපනය සන්සුන්ව එකිනෙක ගැටෙන කලපු වෙරළ මතින් යන දීර්ඝ දිය මංකඩවලින් යුතු, විසල් අහස්තල සහ පැරණි කොවිල්වලින් යුතු වූයේය. ව්‍යාපෘති කණ්ඩායමේ අයගෙන් සහ සහභාගි වන්නන්ගෙන් බොහෝ දෙනා මීට පෙර කිසිදිනෙක මෙහි පැමිණ තිබුණේ නැත. යුද්ධය පැවති බොහෝ කාලයක් තුළ, රටේ අනික් ප්‍රදේශවලින් ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය සම්පූර්ණයෙන් සංවෘතව තිබිණි. මෙහි පැමිණීම මා කිසිදිනක අපේක්ෂා නොකළ තවත් දෙයකි. ඇත්ත වශයෙන්ම, මගේ ජීවිතයේ වැඩිකාලයක්, යාපනයට ගමන් කිරීමේ හැකියාව, (කොළඹ සිට සැතපුම් දෙසිය හතලිස් පහක්) මට හැගී ගියේ ලෝකයේ අනෙක් ඕනෑම ප්‍රදේශයකට ගමන් කිරීමට

වඩා දුරස්ථ, දෙයක් බවයි. ඉදින් අපි දැන් මෙහි සිටියෙමු. දහස් සංඛ්‍යාවක පොත්පත් හා අත්පිටපත් යුද්ධ සමයේදී ගිනිබත් කරනු ලැබ විනාශ වී ගිය ඓතිහාසික යාපනය පුස්තකාලයේ අපි අපගේ වැඩමුළුව පවත්වමු.

ඒත්, එහි ඇතුළු වීම සඳහා යමෙක් සිය පාවහන් ගැලවිය යුතු ස්ථානයක් විය. ඒ හේතුව සහ අනෙකුත් කරුණු කාරණා නිසා එය පූජනීය ස්ථානයක් ලෙස හැඟී ගියේය. පසුව අප ආරක්ෂක මාර්ගය දෙපස බෝම්බ හෙලූ නිවෙස් ඇති, අපගේ සහභාගිවන්නන් ගෙන් සමහර දෙනෙක් හැදී වැඩුණු පූර්ව අධි ආරක්ෂිත කලාපයට අප ඇතුළු විය යුතු විය. අපගේ මාර්ගෝපදේශක තැන අප, යුද්ධයෙන් පෙර තිබූ තත්ත්වයටම නැවත සාදන ලද නිවසකට අප කැඳවාගෙන ගියේය, එයද පූජනීය හැඟීමක් ඇති කළේය.

ළමයෙක් ලෙස මා අපගේ නිවස මතකයේ තබාගැනීමේ මැඩිය නොහෙන උත්සාහයක් ගත් බව යාපනයේදී මම ද වටහා ගත්තෙමි. ලෝකය පුරා සිටින ශ්‍රී ලාංකිකයෝ (අවතැන් වූ ශ්‍රී ලාංකිකයන් බොහෝ දෙනෙක් එසේ කළ බව මට සහතිකය) එයට සමාන මානසික ක්‍රියාවලියක නිරතව සිටියහ. කලාකරු ටී. ශනාතනන් උතුරේ යුද කලාපයන්හි අහිමි වූ නිවාසයන්හි බිම් සැලසුම් අසූවක් සහ ඒ එක් එක් විශේෂිත නිවාසයන් අහිමිවූවන් කී කතා හා අවතැන්වීම් පිළිබඳ වැදගත් කරුණු ඇතුළත් කෘතිය වූ The Incomplete Thombu නම් කෘතිය ගැන අදහස් හුවමාරු කරගැනීම සඳහා පැමිණියේය. සමස්ථ අසල්වැසි ප්‍රදේශ විනාශ වූ බවත්, හැමදෙනාම විදේශගතවූ බවත් ඔහු කියා සිටියේය. ඔහුගේ ප්‍රජාවෙහි ඉතිරි වූ එකම පුද්ගලයා වශයෙන් කතා කළ ඔහු පොළොවෙහි ගැඹුරට මුල් ඇදුණු තනි ගසක් යන හැඟීමෙන් යුතුව, ඔවුන් ආපසු එනතුරු නිමක් නොමැතිව බලා සිටියි. ටී. ශනාතනන් සහ අනිකුත් අය වැනි මිනිසුන් ඒ සියල්ල සිදුවන තුරු මෙහි සිටි බවත්, එකී කම්පනය තේරුම් ගැනීමේ මගක් ලෙස හා පලවා හැරීමේ මගක් ලෙස, ඔවුහු ඒ කම්පනය කලාව සහ ස්මරණය බවට හරවාගත් බවත්, ඔවුන්ට ඒ සම්බන්ධයෙන් ප්‍රශංසා කළ යුතු බව සහ සහාය දිය යුතු බවත් මට එමගින් සිහිපත් කර දුන්නේය. ලේඛකයකු වීම සඳහා මරණය ගැන සැලකිලිමත්ව සිටිය යුතු බවත්, භූතයින් ගැන සිතෙහි බලපෑමක් තිබිය යුතු බවත්, ලේඛකයා හැමවිටම ඉතිහාසය ගැන නිරන්තරයෙන් දැන සිටිය යුතු බවත් මගේ සිතට වැදිණි.

මේ තරුණ ලේඛකයින්ට තවම ඒ පිළිබඳ දැනීමක් නොමැති විය හැකිය. එහෙත් මේ කාර්යයට පාදක වන්නේ ස්පන්දනයයි. අවතාර අන් අයට වඩා බොහෝ සමීපව අප ලුහුබැඳ එයි, සමහර විට අප අවකාශයෙහි ඇති ඔවුන්ගේ කතාව ඉව අල්ලා කියනු ඇතැයි යන අපේක්ෂාවෙන් විය යුතුය. නැවත නැවත කෑගැසීම අපගේ කාර්යයි. 'මෙහි මීට පෙර සිටි හැමදෙනාම මිය ගියේය. අපිදු මිය යමු. ඔබද මිය යනු ඇත. මා ද මිය යයි. කිසිවක් තිබූ ආකාරයෙන්ම පවතින්නේ නැත. මට හැකියාව තිබෙන අතරතුර කතාව කියන්නට ඉඩ දෙන්න' සමහර විට මරණය සම්බන්ධ මේ සියලු දැනුවත්කමෙහි අරමුණ විය හැක්කේ ප්‍රශ්න සමග ජීවත් වීමයි. 'අප ජීවත් වන්නේ කෙසේද? අපගේ ජීවිතවල තේරුම් කුමක්ද? ශ්‍රී ලංකාව සම්බන්ධ සැලකිල්ලක් දක්වන අප සියලුදෙනාට මේවා වැදගත් ප්‍රශ්න යැයි මම සිතමි. යුද්ධයෙන් පසුව අපගේ ජීවිත කෙසේ වනු ඇද්ද? අබෝධය, සාධාරණත්වය සහ පිළිගැනීම ඊට වඩා වැඩිතර වශයෙන් සාමයට, ඥාතීත්වයට පෙරලාගන්නේ කෙසේද?

තවත් එක් කතාවක් අවසාන වශයෙන් කියන්නට ඇත. මේ කතාවද සොරා ගත්තේ රාත්‍රී කෑම මේසයේ කතා සල්ලාපයෙනි. එක් රාත්‍රියකදී, දෙමළ සහභාගිවන්නකු, ගුරුවරයකු, කොළඹ අධ්‍යාපන උත්සවයකට ගිය ගමනක් පිළිබඳව අප කණ්ඩායමට කීවාය. මේ උත්සවයේදී ඇයට, ගෙල වටා මාලයක් පැළඳ සිටි සිංහල ගුරුවරියක මුණ ගැසී ඇත. මෙම මාලයේ තාලි අටක් එල්ලී තිබිණි ඇගේ වචන වැදී අපි ගොළු වී ගියෙමු.

තාලිය යනු දමිළ කාන්තාවකට සිය විවාහ මංගල්‍යය දිනයේදී, ඇගේ මනාලයාගෙන් ලැබෙන පාරිශුද්ධ විවාහ මාල පෙත්තක් වන අතර, එය ඇය මිය යන දින දක්වා පැළඳ සිටිය යුතුය. නොදන්නා තත්ත්වයන් යටතේ, ඔවුන්ගේ ඉතා මාහැඟි වස්තූන්, කාන්තාවන් අට දෙනෙකුට අහිමි වී ඇත, ඔවුන් ඉතා උතුම් කොට සලකන වඩා පාරිශුද්ධ වස්තුවෙහි අයිතිය අත හැරීමට කාන්තාවන් අට දෙනෙකුට බල කර තිබේ. ඒ කාන්තාවන් අට දෙනා මරා නොදැමුවද, ඔවුන්ගේ තාලි විකුණන්නැයි බලකිරීම එකම අන්තගාමී අහිමිකිරීම වන්නට ඉඩ තිබිණි.

'ඒත් මම හිතන්නෙවත් නෑ ඇය තාලි කියන්නෙ මොනවද කියලා දැනගෙන හිටියා කියලා. ඇය හිතන්න ඇති ඒවා ලස්සන මාල පෙති කියලා. එයා කොහෙන් හරි මාලෙ සල්ලිවලට ගන්න ඇති' සහභාගිවන්නිය

කීවාය. 'ඒ නොදන්නා සිංහල කාන්තාව දැනගෙන සිටියා නම්, තමන්ගේ ගෙලේ පැළඳගෙන සිටියේ මොකද්ද කියලා එයත් අපි වගේම තැති ගන්න ඉඩ තිබුණා. 'ඔයා මොකද්ද කළේ?' මම අවසානයේදී ඇසුවෙමි. 'ඔයා ඇයට කිව්වද? මාලෙ ගත්තෙ කොහෙන්ද කියලා එයාගෙන් ඇහුවද?' 'නෑ' ඇය කීවාය. 'අපි එකිනෙකා සමග හිනාවෙලා අහක බලාගත්තා. කියන්න දෙයක් තිබුණේ නෑ'

මට මේ කතාවේ වැදගත් අවස්ථාව ලෙස දැනෙන්නේ කාලය සහ ස්ථානය විසින් අණ කළ පරිද්දෙන් දෙදෙනා ක්‍රියා කළ, කාන්තාවන් දෙදෙනා අතර ගැඹුරු නිහඬතාව ඇති වූ මොහොතයි. එහෙත් මේ කාන්තාවන් දෙදෙනාට සන්නිවේදනයට අවකාශයක් තිබුණේ නම් කුමක් විය හැකිව තිබිණිද? භේද වීම, අහිමි වීම, කම්පාව, අභිලාෂයන්, අවශ්‍යතාව හා සමනය පිළිබඳ කතා කිරීමට දෙදෙනාට පොදු මගක් තිබුණේ නම් කුමක් විය හැකිව තිබිණිද? සිංහල කාන්තාවට ඇගේ කතාව කීමට ඉඩ ලැබුණේ නම්? යුද්ධය ඇගේ ජීවිතය කැටයම් කළේ කෙසේදැයි අපි නොදනිමු. සමනය කිරීම කළ හැක්කේ, නිශ්ශබ්දතාව බිඳ හෙලා, සාමූහික දුර්කල්පනාවන්ට අභියෝග කොට, අපට තුවාල කරනු ලැබූ සහ අප විසින් තුවාල කරනු ලැබූ අයට අපගේ කතා කීමෙනි. එහෙත් මේ සඳහා ආරක්ෂිත අවකාශයන් අවශ්‍ය වන අතර, මෙතෙක් ශ්‍රී ලංකාවේ එබඳු ආරක්ෂිත අවකාශයන් ඇත්තේ කිහිපයක් පමණි.

අපගේ නිවස අත්පත් කරගෙන සිටි දෙමළ පවුල පිළිබඳව ශ්‍රී ලංකාවේ සිටින අතරතුර මම සිතුවෙමි. මේ නිවස ඔවුන්ගේ ගෙදර ලෙස ඔවුන් විසින් සලකනු ලැබුවේද? මේ නිවසේදී උපත ලැබූ, අන් තැනක් නොදන්නා දරුවන්, මා මෙන්ම මේ නිවස ඔවුන්ගේ ගෙය ලෙස සැලකුවේද? මා ඒ මිනිසුන් කිසිදිනෙක දැන නොගනු ඇත, එහෙත් සමහර විට මේ ස්ථානය බෙදාහදා ගත් අප තුළ ආත්මීය බැඳුමක් ඇති කරන්නේද? සැබෑව නම් අප වෙන්ව සිටිනවාට වඩා ශ්‍රී ලාංකිකයන් ලෙස අප වඩා සමීපව බැඳී සිටින බවයි. මගේ ජීවිතයේ වැඩි කාලයක්, ශ්‍රී ලංකාව යනු කුමක්ද හෝ තිබෙන්නේ කොහේදැයි නොදත් මිනිසුන් සිටිනා ස්ථානයන්හි ගත කළ මට, මෙය හොඳින් පැහැදිලිය. අවසානයේදී අපි සැබවින්ම එක් නිවසක් බෙදාහදා ගත්තෙමු. මේ නිවස නිතරම මාරුවන සමූහයකට ගෙබිම විය, දෙආකාර ඉතිහාසයන්ට, ප්‍රතිවාදී දෙපිරිසකට සත්කාර කළ

ස්ථානයක් විය. මෙය ලෝකය පුරා සිය නානප්‍රකාර නිර්මාණශීලී සහ සංස්කෘතික ප්‍රකාශය ගෙන ගියා වූ ස්ථානයක් විය. එය, අපගේ වචනවලින්, අපගේ සැමරුම්වලින්, අපගේ සිරුරුවලින් අප නැවත යනෙන නිවසක් වන අතර, එම නිවසෙහි කතාව අප විසින් බෙදාහදාගත යුතු නිවසකි.

Write to Reconcile සහභාගිවන්නන්, මෙසේ බෙදාහදාගත් එක් නිවසක කතාව කියන්නට නිහඬතාවට අභියෝග කරන්නට ඔවුන්ගේම වූ බොහෝ සහ විවිධ ක්‍රම මගින් යත්න දරනු ඇතැයි මම විශ්වාස කරමි. මේ විශේෂ ස්ථානය පිළිබඳව ඔවුහු විසිතුන් ආකාර වූ විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන්, විසිතුන් වැදෑරුම් ලෙසින් එය දැකීමෙන් ඒ කාර්යය කරනු ඇත. එබැවින්, මෙහිදී, අපි ඔවුන්ගේ වරප්‍රසාද ලත් සහ කෘතවේදී ශ්‍රාවකයන් වෙමු.

***නයෝමි මුණවීර*** *ශ්‍රී ලාංකීය ඇමෙරිකානු ලේඛිකාවකි. ඇයගේ පළමු නවකතාව වන, ශ්‍රී ලංකාවේ යුද සමය තුළ ජීවත් වන දෙමළ හා සිංහල පවුල් දෙකක කතාව කියැවෙන Island of Thousand Mirrors ප්‍රකාශයට පැමිණුනේ 2013 දීය. එය Man Asia සාහිත්‍ය සම්මානය සඳහා දීර්ඝ ලැයිස්තුවට ඇතුළත් වූ අතර ඇය ආසියාවේ පොදුරාජ්‍ය මණ්ඩලීය ප්‍රාදේශීය සාහිත්‍ය ත්‍යාගය හිමිකර ගත්තාය. ඇය කැලිෆෝනියාවේ ඕක්ලන්ඩ් නුවර වාසය කරයි.*

# ධජය

### *ශිලෝනි සුමන්දිරන්*

ශාලාව දහඩිය ගඳින්, කෙඩෙත්තුව සහ නොරුස්නා බවින් පිරී තිබිණි. දැනටමත් තදබද වූ සාලයට, නිල ලාංඡන පැළඳගත් ශිෂ්‍ය නායකයින් විසින් ගැහැනු ළමුන් අසුන් ගන්වනු ලබන විට මැසිවිලි මිමිණුමක් නැගෙමින් තිබිණි. එක්ව බිම ඉඳ ගන්නට බල කරනු ලැබූ කිලිටි තැවරුණු සිසුන්ගෙන් අසුන් අතර වූ ප්‍රවේශ මාර්ගය ඇහිරී තිබුණේය. මම පිටුපස මගේ අසුනට ඇද වැටී, අනතුරුව මුහුණෙහි නැගුණ ඩාබිඳු, මගේ නිල ඇඳුමෙහි වාටියෙන් පිසදා ගැනීමට පහතට නැමුණෙමි.

'ඇයි අනේ අපි මෙතෙන්ට ආවේ? හරිම රස්නෙයි. ඇයි විදුලි පංකා වැඩ නොකරන්නේ?' සුලක්ෂි, මගේ හොඳ මිතුරිය, ඇගේ නළලෙහි ඇලී තිබුණු කෙටි කෙහෙරැල් සිය පැණි පැහැති අතින් රළු ලෙසින් පසෙකට කරමින් ඇසුවාය.

'මම දන්නේ නැහැ' එතරම් තදබදයක් නැති, දාහය නොමැති තැනක් ගැන සිතමින්, සෙමෙන් මගේ දෑස වසා ගත් මම එසේ පිළිතුරු දුන්නෙමි. සුලක්ෂි මට වැලමිටෙන් අනින විට මම කිරා වැටෙමින් සිටියෙමි.

'තනුකි අක්කි කියනවා ඔයාට නැගිටින්න කියලා' ඇය කොඳුළාය.

'අපි චිත්‍රපටියක් හරි, මොකක් හරි බලන්න යනවා වගෙයි' වේදිකාව පෙන්වමින් සුලක්ෂි කීවාය.

මම සෙමින් මගේ දෑස විවර කළෙමි. ප්‍රවේශ මාර්ගයෙහි සිට මා දෙස බලා සිටින උස ගැහැනු ළමයා දෙස එක් බැල්මක් හෙළූ මම, වහාම සන්සුන්ව ඉඳගත්තෙමි. සාලය වහා දැඩි නිහඬ බවක ගිලී ගියේය. දැඩි වෙහෙස හා දාහයෙන් මිදෙනු පිණිස යම් සහනයක් ලබා ගැනීමේ මහත් අපේක්ෂාවෙන් යුතුව මම තිරය දෙස දෑස් යොමාගෙන සිටියෙමි. ඔවුන් හොඳ චිත්‍රපටියක් පෙන්වනු ඇතැයි මම බලාපොරොත්තුවෙන් සිටියෙමි. සංගීතමය වැඩසටහනක් නැරඹීමට වඩා රුචි වූයෙමි. එහෙත් ජුලි ඇන්ඩෘස්ගේ කඳු මුදුනෙහි නර්තනය හෝ ඕඩ්රි හෙප්බර්න්ගේ නැගෙනහිර ලන්ඩන් නර්තනයෙන් සාලාව පිරී යනු වෙනුවට

ජනාධිපතිවරයාගේ මුහුණ තිරයෙන් මතු විය. අපගේ විදුහල්පතිවරයා නැගී සිට, අප ශාලාවෙහි රැස්ව සිටියේ කුමක් සඳහාද යන ප්‍රශ්නයට බොහෝ වේලාවක් බලාපොරොත්තුව සිටි පිළිතුර ලබා දුන්නේය.

'දැරියනි, යුද්ධය අවසාන කිරීම සම්බන්ධව ඔහුගේ කතාව කිරීමට ජනාධිපතිතුමන් සූදානමින් සිටිනවා. මෙය ඓතිහාසික මෙහොතක්, එබැවින් අවධානය යොමු කරන්න.' ඇය නිවේදනය කළා ය. අනතුරුව ඇය නැවත අසුන් ගත්තාය.

දැරියක් හෝ දෙදෙනෙක් එකී ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් විස්මිත ප්‍රතිචාර හුවමාරු කරගත්හ. මම මගේ දෑස් කරකැවූයෙමි. 'යුද්දෙ ඉවර බව සමහර මිනිස්සු දන්නෙවත් නැති බව මට හිතාගන්න බෑ' මම කීවෙමි.

''මම දන්නවා, හරිද. මගේ දෙමව්පියෝ අපි දිනපු මොහොතෙම කොඩියක් දැම්මා.'' සුලක්ෂි පිළිතුරු දුන්නාය.

මගේ මුහුණ ඉබේම පුළුටු වී ගිය බවක් මට හැඟී ගියේය. 'දිනූ' බව ඇය කීවාය. යම් හේතුවක් නිසා එම වචනය නිවැරැදි යැයි මට දැනුණේ නැත. නිවෙස්වල සඳළුතලයන්හි සහ පියසිවල ශ්‍රී ලාංකීය ධජ ලෙළ දෙනු මම දුටුවෙමි. එහෙත් අප නිවසෙහි කොඩි ලෙළ දුන්නේ නැත.

ජනාධිපතිතුමා කතාව ආරම්භ කළේය. මම මහත් ඕනෑකමින් ඉදිරිපසට නැමුණෙමි. එහෙත් ඔහු කියන්නේ කුමක්දැයි මට තේරුම් ගත නොහැකි බව මා වටහා ගත් විට කලකිරීම් දාමයක් මා තුළ ඇති විය. 'දිනා' සහ 'අපි' වැනි ව්‍යතිරේඛයන් හැරුණු විට කතාවෙහි ඉතිරිය සඳහා ගැඹුරු සිංහල බස භාවිතා විය. එය මගේ අවබෝධ කර ගැනීමේ ශක්තියෙන් පරිබාහිර විය. මම මගේ අසුනට ඇද වැටුණෙමි. ගුරුවරියක හෝ ශිෂ්‍ය නායිකාවක අපට ආපසු යන්නට සංඥා කරන විට සුලක්ෂි මට වැළඹිටෙන් අනිනු ඇතය යන අවබෝධයෙන් මට සුවසේ නිදාගන්නට හැකිය. අප අතරෙහි නිහඬ අවබෝධයක් තිබිණි. ඒ වූ කලී වසර ගණනාවක මිත්‍රත්වය විසින් පමණක් ගොඩනැගිය හැකි ආකාරයේ අවබෝධයකි. මා මුසාවක් කියන්නේ ද හෝ සත්‍යවාදී ද යන්න කීමට ඇයට හැමවිටම හැකියාව ඇත. අනෙක් හැමදෙනාටම වඩා මට ඇය ශෝකයෙන් සිටින්නේ ද යන්න කිව හැකිය. ඇගේ සියලුම

මනෝභාවයන් සමග කටයුතු කරන්නේ කෙසේ ද යන්න මම නිවැරැදිවම දනිමි. අපගේ මිත්‍රත්වයට බලපාන්නා වූ එක් ප්‍රධාන හේතුවක් වන්නේ, දෙමළ ජනතාව හා සිංහල ජනතාව අතරෙහි පැහැදිලිවම ඇති සියලු එදිරිවාදිකම් මට කිසි කලෙක අවබෝධ නොවීමය. අපගේ වෙනස් ජනවාර්ගිකත්වය හැරුණු කොට අපි සහෝදරියන් වැනි වීමු. ඇය මා ගැන වගබලාගනු ඇතැයි යන දැනීමෙන්, අස්වැසීමෙන්, මම, මට සතුටින් වඩා උද්දීපිත දවල් සිහින දකින්නට ඉඩ දුනිමි. එවකට අපගේ වයස අවුරුදු දහ තුනක් වූයෙන්, සුලක්ෂිගේ දෙමව්පියන් ඔවුන්ගේ වෙරළබඩ නිවසට නිවාඩු ගත කරන්නට ආ විට මා ද ඔවුන් සමග කැඳවාගෙන යන්නට ආරාධනා කළහ. දෙසතියක කාලයකින් අප එහි යාමට සැලසුම් කරමින් සිටි අතර, ඒ සති අන්තයෙහි අපට ලැබිය හැකි සතුට සොම්නස ගැන මම සිහින මවමින් සිටියෙමි.

අවසානයේ දී කතාව අවසන් වූ අතර, දැරියන් ශාලාවෙන් පිටත පොදිකමින් සිටියේ, එක් අයෙක් පසුපසින් අනෙකා ගමන් කළ යුතුය යන ගමන් කිරීමේ නියමය අතැර දමමිනි. යුද්ධය ජයග්‍රහණය කිරීම කොතරම් විශිෂ්ට වික්‍රමයක් ද යන්න මා වටා සිටින අය කතා කරනු මට ඇසිණි. ඔවුන් දැන් ත්‍රස්තවාදයෙන් හා අන්තරායෙන් විනිර්මුක්ත වූ පාරාදීසයක හැදෙනු වැඩෙනු ඇත. ජනාධිපතිතුමන් ඔහුගේ කතාව අවසන් කරන විට බොහෝ දැරියෝ අත්පොළොසන් දෙමින් ප්‍රීතිඝෝෂා කළහ. මම ද මගේ දවල් සිහිනයෙන් ඉවත්ව ඔවුන්ට එක් වූයෙමි.

මගේ මිතුරු කණ්ඩායම සහ මම එක්ව පන්ති කාමරය දෙසට ඇවිද ගියෙමු. අශාන්ති අප ඉදිරියෙන් උඩ පනිමින් ගමන් කළාය. එසේ යමින් නිරන්තරයෙන් අප දෙස හැරුණේ හාස්‍යජනක කතා කීමටය. ඒවා කිසිසේත් අදාළ නැති, කුසුතෙවනන් මහත්මියගේ දිලිසෙන කහ පැහැති සාරිය නිසා ඇය සෙසම් ස්ට්‍රීට් හි විශාල කුරුල්ලා මෙන් පෙනුණු බව වැනි කතා විය. හිරු රශ්මියෙහි දී නෙත් කොනින් නිදිමත බැල්මක් හෙලූ මහේෂි, කතාව පැවැත්වුණු වෙලාවෙහි ඇයට හරිහැටි නිදාගන්නට ඉඩ නොදුන්නේ යැයි බයිරවී ට දොස් කීවා ය. එය සැබවින්ම ඔවුන් දෙදෙනා අතර විවාදයක් ඇති කිරීමට හේතු කාරක විය. ඔවුන් දෙදෙනා කලහ කරමින් යන ආකාරය දෙස බලමින්, සිනාසෙමින් සුලක්ෂි හා මම දෙපසින් ගමන් කළෙමු.

''ඔච්චර කේන්ති ගන්න එපා මහේෂි. අද සතුටු වෙන්න ඕන දවසක්. ඒක විශිෂ්ට දෙයක් නොවෙයි ද? මේක මෙහෙම සිද්ද වෙයි කියල කවුද හිතුවෙ? ශ්‍රී ලංකාව දැන් ආරක්ෂිත රටක්. අපි හැමෝම ආරක්ෂිතයි!'' සුලක්ෂි කෑගෑවාය.

මම එකඟතාව පළ කොට සිනාසී, මොහොතකට පසුව බැම හකුලා ගත්තෙමි. 'අපේ ගෙදර කොඩියක් දාලා නැහැ'

මගේ තොල් අතරින් ඒ වචන ගිලිහී ගිය මොහොතෙහි, ඒ වචන අල්ලාගෙන නැවත ඒවා මුව තුළට තල්ලු කොට දැමීමට හැකි නම් මැනවැයි සිතුවෙමි. මගේ මිතුරියෝ නිහඬ වූහ. පුළුල් ඇස් කුට්ටම් හතරක් මා වෙත එල්ල වී තිබිණි.

'හොඳයි ... මං හිතනවා, ඔයා දෙ ...' සුලක්ෂි එසේ ආරම්භ කොට, ඇගේ කොළඹ 7 හි ශිෂ්ට සම්පන්න ඉව මතු වූයෙන් ඒ කතාව නැවැත්වූවාය.

'දෙමළ ? ඒක සාධාරණ නෑ!' බයිරවී එතනට පැන කෑගෑවාය. 'අපි දෙමළ' අපි කොඩියක් දැම්මා! 'අපි දේශප්‍රේමියෝ'

දැරියෝ අවබෝධයෙන් හිස සෙලවූහ. 'දේශප්‍රේමී' යන වචන සඳහා නිර්වචන සොයා, වැදගැම්මකට නොමැති දේ පිළිබඳ දබර කිරීමේ අවශ්‍යතාවයක් නොමැති මම, මගේ ටයිපටිය අල්ලමින් සිටියෙමි.

'ආ .... මේ සෙනසුරාදා සාදයට ඔයාලා මොනවද අඳින්නේ?' ඇතිව තිබූ ආතතිය සමනය කිරීමට වහා ඉදිරිපත් වෙමින් සුලක්ෂි ඇසුවාය. බයිරවී ඇඳිය යුත්තේ කුමක්ද යන්න පිළිබඳ අශාන්ති සහ මහේෂී තර්ක කරන්නට පටන් ගත් අතර, සියලු අවධානයන් මා වෙතින් වෙනතකට යොමු විය.

අප පංතියට ආපසු යන විට සුලක්ෂි ඇගේ අතින් මගේ අත අල්ලා ගත්තාය. 'පුෂ්පා... ත්‍රස්තවාදීන් එක්ක සටන් කරපු නෑයෝ ඉන්නවද ඔයාගේ ?' ඇය ඇසුවා ය.

ඇගේ දෑස් පොළවට නැඹුරුව තිබිණි. මගේ අත අල්ලාගෙන සිටි ග්‍රහණය වඩා දැඩි වූයේ, මා අත, අතහැර පළා යනු ඇතැයි සිතා ඇය බියට පත්වූවාක් මෙනි. මම සිනාසුණෙමි.

'මෝඩ වෙන්න එපා සුලක්ෂි. ඔයා මගේ නෑයින්ගෙන් බොහොම දෙනෙක් මුණගැහිලා තියෙනවා. ඒ ගොල්ලො දෙමළ ඊළාම් විමුක්ති කොටි (LTTE) සංවිධානයේ අභිප්‍රායන් ගැනත් සානුකම්පික නැහැ.'

සුලක්ෂි යාන්තමට සිනාසුණු නමුත්, එය ඒත්තු ගත් බවක් පෙනී ගියේ නැත. 'මට තේරුම් ගන්න බැහැ ඔයා ජයග්‍රහණය සමරන්නෙ නැත්තෙ ඇයි කියල. ඔයාගෙ දෙමව්පියො ඔයාට කිව්වෙ නැති වුණාට, සමහර විට ඒකට සම්බන්ධ වෙච්ච ඔයාලගෙ නෑයො ඇති. ඒක එහෙම වෙන්න පුළුවන්. එහෙම නේ?'

අපට හැමවිටම නව නැන්දා, මාමලා සහ ඥාති සහෝදර සහෝදරයන් හමුවිය. 'ඒක මට සැකයි' මගේම වචන පිළිගන්නවාද නොගන්නවාද යන්න පිළිඳව හරි හැටියට නොදත් හෙයින් මම සන්සුන්ව පිළිතුරු දුනිමි. මා ඒ සිතිවිල්ල නිසා අපහසුතාවට පත් වූ බව සුලක්ෂි අවබෝධ කර ගත්තාය. ඒ කාරණය ඇයට සැබවින්ම බලපෑමක් ඇති නොකළ බව හා එයින් මට බලපෑමක් ඇති නොවන බව කියන්නට මෙන් ඇය වහා විෂය මාරු කළා ය.

සුලක්ෂි කතා කරන විට මම, අප මිතුරන් වූයේ කෙසේද යන්න සිහි කළෙමි. පළමු වැනි පංතියේ සිටම අප එකට උගත් බැවින්, අප බොහෝ දෙනා මිතුරන් වූයේ ඉබේටමය. අනෙක් අතට සුලක්ෂි සහ මා මිතුරු වූයේ පස්වැනි ශ්‍රේණියේ සිටියදී ය. එය හරියට අප දෙදෙනා එකිනෙකා සොයාගත්තාක් මෙනි. එක් දිනක් මහේෂි මකුළුවකු අතැතිව මා පසුපස එළවාගෙන ආවාය. බියට පත් වූ මම, එවකට මා නොදන සිටි සුලක්ෂි වෙත දිව ගොස් , ඇය මා ඉදිරියේ පළිහක් කොට ගෙන සිටියෙමි. මා දෙස බලා ඉගි කළ සුලක්ෂි එබඳු වර්ගයේ මකුළුවකුගෙන් ඇති විය හැකි ආසාදනය පිළිබඳ මුසාවක් කීවාය. මහේෂි වහා මකුළුවා අතහැරි අතර මම ආරක්ෂාව ලැබීමි. එදින පටන් සුලක්ෂි මගේ මිතුරිය වූවාය. අප දෙදෙනා බොහෝ දුරට සමාන ගතිපැවතුම් ඇත්තන් වීමු. එමෙන්ම සියලු දේ සම්බන්ධයෙන් හැමවිටම පාහේ එකඟ වීමු. අප කිසිවිටෙක එකඟ නොවූ විට අනෙකා සමග එකඟ වීම සතුටින් ප්‍රතික්ෂේප කරමින්, පැය ගණන් අදහස් හුවමාරු කර ගතිමු. සැබවින්ම, අප පංතිය පිටුපස හිඳගෙන, ආගම හා එබඳු කාරණා සම්බන්ධව දාර්ශණික සාකච්ඡා යනුවෙන් අප හැඳින් වූ දීර්ඝ සාකච්ජා, ආගම සම්බන්ධ හැම කාල පරිච්ජේදයකදීම

පැවැත්වීමු. මේ සාකච්ඡාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් මගේම අදහස් හා විශ්වාසයන් රැසක් නිර්මාණය කළෙමි.

අපගේ පාසල ද ජාතික ධජය නැංවූ බව දැන ගැනීමෙන් පසුව මම එදින පාසලෙන් පිටව ගියෙමි. එදින තුළ අසන්නට ලැබූ බොහෝ වික්‍රමාන්විත කතා මෙනෙහි වන විට, මට ආඩම්බරකාරී හැඟීමක් ඇති විය. සිය අසිපත අල්ලාගෙන, ඍජුව සහ සවිමත් ලෙස සිටින සිංහයා ඒ අභිමානය විදහා දැක්වූයේ ය. ඔහු ආරක්ෂාව හා බොහෝ අවස්ථා අනාගතයක් සහතික කරන බව පෙනී ගියේය.

යුද්ධය පැවති කාලයේ දී ද, සැබවින්ම කිසිදිනක මට අනාරක්ෂිත බවක් දැනුණේ නැත. සැබවින්ම කොළඹ අඩු වැඩි වශයෙන් ක්ෂේම භූමියක් වූයේය. ඉඳහිට, බෝම්බයක් පුපුරා ගිය අවස්ථාවක හෝ අන්ධකාරව ගිය අවස්ථාවක, මා ජීවත් වූයේ යුද්ධය පවතින රටක බව සිහියට නගා ගැනීමට හැකියාව තිබුණි. එහෙත් ඒ තත්ත්වය පහව ගිය විට, අන්තරායක සිටි බව නැවත වරක් මට අමතකව යාමට ඉඩ තිබුණි. මගේ ශ්‍රී ලංකාවෙහි හැම විටම පාහේ ආරක්ෂාව දැනිණි. ආරක්ෂිත ස්ථාන සොයා ගිය ඥාතීන්ට සහ මිතුරන්ට මට එය කිව හැකි විය. මගේ බොහෝ නැන්දලා සහ මාමලා, අප සංක්‍රමණය නොවීම ගැන මගේ දෙමව්පියන්ට චෝදනා කරනු මා අසා තිබේ. 'ඒක යුද්ධයෙන් වැනසුණු රටක්! ඔබට ආරක්ෂාවක් නැහැ' ඔවුහු කීහ.

මගේ දෙමව්පියන් ඒවාට පිළිතුරු දෙන විට මගේ සිතුවිලි ප්‍රතිරාවය වෙයි. 'කොළඹ බොහොම ආරක්ෂා සහිතයි. අපි හැමෝටම රට අතැරලා යන්න බෑ. වියදම් දරාගන්න පුළුවන් හැමදෙනාම රට ඇරලා ගියා නම්, මේ රටට තියෙන්නෙ මොන බලාපොරොත්තුවක් ද? ඔබට යුද්ධයෙන් වැනසිච්ච රටක් බලන්න ඕන නම් උතුරටයි, නැගෙනහිරටයි යන්න ඕන. කොළඹ ආරක්ෂාව තියෙනවා, ඒ වගේම කොළඹට ආරක්ෂාව හැම වෙලාවෙම තියෙයි.

'මේ රටේ ඔයාගෙ දෙමළ ළමයි හදා වඩා ගන්න එකෙන් කරන්නෙ, කරදරවලට අත වනන එක පාවම්' මගේ දෙමව්පියන්ගේ වචන පිළිගැනීමට අකමැති විදේශීය ඥාතීහු එසේ කියනු ඇත. 'ඒගොල්ලන්ට වර්ගවාදී ක්‍රියාවලටයි, වෛරයටයි මූණ දෙන්න වෙයි. දැන් මා මගේ රට

ආරක්ෂා කිරීමට පියවර ගත යුතුය. එසේ කළ යුත්තේ මා කිසිවිටෙක වර්ගවාදයේ ගොදුරක් නොවූ බව ගෙනහැර දක්වීමෙනි. මගේ වචන අසන ඔවුහු නිහඬ වනු ඇත. එහෙත් ඔවුන්ගේ නිහඬතාව පරාජයක් නොවීය. ඔවුන්ගේ සානුකම්පික බැල්ම හා බිමට නැඹුරු කොටගත් ඇස් කියා පෑවේ, මා තවමත් තේරුම් ගත හැකි තත්ත්වයේ නොසිටින බැවින්, සැබෑව මට බල කර කීමට ඔවුන්ට අවශ්‍ය නොවූ බවයි.

රාත්‍රී ආහාර ගැනීමේ දී පවුලක් ලෙස එකට එක්වීම දුර්ලභ දෙයක් විය. අපගේ ජීවන ක්‍රමය ඔවුන්ගේ ළමා කල ජීවන ක්‍රමය හා සසඳා බැලීමේ දී ඇති ප්‍රධාන වෙනස මෙය බව මගේ දෙමාපියෝ නිතර සඳහන් කළහ. කෙසේ වුවද ඒ සන්ධ්‍යාවේ, අප සියලු දෙනා නිවසෙහි සිටියෙන්, රාත්‍රී ආහාරය සඳහා පවුලක් ලෙස එක්ව හිඳගතිමු. දීසි එහා මෙහා කරන විට සියලු දෙනා එකවර කතා කරන්නට වූහ. හැම කෙනෙකුටම ඔවුන්ගේ කතාවක් කීමට තිබිණි. කෑම බෙදීම අවසානයේ දී අපි නිහඬව ආහාර අනුභවය පටන් ගතිමු. අපගේ නිවසේ පිටත ධජයක් නොමැතිවීම ගැන මගේ දෙමව්පියන්ගෙන් ඇසීමේ අවස්ථාව මට උදා විය.

'අප්පා, ඇයි අපේ ගෙදර ජාතික කොඩියක් නැත්තෙ? අනෙක් හැමදෙනාම ජය සමරනවා!'

'සමරන්නෙ මොකක් ද? සිය දහස් ගණන් ජීවිත විනාශ වුණා? ගෙවල් විනාශ වුණා?'

ඔහු තමාගේ ගෑරුප්පුවෙන් අර්තාපල් ගෙඩියට ඇන, එය කටට දමා ගත්තේය. අනතුරුව ඔහු මා දෙස බැලුවේ මගේ පිළිතුර බලාපොරොත්තුවෙනි.

මම වික්ෂිප්තව ගියෙමි. පාසලේ දී කිසිවෙක් ඒ ගැන කතා කළේ නැත.

'මොකද අපි යුද්දෙ දිනුවා' මම ප්‍රයත්න දැරුවෙමි. 'මීට පස්සෙ මිනිස්සු කවුරුත් මැරෙන්නෙ නැහැ! ගෙවල් විනාශ වෙන්නෙ නැහැ! අපි හැමෝටම ආරක්ෂාව ලැබේවි!' මම කතාව ජයග්‍රාහීව අවසන් කළෙමි.

අම්මා මදෙස බලා සිනාසුණා ය.

'ඒක ඇත්ත කුන්ජු. දැනට, හිංසනය නැවතිච්ච එක ගැන අපි දෙවියන්ට ස්තුතිවන්ත වෙන්න ඕන. ඒත් යුද්දෙ හින්දා තමන්ගෙ දෙමව්පියො සහ දරුවො අහිමි වෙච්ච සියලුම ජනතාව ගැන මොකද කියන්නෙ. රතිඤ්ඤා පත්තු වෙනවා ඇහෙන කොට ඔවුන්ට මොන වගේ හැඟීමක් ඇතිවෙයි කියලද ඔයා හිතන්නෙ? සමහර මිනිස්සු තාම දන්නෙ නෑ ඒ ගොල්ලන්ගෙ පවුල් පණ පිටින් හරි නැතුව හරි යුද්ධ කලාපයෙන් එළියට ආවද කියලා'

මොහොතකට ඇය කී දෙය පිළිබඳව මම සිතුවෙමි. එහෙත් තවමත් මා දෙමව්පියන් සමඟ එකඟ නොමැති බව වටහා ගතිමි.

'ඒත් යුද්දෙ ඉවරවෙච්ච හින්දා ඒ ගොල්ලොත් සතුටු වෙනවා ඇති. ඒ වගේම දැන් හුගක් මිනිස්සු ආරක්ෂිතයි!' මම පිළිතුරු දුනිමි. මම මගේ ගෑරුප්පුව එහා මෙහා කළෙමි. 'අපි ඒත් යුද්ධය දිනුවා. ජයග්‍රහණය සැමරීමේ කිසි වැරැද්දක් නැහැ. ඉස්කෝලෙත් කොඩියක් දැම්මා!'

'ඒ මොකද ......' අප්පා කතාව ආරම්භ කළේය. එහෙත් අම්මාගේ අනතුරු ඇඟවීමේ බැල්ම දැක වහා නිහඬ වූයේ ය. ඔහු සිය ආහාර කෙරෙහි අවධානය යොමු කොට, ආහාර අනුභව කළේය.

'කවුද කුන්ජු යුද්දෙ දිනුවෙ? කවුද අපි කියන්නෙ?' අප්පාගේ ඉවසිලිවන්තභාවයට ආහාරවලින් කෘතගුණ සලකන්නට මෙන්, අම්මා සලාද බඳුන මගේ පියා වෙත ළං කරමින්, කාරුණිකව අසා සිටියාය.

'ශ්‍රී ලංකාව නේද?' මම අඩමානයට ඇසුවෙමි.

මට යාබදව හිඳගෙන සිටි මගේ වැඩිමහල් සහෝදරයා කෑම මදකට නවතා කතා කළේ ය. 'ඒක සිවිල් යුද්ධයක් පුෂ්පා. ශ්‍රී ලංකාවට එරෙහිව ශ්‍රී ලංකාව' වගේ.

'මම ඒක දන්නවා. ඒත් ආණ්ඩුව දිනුවානේ !' මම කෝපයෙන් ප්‍රකාශ කළෙමි.

මගේ සහෝදරයා කිසිවක් කියන්නට සූදානම් වූ නමුදු මගේ පියා එය වැළැක්කුවේ ය.

'ඔව්, ආණ්ඩුව දිනුවා. ඔයා කියන එකත් හරි'

'එහෙනම් ඇයි අපි කොඩියක් දාන්නෙ නැත්තෙ?' මම බලාපොරොත්තු කඩ වූ ලෙසින් ඇසුවෙමි. මගේ සහෝදරයාගේ කතාව මගේ සිතෙහි වැඩ කළ අතර මට ඔහු කී දේ සහේතුක කළ නොහැකිය.

'යුද්ධයකදි, ජයග්‍රාහකයොත් ඉන්නවා. පරාජිතයොත් ඉන්නවා.' අප්පා සෙමින් පැහැදිලි කළේ ය. 'තුවාලකාරයොත් ඉන්නවා නොමැරී බේරුණු අයත් ඉන්නවා. මේ යුද්දෙදි අපි කවදාවත් පැත්තක් නොගත්තෙ ඇයි කියලා දන්නවද? මොකද අවසානෙදි, දෙපැත්තම ශ්‍රී ලාංකිකයො. දෙපැත්තෙම තුවාලකාරයො හිටියා. දෙපැත්තෙම දෙමව්පියෝ හිටියා, අනෙක් පැත්ත නිසා දරුවො නැතිවෙච්ච. රජයේ ජයග්‍රහණයෙ සංකේතයක් හැටියට ධජය භාවිතා කිරීමෙන් වෙන්නෙ ඒ ජයග්‍රහණයෙන් රටේ බොහෝ ජන කොටසක් ඉවත් කිරීම. දැන් ඒ හින්දා, කොඩිය එක පැත්තකට විතරයි සම්බන්ධය'

මගේ දෙමව්පියන් යුද්ධය පිළිබඳව හැමවිටම බොහෝ විවේචනාත්මක අදහස් දැරූහ. රජයේ බොහෝ තීරණ හා ප්‍රකාශන සම්බන්ධයෙන් ඔවුහු සිනා පහළ කළ අතර එල්ටීටී යේ ක්‍රියාකාරකම් ද එලෙසින්ම විවේචනයට ලක් කළහ. රජය වෛරයට වෛරයෙන්ම පිළිතුරු දෙන ආකාරයෙන් සටන් කරන බවත්, අවසානයේ දී සිදුවන්නේ දෙපාර්ශවයම භීෂණයට මුහුණ දීම බවත් අම්මා නිතර කියනු මම අසා ඇත්තෙමි.

මගේ අනේකවිධ ප්‍රශ්න පිළිබඳව කියාපෑමේ හැකියාවක් නොමැති වූ මම බැම හකුලා ගත්තෙමි. මගේ සියලු සිතිවිලි හා ප්‍රශ්න තවමත් මට වෙන් වෙන් වශයෙන් දැක්විය නොහැකිය. මේ හැම දෙයටම වඩා, සාමය අපේක්ෂිතව සතුටට පත්වීමේ වරදක් තිබුණේ ද? මගේ දෙමව්පියන් පමණට වඩා විවේචනාත්මක හා සර්ව අශුභවාදී වූවා විය හැකි යැයි මම සිතුවෙමි.

වැඩිදුරටත් ඒ ගැන සිතමින් ඉන්නට අවකාශය ලබන්නට පෙර වීඩියෝ පාපන්දු ක්‍රීඩාවක යෙදෙන්නට මගේ සහෝදරයා මට ආරාධනා කළේ ය. නූලෙන් පැරදීම වළක්වා ගැනීම සඳහා මහත් ඕනෑකමින්

සෙල්ලම් කරන්නට වූ මගේ අවධානය ඉක්මණින්ම ක්‍රීඩාව වෙත යොමු විය.

ජාතික ධජ සහ ජයග්‍රාහී පෙළපාලි පිළිබඳ කරුණු පහසුවෙන්ම අමතක වූයේ, හොඳම කණ්ඩායම විය හැක්කේ කවුරුන්ද හා ආරම්භක ක්‍රීඩාව ලෙස ඔහු තෝරා ගත් ක්‍රීඩාව අප ක්‍රීඩා කළ යුතු ද යන වැදගත් ප්‍රශ්න පිළිබඳ තර්ක කිරීමට මගේ අවධානය යොමු වූ බැවිනි.

'තෘප්තකර කාලගුණය' වශයෙන් හඳුන්වන්නට මා කැමති කාලගුණය සමඟ උදෑසන උදා විය. එය, සුඛෝපභෝගී මෝටර් රථයක සිටිමින්, වායු සමීකරණ පහසුව විඳිමින් ලෝකය දෙස බලන්නාක් වැනි තත්ත්වයකි. සූර්යයාගේ පීඩාකාරී හිරුරැස් පොළවට පතිතවීමට එරෙහිව පවත්නා පළිහක් ලෙසින් අහස වළාකුලින් පිරී තිබුණේය. එකම ප්‍රශ්නය වූයේ වර්ෂාව හේතු කොට ගෙන පළිහට බාධා සිදුවීමයි. මුළු කොළඹම ඇති මෝටර් රථ පිටතට ගත්තාක් මෙන් පෙනෙනන්ට විය. වැල්ලවත්තෙහි මහා මාර්ගයන් හි වූ වාහන සෙලවුණේවත් නැති තරම්ය. වෙනත් කරන්නට දෙයක් නොමැති වූ මම, කවුළුවෙන් පිටතට දෑස් විදහා බලා සිටියෙමි. දුබල, මහලු මිනිසෙක් ඔහුගේ පුංචි කඩය අරිමින් සිටියේ ය. කුඩා ජාතික කොඩියක් එස වූ, දුබල තත්ත්වයේ තැඹිලි පැහැති ත්‍රීරෝද රථයක්, අසල නවතා තිබුණේ ය. දැන් එහි රියදුරු එයින් බැස, කෝපයෙන් යුතුව මහලු මිනිසා වෙත සමීප වූයේය. මහලු මිනිසා ඔහුගේ හිස ගස්සා තමා කරමින් සිටි කාරියෙහි යෙදුණේ ය. ත්‍රීරෝද රියදුරු කෙලින්ම ඔහු වෙත පැමිණ, ඔහු තල්ලු කොට, ඒ සුදු හිසකේ සහිත කුඩා මිනිසාට එරෙහිව තර්ජනාත්මකව යමක් කියන ආකාරය මම තැතිගැන්මකින්ද යුතුව බලා සිටියෙමි. ඔහු එය මගහැර යනු ඇතැයි හෝ ඔහුගේ කඩය තුළට දිව යනු ඇතැයි මා සිතුවද ඔහු තර්ක කළේ ය. මහලු මිනිසාට රියදුරු නැවත ප්‍රහාරයක් එල්ල කළ විට මගේ සියලු මාංශපේශීන් කෝපයෙන් වෙව්ලුම් කන බවක් මට දැනුණි. ඔහු තමාගේම ත්‍රීරෝද රථය හා අනතුරුව අසල්වැසි වෙළඳසැල අභිනයෙන් පෙන්වා සිටියේ ය. සිය අසල්වැසි වෙළඳසල ඉදිරියේ ආලේප කොට ඇති විසල් රත්පැහැති සිංහයා දෙස මිනිසා බැල්මක් හෙලුවේය. මගේ මෝටර් රථය ඉදිරියට ගමන් කරන්නට විය. මට හැකිතාක් දුරට මම මහලු මිනිසා දෙස නෙත් යොමු කොට ගෙන සිටියෙමි. ඔහු රියදුරාගෙන් ආයාචනාත්මකව කිසිවක් ඉල්ලා සිටිනු පෙනී ගියේ ය.

පාසල් ගේට්ටුව හරහා ඇවිද යන මගේ හිසට කුඩා පොද වැටෙනු මට දැනෙන්නට විය. මෙබඳු කාලගුණ තත්ත්වයක් හැමවිටම ශාන්ත සන්සුන් බවක් ගෙන එනු පෙනිණි. ජාතික ධජයෙහි ගිනි රත් පැහැය මගේ අවධානය ලබා ගත්තේ ය. ලේ රත. සටනට සූදානම් වන්නාක් බඳුව, අසිපත අතැතිව, සිංහයා ඍජුව බලා සිටියි. ධජය සුළඟෙහි හැපෙයි. ධජයෙහි කොන් හැපෙයි, ඇඹරෙයි. එවිට ධජයෙහි ඇති තැඹිලි හා කොළ පැහැති තීරු දැකිය නොහැකි තරම් ය. මගේ දෑස සිංහයාගේ මුහුණින් ඉවතට ගත් මම පංතිය දෙසට ඇවිද ගියෙමි.

දිනය පුරුදු පරිදි ගෙවී ගියේ, අප පෙළපාලි සහ කිරිබත් සංග්‍රහ දුටුවේ ද යනුවෙන් ගුරුවරුන් ඉඳ හිට කළ ප්‍රශ්න කිරීම් ද සමගිනි.

මගේ උභතෝකෝටික ප්‍රශ්නය සුලක්ෂි සමග සාකච්ඡා කරන්නට, ත්‍රීරෝද රථ රියැදුරුගේ සිද්ධිය ඇයට කියන්නට මට වුවමනා විය. එහෙත් මටද තේරුම් ගත නොහැකි කිසියම් හේතුවක් කරණකොට ගෙන මට ඇයට සමීපවීමට හැකියාවක් ඇතැයි මට හැඟී ගියේ නැත. මට සමීප විය හැකි හොඳම තැනැත්තිය බයිරවී යැයි මම හඳුනා ගත්තෙමි. ඇය පැමිණියේ දමිළ නිවසකිනි. ඔවුන්ගේ දෙමව්පියන්ට ඇත්තේද මගේ දෙමව්පියන්ට ඇති අදහස් උදහස් විය යුතුය. ඒ හැරුණු කොට සිදුවූයේ කුමක්ද යන්න ගැන හොඳ අවබෝධයක් බයිරවීට ඇත. කිසිවක් දැනගැනීමට අපට අවශ්‍ය වූ හැමවිටම අපි ඇයගෙන් අසන අතර ඇය අපට එය පැහැදිලි කර දෙන්නීය. බයිරවී මෙන් මා පුවත්පත් කියවිය යුතු යැයිද, අප වටා සිදුවන්නේ කුමක් ද යන්න ගැන අවබෝධයකින් සිටිය යුතු යැයි ද මගේ දෙමාපියෝ හැමවිටම මට කියති. ඇය හැමවිටම තොරතුරු සොයමින් සිටින කෙනෙකු යැයි සැලකෙන බැවින් වැඩි සහායක් ඇයගෙන් ලැබිය හැකි වනු ඇත.

දිනයෙහි පසු භාගයේ දී මම ඇයට සමීප වූයෙමි. ඇය භෝජනාගාරයෙහි ඉඳගෙන සිටියා ය.

'බයිරවී' මම කතාව ඇරඹුවෙමි. 'ඔයාගෙ ගෙදර කොඩියක් දාන්නෙ කොහොමද? ඔයාගෙ දෙමව්පියන්ට දැනෙන්නෙ නැද්ද ඒ ගොල්ලො සංවේදී නැහැ කියලා.' ඇය ව්‍යාකූලභාවයකින් යුතුව මදෙස බලා අනතුරුව, බොජුන් හලෙහි දොර දෙස බැලුවාය. 'නැහැ, ඔවුන් දේශප්‍රේමයෙන් යුතුයි' ඇය නිර්භීතව කීවා ය.

අනතුරුව කොඩියක් එල්ලීම දේශප්‍රේමයට සමානය යන ඇගේ ප්‍රකාශය පිළිබඳ මා අභියෝග කරන්නට පෙර, ඇය නැගිට බොජුන් හලෙන් පිටතට ගියේ ඇගේ උණු මයිලෝ බඳුනද එහි තිබියදී ය. ඇගේ ප්‍රතික්‍රියාවෙන් මම මහත් සේ පුදුමයට පත්වීමි.

මගේ සිතිවිලි තවත් කෙනෙකු සමග සාකච්ජා කොට තෝරා බේරා ගැනීමට මට තවමත් අවශ්‍ය වූ අතර අවසානයේ දී සුලක්ෂි සමග කතා කිරීමට තරම් මගේ පසුබෑම ජය ගත්තෙමි. මෙබඳු කාරණා සම්බන්ධයෙන් මා සමග සැබවින්ම සබැඳිය හැකි එකම තැනැත්තිය ඇය වූවා ය. පොතක් දෙස නෙත් යොමා ගෙන සිටින සුලක්ෂි නිසැකවම සිටිය හැක්කේ කොතනදැයි දැන සිටි මම ඇය සිටි පන්තිය දෙසට සෙමින් ගමන් කළෙමි. මම හෙමින් ඇගේ උරහිසට තට්ටු කළෙමි. ඇය සිනා සී පොත පසෙකින් තැබුවා ය.

'මොකද වෙන්නෙ?' ඇය ඇසුවා ය.

මගේ සියලු ව්‍යාකුලතාවන් මම ඇය ඉදිරියේ දිග හැරියෙමි. 'යුද්ධය අවසාන වීම ගැන මම සතුටු වෙන්න ඕනැද නැත්නම් දුක්වෙන්න ඕනද කියලා මට තේරෙන්නෙ නෑ සුලක්ෂි. 'ජයග්‍රහණය' කියන්නෙ භාවිතා කරන්න තියෙන නිවැරැදි වචනයද? නැත්නම්, ඇත්තටම යුද්ධයේ බලපෑම ඇතිවෙච්ච අය ගැන අපි අසංවේදී වෙලා ද? හැමදෙනාම පාරට බැහැලා ජයඝෝෂා පවත්වන කොට, ජයග්‍රහණය සමරන කොට, තවමත් අනාථ කඳවුරුවල ඉන්න (අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරු) උදවියයි, ඒගොල්ලන්ගෙ පවුල්වල අයයි ගැන අසංවේදී වීමක් කියලා ඔයා හිතනවද?' ඉක්මන් හුස්මක් ගැනීමට මම කතාව නැවැත්වූයෙමි. විසල් කරගත් දෑසින් යුතුව සුලක්ෂි මදෙස බලා සිටියාය. මම වහා පුටුවක් ඇදගෙන ඇය ළඟ හිඳගෙන කතාව පටන් ගත්තෙමි.

'මං අහන්නෙ පැත්තක් ගන්න ඕන ද? මොකද අපි ඒක කරන්නෙ නේ? අපි කියනවා රජය 'දිනුවා' කියලා. ශ්‍රී ලංකාව නෙවෙයි, මොකද කොටි සංවිධානයේ ඉන්නෙත් ශ්‍රී ලාංකිකයො හින්දා. හරිද? ඒත් ආයෙම, මම දන්නෙ නෑ .... අපි සතුටු විය යුතු වෙනවා. මං හිතන්නෙ ඒ යුද්ධයක අවසානය! ජනතාව වඩාත් ආරක්ෂා වේවි! ඒත්, මේ වෙන වෙන ප්‍රශ්න ඔක්කොම තියෙනවා, මම දන්නෙ නෑ කොයි එක හරිද කොයි එක වැරදිද

කියලා. මම දන්නෙ නැහැ .... මේ ඔක්කොම ගැන ඔයා මොකද හිතන්නෙ? නිසැකවම ඔයාගෙ දෙමාපියොත් මේ ගැන කතා කරනවා ඇති'

මම සුලක්ෂි දෙස බැලුවෙමි. ඇගේ සිත කලබලව ඇති බව මම දුටුවෙමි. 'මම ...... මට හිතෙනවා අපි සමරන්න ඕන කියලා' ඇය අවසානයේ දී කීවාය.

'ඒත් ඇයි?' ඇය වැඩි අවධානයක් නොදක්වන බව දැකීමෙන් ඇති වූ කෝපයෙන් යුතුව මම ඇසුවෙමි. ඇය මට පිටුපා ඇගේ පොත පෙරලා ගත්තාය. ඇය නැවත පොත වසා මා වෙත හැරුණාය.

'මොකද, රජය කියන්නෙ ශ්‍රී ලංකා රජය පුෂ්පා. ඔයා ඇත්තටම දේශප්‍රේමී නම්, ජාතියක් හැටියට අපේ ජයග්‍රහණය සමරන කොට ඔයා ඒකට එකතුවෙන්න ඕන' ඇය විරාමයක් තැබුවා ය. ඇය ඩෙස්කුව මත තිබුණු ටිපෙක්ස් සලකුණු ඇගේ ඇඟිලිවලින් වේගයෙන් සූරා හැරියාය.

'කොහොම හරි මගේ දෙමව්පියො කියන්නෙ එහෙමයි'

ඇය ඇගේ පොත අතට ගෙන නැවත කියවන්නට වූවා ය. මම ඇය දෙස බලා සිටියෙමි. සුලක්ෂි, මා දන්නා බොහෝ කුතුහලය ඇති ප්‍රශ්න අසන අයගෙන් කෙනෙකි. ඇය නිතරම ප්‍රශ්න ඇසුවාය. ඒ ගුරුවරුන්ගෙන්, දෙමාපියන්ගෙන් හෝ මිතුරන්ගෙන් විය හැකිය. කිසිවක වලංගු බව ප්‍රශ්න නොකොට අත්තනෝමතික ප්‍රකාශයන් කරන්නට ඇය කිසිවිටෙකත් ඉඩ හැරියේ නැත. මේ කිසිසේත්ම ඇයගේ ස්වභාවය නොවේ. 'මොකද ඔයාට වෙලා තියෙන්නෙ?' මගේ යටහත් ප්‍රශ්නය ඇය තවදුරටත් නිහඬ කරවූ අතර අනතුරුව එය කෝපත් බැල්මක් බවට පත්විය. මම නැගිට නැවත මගේ අසුනට ගියෙමි. ව්‍යාකූලව ගිය මම දැන් සිදු වූ දෙය ගැන වේදනාවට පත්වූයෙමි.

සමීපයේ ඉඳගෙන සිටි නමුත් දවසේ ඉතිරි කාලය තුළ අප එකිනෙකාට කතා කළේ නැත. වරක් හෝ දෙවරක් මම විහිළුවක් කිරීමට උත්සාහ කළ නමුදු ඇය සිනාසුණේ හෝ නැත. පංතියේ කතා කරමින් සිටීම ගැන ගුරුවරිය සුලක්ෂි සහ මට කෑ නොගැසූ පළවෙනි දිනය එය විය. මම ඇගේ දෑස දෙස බලන්නට කිහිප වරක් උත්සාහ කළ නමුත් ඇගේ කාරියෙහි නිරතව සිටි ඇය මදෙස බැලීම ප්‍රතික්ෂේප කළා ය.

අප දෙදෙනා අතර වූ මේ නිහඬතාව, මේ අලුත් උදාසීනකම හා ශූන්‍ය බව මුසු වෙන්ව සිටීම අනෙක් මිතුරියන් අතරට ද ගොස් ඇති බව පෙනේ. හැමවිටම කුමක් හෝ දෙයක් ගැන සිනාසෙමින් සිටින අශාන්ති පවා, ඇගේ පුටුවේ නිහඬව හිඳගෙන, නිරන්තරයෙන්ම පාහේ මා සහ සුලක්ෂි දෙස බලමින් සිටියා ය. බයිරවී සමඟ අප සිටින ස්ථාන මාරු කර ගැනීමට ද මම කල්පනා කළෙමි, එවිට සුලක්ෂි හා මට යන දෙදෙනාටම පහසුවෙන් පාඩමට සවන් දීමට හැකි වනු ඇත, එහෙත් නිල වශයෙන් එසේ ඉවත්වීම මවිසින් කරනු ලැබීම මට අවශ්‍ය නොවී ය. විශේෂයෙන්ම සුලක්ෂි මා කෙරෙහි එබඳු විස්මිත ආකාරයෙන් හැසිරෙන්නේ මන්ද යන්න මට කිසිසේත් තේරුම් ගත නොහැකි බැවින් මට එසේ කළ නොහැකිය. මඳ වේලාවකට පසුව මම ඇය දෙස බැලීම අත හැරියෙමි. මා අතහැර, අපට ඉදිරි මේසයේ ඉඳගෙන ඇය මහේෂි සහ අශාන්ති සමග 'බින්ගෝ' සෙල්ලම් කරන විට එය නුදුටු සේ හෝ ගණනකට නොගත් සේ සිටීමට මම මවාපෑමක් කෙළෙමි.

ඊළඟ දින කිහිපය තුළ අපගේ සබඳතාවෙහි පළුද්දක් ඇති විය. අපි එකිනෙකාට කාරුණික වීමු, එහෙත් මිතුරු නොවීමු. මම අපගේ නිහඬ සටන අවුලා ගන්නට උත්සාහ කරන විට එවැන්නක් සිදුනොවුණාක් මෙන් ඇය එය මග හැරියා ය. අවසානයේ දී එය දරාගත නොහැකි වූ අතර මම ඇයට මුහුණට මුහුණ කතා කිරීමට තීරණය කළෙමි. සුලක්ෂි සොයා ගැනීම හැමවිටම පහසු කාරණයකි. එබැවින් එක් විවේක කාලයකදී, සමගිය ඇති කර ගැනීමේ අධිෂ්ඨානය ඇතිව, මම ඇය සොයා පුස්තකාලයට ගියෙමි. ඒ, පුස්තකාලයේ කොනක හිඳගෙන ඇය පොතක් කියවමින් සිටින බව මා දන්නා බැවින් එහිදී ඇය මුණ ගැසිය හැකි නිසාය. මා පැමිණි බව නෑසෙන තරමට ඇය කියවමින් සිටි නවකතාවට බොහෝ සේ ඇලී සිටියා ය. මම ඇයගේ උරහිසට තට්ටු කර, මට කීමට ඇති දේ කෙලින්ම කීවෙමි. 'මෙහෙම වුණේ මං යුද්දේ ගැන කතා කරපු නිසාද? අපි ඒ ගැන එකඟ නොවුණට කමක් නෑ. අපි හුඟක් දේවල් ගැන එකඟ නොවෙච්ච අවස්ථා තිබුණා' මම සන්සුන් ලෙසින් කීවෙමි.

'නෑ......නෑ ඒක හින්දා නොවෙයි' සුලක්ෂි පිළිතුරු දුන්නාය. ඇය බොරු කියන වග මට කිව හැකිය.

'මං ඔයාගෙන් අහපු දේ ගැන හිතලා බැලුවද? මං අවුල් වෙලා

ඉන්නේ ඇයි කියලා ඔයාට තේරෙනවද?'සුලක්ෂි දෑස් දල්වාගෙන සිටියාය. ප්‍රතික්‍රියා දක්වන්නේ කෙසේද යන්න පිළිබඳව ඇයට තිනච්චක් නොමැති වූ වග මට කිව හැකිය.

'ඒක මෙහෙමයි ... ඔයා එකක් කියනවා, මගේ තාත්තා ... හොඳයි ඒ ගොල්ලො හිතනවා ... වෙන විදිහකට'

'ඒක හොඳයි, හරිද? ඉතින් අපිට ඒක ගැන කතා බහ කරලා මට හොඳ අවබෝධයක් ලබාගන්න පුළුවන්' මම සතුටින් කෑ ගැසුවෙමි. සුලක්ෂි ඇගේ පෙළපොතෙහි පිටු කොන් දෙස බැලුවාය. ඇගේ දෙමාපියන් සිතන්නේ කුමක් දැයි ඇය මට කියනු ඇතැයි මම ඇය දෙස බලා සිටියෙමි. එහෙත් ඇය පිළිතුරු නොදුන්නාය. මගේ කෑ ගෑම අප දෙදෙනා අතර වූ අවකාශයේ සැඟව ගියාක් මෙන් විය. මේ විශේෂ මාතෘකාව සාකච්ඡාව සඳහා නොගැනෙන්නේ මන්දැයි මට තේරුම් ගත නොහැකි විය. ඒ පිළිබඳව ඇය සමග කතා කිරීමේ මගේ නොනැසෙන අවශ්‍යතාව ඇයට වටහාගත නොහැකි බව මම දුටුවෙමි.

'ඒක අතාරින්න. ඒක වැදගත් දේකුත් නෙවෙයි' අවසානයේ දී ඇය කීවාය. 'මිනිස්සු කොහොම හිතනවාද කියන එක, ඔයා තේරුම් ගන්නවා වගේ දෙයක් නොවෙයි ඒක. මිනිස්සු කළ යුතුයි කියන දේවල් කිසිදෙයක් වෙනස් කරන්නෙ නැනෙ. ඉතින් ඒක අතාරින්න. හැමෝටම තම තමුන් හිතන විදියට හිතන්න ඉඩ දෙමු.'

ඇගේ හේතු දැක්වීමට පදනමක් නොමැති බව අප දෙදෙනාම දැන සිටියෙමු. එහෙත් ඇගේ හඬෙහි ආයාචනාත්මක ස්වරයක් විය. මේ විලාසය ඇය තුළ දොම්නසක් ඇති කරන බව පෙනිණි. ඒ කුමක් නිසාදැයි මට වටහා ගත නොහැකි විය, එහෙත් ඇය එය මට නොකියන බව මම දැන සිටියෙමි. කොඩිය ගැන කතා කිරීම ඇයගේ සිත රිදවූ බව මම වටහා ගතිමි, එබැවින් මම ඒ විෂයය අත් හැරියෙමි, මම අන් තැනකින් එයට පිළිතුරු සොයන්නට වීමි.

හැමවිටම, ඒ අයුරින්ම තිබුණු කුඩා දේවල් වැඩිකොට මගේ අවධානය ලබාගැනීමට පටන් ගත්තේය. මා විශ්වාස කළ දෙයට ප්‍රතිවිරුද්ධ ලෙසින්, අප පාසලේ උදවිය මූලික වශයෙන් එක්වූයේ ඔවුන්ගේම ජනවර්ග

යන් සමගය. සිංහල සහ දමිළ මාධ්‍යය පන්ති එකිනෙකා සමග මිශ්‍ර නොවූ අතර කිසිදු ඉංග්‍රීසි මාධ්‍යය පන්තියක් සමග එක් වූයේ නැත. අපද, එබඳුවම, එකමුතු වූයේ අප එකිනෙකා සමගිනි. කෙසේ වුවද අපගේ ඉංග්‍රීසි මාධ්‍යය පන්තියේ වුවද, දමිළ හින්දු දූරියන් එක්වූයේ ඔවුනොවුන් සමග පමණකි. කිසිවෙක් ඔවුන් තම කණ්ඩායම්වලින් ඉවත් නොකළ නමුත් හා ඔවුන්ට අකාරුණික නොවූ නමුත් ඒ කිසිවෙක් සැබවින්ම ඔවුන් තම කණ්ඩායම් තුළට ඇතුළත් කර නොගත්හ. පෞද්ගලිකවම සැමදෙනාම, සැමදෙනාටම ආචාර සම්පන්න හා කාරුණික වූ නමුදු, කණ්ඩායම් සැදුණේ ජනවර්ගය හෝ ආගම් පදනම් කොට ගෙනය. ගෙවී ගිය දිනයන්හි මම ඉඳහිට අප පන්තියේ දමිළ දූරියන් සමග ගැවසුණෙමි. සුලක්ෂි මෙන් නොව ඔවුන් සියලු දෙනාම ඔවුන්ට හැඟී ගිය දෙය කියන්නට සූදානම්ව සිටියහ. බොහෝ අදහස් පැමිණියේ මගේ නිවස වැනි නිවෙස්වලිනි, බයිරවී වැනි අයට වෙනස් ආකරයේ අදහස් තිබුණු අතර ඒවා අඩුවෙන් තැකීමක් කළ නොහැකිය. එහෙත් කුමක් අපට හැඟී ගියද, අපි ඒවා ඔවුනොවුන් සමග, පමණක් ඉතා සතුටින් බෙදා හදාගතිමු. සුලක්ෂි සහ මා එක්ව සිටින විට ඇති උදාසීන බව සලකා බලන විට මේ වෙනස ප්‍රබෝධමත් ඉසුඹුවක් විය.

සුලක්ෂි මා අරබයා අතිශයින්ම කාරුණික වූ නමුදු, ඇය තවදුරටත් කිසිදු වැදගත් දෙයක් මා සමග කතා කළේ නැත. ඇය කරන කවරක් ගැන වුවද නොරුස්නා බවක් මා තුළ වර්ධනය වෙමින් තිබිණි, මා හැමවිටම ඇයට සැර වැර වෙන බවක් මට දැනෙන්නට විය. එවැනි අවස්ථා බොහෝ සෙයින් උදා වූයේ අප එකම දේ බෙදා හදා ගත් බැවින් හා එකිනෙකාගේ බඩු භාණ්ඩ නිතරම භාවිතා කළ බැවිනි. අවසානයේදී, සුලක්ෂි ඇගේ කාරුණික මුහුණුවර ඉවත ලා, මට පෙරලා සැර වැර කරන්නට වූවාය. මේ අතර, මා සුලක්ෂි පිළිබඳව කරන විවේචන, එනම් ගීත ගායනය කරන්නට කිසිසේත් හැකියාවක් නැති ඇය හැමවිටම ගායනා කරමින් සිටි ආකාරය ගැන මම කතා කීවෙමි. සුලක්ෂි අනෙක් උදවිය සමග සැබෑවට මිතුරු දම් ඇති කර ගැනීමට උත්සාහ ගන්නේ නම් ඔවුන් ඇය මාන්නක්කාරියක යැයි නොසිතනු ඇතැයි ද මම කීවෙමි. මා ඇය පිළබඳව කියන ගොරහැඩි කතා අසමින් සිනාසෙන්නට අපගේ මිතුරියෝ සැදී පැහැදී සිටියහ. එක් උදෑසනක මා පාසලට යනවිට මහලු මිනිසාගේ කඩයෙහි වෙනසක් කොට තිබෙනු නිරීක්ෂණය කළෙමි. ත්‍රී රෝද රථ රියැදුරුට අවශ්‍ය දේ සිදුව තිබිණි. කුඩා ජාතික කොඩියක් සුළඟෙහි ලෙලදෙමින් තිබුණේය.

ජනාධිපතිතුමන්ගේ කතාවෙන් සතියක් ගත වූවාට පසුව, භූ තල දෙකක් ඉතා වේගයෙන්, දරුණු අන්දමින් එකිනෙක පසුකර යන්නට තැත්කරන කල් හි, නොවැළැක්විය හැකි භූමිකම්පාවක් සිදුවිය. මහේෂි 'දමිළ සමානයි ත්‍රස්තවාදීන්' විහිළුව කරන විට විරසකව සිටි සුලක්ෂි සහ මම මිතුරියන් කිසිවෙක් නොමැතිව පන්තියේ ඉඳගෙන සිටියෙමු.

'ඔයා ඒ වගේ දෙවල් නොකිව යුතුයි. විහිළුවක් වගේවත් ! ඒක වර්ගවාදය' මම කෝපයෙන් ඇයට කෑ ගැසුවෙමි.

'නවත්තන්න! සන්සුන් වෙන්න පුෂ්පා. ඒක විහිළුවක් විතරයි!' මහේෂි සමාව අයදින විලාසයෙන් පිළිතුරු දුන්නාය. 'කනගාටුයි'

'එයා විහිළුවක් කළේ පුෂ්පා!' සුලක්ෂි ඇගේ ඩෙස්කුවේ තද දුඹුරු ලීයට අතින් ගසමින් කීවාය. 'ඔයා ඒ විදියටමයි ත්‍රස්තවාදය ගැන මුස්ලිම් අය සම්බන්ධයෙන් විහිළු කරන්නෙත්. ඒකත් වර්ගවාදය, දන්නවද?'

මම ඇය දෙස තැතිගත් නිහඬ බවකින් බලා සිටියෙමි.

'ඔයාට හැම තිස්සෙම හිතන්න ඕන දෙමළ මිනිසුන්ම ඉලක්ක කරනවා කියලා. මේ රටේ තියෙන ලොකුම ප්‍රශ්නෙ ඒකයි. දෙමළ මිනිස්සු හිතන්නෙ අනික් හැමෝම ඒගොල්ලන්ව අල්ලගන්න ඉන්නවා කියලා. ඉතින් ඒගොල්ලෝ හැම දේ ගැනම නිකරුණේ කලබල කරනවා පොඩි කාරණා ලොකුවට අරගෙන' දැන් ඇය නැගිට සිටියාය. ඇගේ වම් අත මිට මොළවාගෙන සිටි අතර ඇගේ දකුණු අත ස්ථිරසාරව ඩෙස්කුව උඩ තබාගෙන සිටියේ, එයින් ඇයට සහායක් ලැබෙන්නාක් මෙනි.

ඒ වචන ඇයගේ නොවන බව මම දැන සිටියෙමි. ඇය, ඇයගේ දෙමාපියන් කිවූ දේ ගිරවියක මෙන් වහරන බව මා දන්නේ මෑතකදී, මමත් බොහෝ දේ කතා කළේ ඒ ආකාරයෙන් වන බැවිනි. මේ ඇය සමග කරුණු කාරණා නිරවුල් කර ගැනීමට ලැබී ඇති අවස්ථාවකි.

'එහෙම වෙන්නෙ මේ රටේ දෙමළ මිනිසුන්ව ඉලක්ක කරගන්න හින්දා. මුස්ලිම් මිනිස්සුන්ටත් එහෙමයි' මම ඇයට දැනුම් දුන්නෙමි. මෑතකදී මගේ දෙමාපියන්ගේ සාකච්ඡාවන්ට සවන් දීම ගැන මම සතුටු වීමි, එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ උදාහරණ ගෙන හැර දැක්වීමට හැකියාව මට ලැබී තිබිණි.

'හොඳයි, ඔයා හිතනවා නම් මං ඔයාව ඉලක්ක කරගෙන කියලා, ඇයි ඔයා මං එක්ක යාළුකම් පවත්වන්නේ ?' සුලක්ෂි ඇසුවාය.

මා පිළිතුරු දෙන්නට පෙර, ඇය වටයක් කැරකී පන්තියෙන් පිටතට ගියාය. අපගේ අනෙක් මිතුරියෝ මා දෙස බලා සිටි නමුත් ඔවුන් කාගේ පැත්ත ගන්නේ ද යන්න පිළිබඳ කිසිදු ඉඟියක් ලබා දුන්නේ නැත. එදින පසු වේලාවකදී මම ඇය දෙස බලා සිනාසෙන්නට උත්සාහ කළෙමි, එහෙත් ඇය ඇගේ හිස හරවා ගත්තාය, එය මගේ දෑස් හමුවීම මගහැරීමේ ඇගේ අලුත් පුරුද්ද ක්‍රියාත්මක කිරීමකි.

සුලක්ෂි සහ මම එකිනෙකා මග හැරියෙමු. අප එක පේළියේ තවදුරටත් එක්ව හිඳගත්තේ නැත. ඇගේ ප්‍රතිචාරයට මුලින්ම මම පුදුම වූයෙමි. මා දුටු ලෙස ඇය අගතිගාමී ලෙස හැසිරීම නිසා සෙමෙන් එය මා තුළ ඇය කෙරෙහි වන කෝපයක් බවට පත්විය. ජනාධිපතිතුමන්ගේ කතාවෙන් පසුදින සේම, නිහඬතාව අප දෙදෙනා ඈත් කරවන බව පෙනී ගියේය. කෙසේ නමුදු මේ අවස්ථාවේදී ඇති වූ නිහඬතාව දිගටම බලපැවැත්විණි. එතරම් අගතිගාමී වීම පිළිබඳව සුලක්ෂි කෙරෙහි මා තුළ උපන් කෝපය සහ ප්‍රතිවිරෝධය මා තුළ පැසවන්නට විය. ඊළඟ කාල පරිච්ඡේදයේදී සුලක්ෂි සහ අශාන්ති දෙවැනි පේළියට ගියහ. අපගේ මිතුරියෝ මාරුවෙන් මාරුවට මා සමග ඉඳගත් අතර විවේක කාලවල දී මා සමග කතා කළහ. දිනපතාම එක් අයෙක් මා සමග සිටින්නට වෙන් කෙරුණු අතර, අනෙක් සියලු දෙනා සුලක්ෂි සමග සිටියහ.

එක් දිනක් මගේ මිතුරිය වීමේ වාරය ලැබුවේ මහේෂි වූ අතර 'සෙනසුරාදට මාත් එක්ක චිත්‍රපටයක් බලන්න එනවාද' යි මම ඇයගෙන් ඇසුවෙමි. සති අන්තය පිළිබඳව අපේක්ෂාවන් හැමවිටම මා තුළ පෙළඹවීමක් ඇති කළේය.

'මට බැහැ පුෂ්පා. මම, සුලක්ෂියි එයාගෙ පවුලේ අයයි එක්ක ඒගොල්ලන්ගේ වෙරළබඩ නිවසට (Beach Home) යනවා.' ඒ තොරතුරු කීමෙන් මගේ සිතෙහි ඇතිවිය හැකි බලපෑම ගැන නොදන මහේෂි කීවාය, එපමණක් නොව සති අන්තය එළඹෙන තුරු ඇයට බලා සිටිය නොහැකි යැයි ඇය වැල් වටාරම් දොඩවන්නටද වූවාය.

මම ඇය දෙස බලා සිටියෙමි. සුලක්ෂි කිසිවිටෙකත් මට නිල වශයෙන් ආරාධනා නොකර සිටියේ නැත. මා දෙස බැලීම පවා ප්‍රතික්ෂේප කරන ඇය මට ආරාධනා කරන්නේ කෙලෙසින් ද? අනෙක් අතට, මට, වෙරළබඩ නිවස පිළිබඳව අමතකව තිබූ අතර, සති අන්තය සඳහා වන මගේ අනේකවිධ සැලසුම් තිබිණි, ඒවාට සුලක්ෂි සමග යාමට මා අපේක්ෂා කළේ ද නැත. මේ සියල්ලට වඩා, අපි දැන් කතා නොකරමු. අප මිතුරියන් යැයි කීමට ද දැන් හැකියාවක් නැත. මගේ පහළ ඇහි පියන්වල කඳුළු නලියනු මට දැනිණි. මම කඳුළු නොපෙනෙන්නට ඉවත බලා ගතිමි. ඇය ගෙන යන දේ ගැන කතා කරන බැවින් මගේ කඳුළු නොදකිනු ඇතැයි මම සිතුවෙමි. මගේ දෑසින් ගලා ආ කඳුළු බිඳු කිහිපය ඇසිපිය අතරින් ගලා ගොස්, මගේ මුහුණට වැටෙනු මහේෂි නොදකින්නට ඇත.

'පුෂ්පා ? අවුලක් නැහැනෙ ? මොකද වෙලා තියෙන්නේ?' ඇය ඉදිරියට නැමී, මගේ මුහුණ දෙස හොඳින් බලන්නට උත්සාහ කරමින් ඇසුවාය.

'මුකුත් නෑ මහේෂි. මම හොඳින්' මම ඇය දෙස බලා සිනාසුණෙමි. මම ඇගෙන් ඉවතට හැරී බලන විට සුලක්ෂි, බයිරවී සහ අශාන්ති සඟරාවක සිලිටු අලුත් පිටු පෙරලමින් සිනාසෙමින් සිටිනු දුටුවෙමි. 'මං හොඳින්' මම වැඩිකොටම මට ඇසෙන්නට නැවත කීවෙමි.

ඊළඟ මාස කිහිපය තුළ වැඩි වෙනසක් සිදුවූයේ නැත. ජයග්‍රහණයේ අතිශයෝක්තිය අඩු වී ගියේය. ජනතාව ඔවුන්ගේ එදිනෙදා වැඩකටයුතුවලට එක්වූහ. කොළඹට යුද්ධයේ බලපෑම එතරම් දැනුණේ නැත. එබැවින් අපගේ ජීවිතවල වැඩි වෙනසක් ඇති නොකරමින් සාමකාමී යුගයක් ආරම්භ විය.

අවසානයේ, එක් දිනක් සුලක්ෂි කලකින් අප නිවසට නොපැමිණියේ මන්දැයි, අම්මා මගෙන් ඇසුවාය. 'අපි රණ්ඩුවක් වුණා' මම ඇයට කීවෙමි. විනාඩි දහයකට පසුව වයස අවුරුදු පහේදී මෙන් මම ඇගේ උකුලේ හිඳගෙන, ඇයට අපගේ දබරයට හේතු වූ කාරණා හඬමින් කීවෙමි. එහෙත් ඇය සිනාසෙන බව අවබෝධ කර ගතිමි. එය ආඩම්බරය? සතුට? අවබෝධය? නැත, එය ප්‍රමෝදයයි. එයින් සිදුවූ එකම දෙය මා කෝප ගැන්වීම පමණකි. 'ඒක විහිළුවක් නොවෙයි. ඒක බැරෑරුම් කරුණක්' මම කෑ ගැසුවෙමි.

'මම දන්නවා කුන්ජු. ඒක කොහොමද හරිගස්සා ගන්නේ කියලා මං ඔයාට කියන්න ඉස්සෙල්ලා, මට ඔයාගෙන් ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?' ඇයට එසේ ඇසිය හැකි බවට මා ඉඟි කළ අතර ඇය දිගටම කතා කළාය. 'හොඳයි, ඔයා මුස්ලිම් අයට විහිළු කරන එක නැවැත්තුවද? අනෙක් ජාතියට එරෙහිව වෙනස් කොට සැලකීම ගැන ඔයා බැලුවද?'

මම හිස සෙලවීමි. 'සමහර වෙලාවට ඔයත් වර්ගවාදියෙක්' මම ඇයට කීවෙමි. මගේ මව හැමවිටම සිංහල ජාතිය පිළිබඳව අණ ගුණ නැති විවේචන කරයි. එහෙත් මේ වනතුරු ඇය වර්ගවාදී යැයි මා කිසි විටෙකත් සිතා නැත.

ඇය සිනාසී හිස සෙලවූවාය. 'අපි හැමෝම අපේම විදිහකට ටිකක් අගතිගාමියි. ඔයත් හොඳින්ම දැනගන්න ඕන දේ තමයි ඔයත් අනෙක් හැමෝම වගේ නරකය කියන එක, උත්සාහ කරන්න ඕන ඒක අවම කරගන්නයි.'

'සුලක්ෂි ටිකක් මෝඩයි, හරිද?' එය එකඟතාව සහ අනුමැතිය සෝදිසි කළ ප්‍රකාශයක් විය.

'අපි දන්නේ නෑ රත්තරනේ. එයා ගෙදරදි එයාට ඇහෙන ඒවා කියනවා වෙන්න ඇති. එයාගේ දෙමාපියෝ එයාට කියලා ඇති ඒවා ගැන කා එක්කවත් කතා කරන්න එපා කියලා, ඒවා මතභේදයට තුඩු දෙන හින්දා. එයාගේ පවුලේ සාමාජිකයෙක් රජයේ ඉන්නවා වෙන්න පුළුවන්. ඒ ගොල්ලන්නට හුඟාක් උදව් කරන කෙනෙක්. අපි දන්නේ නැනෙ' ඈ මගේ හිස පිරිමැද්දාය. 'මේ වගේ කාරණා සංවේදියි. බහුතරය වුනත්. හොඳම දේ තමයි ඒවා මිත්‍රයොත් එක්ක කතා නොකරන එක'

'ඒත්, එහෙනම් කොහොමද? අදහස් හුවමාරු කරගන්නේ?' මම ඇසුවෙමි.

'සමහර දේවල් හුඟාක් දුෂ්කරයි' ඇය සුසුම් හෙලුවාය. 'අපි සටන් කරන්න පුළුවන් තැන්වලට විතරයි සටනට යන්න ඕන.' ඇය කතා කරන විට මගේ දෑස් මුණ නොගැසෙන්නට වග බලාගන්නා බව මට පෙනිණි, ඒ වෙනුවට ඇස යොමු කරන්නට ඇය පොළොවෙහි තැනක් සොයාගෙන තිබිණි. 'සමහර වෙලාවට අපේ සැප පහසු කලාපෙන් පිටතට යන්න

අමාරුයි කුන්ජු' ඇය මා ඇගේ උකුලෙන් බස්සවා, රාත්‍රී ආහාරය සූදානම් කරනු පිණිස යන්නට නැඟී සිටියාය. 'සුලක්ෂි එක්ක යාලු වෙන්න' කාමරයෙන් පිටතට යාමට පෙර ඇය මට අවවාද කළාය.

සැප පහසු කලාපය සහ සටන් බිම ගැන ඇය කීවේ කුමක්දැයි මට හරිහැටි තෙරුම් ගත නොහැකි විය. මා අවබෝධ කරගත් දෙය නම්, යුද්ධය හා අරගලය ගැන කිසිදින සාකච්ඡා කිරීමෙන් තොරව, සුලක්ෂිට සහ මට මිතුරුදම් පවත්වා ගෙන යා හැකි වග ඇය සිතන බවයි. අම්මා සහ අප්පා ඔවුන්ගේ මිතුරන් සමග කෙතරම් සමීප දැයි මම සිතන්නට වීමි. සමහර විෂයයන් කතා කිරීමට නොහැකි විට අපට යම් අය සමග සැබවින්ම සමීප විය හැකි දැයි මම කල්පනා කරමි. එය සුළු දෙයක් යැයි අම්මා සිතන බව පෙනෙයි. දැන් යුද්ධය හමාර වී ඇති බැවින් එහි වැදගත්කමක් නැතැයි ඇය සිතයි. එහෙත් මට එය නොවැදගත් දෙයක් නොවේ. මගේ අදහස් ඉවසා දරාගන්නට සුලක්ෂිගේ ඇති නොහැකියාව සහ ඇයගේ අදහස් බෙදා ගැනීමට නොහැකි වීම අපගේ මිත්‍රත්වය පළුදු කළේය, එය කෘතිම බවට පත් කළේය. එහෙත් මා වැරදි විය හැකිද? යුද්ධය පිළිබඳ ඔවුන්ගේ හැඟීම් බෙදා හදා නොගැනීම පසෙක තිබියදී අම්මාට සහ අප්පාට මිනිසුන් සමග සැබෑ මිත්‍රතත්වයක් ගොඩ නඟා ගත හැකි නම්, මට ද සුලක්ෂිට ද එසේ කළ හැකි වනු ඇත. සමහර විට, මා ද අවසාන වශයෙන් වටහාගත යුත්තේ ඒ ගැන කතා කිරීම ඒ සා විසල් වැදගත් දෙයක් නොවූ බවයි.

***ශිලෝනි සුමන්දිරන්*** *උපත ලැබුවේ සහ හැදී වැඩුණේ කොළඹ ය. ඇය අද සී.එම්.එස් කාන්තා විද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවකි. සිය අදහස් නිර්මාණාත්මක කලාව මගින් ප්‍රකාශ කිරීමට පාසලේදී ඇය දිරිගන්වනු ලබයි. ඇය තම කතාව ගොඩනගන්නේ ඇය හැදුණු වැඩුණු පරිසරය තුළ ස්ථානගත කරමිනි. ඇගේ චරිතයෝ ඇයද පාර්ශවයක් වූ ඉංග්‍රීසි කතාකරන උප සංස්කෘතියක් පිළිබිඹු කරයි.*

# පැපොල් ගස

**_නිකිණි ජයතුංග_**

ඔවුන්ගේ ප්‍රභාවෙන්, මට සරදම් කරමින්, ඉඟිකරමින් ඔවුහු එහි එල්ලී සිටියහ. කහපැහැති පැපොල් ගෙඩි හිරු රැස් දහරෙහි ගිල්වූවාක් මෙන් කඳෙහි, ඒ දිදුලන එළිය වටා පැපොල් ගසෙහි කොළ විහිදී තිබෙයි.

මගේ කවුළුව අසල හිඳගෙන සිටින විට ඒවා ළංව පෙනෙන අතර, මට එයට අත දිගු කර එක් ගෙඩියක් කඩා ගැනීමට පුළුවන. වසර ගණනාවකට පෙර, අවසාන වරට මේ අපේ නිවස යැයි මා හැඳින්වූ අවස්ථාවේදී මට තටු ලැබෙනු ඇතැයිද, ඒ අනුව ගසට පියඹා ගොස් ගෙඩියක් කඩා දමන්නට හැකි වෙනු ඇතැයිද සිතන්නට මම පුරුදු ව සිටියෙමි. දරුවෙකුගේ හුදකලා දවල් සිහින, එහෙත් අද මට ඒවාට ළංවිය හැකිය. මා දැනටමත් දුර ප්‍රමාණයන් තේරුම් ගෙන, මගේ ගමන් මග සැලසුම් කර ඇත. පළමුව හැමවිටම ළිං ඉවුරෙහි වැදින බරැති බාල්දිය ඇති තැන තිබෙන බුරුල් වූ ගල් මග හැර, ළිං ගැට්ට මතට නඟිමි. එතැන් සිට අපගේ ඉඩම මායිම් වන, උද්‍යාන තාප්පය මතට පනින්නෙමි. තාප්පය උස, පටු එකකි. එහි පළල අඟල් හතරකට වැඩි නැත. එහෙත් මට අවශ්‍ය වන්නේ එපමණකි. මගේ සමබර බව මනාව තිබෙයි. මගේ දෙපා මට විශ්වාසය. මා වළකාලන්නේ මගේ විශ්වාසය අඩු කමක් නිසා නොවේ. සත්තකින්ම ප්‍රශ්නය මා වළකාලන්නේ කුමක් ද යන්නය. අසල්වැසියන් කුමක් කියනු ඇද්ද? හොඳ ගැහැණු ළමෝ තමන්ගේම ගසකින් හෝ ගෙඩි කඩන්නට තාප්ප දිගේ බඩ ගා නොයති. එය වඳුරන්ගේ සෙල්ලම් පිටියකි. අඩුම තරමින් මිනිසෙකුගේ සෙල්ලම් පිටියකි. මගේ දැනටමත් සුණු විසුණු වී ගිය ඉතිහාසය නිසා, එය නියත වශයෙන්ම මගේ සෙල්ලම් පිටිය නොවේ.

ඉච්ඡා භංගත්වයට පත් සුසුමක් ද සමගින් මම මා ඉදිරියේ ඇති කුඩා කැඩපත දෙසට හැරුණෙමි. මුග්ධකම! මගේ ඇඟිලි නොඉවසිලිමත් ලෙසින් දිගු කෙස්වැටිය අදින්නටත්, අල්ලා ගන්නටත්, කරකවන්නටත් විය. මම මගේ ගෙතූ කෙස් වැටිය හිස මුදුනට වෙන්නට බැඳ ගත්තෙමි. වහා වැඩ කිරීම මගේ සහජ පුරුද්දක් වූ, අතර කොණ්ඩය ආරක්ෂිතව සිටින්නට ගැසීම සඳහා කොණ්ඩ කටුවක් ගත්තෙමි. මොහොතකට, අන්

යම් කෙනෙක් මා දෙස බලා සිටියේ ය. අධිෂ්ඨානයෙන් යුතු දැරියක් ඇගේ මුහුණෙහි දැඩි බව තුළින් දුටිමි. එහෙත් ඇය තවදුරටත් එහි නැත. එහෙත් උදෑසන ක්‍රියාකරන ආකාරය මගේ ඇඟිලිවලට තවමත් මතක තිබීම පුදුම සහගතය. මගේ ඇඟිලිවලට, දෑතට, හිස්මුදුනට කර කෙස්වැටිය බැඳගන්නා ආකාරය තවමත් මතකයේ ඇත. සියල්ල තත්පර තිහකින් ක්‍රමානුකූලව කර අවසන් විය. මා පුහුණු කර ඇති පරිද්දෙන්ම එය ක්‍රමානුකූලව සිදුවිය. අන් දේවල් සේම යමක් නියමාකාරයෙන් කිරීම මට පුරුදු පුහුණු කර ඇත. එහෙත් තවදුරටත් මේ ආකාරයට මගේ කෙස් වැටිය සකස් කිරීමේ වුවමනාවක් මට නැත. මම අද වනයේ දුව පැන නොඇවිදිනු ඇත. කෙහෙවැටිය ඇස් වලට වැටෙණු ඇතැයි බියෙන් උඩට කර බැඳීමේ අවශ්‍යතාවක් අද මට නැත. අද මා කරන එකම විධිමත් දෙය කරන්නේ මහන මැෂිමෙන් කරන මැසීමේදී පමණකි. එක වරටම පිඹුරෙක් කුඩයකින් පිටතට පැමිණෙන්නාක් මෙන්, කොණ්ඩා කටුව ගැලවූ විට මගේ කෙහෙ වැටිය පිට මැදට වැටෙයි. උදෑසන කාලය වුවද දැනටමත් මගේ ගෙල පිටුපසට දාහය දැනෙයි.

*

'නවාදිනි' මගේ මව හඬ ගෑවාය. මා මුළුතැන් ගෙයට ඇතුළු වන විට, ඇය බයාදු ලෙස තේ බෙලෙක් කෝප්පයක් මා දෙසට තල්ලු කළාය.

'ස්තූතියි' මගේ හඬෙහි වූ විධිමත් බවට වෛර කරමින් මම පිළිතුරු දුනිමි. 'හොඳට නින්ද ගියාද?' කිසිවක් ඇසිය යුතු වූ බැවින් මම ඇසුවෙමි. අප දෙදෙනා අතර වූ හැම සංවාදයක්ම අවසන වූ නිහඬතාව බිඳින්නට යමක් කිව යුතු විය.

'එච්චර හොඳට නින්ද ගියේ නෑ. අල්ලපු ගෙදර සද්දවලට මගේ නින්ද කැඩුණා. අසරණ කොලුපැටියාගේ කෑගැහිල්ලට මට ඇහැරුණා. නපුරු හීන දැක්කම ළමයි හරියට බය වෙනවා. ඒ පවුලට වෙච්ච දේවල් බැලුවම ළමයා විඳවන එකේ පුදුමයක් නෑ'.

මම කැළඹීමකින් යුතුව කෙළ ගිල්ලෙමි. රෑ කල මට දැනෙන මහත් වූ භය හේතුවෙන් මෙන්ම රාත්‍රී බිහිසුණු ත්‍රාසය නිසා මගේ ගත දහඩියෙන්

පෙඟී යයි. අම්මාගේ නාමයෙන් හැම රැයකම මගේ කෑගෑම් වළකා ගත්තෙමි. මා සිහිනයෙන් විඳින්නා වූ අප්‍රමාණ වද වේදනාවන් ගැන ඇය නොදනියි. මගේ ඇස් යට ඇති කළු රවුම් ඇය දකින්නට ඇත. එහෙත් ඇය කිසිවිටෙකත් ඒ ගැන අසන්නේ නැත. දූනුදු ඇය කුස්සියේ එහා මෙහා ඇවිදිමින් කාර්යබහුලව සිටියි. ඇය සංවාදයක් ගොඩනැඟීමට උත්සාහ නොකිරීම ගැන මම ඇයට කෘතඥ වෙමි. අතීතයේ ජීවත් නොවීම වඩා හොඳය.

දිරාපත් වූ එහෙත් මසන්නට හැකියාව ඇති කාමරය කොනක තිබෙන මැෂිම මත සාරි හැට්ටයක් මා එනතුරු බලා සිටියි.

'මේ ඇඟලුම ඉක්මනට කරලා ඉවර කරන්න ඕන, වාටිය මහන්න විතරයි තියෙන්නේ' මම කියමි.

'ආ හොඳයි, පස්සේ ඉන්ද්‍රකුමාර් නෝනා එනවා හැට්ටේ ගෙනියන්න.' මගේ මව මට සිහිපත් කළාය. 'ඔයාට තව වැඩ එයාගෙන් ගන්න පුළුවන් ද කියලා මම බලනවා.'

'අම්මා, මං ඉන්ද්‍රකුමාර් නෝනාගේ ඔක්කොම හැට්ට ටික ආපහු හරි ගැස්සුවා. ඇයට බැහැ තවත් අපට උදව් කරන්න. මට වැඩ දෙන්න කියලා ඒ අහිංසක නෝනා සල්ලි වියදම් කරන්න සුදුසු නෑ. එයාට එයාගෙම පවුලක් තියෙනවා හිතන්න.'

'මං දන්නෙ නැහැ ගමේ අනෙක් උදවිය එන්නෙ නැත්තෙ මොකද කියලා' මගේ මව කල්පනාවෙන් යුතුව කීවාය. 'ගමේ තියෙන එකම මහන මැෂිම ඔයාගෙ. අනික ඔයාගේ වැඩ හරි හොඳයි. හරි පිළිවෙලයි...!' මගේ ඇස් දෙස බැලිය නොහැකි වුවද, ඇය සිනාසෙන්නට උත්සාහ කළාය. 'මේ සිංහල සොල්දාදුවෝ... ඒගොල්ලො හොඳට ඔයාට ඉගැන්නුවා' ඇය කෙටියෙන් කතාව අවසන් කළාය.

ඔව්, අඩුම තරමින් ඔවුහු එය කළහ. මම දැන් වාටි මූට්ටුව, ඩාට් මැසීම හා මෝස්තර මැසීම, යටි මැස්ම, මූට්ටුව ආදී අනෙක් සියලු ආකාරයේ මැහුම් මසන්නට දනිමි. එහෙත් මම AK 47, අත් බෝම්බ සහ ක්ලේමෝ බෝම්බ ගැනද දනිමි. කැලයේ වැවී ඇති වල් පැලැටි කමින් ජීවිතය ගැටගසා ගන්නේ කෙසේද? යන්න ද මම දනිමි. කසල සහ පෙඳ

පාසි එක්කොට කැලෑ ඇඳුමක් සාදාගෙන මගේ ශරීරය ඉන් ආවරණය කරගන්නා ආකාරයද දනිමි. අන්තරාදායී අකුල් අතරින් කිසිවෙකුට නෑසෙන ලෙසින් හා යුහුසුළුව ගමන් කරන්නේ කෙසේදැයි මම දනිමි. අනෙක් සොල්දාදුවෝ එම පුහුණුව ද හොඳින් මට ලබාදුන්හ.

එහෙත් මගේ නව 'සිවිල්' ජීවිතයට ඒ පුහුණුවෙන් පලක් නැත. ඇඳුමක මැහුම් කිහිපයක් ගැසීමට පුරුදු වීමෙන් මට සාර්ථකව 'නැවත බද්ධ' විය හැකිය.

මගේ කර්කශ සිනාව, අම්මාගේ අප්‍රසාදය මුසු බැල්මකට ලක්වීමට හේතු විය. මගේ මැසීම නිසා පවුලට සහ මට ආදායමක් උපයාගත හැකි වෙයි. එහෙත් මම කිසිවිටෙකත් මහන්නියක වීමට අපේක්ෂා නොකළෙමි. මම කිසිවිටෙකත් සොල්දාදුවකු වීමට ද අපේක්ෂා නොකළෙමි. *එහෙත් එය අනෙක් අතට පෙරලුණු හැටි බලමු.*

කෙසේ වුවද මහන්නෙකුට මහන්නට දේ අවශ්‍යය.

'මං පන්සලේදීත් අහලා බලන්නම්!' මගේ මව මට ඒත්තු ගන්වන්නට මෙන් කියන්නට වූවාය.

'කෙනෙකුට ඇඳුම් පිළිසකර කරගන්නත් තියෙන්න පුළුවන්'.

'එහෙම තිබුණත්, ඒ ගොල්ලෝ ඒවා මට දෙන එකක් නෑ.' මේ වැඩකට නැති පරණ මහන මැෂිමට බොබිනය දැමීමට වෙහෙස වෙද්දී, මගේ හඬ අපේක්ෂා භංගත්වයෙන් රෑරා යෑම ගැන මට කළ හැකි දෙයක් නොවීය.

මෝඩ වෙන්න එපා ළමයෝ' ඇය දොස් නැගුවාය.

'ගමේ මිනිස්සු මං දිහා බලන විදිහ ඔයා දැක්කනේ. ඒ ගොල්ලො මගේ ඇස් දිහා බලන්නේ බොහොම අමාරුවෙන්, කතා කරන්නෙත් අඩුවෙන්. හුඟක් මිනිස්සු මට සලකන්නේ මට මහ ව්‍යාධියක් තියෙනවා වගේ' *'ත්‍රස්තවාදය' ආසාදිත රෝගයක් විය හැකිය.*

'ඔයා හුඟාක් කාලයක් හිටියේ නැහැනෙ. ඔයා හුඟාක් ලොකු මහත් වෙලා. ඔයා වෙනස්. ඔයාව ආයෙම දැන අඳුනගන්න ඒ ගොල්ලන්ට කාලයක් ඕනනේ.'

*'ඒ ගොල්ලන්ටද ඔයාටද අම්මා?'*

'ඒක නිකන්...' මම සුසුමක් හෙළුවෙමි. 'මට ආයෙම මං මෙහෙන් යනකොට හිටිය පුංචි කෙල්ල වෙන්න බැහැ. අම්මට මතක තියෙන, ඔවුන්ට මතක තියෙන ගෑනු ළමයා. මේ තමයි දූන් මම ඉන්න හැටි'

'ඇත්තෙන්ම' අම්මා කොඳුළාය. 'ඔයා වෙන කවුරු වෙන්නද?

*'වෙන කවුරු වෙන්නද ඇත්තටම?'*

*

'මම දන්නෙ නෑ ඔයා මේ තරම් ගාණට මිම්මට මැහුවෙ කොහොමද කියලා.' ඉන්ද්‍රකුමාර් මහත්මිය කණ්ණාඩියෙන් බලමින්, ඇඳුම මහත් සේ අගය කරමින් කීවාය.

'කරන්න ඕන මොකද්ද කියලා දන්නවා නම් ඒක එච්චර අමාරු නැහැ' මම නිරහංකාරව කීවෙමි.

මගේ මව ආඩම්බර බැල්මක් හෙළුවාය. සතුට බිඳක් මා තුළ පුබුදමින් තිබිණි. එය සිදු වී බොහෝ කාලයක් ගත වී තිබුණේය.

'හොඳයි' මේ වගේම හොඳට ඊළඟ ඇණවුමත් ඔයා කරන බව මහ දන්නවා ඒ එක්කම...'

'ඉන්ද්‍රකුමාර් නෝනා' මම බාධා කළෙමි. 'ඔයා මට මෙච්චර උදව් කරලා තියෙනවා දැනටමත්. ඇත්තටම තවත් ඕන නෑ..'

'ඒක මට නොවෙයි අනේ' ඇය ඇඟිලි තුඩු මත සිටගත්තා ය.

'ඒක රාජන්ට. එයා කඳවුරෙන් නිදහස් කරලා'

රාජන්. ඇගේ පුත්‍රයා ගෙදර පැමිණියේය. ඉන්ද්‍රකුමාර් මහත්මියගේ මුහුණ අද උද්‍යෑසන ප්‍රබෝධමත්ව තිබීම පුදුමයට කරුණක් නොවේ. අනෙක් අතට මගේ මව ඒ කතාව ඇසීමෙන් සඟවා ගැනීමට උත්සාහ කළ ද දුර්මුඛ වූ බවක් හොඳින් විද්‍යාමාන විය. මම ඇය සමීපයට ගියෙමි, ඇය වැටෙනු ඇතැයි බියෙන් මම ඇයට ඉඳගන්නට පුටුව වෙත ළං කළෙමි.

'රාජන්' ඇය කොඳුළාය. 'එයා ගෝපාලන්... ගෝපාලන් ගැන මොනවා හරි කිව්වද?'

ඉන්ද්‍රකුමාර් මහත්මිය, සිය නොසැලකිලිමත් කම ප්‍රමාද වී වටහා ගත්තාය. 'නැහැ'... නැහැ. මට කනගාටුයි. එයා කිසිදෙයක් දන්නේ නැහැ. ගෝපාලන් අතුරුදහන් වෙනකොට එයා එහෙ හිටියෙත් නැහැ... ඔයා දන්නවනෙ ඒක.'

'මම දන්නවා, මම දන්නවා.' බලාපොරොත්තු සුන් වූ ලෙසින් මගේ මව හිස සොලවමින් සහතික කළා ය. 'ඒත් ඒ ගොල්ලෝ හොඳම යාළුවො. මං හිතුවා එයා දන්නවා ඇති කියලා...' ඇගේ හඬ ගොත ගැසෙන්නට විය. 'මගේ පුංචි එකා ගැන එයා මොනවා හරි අහලා ඇති' ඇය දැන් පින්සෙන්ඩු වෙයි. 'මොනවා හරි'

'අම්මා' මම හැකිතාක් මෘදු ලෙසින් කතා කළේ, මොහොතකින් ඒ කඳුළු ගංගාව ගලා යනු ඇතය යන සිතිවිල්ලෙනි. 'දැන් අවුරුදු ගාණක්... අපි...'

'ඒ ඔයාගේ සහෝදරයා! කොහොමද ඔයාට එයාව නිකම්ම අමතක කරලා දාන්න පුළුවන්?' ඇගේ වදන් රිදුම් දෙන්නට විය.

'මං අමතක කළේ නෑ. මට කවදාවත් එයාව අමතක කරන්නත් බෑ. අපි එයාගෙ මතකය හිතේ තියාගන්නවා නම්, එයා හැමදාම අපි එක්ක ඉඳීවි'

'ඒත් එයා කොහේ හරි ඉන්නවා නම්.' මගේ මවගේ දෙනෙත් නිරර්ථක විශ්වාසයකින් දිදුලන්නට විය.

එහිදී ඉන්ද්‍රකුමාර් මහත්මිය ඉදිරිපත් වූවාය. 'අපිට තව පැමිණිල්ලක් දාන්න පුළුවන්. මං එන්නම් ඔයත් එක්ක යන්න'

'අපි පැමිණිලි මහ හුඟාක් දැම්මා. කවුරුවත් ගණන් ගන්නෙ නෑ. ජෝශප් හමුදා කඳවුරේ හැම සොල්දාදුවා ළඟටම ගිහින් මම කතා කළා. මගේ පුතාට මොනවා වුණාද කියලා මං තාම දන්නේ නෑ. එයා දේශපාලනයක් කළෙත් නෑ. එයා රාජනුයි අනෙක් ළමයිනුයි එක්ක කොටින්ට එකතු වුණෙත් නෑ. එයා ඒකට කොහෙත්ම සම්බන්ධ වුණේ නෑ. එයාට ඕන වුණේ එයාගේ අධ්‍යාපනය ගැන හිත යොමුකරන්නයි.'

'අම්මා, කවුරුත් දැකලා නෑ' ඇයට එය තේරුම් කරදීම සඳහා මම එසේ කීවෙමි. 'රාජන්ව අරගෙන ගියා වගේ එයාව සොල්දාදුවෝ රඳවා ගැනීමේ කඳවුරට අරන් ගියෙත් නෑ. එයා නිකම්ම අතුරුදහන් වුණා'

'මට එයාව ආරක්ෂා කරගන්න තිබුණා' මගේ මව අඳෝනා නඟයි.

'ඔයාට කරන්න පුළුවන් හැමදේම ඔයා කළා' ඉන්ද්‍රකුමාර් මහත්මිය නිෂ්ඵල ලෙසින් මගේ මවගේ අතට තට්ටු කරමින් කීවාය.

මගේ මව හෙලන හැම කඳුලක්ම දැනටමත් බිඳී විසුණු වී ගිය මගේ ස්නායුන් කෝපයට පත් කරවයි. මේ දර්ශනය මගේ නපුරු සිහිනයන්ට සමාන විය. එයින් මගේ දුක හා වේදනාව දෝංකාර දුන්නේය. කොතැනක හෝ තවත් මව් කෙනෙකු, තවත් දරුවකු වෙනුවෙන් හඬන බව, වැළපෙන බව මම දනිමි. ඒ වෙනුවෙන් චෝදනා ලැබිය යුතු එකම තැනැත්තිය මා බවද මම දනිමි. මට සමාව දීමට, කිසිදිනෙක මට නොහැකිවනු ඇත.

'අපිට ඒක ඒ විදියට භාරගන්න වෙනවා' මම කියමි, මගේ හඬ වියලි සහ වෙහෙසකර එකක් විය. 'අපි දන්නේ නෑ එයාට මොකක් වුණාද කියලා. අපිට කවදාවත් දැනගන්න ලැබෙන එකකුත් නෑ.' මගේ හිස්කබලෙහි දැනෙන පීඩනය සමනය කරගැනීම සඳහා මම මගේ ඇඟිලි වලින් නලල තෙරපු වෙමි.

'නෑ, මට ඒක විශ්වාස කරන්න බෑ' මගේ මව විරෝධය දක්වමින් පිළිතුරු දුන්නාය.

'මට අවතාර පස්සේ එළව එළව ඉන්න බෑ' යි කී මම වහ වහා කාමරයෙන් ඉවත් වීමි.

'නවාදිනි...' ඇය මා නවත්වන්නට උත්සාහ කළාය. ඇගේ හඬ කර්කෂ විය, කලබලය නිසා දෑස් දැඩි විසල්ව තිබිණි. 'නවාදිනි, ඔයා කොහේද යන්නේ ?'

'නිකම් එළියට... එළියට! ඒක අපරාධයක්ද?'

ඉන්ද්‍රකුමාර් මහත්මිය දොර ළඟදි මා නැවැතුවාය. 'නවාදිනි, ඔයා දන්නවනෙ ඔයා තනියම නොයා යුතුයි කියලා'

මගේ අත ඇගේ ග්‍රහණයෙන් ගලවා ගෙන, මම යන්නට වීමි, මගේ මව මා ගේට්ටුවෙන් පිටව යන තුරු ඉකිබිඳිමින් මා පසුපස පැමිණියා ය.

*

අපවිත්‍ර මාර්ගය මා ඉදිරියේ දිවෙයි, උස තල් ගස්වල ගාම්භීර බවෙහි සෙවනැලි පාර හරහා වැටී ඇත. කුරුල්ලන් පමණක් තනි නොතනියට සිටින විට මම කිසියම් සැනසීමක් ලද්දෙමි. කුරුල්ලන් මා විනිශ්චය කරන්නේ නැත. කුරුල්ලෝ සතුරු සැකයකින් යුතුව මා දෙස නොබලති. ඔවුන් වෙනුවෙන් යුද්ධය දිනා ගැනීමට අසමත් වුයේය යන බලාපොරොත්තු කඩවීමෙන් යුතුව ඔවුහු මා දෙස නොබලති. දරන ලද ප්‍රයත්නයේ දී හැකි සෑම දුරක්ම යාම සම්බන්ධයෙන් කෝපවන්නේ නැත. ජයග්‍රහණය සඳහා කරන කැපකිරීම උත්කර්ෂවත්ය. එහෙත් පරාජයේදී එය අපතේ යැවුණු ඛේදාන්තයක් පමණකි. මා දෙස බලන චෝදනාකාරී ඇස් වලින් මම එය හොඳින් දකිමි. නොමැරී ජීවත් වීම මට නම් දඬුවමකි.

මගේ මවගෙන් ඈත්ව පළා ඒම ගැන මම කෝප වූයෙමි. එහෙත් පිටතට පැමිණීම හොඳ බව හැඟෙයි. මගේ නිදහසෙන් කූඩුවෙන් නිදහස් වීම, ඇගේ ආවෘති භීතිකා කරදරයෙන් ඈත්වීම, මගේ සහෝදරයාගේ ප්‍රාදුර්භූත වන මායාවෙන් නිදහස් වීම මගේ හිතට සහනය දනවයි. මම මා සමග බොහෝ භූතයින් කැටුව යමි, මගේ සිත සොහොන් බිමක් වැනිය. නින්දේදී මම ඇති තරම් මළ මිනිසුන් දකිමි. අවදියෙන් සිටින විටද මට ඔවුන් සමග ගමන් කළ නොහැක. එහෙත් මට මගේ මවට චෝදනා කළ නොහැකිය. පියා මිය යාමෙන් හා මා වෙන්ව යාමෙන් පසුව, ඇගේ ලොව බොහෝ කලක් සිටි එකම ජීවියා ගෝපාලන් පමණි. මා අහිමි වීමෙන් ඇයට රිදුම් ලැබුණේ නම්, ගෝපාලන් අහිමි වීම ඇයට මියෙන්නට තරම් හේතුවක් වනු ඇත.

ඔවුන්ගේ දරුවකුට වඩා කලක් ජීවත්වන මව්පියෙක්! එය ස්වභාවික න්‍යායට එරෙහි දෙයකි. එහෙත් යුද්ධය එබඳු බොහෝ දේ කළේය. ඒ කෝපයේ යාන්ත්‍රණය පෝෂණය කිරීම මගේ පාර්ශවයෙන් කෙරුණේය. මගේ සහෝදරවරුන් කළාක් මෙන් මා කිසිවිටෙකත් ගණන් මිනුම් තබාගෙන නැත. එහෙත් මගේ ශ්‍රමයෙහි ඵල බොහෝ වූ බව මම දනිමි.

ක්‍රියාශූර නොවූයේ නම් මා නිකමෙකි. බොහෝ පිරිමි, හමුදා සොල්දාදුවන්, එහෙත් අනෙක් අයද ඇතුළුව, හැම වයසකම, හැම ප්‍රමාණයකම, හැම ආගමකම, හැම පසුබිමකම, අයද එසේය. යුද්ධය කිසිවක් වෙනස් කොට සලකන්නේ නැත. අනෙක් පස සිටින සියලුම දෙනා එක සමාන සතුරෝ ය. ශක්තිමත් පුද්ගලයා ඉතිරි වෙයි. එක්කෝ තමන් මැරෙයි. නැත්නම් අනිකා මැරෙයි.

හැම දෙනාගේම අත්වල මඩ ගෑවී ඇති විට, කැලැල් පෙනෙන්නේ අඩුවෙනි.

ව්‍යාපාරයක හැමදෙනාම, අපි ව්‍යාජ නිර්භීතකමකින් මුවා වී සිටියෙමු. මුළුමනින්ම, ව්‍යාපාරයේදී අපි නිර්භීතකමෙහි සළු පොරවාගෙන සිටියෙමු. අපගේ අරමුණ පිළිබඳ දැඩි මතධාරී වීමු. අප වෙළාගෙන තිබුණු බිහිසුණු සෙවනැල්ල පිළිබඳ ප්‍රමෝදයට පත් වීමු. හැම බඳවා ගැනීමේ ක්‍රියාවලියකදීම, හැම මෙහෙවරකදීම, නම් අමතක කිරීම පහසු විය. මරාදැමීම සඳහා යැවුණු බැටළු පැටවුන්ගේ මුහුණු අමතක කිරීම පහසු විය. සිතනවාට වඩා, හැඟීම් දැනීම් වලට වඩා ක්‍රියාකිරීම සහ අණට කීකරු වීම පහසුය. ඒ සියල්ල මට තේරුම් යන්නේ අද ය. අම්මාගේ ශෝකයෙන් දැවුණු මුහුණෙහි එය දස ගුණයකින් ප්‍රතිබිම්බ වෙයි. දැන් මගේ සිතෙහි ලිය වී ඇති, ගොදුරු වූවන්ගේ නම් සහ මුහුණු සොහොන් ගල් මෙන් මට හමුවෙයි. හැමටම වඩා, අනෙක් අයට වඩා මගේ සිහිනයන්හි නිතර හොල්මන් කරන කුඩා දැරිය විද්‍යා මට හමුවෙයි.

ඇගේ කඩමාලු රෙදි බෝනික්කා වෙනුවට රයිපලය ඇය අතට පත්කළ විට, මා ඇය මරණ දඬුවමට කැප කළ බව මම තිර වශයෙන්ම දැන සිටියෙමි. පුහුණුවක් නැත, අඩුතරමින් පතරොම් ඇතුළු කරන්නේ කෙසේද හෝ වෙඩි තබන්නේ කෙසේද යන්න පෙන්වා දීමට හෝ වේලාවක් නොතිබිණි. එකල වෙඩිඋණ්ඩ, රත්තරන් වලට වඩා බෙහෙවින් වටිනාකමක් ගත්තේය. ඇගේ හෙල්මටයේ පටි තදකිරීම සඳහා වැරෙන් ඇද්දේ ඇය විසින් කරනු ලැබිය හැකි සියලුම හොඳ දේ සඳහා සැලකුම් කරන්නට මෙනි. අනතුරුව ඇය මා ඉදිරියට තල්ලු කළේ, ඇගේ කුඩා සිරුර මා සහ විනාශකාරී ප්‍රහාරය අතරට දමන්නට මෙනි. අවසානයේදී, හාත්පස ජරා ධූලි වී, එහි දුම් රොටු හා අත් පා එස වූ විට, ඇය එදෙස බලන්නට ආපසු හැරුණාය, ඇගේ ඇස් පිරිසි තරම් විසල්ව තිබිණි. ඒ

කෙටි මතකය එකල මට දැඩිව පහර දුන්නේය. එවකට ගෝපාලන් කුඩා වියෙහි වූයේ ය. ඔහුට පා නගා ඇවිදීමටද පුළුවන් කමක් තිබුණේ නැත. අපගේ පියා එකල, විදුලිය විසන්ධි කළ අවස්ථාවෙහි භූත කතාන්දර කීවේය.

'නවාදිනී'

මගේ අත ගැහෙන්නට විය. සුළු චලනයකින් මම යථා තත්වයට පත්වීමි. මා පය යට විශ්වාසදායී ලෙස ශක්තිමත් පොළව ඇති බව නැවත වරක් මට දූනේ, මම මගේ උගුරෙහි සිර වී තිබුණු හුස්ම පිට කළෙමි.

'නවාදිනි'

මේ හුදකලා මාර්ගයෙහි මගේ නම කියනු අසන්නට මම බලාපොරොත්තු නොවීමි. මම හෙමින් හැරුණෙමි. තවමත් තෝන්තුවාවෙන් යුතුව ඔහුගේ කීරි හඬ නගන බයිසිකලයෙහි නැග සිටින ලියුම්කරු ප්‍රදීප් දෙස බලන්නට හැරුණෙමි.

'හලෝ' මම තරමක අඩමානයෙන්, කාරුණිකව කතා කළෙමි. මා ආපසු පැමිණීමෙන් පසුව මා සාකච්ඡාවලට පුරුදුව සිටියේ නැත. මා කතා කළේ මගේ මවට හා මගේ පාරිභෝගිකයන් කිහිප දෙනෙකුට පමණකි. (එය ඉන්ද්‍රකුමාර් මහත්මියට පමණක් මූලිකව සීමා විය.) එහෙත් අප නිවසට ඉඳ හිට ලැබෙන ලිපියක් දෙන්නට පැමිණි විට ඔහුගේ මුවෙහි හැම විටම මා සඳහා සිනහවක් තිබිණි.

'ඔයා ගම් ගොඩ පැත්තට යනවාද?' ඔහු ඇසුවේය. 'අපි ඔයාව නිතර දකින්නේ නැහැනෙ එහෙදි'

මම අපහසුතාවෙන් එහා මෙහා වීමි. 'නෑ මගේ අම්මාට ඕන මං ගෙදර ඉන්න. ඇය... ඇය ගෙදර තනියම දාලා යනවට කැමති නෑ'.

ඔහු අවබෝධයෙන් යුතුව හිස සැලුවේය. අනතුරුව මගේ මවගේ සෞඛ්‍ය තත්ත්වය ගැන කාරුණිකව විමසුවේ ය. මම ඇගේ බිරිඳ, මේනකා, මා සිතන්නේ ඇය අමතන්නේ එලෙසිනි, මම ඇය ගැන ඇසුවෙමි.

'එයා හොඳින් වැඩ කරගෙන ඉන්නවා, ස්තූතියි ඔයාට. අන්තිමේදී

එයාට ඉස්කෝලෙට යම් දේවල් ටිකක් ලැබුණා. ඒක හින්දා හිතනවා එයාට ඉක්මනින්ම පාඩම් පටන් ගන්න පුළුවන් වෙයි කියලා. හුග කාලයක් ගියානේ. එයාගේ පන්ති ඉස්සර වගේම පිරෙන එකක් නෑ ඇත්තටම'

මම හිස සෙලවීමි. නපුරු බවක් නොපෙනෙන්නට සාකච්ඡාව අවසන් කිරීමේ මගක් මම සිතමි. මාර්ගය පාළුවට ගොසිනි, එහෙත් බියෙන් යුතුව වට පිට බැලීම මට පාලනය කර ගත නොහැකි විය. කටකතා පැතිර යාමට අනුබල දීම මට කළ නොහැකිය. ලියුමක් බෙදන්නට අප නිවසට පැමිණි ඔහු සමග සුහදව වචනයක් කතා කිරීම එකකි. එහෙත් ජනශුන්‍ය මාවතක, තනිවම භාරකරුවකු නොමැතිව, සාකච්ඡා කරමින් සිටීම තව එකකි. මම දැනටමත් 'කොටියකු' වීමේ ලේබලය ගසාගෙන ඇත්තෙමි. 'පිස්සු ගැහැණියක්' යන්නෙහි අමතර බරද දරා ගන්නට මගේ උරහිස් වලට ශක්තියක් ඇතැයි මම නොසිතමි.

ඔහුට ස්තුතිවන්තනට, සම්පූර්ණයෙන්ම අහිංසක අපගේ සාමිචියෙහි අයෝග්‍ය බව ඔහුට තේරුම් යන්නට ඇත. ඔහු කාරුණිකව කතා කළේය. 'මං යමින් ගමන්. රාත්‍රී කෑමට මං පරක්කු වෙන එක මේනකාට පෙන්නන්න බෑ.'

'ඔව් මගේ අම්මත් මං කොහේද කියලා බලනවා ඇති' මම කීවෙමි.

'ඇත්තෙන්ම. පරක්කු වෙලා පාරේ නොඉන්න එක වැඩිය හොඳයි'.

'ආ, ඉන්ද්‍රකුමාර් නෝනා ඇඳගෙන හිටපු සාරි හැට්ටෙ මේනකා හරියට අගේ කළා. ඇය කිව්වා සම්පූර්ණ ගෞරවය ඔයාට යන්න ඕන කියලා' ඔහු බයිසිකලයට පා තබා පැද්දෙමින් සහ එය තල්ලු කරමින් සිටින අතරෙහි ඔහු නිකමට මෙන් කීවේය.

'ඔයාට ඉස්කෝලේ යුනිෆෝම් මහන්න පුළුවන් වෙයි!' උරහිස් හරවා ඔහු කීවේය. ඔහු යන විට පැරණි දමිළ චිත්‍රපටයක ගී තනුවක් තමාටම මුමුණා ගත්තේය. මගේ දර්ශන පථය අඳුරු කළ අතීතයේ බර වළාකුළු ඉවත්ව ගියේය. මම නැවතත් කුරුල්ලන් සමග තනි වීමි. මේ අනපේක්ෂිත කාරුණික බවින් ඔවුන්ගේ ගීතිකාවන් හදිසියේම තීව්‍ර විය. කුඩා ගමන් මලු අතැතිව සිටින පිරිමි ළමුන්ද, සිය කොණ්ඩා කරල් අග දිලෙන රතු පීත්ත පටි බැඳ සිටින ගැහැණු ළමුන්ද මවා ගන්නට මම මට

ඉඩ දුනිමි. මා සැකසූ නිල ඇඳුම් සහිතව පරෙවි රැනක් ද පාසලට යන ඒ මාර්ගයෙහිම ගමන් කරමින් සිටියි.

*

මගේ හුදකලා ගමනෙහිදී වේලාව පිළිබඳ හැඟීම මගෙන් ගිලිහී ගියේය. මගේ සමෙහි ගැටුණු හිරුගේ උණුහුම් ආලිංගනය මට දැනෙන්නට විය. මම මගේ දෙපා සෙලවීමි. බොහෝ වේලාවක් උදාසීනව වැතිර සිටීමෙන් පසුව කරන යම් ශාරීරික අභ්‍යාසයක් සාමාන්‍යයෙන් කෙරෙන චලනයන් අහිමිව තිබූ මගේ මස්පිඩුවලට කිසියම් සැහැල්ලුවක් ලබා දෙනු ඇත. ඒ පෙළඹවීමෙන් යුතුව, මම දුවන්නට වීමි. මගේ දෙපා පොළවෙහි ගැටුණු අතර, මගේ දෑත් ක්‍රමානුකූලව ඉහළ පහළ ගියේ, පිස්ටනයක් සේ මා ඉදිරියට ගෙන යමිනි. මා සජීවි බව මට දැනිණි.

මට ඒ හඬ ඇසුණේ එවිටය. ඒ වාහනයක මහ හඬය. එය අපගේ දිස්ත්‍රික්කයේ ඉතා අමාරුවෙන් ගමන් ගන්නා බස් කිහිපයෙන් එකක් නොවන බව පෙන්නුම් කෙරෙන අකාරයෙන් ධාවනය වූයේය. එය හමුදා ජීප් රථයක් විය යුතුය. මෙහි ධාවනය වන අනෙකුත් වර්ගයක එකම වාහනය එයයි. යළි ප්‍රකෘති ස්වභාවයට පැමිණෙමින්, වටාපිටාව දෙස බලමින්, මම වහා නැවතුණෙමි, එහෙත් එක දිගට විහිදෙන මහාමාර්ගයෙහි ක්ෂේමභූමියක් දකින්නට තිබුණේ නැත. ජීප් රථය ළං ළංව පෙනුණු අතර මම එමගෙහි සිරවී සිටියෙමි. සැන්දෑ එළිය මියැදෙමින්, දිගු සෙවනැලි මා වටා පතිත වෙමින් තිබියදී මා ඉතා අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇති බව මට දැනී ගියේය. පැයකින් ප්‍රමාද වන්නට ඉඩ හැර ඇති බව දැන දැනම, මා, මගේ අරමුණක් නැති දවල් සිහින දැකීම ගැන මටම සාප කරගත්තෙමි. මේ හැඟීම මා තුළ ඇති වූයේ, සැබවින්ම මගේ 'වෘත්තිය' අනුව, මට ඇවැසි වේලාවට නිවසෙහි සිට වැඩකිරීමට ඉඩ ලැබෙන බැවිනි. එහෙත් දැන් මම අනෙක් දැරියන් දිනපතා මුහුණ දෙන තර්ජනයට මුහුණ පා සිටිමි. මුග්ධ නිර්භීත කමකින් මා අපගේ නිවසින් පිටතට එන විට මගේ මවගේ දෑසෙහි නැගුණු භීතිය කුමක්දැයි දැන් මට සිහිපත් වෙයි.

වාහනය මීටර් කිහිපයක් පමණ දුරින් පැමිණෙන විට පොදු බසක් හා සංස්කෘතියක් බෙදා හදා ගත් නිසා වූ ඉතා සමීප ඇඟලුම්කමකින් එකිනෙකාට සරදම් කර ගන්නා සොල්දාදුවන් දෙදෙනෙකුගේ හඬ මගේ

සවනත වැකිණි. ජීප් රථය නවත්තන්නට තිරිංග තද කරන විට දූවිලි වළාවක් මා වටා නැගුණේය, ඒ සමගම මිනිසුන් දෙදෙනා මතු වූහ. දෙදෙනාම හැඩිදැඩිය. මාංශ පේශී ශක්තිමත් ය. වඩාත් වැදගත් දෙය නම් ඔවුහු ආයුධ සන්නද්ධව සිටියහ. කඩිසර කම සහ වේගය මගේ පාර්ශවයෙහි තිබුණ අතර, නිසැකයෙන්ම ශක්තිය තිබුණේ ඔවුන්ගේ පාර්ශවයෙහි ය. එබැවින් දිවීමේ හෝ විරෝධය පෑමේ ඵලය කිම? නාගයන් පිරිවරාගත් රාක්ෂණියගේ හිසෙන් මතුවන නාගයින් මෙන් හමුදා කඳවුරේ තව හමුදා භටයින් ඔවුන්ගේ සහායට පැමිණෙනු ඇත. තවමත් සැසඳීමෙන් මට මා වළකා ගත නොහැකිය.

මගේ හදවතට නිසල වන්නැයි මම අණ දුන්නෙමි. *'ඔවුන්ට බය වූ වග පෙන්වන්න එපා. එතකොට ඔවුන් ඔබව අල්ලා ගනීවි.'*

'මේ පටු මගේ කෙළවරේ ඉන්න ගෑනු ළමයා ඔබ නේද? නවාදිනි තංගරාජාද?' එකෙක් අසයි. මගේ දෑස් පුළුවන් තරමට බිමට නැඹුරුකරගෙන මම හිස සැලුවෙමි. ' ආ එහෙනම් ඔයා අපේ ගමන් දුර අඩු කළා. අපි මේ ඔයාව බලන්න යන ගමන්'

ඔහුගේ හඬෙහි සැහැල්ලු බවින් මම විමතියට පත්ව, අවදානම මැද වුවද ඔහු දෙස බැලුවෙමි. ඒ හඬ බොහෝ මිත්‍රශීලිය. මේ සොල්දාදුවා විශිෂ්ට ශ්‍රී ලංකා හමුදාවෙහි විජයග්‍රහණයෙන් සහ ගෞරවයෙන් ආකර්ෂණය වී ඇති බවට සැක නැත. බොහෝ විට ඔහුගේ විවාහ අපේක්ෂාවන් වර්ධනය කරගැනීමට අපේක්ෂා කරනවා විය හැකිය. හැම සිංහල දැරියකම සොල්දාදුවකු හා විවාහ වීමට කැමති වනු ඇතැයි මම කැට තබමි. අනෙක් අතට, ඔහුගේ වැඩිමහල් සොල්දාදු සගයා යුද්ධයෙහි රළු පරළු වී ඇති රළු පෙනුමක් ගත්තේය. ඔහු කැලෑ ඇඳුම ඇඳගෙන සිටියේ බොහෝ පහසුවට ඔහුගේම දෙවෙනි හමක් ලෙසිනි. සාමාන්‍ය සිවිල් ඇඳුම් ඇඳගත් විට ඔහු වෙතින් වඩා අපහසුතාවක් දිස්වනු ඇතැයි මම සැක කරමි. හරියට මං වගේ.

'මොකක් හරි ප්‍රශ්නයක් ද සර්? ' මා එසේ ඇසුවේ කුමක් නිසාදැයි මට නොවැටහිණි. මේ, මේ මාසයටම සොල්දාදුවන් මා හමුවන්නට පැමිණි තුන්වැනි අවස්ථාවයි. එහෙත් මා මගේ කොටස රඟ පෑ යුතුය.

'නෑ මුකුත් ප්‍රශ්නයක් නෑ. අපිට සහතික කරන්න ඕන අපේ වාර්තා යාවත්කාලීනද කියලා.' ඔහු ඔවුන් සැමදෙනා නිරන්තරයෙන් භාවිතා කරනා එකම වගන්තිය භාවිතා කළේය. වාර්තා පරීක්ෂාව. උවදුරක් නැත. අඩු තරමින් දැනට

'ඔයා පුනරුත්ථාපනේ හිටියා'

'ඔව්, මාව නිදහස් කළා. 2012 අගෝස්තු 15 වැනිදා' අකුරටම සත්‍යයකි. මේ හොඳින් පුහුණු වූ අත් පිටපතකි.

'ඇයි ඔයා කොටින්ට එකතු වුණේ ?' ඔහුගේ සගයා නිහඬව මගේ මුහුණ සියුම් ලෙස පරීක්ෂා කරන අතර හෙතෙම එසේ ඇසුවේය.

'මට වෙන කරන්න දෙයක් තිබුණේ නෑ'

'ඉතින් ඔයාට බැඳෙන්න බල කළා ?'

'ඔව්' *එය සරලව තබමි. ඔවුන්ට වටහාගත හැකි එකම දෙය එපමණකි. නිරපේක්ෂවම.*

ඔහු බලාපොරොත්තු සහගතව මා දෙස බැලුවේය. ඒ විවේචනාත්මකව නොව සරල හා නිර්ව්‍යාජ කුතුහලයකින් බව පෙනිණි. නිහඬතාව තර්ජනයක් තරමට බලපෑම් කරන සුළු විය හැකි බව පෙනිණි.

'ඒ ඉන්දියානු හමුදාව ආපු කාලෙ වගේ. මං එතකොට පොඩියි. ව්‍යාපාරෙට බඳවා ගැනීම් කරමින් හිටියේ. ඒ ගොල්ලෝ හැම පවුලකින්ම සමාජිකයෙක් ඉල්ලා සිටියා' කතාවේ මේ පැත්ත එකල මෙකල කළයුතුදැයි සිතමින් මම අඩක් අකැමැත්තෙන් සහ අඩක් ප්‍රයෝගකාරී ලෙසින් කීවෙමි. අහිංසක සිවිල් වැසියකුගේ භූමිකාව ඇය ප්‍රිය නොකරන ජීවිතයකට තල්ලු කරදමා ඇති සෙයකි. කෙසේ වුවද එය සත්‍යයෙන් බොහෝ ඈත නොවේ. අපට ඔවුන් ඉල්ලා සිටින රන් පවුම් දෙකක් හෝ රුපියල් හයදහසක් ලබාදීම දුෂ්කර වූයේය. ප්‍රතිඵලය එනතුරු විරාමයක්. අනතුරුව, එය රහසක්. 'අපිට මිනිස්සුන්ගෙන් ගෙවන්න වුණා'

උඩ බැලූ විට මට තරුණ සොල්දාදුවාගේ මුහුණෙහි සිත්තම්ව තිබූ ව්‍යාජ බව දකින්නට ලැබිණි. *මා රංගන ශිල්පිනියක විය යුතුව*

*තිබිණි.* ඔහුගේ අත්දැකීම් ඇති සහෝදරයා හෙලවුණේ නැත. එහෙත් ඔහු ප්‍රේක්ෂකයාය. 'ත්‍රස්තවාදින්ගේ' කෲර බව ඔහු කෝප ගන්වයි. ඔහු සමහර විට මේ කතාව මීට පෙර අසා තිබෙන්නට ඇත. ඔහුට කා වැද්දූ සමස්ථ ප්‍රචාරණයේම කොටසක්. මම ඔහුගේ අහිංසකකමට සිනා නොවී සිටීමට උත්සාහ කරමි. ඔහු වැරදි වෘත්තියක් තෝරාගෙන ඇත.

'ඔයා පවුලේ එකම ළමයා, ඒත්, ඒ ගොල්ලො ඔයාව අරගත්තා?' ඔහු ඇසුවේය. ඒ ප්‍රශ්නය මගේ මානසික සහනය අත්හිටුවීමට හේතු වූ අතර, සෝදිසියෙන් සිටීමට එය මට සිහිපත් කළේය.

'නෑ. මට සහෝදරයෙක් සිටියා. එතකොට එයා පොඩි ළමයෙක්'

ඒ දොර වසා දැමීම වඩා හොඳය. මගේ සහෝදරයා සහ ආදරණීයයන්, සොල්දාදුවන්ට අල්ලා ගත නොහැකි වන සේ මගේ හදවතෙහි ඈතම තැනක අගුලු ලා තැබීම වඩා හොඳය. එවැනි තොරතුරු කාරණා ඔවුන් දැනගැනීම අවශ්‍ය නොවේ. කණ්ඩායම් දෙකක් අතර ඇති වූ සටනකට මගේ පියා මැදි වූ බව, කොටින් සහ ඉන්දියානු හමුදා සොල්දාදුවන් අතර ඇති වූ සටනකදී එයට මැදිව එයින් මිදෙන්නට උත්සාහ කළ මගේ පියාණන් වෙඩි උණ්ඩයක් වැද මිය ගිය බව, 'කොල්ලන්' පැමිණ දොරට තට්ටු කර, අප ඉහළ මිලක් ගෙවිය යුතු යැයි ඉල්ලා සිටි බව' ඔවුන් දැනගැනීම අවශ්‍ය නැත. ගෝපාලන් මටද වඩා වයසින් අඩුය. ඔහු ප්‍රියමනාප යහපත් ගති ඇති ළමයකු වූයේය. ඔහුට මගේ මව අවශ්‍ය විය. ඇයට ඔහු අවශ්‍ය විය. මම ගෝපාලන් වෙනුවෙන් ඉදිරිපත් වූවෙමි. එසේ වූ විට පිරිමියෙකු අප නිවසට ඉතිරි වෙයි. (හොඳයි, පිරිමි ළමයෙක්) අපගේ මව රැකබලා ගන්නා පිරිමියෙක්, අපගේ පවුලෙහි නම මතුවට රැගෙන යන පිරිමියෙක් සිටිනු ඇත.

මේ දර්ශන තලය විසින් ඉල්ලා සිටිනු ලබන අකර්මන්‍ය වෙස්මුහුණෙහි මගේ මුහුණ තබා ගන්නටද යම්තමින් අරගල කරමින්, මම පසුබිම මහත් ඕනෑකමින් අධ්‍යයනය කළෙමි. තරුණ සොල්දාදුවා ද සැනෙකින් සිතිවිලිදාමයක පැටලී සිටිනු පෙනිණි. සමහර විට ඔහුගේම සොහොයුරකු සිහිවන්නට ඇත. පළමුව වැඩිමහලු, තැනැත්තා ලෙසින් වන වගකීමද සිහිපත් වන්නට ඇත. දුම්වැටියක් දල්වාගෙන එහි දුම තදින් අදින ඔහුගේ උසස් නිලධරයාගේ

නොඉවසිලිමත් කෝපය, තරුණ පුද්ගලයාට මේ මුහුණ දී ඇති තත්ත්වයට අප්‍රමාදව එක්වන ලෙස කළ පෙළඹවීමක් බඳු විය. සිය උගුර පාදමින් ඔහු තවදුරටත් කතා කළේය. 'ඔයා ඇයි එච්චර කාලයක් එහෙ හිටියේ?'

*දුන් ප්‍රවේශම් වන්න.* දෑතෙහි එක්ව තිබූ ඩා බිඳු පිස ගැනීමට මම මගේ ඇඳුම අල්ලා ගත්තෙමි. මා එහි කෙතරම් හොඳින් වැඩ කළේද යන්න මට ඔවුන්ට කිව නොහැකිය. හදිසියේ මා ඉදිරියට විවර වූ ද්වාර හේතු කොටගෙන මා කෙතරම් සතුටු වූයේ දැයි ඔවුන්ට කිව නොහැකිය. මගේ පවුලේ උදවිය අපේක්ෂා කළාට වඩා වෙනස් වූ අධ්‍යාපනයක් ලැබීමට ලැබුණු අවස්ථාවෙන් මා කෙතරම් ගැඹුරු සතුටක් ලැබුවාදැයි කිව නොහැකිය. මගේ සමාජ ප්‍රජාවේ ගැහැණිය උදෙසා ප්‍රතික්ෂේප කරන ලද නිදහස ආශ්වාදයෙන් යුතුව විඳ දරාගත් බව ඔවුන්ට කිව නොහැකිය.

'මට... මට අතෑරලා එන්න බැරිවුණා. ඒ ගොල්ලෝ මට ඉඩ දුන්නේ නෑ'

මගේ කතාවේ සත්‍යය, ඔවුන්ගේ නිරීක්ෂණයෙන් කිරා මැන බලන්නට මෙන් සොල්දාදුවෝ මොහොතක් එකිනෙකා දෙස බැලූහ. මේ නිල නොවන පරීක්ෂාවන්ට භාජනය වන හැම දමිළ ජාතිකයකු විසින්ම වමාරන, ව්‍යාජ පිළිතුර එයයි. අනුගාමිකයා සහ බලහත්කාරයෙන් බඳවා ගත් අය අතර වෙනස කෙනෙක් හඳුනාගන්නේ කෙසේද?

'දැන් මොනවද ඔයා කරන්නේ ?' දෙදෙනාගෙන් බාල සොල්දාදුවා ඇසුවේය.

'මම මහනවා. මට මේ පුහුණුව ලැබුණේ පුනරුත්ථාපන කඳවුරේ දී. මං ඒ ගැන බොහෝම ස්තුතිවන්ත වෙනවා.' මා මේ ප්‍රතිචාරය මුසු කළේ බෙහෙවින් නිර්ව්‍යාජ හැඟීමකින් යුතුවය. එමඟින් මා පළමුව දුන් පිළිතුරුවලටද විශ්වසනීය බවක් එක්වනු ඇතිය යන අපේක්ෂාවෙන් යුතුව මම මේ ප්‍රතිචාරය දැක්වූයෙමි.

'ආ හොඳයි. ඒක හොඳයි ඒගොල්ලෝ ඔයාට ප්‍රයෝජනවත් යම් දෙයක් උගන්නපු එක' ඔහු අකාරුණික නොවන සිනාවක් පෑවේය. ඔහු දැනට ප්‍රශ්න කිරීම අවසන් කර ආපසු යන්නට හැරුණේය. මගේ පෙනහළු වලින් සැනසුම් සුසුමක් නගින්නට ආසන්න වුවද, ඒ සැනසුම් හුස්ම පොද

හෙළන්නට පෙර, පළමු වතාවට වැඩිමහල් සොල්දාදුවා ගල් බොරළු වැනි රළු හඬකින් කතා කළේය.

'මේ ඇඳුම මැහුවේ ඔයාද?' කරදරකාරී මැස්සෙක් ඉවත් කරන්නාක් මෙන් සිය සිගරැට් කොටය වීසි කළ සොල්දාදුවා, ඇඳුමෙහි කොලරය අල්ලා ගැනීමට සමීපයට පැමිණියේය. 'ඒක... ලස්සනයි' ඔහුගේ අත ඉතා දිගු වේලාවක් එහි රැඳිණි. ඔහුගේ ඇඟිලි මගේ පපුවට අඟලක් පමණ දුරින් තිබිණි. මගේ හදවත වියරුවකින් මෙන් වෙන් වෙන්ව මගේ ඉළ ඇටවලට පහර දෙන හඬ දැනගැනීමට ඔහුට හැකිවන්නට ඇත. 'හරි ලස්සනයි'

ඔහුගේ සගයා සිනාසුණේය. 'මොකද, එයාට කියලා ඔයාටත් ඇඳුමක් මහගන්න ඕන වෙලාද? ජ්‍යෙෂ්ඨ සොල්දාදුවාගේ දෙතොල් අවලස්සන නියවීමක් සහිතව උඩු අතට හැරුණි. එහෙත් ඔහුගේ දෑස් උදාසීනව තිබුණි. ඒවායේ තිබුණේ කපටි, අසතුට මුසු පෙනුමකි. ඒ ඇස් මගේ දෑස් දෙස ඍජුව එල්ලව තිබුණේය.

ඔහු අවවාද කරයි (එක්කෝ තර්ජනය කරයි) 'අපේ තියෙනවා ලියාපදිංචි කිරීමේ අලුත් වැඩපිළිවෙලක්. ඔයා සඳුදට සිවිල් කාර්යාලයට නොවැරදීම වාර්තා කරන්න ඕන.'

මම හැඟීම් දැනීම් නොමැති ලෙසින් හිස සැලුවෙමි. එයින් පැහැදුණ ඔහු වාහනය කරා ගියේය. 'ලියාපදිංචියට' වඩා බොහෝ දේ සිවිල් කාර්යාලයේ දී සිදුවෙයි. නැතහොත් මා එසේ අසා ඇත. එහෙත් මට ඇත්තේ කවර අභිමතයක්ද? මා තුළ පැන නැඟෙන බලවත් කෝපය මම ගිලගත්තෙමි. මගේ ඇඟිලි මත්ද්‍රව්‍ය වලට පුරුදු කෙනෙකු එය භාවිතා නොකරන විට සිදුවන්නාක් මෙන් වෙව්ලයි. මගේ ආශාව මුදු ලෝහය අත්විඳීමට ය, තුවක්කුවක බර අත්විඳීමට ය, වෙඩි උණ්ඩයක් මගේ අතෙහි තිබෙනු විඳ ගැනීමටය. නිලධාරියාගේ ඉනෙහි හැලහොල්මනකින් තොරව එල්ලෙමින් තිබූ පිස්තෝලය දෙස මම සහනයකින් මෙන් බලා සිටියෙමි. ඔහුගේ කනිෂ්ඨ නිලධාරියාගේ පිටෙහි රයිපලයක් එල්ලී තිබුණේය. මාරාන්තික පසුම්බියක් එල්ලී තිබුණේය. මොහොතකට, මම එක වෙඩි උණ්ඩයක් ඉගිල්ලෙනු මනසින් බලා සිටියෙමි. ජ්‍යෙෂ්ඨ සොල්දාදුවාගේ හිස පිටුපස රත් පැහැති මලක් පිපෙන්නට වූයේ, හැම උදෑසනකම හමුදා ක්‍රමයට අනුව පීරන කොට කොණ්ඩය අවුල්කර දමමිනි.

මගේ සිතැඟි තේරුම් ගත්තාක් මෙන්, හිටිහැටියේ ඔහු ආපසු හැරී මා දෙස බැලූ අතර මම ඉක්මනින්ම ඉවත බලාගත්තෙමි

'ඔබේ සහෝදරයා. එයා කොහේද දූන්?'

මට දූන් පිළිතුරු දීමට බල කෙරේ. මේ ප්‍රශ්නයට වේදිකා අධ්‍යක්ෂණයක් නැත.

'මං එයාව අවුරුදු ගණනාවකින් දැකලා නෑ. එයා අතුරුදහන් වෙලා... ගමෙන් පලායන්න සිද්ධ වෙච්ච වෙලාවේ එයාව මගේ අම්මාගෙන් වෙන්කරලා...'

මුසාව මගේ දිව අතරින් පහසුවෙන් ගලා එයි. එය පොදු කතන්දරයකි. 'එයා ආපසු ආවේ නැහැ. අපි දන්නවා එයා මැරිලා' මගේ හඬෙහි ගැබ්වුන ස්ථිරසාර බව ගැන මම ද විමතියට පත්වීමි.

'හරි. ඉතින් මම විශ්වාස කරනවා එහෙනම් වව්නියාවේ තියෙන ඊනියා 'අතුරුදහන් වූවන්ගේ' විරෝධතා වලට ඔයා එකතු වන එකක් නෑ කියලා'

මම කීකරු ලෙසින් මගේ හිස සෙලවූවෙමි.

'සර් ඒ වගේ සිද්ධියක් වෙනවා කියලවත් මම අහලා තිබුණේ නැහැ'

එබඳු දෙයක් ගැන අම්මාට කිසිවිටෙකත් දැන ගැනීමට ඉඩ නොලැබෙන පරිදි මම මගේ බලය භාවිතා කරන්නෙමි. 'ඒත් ඒක මං සහභාගී වෙන්න හිතෙන්නෙ නැති එකක්'

ඔහු තමාගේ එකඟතාව පළ කළේය.

'දක්ෂ ගැහැණු ළමයා. මොළේ පාවිච්චි කරලා වැඩ කරන්න දිගටම, එතකොට කරදර ඇති වෙන්නේ නෑ' ඔහුගේ වචන වලින් ගම්‍යමාන වන තර්ජනය හඳුනාගැනීමට තරම් මම දක්ෂ වෙමි. ඔහුගේ සගයා එන්ජිම පණ ගන්වන විට ඔහු අවසාන අනතුරු ඇඟවීමද කළේය.

'මතක තියා ගන්නඃ සඳුදා, සිවිල් කාර්යාලයේදී මං ඔයාව බලාපොරොත්තුව ඉන්නවා. පුද්ගලිකව'

මම ගෙදරටම දිව ගියෙමි.

මගේ මවගේ රත්පැහැ ගත් දෑසෙහි අස්වැසිල්ලක් සනිටුහන් විය. සියල්ල සමාප්ත වූයේය යන හැඟීමකින් යුතුව ඇය දොර අගුලු ලෑවාය. ඇය දෙතොල් තද කොටනෙ සිටියි. එහෙත් මේ වාදයක අරම්භය නොවේ. සියලුම සටන් ඇය වෙතින් පළා ගොසිනි. අප දෙදෙනා අතර නිහඬතාව වර්ධනය වෙයි. මා කොහි ගියේදැයි කියන්නට මම ස්වේච්ඡාවෙන් ඉදිරිපත් නොවීමි. ඇය ඇසුවේද නැත.

*

පසුව, මගේ ඇදෙහි වැතිර, නපුරු සිහින පෙනෙන නින්ද මග හරිමින් සිටින විට පමණට වඩා ඉදුණු පැපොල් ගෙඩියක් බිමට වැටෙන බොල් හඬ ඇසුණි. මට එහි ගොස් එය අහුලා ගත හැකිව තිබුණි. එහෙත් එය කපා බැලූ විට එහි මදය පල්ප වී තිබිය හැකි බව, එහි රසය වියැකී ගොස් තිබිය හැකි බව, නරක් වී තිබිය හැකි බව මම දනිමි. එහි නිදහසේ වැටී තිබෙනු ඇත, එහෙත් එය නරක් වී තිබිය හැකිය. කපුටන්ට, මැස්සන්ට, පැපොල් පල්පය මත භෝජන සංග්‍රහයක් අත්විඳින්නට මට සිදුවෙනු ඇත. ඔවුන් ඒ සියල්ල භුක්ති විඳිනු ඇත.

නැත. මම ඉක්මනින් මගේ තීරණය ගනිමි.

මම ඇඳ ඇතිරිලි අතරින් මගේ දෙපා ඉවතට ගතිමි. මගේ දෙපතුල් සීතල පොළොවෙහි තබමින් මම හොරෙන් හොරෙන් අපගේ නිවසෙහි කාමර හරහා ඇවිද යමි, තවත් එක් භූතයෙක් කාමර හරහා හොල්මන් කරමින් ඇවිදී. පිටතදී සමන්පිච්ච සුවඳ පොදක් සමග මුසු වූ රාත්‍රී සුළඟ ආශ්වාස කරමි. මම නිහඬතාවෙන්, නිසලතාවෙන්, ශක්තිය උරා ගනිමි. රාත්‍රියේ එළඹුම හා හුදකලාව මා තුළ අවදි කළ ශක්‍යතාව පිළිබඳ හැඟීමෙන් දිරිමත් බවක් ඇතිවේ. ඒ රත් පැහැති පැපොල් ඵලයන්හි අතිශය දීප්තිමත් ප්‍රභාව අන්ධකාරයෙහි වුව සිතින් දිස් වේ. ඒ දීප්තිය අන් කිසිවකින් දැකිය හැකි නම් ඒ වූ කලී පැපොල් පොත්තෙහි වර්ණය, ගලා එන දීප්තිමත් සඳ රැසෙන් ප්‍රතිබිම්භ වීමය. මගේ වළඑකර මදක් රිදුම් දුන්නද පැපොල් ගසෙහි මෙහෙයුම හොඳින් සිදුවිය. අධික වෙහෙස නිසා මගේ සිරුරේ මස්පිඩු වෙවුලා ගියද,

මගේ නහර හරහා හොඳින් රුධිරය ගලා එන බවට වන අවබෝධය ඇතිව මම, මගේ තිළිණය, මගේ පපුවට හොඳින් තුරුළු කොට තබා ගත්තෙමි. සියල්ල අහිමිවන ආකාරයෙන් අන් හැම දෙයම අහිමි වී ගියද, දැන් මේ මොහොතේ සුළු ජයග්‍රහණයක් ලැබී ඇත. මම අතීතයේ වළාකුළු, උවදුරු සහිත අනාගතය මගේ සිතෙන් ඈත කෙලවරට තල්ලු කර දැමුවෙමි.

මම අඳුරු මුළුතැන්ගෙහි, සිටියදී මා කඩා ගත්, ඉදුණු පළතුර මා ඉදිරියේ විය. එසේ කිරීම යෝග්‍ය බව මම දැන සිටියෙමි.

ශල්‍ය වෛද්‍යවරයකු සිය ප්‍රථම කැපුම කපන්නාක් මෙන් මම පැපොලෙහි සියුම් පොත්ත හරහා පිහිතලය දිව වූයෙමි. පළතුරෙහි මැද ඇති කලු පැහැති ඇට භක්තිමත් ලෙසින් සූරා වෙන් කළෙමි. හැන්ද පැපොල් බෑවට දමා විල්ලුද වැනි වූ, තැඹිලි පැහැති මදය හැන්දක් එක්කොට ගත්තෙමි. මම පැපොල් ගෙඩියෙහි පූර්ණ රසය විඳිමි. එහි රසයට, මගේ දිවෙහි රඟන්නට ඉඩ දෙමි. ඒ ප්‍රණීත බවෙහි උපරිම රසය අත්‍යන්තයෙන්ම විඳ ගනිමි.

***නිකිණි ජයතුංග*** *ඉපදී හැදී වැඩුණේ එක්සත් රාජධානියේ ය. එහෙත් ඇය හැම විටම ඇගේ ශ්‍රී ලාංකීය උරුමයට සමීපව සිටියාය. ගෙකො ශ්‍රී ලංකා තරුණ පුණ්‍ය ආයතනයේ සභාපති ලෙසද, (2004 සුනාමි ව්‍යසනයෙන් පසුව පිහිට වූ) කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයෙන් ශ්‍රී ලංකා සංගමයේ සභාපති ලෙස ද ඇය සේවය කර ඇත. ශ්‍රී ලංකාවේ විවිධ ජාතීන් අතරෙහි සමඟිය, ප්‍රතිසංධානය සඳහා වන සාකච්ඡා ප්‍රවර්ධනය කිරීම සහ සාකච්ඡා වැඩමුළු සඳහා පහසුකම් සැපයීම සඳහා කටයුතු කරන බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලාංකීය තරුණ වෘත්තිකයන්ගේ බහුවාර්ගික බහු ආගමික ස්වේච්ඡා කණ්ඩායම වන සමගි ප්‍රතිසංධාන ආයතනයේ සාමාජිකාවක ලෙස ඇය අද කටයුතු කරයි. විශිෂ්ඨ ලේඛනයෙහි යෙදීමේ ඇගේ කැමැත්ත වර්ධනය කර ගැනීමට ඉඩ හසර සලසන ශාස්ත්‍රාලීය ප්‍රකාශන ආයතනයක් වන පැල්ග්‍රේව් මැක්මිලන් ආයතනයේ ප්‍රකාශන අංශයෙහි නිකිණි සේවය කරයි.*

# බලාපොරොත්තුව

*ශාන් දිසානායක*

මැෂින් තුවක්කු හඬ ඔවුන් වටා ගිගුම් දෙන්නට විය. ඔහුගේ වැළඳ ගැනීමෙන්, පාවෙන වෙඩි උණ්ඩ නොවැදෙන්නට ඇගේ ආරක්ෂාව සහතික කරන්නාක් මෙන්, සිල්වා අගලෙහි හිඳගෙන සිය දියණිය තදින් සිප වැළඳගත්තේය.

'අම්මා කෝ ?' ඇය ඉකිබින්දාය.

'ඇය ඉක්මනින් ඒවි. ඔයාගේ ඇස් වහගන්න.' කන් බිහිරි කරවන ශබ්දවලින් සිය දියණියගේ කන් ඇසීමට හානි වනු ඇතැයි ඔහුගේ හදවත බියෙන් ගැහෙන්නට විය. පොළව සලිත වන හැම විටකම ඇගේ සිරුරට වැලි වැටීමෙන් වළකාගනු සඳහා ඇය වසාගෙන ඔහු කුදු ගැසී සිටියේය. ඔහු ඇගේ දෙකන් ආවරණය කළේ ය. යන්තම් අවුරුදු අටක දැරියට, දැනටමත් මේ මහා භයංකර තත්ත්වයට මුහුණ දීමට සිදුවීම ගැන ඔහු බොහෝ ශෝක වූයේය.

'අන්නමා' නිවසේ ඇති දේවතාවියගේ කළු පැහැති පිළිමය සිතෙහි මවා ගනිමින්, වසාගත් දෑතින් යුතුව ඔහු යාඥා කරන්නට වූයේ ය. 'අන්නමා, කරුණාකරලා මගේ බිරිඳ ආරක්ෂා කරලා දෙන්න.' සිය බිරිඳගේ මෘත දේහය, ඇගේ තැලී පොඩි වී ගිය මුහුණ සහ රත් වූ වැල්ලෙහි ඇගේ රුධිරය ගලා යන ආකාරය පරිකල්පනය කිරීම ඔහුට මැඩගත හැකි නොවීය. ඔහු සිය හිස තදින් සොලවා දෑස් විවර කළේය. ඇය මිය ගියේ දැයි ඔහුට සහතික නැත. ඇය සම්බන්ධයෙන් එබඳු අවාසනාවන්ත දෙයක් ඔහු උපකල්පනය නොකළ යුතු වෙයි.

හය මසකට පෙර, යුද්ධය නැවත ආරම්භ වන්නට පෙර ඔවුන්ගේ පුතුකුලම් ගමෙහි වූයේ සන්සුන්, මුදු සුළං හමා යන, ළා හිරු රැසින් හම ප්‍රබෝධමත් කරවන, එහි කිසිදිනෙක යුද්ධයක් නොතිබුණාක් වැනි වාතාවරණයකි. එහෙත් හැම විටම එහි යුද්ධයක් තිබිණි.

තාවකාලිකව අවි බිම තැබීමෙන් මාස ගණනාවක් ගම නිසංසල විය. එය බිඳී ගිය කල්හි සාමාන්‍ය ජන ජීවිතය පිළිබඳ ඔවුන්ගේ සිහිනයෙන්

ඔවුහු අවදි වූහ. දමිළ සහ සිංහල දෙපසම ගම්මුන් භුක්ති විඳි සාමයට එතරම් ආයුෂ තිබුණේ නැත.

එහෙත් දන් අගලෙන් උඩ සිදු වී ඇත්තේ කුමක් දැයි දැනගැනීමට ඔහු කැමැත්තේ විය. සමීපයේ ඇති හමුදා මුරපොළට සියලුම පැතිවලින් වෙඩිපහර එල්ල වන්නට ඇත. හමුදාව සහ කොටින් අතර වෙඩි තබාගැනීම ආරම්භ වන විට එම මුරපොළෙහි ඔවුහු පෙළගැසී සිටියහ. සෙනඟ තැන තැන විසිරී ගියහ. ඔහු, ඔහුගේ දියණිය සමග දිව ගියේය. ඔහුගේ බිරිඳ පාරෙහි අනෙක් පස අගලට වහා දිව ගියාය. වහ වහා දිව ගිය ඔවුන් කලබලයෙන් එකිනෙකා දෙස බැලූහ. ඇයට ඔවුන් සමග පැමිණිය නොහැකි විය, මන්ද ජන ගංගාව නිසා ඇයට සිල්වාගේ අගලට පැමිණෙන මග ඇහිරී ගියේය. මිනිස් සිරුරු කැබලි හැමතැනම විසිරෙන්නට වූ අතරෙහි කාලය වේගයෙන් ගෙවී ගියේය, ඇය අනෙක් පස වූ අගලට වහ වහා දිව ගියාය. සිල්වා සැඟවෙන්නට දිව යද්දී, දමිළ දැරියකගේ හිස පළුවනු ද, සිංහල දරුවකුගේ කකුල වෙන්ව යනු සහ රතු ලෙයින් පොළව නැහැවෙමින් තිබෙණුද, මහලු ගැහැණියකගේ ඉල ඇට කූඩුව විවරව තිබෙනු ද දුටුවේය. එය වෙඩි උණ්ඩ වරුෂාවක් විය.

දැන් සිල්වා සහ ඔහුගේ දියණිය අගලක වෙඩි තබාගැනීමකට මැදිව සිටියහ. ඔහුගේ බිරිඳ අනෙක් පස සිරවී සිටියාය. ඇය වෙඩි උණ්ඩ ප්‍රහාරයෙන් ආරක්ෂිතව, සැඟවී සිටිනවා විය යුතුය. සිල්වා සිටි අගල මීටර් භාගයක් පමණ ගැඹුරු සහ අඩි කිහිපයක් පමණ පළලැති එකකි. සිල්වා සහ ඔහුගේ දියණිය හැරුණු කොට එහි වෙනත් කිසිවෙක් නොසිටියහ.

සිල්වා සිය ලේ ගලන ඇඟිල්ල දෙස බැලුවේය, මෝටාර් පිපිරුමකින් විසිරුණ උණ්ඩ කැබලි පටු එහෙත් ගැඹුරු තුවාලයක් ඇඟිල්ලෙහි ඇති කර තිබිණි. ඔහු මෘදු ලෙසින් සිය දෑතෙහි සිටි දියණිය හැරවූයේ ඇයට තුවාල වී ඇත්දැයි බැලීමටය. ඇගේ කුඩා පපුව රතු ලේ පැල්ලමකින් වැසී තිබිණි, එහෙත් ස්තුතිවන්ත වන්නට ඒ ඇයගේ රුධිරය නොවීය. සිල්වා සැනසුම් සුසුමක් හෙළුවේය. තමා සිය දියණියට කෙතරම් ආදරය කරන්නේ ද, යන්න ඔහු මේ වනතුරු වටහාගෙන තිබුණේ නැත. ඔහු ඇගේ නළලට හාදුවක් දුන්නේ ය. පොළව නැවතත් දෙදරා ගියේ කිසිවක් ළඟ ළඟම පුපුරා යමින් අගලට දූවිලි එක් කරමිනි.

'පහත් වෙන්න, පහත් වෙන්න' කෙනෙක් කෑගැසුවේය.

සිල්වා, දියණිය වඩාත් ආරක්ෂා කරගැනීම සඳහා, ඇය තුරුළු කොටගෙන කුදු ගැසී, ඇය තදින් වැළඳ ගත්තේය. ඔහු දියණියගේ කම්මුල් සිප ගත්තේය, ඔහු ලේ ගලන සිය ඇඟිල්ල දෙස නැවත බැලුවේය. ඔහුගේ බඩෙහි දැගලිල්ලක් ඇති විය. ඔහු වමනය වළකා ගත්තේය. දැන් ඔහුට ජීවත් වීමට ශක්තිය දෙන, සිය දියණියගේ මෘදු හද ගැස්ම අසන්නට හැකිය. ඔවුන් වටා මුළුමනින් ඇති බිහිසුණු බව පසෙක තිබියදී, ඇගේ හදවතෙහි දෝංකාරය ඔහුගේ සිරුර හරහා ශාන්ත හැඟුමක් පැතිර වූයේ, ඇගේ මවගේ සොහොයුරිය වූ, යුද්ධයෙන් මියගිය ශාන්තිගෙන් පසු දියණියට ඒ නම තැබූ බව සිහිපත් කරවමිනි. ඇය රෝගීන් සුවපත් කිරීමට යුද කලාපයට යාමට කිසිවිටෙකත් බිය නොවූ වෛද්‍යවරියකි. යහපත් වෛද්‍යවරියකට පෑ යුතු ගෞරවය පෙන්වීමේ මාර්ගයක් ලෙසින් ඔවුන් දියණිය එනමින් නම් කළේ කිසිදිනෙක ඇය අමතක නොවන බව සහතික කිරීමටය.

සිල්වා සිය දැරියගේ කම්මුලෙහි තම කම්මුල තබා තද කළේය. ඇගේ මුහුණ තෙත් කළ කඳුළු ඔහුට ස්පර්ශ විය. අනතුරුව තම කම්මුලෙහි කඳුළක් ගලා ගොස් ඒ කඳුළ දියණියගේ කඳුළු සමග එක්වනුද, ඔහුට දැනිණි. ඔහු සිය බිරිඳ පාර්වතී ගැන සිතමින් සිටියේය. දමිළ යුවතියක වූ ඇය විවාහ කරගැනීමට තමාට මුහුණ පෑමට සිදුවූ සියලු බාධාවන් පිළිබඳ ඔහු සිතමින් සිටියේය.

නව වසරකට පෙර, වෙඩි හඬ වෙනුවට ඔහුගේ හිසෙහි නින්නාද වූයේ සාම්ප්‍රදායික හොරණෑවෙන් මතුවන සංගීතය නාදයයි, පාර්වතී රතු පැහැති මල් දමකින් සැරසී ඇය ලක්ෂ්මී දෙවඟන ලෙසින් දෘශ්‍යමාන වන, රත් පැහැති එම්බ්‍රොයිඩර් වැඩ දැමූ, බර්ගන්ඩි සාරියකින් සැරසී, ඔහු සමීපයේ හිඳගෙන සිටියාය. ඇයගේ ලජ්ජාශීලී සිනහව ඔහුට සිහිපත් කළේ, ඇය හා විවාහ වෙන්නට ඔහුගේ පවුලෙන් වෙන්ව යාමෙහි වටිනාකමක් තිබූ බවය.

ඇය හමු වූ පළමු අවස්ථාවෙහි පාර්වතී සමග ඇතිවූ භාවාත්මක බන්ධනය ක්ෂණික බන්ධනයක් විය. ඔවුන් මුණ ගැසී තිබුණේ අශුභ තත්ත්වයන් යටතේ ය. බෝම්බ පිපිරුමක ප්‍රතිඵලයක් වශයෙන් ඔහු ගමන් කළ දුම්රියෙහි මැදිරි තුනක් ගින්නට අසු විය. ගිනිදැල් දුම්රිය පෙට්ටිවල කවුළුවලින් අහස ඉහළට නැඟුණේ, මහා කුණාටුවකින් මතුවන ගිගුරුම්

හඬක් නගමිනි. දිවි ගලවාගත් මගීහු, දුම්රියේ ඉතිරි කොටසටද ගින්න ඇවිලී යනු ඇතැයි බියට පත්ව යටි ගිරියෙන් කෑ ගැසූහ. තමා දිවි ගලවා ගනු ඇතැයි සිල්වා සිතුවේ නැත. එහෙත් ඔහු ආරක්ෂිතව දුම්රියෙන් බැසගත් අතර, අනතුරුව ඔහු දිවි ගලවා ගත් අනෙක් අයට උදව් කරන්නට පටන් ගත්තේ ය. එසේ උදව් කරන අතරතුර, ඔහු පාර්වතී සමීපයට පැමිණියේ ය, ඇය අසුනක් යටට රිංගා ගෙන සිටියා ය, ඇයට උදව් කරමින් සිටියදී, ඇගේ දූලි වැකුණු, විලාප නැගුණු මුහුණ දුටු සැනෙකින් ඔහු ඇය පිළිබඳ සිතක් ඇතිකර ගත්තේ ය. පවුල් දෙකම සම්බන්ධයට තදබල ලෙස විරෝධය පෑ නමුත්, තුන් මසකට පසුව ඔවුහු විවාපත් වූහ.

දහවල නිමා වී රාත්‍රිය එළඹුණු අතර සිල්වා සහ ඔහුගේ දියණිය තවමත් අගලෙහි හිර වී සිටියහ. රැහැයියන් හැඬූහ, ඉඳහිට මෙන් වෙඩි හඬක් ඇසිණි. එතරම් දිගු වේලාවක් එකම ඉරියව්වෙන් වැතිර සිටීම නිසා, සිරුරට ඉදිකටු අනින්නාක් මෙන් වේදනාවක් සිල්වාට දැනිණි. එහෙත් ඔහුගේ දියණිය සන්සුන් ලෙසින් නිදාගෙන සිටියාය. කෙතරම් නිසසල ලෙස ඇය නිදාගෙන සිටියේ දැයි කිවහොත් ඇයට තුවාල සිදු නොවූ නමුත් ඇය මියගොස් ඇතැයි සමහර අවස්ථාවක ඔහු බියට පත් වූයේය.

තමාට සහතික කරගනු පිණිස ඔහු ඇයගේ හදගැස්මට වරින් වර සවන් දුන්නේය. සිය දියණිය බිම තැබූ සිල්වා, අගලෙන් ඉහළට එබී තමා වටා ඇති අන්ධකාරය දෙස බැලුවේය. රැහැයියෝ තවමත් හඬ නගමින් සිටියහ, එහෙත් වෙඩි හඬ නැසුණි. ඈතින් ගින්නක් ඇවිලෙමින් තිබිණි, නුදුරින් ඇති මැදි වයසේ මිනිහෙකුගේ මෘත ශරීරය හැරෙන්නට ඒ එළියෙන් කිසිවක් හෙළිදරව් නොවෙයි. මියගිය මිනිසාගේ සරම ඔහු නිරුවත්ව තබමින් ඉනෙන් පහලට රූටා ගොස් ඇත. මියගිය තැනැත්තකුගේ ගන්ධය සහ පිළිස්සෙන ටයර් ගන්ධය වා තලයට මුසු විය.

දියණිය තවමත් නින්දේ දැයි සිල්වා පරීක්ෂා කර බැලුවේය. අනතුරුව ඔහු අගලෙන් ඉහළට සිය සිරුර ඇද ගත්තේය. ඉන් අනතුරුව ශබ්දය අවම වන අන්දමින්, පාරෙන් අනෙක් පැත්තෙහි ඇති අගල දෙසට බිරිඳ සොයනු සඳහා දණ ගාගෙන ගියේය. සුළඟින් ඇතිවන පඳුරුවල සර සර ගෑම පවා ඔහුගේ හද ගැස්ම වැඩි කළේය. දියණිය කඳවුරෙහි තනිව තබා ඒම ඔහුගේ සිතෙහි භයංකර හැඟීමක් ඇති කළේ ය. එහෙත් සිය බිරිඳ ජීවත්ව සිටින්නේ ද යන්න ඔහු සොයා බැලිය යුතු විය. නිසසලව නින්දෙහි සිටින තුරු ශාන්ති නිරුපද්‍රිතව සිටිනු ඇත. එහෙත් ඔහුගේ

බිරිඳට තුවාල සිදු වී තිබෙන්නට පුළුවන. රුධිරය ගලා යාමෙන් මරණය සිදුවන්නට පුළුවන. ඒ සිතිවිල්ලෙන් ඔහු පීඩාවට පත්වූයේය.

සිදුව තිබිය හැක්කේ කුමක් දැයි බලන්නට ඔහු දෑස් කුඩා කළ නමුත්, අඳුරට වැඩි යමක් දැකිය නොහැකි විය. පොළවෙහි කිසිවක් සොයා ගන්නට වෑයම් කළ ඔහුගේ අතට මෘත ශරීරයක් අසු විය. රයිපලයක ගිනිදැල්ල සහ ගිනි බිඳෙන හඬ, මෘත දේහය සමීපයේ මුනින් අතට වැතිරෙන්නට සැලැස්විය. රයිපලය නැවත නිහඬ වූ විට, ඔහු මළ සිරුර වෙතින් ඉවත්ව අගල දෙසට ගොස් සන්සුන් ලෙසින් හඬ ගෑවේය. 'පාර්වතී, පාර්වතී'.

මද දුරක් ඈතින්, මුරපොළක් අසල බංකරයක අපැහැදිලි කතාබහක් සිදුවෙමින් තිබිණි. ඒ ශ්‍රී ලංකා හමුදාවද, නැතහොත් ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානයදැයි ඔහුට පැහැදිලි නොවීය. අනතුරුව අන්ධකාරය කෙඳිරිල්ලකින් පිරී ගියේ ය. ඒ තමාගේ බිරිඳ විය හැකි යැයි භීතියට පත්ව, හඬ අසන්නට සිල්වා හිස එසවූවේය. එයටද වඩා බියජනක සිතිවිල්ලකින් ඔහුගේ සිත කීරි ගැසී ගියේය. ඒ ඔහුගේ දියණිය විය නොහැකිද?

තවමත් බිම වැතිර ඔහු ආපසු හැරී බැලුවේය. පුද්ගලයා නැවතත් කෙඳිරි ගෑ නමුත් ඒ කෙඳිරිලි හඬ පැමිණියේ විරුද්ධ දිසාවෙන් බව ඔහු අස්වැසිල්ලකින් යුතුව වටහා ගත්තේය. අන්ධකාරයෙන් කෙඳිරිලි හඬ පැමිණෙන්නේ කොයිබින්දැයි වටහා ගැනීමට උත්සාහ කරමින් ඔහු ඉදිරියට බඩ ගෑවේය. එය ඔහු උගුලකට අසුකරගැනීමේ උපායක් විය හැකිද?

ඔහු කෙඳිරිය එන්නේ කොයිබින්දැයි සොයමින් පාරෙන් අනෙක් පස ඇති අගල දෙසට ගියේය. මෙබඳු ප්‍රහාරයන් සඳහා විශේෂයෙන් තැනූ, පාර දෙපස ප්‍රතිවිරුද්ධ දිසාවන්හි වන අගල් දෙකක් සෑදීම හමුදා මුර පොළවල සාමාන්‍ය දෙයක් විය. අගලෙහි සිටින්නේ කවුරුන්දැයි සීතලව ගිය ඔහුට සිරුරු පෙළක් තිබෙනු දැනී ගියේය. ඔවුන් සියලු දෙනාම මිය ගොසිනි. ඒ සිරුරු යටින් නැවත අර කෙඳිරිලි හඬ ඇසෙන්නට විය.

ඔහු පසු පසින් රහසිගත මිමිණුම් හඬක් ඇසෙන්නට විය. තවමත් පොළවෙන් නොනැගිට ඔහු වහා හැරුණේය. අඩි හඬ ඔහු දෙසට එමින් තිබිණි. ඔවුන් කවුරුන් වුවද, ඔවුන් පැමිණියේද සිල්වා සොයන්නට උත්සාහ කළ දෙයම සෙවීමට ය. අඳුරෙහි කෙඳිරිලන තැනැත්තා සොයා ගැනීමට ය.

ඒ ඔහුගේ බිරිඳ විය හැකි යැයි බිය වූ සිල්වා අගලෙහි වූ මළ සිරුරු රැස අවුස්සා ඇය සොයන්නට වූයේය. එම මළ සිරුරු කන්ද අතරින් තුවාල ලැබූ පිරිමි දරුවකු ඇද ගත්තේය. ඔහුගේ අත්වල ප්‍රමාණයත් සහ සිරුරෙහි බරෙන් ඔහුට වයස අවුරුදු පහක් පමණ වන්නට ඇතැයි නිශ්චය කර ගනු ලැබිණි. ඔහුගේ ශරීරයෙන් පහළ කොටස නිරුවත්ව තිබුණේය. සිල්වා වහා කළ හැකි විකල්පය කල්පනා කළේ ය. පිරිමි ළමයා රැගෙන තමා සිටින අගලට යා යුතු යැයි සිල්වා සිතුවේ ය. පිරිමි ළමයාගේ කෙඳිරිගෑමෙන් කිසිවකු ඔහු සිටින තැන අවබෝධ කර ගනු ඇත.

මේ දරුවා බේරා ගැනීම වෙනුවෙන් තමාගේ ආරක්ෂාව ඔහුට අහිමි කරගත නොහැකිය. ඔහුගේ දියණියට ඔහු අවශ්‍යය ය. තවමත් ජීවත්ව සිටින්නේ නම්, ඔහුගේ බිරිඳටද ඔහු අවශ්‍යය ය. ඔහු මෘදු  ලෙස මළ සිරුරු කන්දට පිරිමි ළමයා අතහැර, තම දියණිය සිටින දිසාවට සෙමින් ගමන් කළේය. ඔහු අනෙක් පස වූ ශාන්ති සිටි අගලට ළඟා වන විට කුඩා පිරිමි දරුවා නිහඬ කර වූ මහ හඬ නැගූ වෙඩි පහර දෙකක් ඇසිණි.

අනතුරුව තවත් නොපැහැදිළි දෙඩවිලි හඬක් ඇසෙන්නට විය. ඒ දමිළද? ඒ සිංහලද?

ඒ කොටින් නම්, ඔහුගේ සිංහල අක්මුල් තිබියදී, භාෂාව චතුර ලෙස දත් නිසා ඔහුට ව්‍යාජ දමිළයකු සේ රඟ පෑ හැකිය. එහෙත් තමා ඔවුන් රැවටීමට තැත් කරන හමුදා සෙබළකු යැයි සිතා බියෙන් යුතුව ඔවුන් තමා ට වෙඩි තැබුවහොත් කුමක් කළ හැකිද? එහෙත්... ඔහුගේ හෘද ස්පන්දනය ඉහළ නැංගේය. අඳුරෙහි නිහඬව සිටීම ආරක්ෂාව සඳහා වඩා හොඳ යැයි ඔහු සිතුවේය. සිය දියණිය අවදිව නොහඬාවා'යි යදිමින් ඔහු සෙමින් අගලට බැස්සේය. ඔහු පොළවට පය තබන විට මද හඬක් නැගිණි. තුවක්කුකරුට එම හඬ ඇසෙන්නට ඇතැයි බිය වූ ඔහුගේ හෘද ස්පන්දනය වේගවත් විය. ඔහුගේ දියණිය තවමත් සුවසේ නිදාගෙන සිටියාය.

සිල්වාගේ සිතුවිලි ඔහුගේ බිරිඳ වෙත යොමු විය. දැන් ඔහුට ඉකි නොගසා සිටිය නොහැකිය. ඇය අනෙක් අගලෙහි තිබුණ මළ සිරුරු වලින් එකක් වූයේ ද? ඒ සිතුවිල්ල ඔහුට දරාගත නොහැකි විය. එතැන

බොහෝ අඳුරු වූයේ ය. රයිපල් ගිනිදැල් ඔහුගේ ඉකිබිඳුම නිහඬ කර විය. එහි සිටි කවුරුන් හෝ මළ සිරුරු අතරෙහි පණ පිටින් කිසිවකු නැති බව සහතික කරගන්නට මළ සිරුරුවලට ගිනි බින්දේය. තම දියණිය සිය දෑතෙහි එහා මෙහා වනු ඔහුට දැනිණි. ගිනිබිඳුම, සිය අගලෙහි වාරය වන්නට කලින් ඔවුන් එතැනින් පලා යා යුතු විය.

'ශාන්ති' ඔහු ඇගේ කණට කොඳුළේය. 'දුක් වෙන්න එපා'. මං ඔයාව මෙතනින් ගෙනියනවා. අපි ජීවත් වෙයි, මං ඔයාට පොරොන්දු වෙනවා. ශබ්ද කරන්න එහෙම එපා. අප්පා ඔයාව මෙතනින් අරගෙන යනවා' ඔහු තමා අභ්‍යන්තරයෙහි වූ සියලුම හැඟීම් ශාන්තිගේ නළලට හාදුවක් දෙමින් මුදා හැරියේය.

ශාන්ති සිය පපුවට තුරුළු කර ගනිමින්, ඔහු අඳුරෙහි අගලෙන් පිටතට පැමිණියේය. මිනිස් සුන්බුන් අතරින් ඉක්මනින් බැහැරව යන ඔහු තමා කිසිවෙකුට දර්ශනය වීම වළකා හැඟවෙන්නට ඉඳහිට උක්කුටියෙන් සිටියේය. අඳුර නිසා ඉදිරියෙහි ඇත්තේ කුමක්දැයි නොපෙනුණ බැවින් ඔහු එක් වරකට වැඩි වාර ගණනක් ඇද වැටුණේය. ඔහු දැන සිටි එකම දෙය වූයේ තමා ඇද වැටුණේ සිය අසල්වැසි ගම්මුන්ගේ මළ සිරුරු මත බවය. ඔහුගේ එකම අපේක්ෂාව වූයේ ඒ සිරුරු අතරෙහි තම බිරිඳගේ සිරුර නොතිබේවාය යන්නය. ඔහු වැටෙන හඬ යටපත් කරන්නට උස් වෙඩි හඬ සමත් විය. ඉවකින් මෙන් ශාන්ති ඔහුගේ ගෙල සිය දෑතින් බදාගෙන නිහඬව සිටියාය. ඔහුගේ නෙත් කොනින් සිල්වා ගිනි බිඳුමක එළිය දුටුවේය. ඒ සැලෙන ගිනිදැල් අතරින්, මළසිරුරු පෙනී නොපෙනී ගියේය.

පඳුරු සහිත වන ලැහැබක් ඉදිරියෙන් තිබුණේ ය. සිල්වා කොළ අතු අතරින් ගමන් කළේය. සැණින් වෙඩි හඬ ඔහු පිටුපසින් ඇසිණි. ඔහුගේ හෘද ස්පන්දනය අඩු විය. ඔහු දැන් සිටින්නේ මුරපොළින් සැතපුම් දෙකක් පමණ දුරින්, ඔවුන්ගේ පුතුකුලම් ගම්මානය කෙළවර, වනාන්තරය මැද බව ඔහු වටහා ගත්තේය. ඔවුන් බේරී ගොසිනි. සැහැල්ලුවක එවැනි ප්‍රබල හැඟීමක් මීට පෙර කවරදා හෝ ඔහුගේ ජීවිත කාලයේදී ඔහු අත් විඳ නැත.

'අප්පා, අම්මා කොහේද?' ශාන්ති ඇසුවාය. සිල්වාගේ සිතෙහි දැවෙන්නා වූ තැතිගැන්මක් ඇති විය. අනතුරුව ඔහු ඉකිබිඳ හඬා

වැටුණේය. සැබැවින්ම ඔහු ඇය අතහැර ආවේ ද? ඇය තවමත්, වීදියෙහි ඒ සිරුරු අතරෙහි, තුවාල ලැබ ජීවත්ව සිටිනවා විය හැකිය. නෑ නෑ , ඔහු තමාටම සහතික කොටගත්තේ සිය සරමෙහි වාටියෙන් කඳුළු පිසදා හරිමිනි. ඔහු නිවැරදි දෙය කළේය. ඔහු ශාන්ති බේරා ගත්තේය. මෙබඳු තත්ත්වයකදී, පාර්වතී වුවද කරනු ඇත්තේ මෙයයි.

එය සාමකාමී සෙනසුරාදා උදෑසනක් විය. මයිනෝ මිදුලට පැමිණියහ, ශාන්ති සිය බෝනික්කා සමග සෙල්ලම් කරමින් සිටියාය. මුරපොළෙහි ප්‍රහාරය සිදු වූයේ දින කිහිපයකට ඉහතදී වුවද ඇගේ ජීවිතය තවමත් අනතුරෙහි ඇතැයි සිතමින්, සිල්වා ක්‍රියාකරන ලෙසින් නිතර කුරුල්ලෝද ඇය දෙස පරීක්ෂාකාරීව බලා සිටියහ. ඔහු හැමවිටම විගස කලබල වූයේය. පරීක්ෂාකාරීව සිටියේය. ඉඳහිට කුඩා ශබ්දයකින් වුව ඔහු බොහෝ සේ කැළඹිල්ලට පත්වූයේය. වෙඩි හඬක් ලෙසින් යාන්තමට ඇසෙන ඕනෑම අනපේක්ෂිත හඬක් ඇසීමෙන් ඔහු දුටු බිහිසුණු ප්‍රතිබිම්බය වෙත ඔහුගේ සිත ගෙන ගියේ ඔහුගේ හද ගැස්ම බොහෝ සේ වර්ධනය කරමිනි. ඔහුගේ බල්ලා බුරන හඬ ඇසෙන ඕනෑම අවස්ථාවක ඔහුගේ සිරුර වෙව්ලන්නට පටන් ගත්තේය. සමූල ඝාතනයට වගකිය යුත්තේ කවුරුන්ද යන්න තවමත් පැහැදිලි නැත. ස්තුතිවන්නට ජීවිත බේරාගෙන තිබෙන්නේ සිල්වා සහ දියණිය පමණක් නොවේ. ඔහුගේ පවුලේ උදවියට දිවි බේරාගත නොහැකි වුවත්; , රාජන් නම් වූ මිනිසෙක් දිවිගලවාගෙන ඇත. කුලසේකරගේ පුතා හා දුව අද රෝහලෙන් නිදහස් කර එවා ඇත. වෛද්‍යවරයා අභ්‍යන්තර තුවාල පරීක්ෂා කර ඇත්නම් සහ අභ්‍යන්තර තුවාල සුව වී ඇත්නම් දිවි බේරාගත් අනෙකුත් උදවියට ගම්මානයට පැමිණිය හැකිව තිබිණි.

ඔහුගේ කල්පනාවට අනුව පාර්වතී ජීවතුන් අතර සිටියි. රාජන් දිවි බේරාගෙන ඇතැයි කිසිවෙක් නොසිතුවද ඔහු ජීවතුන් අතර සිටියේය. කුලසේකරගේ පියා සොයාගන්නට හැකි වේ යැයි සිතුවේ කවුද? පාර්වතී ද එලෙස ජීවත් විය යුතු වූවාය. ඇය ඔවුන්ට වඩා ශක්තිවන්තය. අනෙක් අතට ඇය සිටියේ වෙඩි තැබීම සිදු වූ ස්ථානයට බොහෝ දුරිනි. ඇය සොයාගැනීමට හැකි හැමදෙයක්ම සිල්වා කළේ ය. කොළඹ යන්නට එන්නට වියදම් කිරීමෙන් ඔහුගේ ඉතුරුම් සිඳී ගොසිනි. ලෙඩුන් වෙනත් රෝහල්වලට මාරු කිරීමේ වාර්තා පිරික්සමින් දිස්ත්‍රික්කයේ හැම

රෝහලකටම ගොස් ඔහු සොයා බැලුවේ ය. ඔහු පාර්වතීගේ අතුරුදන් වීම ගැන පොලිසියට පැමිණිල්ලක්ද දැමුවේය. පොලිස් ස්ථානාධිපතිට රුපියල් දස දහසක අල්ලසක් දීමට ද ඔහු අමතක නොකළේය. දැන් ඔහුට කළ හැකිව තිබුණු එකම දෙය සිදුවන්නේ කුමක්දැයි බලා සිටීමයි. එහෙත් ඔහුගේ සියලු ප්‍රයත්නයන් මෙසේ තිබියදී, තමා ඇය සොයාගැනීමට ගත්තේ පුංචි උත්සාහයක් පමණක් යැයි යන සිතුවිල්ල තවමත් ඔහුගේ අභ්‍යන්තරයෙහි කොතැනක හෝ ගැඹුරට කා වැදී තිබුණේය.

ගේට්ටුව අසල සිටින තැපැල්කරුගේ සීනුවේ ශබ්දය සිල්වාගේ සිතුවිලි බිඳ දැම්මේය. වහා දිව ගිය හෙතෙම කාකි නිළ ඇඳුමෙන් සැරසුන කැහැටු මහළු මිනිසා අතින් ලියුම උදුරා ගත්තේය. කවරය ඉරා විවර කළ සිල්වා ලිපිය කියවන්නට වූයේය. ඔහුගේ දෑස් ලිපියෙහි වචන පේළි හරහා දිව යද්දී, චිත්තාවේගයෙන් ඔහුගේ හදවත බර වී වැඩි වේලා යන්නට මත්තෙන් දණගසාගෙන කුඩා දරුවෙකු මෙන් වැළපෙන්නට වූයේය. ඔහුගේ බිරිඳ අතුරුදන්ව ඇති බව නිල වශයෙන් ප්‍රකාශයට පත් කර තිබිණි. මේ ඉතා අවසනාවන්ත යුද්ධයේ ගෙවී ගිය වසර ගණනාව තුළ අත්දැකීම්වලින් ඔහු දැන සිටි දෙය වූයේ, ඇය සොයාගන්නට ඔවුන් කළ හැකි සියල්ල කළ බව කීවද, මේ ලිපියෙන් අදහස් කරන්නේ බලධාරීන් සැබවින්ම ඇය පිළිබඳව සෙවීම අත්හළ බවයි. ශාන්ති දුවමින් ඔහු වෙත පැමිණියාය. ඔහු ඇය වැළඳ ගත්තේය. තමාගේත් පාර්වතීගේත් ආදරයෙහි ඵලය වූ මේ දරුවා නැවත තමා වෙතින් ගිලිහී යනු දකින්නට ඔහුට වුවමනා නොවීය. ඔහු ඇයගේ සිරුරෙහි එල්ලී ගත්තේ ඇගේ උණුහුමෙන් ධෛර්යය සහ අධිෂ්ඨානය ලබා ගනිමිනි. නැත, බලධාරීන් කුමක් විශ්වාස කළද, ඔහු ඇය සෙවීම අත හරින්නේ නැත. ඔහු ඇය සෙවීම අතහරින එකම මාර්ගය විය හැකි වන්නේ ඔවුන් ඇගේ මෘත දේහය ඉදිරිපත් කරන්නේ නම් පමණකි.

***ශාන් දිසානායක** ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ ඉංග්‍රීසි සාහිත්‍ය විශේෂ උපාධිය හදාරන ශිෂ්‍යයෙකි. ඔහු ෆැන්ටසි සාහිත්‍ය කියවීමට හා ලිවීමේ කලාව හැදෑරීමට කැමැත්තේය. ලිවීමේ ක්‍රියාවලියේ දී අද්භූතය සහ විශ්වය ක්‍රියාකරන ආකාරය පිළිබඳ අන් හැමටම වඩා ඔහුගේ සිත ඇඳ බැඳ තබාගනියි. ලිවීම හැරුණු කොට ඔහු ක්වොන්ටම් යන්ත්‍ර විද්‍යාව හා යථාවේ ස්වභාවය පිළිබඳව උගැන්මට කැමැත්තක් දක්වයි.*

# මුරපොළ

## නුෂෙල් දි සිල්වා

වෙරළාසන්න පාරෙහි, සිය වැඩ කටයුතු සඳහා ගමන් කරන උදෑසන රියපෙළ සන්සුන් බවකින් යුතු විය. රිය පදවාගෙන යන රධිකාට, තැන් තැන්වල තිත් මෙන් තිබුණු නෞකාවන් සහ බෝට්ටු සහිත සන්සුන් ක්ෂිතිජය ඉදිරියට සාගරයේ නීලහරිත ජලකඳ දියරැල් නංවමින් යනු දක්නට ලැබිණි. උදාහිරු ඇයගේ වින්ඩ්ස්ක්‍රීනයේ දිදුලන්නට විය, සුදු පෙණ පිඬු සහිත රළරැළි, අහසෙහි රෝස සහ තැඹිලි පැහැති කුඩා වළාකුළු සමග එක් වෙයි. මෙහි වාහන ගමනාගමනය කිසිවිටෙකත් ගාලු පාරේ මෙන් ඝෝෂාකාරී වූයේ හෝ ව්‍යාකූල වූයේ හෝ නැත, වාහන නොනැවතී ඉදිරියට ගමන් කළේය. කොළඹ ඇතුළත ගමන් කිරීමේ දී ඇගේ ප්‍රියතම මාර්ගය ලෙස ඇය ඒ මාර්ගය සලකන්නට ඇත. එහෙත් ඒ මාර්ගයෙහි පසෙක වූ මුඩුම මුරපොළ හැමවිටම පාහේ ඇගේ ඒ සිතිවිල්ල විනාශ කර දමන්නට සමත් විය. අවංකවම, ඒ හමුදා සෙබළුන් දෙස ඇගේ මෝටර් රථයේ සිට බලන්නට හොඳ ක්‍රමයක් ඇයට තිබුණේ නැත, ඔවුන් ඇය දෙස බලන විට ඇය ගරුසරු නොමැති අයුරින් බැලුවහොත්, ඔවුන් ඇයව නවත්වනු ඇත. ඇයගේ බැල්ම වෙනතකට යොමු කොට, නොසැලකිලිමත් ලෙසින් දූවිලි පාර දෙස බැල්ම යොමු කළහොත්, එවිටද ඔවුන් ඇය නවත්වනු ඇත. ඇය මේ ක්‍රීඩාව දිනුවත් දිනන්නේ ඉතා කලාතුරකිනි. මේ වන විට ඔවුන් ඇය හඳුනාගනු ලැබ ඇතැයි ඔබ සිතනු ඇත, එහෙත් නැත, ඇය තවමත් නවතනු ලබයි, පරීක්ෂා කරනු ලබයි.

මේ බදාදා උදෑසන ද ඈත තබා ඇයට මුරපොළ දැකිය හැකි විය, ඒ කුඩා දුඹුරු පැහැති මුරපොළ විසල් වී පෙනෙයි. 'කරුණාකරලා, අද නෙවෙයි', ඇය තමාටම කියා ගන්නේ අනුමානයෙන් යුතුව සිය පාදය ඇක්සලේටරය මත අඩමානයෙන් තබා ගනිමිනි. වේගයෙන් මුරපොළ පසුකර යාමේ පෙළඹවීම මැඩ පවත්වාගෙන ඇය නියත වේගයක් තබා ගත්තාය, ඇය සිය දෑසෙහි නොසැලකිලිමත් බැල්මක් තබා ගන්නට උත්සාහ කළාය. අද නවතනු ලැබීමට ලක්විය හැකි නරකම දිනය විය හැකිය. ඇගේ සීනු ඔරලෝසුව (Alarm) නැවතී තිබුණු අතර, ඇය අවදියෙන් සිටින්නේදැයි කිසිවෙකු සොයා බලා නැත. ඇයට සිය බිලවිසය

පෙරදින රාත්‍රියේ මැද තැබීමට අමතක විය, අනෙක් අතට මයුරි බොහෝ වේලාවක් නාන කාමරයේ ගත කළාය. 'අනේ අද නම් මේක වෙන්න එපා' ඇය නැවත මුමුණා ගත්තාය. කාකි ඇඳුම ඇඳගත් නිලධාරයා අප්‍රසන්න නැවතීමේ සංඥාව දීමෙන් පසුව එයට ප්‍රතිචාර වශයෙන් මීටර් සිය ගණනක් ඉදිරියෙන් තිබූ කළු පැහැති මෝටර් රථය ගමන බාල කළ අතර, රධිකාට එයින් පොඩි සැනසිල්ලක් ඇති විය. ඔවුන් කළු පැහැති මෝටර් රථය පරීක්ෂා කිරීමට කාලය මිඩංගු කරන බැවින් ඇය දෙස බලන්නට වේලාවක් නොතිබෙනු ඇත. මොන? එබඳු වාසනාවක් නැත. නොසැලකිලිමත් බැල්ම අද උදෑසන කිසි ලෙසකින්වත් කිසිදු ආශ්චර්යයක් සිදුකළේ නැත. ඇය කළු කාරයට මදක් ඈතට වන්නට සිය කාරයෙහි වේගය අඩු කළාය. සැබෑ මුරපොළ දෙස බලන්නට ඇය අකමැති වූවාය, ඒ වෙනුවට මුහුදෙහි නීල හරිත දිය කඳ පෙරලෙන අකාරය දෙස ඇය බලා සිටියාය. එය ඇයට සන්සුන් හැඟීමක් ගෙන දුන්නේය.

එසේ වුවද, ඇයගේ සිතෙහි දැන් සුවිශේෂ සන්සුන් බවක් ඇති වූයේ නැත. නිහඬව සාප කරමින් ඇය ස්විචය ක්‍රියාවිරහිත කොට වීදුරුව පහත දැමුවාය. මේ නිලධාරීන් ඔබ නවතා සුනංගු කර තබා ගැනීමට රුචි බව පෙනී යයි. ඇය සිය පසුම්බියෙන් තම ජාතික හැඳුනුම්පත ගන්නට නැඹුරු වූවාය. එවිට ඇයට ඇගේ දෙකන් පෙතිවල වූ රත්තරන් කරාබු පැද්දෙනු දැනිණි. ස්වර්ණාභරණ පැළඳීමට තෝරාගත්තේ හොඳම දවසකි. ඇගේ මිතුරිය නයනා කියන ආකාරයට එවිට ඇය 'වඩාත් දමිළ' බව පෙනෙයි. නයනා ගැන සිතීම රධිකාගේ කෝපය අවුස්සයි. තමා කෝප ගන්නා ඇගේ කතාව ගැන සිතන විට ඇය දත්මිටි කෑවාය. පාසලේදී, ඉතා අපරීක්ෂාකාරී කතා නොසිතා කීමේ නයනාගේ පුරුද්ද දැරියන්ට විනෝදය සපයන්නක් විය. ඇගේ බොළඳ, අනුවණ වාචාල කතා කීමේ අභිරුචිය වයස සහ කාලය ගෙවීයාමෙන් පසුව වුවද වියැකී ගියේ නැත. ඇගේ හිත හොඳ බව රාධිකා පිළිගනියි. එසේ වූයේ වී නමුදු, අනපේක්ෂිත අවස්ථාවන්හිදී ඇය තවමත් ඇගේ කකුල මුවෙහි රුවා ගනියි, දැන් අවුරුදු විස්සක් ගත වූවාට පසුව එය හැමවිටම සිනාවට කරුණක් නොවේ.

'රධිකා, ඔයා පාරේ නිකන් ඇවිදගෙන යනකොට ඔයා දෙමළ කියලා කිසිකෙනෙක් හිතයි කියලා මං හිතන්නේ නෑ' නයනා පසුගිය සති අන්තයේදී කීවාය.

'විශේෂයෙන්ම ඔයා පොට්ටු තියලා නැත්නම්, ඒ වගේම ඔය ලොකු රත්තරන් කරාබු දාලා නැත්නම්. ඔයාට මේ පැහැපත් මුහුණ තියෙනවා. මං කියන්නේ ඔක්කොම දෙමළ අය කළු නෑ...' රධිකාගේ කෝපයට පත් වූ විමසිලිමත් මුහුණෙහි බැල්ම නයනාගේ විසල් ඇස්වලට හසුවූ විට නයනාගේ හඬ බාල විය. ඇගේ අත්වලින් නැගෙන වළලු හඬ නැවතිණි, ඇය ඇගේ තොල් සපා ගත්තාය.

'මේ කරාබු මගේ අත්තම්මගෙ. ඈ මට ඒවා තෑග්ගක් හැටියට දුන්නා'

'නෑ ඔව්, ඇත්තෙන්ම... ඒවා ඇත්තටම ලස්සනයි, මං නිකම් කිව්වෙ'

තමාගේ නාසය විදින්නට අවසර නොලැබීම ගැන නයනා පැමිණිලි කළේ ඒ අවස්ථාවේදීය.

'අයියෝ රධිකා, අප්පච්චි හරි පරණ තාලෙ කෙනෙක්! ඉස්සෙල්ලම මං හිතුවා මං කනේ හිල් දෙකක් විදින්න ඕන කියලා, ඊට පස්සේ මට ඕන වුණා බොලිවුඩ් නිළියො වගේ නහය විදින්න. ඒත් එයා මහ කලබලයක් කළා ඒකට. එයා කියනවා මං එහෙම නොකළ යුතුයි ලු, මොකද මාත් දෙමළ වගේ පෙනෙයිලු. ආ, ඉන්න, නෑ මං ඒක හිතලා කිව්වේ නෑ'

රධිකා නයනාගේ මුග්ධ කතා ගැන, රධිකාගේ දුක් ගැනවිලි පිළිබඳ සිනාසෙන්නා වූ මිතුරියන්ට නිතර පැමිණිලි කළාය.

'ආ ඉන්න රධිකා, අපි නයනා ගැනයි කතා කර කර හිටියේ. ඇයි ඔයා පුදුම වෙලා?'

'එයා ඇත්තටම ජාතිවාදියෙක් නෙවෙයි, මෝඩයෙක් නෙවෙයි, එයාට වචනවල පාලනයක් නෑ. හිතන දේ ඔහේ කියනවා'

'ඔය තරම් කලබලයක් ඇති කරගන්නෙ ඇයි අනේ? දවසක් එයා නතාෂාගේ කොණ්ඩ මෝස්තරය ගැන මොකද්ද කිව්වේ කියලා මතකද?'

'අවංකවම, රධිකා, නයනා මොනවා කිව්වා වුණත් එයාට හොඳ හදවතක් තියෙනවා. ඔයාට ඕන හැමවෙලාවෙම එයා ඉන්නවා ඔයා වෙනුවෙන්. සහතික වශයෙන්ම ඔයාට ඒක දකින්න පුළුවන්'

සමහර අවස්ථාවන්හිදී රධිකා උදාසීන ලෙස සිනාසී එකඟතාව සඳහා අපැහැදිළි අන්දමින් තොල් මතුරන්නට සමත් වූවාය. ඇය සැබවින්ම නයනා කෙරෙහි විශ්වාසය තබන අතර ඇය හොඳ මිතුරියක් ලෙසද සලකයි. එහෙත් පසුව, ඇය කෝපයෙන් සිතනු ඇත්තේ බොහෝ කාරුණික හා දේශපාලන වශයෙන් නිවැරදිව සිටින්නට උගත්, එහෙත් අර්බුදකාරී අවස්ථාවක තමාට කිසිසේත් විශ්වාසය තැබිය නොහැකි අනෙක් මිනිසුන්ගේ සිත් තුළ ඇය ගැන දෝලනය වන අදහස් හා උපකල්පන කවරේද යන්නය. ඇය අනවරතයෙන්ම දැන් සිටින්නේ අර්බුදකාරී අවස්ථාවකය, ඇය මාර්ගයෙහි පසෙක ඇති මුරපොළෙහි සිටියි, ඒ සිටින්නේ ඇගේ දමිළ පන්නයේ කරාබු පැළඳගෙනය, ඇගේ මුක්කුත්තිය පැළඳගෙනය. රථයේ පුවරුව මතුයෙහි ඇගේ කුඩා ගනේෂ් පිළිරුව තබාගෙනය. ඇය කරාබු පැළඳ ගත්තේද නැත්තේද යන්න වෙනසක් ඇති කරන්නාක් සේය. ඒ කුඩා තකතිරු හැඳුනුම් පත්‍රය පමණක් වුව ඇගේ ජීවිතය දුෂ්කර තත්ත්වයකට පත් කරවයි.

'මිස්, කරුණාකරලා හැඳුනුම් පත්‍රය'

ඇය වෙත නැඹුරු වූ කාකි නිළ ඇඳුම ඇඳගත් තරුණයා හැඳුනුම්පත ඉල්ලා සිටියේය. කතා බහකින් තොරව ඇය එය ඔහුට දුන්නේය. සිනාසෙනවාද නැද්ද? ඇයට රවා බලන්නට සිතිනි, එහෙත් කුමකට ද? සිනාවෙන් බොහෝ විට පලක් වන්නේ නැත එවිට ඔවුන් සිතන්නේ ඔබට සඟවන්නට යමක් ඇති බවය. අවංකවම, මෙය යම් හිතුවක්කාර පුද්ගලයෙක් හැමවිටම නීති රීති වෙනස් කරන අගතිගාමී සෙල්ලමක් මෙනි. හිතාමතාම කරදරයක් කිරීමට සිතනවාක් මෙනි.

'මිස්, උපන් ස්ථානය යාපනය?'

ඔහුට කෑ ගැසීමට රධිකාට අවශ්‍ය විය. 'අනේ, මේ නිකන් බොරු ගෞරවය එපා. මෝඩයා මං දන්නවා මේක ඔහේලට විහිළුවක් බව. ඔහේලගේ ඒකාකාරී ජීවිතේ තව මොනවද කරන්න තියෙන්නේ? ඔය ලුණු වැදිච්ච, පුංචි ආරක්ෂක කුඩුවේ ඉඳගෙන ඉන්නවා ඇරෙන්න? යාපනේ උපදින්න සිද්ධ වෙච්ච දෙමළ මිනිසුන්ට හිරිහැර කරන්න, පාරට පැනලා ඔය 'නවතනු' ලකුණ අල්ලනවා ඇරෙන්න?' එසේ කියනු වෙනුවට ඇය ගැඹුරු හුස්මක් ගත්තාය. 'ඔව්, මහත්මයා, ඒත් මම දැන් විසිතුන්

අවුරුද්දක් දෙහිවල ජීවත් වෙන්නේ' ඇය සිය ස්වරයෙහි ප්‍රසන්න බව සහ ගෞරවාන්විත බවද එහෙත් දැඩි බවද තබා ගැනීමට සටනක යෙදුණාය.

'රියදුරු බලපත්‍රය බලන්න පුළුවන්ද මට?' ඔහුගෙන් පෙනුණේ අවිශ්වාසයක සේයාවද, නැතහොත් ඇය කලබලයට පත්වූවාද?

'සහතික වශයෙන්ම' ඇය සිය පසුම්බියට අත දමමින් කීවාය.

පුදුමයකි, එය නියමිත ස්ථානයෙහි නැත. මෝටර් රථයේ ඉදිරි ලාච්චුවෙහි එය තිබෙනවා විය යුතුය. ඇය නැඹුරු වී එය විවෘත කළාය, ලාච්චුව අවුස්සමින් එය සොයන ඇයට සිය උදරයෙහි සුළු දැගලිල්ලක් දැනිණි. අනතුරුව, ඇගේ රියදුරු බලපත්‍රය, තම කණ්ණාඩි මේසය උඩ තිබෙනු ඇය පැහැදිලිවම දුටුවාය, බලපත්‍රය අලුත් කිරීමේ පෝරමය පිරවීම සඳහා පිටතට ගත් රියදුරු බලපත්‍රය නොසැලකිලිමත් ලෙසින් ඇය කණ්ණාඩි මේසය මත තබන්නට ඇත. මේ වනවිට ඇයට එහි අංකය මතකයේ තබාගැනීමට හැකිවිය යුතුය. මොන හත්හිලව්වක්ද මන්දා?

'ම්... මහත්තයා මං හිතනවා මං ඒක ගෙදර දාලා ඇවිත්'

ඔහුගේ සන්නිවේදන ගුවන් විදුලි යන්ත්‍රය නාද වූ අතර ඔහු එයට සවන් දීමට හැරුණේය. රධිකා ඇවිස්සී ගිය කෝපයෙන් යුතුව දැස් වසා ගත්තාය. එහි සර සර හඬින් ඇයට කිසිවක් උකහාගත හැකි නොවීය, එමෙන්ම ඔහුටද ඒ පැටලිලි සහිත නියෝගවලින් කිසිවක් වටහාගත හැකිදැයි ඇයට සිතුණේ නැත. එහෙත් යම් ඉහළ නිලධාරියෙක් ඔහුට බුරා වැටෙන්නට ඇත්තේ, පෙරදින රැයෙහි සිය බිලිවිසය මදිනු වෙනුවට එහි පුපුරණ ද්‍රව්‍ය ඇසිරූ දමිළ කාන්තාවක, මොටර් රථයේ පසුපස පුපුරන ද්‍රව්‍ය පිර වූ හොන්ඩා ස්කෝඩ් වර්ගයේ මෝටර් රථයකින් නිසැකවම පැමිණෙන බැවින්, ඇය පිළිබඳව විමසිලිමත් වන ලෙස නියෝග කරමින් විය යුතුය. ඇය දමිළ පන්නයේ විශාල රන් කරාබු පැළඳ සිටින්නට ඉඩ තිබේ. සැණෙකින් ඇය යළිත් කෝපයට පත් වූවාය. එය කෙතරම් මුග්ධ දැයි ඔවුන්ට නොපෙනුණේද? දෙවියන්ට පින්සිදු වන්නට ඇය නැගී එන බැංකුවක සේවය කළාය. ඇය වැඩ කළ ප්‍රමාණයට, කුමන්ත්‍රණයක් ගැන සිතන්නට කිසිදු වේලාවක් තිබුණේ නැත. කුමන්ත්‍රණයක් කරනවා තබා එවැන්නක් සිතාගන්නටවත් වේලාවක් ඇයට තිබුණේ නැත.

HSBC බැංකුවේ ඇගේ රැකියාව ගෞරවනීය රැකියාවකි, ඇය සේවය කළේ සතුටිනි. එහෙත් ඇය බැංකුවේ සේවය තෝරාගත් සැබෑ හේතුව වන්නේ, 83 ජාතිවාදී කෝලාහලය කාලයේදී සිදු වූ දෙයක් පිළිබඳ රාජ් මාමා ඇයට කී කතාවකි. 'ගිනි තැබීම් අහන්න ලැබුණම අපේ මිත්‍රයෝ අපිව සේප්පු වලට දැම්මා, අපි මුළු රෑම සේප්පු ඇතුළෙ හිටියා. කාටවත් බැහැනේ සේප්පුවක් ගිනි තියන්න, බෑ! මං හිතනවා බැංකුවට අපිව කොයිතරම් වටිනවද කියලා අර ජාතිවාදී උෟරෝ දැනගෙන හිටියේ නෑ කියලා' එබැවින් ගැටවර දැරියක ලෙස ඇය එහි, එනම් දමිළ මිනිසුන්ගේ වටිනාකම දැන සිටි බැංකුවේ සේවය කිරීමට තීරණය කළාය. එකල, පාසලේදී සිදුවෙන දූසිම් ගණන් වූ අසාධාරණකම් වලින් ඇය අපේක්ෂාභංගත්වයට පත් ව සිටියාය. ඇගේම පියාට සේවය කරන ස්ථානයේදී විඳින්නට සිදුවූ අසාධාරණකම් පිළිබඳව නුදුටු ලෙසින් සිටීම පිළිබඳව කෝපයටත් වෙහෙසටත් ඇය පත් ව සිටියාය. රාජ් මාමා එවකට බැංකුවේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධරයකුව සිටියේය. සම්මුඛ පරීක්ෂණයට පෙර ඔහු ඇය පිළිබඳව සඳහනක් කර තිබිණි. ඔහුද පසුපසට වී සිටි තවත් කෙනෙක් වූයේය, එහෙත් අප්පා මෙන් නොව ඔහු දමිළ මිනිසුන්ට මේ රටෙහි සලකන ආකාරය පිළිබඳව මිථ්‍යා අදහස් තිබුණේ නැත. ඔහුට හොඳ රැකියාවක් තිබුණු අතර ඔහු එබඳු රැකියාවක් ලැබීමට සුදුසු වූවේය. මන්ද ඔහු එය සඳහා බොහෝ වෙහෙසී වැඩ කළ බැවිනි. එය එපමණකි, ඒවා වෙනස් වූයේ නම් ඔහු එය අතහැර යනු නිසැකය. සිංහලයන් මෙන්ම බොහෝ දමිළ තැනැත්තන්ද අධිකාරිත්වය දරන තනතුරුවල සිටින තැන් කිහිපයෙන් එක් තැනක් ලෙස මේ බැංකුව සඳහන් කළ හැකිය. යම් දිනෙක ඔවුන්ගෙන් කෙනෙකු වීමට රධිකා තීරණය කොටගෙන සිටියි.

'අපිට රියැදුරු බලපත්‍රය බලන්න ඕන මිස්. ආරක්ෂක අනතුරු ඇඟවීමක් අද උදේ දීලා තියෙනවා'

'කට වහනවා, කට වහනවා' ඇය සිතුවාය. ඔය තරම් සමාව අයදින ආකාරයෙන් කතා කිරීම නවත්තනවා. සැබැවින්ම, මේ ගැන නුඹට බොහොම සතුටුයිනෙ. ඔය මෝඩ ආරක්ෂක අනතුරු ඇඟවීම් ඇරුණු කොට, මා අත කිසිම වරදක් නැති බව ඔබ දන්නවා. මම ඇඳ සිටින්නේ පැහැදිළිවම රතු HSBC බ්ලවුසයකි.

'මහත්මයා, මම ඒක ගෙදර දාලා ඇවිල්ලා. මට කනගාටුයි. ඒත් මගේ හැඳුනුම්පත තියෙනවා, ඒක ඇති නේද?'

ඔවුන්ගේ ඇස්පිහාටු මදක් නටවා, ලද බොළඳ හඬකින් කතාකොට සිංහල දැරියන් කීදෙනෙක් දඩ කොළයක් හෝ නොලබා බේරියන්නට ඇද්දැයි ඇය සිතුවාය. සැබවින්ම, එය හාස්‍යජනක වූයේය. එහෙත් ඇය ඒ පහත් තත්ත්වයට වැටෙන්නේ නැත.

'කනගාටුයි මිස්, ඔයාට ෆෝරමේ පුරවන්න වෙනවා. කාරෙකේ බූට් එක අරින්න'

ඇය කාරයේ පසුපස විවර කිරීමට බිමට බට විට, මුහුදු සුළඟට ඇගේ හිසකේ හසු විය, ඇගේ එල්ලෙන කරාබු සෙලවෙන්නට විය. නිසැකවම, කාරයේ පසුපස කිසිවක් නැත. කාරයේ පසුපස දොර විවර කරන ලෙසද ඇයට ආරක්ෂක නිලධාරියා සංඥා කළේය. එහිද කිසිවක් නැත.  අම්මාට, රියැදුරු බලපත්‍රය රැගෙන එන ලෙස කීමටද ඇයට හැකියාව තිබේ, එහෙත් දෙහිවල සිට? ඇය බඩු ගෙන එන්නට ගියේ බදාදා දිනවලය.

තව කාන්තා නිලධාරිනියක් පළමු වැන්නාට එක් වූවාය. අපූරුයි. ඔබ සියලු දෙනාම මා වටා මෙසේ එක් රොක්ව ජීවිතය දුක්ඛිත තත්ත්වයට ඇද හෙළති. තරුණිය සිය සගයා අතින් හැඳුනුම්පත ගත්තාය, ඇය එහි අංකය අප්‍රමාදව පොතක ලියා ගන්නට පටන් ගත්තාය. සැනෙකින් ඇය රධිකා දෙස බලා, තම හිස පසෙකට ඇල කොට ගත්තාය.

'මිස්? රධිකා තම්බිරාජා?'

'ඔව්?' මොකද්ද ? ඇය දූන් කළේ කුමක්ද? ඒ මාර්ගයේ ඔවුන් බලා සිටින්නේ රධිකා තම්බිරාජා නම් වූ මරාගෙන මැරෙන බෝම්බ කාරියක පැමිණෙන තුරුද?

'තාත්තගේ නම?'

'අරුල් තම්බිරාජා' ඔවුන්ට පවුලේ සියලු දෙනා ගැන දැනගන්නට වුවමනා වී ඇත්තේ මොන කරුමයටද?

'මිස් පදිංචිය දෙහිවල නේ? හිල් ස්ට්‍රීට්? කාර්ගිල්ස් එක ළඟ?'

'ඔව්  කොහොමද ඔයා දන්නේ ?'

ඇය දනටමත් ඔව් යැයි කීවේද?

'මිස්, මමත් ඒ පාරෙම පහළ පදිංචිය. මල්ෂිනී අප්සරා'

රධිකා හිස් බැල්මෙන් ඇය දෙස බැලුවාය. ඇයගේ ජීවිතයේ ඇයට කිසිදු මල්ෂිනි අප්සරා කෙනෙකු මතකයේ නැත. ආරක්ෂක තරුණියගේ කාන්තිමත් සිනාව මදක් වියැකී ගියේ ය.

'මිස්, ඔයාගේ තාත්තා අපිට ඉස්කෝල පොත් අරන් දුන්නා'

අනේ මේ ඒ ගෑනු ළමයද? තමන්ට සහ තම සොහොයුරන්ට අයත්, වාර්ෂිකව ඉවත් කළ ඇඳුම් සහ පාසල් නිළ ඇඳුම් ගෙන යන පාර පහළ දූරියන් සහ දරුවන් කිහිපදෙනෙක් ඇගේ මතකයට නැගිණි. අප්පා මේ අසරණ දරුවන්ට පාසල් පොත් මිල දී ගන්නට ඇත, එමෙන්ම නව වසරට ඔවුන්ට ඇඳුම් සහ කමිස රෙදි මිල දී ගෙන දෙන්නට ඇත.

'මිස්, මාව මතකයි නේ?'

රධිකා ඇසි පිය ගසා, හිස සොලවා, පුළුල් සිනාවක් පෑවාය. 'ආ ඔව්, මල්ෂිනි අප්සරා! ඔයා හිටියේ ජම්බු ගහ තියෙන ගෙදරනේ. සමහර වෙලාවට අපි ආවම ඔයා අපිට ජම්බු දුන්නා'.

'අපි ඔයාලට ඇඳුම් දෙන්න ආවම' එසේ කීවේ මොන හිතකින්ද? එක් අතකට එය අවමානයකට පත් කිරීමේ ධ්වනියක් නැගුවේ නැත. එහෙත් මල්ෂිනි අප්සරා, රධිකාගේ 'නයනා' ආකාරයේ මුග්ධ කතාවෙන් කිසිසේත් කෝපයට පත් නොවී, නැවත පුළුල් සිනාවක් පෑවාය.

'ඔව් මිස්! කියන්න තාත්තට මං මතක් කළා කියලා'

'සහතික වශයෙන්ම. එයාටත් ඔයාව මතකයි'

එය සත්‍යයකි. අප්පා හැම කෙනෙක්ම සහ හැම දෙයක්ම ගැන ලොකු උනන්දුවක් දක්වූයේය.

'මං මේ මිස්ව දන්නවා. එයාට යන්න පුළුවන්' මල්ෂිනී අප්සරා සිය සගයා වෙත හැරෙමින් කීවාය, එය නැවත සහතික කරන්නට මෙන් ඇය හිස සෙලවූවාය. ඔහු ඇය දෙස සැකයෙන් බලා අනතුරුව හිස සෙලවූයේය.

'ඔයාට ස්තුතියි මල්ෂිනි. ඉස්සරහට මං මගේ රියදුරු බලපත්‍රය අමතක කරන්නේ නෑ. මං අප්පට කියන්නම් අද මට ඔයාව මුණ ගැහුණා කියලා'

පා මදක් පැකිලෙද්දී, රධිකා සිය මෝටර් රථය වෙත ආපසු ගියාය. මොටර් රථය පණ ගැන්වීමට සූදානම් වන විටදී, ඇයගේ නෙතට රථයේ පුවරුව මත ඇති, ඇයට අප්පා තිළිණ කළ ප්‍රීතිමත් කුඩා ගනේෂ් රුව දිස්විය. අප්පා කොතරම් අහිංසක සහ සර්වශුභවාදී වූයේ දැයි කිවහොත් ඇයට ඔහු අල්ලා, සොලවන්නට සිත්විය.

1983 කැරලි කෝලාහල අවස්ථාවේ සිදුවීම් නිසා ඔහුට ඔහුගේ මිතුරන් සමහරෙක් අහිමි වුවද, ඔවුන් රට හැර ගියේ නැත. බොහෝ දෙනා ටොරොන්ටෝ සහ ලන්ඩන් නගරවලට සංක්‍රමණය වෙමින් සිටි නමුදු ඔවුහු රටහැර නොගියහ. 'අපි රට හැරලා නොයනවා නම් ඒ අය තේරුම් ගනීවි අපි අහිංසකයි කියලා. අපි හදිසියේ පලා යනවා නම් ඒකෙන් පෙනෙයි අපි වැරදි කාරයෝ කියලා. අපිට මේ රට වෙනුවෙන් වගකීමක් තියෙනවා. අපිට බැ නිකන් පැනලා යන්න' යැයි ඔහු කීවේය. අම්මා ඒ සම්බන්ධයෙන් කිසිවක් නොකීවාය. ඉදින් අප්පා සිය මුළු ජීවිතයම ගත කළේ රැකියාව උදෙසාය. බොහෝ සේ වෙහෙස මහන්සි වී වැඩ කළද ඔහු වෙනුවෙන් කිසිවිටෙක වචනයක් නොකියන සිංහල නරුමයන්ගෙන් පිරි දෙපාර්තමේන්තුවක හැමවිටම උසස්වීම් වලදී ඔහු නොසලකා හරිනු ලැබුණි. සමහර අවස්ථාවන්හිදී ඔහු සිය ඇස් දෙක රැළි නංවාගෙන පැමිණෙන්නේය. එවිට, ඔහු කතා කරන්නේද, කෑම බීම ගන්නේද මද වශයෙනි. අනතුරුව ඉක්මනින් නින්දට යයි. එහෙත් එබඳු දවස් තිබුණේ ඉඳහිටය. සාමාන්‍යයෙන් ඔහු ඔහුගේ සිංහල සහෝදර සේවකයන් ගැන කරන කතා, ඔවුන්ගේ දරුවන් සරසවියට ඇතුළු වීම, පොහොසත් ස්වාමිපුරුෂයන් හෝ සර්ව සම්පූර්ණ බිරින්දෑවරුන් ලබන දරුවන්ගේ විවාහ බන්ධන ආදියට සැබඳෙයි.

දිනක් ඔහු නිවසට පැමිණ ප්‍රීතිමත් ලෙසින් කීවේ 'හොඳ ආරංචියක්! ජගත්ව අපේ පැත්තේ කළමනාකරු හැටියට උසස් කරලා. එයා අපේ කාර්යාලයේ හොඳටම විශ්වාසය තියන්න පුළුවන් අයගෙන් එක්කෙනෙක්'

රධිකා සහ පවුලේ උදවිය ඔහු දෙස බැලුවේ වික්ෂිප්ත ලෙසිනි.

අප්පා ඒ උසස් වීම තමාට ලැබෙනු ඇතැයි බලාපොරොත්තු තබාගෙන සිටියේය.

අම්මා ඔහුට එය පෙන්වා දුන් කල්හි 'ආ හොඳයි, ජගත්ට ඒක ලැබෙන්න සුදුසුයි. අපේ පැත්ත දැන් හොඳ අතකට ගිහිල්ලා තියෙන්නෙ' යි ඔහු කීවේය.

'ඒත් අප්පා, එයාගේ සහෝදරයා නේද ප්‍රාදේශීය ප්‍රධානියා?' ඔහු සිය මිතුරාගේ ජයග්‍රහණය පිළිබඳව අවංකවම සතුටුවන බව දැන ගැනීමෙන් කෝපයට පත් වූ රධිකා තර්ක කළාය.

'රධිකා ඒකේ සම්බන්ධයක් නෑ මේ කාරණාවට. ජගත් එකට වැඩ කරන විශේෂ කෙනෙක්. ඊට අමතරව...'

එහෙත් ඇය ඇස් කරකවා ඔහු නොසලකා හැරියේය. ඔහුගේ සියලුම මිතුරන්, විශේෂයෙන්ම අප්පාගේ උසස්වීම් වළකාලමින් තමාට උසස් වීම් ලබාගැනීම සඳහා ඔහුගේ සම්බන්ධතා ප්‍රයෝජනයට ගත් දූෂිත ජගත් මාමා පවා මිත්‍රයකු යැයි අප්පා කියන්නේ කෙසේදැයි ඇයට තේරුම් ගත නොහැකි විය.

සති අන්තයන්හිදි, අප්පා අවුරුදු උත්සව සහ නත්තල් උත්සවයන්හි සිට සියලුම දේ සංවිධානය කරන්නට හිල් වීදියේ වැසියන්ට උදව් වීම සඳහා බලවත් උනන්දුවක් දැක්වූයේය. හැමවිටම ඔහු හැම තැනකදීම සිය නිහඬ ආධාර ලබා දුන්නේය. තවත් මල්ෂිනි අප්සරාවන් කිහිපදෙනෙක් සිටි බව රධිකා දැන සිටියාය.

එතෙකුදු වූවත්, ඔහුගේ අධිමානසික සර්වශුභවාදය සහ නිර්ලෝභී බව රධිකාගේ නුරුස්නා බව වඩ වඩාත් දැඩි කළා පමණකි, මන්ද ඔහුගේ අපේක්ෂාව, උමතු අන්ධභාවයක් සමග එක් වීමෙන්, යමක් ඍජුව ප්‍රකාශකිරීමට ඔහු තුළ තිබූ අකමැත්ත ඇය දුටු බැවිනි. මේ යථාර්ථයන් තේරුම් ගැනීමට අප්පා තුළ ඇති නොහැකියාව කරන කොටගෙන, දිනපතා සිදුවන විෂමතාවන් ගැන වටහාගැනීමට, අසාධාරණය පිළිබඳ වඩාත් ඍජුව කතා කිරීමට ඇයට හැකියාව ලැබුන අතර සමහර අවස්ථාවන්හි දී, ඒ නිසා තමා වහා කිපෙන සුළු නිසා පැමිණිලි කරන කෙනෙකු වනු ඇතැයි ඇය බිය වූවාය. ඇය වඩා ලොකු මහත්වන විට, ඔහුගේ අදහස්

සහ ඔහුගේ තීරණ පවුලෙහි දුෂ්කරතා සහ ඉච්ඡාභංගත්වය ඇති කළේ කෙසේද යන්න පිළිගැනීම ඔහු එකහෙලාම ප්‍රතික්ෂේප කළ විට තමාගේ කෝපය වඩාත් දැඩි වූ බව ඇය තේරුම් ගත්තාය.

ඔවුන් සියලු දෙනා පාසල් යමින් සිටි කාලයේ, දිනක් ඇගේ සොහොයුරු ජෙගන් පැමිණ කෝපත්ව හඬමින් කියා සිටියේ ක්‍රිකට් කණ්ඩායමට වෙනත් ළමයෙක් ගත් බවය.

'ඒක හරිම අසාධාරණයි අම්මා. පුහුණුවට ෂෙහාන්ව ගත්තෙ ෂෙහාන්ගේ තාත්තා මන්ත්‍රී කෙනෙක් හින්දා. එයා පහුගිය සතියෙ ඒ ගැන පම්පෝරි ගහමින් හිටියා. ඒත් මං මේ මුළු අවුරුද්දෙම එයාට වැඩිය හොඳට සෙල්ලම් කළා. මං හිතුවා පුහුණුකරු මාව තෝර ගනියි කියලා. ඒත් එයා මාව තෝර ගත්තේ නෑ. ඒක සාධාරණ නෑ, අම්මා! '

අප්පා ඒ අවස්ථාවේදී එයට මැදිහත්ව සියල්ල නරක අතට හැරවූවේය.

'පුතා, ඔයා අනික් අයට මේ විදිහට චෝදනා කළ යුතු නෑ. ඔයාගේ කුසලතා වැඩිකර ගන්න බලන්න'

'ඒත් අප්පා, මං ඒක තමයි කළේ. මං දන්නවා මං කොච්චර හොඳට සෙල්ලම් කළාද කියලා'

'හොඳයි, එහෙනම්, පුතා, ඊළඟ අවස්ථාවේ ඔයාට තැනක් සහතිකේටම ලැබෙයි'

'ඒත් අප්පා, බිග්මැච් එක තියෙනවා මාස දෙකකින්! ඊට ඉස්සෙල්ලා මාව තේරෙන එකක් නෑ. කොහොම වුනත්, ෂෙහාන් වගේ අය තෝරාගන්නවා නම් මට කණ්ඩායමට තේරෙන්න කවදාවත්ම අවස්ථාවක් ලැබෙන එකක් නෑ'

'පුතා, මට හොඳටම විශ්වාසයි පුහුණුකරු හොඳටම දන්නවා එයා කරන දේ. තාත්තා කවුද කියන එක උඩ වෙන ළමයෙක්ව තෝරගන්න ඇති කියලා මං හිතන්නේ නෑ'

'අප්පා මගේ වයස පහළොවයි. මට අවුරුදු දහයයි වගේ කතා

කරන්න එපා. මේ වගේ දේවල් හැමදාම වෙනවා! එහෙම නැත්නම් අප්පා හිතනවාද කණ්ඩායමේ තැනක් ලබාගන්න මම සුදුසු නෑ කියලා ?'

ජෙගන් පෙරටද වඩා කේන්තියෙන් යුතුව සිය කාමරය තුළට ගියේය. කාලයක් යනතුරු, පාසලේ ක්‍රිකට් තරඟවලදී තමා ක්‍රීඩා කරනු බලන්නට අප්පාගේ පැමිණීමද ඔහුට අවශ්‍ය නොවීය. 'අප්පා හිතන්නෙ නැහැ මං හොඳට සෙල්ලම් කරනවා කියලා, ඒක නිසා අප්පා මං සෙල්ලම් කරනවා බලන්න එන්න ඕන නෑ'

හොඳ ලකුණු ලබාගැනීම සහ බාහිර කටයුතු සඳහා ඇගේ සහභාගිත්වය තිබුණේ වූ නමුදු මයුරි ශිෂ්‍ය නායිකාවක් බවට පත් වුණේ නැත. ආචාර්ය මණ්ඩලයෙහි ඡන්දය භාවිතා කිරීමේ දෝෂයන් තිබුණු බව රධිකා පෙන්වා දුන්නාය. 'මයුරි හිටියේ සිංහල මාධ්‍ය පන්තියක නම් තව ගුරුවරු එයාට ඡන්දෙ දෙන්න තිබුණා'.

මේ තර්කයෙහි අන්තර්ගත වූ දෙය පිළිගැනීම අප්පා ප්‍රතික්ෂේප කළේය.

'රධිකා ඒක බොහොම නොසැලකිලිමත් කතාවක්. අපේ මව්බසේ අගය අපේ භාෂාව කොයිතරම් රමණීයද, කාව්‍යාත්මකද කියන එක ඔයා අගය නොකරන එක ගැන මං කනගාටු වෙනවා. සමහර විට මං ඔයාට අර කවිපොත දෙන්න ඕන..'

'ඒත් අප්පා, මං කතා කරන්නෙ දමිළ භාෂාව ගැන නොවෙයි. මං කතා කරන්නේ මයුරිගෙ ශිෂ්‍යනායක කම ගැන'

'රධිකා, මේ වයසට ඔයා මේ විදිහට හිතනවා. තව අවුරුදු කිහිපයකින්, ඔයා කෘතඥ වේවි දෙමළ සාහිත්‍යයේ පොහොසත්කම ගැන ඔයාට හැබෑවටම අගය කරන්න පුළුවන් වීම ගැන..'

'ඒත් අප්පා, අපි කතා කරන්නේ දෙමළ මාධ්‍යය ගැන නොවෙයි. මං කිව්වේ තෝරාගැනීමේදි ක්‍රමය ඇත්තටම අසාධාරණයි කියන එක...'

'සමහරවිට අපි හැමෝටම ලබන සතියේ අර නාට්‍යය බලන්න යන්න පුළුවන් වෙයි, මං පත්තරේ දැක්කා, සමහර විට එතකොට ඕගොල්ලන්ට පෙනේවි...'

දෙමළ සංස්කෘතිය පිළිබඳ අප්පාගේ චමත්කාරජනක හැඟීම්, මයුරිගේ දොම්නස් පිළිබඳ සියලු කාරණා අමතක කරවන්නට ඇත. මේ රටේ දමිළ ජාතිකයකු වීම සැබවින්ම කුමක්ද යන්න අවබෝධ කරගැනීමට එක්කෝ ඔහු සම්පූර්ණයෙන්ම අසමත්ය, නැත්නම් එය පිළිගැනීම ඔහු ප්‍රතික්ෂේප කරයි.

අම්මා තවදුරටත් නිසොල්මන්ව නොව නිහඬව සිටීම ගැන හෝ කිසිවක් පිළිගැනීම වෙනුවට කටුක පිළිවෙතක සිටීම ගැන අප්පා නිහඬ පිළිවෙතක් අනුගමනය කළේය. විදේශයන්ගෙන් පැමිණෙන දිගු ලිපි ඇය කියවූවාය, සමහර වචන අවධාරණය කරමින්, අප්පා දෙස අර්ථාන්විතව බැලීමට, මදකට කියවීම නතර කරමින් ඇය එම ලිපි කියවූවාය.

'මෙහෙ ජීවිතේ හොඳයි. ඔයා මෙහේ එන්න ඕනෑ'

'ජෙයාට පහුගිය සුමානෙ උසස්වීමක් ලැබුණා. එයා එතන වැඩකරන්න ගිහින් අවුරුද්දක් විතරයි, ඒත් මැනේජර් එයාගේ වැඩ හොඳයි කියලා පිළිගත්තා. එක දෙයක් තියෙනවා, මාලා, ඒ ගොල්ලෝ බොහොම සාධාරණ උදවිය'

'ගෞරි ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට තේරුණා කියන්නයි ලියන්නේ ! සම්පූර්ණ ශිෂ්‍යත්වය. මුළු පවුලම සතුටින් ඉහවහ ගිහිල්ලා. ඔයත් සතුටු වෙයි කියලා අපි දන්නවා'

එහෙත් සිය පරණ තර්ක ඉදිරිපත් කරමින්, අප්පා එයට මැදිහත් වූවේය.

'ජෙයා හැම තිස්සෙම කිව්වා රේණු, එයාට හොඳ කුළු බඩු හොයාගන්න බෑ කියලා මැසිවිලි කියනවාය කියලා. එයා ශ්‍රී ලංකාවේ ඉන්න සහෝදරීට කියලා ඒවා ගෙන්න ගන්නවා. ඈ කිව්වා එහෙ හොඳ අඹ වත් හොයා ගන්න නෑ කියලා'

සමහර විට ජෙයා මාමා, ඔහුට සේවාස්ථානයෙන් ලැබුන සැලකිල්ල නිසා අලුත් අඹ සතුටින් හුවමාරු කරගනු ඇතැයි කියන්නට රාධිකා කට ඇරියාය. නමුත් ඒ වන විටත් අම්මාගේ මුහුණ දැඩි වී තිබුන අතර ලියුමද පෙසක දමා තිබිනි.

සිය මුල් ගැටවර වියේදී රධිකා නීතිඥයකු වීමට කල්පනා කර තිබුණාය, එහෙත් අප්පා සමග වූ සාකච්ඡාවෙන් පසු ඒ අභිලාෂය ගැන ඇය කලකිරුණාය.

'මං නීතිඥයෙක් වුනහම මං කතා කරන්නේ දෙමළ අය වෙනුවෙන් විතරයි.  මං, මගේ නඩු ඔක්කොම දිනනවා' ඇය ප්‍රකාශ කළාය.

'රධිකා' ඔහු පිළිතුරු දුන්නේ තැතිගත් ලෙසිනි. 'ඒත් ඔයා පෙනී සිටිය යුතු සුදුසු සිංහල පුද්ගලයෙක් හිටියොත් මොකද කරන්නේ? එහෙම නැත්නම් මුස්ලිම් කෙනෙක් නැත්නම් බර්ගර් ජාතිකයෙක්? ඔයා සමානතාව වෙනුවෙන් කටයුතු කරනවා නම් සාධාරණ වෙන්නත් ඕන.  අපි හිතලු පදනම් කරගෙන වෙනස්කම් කරන්න හොඳ නෑ'

'ඒත් අප්පා හැමවෙලාවෙම අපිට වෙන්නේ එහෙමනෙ. මං හදන්නෙ ඒක හරිගස්සන්න විතරයි. කොහොම නමුත්, විෂම ලෙස සලකන්න පටන් ගත්තෙවත්, ජාතිවාදි වුණේවත් අපි නොවෙයි. ඒගොල්ලොයි ඒක කළේ'

'රධිකා! ඔය අපියි  ඒගොල්ලොයි කතා නවත්තන්න. එපා ඒ කතා'.

'අප්පා, හැමෝම ඔයා වගේ හිතනවා නම් බොහොම හොඳ වෙන්න පුළුවන්. ඒත් කවුරුවත් එහෙම හිතන්නේ නෑ. කවුරුවත් නෑ! සමහර වෙලාවට අපි යථාර්ථවාදී වෙන්න ඕන'

'තරුණ නෝන මහත්තයා! කරුණාකරලා කෑ ගහන්න එපා! ඔයා හිතනවාද ඔයාගේ සේවාදායකයා තෝරලා බේරලා සලකන එක යථාර්ථවාදියි කියලා?'

'අපේ ජීවිත හරි ඉස්තරම් කියලා පෙන්නගෙන ඉන්න එකයි, හැම දවසෙම අපි ජාතිවාදී කරදරවලට මූණ දෙන්නෙ නෑ කියලා පෙන්නගෙන ඉන්න එකයි, යථාර්ථවාදි කියලද ඔයා කියන්නේ?'

අප්පා එයට ප්‍රතිචාර දක්වන්නට මුව විවර කළ නමුත් අනතුරුව කෝපයෙන් ඔහු කට වසා ගත්තේය. ඔහු සිය දෙතොල් තද කොටගෙන ඉතා සන්සුන් ලෙසින් මෙසේ කීවේය. 'යන්න ඔයාගෙ කාමරේට රධිකා. මේ ගෙදර ගරුසරු නැති ළමයින්ට ඉඩ දෙන්න බෑ මට' රධිකා උඩුමහලට දිව ගියාය, ඇගේ කඳුළු ඇඳ ඇතිරිලිවලට වැටෙන අතර තුර ඇය කොට්ටය කෝපයෙන් සිදුරු කළාය.

ඇයගේ හැඟීම් සම්පූර්ණයෙන්ම තේරුම් ගන්නා සහ කතා කිරීමට පහසු එමෙන්ම වඩා ඍජු ගුණැති රාජ් මාමා කෙරෙහි තමාගේ විශ්වාසය ගොඩනැඟී ඇති බව ඇය තේරුම් ගත්තාය. 'මට ඔයා හිතන දේ තේරෙනවා රධිකා. ඒත් මට විශ්වාසයක් නැහැ ඔයා බලාපොරොත්තු වෙන විදිහට ඒවා සිද්ධ වෙයි කියලා. ඔයා ගණන්වලට දක්ෂයි, ඔයා කවදාහරි හිතුවද බැංකුවක වැඩ කරනවා කියලා? ඔයාට බැංකුවක වැඩ කරන්න කැමති වෙන්න කාරණා එකකට වැඩි ගණනක් තියෙනවා'.

ඒ කළු ජූලියේ බිහිසුණුකම ගැන රධිකා ඇසූ පළමු අවස්ථාව විය, HSBC බැංකුවේ වැඩකිරීම වටින්නේ මන්දැයි රාජ් මාමාට හැඟී ගියේ ඇයි දැයි යන්න ඇසූ පළමු අවස්ථාව එය විය.

'රධිකා ඔයාගේ පළවෙනි වගකීම වෙන්න ඕන ඔයා ගැනයි ඔයාගෙ පවුල ගැනයි. ඔයා හැමතැනම ඉන්න දෙමළ මිනිස්සුන්ට හැමදේම කරන්න උත්සාහ කරන්න, දුව ඇවිදින්න පටන් ගත්තොත්, ඔයා බොහොම ඉක්මනින් අපේක්ෂා භංගත්වයට පත්වෙයි. ඔයා සෝදිසියෙන් ඉන්න ඕන ජාතිවාදී සිංහල මිනිසුන් ගැන විතරක් නෙවෙයි' සිය කතාව අවසන් කරමින් රාජ් මාමා කීවේය.

ඇය සිය සිහිනයෙහි වෙලී සිටින්නේ නම්, යා යුතු වූයේ නීලන් තිරුචෙල්වම් හෝ ලක්ෂ්මන් කදිරගාමර් ගිය මගෙහිදැයි, වයසින් මුහුකුරා යනවිට හා තමා අවට ලෝකය ගැන වඩාත් දැනුම් තේරුම් ලබන විට ඇය සිතුවාය. ඇය ඇයගෙන් ප්‍රශ්න කරගත් විට, තමා සිය නිවැරදි අනාගත වෘත්තිය තෝරා ගත්තේ, තමා වෙනුවෙන්ම පමණක් නොව තම පවුල වෙනුවෙන්ද බව ඇයට හැඟී ගියේය. ඔවුන්ගේ ජීවන තත්ත්වය විශාල වශයෙන් ඉහළට නැංවීමට සමත් ඇය නිවසට ගෙන ආ ආදායම පිළිබඳව කරුණු පසෙක තිබියදී, අප්පා සමහර අවස්ථවන්හි දී මහත් කණස්සල්ලෙන් තමා දෙස අහම්බෙන් මෙන් බලා සිටිනු ඇය දැක ඇත. අප්පා සහ රාජ් මාමාට අවශ්‍ය වූ, ඇය තෝරාගත යුතු වෙනත් මගක් පිළිබඳ කතාව සමහර අවස්ථවන්හි දී ඇය තුළ කෝපය මුසු හැඟීමක් ඇති කළේය. එය කුමක් ද යන්න ඇයට තමන්ටම අවබෝධ කරගත නොහැකි විය.

රධිකා සුක්කානම මදක් තදින් අල්ලා ගත්තාය. මුරපොළෙහි ආරක්ෂක නිලධාරීන් කෙරෙහි වූ අප්‍රසන්න බව සිහිපත්ව ඇය සිය නැහැය හකුලා ගත්තාය. ඇගේ හිසෙහි කරකැවුණු කෝප සහගත සිතිවිලි අප්පාට ඇසුණේ නම්, ඔහුගේ කෝපත් ස්වරූපයෙන් ඔහු ඇයට දොස් පවරන්නට ඉඩ තිබිණි. 'දූන් රධිකා ඔවුන් කරන්නෙ ඔවුන්ගෙ රස්සාව. ඒ උදවිය රාජකාරිය ඔයතරම් උනන්දුවෙන් කරන එක ගැන අපි සතුටු වෙන්න ඕන'. මල්ෂිනි අප්සරාගේ කාරුණික බව අගය කළ යුතුය. එහි අවසානය ඇය කිසිදිනෙක අසන්නට නැත. 'කොච්චර අපූරු පරීක්ෂාකාරී තරුණ කාන්තාවක්ද, මල්ෂිනී අප්සරා? ඇය තමුන්ට ලැබිච්ච බොහොම අවස්ථාවන්ගෙන් ඇත්තටම හොඳට එල නෙලාගෙන තියෙනවා, ඒ වගේම මහන්සි වෙලා වැඩ කරලා තියෙනවා. අද එයාව දකින්න ලැබිච්චි එක මහ පුදුම දෙයක්' තමා හෘදයාංගමව විශ්වාස කළ යහපත් අරමුණු, අවතැන් වූ පරමාදර්ශයන් සහිත වයෝවෘද්ධ මිනිසා වෙනුවෙන් තේරුම් ගත නොහැකි උණුසුමකින් තමාගේ සිත වහා පිරී යනු රධිකාට දැනිණි. ඇය සිය පියා මෙන්ම සිනාමුසු මුහුණෙන් යුතුව සහ සර්වශුභවාදී ලෙසින් ඇය ඉදිරියේ ඇති කුඩා ගනේෂ් රූපය දෙස හදිසි බැල්මක් හෙලමින්, එය මදක් අල්ලන්නට ඉදිරියට ඇදුණාය. ඇය රථය පණ ගන්වන්ට යතුරු දැමූ කල්හි, තමා නිරායාශයෙන්ම ආශිර්වාද ඉල්ලා සිටි බවත්, එහෙත් තමා එසේ ඉල්ලා සිටියේ දෙවියන්ගෙන් නොව අප්පාගෙන් බවද ඇය අවබෝධ කර ගත්තාය.

***නුෂෙල් දි සිල්වා*** *බොහෝ දුරට හැදී වැඩුණේ කොළඹය, එහෙත් ඇගේ ජීවිතයේ පළමු වසර හත ඇය ගත කළේ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවරයි. ප්‍රින්ස්ටන් සරසවියේ උපාධි අපේක්ෂකයකු ලෙස ඉගෙනුම ලබද්දී ඇය තවත් වසර හතරක් ඇමෙරිකා එක්සත් ජනපදයේ වාසය කළාය. විෂම ලෙස සැලකීමේ අත්තනෝමතික ස්වභාවය පිළිබඳ ඇගේ පූර්ව නියුක්තිය හට ගැනෙන්නේ ඇය වාසය කළ එක් එක් ස්ථානයන්හිදී ඇය ඇගේ අත්දැකීම් ග්‍රහණය කොට ගත් අකාරය මතය. ඇය සැප්තැම්බර් මාසයේදී එම් අයි ටී හි (MIT) පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයට යනු ඇත.*

# පොළෝ තලය යට

***අම්ර්තාංජලී සිවපාලන්***

කුනන් ඔහුගේ දෑස් විවර කරන විට ඔහුට දනී ගිය පළමු දෙය භයානක නිශ්ශබ්දතාව වූයේය. තමා සිටින්නේ කොහේදැයි අවබෝධ කරගැනීමට ඔහුට කීප මොහොතක් ගත විය. ඔහු සහ තවත් දහදෙනෙක් සටන් කරමින් සිටි අගලට ඉතා ආසන්නව, අහස්යානාවකින් බෝම්බයක් වැටුණු ආකාරය ඔහුට සිහි විය. සීස් හඬින් ආ කාලතුවක්කු ෂෙල්වෙඩි ඔවුන් පසුකර යද්දී නැගුවේ ගුවන් යානයක හඬයි. සැණෙකින් ශරීරවලින් ගැලවී ගිය මඩ සහ ලේ නැහැවුණු අවයව අගලෙහි වැටී අගල පිරී ගියේය. පිළිස්සී ගිය සම් මස් වල දුර්ගන්ධය සහ සල්ෆර් දුහුවිලි පිරි වළාකුළුවලින් ආ දුහුවිලි අංශු ඔහුගේ නාස්පුඩු අතරින් රිංගා ගොස් ඔහුගේ ඉහ මොළ රත්කරවන්නට විය. අගලෙහි පස් කඩා වැටී කුනන් පස් අතරෙහි හිරවී ගියේය. දන්, සිය පාදය සුන්බුන් වලින් වැසී ගොස් ඇති බව ඔහුට පසක් විය. අත් හළ බිමෙහි නැගී සිටින උසැති තල්ගස් සහ අධික සුළඟින් ගැලවී ගිය ගස් මුදුන් ඔහුගේ හිතෙහි ඇඳී ගියේය. මා වැටී සිටි මර උගුලෙන් තමා මුදවා ගන්නට තැත් කරද්දී බියජනක හදිසියක් ඔහු වෙලා ගත්තේය. අවසානයේදී ඔහු අගලෙන් උඩට ඇදී පැමිණ, සිටගත් කල්හි අවට ලෝකය විනාශ වී ගොස් ඇති බව ඔහු දුටුවේය, අඩුතරමින් ඒ ප්‍රදේශයට බෝම්බ පහක් වැටෙන්නට ඇත. ඔහු ඊළඟ අගල වෙතට විසිවෙමින් ගමන් කළේය. එහි කිසිවෙක් දිවි ගලවාගෙන තිබුණේ නැත. ඔහු ශංකර් සොයාගත්තේ ඉන් පසුවය. බෝම්බයේ බලපෑමෙන් ඔහු අගලෙන් උඩට විසි වී සිටියේය. ඔහු නුහුරු ආකාරයකට ඇඹරී ගිය ඔහුගේ දකුණු අත සහ කකුලද සහිතව එහි වැතිර සිටියේය. ඔහුගේ කම්මුල හරහා ගැඹුරු කැපුමක් තිබුණු අතර ඔහුගේ උරහිස ලෙයින් නැහැවී තිබිණි. එහෙත් ඔහු පණපිටින් සිටියේය. පොළව මත්තෙහි ජීවත්ව සිටින්නේ තමන් දෙදෙනා පමණක් විය හැකි යැයි පෙනෙන්නට විය. කුනන් පසෙකින් දණ ගසාගෙන ඔහු ඔසවන්නට උත්සාහ කළේය. ශංකර් වේගයෙන් ඇසිපිය ගැසුවේය. 'කුනන් මේ ඔයාද?'

ඔහු හිස සැලුවේය.

'කෝ අනික් අය? අපි මේ කොහේද?'

සුන්බුන් දෙස බලන්නට කුනන් රවුමක් හැරුණේය. 'අපි දෙන්නා විතරයි මෙතන ඉන්නේ' ඔහු කීවේය.

අනතුරුව නැවතත් ඔහුට ගුවන් යානයක හඬ ඇසිණි, ඔහුගේ පපුවට හා නිකටට අත් තබාගෙන, අහස්යානය කෝපයෙන් පහළට රූටා එනු ඇතය යන අපේක්ෂාවෙන් බිමට වැටුණේය. එහෙත් එය එසේ සිදුනොවීය. එය දීප්තිමත් නිල් පැහැති සැන්දෑ අහසෙහි නොපෙනී යනු ඔහු දුටුවේය. ඔහුගේ බොහෝ මිතුරන් එක් මොහොතකින් මිය පරලොව ගිය ද ඔහු තවමත් ජීවතුන් අතර සිටියි. ශෝකවනු පිණිස කිසිදු ඉඩක් නොදෙමින් පිපිරුම හිරිවැටුමක් ගෙන ආවේය. එහෙත් දීප්තිමත් නිල්වන් සැන්දෑ අහසට විරුද්ධව උදාසීන ලෙසින් ඇදී යන බෝම්බකරු දැකීම, ඔහු යළි යථාතත්ත්වයට ගෙන එන්නට සමත් විය. උද්වේගය මුසු හැඟීම්වලියක් කුනන්ගේ චිත්තාභ්‍යන්තරයෙහි ඇතිවිය. ඔහු තුළින් වියරු වූ හඬක් පැන නැගිනි, කෝපයේ හඬක්, අසරණභාවයේ හා සංවේගයේ හඬක් ඔහු වෙතින් පැන නැගිනි. ඔහු තමාගේ පාමුල වැටී තිබුණු AK 47 පිස්තෝලය අතට ගත්තේය, අනතුරුව බෝම්බකරු පලාගිය දෙසට ඉවක් බවක් නොමැතිව වෙඩි තබන්නට වූවේය.

'මම උඹව බාවනවා'යි ඔහු මහ හඬින් කෑ ගැවේය.

'ඔයාට පිස්සුද? නවත්වන්න ඕක' ශංකර් කෑගැවේය.

'ඔයාට වුවමනාව තියෙන්නෙ ආයෙමත් උන්ව ගෙන්න ගන්නද? ඔය පිස්සු වැඩේ නවත්තන්න.'

ශංකර්ගේ ආයාචනාත්මක දෑස් දෙස ඔහු බැලුවේය. එය මෝඩ ක්‍රියාවක් විය. ඔහුගේ වෙඩිතැබීම සතුරාට ඔවුන් නිරාවරණය වීමක් විය. මොහොතකින් වෙඩි උණ්ඩ වර්ෂාවක් පතිත වූයේය. සැඟවී වෙඩි තබන්නෝ ඔවුන් දෙසට පැමිණියහ. කුනන්, ශංකර් ඔසවාගෙන, සිය කර මත තබාගෙන, ශංකර්ගේ දෑත තම ගෙල වටා දමා ගත්තේය. වෙඩි වර්ෂාව මැද ඔහු රිංගා යන්නට පටන් ගත්තේය. කුනන්ගේ හැම චලනයක් පාසාම ශංකර් වේදනාත්මක හඬක් නැගුවේය, එහෙත් ඔහු හැකිතාක් ඉක්මනින් යා යුතු විය. ඔවුන්ගේ කණ්ඩායමෙන් ඉතිරිව සිටින්නේ ඔවුන්

දෙදෙනා පමණකි, ශංකර් අත හැර යන්නට කුනන් සූදානම් නැත. කුනන් බඩගාමින් ගියේ උරගයකු පරිද්දෙනි. ශංකර්ගේ බරට ඔහුගේ සිරුර මිරිකී ගියේය. තමාගේ දකුණු උරහිස් තලයට පහතින් දැනෙන තදබල වේදනාව, තමාද තුවාල ලබා ඇති බව ඔහුට වටහා දුන්නේය. එහෙත් ඔහුට ඉදිරියට යාමට වුවමනා වූයේය. නැගිට ඇවිද යාම ආරක්ෂිත යැයි ඔහුට හැඟෙන්නට පෙර යාමට තව කිලෝමීටර බාගයක් පමණ පැමිණ තිබුණා විය යුතුය. දෙපයින් නැගී සිටීමට අවස්ථාව ලැබ නැගී සිටින විට ශංකර් සහ ඔහු හෙම්බත්ව සිටියහ. ශංකර්ගේ සිරුරෙන් රුධිරය බොහෝ ගලා ගොස් තිබුණි, ඒ අතරතුර, කුනන් ගේ සිරුරින්ද ලේ ගලා ගියේය. අඳුර වැටෙමින් තිබුණ අතර ඇඳිරිය වැඩිවීම ගැන කුනන් ස්තුතිවන්ත වූයේය. ශංකර් උරෙහි තබාගෙන කුනන් ඇවිද යන්නට පටන් ගත්තේය. ශංකර් වේදනාවෙන් කෑගැවේය.

අරුණෝදයෙහි පඬු පැහැ එළිය පෙරදිග අහසින් මතු වී එන විටද කුනන් ඇවිද එමින් සිටියේය. පෙරදින සන්ධ්‍යාවෙහි මේ ගමන පිටත්ව එන විට මෙය මෙපමණ දුෂ්කර ගමනක් වනු ඇතැයි ඔහු සිතුවේ නැත. රාත්‍රියේ ඇවිදීම තුළම රාත්‍රියට ආවේනික අන්තරාවන් සහ දුෂ්කරතා තිබිණි, එහෙත් දවල් කාලය ඊටත් වඩා දුෂ්කර විය. දීර්ඝකාලීනව අත්හරිනු ලැබූ එළවළු සහ මඤ්ඤොක්කා වගා බිම් ඔහුට අවශ්‍ය ආවරණය දුන්නේ නැති තරම්ය. සරු රතු පස සහිත, ඔහුගේ ගමෙහි වූ මේ හුරුපුරුදු කෘෂිකාර්මික වගාබිම්, ඔවුන්ගේ ශ්‍රමය උදෙසා එහි වෙසෙන ජනතාවට පෙරලා ලැබෙන වත්කම විය. එහෙත් දැන් ඒ වගාබිම් අනුකම්පා විරහිත සුළඟෙහි පාවී යන දූහුවිලි බවට හැරෙන වේලී ඉරිතලා ගිය පොළවක් බවට පත්ව ඇත. මේ ඔහු අයත් වූ භූ දර්ශණය විය. වසර කිහිපයකට පෙරදී යුද්ධය විසින් ඔවුන් සියලු දෙනා මේ භූමියෙන් පලවා හරින තුරු, ඔහුට නිරන්තරයෙන් හැඟී ගියේ තමාද මේ ගහකොළ සහ කුඹුරු අතරෙහි කෙනෙකු බවය. මෙම බිම් පෙදෙසෙන් පිටමංව සිටි වසර ගණනාව තුළම ඔහුගේ නිරන්තර අභිප්‍රාය වූයේ, පෙර සේම නිදහස් ලෙස සැරිසැරිය හැකි ලෙසින් පොළවෙහි ඇවිද යන්නට, මේ ගම්බිම් වලට පැමිණෙන්නටය. දින කිහිපයකට පෙර, ප්‍රහාරය සඳහා මෙහි පැමිණෙන ලෙස නියෝග ලද විට, බලවත් ප්‍රීතියක් ඔහුගේ මුළු ආත්මය පුරා දිවගියේ ය. දැන් තිබෙන තත්ත්වයෙන් සිය ගම්බිම් දුටුවිට ඔහුගේ සිතෙහි මහත් වේදනාවක් හට ගත්තේය.

ඔහුගේ උරමත සිටි ශංකර්ගේ බර නිසා ඉක්මනින් ගමන් කිරීම ඉතා දුෂ්කර විය. එහෙත් ශංකර්ගේ කෙඳිරිල්ල ඉක්මනින් යන්නට ඔහුව පෙළඹවීය. ඔහුගේ උරහිස යටින් දැනෙන වේදනාව කුනන් තුළ පැකිලීමක් ඇති කර විය. තමාගේ පිටෙහි දැනෙන තෙතමනය තමාගේ රුධිරය නිසාද නොඑසේනම් ශංකර්ගේ රුධිරය නිසා දැනෙන්නක්දැයි ඔහුට නිනච්චක් නොවීය. එය පරීක්ෂා කර බලන්නට වේලාවක් එළඹෙනු ඇත. එහෙත්, කුනන්ගේ සිතෙහි දැන් ඇති එකම සිතුවිල්ල සිය මිතුරාට යම් පහසුවක් සැලසීමය. දුබල හඬකින් බොන්නට වතුර ඉල්ලා සිටි ශංකර් දැන් නිහඬව සිටියේය. ඔහුගේ මිත්‍රයාගේ පීඩාකාරී ආශ්වාසය ඔහුට කියා සිටින්නේ ඉක්මනින් පානය සඳහා ජලය සොයා ගත යුතු බවය. පාසලේ ළිඳේ ජලය හැමවිටම නවමු සහ සීතල බවකින් යුතුය, එහෙත් ගැටළුව එහි ළඟා වීමය.

ජනශූන්‍ය ගොවිබිම් පසුකරමින් කුනන් පරීක්ෂාකාරී ලෙසින් ගමට ඇතුළු වූයේය. ගුවන් බෝම්බ වලින් හෝ ෂෙල්වෙඩි වලින් විනාශ වී නොගිය එකදු ගොඩනැගිල්ලක් හෝ එහි නොවීය. අහස ඒ මත කඩා වැටුණාක් බඳුව, කෝවිලෙහි මණ්ඩපය බිඳ වැටී ඇත. අලංකාර කරන ලද කුළුණු, සුන්බුන් වූ පියස්ස යට කැබලි වී ගොසිනි. සිමෙන්ති බදාමයෙන් සාදන ලද විශාල නොළුම් මලෙහි රෝස පැහැති පෙති කැඩී බිඳී විසිරී ගොසිනි. ඒ සුන්බුන් වැටී ඇත්තේ අත් පා වලින් තීරු තීරු වී ගිය මාංශ කැබලි සේය. ගමට පැමිණෙන හැමදෙනාම පිළිගත් විසල් සියඹලා ගස් බිමට පතිතව ඇත, එහි මුල් අවුල් වී විසිරී ගොසිනි, එම වෘක්ෂයෙහි උදාර සෙවනෙහි සාදා තිබුණු කඩසාප්පු ඉවත ලූ හිස් ටින් මෙන් පෙනිණි. පාරෙහි තවත් පහළට එන විට, ශාන්ත ඇන්තනි ප්‍රතිමාව එහි පාදස්තලයෙන් ගලවා වීසිකර දමා තිබුණේය. සිය යාඥා පොත අතෙහි තබාගෙන, ජනාකීර්ණ මාර්ගය පසුකර යනෙන සියලු දෙනා සමග සතුටින් සිනාසෙන ළමා ශාන්තුවරයා, දැන් ශීර්ෂ රහිතව හා අත් නොමැතිව වැතිර සිටියි. කාලතුවක්කු ෂෙල්වෙඩි වැදී සිදුරු නොවූ, අඩුතරමින් එක් සිදුරක් හෝ නොමැති එක් නිවසක් හෝ මෙම ප්‍රදේශයේ තිබුණේ නැත.

කුනන් සිය ගමන අවසන් කළේ පටු මං මාවත් සහ අඩිපාර දිගේ යමිනි. ඔහුට ප්‍රධාන මාර්ගයෙහි යා නොහැකි විය. සෑහෙන ආවරණයක් නොමැති වීම නිසා එය වඩාත් අන්තරාදයක වූයේය. ඒ වෙනුවට ඔහු ගමන්

කළේ කෙසෙල් වදුළු හරහාය. කෙසෙල් වදුළු බොහෝ විනාශ වී තිබෙනු දැකීම ඔහු ශෝකයට පත් කරවූයේය. මේ පළාතේ හොඳම කෙසෙල් වගාව වූයේ මෙයයි. ගමෙහි කෙසෙල් සොයා හැම දෙසින්ම මිනිස්සු මෙහි පැමිණියහ. එහෙත් දැන් පළතුරු වඳවී ගොසිනි, විනාශ වී ගොසිනි. ගස් කිහිපයක කැහැටු කෙසෙල් මල් කිහිපයක් තිබිණි, කුනන් ඒවා පිළිබඳ මතකයක් තබා ගත්තේය. ශංකර් වෙනුවෙන් කළයුතු දේ කිරීමෙන් පසු ඔහු නැවත පැමිණිය යුතුය. ශංකර්ගේ බරද සමග ඇවිදයාම කුනන්ට බොහෝ අපහසු වෙමින් තිබේ. ඔහු පරීක්ෂාකාරී ලෙසින් පටුමග හරහා ගමන් කළේය, අනතුරුව වැට පැන තංගරාසාගේ මිදුලට පිළිපන්නේය. ගමෙහි වූ සියලුම විශාල නිවාසයන්හි පියැසි අහසට විවරව තිබුණු අතර, තංගරාසාගේ නිවසෙහි පිදුරු වහලය මාස ගණනාවක් නොසලකා හැරීම නිසා ගරා වැටුණු නමුදු, විනාශ වී තිබුණේ නැත. වේයන් වහලය ඉහළටම නැගෙමින් සිටියද එය තවමත් ආරක්ෂිතව තිබිණි, මකුළු දැලෙහි ගණ ස්ථරය නිසා ඉන් පෙනී ගියේ වහලය කඩා වැටීමෙන් වළකාගැනීමට ඉන් සහයක් ලැබෙන බවය. කුනන් බොහෝ විඩාපත් ලෙසින් ශංකර් ගෙපැලෙහි පටු වැරැන්ඩයෙහි තැබුවේය. ශංකර් තබාගෙන ආ ඔහුගේ වම් උරහිස හිරිවැටී තිබුණි. ඔහුගේ තුවාලයෙන් භයානක ගැස්මක් පැමිණීයේය. බොහෝ සෙයින් වෙහෙසට පත් වූ ඔහු සිය මිතුරා සමීපයෙහි වැතිරුණේය.

*

උපුල් කිසිදිනෙක පොළව එතරම් සමතලා ලෙසින් දුටුවේ නැත. ප්‍රථම වතාවට ඔහු එය දෙස බැලූ විට, පොළව තමාගේ මුහුණ හරහා පහරක් ගැසුවේය. යන හැඟීම ඔහුගේ සිතෙහි ඇති විය. දාහය සමනය කරනු පිණිස හමාගිය මහ සුළඟ කිසිවක් කළේ නැත. ගිනිගත් සුළඟ පැමිණියේ ඔහු වටා කරකැවෙන කසයක් මෙනි. හැමදෙයක් මතම වැටී තිබුණු රතු පසට ඔහු ද්වේෂ කළේය. ඔහුගේ නිළ ඇඳුම තවදුරටත් කොළ පැහැ නොවීය. නිල ඇඳුමේ ඔහුට නමක් සොයාගත නොහැකි අවලස්සන කිලිටි පැහැයක් ගත්තේය. ඔහුගේ කළු සපත්තුවල දිස්නය වියැකී ගොසිනි. ඒවා දැන් හොඳ රතු දුහුවිල්ලෙන් ආවරණය වී ඇත. මේ මුරපොළෙහි මුරකරමින් මෙතැන ඉඳගෙන සිටීමට සිදුවීම ගැන ඔහු තමාටම සාප කොට ගත්තේය. ඔහුගේ දෑසට පෙනෙන මානයේ කිසිවක් සෙලවෙනු නොපෙනෙයි. ඉතා වියළි අපුල සුළඟ පමණක් රතු පස කැළඹවීය.

උපුල්ගේ ගම්මානයෙහි සියල්ල සිහිලසින් ද, කොළ පැහැයෙන් ද යුතුවිය. ඔවුන්ගේ ගම්මානය අද්දර ගලායන ගංගාව කිසිකලෙකත් නොසිඳුන අතර, අනෙකුත් ගම්මානයන්හි මිනිස්සු වියළි කාලයේදී සැතපුම් බොහෝ ගණනක් ජලය ගෙනයනු පිණිස ඇවිද පැමිණියහ. උපුල් සහ ඔහුගේ මිතුරන් ඔවුන්ගේ විවේක වේලාවන්හිදි මෙම ගංගාවේ පිහිනමින්, මසුන් අල්ලමින් හෝ ගඟ දෙපස බෝ ගස් සෙවනෙහි සීත තෙත් වැල්ලෙහි වැතිරෙමින් කාලය ගත කළහ. හැමවිටම කණ්ඩායම මෙහෙයවූ නායකයා ඔහු වූයේය, පාසල් නිවාඩු කාලයන්හි ඔවුන්ගේ සියලුම වික්‍රමයන් සංවිධානය කළේ ඔහුය. සිය මිත්‍රයින් වනයෙහි ඇතුලාන්තයටම ගෙන යන්නේ ඔහුය. දන් රස බලමින්, කුරුල්ලන් දෙස බලමින්, වඳුරන්ගේ විගඩම් වලට සිනාසෙමින් ඔවුහු මහ වනය වටා ඇවිද යති. 'ඔයා හිතනවාද මෙහෙ වල් සත්තු ඉඳියි කියලා ?' 'ඉන්න පුළුවන්' 'මේ ළඟදි මට ඇහුණා මුදලාලි කාටද කියනවා, සමහර දවස් වලට කැලේ ඇතුලේ ඉඳලා කරෝලිස් අප්පු කෑ ගහන සද්දේ ඇහුණා කියලා' කරෝලිස් අප්පු කැලයේ මියගොස් සිටියදී සොයා ගත්තේය. ඔහුගේ මරණය ඔවුන්ගේ ගමෙහි වූ පැහැදිලි කළ නොහැකි අබිරහස්වලින් එකකි. තමාගේ සහායකයාගේ දෑසෙහි මතුවූ බියපත් පෙනුම බලමින් උපුල් සතුටට පත්වූයේය.

වරක්, ඔවුන් වනාන්තරයේ මංමුලාව ගිය තරම්ය, මුළු රාත්‍රියම ඔවුන්ට එහි ගත කරන්නට සිදුවන බව ඔවුන්ට සහතික විය. ගංගාවෙහි සිහින් කෙඳිරිලි හඬ ඇසුණේ ඔහුටය. ඔහු ඔවුන්ට මග පෙන්වමින් ගමන් ගත්තේය, ඉන් අනතුරුව ගැටළු කිසිවක් පැන නැගුණේ නැත. ඔවුහු ගං ඉවුර දිගේ නිවස දක්වා ගමන් කළහ. ගං ඉවුරක් නොමැති ස්ථානයන්හිදී ඔවුහු තමන්ට ශක්තිය දුන් ජලයෙහි සීතල නැවුම් බව විඳිමින් ගං දියවැල් ඔස්සේ පීනා ගියහ. ඉක්මනින් ඔවුහු සිය ගම්මානයට පෙරලා පැමිණියහ.

*

අතහැර දමන ලද නිවහන වටා තිබූ නිහඬ බවට කුනන් කැමති නොවීය. අඩුම තරමින් සටන් බිමකින් නැගෙන ඈත වෙඩිහඬක් ඇසීමේ අපේක්ෂාවෙන් ඔහු සිය දෙසවන් යොමු කළේය. ඔහුගේ පැරණි පාසල තිබුණේ ඒ ආසන්නයේය. ඔහුට එතැනින් ජලය ලබාගත හැකිවනු ඇත.

ඔහු ශංකර්ට මුදු ලෙස තට්ටු කර පහත් ස්වරයකින් කතා කළේය, 'ඔයා මෙතන ඉන්න, මං ඉස්කෝලෙ ළිදෙන් වතුර ටිකක් ගේන්නම්'

ශංකර් යාන්තමින් හිස සෙලවූයේය. එය ඔහුගේ ප්‍රතිචාරයද නැතහොත් කටුක වේදනාව නිසා ඔහුගේ හිස එහා මෙහා වීමක් ද යන්න කුනන් ට පැහැදිළි නොවීය. කුනන්, තංගරාසාගේ අංගනයෙන් ඉවත්ව, ගස් සහ පඳුරු යටින් ඉතා ප්‍රවේශමෙන් ගමන් කරන්නට පටන් ගත්තේය. ඔහු වටා තිබුණේ අන් කිසිවක් නොව විනාශයයි. සැබවින්ම මේ ඔහුගේ ගමදැයි තේරුම් ගැනීමට ඔහුගේ සිතට නොහැකි බව පෙනී ගියේය. ක්‍රමානුකූලව රටාවන්ට අනුව පොල් ඉරටු ඉදල්වලින් පිළිවෙලට අතු ගෑ අංගනයෙහි දැන් වල් වැවී ඇත. ගවමඩු පාලුවට ගොසිනි. පෙර පැවැති සෞභාග්‍යයේ සහ සශ්‍රීකත්වයේ සලකුණක් නොමැති භූත ස්ථානයක් බවට එය දැන් පත්ව ඇත.

යුද්ධය හා සටන් කිරීම පිළිබඳව උපුල්ගේ සිතෙහි තිබුණ සංකල්පය යථාර්ථයට බොහෝ දුරස්ථ විය. සටනෙහි පළමු දින කිහිපය ඔහුට ඉවසිය නොහැකි වූයේය. ඔවුන් ගමන් කරමින් සිටි ට්‍රැක්ටරය බිම් බෝම්බයක වැදීමෙන් ඔවුන්ගේ අඩක් පමණ පිරිස කෑලිවලට කැඩී මස්වැදලි ගුවනෙහි විසිරී ගියේය, ඒ දැකීමේන් උපුල්ගේ ප්‍රකෘති සිහිය මුළුමනින්ම පාහේ විකල් විය. එය ඔහුට කෙතරම් බියජනක වූයේ දැයි කිවහොත් බත් කටක් ගිලින්නට ඔහුට සුමානයක පමණ කාලයක් ගත විය. ඔහුගේ අණදෙන නිලධාරියා ඔහු කෙරෙහි බොහෝ සානුකම්පික වූ අතර ඔහුගේ නිල රාජකාරීවල වෙනසක් සිදු කළේය. දැන් ඔහු යොදවා ඇත්තේ භූමි දර්ශන සෝදිසි කිරීමේ අංශයේ ප්‍රධානියා වශයෙනි. එතෙකුදු වුවත්, එය උපුල් ප්‍රිය කරන දෙයක් නොවීය. අසාමාන්‍ය සහ සැක සහිත යම් එහා මෙහා වීමක් සිදුවන්නේ දැයි ගසක වූ තාවකාලික මුරපොළක සිට සොයා බැලීමට ඔහු පැය ගණන් ගත කළේය. ඔහු තමාගේ ගුවන් විදුලි යන්ත්‍රයෙන් අනෙකුන් හා සම්බන්ධ වුවද, වාර්තා කිරීමට දෙයක් නොතිබිණි.

ඔහු වටා තිබුණු භූමි දර්ශනයට ඔහු වෛර කළේය, එක ගොඩනැගිල්ලක් හෝ බෝම්බ හෝ ෂෙල් වෙඩි වලින් නොබේරුණු ඒ ගම්මානය හොල්මන් ගම්මානයක් මෙනි.

මුළු දහවල හෝ රාත්‍රිය පුරා කිසිවක් සිදු වුයේ නැත. අසන්නට ලැබුණු එකම හඬ වූ කලී බෝම්බකරුවන්ගේ හඬ, බෝම්බ පුපුරන හඬ හා

කාලතුවක්කු වෙඩිහඬ පමණකි. ගිනියම පමණක් මේ ස්ථානයෙහි තිබේ, ඒ ගිනියම ඔහු මීට පෙර කවර කලෙක වත් අත් නොවින්දා වූ ගිනියමකි. ඒ ගිනියම එහා මෙහා වූයේ පණ ඇති කෙනෙකු මෙනි, ගතවන හැම පැයක් තුළම පළිගන්නා සුළු බව පැන නැගෙමින් තිබිණි. පවත්නා වූ සියලු දෙය දවා හලු කරවමින්, පොළෝ තලයෙහි ඇති සියලුම කුදු මහත් දේ පොළවෙන් පිසදා හරින්නට ගිනියම තැත්කරන්නේද යන්න දක්නට තිබිණි. සමහර වෙලාවට, මුළු භූමි දර්ශනයම එකවර ගිනිගනු ඇතැයි ඔහු සිතුවේය. ඔහු ගෙන ආ ජලය පමණක් අස්වැසිල්ලක් ගෙනෙන එකම දෙය වූයේය. එහෙත් අද එයද ප්‍රමාණවත් වන්නේ නැත. දවසින් බාගයක් ගත වන්නටත් පෙරදීම ජලය සියල්ල පාහේ අවසන් වෙයි. ඔහුගේ දෙතොල් වියැලී ගියේය, ඔහුගේ උගුර සම්පූර්ණයෙන්ම වියලී ගියේය, ඔහුගේ කටෙහි කෙළද සිඳී ගිය වග පෙනී ගියේය. සිය නිවස අබියස ගලා බස්නා ගංගාවේ පිළිබිඹුවද, ගම මැදින් නිස්කාන්සුවේ එය ගමන්කරන ආකාරය ද සිය කළගෙඩිවල කට දක්වා ශීතල ජලය පුරවා ගන්නා ආකාරයද ඔහුගේ මනැසෙහි බබළන්නට විය. රටෙහි මේ කොටසේ ගංගා දකින්නට නොලැබෙයි. ආරම්භයේදී ඔහුට එය තේරුම් ගත නොහැකි විය. ජලය ලබාගත හැකි එකම මග වූයේ, සූර්යයාගේ රුදුරු බවින් ජලය සඟවා ගන්නට තැත් කරන්නාක් මෙන් පෙනුණු ගැඹුරු ළිං ය. ගස මත වූ මැස්සෙහි ඉහළ හිඳගෙන සිටියදී උපුල්ගේ සිත නිරන්තරයෙන් එහා මෙහා පාවී යයි. ඔහුට සහමුලින්ම පාහේ අමතක වී ගිය සිදුවීම් සහ මිනිසුන් ඔහුගේ ප්‍රකෘති සිහිය පැහැර ගන්නට ළංවූ මූසල පාළුව නැතිකරමින් සැනෙකින් ඔහු ඉදිරියේ මතුවන්නට විය. ඔහු සිය මාමා සමග ගිය දඩයම් ගමනක් කෙරෙහි ඔහුගේ සිතුවිලි එක්විය. මාමා මහ කැලෑ රොදට යනවිට දඩයම් කරනු පිණිස තමාවද කැඳවාගෙන යන්නයි කියමින් ඔහු මාමාට කරදර කළේය, එයට ඔහුගේ මාමණ්ඩියගේ නිරන්තර පිළිතුර වූයේ උපුල් තවම කුඩා වැඩි බවය. 'ඔයා තව ලොකු මහත් වෙන්න ඕන දඩයක්කාරයෙක් වෙන්න' ඔහු කියන්නට ඇත. ගමේ හොඳම දඩයක්කරු වූයේ උපුල්ගේ මාමාය. හැමදෙනාම ඔහු දෙස බැලුවේ ගෞරවයෙනි. අවසානයේදී, මාමා දඩයමේ යන විට තමාවද කැඳවාගෙන යා හැකි බව උපුල්ගේ මාමා කී විට උපුල් සතුටින් ප්‍රමුදිත වූවේය. ඔහුගේ බලාපොරොත්තු පල දරනවා පමණක් නොවේ, ඔහුගේ මාමා ඔහු ලොකුමහත් වූ පුද්ගලයෙකු වශයෙන් පිළිගෙන තිබේ.

එක් සන්ධ්‍යාවක, උපුල් සහ ඔහුගේ මාමණ්ඩිය ඔවුන්ගේ දඩයම් ගමන ආරම්භ කළහ.

'මට අලියි, මුවොයි දකින්න පුළුවන් වෙයිද? කැලෑවේ හිවල්ලු ගොඩක් ඉන්නවද?' ඔහු හුස්මක් නොගෙන ඇසුවේය.

ඔහුගේ මාමණ්ඩිය සිනාසුණේය.

'ඔයා ආසයි ගොඩක් සත්තු දකින්න, නැද්ද?'

උපුල් හිස සැලුවේය.

'හොඳයි, අපි යනවා ඔයාට සත්තු හුගාක් දකින්න පුළුවන් තැනකට. හැබැයි ඔයා හරි ඉවසීමෙන්, හෙලවෙන්නෙ නැතිව ඉන්න ඕන'

ඔවුහු කැලෑ පාරෙහි ගමන් ආරම්භ කළහ. ඔවුන් ඉදිරියට ගමන් කරන විට මහ ගහ කොළ සහ යටි වගාව එන්න එන්නම දැඩි වනගහණයක් පෙන්නුම් කළේය. උපුල් කැලෑ වාතය දැඩිව ආශ්වාස කළේය. ඔවුහු සන්ධ්‍යාවෙහි මුල් භාගයේදී ගමන ආරම්භ කළද, වනාන්තරයේදී පෙනුණේ රාත්‍රිය මෙන් කළුවරකි. ඔහුට ඇසුණු විවිධ කුරුළු හඬ හඳුනාගැනීමට උපුල් උත්සාහ කළේය. ඔහු කිසි දිනෙක නොදුටු බොහෝ වර්ගයන්හි සමනල්ලු කොළ මත වසා සිටියහ. දැන් ඔවුන් ගමන් කළ මාර්ග යේ තීව්‍ර හැරවුමකට පැමිණි අතර, ඔවුන් සිටගෙන සිටියේ දිය කඩිත්තක් කෙළවරය. එහි දම් හා සුදු පැහැති ඕලු හා මානෙල් මල් පිරී තිබිණි, කෘමිසතුන් කිහිපදෙනෙක් මල් මත ගුමු නද දෙමින් සිටියහ. සුළඟට මානෙල් මල්, කුරුල්ලන් තටු ගසන්නාක් මෙන් නැවී ගියේය.

ඔහුගේ මාමණ්ඩිය විශාල වෘක්ෂයක් වෙත ගමන් කළ අතර උපුල් ඔහු පසුපසින් ගමන් කළේය. මිනිසුන් දෙදෙනෙකුට වැතිර සිටිය හැකි තරමේ මැස්සක් ගසෙහි ඉහළ තිබේදැයි ඔහු බැලුවේය.

'ඔයාට නගින්න පුළුවන්ද?' ඔහුගේ මාමණ්ඩිය ඇසුවේය.

උපුල් හිස සැලුවේය. ඔහු මහත් ප්‍රබෝධයට පත්ව සිටියේය.

'හරි ඔන්න ඔහොම' ඔහුගේ මාමණ්ඩිය ගසට නගින්නට ඔහු ඉහළට එසවූයේය. ඝන කෝටුවලින් සාදා තිබුණු මැස්සට, උපුල්

ඉක්මනින් ගොඩ වූයේය. ඔහුට පසුව ඉහළට නැගුණු මාමණ්ඩිය, තමා ගෙනා ගෝනිය ඒ මත එලුවේ ඉඳගන්නට සුව පහසු තැනක් එතැන නිර්මාණය කරමිනි. ඔහුගේ පරිසරය වටකොටගත් නිසංසලතාව උපුල් ග්‍රහණය කොට ගත්තේය. වන ගැබෙහි වූ නිසලතාව හා ශාන්ත භාවය ඔහු තුළට කා වැදුණේය.

'රෑ වෙනකොට ඔයාට හුඟක් සත්තු එනවා බලන්න පුළුවන්' ඔහුගේ මාමා උපුල් පසෙකින් වැතිර, ඔවුන්ගේ වටාපිටාව දෙස බලමින් කීවේය. 'දැන් ඔයාට කරන්න තියෙන එකම දේ ඉවසීමෙන් ඉඳගෙන ඉන්න එකයි'

සත්තකින්ම ඉවසීමෙන්! ඔහුගේ මාමා අවධානය යොමුකරනු පිණිස උපුල්ට වැලමිටෙන් අනින විට කිසිදු සතෙක් දැකගැනීමේ බලාපොරොත්තුව උපුල් වෙතින් අතහැරෙන්නට ආසන්නව තිබිණි. එහි පුංචි සර සර ගෑමක් ඇසෙන්නට විය. නිශ්ශබ්ද වන ලෙසට ඔහුගේ මාමා ඔහුට සංඥා කරන විට ඒ ශබ්දය කුමක්දැයි අසන්නට ඔහු සූදානම්ව සිටියේය. එසැනින් ශාඛා සහිත අං ඇති මුවෙක් දියකඩිත්ත දෙසට ගියේය. අවට තත්ත්වය පරීක්ෂා බලන්නට මෙන් ඌ මොහොතකට නැවතුණේය, අනතුරුව මන බන්ධනීය ලීලාවෙන් දිය කඩිත්තට ගොස් වතුර උගුරක් බීවේය. සමහර විට ඒ ජලය බීමට සුදුසු යැයි සංඥා කරන්නට මෙන් ඌ හිස එසවූයේය, අනතුරුව ගස් අතරින් මුළු කණ්ඩායම පැමිණියහ. බොහෝ මුවන් පිරිසක් එක් තැනකට මේ ලෙසින් එකතු වනු උපුල් මීට පෙර කිසිදිනෙක දැක තිබුණේ නැත. එක් එක් ප්‍රමාණයෙන් යුතු මුවන් දැකීමෙන් මත් වූ ඔහු පහතට වාරු වූයේය. හදිසියේම ඔහු සිය මාමණ්ඩිය දෙස බලා රහසින් කතා කළේය. 'ඔයා ඔවුන්ගෙන් එකකුට වෙඩි තියනවද?'

ඔහුගේ මාමා හිස සෙලවූයේය. 'උන් ඉන්නේ තිබහින්. මේ දිය කඩිත්ත හොයාගෙන උන් බොහොම දුර කතරක් ගෙවාගෙන ඇවිත් තියනවා'

ඔහුගේ මාමාගේ පිළිතුර උපුල්ට ඉක්මනින්ම සැනසිල්ලක් ගෙන ආවේය.

උපුල්ගේ සිතිවිලි වර්තමානයට සේන්දු විය. භූමි දර්ශනය සියුම්

ලෙස පරීක්ෂා කිරීමේදී, ඔහුගේ දෑස් නැවතුණේ එකිනෙකට 'එල්' හැඩයෙන් සම්බන්ධ, ගමේ පාසල යැයි සිතිය හැකි වහලයක් නොමැති ගොඩනැගිල්ලක් අබියසය. නිවාඩු කාලයේදී එක් මුල්ලකට සියලු බංකු දැමූ, විදුහල්පතිවරයාගේ කාමරය අගුළු දැමූ, වියළි කොළ තැන තැන වැටුණු බරාඳ සහ අංගනයන් සහිත, ඔහුගේ පාසලෙහි තියුණු බිය උපදවන පෙනුමක් තිබුණේය.

උපුල් 'වෙනසක් නැත' පණිවුඩය සිය ගුවන් හුවමාරු හරහා යැවූ අතර පිළිතුර බලාපොරොත්තුව සිටියේය. වෙනත් ආකරයකටද එම පණිවුඩයටම යවනු ලැබිණි. ඔහුට පිපාසය සංසිඳුවා ගත හැකි ළිඳක් නිසැකයෙන්ම තිබිය හැකිය. එය ඔහුගේ මුරපොළෙන් මිනිත්තු කිහිපයක් එපිටින් තිබුණේය. ඔහු වහාම ආපසු පැමිණෙනු ඇත. එයට ඔහුට එතරම් වෙලාවක් කොහෙත්ම ගතවන්නේද නැත. උපුල් හෙමිහිට සිය මුර පොළෙන් බැස ප්‍රවේශමෙන් පාසල් ගොඩනැගිල්ල දෙසට ඇදුණේය. තාර කඩා නැවත පිරියම් කළ ලකුණු බලමින් ඔහු ඉතා ප්‍රවේශමෙන් පාරෙහි ගමන් කළේය. තාර පාරෙහි යාම ආරක්ෂිතය, මන්ද බිම්බෝම්බ වළලා ඇතොත් ඔබට ඒවා දැකගත හැකි බැවිනි.

ගත වෙනු ඇතැයි සිතු වෙලාවට වඩා වැඩි වේලාවක් ඔහුට ගොඩනැගිල්ලට ළං වීමට ගතවිය. ගස මුදුනේ සිටින විට එය පෙනුණේ ළඟින් ඇති බවය. එය නියත වශයෙන්ම පාසලක් විය, එහෙත් සියල්ල වියවුල්ව ගොසිනි. ඉදිරි ගොඩනැගිල්ලෙහි විවරයක් තිබුණි, වහලය මේස පුටු මතට වැටී තිබුණේ මේස පුටු සුන්බුන් දමමිනි. උපුල් ප්‍රධාන ගොඩනැගිල්ල අද්දරට ගියේය. ළිඳ තිබුණේ අංගනයෙහි ඈත කෙළවරෙහිය. දිග කඹයක් ගැට ගැසූ බාල්දියක් එතැන බිම තිබිණි. මේ අවසනාවන්ත ස්ථනයෙහි උපුල්ට දක්නට ලැබුණු වඩාත් සුන්දර දර්ශනය වූයේ එයයි. ඉක්මනින් ඔහු තම මුහුණ මත සීතල වතුර ඉස ගත්තේය. දාහය නිවී ගියේය. නිසලතාව සැබවින්ම ප්‍රබෝධමත් විය. උපුල් වතුර බිව්වේය, එහි සීතලය ඔහුගේ මුළු සිරුර පුරා කාවැදිනි. ඔහු සිය දෝතට තවත් බොහෝ ජලය පුරවාගෙන ඔහුගේ මුහුණ එයට ළං කළේය, ඒ සැපදායක සිසිලසින් සිය මුහුණ මැත් කරන්නට ඔහුට ලෝබ සිතිනි.

කුනන් පාසලේ ගරාවැටුණු පිටත බිත්තිය වටා ගමන් කළේය. ඈත කෙළවර ළිඳ තිබෙන බව ඔහු දැන සිටියේය. ළිද පිළිබඳ සිතිවිලි හොඳ සහ නරක යන සිතිවිලිවලිදාමයකට ඔහු ගෙනයනු ලැබිණි. මොහොතකට ඔහු

සිය පියාගේ මතකයෙහි මංමුලා විය. කෝවිලේ මංගල්ලයේ සිට ආපසු එනවිට ඔහුගේ උරමතින් පැමිණෙන මතකයෙහි ඔහු මංමුලා වූයේය. කුනන් සමහර අවස්ථාවන්හිදි පියාගේ කැරලි ගැසුණු කෙහෙවැටියෙහි, කුෂනයක හිස තැබුවාක් මෙන් සිය හිස තබාගෙන ඔහුගේ පියාගේ සිරුරෙහි හැමවිටම රැඳී පවතින පොළවෙහි සුගන්ධය ආශ්වාස කරමින් සුවසේ නින්දට වැටුණේය. තවත් මිනිසුන් කිහිප දෙනෙකු සමග එක්ව මේ ළිඳ කැපුවේ ඔහුගේ පියාය. වැඩ ආරම්භ කරන විට කුනන්ගේ සිතෙහි ඇතිවූ උද්වේගය ඉක්මනින් නැතිවී ගියේය. ළිද කපන්නට මිනිසුන්ට ගත වූ කාලය ඔහුගේ ළමා මනසට තේරුම් ගත නොහැකි විය. සන්ධ්‍යා කාලයෙහි ඔහුගේ පියා කුඩා තල් හකුරු කැබැල්ලක් සපමින්, තේ උගුරක් බොමින් ඉඳගෙන සිටියදී 'මේක ඉවරවෙන්නෙ කවදද? අපිට වතුර ලැබෙන්නේ කවදාදයි' ඇසුවේය.

'ඉක්මනින්' ඔහුගේ පියා කියන්නට ඇත.

එහෙත් එයින් ඔහු සෑහීමකට පත්වූයේ නැත.

'කොච්චර ඉක්මණටද? ඒක සුමානයක් ?'

'නෑ ඊට වැඩියි'

'ඒක මාසයක්'

'කියන්න බෑ' ඔහුගේ පියා පිළිතුරු දෙන්නට ඇත. 'ඒක රඳා පවතින්නේ මහ පොලෝ මාතාව කොයිතරම් ඉක්මණට, අපිට ආශිර්වාද කරයි ද කියන එක උඩ'

කුනන් සිය පියාගේ සිරුරෙන් සහ ඔහුගේ ශක්තිමත් දෑතින් නික්මෙන සීතල නැවුම් බව විඳ ගනිමින්, පියාට තුරුළුව සිටින්නට ආසා කළේය. එක් සන්ධ්‍යාවක ඔහුගේ පියා සතුටින් මෙසේ කීවේය. 'අද අපි උල්පත හාරනවා. බොහොම ඉක්මනින් අපට වතුර ලැබෙයි'

'ඔයා හැමතිස්සෙම කියනවා බොහොම ඉක්මනට කියලා. ඒත් කවදාවත් වතුර එන්නෙ නෑ'

'වතුර එයි. එහෙම වතුර ආවම බොහොම කාලයක් ජීවිතය දෙන්න ඒ ජලකඳ ගලාගෙන යාවි'

දින කිහිපයකට පසුව, ඔහුගේ පියා සහ අනෙකුත් මිනිස්සු ළිං පත්ලෙහි සිට ප්‍රමුදිතව කෑ ගහන්නට වූහ. උඩට පැමිණීමට සාදා තිබුණු රළු පඩි සෙමින් නැග ඔහුගේ පියා උඩට එනතුරු සියලු දෙනා උද්වේග යෙන් යුතුව බලා සිටියහ. විදුහල්පතිතුමා පළමු වතුර උගුර පානය කර, එය අමාවක් මිස අනෙකක් නොවේ යැයි කීවේය. වතුර තොල ගෑ සියලු දෙනාම සතුටට පත්වූයේ වතුරෙහි රසය සහ නැවුම් බව හේතුකොටගෙනය.

මේ වැදගත් සිදුවීම සමරන්නට උත්සවයක් සංවිධානය කළේය. ඒ මහා ප්‍රීති උත්සවයට, පෙරදා රැයේ ඇසුණු මහා ශබ්දයක් දුන් පිපිරුම බලපෑවේ නැත. පාසල් භූමියේ පැවති උත්සවයට මුළු ගමේම සහභාගිත්වය ලැබිණි. ළිද හෑරූ කුනන්ගේ පියා සහ අනෙක් මිනිසුන්ට විදුහල්පතිතුමාගේ ගෞරවය මැනවින් ලැබිණි. උත්සවය එහි උච්ච අවස්ථාවට පැමිණියේය. සියලු දෙනා උත්සවයට සහභාගී වෙමින් සිටියදී, හදිසියේම ගම අවබෝධ කරගත්තේ හමුදාව පාසල වටලා ඇති බවය. උත්සවශ්‍රීය සහ විනෝදය සැනෙකින් භයංකර බව සහ සංත්‍රාසය බවට පරිවර්තනය විය. කිසිවකු සිදුවන්නේ කුමක්දැයි තේරුම් ගැනීමට පෙරාතුව සියලුම මිනිසුන්ට නවතා තිබෙන ට්‍රක්රථ වලට නගින ලෙස බල කෙරිණි. පිරිමින් ට්‍රක්රථවලට නංවා ගන්නා විට කිසිවෙක් වචනයක් හෝ කතා නොකළහ, ඔවුන්ගේ වචන බියෙන් ගල්ගැසී ගියාක් බඳු වූයේය. ඉතිරි වූ පිරිස ලතෝනි දෙන්නට වූයේ ට්‍රක් රථ යන්නට පිටත් වූ සැනෙකිනි. වාහනවලින් එන දූහුවිල්ලෙන් නැහැවෙමින් ඔවුහු ට්‍රක්රථ පසුපස දිව ගියහ.

අනතුරුව, බලාපොරොත්තු සහගතව බලාසිටීම ආරම්භ විය. රැගෙන ගිය මිනිසුන්ගේ බිරින්දෑවරු සහ දෙමාපියෝ ඔවුන්ගේ ඥාතීන් නිදහස් කරනු ඇතැයි බලාපොරොත්තුවෙන් හමුදා කඳවුර අසලට වී බලා සිටියහ. අනෙක් උදවිය, උසස් හමුදා නිලධාරින්ට මේ ගැන කතා කරන්නට බලය ඇතැයි ඔවුන් විශ්වාස කළ රජයේ නිලධාරින් හා අනෙකුත් බලගතු උදවිය හමුවීමට ගියහ.

කුනන්ද, සිය මව සහ අත්තම්මා සහ සීයා සමග ගොස් හමුදා කඳවුර ඉදිරියෙහි දූහුවිලි පාරෙහි ඉඳගෙන සිටියේය, බෙහෙවින් තද කොට සාදන ලද ගේට්ටුවට එපිටින් සිදුවන්නේ කුමක් දැයි සැණෙකින් බලා ගැනීමට හැකිවේදෝයි සිතමින් ඔහුගේ දෑස් රිදෙන තුරු ඔහු බලා සිටියේය.

සතියකට පසුව මිනිසුන්ගෙන් බොහෝ දෙනා කඳවුරෙන් පිටතට පැමිණියහ. ඔවුන් ඇවිදින සෙවනැලි බඳු විය. අසරණ පෙරහැර අවසානයකට පැමිණි විට ඔහුගේ පියා නිදහස් කළ අය අතරෙහි නොමැති බව ඔවුහු වටහා ගත්හ.

ඔහුගේ කල්පනාවෙන් මිදි තිගැස්සුණු කුනන්, සැනසුම් සුසුමක් හෙලමින් තාප්පයේ සුන්බුන් අතරින් ප්‍රවේශමෙන් පියමන් කළේය. අවසානයේදී ඔහු තමාගේ ගමනාන්තයට පැමිණියේය. ඔහු හිස ඔසවා බැලුවේය.

මොහොතකට ඔවුහු එකිනෙකාගේ විස්මිත බැල්ම දෙස බලා සිටියහ, එකෙක් අනෙකාගේ ඇසෙහි පිළිඹිබු වන බියෙන් පිරීගිය තමාගේ වූ ප්‍රතිබිම්බය දුටුවේය. ඔවුන්ගේ බද්ධ දෘෂ්ටිය එතැන ඇති සියලු දේ ගල් කරවීමට සමත් වූවාක් මෙන් විය. සොල්දාදුවෝ දෙදෙනා වාතයෙහි රත්වූ නිසංසල බවෙහි කොටසක් බවට පත්වූහ. අනතුරුව ඔවුහු දෙදෙනාම පසුපසට පියවර තැබූහ.

උපුල් පාසල් ගොඩනැගිල්ල පසුපසින් පසුබැස්සේය, ඔහු තමා පසුපසින් පැමිණෙන ඉක්මන් අඩි ශබ්දයක හඬ බලාපොරොත්තු වූයේය, ක්ලික් හඬ, අනතුරුව පිපිරුමක්.

කුනන්, කඩාවැටුණු බිත්තිය අසල වකුටුව හිඳ ගත්තේය, තවමත් නොවැටී තිබෙන බිත්තියේ කුඩා කොටසට නිරර්ථකව මුවා වූයේය. අනෙකුත් සොල්දාදුවන්ට අනතුරු හැඟවීම සිදුකෙරෙන ගුවන් විදුලි පණිවුඩයේ හඬද, ඉන් අනතුරුව සියලුම පැතිවලින් නැගෙන ස්නයිපර් වෙඩි උණ්ඩ වරුෂාවද ඔහු බලාපොරොත්තුව සිටියේය.

බොහෝ වේලාවක් ගතවිය.

නිසලතාව නොබිඳී පැවතිණි.

කුනන් තීරණයක් ගත්තේය. සුන්බුන්ව ගිය බිත්තියේ මද රැ කවරණය අත්හල ඔහු ළිඳ වෙත ගොස් වතුර බාල්දියක් ඇද ගත්තේය. ඔහුගේ සිතෙහි වූයේ, ඔහු දෙසට කල්පිත වෙඩි උණ්ඩයක් වේගයෙන් පැමිණෙන ශබ්දය ඔහුට අසන්නට ලැබිය හැකි බවය. සීතලක් ඔහුගේ

කොඳු නාරටිය හරහා ගියේය, එක වතුර බිඳුවක් හෝ ඉහිරෙන්නට ඉඩ නොතබමින් ඔහු සුන්බුන් උඩින් ප්‍රවේශමින් පියවර තැබුවේය. අනතුරුව ඔහු දඩිබිඩි ගමනකින් ඇවිද ගියේය. ප්‍රමාද වන්නට පෙර ඔහු ශංකර් වෙත යා යුතු විය.

අංගනය හැර යන්නට පෙර, කුනන් ආපසු හැරී බැලුවේය.

සෙබලෙකුගේ හුදකලා වූ රුවක් පාසල් ගොඩනැගිල්ලේ කැඩී බිඳී ගිය බිත්ති අතරින් පැමිණෙනු ඔහු දුටුවේය.

***අම්රිතාංජලී සිවපාලන්*** *යාපනය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි සාහිත්‍ය උගන්වන්නීය. යුද්ධය පැවති කාලය පුරාම ඇය ජීවත් වූයේ යාපනයේය. පාසලේ ළිඳ ළඟදී මුණගැසෙන තරුණ මිනිසුන් දෙදෙනාගේ කතාව සත්‍ය කතාවකි. අනෙක් සියලු සිදුවීම් විවිධ ස්ථානයන්හි සහ කාලයන්හි විවිධ මිනිසුන්ට අත්විඳින්නට සිදුවූ සිදුවීම් ය.*

# විශේෂ ප්‍රවෘත්ති
## අනාගතවාදී කතාවක්

***ශයිලෙන්ද්‍රී වික්‍රම ආදිත්‍ය***

ඈතින් පෙනෙන ගසෙහි කොළ ඇත්තෙන්ම නැති තරම්ය. ඉතිරි වී ඇති කොළ කිහිපයෙහි කහකුරුල්ලෝ පියාපත් සලමින් සිටිති. නොනැසී සිටින ඒ රන්වනුන්ට සැන්දෑ හිරු හා මද සුළඟ වර්ණය සහ ජීවය ලබා දුන්නේය. එය එකවර සුන්දර වූවා සේම, රැවටීමක්ද වූවේය.

මගේ දෑස් ගසෙහි සිට, මරදාන පාරෙහි අඳුරුවන් තාර පාර වෙත යොමුවිය. රථවාහන කිහිපයක් දුහුවිලි නංවමින් වේගයෙන් එයි, බොහෝ අදරැති ගිරවුන් හෝ පැණි කුරුල්ලන් නොවන, බොහෝ දෙනා අප්‍රිය කරන කපුටන් කලබලයට පත් වූහ. මේ කළු හෙවනැලි හැමවිටම සැක නොකරන හිස් මත සිය වසුරු හෙලන්නට වගබලා ගනිති.

'තම්බියා' පිරිමි ළමයෙක් කෑගෑවේය. මම කොන්ද කෙළින් කොට ගතිමි. මුස්ලිම්වරුන්ට නිග්‍රහයක් බැවින් තම්බි යන වචනය කිසිවිටෙක නොකියන ලෙසට අපට දැනුම් දී තිබිණි. එහෙත් ඒ වචනය පුංචි සහෝදරයා යන අර්ථය දෙන වග මම සිතුවේය. සමහර විට ඒ වැඩිමහල් සහෝදරයා සිය බාල සහෝදරයා අමතන ආකාරය විය හැකිය.

'එහෙනම් උඹ කවුද?' වෙනත් කටහඬක් සිංහල බසින් ඇසුවේ අනෙකාගේ වාර්ගිකත්වය පිළිබඳ තවදුරටත් වග විභාග කරමිනි. මේ සමගම පෙනෙන ආකාරයට ගැරහුමක් විය හැකි දෙමළ වචනයක්ද භාවිතා විය.

බස් නැවතුමෙහි කැහැටු පිරිමි ළමුන් තිදෙනෙක් සිටගෙන සිටි, මගේ වම් පසට මම හැරුණෙමි. එතැන සියලු දෙනා නව දෙනෙක් හෝ දහ දෙනෙක් වන්නට ඇත, ඔවුන්ගේ ශරීර වර්ණය කළු පැහැ විය. ඔවුන්ගේ සුදු කමිස සහ මේස් දුහුවිල්ලෙන් කහ පැහැ ගැන්වී තිබිණි, ඔවුන්ගේ කළු සපත්තු කැඩුණු සහ අපිරිසිදු ඒවා විය. අලුත්ව තිබියදී කහ, නිල් සහ රතු පැහැතිව තිබෙන්නට ඇති ඔවුන්ගේ පාසල් බෑග් අවපැහැ ගැන්වී ඇත, ඒවායේ ඉරුණු පසුපස පොත්වලින් බරවී තිබිණි. එකිනෙකාට නින්දා කර

ගනිමින් සිටි පිරිමි ළමුන් දෙදෙනා මුස්ලිම් ළමෝ වූහ, ඔවුන්ගේ කුඩා තොප්පි ඔවුන්ගේ හිස්මත නිරුපද්‍රිතව තිබිණි.

ඔවුන් භාවිතා කළ බස ඇසීමට බිය උපදවන සුළු විය. විශේෂයෙන්ම, සිවිල් යුද්ධයෙන් දසකයට පමණ පසුව ඇති වී තිබෙන උණුසුම්කාරී තත්ත්වය නිසා එය බිය උපදවන සුළු විය. පුංචි ළමයින් එතරම් අශෝභන වචන භාවිතා කිරීම මා තුළ ඇති කළේ ඔවුන් කවරාකාර නිවෙස්වලින් පැමිණෙන්නේද යන පැනයයි.

තොප්පියක් පැළඳ නොසිටි, ඔහුගේ දකුණු අතෙහි පිරිත් නූලක් එල්ලෙමින් තිබුණු පිරිමි ළමයා, ඔහුගේ දෑත් එක්කොට දබරඟිල්ල පිටතට එල්ල කොටගෙන, ඔහුගේ බොරු තුවක්කුවෙන් වෙඩිතබන්නට පටන් ගත්තේය. 'ඩිෂුම් ඩිෂුම්'

'ඔයා කොටියෙක් ද, නැත්නම් හමුදාවේ කෙනෙක්ද?' ඔහුගේ මිත්‍රයා ඇසුවේය.

'මං ඒ දෙගොල්ලන්ටම වඩා හොඳයි. මං ඔක්කොම මරලා රට පාලනය කරනවා'

'අනේ ඔයාට මැස්සෙක්වත් මරන්න බෑ. උඹ පොං...'

ඔහුගේ ගර්භාව ඉක්මනින් නැවතුණේ අනෙක් මුස්ලිම් පිරිමි ළමයා ඔහුගේ කමිස අතින් තදින් ඇද්ද හෙයිනි. 'බස් එක එනවා'

කිරි කිරි ගාමින් ඇදී ආ අඩක් හිස් බස් රථයට ඔවුහු පොරකා නැග ගත්හ.

මගේ කාර්යාල ප්‍රවාහන සේවාව හැමවිටම පැමිණෙන දිසාවට මම හැරී ගියෙමි. මගේ සහෝදර සේවකයින් කිහිපදෙනෙක් පිටත්ව යමින්, අත වනමින්, සිනාසෙමින් මා පසුකර ගියහ. මම මගේ ජංගම දුරකතනය ගෙන වෙලාව පරීක්ෂා කර බැලුවෙමි, වේලාව පස්වරු 5.30 විය. විනාඩි පහකට පසුව නිල් සහ සුදු වෑන් රථය මා ඉදිරියට පැමිණියේය. 'මරදාන පානදුර' නාම පුවරුව දැකීම ආශිර්වාදයකි.

එය පීඩාකාරී සහ ඉච්ඡා භංගත්වයට පත් වෙහෙසකර දිනයක් විය. පළමු වතාවට මා කොළඹ නගරයට පිටස්තර අයෙක්ය යන හැඟීම

මා තුළ ඇති වූ වග මේ උදෑසන මට හැඟී ගියේය. මෙය විදේශ රටක් නොවේ, දුර ඈත නගරයක් නොවේ, එහෙත් කොළඹ මා පාසල් ගිය සහ දැන් මා වැඩ කරන නගරයයි. එය හැම විටම හුරුපුරුදු සහ සැප පහසු ඇති ඉන් එක් ස්ථානයකි.

එදින මට පැවරුණු කාර්යය වූයේ කෝවිල් අසල මල්මාලා සාදන හා අලෙවි කරන අය සමග කතාබහ කිරීමයි. පුවත්පත් ඡායාරූප ශිල්පියා ඔවුන් හමුවීමට මයුර වීදියට මා සමග පැමිණි අතර, ඡායාරූප ශිල්පියා ඡායාරූප ගන්නා අතර මම වෙළෙන්දන් සමග, කතා කළෙමි. ඔහුගේ කැමරාවේ 'ක්ලික් ක්ලික්' හඬ සම්මුඛ සාකච්ඡාවන්හි නුහුරු බව හා ගැලපිණි. මගේ සිංහල උච්චාරණය නිවැරදි නොවීම මා ලැජ්ජාවෙන් වුව පිළිගත යුතු වූ දෙයකි, ඔවුන්ගේ සිංහල බස එයටද වඩා නරක් විය, ඔවුන්ගේ දෙමළ ස්වර භාවිතයෙන් යුතු උච්චාරණයක් එහි විය, බොහෝ වරක් ඔවුන් කීවේ කුමක්දැයි නැවත කියන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටීමේ හේතුවෙන් යම් අපහසුතාවක් මගේ සිතෙහි ඇති විය. මම මට අවශ්‍ය වූ කතාව ලබාගැනීමට සමත් වීමි, එතෙකුදු වුවත් ලැජ්ජා සහගත හැඟීම මා තුළ තවමත් තිබුණේ මට විශ්වාසයෙන් යුතුව ඉංග්‍රීසි බස කතා කළ හැකි නමුත් මගේ සිංහල භාෂා දැනුමෙහි දුර්වල බව හා දෙමළ බස කොහෙත්ම නොදැනීම පිළිබඳවය.

බාල වියේදී යටත්විජිතකරණය පිළිබඳ ඉගෙනීම සහ පසුව, විශේෂයෙන්ම යුද කාලයේදී යුරෝපය ශ්‍රී ලංකාවට සැලකූ ආකාරය පිළිබඳ උගැන්මෙන් මම බ්‍රිතාන්‍යයන්ට වෛර කිරීමට පටන් ගත්තෙමි. ඉංග්‍රීසි කතා කිරීම මට ඉතා පහසු වූයේය, එහෙත් සමහර අවස්ථාවලදී මම එය, මගේ පන්තියේ අනෙක් බොහෝ දෙනා මෙන්, එම බස කතා කිරීමට නොදත් අය හෙළා දැකීම සඳහා භාවිතා නොකළෙමි.

පසුදා උදෑසන පිටතට යාමට නොහැකි බොහෝ සීතල දවසක් වූවේය, අවුල්ව ගිය බ්ලැන්කට්ටුව හා කොට්ට සහිත මගේ සැපපහසු ඇඳ ලතැවෙමින් සිටින්නට ආරාධනා කරන තැනක් වූයේය. බොහෝ වෙහෙස වී වැඩ කළ දින පහක සතිය මගේ ශක්තිය උරාගෙන තිබිණි. එබැවින් මා තවදුරටත් පිටතට ගියේ නැත. එතෙකුදු වුවත් පොරොන්දුව පොරොන්දුවයි. අවසාන වශයෙන්, වැඩ කිරීමෙන් නිවාඩුවක් ලද විට,

මගේ පාසල් කාලයේ ඉතාම සමීප මිතුරකු සමග දහවල් ආහාරය ගැනීම සඳහා ඇය හමුවීමට කටයුතු සම්පාදනය කර තිබුණි. ඒ මා ඇය අවසන් වරට දුක වසර ගණනාවකට පසුව බව පෙනී ගියේය. මා අවසන් වරට ඇය දුටුවේ අප දෙදෙනාම අපගේ සුදු නිල ඇඳුමින් සැරසී, එක පන්තියක සිට අනෙක් පන්තියට දුවමින් සිටියදී ය.

බස් නැවතුමට ඇවිද යමින් සිටියදී, වාහනයක් වතුර කඩිත්තකින් ධාවනය කරද්දී, ඒ වතුරෙන් මා නැහැවී ගියේය. බසය තවමත් හුස්ම හිරකරන තත්ත්වයේ සහ මුළුමනින් පිරුණු තත්ත්වයේ නොතිබුණද, පාසල් වේලාවලදී 154 බසයේදී මෙන්, හිස් ආසන දකින්නට නොවීය. මගේ මනෝභාව තවදුරටත් නරක් වූයේ කොන්දස්තරගේ කෑගැසීම් හුදු කෙඳිරිල්ලක් පමණක් බවට පත්කරමින් බෙරිහන් දෙන බස් සංගීතය ඇසීමෙනි.

අවසානයේදී බසයෙන් බැස මට ඉදිරියෙන් ගමන් කරන මිනිසුන් අතරින් රිංගා ගිය මට, ගැඹුරු හුස්මක් ගෙන සන්සුන් වන්නට හැකි විය. මා, විශාල සහ බොහෝදුරට අඳුරුවන් මුහුද දෙසට දිවෙන පාරට හැරී, තවමත් මග එමින් සිටිනවා ඇතැයි මා දන්නා අන්යාට කතා කළෙමි.

'හායි! මං ට්‍රැෆික් එකට අහුවෙලා. තව විනාඩි පහළොවක් යාවි. අඩුතරමින්!'

'ඒක හරි අන්යා. මං කොහොමටත් කලින් ආවා. මං එහෙනම් පොත් සාප්පුවට යන්නම්'

'ආ ඔව්, වඩා හොඳයි. මං එතෙන්ට ආවම ඔයාට ටෙක්ස්ට් කරන්නම්. ඒ වගේම මගේ ඥාති සහෝදරියත් අපි එක්ක ඉඳීවි පැය බාගයක් විතර කමක් නැද්ද?'

මම ඇගේ ඥාති සහෝදරියන් ගැන අසා ඇත්තෙමි, ඉන් එක් අයෙක් මට හමුවීද ඇත. අවුරුදු පහළොවක් පමණ වූ සුන්දර නිහඬ දැරියක් ! නැවත ඒ ඇය විය හැකි බව උපකල්පනය කරමින්, කිසි ප්‍රශ්නයක් නැතැයි අන්යාට කීවෙමි.

පොත් සාප්පුවෙහි වායු සමීකරණය පහළ මට්ටමක තබා තිබුණේ

පාරිභෝගිකයා දහඩිය දැමීමෙන් මුදවා තබාගැනීම සඳහාය, එහෙත් එය ඔවුන් අපහසුතාවට පත්කරන මට්ටමේ පහළ තත්ත්වයක් නොවීය. මා එකදු පොතක් හෝ මිලදී නොගන්නා බව දනිමින් පොත් එහා මෙහා පෙරලා බැලුවෙමි. ඒවා බොහෝ මිල අධිකය, මම වැල්ලවත්තේ පරණ පොත්හලෙන් පොත් ගැනීමට වඩා කැමතිය, පරණ පොත්වල සුවඳ හුස්ම හිරකරන සුළුය, එහෙත් ඒවා වඩා සුවදායකය.

දුරකතනයේ හඬ මා නැවත සැබෑ ලෝකයට ගෙන ආවේය. අන්යා. මා පොත් සාප්පුවෙන් පිටතට පැමිණි විට, පොත් සාප්පුවේ තිබුණු ඇඳිරියෙන් පසුව මගේ දැස් ඇවිල වූ දීප්තිමත් සූර්යයා මා පිළිග නු ලැබුවේය. දහවල් ආහාරය ගැනීම සඳහා එකඟ වූ පීසා අවන්හලට යන පාර දිගේ ඇවිද යන විට, අපගේ මිත්‍රත්වය දෙස පසුපස හැරී බලන මට සිනා නොවී සිටිය නොහැකි විය. මගේ සිනාව අප්‍රසන්නතාවක් බවට පත්වූයේ, මා එහි ඇතුළු වන විට අන්යා උස හීන්දෑරි මිනිසකු සමග ඉඳගෙන සිටිනු දුටුවිටය, මම ඉතාම නරක දෙය උපකල්පනය කළෙමි. කිසිදිනෙක නොකරන බවට පොරොන්දු වූ දෙයක් ඇය කර ඇත. ඒ ආදරවන්තයකු වෙනුවෙන් මිතුරකුට පිටුපෑමය. මේ ඇයගේ ඥාති සහෝදරයා බව මට සෙමින් අවබෝධ විය. අන්යා මා දුටු අතර මට අත වැනුවාය.

'හායි! දෙයියනේ! හුඟක් කාලෙකින් නේ? ආ මේ මගේ ඥාති සහෝදරයා. රහුල්. රහුල් මේ මගේ හොඳම යාළුවා හිරණ්‍යා'

රහුල් ලජ්ජාශීලී ලෙසින් සිනාසුණේය, ඔහු මුමුණමින් සුබ පැතුවේය. අන්යා මෙන් නොව ඔහු පැහැපත් වූයේය. ඔහුගේ ඇඳුම්වලින් විදේශික ගතියක් පිළිබිඹු විය. මදුරුවන් ඔහුගේ රුධිරය බොමින් ප්‍රීති වූ ඔහුගේ අත්වල දනටමත් කුඩා රතු පැහැති ලප තිබිණි. ඔහුගේ කළු හිසකේ පිටුපසට පීරා තිබුණි, එයින් ඔහුගේ මුහුණ වඩා දිගටි හැඩයක් පෙන්නුම් කළේය.

ඔහුගේ දිව ගොළු කළේ මගේ පැමිණීම දැයි සිතමින් මම යළිත් සිනාසුණෙමි. එතෙකුදු වුව, දෙවැනි බැල්මේදී, ඔහුගේ මුහුණෙහි වූ විවෘත සහ උද්යෝගිමත් හැඟීමට මම කැමති වූයෙමි. ඔහු පෙනුණේ පැය ගණනක් කතා කරමින් ගත කළ හැකි කෙනෙකු ලෙසිනි.

'වුණේ මෙන්න මේකයි. මගේ මෝඩ මාමා සැලසුම් කළා පවුලේ හුඟ දෙනෙකුට නොදන්වා රහුල් ශ්‍රී ලංකාවට එන්න සලස්වන්න. අයියෝ! සම්පූර්ණ අවුලක්. එයා එයාගේ තාත්තගෙ පැත්තේ නෑයෝ වගයක් මුණ ගැහෙන්න යනවා. එයාගේ මාමා මෙතනට එයි විනාඩි තිහකින් විතර.'

අප අපගේ පීසා ගෙන එනතරු බලා සිටියදි, එනම් අන්යාට සැර කුකුළුමස් පීසාවක් සහ මට චීස් පීසාවක් ගෙන එනතුරු බලා සිටියදී, අන්යා, ලැජ්ජාශීලී නිහඬතාවකින් ඉඳගෙන සිටින සිය ඥාති සොයුරා ගැන කතාවලින් මගේ දෙසවන් පිරවූවාය. රහුල්, අන්යාගේ මව් පාර්ශවයේ ඥාතියෙකි. ඇගේ එක ඥාති සහෝදරියකට, ශ්‍රී ලංකාවේ සියලුම ඥාතීහු නැන්දලා මාමලා වෙති. 80 ගණන්වල හෝ 90 ගණන්වල රහුල් සහ ඔහුගේ පවුලේ උදවිය කැනඩාවට ගියහ, දැන් සිය මවගේ මරණයෙන් පසුව රහුල් සිය අධ්‍යාපන කටයුතු නිමවා ආපසු පැමිණ සිටියි. ඔහුගේ පියාද මිය ගොසිනි, එහෙත් ඒ කලකට පෙරදීය. අන්යා ඇගේ නැන්දා හෝ මාමා කිසිදිනෙක දැන නොසිටි හෙයින් ඇයට ඔවුන්ගේ මරණ එතරම් දැනෙන්නේ නැත.

මේ කතාබහ පුරා, රහුල් සිය ඇඟිලි දෙස නොසන්සුන් ලෙස බලා සිටියේය, ඔහුගේ අපහසුතාව පැහැදිලිව පෙනිණි. ඔහුගේ කැළඹිල්ල පහව ගියේ, කෙසේ හෝ, අන්යා ඔහුට මගේ රැකියාව පිළිබඳව කී කල්හිය. 'අපේ හිරණ්‍යා පුවත්පත් කලාවේදිනියක්, කියලා හිතනවා එයා මං ගැන අඩුගාණෙ එක ලිපියක්වත් ලියයි කියලා, එත් ඉතින් අපි එච්චර වැදගත් නෑ'.

'පත්තරේක?' ඔහු ඇසුවේය. රහුල්ගේ කැනේඩියානු උච්චාරණය තේරුම් ගැනීමට පුරුදුවීම අපහසුය.

'ඔව්, මං පටන් ගත්තේ මාස කීපෙකට ඉස්සෙල්ලා' මම කීවෙමි.

'හොඳයි ඔය දෙන්නා ටිකක් කතා කර කර ඉන්න. මට ඇත්තටම වැසිකිලියට යන්න ඕන' අන්යා සිනාසෙමින් කීවාය.

මා ලියන්නේ කුමන ආකාරයේ ලිපිදැයි රාහුල් මගෙන් අහන්නට පෙර තත්පර කිහිපයක නිහඬතාවක් පැවතුණේය. සියලුම ආකාරයේ කතා මා ලියූ බවත්, එහෙත් මා විශේෂ වූයේ මිනිසුන්ගේ එදිනෙදා ජීවිත ගැන කතා ලිවීමට බවත් මම ඔහුට පැහැදිලි කළෙමි.

'ඒක හරි පුදුමයි. මමත් ලියන්න කැමතියි, මං හුඟක් අයට කියන්නෙ නෑ ඒත් මට බ්ලොග් එකක් තියෙනවා' ඔහු වචනවලට ආදරය කරන්නෙක් වේ යැයි කිසිවකු ඔහුගෙන් බලාපොරොත්තු නොවනු ඇතැයි සිතන්නාක් මෙන් ඔහු කීවේය.

'ඇත්තට? මටත් තියෙනවා, මං ඒත් ඒක සැලකිල්ලකින් කරන්නේ නෑ. ඔයා හුඟක් කියනවද? සාමාන්‍යයෙන් කියවීමයි ලිවීමයි එකට යනවා'

ඔහුගේ දෑස් දැල්වුණේය. 'මං හරි ආසයි කියවන්න, මං ගෙනාවා හොඳ පොත් ගොඩක් මෙහෙදි කියවන්න. ඔයා මොනවගේ පොත් ද සාමාන්‍යයෙන් කියවන්නෙ?'

'වැඩිහරියක් නෛතික කතන්දර. ඒ වුණාට මට ළඟදි වැඩිය කියවන්න ලැබුණෙ නැහැ' ඔහු තවත් යමක් කියන්නට සූදානම් වුවද, අන්යාගේ පැමිණීම ඔහුගේ කතාව කොටින් නතර කරවීය. විනාඩි කිහිපයකට පසුව, රහුල්ගේ පියාගේ සහෝදරයා පැමිණ ඔහුව කැඳවාගෙන ගියේය. අන්යා සහ මම තනිවූයෙමු.

'ඉතින් මොනව ගැනද ඔය දෙන්නා කතා කළේ?' අන්යාට තත්පරයක් හෝ අපතේ යැවීමට අවශ්‍ය නොවීය.

'අයියෝ' ! මොකද්ද අනේ ! මුකුත් නෑ. එයා මගෙන් ඇසුවේ මං ලියන කතා ගැන'

'එයාගෙ කතාවත් හරි ලස්සනයි. ඉන්නකො. එයාව ඔයා ඉන්ටවිව් කරනවට කැමති ද කියලා මං අහන්නම්'

පැහැදිලි කිරීමක් අපේක්ෂාවෙන් මම ඇය දෙස බලා සිටියෙමි. යුද සමයේදී රට අතහැර ගිය සියගණන් දෙනාගේ කතාවලට වඩා රහුල්ගේ කතාවෙහි වෙනසක් ඇති බවක් නොපෙනෙයි.

'හොඳයි, රහුල්ගෙ අම්මා, මං හිතන්නේ විශ්වා නැන්දා, රහුල්ගෙ තාත්තා එක්ක විවාහ වුනහම, පවුලෙ අය ඒකට විරුද්ධ වෙලා. ඒ ගොල්ලෝ ආදරෙන් ඉඳලා තියෙනවා, ඒත් එක්කෙනෙක් හින්දු, අනික් කෙනා ක්‍රිස්තියානි. ඊටත් වඩා නරක දේ වුණේ රහුල්ගෙ තාත්තගෙ රස්සාව. මොකද්ද ආණ්ඩුවෙ රස්සාවක්, ඒකෙ තෙරුම එයා යාපනේ වැඩ

කරන්න ඕන. ඉතින් ඒගොල්ලො විශ්වා නැන්දාව පිළිගත්තේ නෑ. විශ්වා නැන්දලට මේ රටේ නියම ස්ථානයක් තිබුණේ නෑ. මිනිස්සු නැන්දාටයි මාමටයි වෛර කළා, මොකද ඒ දෙන්නා වෙනම රාජ්‍ය අදහසට එකඟ වුණේ නෑ. රහුල් ගොඩාක් දුෂ්කරදරවලට මූණ දුන්නා, මට විශ්වාසයි, එයා ඔයාට ඒ ගැන හැමදේම කියයි.'

එයින් පසුව ඉක්මනින් බොහෝ දේ සිදුවිය. දින කිහිපයකට පසුව, අන්යා මට කතා කළේ රහුල් ඔහුගේ කතාව මා සමග බෙදාගැනීමට කැමති බව කීමටය. පුවත්පත් කතුවරයාද එයට කැමති වූයේය, කල්ගතවන්නට මත්තෙන්, මම, රහුල් තේපැන් හලේදී හමුවීමි. පාරිභෝගිකයන්ට මෙහි ඇති තරම් වේලාව ගත කිරීමට ඉඩ ලැබිණි, එවිට අපි යම් කිසිවක් මිලදී ගනිමු, සාමාන්‍යයෙන් මේ 'යම් කිසිවක්' ඉතා මිල අධිකය.

මා කියවමින් සිටි පොතට කෙතරම් ඇලී සිටියේදැයි කිවහොත් රහුල් පැමිණෙනු මා දුටුවේ නැත.

'හලෝ' ඔහුගේ හඬ මුදුය, චංචලය.

'ඕ, හායි ! මම සිනාවක් මුව රඳවාගෙන පොත පසෙකින් තැබීමි.

'ටිකක් ප්‍රමාද වුණා, නැද්ද? මෙහෙ මාර්ග තදබදය මග ඇරලා එන්නේ කොහොමද කියලා හිතාගන්න බෑ'

'ඔයා ඒකට පුරුදු වෙයි. එහෙනම් අපි ඔයාගේ කතාව පටන් ගමුද?'

ඔහු ලජ්ජාවෙන් වට පිට බැලුවේය. 'හොඳයි, ඔයානේ ලේඛිකාව, ඉතින් ඔයාට කොතනින්ද පටන් ගන්න ඕන?'

'මට ඉස්සෙල්ලම ඔයාගේ සම්පූර්ණ නම කියන්න පුළුවන්ද?'

'රහුල් සූරියලිංගම්' අන්යා දමිළ බව මට සිහිපත් කර වූ දුර්ලභ අවස්ථාවන්ගෙන් එකක් එය වූයේය.

රහුල් ඔහුගේ කතාවට අවතීර්ණ වූයේය. වචන පහසුවෙන් ගලා ආවේ, ඔහු මීට පෙර බොහෝ වරක් ඔහුගේ ජීවිතය පිළිබඳව කතා කළාක් පරිද්දෙනි.

'මං උපන්නේ යාපනයෙ. මට අවුරුදු දහයක් විතර වෙනකල් අම්මා, අප්පා සහ මම ජීවත් වූයේ එහෙ, ඊට පස්සේ බෝම්බ දැමිල්ල පටන් ගත්තා. අපේ අසල්වැසියො තීරණය කළා ත්‍රස්තවාදීන්ට එකතු වෙන්න. මං ගිය ඉස්කෝලෙටත් බෝම්බ දැම්මා. අප්පා කොටින්ට එකතු වුණේ නෑ කියලා හිනාවට ලක්වුණා. එයා යුද්ධ ගැන විශ්වාස කළේ නෑ, එයා පැත්තක් ගත්තෙ නෑ. ඒ ගොල්ලො , අපේ තාප්පයෙ ලිව්වා 'ලක්ෂ්මන්ට මරණය' කියලා. අප්පගේ නම ලක්ෂ්මන්. එක දවසක් එල්ටීටීයේ නිලධාරීන් අපේ ගෙදර ඇවිල්ලා ඔහුට කෑ ගැහුවා. අපි සුමානෙකට පස්සෙ ගෙදර අත ඇරලා ආවා'

'කොළඹ වෙනස්' රාහුල් ඉදිරියට වාරු වී, සිය අත හිස කෙස් අතරින් යැවුවේය. එහේ තරම් දූවිලි තිබුණෙ නෑ. ඒත් හැම මුල්ලකම මොනව හරි කුණුවෙනවා වගේ ගඳක් තිබුණා. දෙමළ අයත් වෙනස්, ඒ වගේම හුඟාක් දෙමළ අය හිටියා ඔවුන්ගෙ භාෂාව නොදන්න. ඒ ගොල්ලො කතාකළේ සිංහලයි, ඉංග්‍රීසියි විතරයි. අපි වැල්ලවත්ත මහල් නිවාසවල පදිංචි වෙලා ටික කාලයක් සතුටින් හිටියා. ඊළඟට යුද්දෙ කොළඹට ආවා. අපේ සිංහල යාළුවො අපෙන් ඈත් වුණා. දෙමළ යාළුවො හිතුවා අපි ජාතිද්‍රෝහියෝ කියලා. අප්පට කිව්වෙ එල්ටීටීඊ වැඩවලට උදව්කරන්න කියලා. වැඩකරන තැන්වල මිනිස්සුන්ටයි, නෑයින්ටයි ඕන වුනා අප්පා ලව්වා, පාර්සල් හරි එක එක දේවල් නීතිවිරෝධී විදිහට ගෙනියවන්න. මේක  අපිට තර්ජනයක් වුණහම, මේ රළු ඉල්ලීම් හන්දා හිත කැඩිච්ච අප්පා තීරණය කළා අපි පිටවෙලා යන්න ඕන කියලා. අපි කැනඩාවට ගියා, අපි සමූහයක්. රටපුරා හිටපු පවුල් ඒකෙදි වැදගත් වුණේ නැහැ සිහලද දෙමළද කියන එක. හැමදෙනාටම පලා යන්න වුවමනා වුණා. අපි පිටවෙලා යනකොට අප්පා හිටියෙ හරි දුර්වල තත්ත්වයේ, එහෙ පළවැනි ශීත ඍතුවේදී අප්පා මැරුණා. අම්මයි මමයි කැනඩාවේ ජීවත් වුණා. මට වුවමනා වුණේ නැහැ ආපහු එන්න, අප්පාගෙ දෙමව්පියන් මරා දැම්මා කියලා දැනගත්තහමවත්. ඒ ගොල්ලො නුවර අය හින්දා කාලයක් යනකල් බලපෑමක් ඇති වෙලා තිබුණේ නෑ. අපිට කවදාවත් කිව්වේ නෑ ඒගොල්ලන්ව මැරුවේ කවුද කියලා. දැනගත්ත කියලා ඒ ගොල්ලන්ට පණ එන්නෙත් නෑ'

නිහඬතාව සහිත මොහොතක් උදා විය. 'රහුල්, ඇයි ඔයා කවදාවත් අන්යලා ළඟට ආවේ නැත්තේ? ඒ ගොල්ලෝ පවුලෙ අයනෙ'

තමා අන්යාගේ ඉතා දුර ඥාති සහෝදරයෙක් බව ඔහු පැහැදිලි කළේය. ඔහුට ආපසු පැමිණීමේ අවශ්‍යතාවක් නොපෙනුණ අතර තවමත් ජීවත්වන ඥාතීන් පිළිබඳව කියා තිබුණේ මාස කිහිපයකට පෙරදී පමණකි. 'අන්යා ඔයාට කියන්න ඇති පවුලෙ ප්‍රශ්න ගැන. මං කවදාවත් ඔවුන්ගෙන් කිසිවෙක් මුණ ගැහිලා නෑ. පවුල කියලා කියන අයගෙන් බොහොම ඈත අපි ජීවත් වුණේ, ඉස්සෙල්ලම යාපනේ, ඊළඟට කැනඩාවෙ. අම්මයි, අප්පයි, මමයි අපි කොළඹ ඉන්න කාලෙත් හිටියෙ. අම්මගෙ ආඩම්බරකමයි, අප්පගේ ලජ්ජාවයි වෙන කිසිකෙනෙක් එක්ක සම්බන්ධවීමෙන් වැළැක්කුවා. මං ලොකු මහත් වෙනකොට, අම්මා මට ඡායරූප පෙන්නුවා, ඇගේ ළමා කාලය ගැන කතා කළා. අම්මගේ මරණය සිද්ධ වෙනකම්, මම පවුල කියලා හඳුන්වන මිනිස්සු මුණගැසීමේ ඕනකමක් තිබුණේ නෑ'

'හොඳයි, ඒත් එහෙනම් ඔයා ආපහු අවේ ඇයි?'

මම කුතුහලයට පත්වීමි, නමුත් යුද්ධය සමාවට කරුණක් ලෙස ගනිමින් රට හැර ගිය මිනිසුන්ට මගේ අකමැත්තක් ද තිබිණි. තත්ත්වය නැවත වරක් යහපත් අතට හැරෙන විට, ඔවුන්ගෙන් සමහරෙක් ඔවුන්ගේ පැරණි නිවාස සහ රැකියා ඉල්ලමින් යළි පැමිණියහ.

'අම්මා පහුගිය මාසෙ මැරුණා. මං කොයිතරම් තනිවෙච්චි කෙනෙක්ද කියලා දැනෙන්න පටන් ගත්තා. එහෙත් කවුරුත් නෑ මෙහෙත් කවුරුත් නෑ'

'ඒත් තවමත් මේ ගෙදර' ඔහු හිස සැලුවේය.

එය අසාධාරණ විය. විදේශ රටවලට පලා ගිය අය සහ යුද කලාපයන්හි ජීවත් වූ අය ගොදුරු බවට පත්වූහ. එකම ගොදුරු! ඔව්, ඔවුහු වෙඩි උණ්ඩ දුටුවහ, බෝම්බ පිපිරුමෙහි දෙදරිල්ල ඔවුන්ට දැනිණි, එහෙත් ඔවුන් හැසිරුණේ යුද්ධයෙන් පීඩා වින්දේ දෙමළ ජනතාව පමණක් ලෙසිනි. අපිදු බලාපොරොත්තු විය හැක්කේ කුමක් දැයි නොදන හැම දිනකම භීතියෙන් දිවි ගෙවූවෙමු. පාසල් යාම බෝම්බ වැලලූ භූමියක ගමන් කරන්නාක් බඳු විය. පාසල් යාම, බෝම්බ සෙල්ලමක් සෙල්ලම් කරන්නාක් බඳු විය. එක වැරදි තැනකට, වැරදි ලෙස හැරුණොත් බෝම්බය පුපුරා යයි. එහෙත් අපි එහි සිරවූයෙමු, නිවස ලෙස හඳුන්වන ස්ථානයෙන් අපට පලා යා නොහැකි විය.

මම මගේ අකමැත්ත, මගේ කෝපය සඟවා ගතිමි. ඔහු කෙරෙහි කෝපයෙන් කතා කිරීමෙන් කිසිවක් විසඳෙන්නේ නැත.

'මට කැනඩාවෙ පවුලක් නැති හින්දා විතරක් මම දැන් ශ්‍රී ලංකාව ගැන හිතනවා කියලා ඔයා හිතන බව මම දන්නවා'

මගේ සිත කියවූවාක් මෙන් ඔහු කීවේය. 'ඒක නෙවෙයි. මගේ පියා මැරුණහම මුදල් එන ක්‍රමයක් තිබුණේ නෑ. කැනඩාවේ ඉන්න දෙමළ මිත්‍රයො අපිට උදව් කරමින් ඉදිරිපත් වුණා, ඒත් ඒගොල්ලන්ට ඒ වෙනුවෙන් හුඟක් දේවල් ආපහු ඕන වුණා. ශ්‍රී ලංකාවේ රජයට ආධාර කරපු විවිධාකාර සංවිධානවලට අපේ සම්බන්ධ වීම අවශ්‍ය වුණා. මේ සංවිධානවල රැස්වීම්වලට ඇහුම්කන් දෙන්න එකඟ වුණා නම් කොටින් වෙනුවෙන් තොරතුරු එකතු කරන්න එකඟ වුණා නම් අපි දෙන්නටම රස්සාවලුත් දෙන්න සූදානම් වෙලයි හිටියෙ. ඒත් අපි ඒවා ප්‍රතික්ෂේප කරලා, අපේම දේවල් කළා, පුංචි පඩියකට වෙළඳ ශාලාවල වැඩ කළා.'

මගේ හදවත මුදු මොළෙක් විය. විකල්ප දෙකකින් එකක් තෝරා ගැනීම පහසු වූයේ නැත. සැප සම්පත්වලින් පිරුණු ජීවිතයක් තෝරා ගැනීමට හා හොඳ රැකියාවක් ලබා ගැනීමට ඔහුට හැකියාව තිබිණි. එතෙකුදු වූවත්, ඔහු තෝරාගත්තේ රළුපරළු මාවතයි.

'අම්මාට උදව් කරන්න මගේ විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් ඉවත් වෙන්න එපා කියලා, අම්මා බලකරලා කිව්වා. කොහොමහරි ඉගෙන ගන්නයි, අර්ධකාලීන රැකියාවක් කරන්නයි මට පුළුවන් වුණා. මං කාලයක් පරණ පොත් කඩේක වැඩ කළා. ඒ මම හුඟක් කියවන්න පටන් ගත්ත කාලේ'

ඔහු මට විවිධ පාරිභෝගිකයන් ගැන කීවේය, කිසිදු පොතක් මිලදී ගැනීම වෙනුවට, බොහෝ දුරට දීර්ඝ සාකච්ඡාවල යෙදෙමින් කල්ගත කරන වයෝවෘද්ධ මිනිසුන් පිළිබඳව ඔහු කතා කළේය. මා කාලය ගත කිරීමට කැමති, පරණ පොත් සාප්පුවල නම් මම ඔහුට දුනිමි.

'අපිට එකතු වෙලා යන්නත් පුළුවන් වෙලාවක' ඔහු එසේ යෝජනා කර හිස සැලුවේය. දින කිහිපයකට පසුව යළිත් රහුල් සහ මම මුණ ගැසුණෙමු. අප දෙදෙනා අතර සුවපහසුවක් සහ සැහැල්ලුවක් ගොඩ

නැගෙමින් තිබිණි. එය අප දෙදෙනා අපගේ මුළු ජීවිත කාලය පුරාම එකිනෙකා දැන සිටියාක් බඳු විය.

ඔහු පරණ වී ගිය පොතක් තම බෑගයෙන් ඉවතට ගෙන, පොතෙහි පිටු පෙරලුවේය. 'ඒක කියවන්න. අපි යාපනෙන් එනකොටයි ඊළඟට රට ඇරලා ගියහමයි පාවිච්චි කරපු දින පොත. මහ කබල් භාෂාවකුයිලිවීමකුයි. ඒත් ඔය තියෙන්නේ ඇත්ත. පොඩි ළමයකුගෙ කතාවක්'

ඔහු සටහන් මට දුන්නේය. කවරයේ 'රහුල්ගේ දේපලකි ! අල්ලන්න එපා' යනුවෙන් ලියා තිබුණි.

එහි පළමු සටහන දමා තිබුණේ 1995 මැද භාගයේ දිනයකදීය, එම සටහන දරුවකුගේ අත් අකුරෙන් ඉතා පැහැදිළිව ලියා තිබුණි. ක්‍රමයෙන් ඔහුගේ අත් අකුරු ඒ පැහැදිලිකමෙහි සිට පිළිවෙලකට නැති අකුරු බවට පත්ව තිබිණි. එක එක සටහනක දිග මෙන්ම පෑනෙහි පාටද වෙනස් වෙමින් තිබිණි. මා ඒ සටහන් උඩින් පල්ලෙන් කියවමින් යන විට මට එහි 'මේ යුද්ධය මුග්ධය ! ' 'මම අප්පාට වෛර කරනවා', යන වාක්‍ය සහ වගන්ති දකින්නට ලැබිණි. එමෙන්ම 'අම්මා ! ඔවුන් ඒ තරම් බියගුල්ලන්,' 'අපි යන්න යනවා. මං මේ ශාපලත් රටට වෛර කරනවා, 'කැනඩාව වඩා හොඳයි මං කවදාවත් අතහැර යන්නේ නෑ', 'අරුන් මාමා සල්ලි ඉල්ලුවා. අප්පා එයාට කෑ ගැහුවා, එයා ලජ්ජා නැති කමක් ගැන කතා කළා' 'මම හිතනවා අරුන් මාමා කියන්නෙ ත්‍රස්තවාදියෙක් කියලා' වැනි වාක්‍ය හා වගන්ති ඒ අතරෙහි විය.

රහුල්ගේ දිනපොතෙහි ඔහුගේ අපූරු පින්තූරයක් චිත්‍රනය කොට තිබිණි, එමෙන්ම යුද්ධය පිළිබඳ ඔහුගේ හැඟීම් එනම් කෝපය, වෛරය, පීඩනය, ව්‍යාකූල බව යන හැඟීම් එහි සටහන්ව තිබිණි. ඔහුගේ කතාව ඉතා අමු සහ ඉතා අවංක එකක් විය. කොළඹ ඔහුගේ කලා පංතිවල සිටි සිංහල ශිෂ්‍යයෙක් වූ විනෝද්, ඔහු දමිළ වීම නිසා වරක් ඔහුට පහර දුන්නේය. ඔහුගේ සමෙහි පැහැය හේතුකොට ගෙන සෑම් නම් ගැහැණු ළමයා ඔහු ප්‍රතික්ෂේප කළේය. කැනඩාවේ සිටි අරුන් මාමා සමග ඔහුගේ මව දබර වූයේ, ඔහු අම්මාට ව්‍යාජ දමිළයකු ලෙස චෝදනා කළ බැවිනි.

'මේක අහන්න ආතම්මි' මම ඇගේ නිදන කාමරයේ පුටුවක හිඳගෙන දිනපොත කියවමින් මගේ ආතම්මීට කතා කළෙමි. 'මගේ ජීවිතය හිරුරැස් දහර විනිවිද නොයන ජලයෙන් යුතු ගැඹුරු ළිං පත්ලක සිටින්නාක් මෙන් දැනෙයි. දිනෙන් දින, මේ අඳුරෙන් එළියට එන්නට මම උත්සාහ කරමි.' මම මොහොතකට නිහඬ වූයෙමි, අනතුරුව සන්සුන් ලෙසින් ආත්තම්මාට මෙසේ කීවෙමි. 'මං කැමතියි මට එහෙම ලියන්න පුළුවන් නම්'

'දුව, එහෙම කියන්න එපා. කොහොම නමුත් මොකද්ද ඒ පොත?'

පොතද රැගෙන මම, ආත්තම්මි පස්වරුවෙහි නින්ද භුක්ති විඳින ඇගේ ඇඳ වෙත ගියෙමි.

'ඒ රහුල්. අන්යාගේ දුර නෑයෙක්. මං එයා ගැන ලිපියක් ලියමින් ඉන්නෙ. එයා මට දුන්නා එයාගේ දිනපොත කියවන්න'

'එයා කොහේ කෙනෙක්ද?'

'එයා යාපනෙ. යුද්දෙ කාලෙ කැනඩාවට ගිහින්'

'එහෙනම් එයා දෙමළ'

'අයියෝ අත්තම්මි ! ඔය කතා හැම තිස්සෙම උඩට ගන්න එපා. එයා පුදුමාකාර හාදයෙක්'

'හැමෝම හොඳයි. හැබැයි අමතක කරන්න එපා සමහර අය අපේ පවුලට ගැලපෙන්නේ නෑ.'

අත්තම්මි ඉන් අදහස් කළේ කුමක් දැයි මම ඇයගෙන් ඇසුවෙමි.

'ඔය රාහුල් ලා ඔයගොල්ලන්ව එහෙ මෙහෙ අරන් යයි. ඒත් වැඩ වැරදුනහම ඒ ගොල්ලෝ යන්න යයි. එයා යාපනේ ඉඳලා ආව කෙනෙක් නම්, එයාගේ දෙමාපියෝ කිසි දවසක අනුමත කරන එකක් නෑ'

'ඒක ලිපියකට විතරයි අත්තම්මි. මං මේ එයාව කසාද බඳින්න හරි, වෙන මොහොකට හරි සැලසුම් කරනවා නෙවෙයි. අනික මං හිතන්නේ නෑ එයාගේ කතාව පත්තරේ ගියාට පස්සේ එයාට මාව මතකවත් හිටීවි කියලා'

'එහෙම තමයි මිනිස්සු හැම තිස්සෙම කියන්නෙ. ඒත් ඔයා ඒක දැනගන්න ඉස්සෙල්ලා, එයාගේ කවට කතාවලින් ඔයාව අල්ල ගනීවි. එයා ඔයාගෙ යාළුවෙක්.'

'ඔව්, ඒක වෙනස් වෙන්න ඉඩ තියන්න එපා දුව'

මම අත්තම්මී දෙස බැලුවෙමි. මගේ නළල රැළි ගැන්වෙන්නට විය. අපගේ මිත්‍රතත්වය මේ පුවත්පත් ලිපියෙන් ඔබ්බට යන්නේ නැත. මා එය ලිවීමෙන් පසුව එය අවසන් වනු ඇත. එතකුදු වුව, එය මටම කියාගත් නමුත්, මගේ සිතෙහි සැකයක් මෝදු වෙමින් තිබිණි. ඔහු අන්‍යාගේ ඥාති සහෝදරයා වූයෙන්, මට නිසැකයෙන්ම ඔහු නැවත හමුවනු ඇත. ඒ සිතිවිල්ල මා අසතුටට පත් කළේ නැත.

සති දෙකකට පසුව ලිපිය පුවත්පතෙහි පළවිය, මම ඒ ගැන බොහෝ සතුටට පත්වීමි. ඒ සම්බන්ධයෙන් රහුල් දුරකතනයෙන් මට කතාකොට ස්තුති කළේය, ඒ වගේම පෞද්ගලිකව පැමිණ ස්තුති කරන්නට මගේ කාර්යාලයට පැමිණෙන බව කීවේය.

ඔහු පැමිණි විට, පිළිගැනීමේ නිලධාරිනිය මට ඒ බව දැන්වූ අතර, මම ඔහු හමුවීමට ගියෙමි. මා යන විටම ඔහු සිනාසෙමින් ඉඳගෙන සිටි සෝපාවෙන් නැගී සිටියේය. කෙසේවුවද ඔහු ඇඳ සිටි පවුඩර් නිල් පැහැති ටී ෂර්ටය නිසා වඩා ලාබාල ලෙසින් පෙනිණි.

'මං ඒකට හරි කැමතියි, මං දන්නේ නෑ කොහොම ස්තුති කරන්නද කියලා' ඔහු කීවේය.

'මට සතුටුයි. මං සාධාරණය ඉෂ්ට කළා කියලා හිතනවා'

'ඔයා හරියටම මගේ හිතේ තියෙන දේ ලිව්වා. ඒක හරියට ඔයා මගේ කතාව ඔයාගෙම කතාව බවට පත්කර ගත්තා වගේ'

'රහුල්, ඒ සැමරුම් එක්කොට මාත් එක්ක බෙදාහදාගත්තට මං ඔයාට ස්තුතිවන්ත වෙන්න ඕන'

ඔහු සමුගන්නට පෙර, මට ඔහුගේ දිනපොත සිහිවිය. මම එය බොහෝ වරක් කියවා තිබිණි, එහි වූ සටහන් කියවීමෙන් දැනුදු සතුටක්

විදිමි. මම මගේ මේසය වෙත ගොස් ලාච්චුව විවර කොට දිනපොත ගත්තෙමි.

මම කලින් ලියූ සටහනක් පිටු දෙකක් අතරෙහි දැමුවෙමි. 'ආදරණීය රහුල්, මෙය ප්‍රකාශයට පැමිණවීමට වටිනවා. මෙය ඇත් ප්‍රැනක් දිනපොතෙහි රහුල්ගේ ප්‍රකාශනයයි. මං හිතනවා ඔයා ජීවිතේ ගොඩක් දුර යාවි කියලා . වාසනා වේවා!' මම පිවිසුම වෙත නැවත ඇවිද ගියෙමි, රහුල් ප්ලාස්ටික් පුටුවලින් එකක ඉඳගෙන සිටිනු දුටුවෙමි. ඔහු අලු පැහැ ගන්නා අහස දෙස බලමින් ගැඹුරු කල්පනාවක නිමග්නව සිටියේය.

'රහුල්' ඔහුගේ අවධානය ලබා ගන්නට මම කතා කළෙමි. ඔහු නැගිට මා දෙසට හැරුණේය. මම ඔහුට දිනපොත දුන්නෙමි, ඔහු පිටු අතර පෙරලා බැලුවේය. සටහන දුටුවිට ඔහු එය නොකියවුවද සිනාවක් පෑවේය.

'ඔයාට ස්තුතියි. මං ඉක්මණින්ම ඔයාව ආයේ මුණ ගැහෙන්න බලාපොරොත්තු වෙනවා?' මුහුණෙහි අපේක්ෂා සහගත බැල්මක් රඳවාගෙන මා දෙස බලා සිනාසෙමින් ඔහු කීවේය.

'ඔව් ඔව්' ඔහුගේ දැඩි බැල්මෙන් සිත කලබල වූ මම කීවෙමි. මම, මා රාජකාරිය සඳහා යා යුතු බව කියන්නට මෙන් ඔහුගෙන් සමුගන්නට අත දිගු කළෙමි. ඔහු මගේ බැල්ම අල්වාගෙනම, මගේ අත සොලවා , යන්නට ගියේය..

ඔහුගෙන් සමුගන්නට එතරම් හදිසියක් මට තිබුණේ නැත, තව වේලාවක් ඔහු සිටියේ නම්, මැනවැයි සිතමින්, මම මගේ මේසය වෙත ගියෙමි. තේ කෝප්ප බොහෝ ගණනක් බෙදා හදාගෙන බොමින් ගත කළ කාලයේදී අපි බොහෝ සමීප වීමු, ලිවීම සහ කියවීම් පිළිබඳ දීර්ඝ සාකච්ඡාවන්හිදී අපි එකිනෙකාට බොහෝ සේ බැඳී ගිය බව මම අවබෝධ කර ගත්තෙමි. එතෙකුදු වුව, අත්තම්මී සමග වූ මගේ කතාබහ සිහිවන කල්හි, මම රහුල් මගේ සිතෙහි පිටුපසට තල්ලු කර දැමීමට උත්සාහ කළෙමි. මගේ දවස ගෙවී යනවිට හිස් හැඟීමක් මා වෙලා ගත්තේය.

හැම වසරකම බොහෝ අපේක්ෂා තබා සිටින උත්සවවලින් එකක්

වන්නේ අප්‍රේල් මස අවුරුද්දයි. මම අහාර, තෑගි සහ චාරිත්‍රවලට ඇලුම් කළෙමි. මා වඩාත්ම ප්‍රිය කළ දෙය වූයේ කිරි ඉතිරවීමය, අලුත් මුට්ටිය, අලුත් දර සහ අලුත් කිරි, ඒ හැමටම වඩා නව ආරම්භයක්. නැකැත් වේලාව අන්තිම තත්පරයට පොඩි දරුවන් සහ වැඩිහිටියන් එකලෙසින්ම ගණන් බලති. මේ චාරිත්‍රය ඉටුකරන්නට රටට දනුම් දෙන්නේ රතිඤ්ඤා හඬයි. දින කිහිපයකට පසුව සිදුවූ දෙය මේ චාරිත්‍රයට බොහෝ සමාන විය. කිරි බොහෝ වේලාවක් ඉතිරෙමින් තිබුනු අතර, රහුල්ගේ දුරකතන ඇමතුම සමගම එය උතුරා ගියේය.

'හේයි මේ මම' ඔහු කීවේය.

'ආ ඔව්, කොහොමද?' මා වෙලාගන්නා අලුත් නුහුරු බවට නිහඬව සාපකරමින් මම කීවෙමි.

'කෝපි එකක් බොන්න හම්බු වෙමුද මොකද කියන්නේ ඔයා?'

'හොඳයි, එකක් නම්, ශ්‍රී ලාංකිකයෝ කෝපි බොන්න මුණ ගැහෙන්නෙ නෑ. අපි තේ බොන්න මුණ ගැහෙමු.'

ඔහු සුසුම් ලෑවේය. 'හොඳයි, එහෙනම් අපිට තේ කෝප්පයක් බොන්න මුණ ගැහෙන්න පුළුවන්ද? දැන් පත්තරේ ලිපිය ගියා. අපිට පුළුවන් වෙයි මං හිතන්නේ කතා කරන්න.'

'මං ගොඩක් කැමතියි, ඒත් මං හිතන්නෙ නෑ පුළුවන් වෙයි කියලා'

'හොඳයි ඔය උත්තරේ මං බලාපොරොත්තු වෙච්ච දෙයක් නෙවෙයි. ඒත් මට දැනගන්න පුළුවන් ඇයි කියලා'

'මොකද, අම්මාට යකා නඟියි, එතකොට ඔක්කොම ඉවරයි'

'ඇයි අම්මට යකා නඟින්නේ? එයා මාව දන්නෙ නැති හින්ද ද?'

නිහඬතාවකි. මා ඔහුට කෙලෙස කියන්නද?

'ඒ මං දෙමළ හින්දද?' ඔහුගේ ස්වරය විඩාපත් සහ අබල වූ එකක් විය.

'එහෙම නෙවෙයි. ඒ අර......'

'මට තේරුණා. මිනිස්සු තවමත් එහෙමයි හිතන්නෙ'

දුරකතනය නිහඬ බවක් ගත්තේය.. අනතුරුව විසන්ධි වීමේ බීප් බීප් බීප් හඬ නැගිණි.

සාමය යනු සරදම් පිණිස ගත් වචනයක් බවට පත්ව ඇත. එය මිනිසකුගේ ලේන්සුව මෙනි. දැන් ලේන්සු භාවිතා කරන්නේ ස්වල්ප දෙනෙකි, එසේ භාවිතා කරන ස්වල්ප දෙනාට, රෙදි හදවතට ළංවූ දෙයක් වශයෙන් දක්නා නිසා එය සැනසිල්ලකි. කනගාටුදායක ලෙසින්, සාමය මෝසම් සුළං මෙනි. එය පැමිණෙයි, ලොව සෝදා හරියි, අනතුරුව හැර යයි, එසේ යන්නේ ආපසු පැමිණීමට පමණකි. අපට සාමයේ කාලයක් සහ නොසන්සුන්තාවෙහි කාලයක් තිබිණි. සමහරු විශ්වාස කරන්නේ රට සිංහල බෞද්ධ රටක් බවත්, එබැවින් අන් කිසිවකුට ඉඩක් නැති බවත්ය. අනෙක් ජනවාර්ගික කණ්ඩායම් තමන් සුළු ජාතින් ලෙස පිළිගන්නේ නැත, එබැවින් ඔවුන් තම ස්ථානය කුමක්දැයි දන්නවා ඇත. ජනවාර්ගික හා ආගමික වෙනස්කම් තිබියදී, අප සියලු දෙනා ශ්‍රී ලාංකිකයන් බව සැමදෙනාම අමතක කර ඇත.

එළඹෙන දවස, තව තවත් නිහඬ තත්ත්වයට වර්ධනය විය. මෙය යුද්ධ කාලයේ පැවති විදුලි එළිය වේලාසනින් නිවා දමූ විට හා කවුරුත් විශ්වාස කළ යුතු දැයි නොදැන එකිනෙකාට පරෙස්සමින් කතා කරන විට ඇතිවන නිහඬතාව නොවේ. නව නිහඬතාව වූ කලී සුළු සෙලවීමකින් සාමය සිඳී බිඳී යන ආකාරයේ නිහඬතාවකි.

එය එසේම සිදුවිය.

'පිටකොටුවේ දසදෙනෙක් මිය ගොසිනි, පොලිසිය පුළුල් විමර්ශනයක් කරන බවට සපථ කරයි'

ප්‍රවෘත්ති ශීර්ෂ කෑ ගසයි. 'දෙහිවල පිපිරුමෙන් පස් දෙනෙක් මරුට, දහතුන් දෙනෙක් තුවාල ලබති'

ඒවා, දශක තුනක් පුරා ශ්‍රී ලංකාව තැති ගැන්වූ බෝම්බ සම පිපිරුම් නොවේ යැයි මිනිස්සු බලාපොරොත්තු වෙති. බියපත්ව විසිරී ගිය මීයන් එක් කරන්නාක් මෙන් අප හාස්‍යජනක අන්දමින් එක් කරන්නට

හදිසියේ විදේශිකයෝ උත්සාහ කරති. ඍඟහ ප්‍රවෘත්ති සේවාව සහ ඊර්ක ප්‍රවෘත්ති සේවාව ශ්‍රී ලංකා විරෝධී වැඩපිළිවෙල බාරගත්හ. අළුවල ඇති කුණු එකතු කිරීමේ, රටට එරෙහිව චෝදනා කිරීම් නැවත ආරම්භ විය.

බස් නැවතුමෙහි සිටගෙන, පාළුවට ගිය පාරෙහි විසිරී තිබුණු කොළ දෙස මම බලා සිටියෙමි. වේළුණු කොළ එක්තැන්ව ඇත, අනතුරුව හමා ආ තවත් සුළං පහරකින් විසිරී ගියේ, මුරණ්ඩු මවක් සිය දරුවන් පාසලට එළවා දමන්නාක් මෙනි. මුස්ලිම් අයෙකුට අයත් බයිසිකල් සාප්පුවක් වසා දමා තිබේ. අප දහවල් ආහාරය ගත් ස්ථානයද වස දමා ඇත. එය පුදුමයක් නොවේ. ජනවාර්ගික අර්බුදය එකිනෙකා සැක කිරීමට අප පෙළඹවීය, ඔබට නිතර දහවල් ආහාර පාර්සල ගෙනා මිනිසාද, ඔබගේ කැමතිම ලේඛකයින් පිළිබඳ දන්නා පරණ පොත්හලෙහි මිනිසාද ඔබගේ සැකයට බඳුන් වෙයි. මා සේවය කළ දුර්වර්ණ වූ කහ පැහැති ගොඩනැගිල්ල දෙස මම හැරී බැලුවෙමි. එය මට දෙවැනි නිවස බඳුවිය. නිතර හීන් හඬ නංවන දොරවල් , පොළව පුරා දිව යන කැරපොත්තන්, භාෂාවට හා කතාවලට ඇලුම් කළ මහළු හෝ තරුණ මිනිස්සු එහි සිටියහ. බිමෙහි පැවති අවිනිශ්චිතතාව, මාධ්‍යවේදීන් සහ ලේඛකයින්ට තව දුරටත් සත්‍ය අනාවරණය කිරීමට නොහැකි තත්ත්වයක් උදා කළේය. පුවත්පතක පිටු පිරවීම සඳහා මේ පැරණි ගොඩනැගිල්ලට ආපසු පැමිණීම මට කළ හැකි දෙයක් නොවීය, අඩුතරමින් නුදුරු අනාගතයේදීවත් එසේ කළ නොහැකි වනු ඇත.

මම නිවසින් පිටතට ගියේ බොහෝ කලාතුරකිනි. මා සංචාරයේ යෙදීම, විශේෂයෙන් කොළඹ මධ්‍යයට යාම ගැන අම්මා කැමති නොවීය. කාර්යාල වසා දැමීම ආරම්භ විය. බඩු මිල ගණන් ඉහළ යාමට පටන් ගත්තේය. දැනටමත් ව්‍යාකූලව තිබූ අපගේ රට තව තවත් ව්‍යාකූල විය. මගේ කාලය ගත කරන්නට රූපවාහිනිය නරඹන අතරතුර, යුද්ධ කාලයේදී විශේෂ ප්‍රවෘත්ති විකාශය කිරිමට හැම මිනිත්තු කිහිපයකටම වරක් කාටුන් විකාශයට බාධා කළ ආකාරය මට මතකය. සිංහල බසින් විදේශික චරිත කතාකරන කාටූනයක් මා බලමින් සිටියා විය යුතුය, එය නවතින විට විශේෂ ප්‍රවෘත්ති ලේබලය සමග මෘත ශරීර විසිරී ගිය සුන්බුන් සහ කළු වී ගිය ගොඩනැගිලි දකින්නට ලැබෙනු ඇත. විපතට පත්වූවන්ගේ හැඬුම් සහ අඳෝනාවන්, කාටූන් චරිතයන්ගේ ප්‍රලාප සහ සංගීතය විසින් අත්පත් කර ගැනේ.

මම රූපවාහිනිය ක්‍රියාත්මක කොට ශ්‍රී ලංකා නාලිකාව තෝරා ගත්තෙමි. පස්වරු පහට තිබෙන කාටූන් අරම්භ වී ඇත, චරිත උස්හඬින් කතාකරන, සටන් කරන හා මිනීමරන දෙබස් කැවූ ජපන් හඬ කැවූ සජීවිකරණ කාටූන් ඇරඹී ඇත.

'මේ කුණු කන්දල් ළමයි බලනවා ! මම මිමිණුවෙමි. අත්තම්මි මට යාබද හාන්සි පුටුවේ ඉඳගෙන මා හා එක්වූවාය. මම ඇගේ දෙපා මුල හිඳගෙන ඇයගේ සිරුරට වාරු වූයෙමි. ඇය මගේ හිස සම්බාහනය කරන්නට වූවා ය.

'මොකද්ද මේ කාටූන් එක දුව?'

මා පිළිතුරු දෙන්නට ප්‍රථම දෘෂ්ටයින් මිය යාමේ දර්ශනය වෙනස් විය.

'විශේෂ ප්‍රවෘත්ති.'

මා කුමක් කරන්නේද යන්න නොසිතා මම දුරකතනය අතට ගත්තෙමි, අනතුරුව දුරකතනය දෙස බලා සිටින මම, මා රහුල්ට අමතන්නට අදහස් කරන බව තේරුම් ගතිමි. එතෙකුදු වුවත් මට කරන්නට අවශ්‍ය වූ දෙය පිළිබඳ අවිනිශ්චිතව මම පසු බා ගියෙමි, මගේ හැඟීම් විසින් මා කැඳවාගෙන යනු ලැබිය හැකි ඉසව්වට යාම සඳහා වන මිල මට ගෙවිය හැකි දැයි අවිනිශ්චිතව මම පසුබා ගියෙමි.

***ශයිලේන්ද්‍රි වික්‍රම ආදිත්‍ය**, ඇගේ කියවීමේ ලැදිකම හේතුවෙන් ලිවීමේ කැමැත්ත පැන නැගුණු නිදහස් පුවත්පත් කලාවේදිනියකි. ඇය ලිවීමට අවතීර්ණ වන්නේ, ඇගේ කතාව පදනම් කොටගත් පසුබිමකින්, සංස්කෘතියකින් හා සමාජයකිනි.*

# දහසක් සැමරුම්

***ශ්‍රැති වඩුගේ***

ගුවන් විදුලිය ක්‍රියාත්මකව තිබිණ, අප්පා එයට කන තබාගෙන අසා සිටියේය. 'වැඩකට ඇති ප්‍රවෘත්ති තියෙනවාද?' රාත්‍රි ආහාරය සඳහා රොටි හදන්නට, පිටි ගුලිය පිඟානක තබා පැතලි කරමින් මම ඇසුවෙමි. අප්පා රොටි කන්නට කැමැත්තේය, ඔහුගේ ඉතිරි දත් කිහිපයෙන් වුව ඔහු රොටි කෑවේය. 'දුව ඒ ගොල්ලො කියනවා අද රෑ යාපනේ ටවුමෙ ප්‍රහාරයක් වෙනවා කියලා'

එයට ඉඟියක් මෙන් මට පිටතින් විශාල කලබැගෑනියක් ඇසිණි. අලුත්ම තත්ත්වය ගැන කතා කරමින් අපගේ සියලුම අසල්වැසියෝ ඔවුන්ගේ නිවෙස්වලින් ඉවත් වෙමින් සිටියහ. මගේ ස්වාමිපුරුෂයා රාම් කුස්සියට පැමිණියේය. 'වසුගි, මොනවා හරි ටිකක් දාගන්න, අපි ඉක්මනින් පිටවෙන්න ඕන' ඔහුගේ නිල් කොටු සහිත කමිසයේ බොත්තම් ඉක්මනින් දමන අතරතුර ඔහු කිවේය. ඔහුගේ කඩිමුඩියට බොත්තමක් හෝ දෙකක් මගහැරී තිබිණි. 'මෙහෙ ඒලටීටීඊය ඉන්නවා කියලා ඒ ගොල්ලො විශ්වාස කරන හින්දා යාපනේට ප්‍රහාරයක් එල්ල කරන්න යනවා කියලා කියනවා' පිටතට යමින් ඔහු පැහැදිලි කළේය.

සාරදා සහ රාජා අවදි කරවීමට මම වහා අපගේ දරුවන්ගේ කාමරයට දිව ගියෙමි. 'අම්මා මොනවද වෙන්නේ' ඔවුහු එකවර ඇසූහ.

'අපිට යන්න වෙනවා ටිකකට' ඔවුන්ගේ ඇඳුම් කිහිපයක් සහ අත්‍යාවශ්‍ය අඩුම කුඩුම බෑගයකට දැමීමට පටන් ගනිමින් මම කීවෙමි. 'අප්පා, ලෑස්ති වෙන්න' මම කාමරයේ සිට කෑගැවෙමි. පිළිතුරක් ලැබුණේ නැත.

'අම්මා, හරියටම අපි කොහේද යන්නේ ?' ඇගේ ප්‍රියතම රෙදි බෝනික්කා බෑගයකට දමමින් සාරදා ඇසුවාය.

'යාලුවෙකුගේ ගෙදර, දුව' මදක් අපහසුතාවෙන් බෑගයේ දැති ඇමිණුම (zip) දමමින් කීවෙමි.

අප සියලු දෙනා සූදානම් වීමෙන් පසුව, අප්පා තවමත් වේවැල් පුටුවේ ඉඳගෙන සිටින්නේදැයි බැලීමට පිටතට පැමිණියෙමු, ඔහු ඔහුගේ විශ්වාසවන්ත ගුවන් විදුලිය කනෙහි තබාගෙන සිටියේය. ඔහු ප්‍රවෘත්තිවලින් බැහැරව තමා කවදත් ප්‍රියකරන දෙමළ ගීතවලට මාරු වී සිටියේය. 'අප්පා අපි යන්න ඕන' මම හදිසියෙන් කීවෙමි.

'මං යන්නේ නෑ' ඔහු පිළිතුරු දුන්නේය.

'මොකක්?' මම තැතිගෙන ඇසුවෙමි. 'ඔයා එන්න ඕන. ඔයාට මෙහෙ නතර වෙන්න බෑ. ඒ ගොල්ලො අද රෑ මෙහෙට බෝම්බ දායි'

'මං වයසයි, මට බෑ මේ වයසෙදි තැනින් තැනට යන්න. අඩුතරමෙ මට මගේම ගෙදර මැරෙන්න දෙන්න'

'මාමා කරුණාකරලා ඔයා එනවද?' රාම් බලහත්කාර ඉවසීමකින් යුතුව කීවේය. අනතුරුව මදක් මුදු මෙළොක් වී ඔහු එයට මෙබන්දක් එකතු කළේය. 'අඩුතරමින් ඔයාගෙ මුණුබුරාලා ගැන හිතන්න' සාරදා සහ රාජා ඔවුන්ගේ සීයා දෙස ශෝකයෙන් බැලූහ.

'අප්පප්පා, කරුණාකරලා අපි එක්ක එන්න' රාජා කීවේය. 'බොහොම ඉස්සර කාලේ හිටපු රජවරුයි බිසෝවරුයි ගැන අපිට රෑට නින්ද යන තුරු කතන්දර කියන්නේ කවුද?'

'කරුණාකරලා අපි එක්ක එන්න අප්පප්පා' ඔවුහු දෙදෙනාම ආයාචනා කළහ.

'වාසුගි පරක්කු වෙනවා' දොර ළඟ සිට බලමින් රාම් කීවේය.

'අප්පා කරුණාකරලා මුරණ්ඩු වෙන්න එපා' මගේ දෑසෙහි කඳුළු නැගෙන්නට ළංවෙද්දී ආයාචනා කළෙමි.

'වාසුගි වෙලාව හයයි. ඔයා දන්නවනෙ ඒගොල්ලො කිව්වා ප්‍රහාරය රාත්‍රියේ කරනවා කියලා, අපි දන්නෙ නෑ වෙලාව. ඒත් දැන් ඒගොල්ලො ඕන මොහොතක ප්‍රහාරය එල්ල කරයි. වටපිට කවුරුවත් නෑ, හැමෝම ගිහිල්ලා. අපි යමුද කරුණාකරලා?' දැන් රාම් සිටින්නේ කෝපයෙනි.

'ඕගොල්ලො යන්න, මට මෙහෙ නවතින්න දෙන්න' සාරදාගේ හිසට තට්ටු කරමින් මගේ පියා කීවේය.

ටකරන්වලට බරැති ගල්වලින් ගසන මහ ශබ්දයක් අපට ඇතින් ඇසිණි. දරුවෝ බියෙන් කෑගසා රාම් වැළඳගත්හ. 'මාමා, ඔයා අපිත් එක්ක එන්න ඕන. තවදුරටත් මෙතන ඉන්න එක ප්‍රවේසම් නැහැ. කරුණාකරලා මුරණ්ඩු වෙන්න එපා' තවත් වෙඩි හඬක් ඇසුණි.

'දෙයියන්ගෙ නාමෙට වාසුගි දූන් යමු' රාම් කෑගැවේය.

'ඒත් මං කොහොමද අප්පා දාලා යන්නෙ'

'සාරදාටත් රාජාටත් මොකද වෙන්නෙ?' මගේ කතාව අවසන් කරන්නට ඉඩ නොදී රාම් ඇසුවේය. අප්පා නැගිට මා සිප ගත්තේය. 'වාසුගි කරුණාකරලා යන්න, මට කරදරයක් වෙන්නෙ නෑ' ඈතින් තවත් වෙඩි හඬක් ඇසෙද්දී අප්පා මා දොර දෙසට තල්ලු කළේය.

'මාමා, මම දන්නවා මාමාට මේ ගේ අතෑරලා දාලා යන්න වුවමනා නෑ කියලා. ඒත් අඩුතරමින් ඔයාගේ දූවයි, මුණුබුරාලයි ගැන හිතලා අපිත් එක්ක එන්න කරුණාකරලා' රාම් ආයාචනා කළේය.

මගේ මුහුණෙහි කඳුළු ගලා බසිද්දී මම අප්පාගේ අත අල්ලාගෙන සිටියෙමි. ඔහු ආදරයෙන් මා දෙස බැලුවේය, එහෙත් ඔහුගේ දෑස් ශෝකයෙන් පිරී තිබිණි, එය මගේ මව ගැන කතා කරන විට ඔහුගෙන් මා දකින ශෝකයම විය. එය නැවත දැකීමෙන් මගෙ හදවත කඩා වැටිණි. 'ඔයා දන්නවනෙ මට මේ ගේ අතෑරලා එන්න බෑ මගෙ ළමයෝ. ඒක විතරයි මට තියෙන එකම මතකය' අප්පා කීවේය. ඔහු මගේ අත, අත හැරෙන්නට හැර ක්‍රීම් පැහැති බිත්ති ආදරයෙන් පිරිමැද්දේය. ඔහුගේ මුහුණෙහි පුංචි සිනාවක් රැඳී තිබිණි. ඔහු මෙහි සිටියද ඔහුගේ සිත තිබුණේ අන් තැනකය. එය මට ඔහුගේ දෑසින් දැකිය හැකි විය. ඒ පිළිබඳව තර්ක කළ නොහැකි බව දත් මම තරයේ ඔහු සිප ගත්තෙමි. රාම්, අප්පාගේ උරහිස තදින් මිරිකුවේය.

'මාමා, ඔයාට සහතිකද?' ඔහු නැවත ඇසුවේය. මගේ පියා හිස සැලුවේය. අනතුරුව අප්පා දෙස අවසාන බැල්මක් හෙලා අපි හැරී, රාම්ගේ

වෑන් රථය වෙත ඉක්මනින් ගියෙමු. රාම් අපගේ බෑගය පසුපසට විසි කරද්දී, ළමෝ පළමුව දිවගොස් පසුපස ඉඳ ගත්හ. අපි ඉදිරිපස ඉඳගතිමු, රාම් දොර වසා රථය පණ ගැන්වීය. නැමීගත්, මහළු අප්පා ඉදිරි දොර අසල සිටගෙන සිටියේය. මා වසර කිහිපයකට පෙර දුන්, නිල් සහ සුදු ඉරි සහිත සරම ඔහු ඇඳ සිටියේය. ඔහු අද වනතුරු සුරැකිව තබාගෙන සිටින, අම්මා ඔහුට දුන් ඉරී වැරහැලිව ගිය සරමට එය සමාන විය. රාම් වෑන් රථය පණ ගන්වා, එය පිටතට ගැනීමට පසුපසට පැදවූවේය. අප්පා ආපසු හැරී, වැරැන්ඩයේ ඇති සිය වේවැල් පුටුව වෙත ගමන් කළේය. අප්පා දෙස මා හෙළූ අවසන් බැල්ම, වෑන් රථය ගේට්ටුවෙන් පිටතට ගන්නා විට දුටු, ගුවන් විදුලිය සිය කනෙහි තබාගෙන, ඔහුගේ පුටුවේ ඉඳගෙන සිටි දර්ශනයයි. අප මහ මගට බට විට මම වේව්ලා ගියෙමි.

සැබවින්ම අපි වේගයෙන් ගියෙමු. දැන් අපට ළඟින්ම ශබ්ද ඇසෙයි. මම මගේ දරුවන් සිපගෙන, ඉදිරියේ ඇති මහමග දෙස බලන විට බිය, සාංකාව, වරදකාරී බව සහ ශෝකය සම්පූර්ණයෙන් මා වෙළා ගත්තේය. වැස්ස ආරම්භ විය. 'මගුල' රාම් කෝපයෙන් කොඳුළේය. ඒක තමයි අපට දැන් අවශ්‍යම දේ.

අඳුරු වර්ෂාව අතරින් ඔහු ප්‍රවේසමෙන් රිය පදවමින් රථයෙහි වේගය බාල කළේය. අපට පසුපසින්, ඈතින් තවත් විශාල ශබ්දයක් ඇසෙද්දී වෑන් රථය ගැස්සී ගියේය. මම එය කුමක්දැයි බලන්නට පසු පස බැලූ විට ඈතින් කුඩා ගින්නක්, වර්ෂාවෙන් නිවී යනු දුටුවෙමි. 'ඒ මගේ ගෙදරද?' අප්පා ආරක්ෂා කර දෙන්නැයි මම නිහඬව ශිව දෙවියන්ට යාඥා කරමින් ඉල්ලා සිටියෙමි.

වර්ෂාව මැදින් අප වාහනය පදවාගෙන යන විට වර්ෂාව රථයේ කවුළුවල වැදෙන්නට වූයේ ඇණයකට මිටියකින් පහර වදින්නාක් මෙනි. වර්ෂාව කවුළු කඩා පැමිණ අපට පහර දෙනු ඇතැයි හැඟෙන්නට විය. මම රාම් දෙස බැලුවෙමි. 'අප්පා කරදරයක් නැතුව ඇති කියලා ඔයා හිතනවද?'

ඔහු බොහෝ වේලාවක් යනතුරු පිළිතුරු දුන්නේ නැත, අනතුරුව අවසානයේදී, ඔහු සුසුමක් හෙලා 'මට කනගාටුයි වාසුගි, මට ඒක කියන්න බෑ' යි කීවේය. මම ඉකිගැසුවෙමි. රාම් සමහර අවස්ථාවන්හිදී සාහසික

ලෙසින් අවංක වෙයි. එහෙත් මම ඒ වැරදි බලාපොරොත්තුවට වඩා කැමති වීමි. කඳුළු සහ වැස්ස මගේ දෘෂ්ටියට බාධා කළේය, දැන් මට මා ඉදිරියේ දැකිය හැකි එකම දෙය අඳුරයි. මට මෝටාර්වල මහ හඬ ඇසෙයි, ඒ හඬ තවමත් ඈතින් ඇසුණ ද ළං වන බව පෙනෙයි. එය අප පසු පස පන්නා එන්නාක් මෙනි, කොයි මොහොතේ හෝ අප අල්ලා ගනු ඇතිවාක් මෙනි. එක් අතකින් සුක්කානම අල්ලාගෙන සිටින රාම් අනෙක් අතින් මගේ අත අල්ලාගෙන සිටියේය. ඔහු මගේ අත මිරිකුවේ, ඔහු මා සමග සිටින බවත්, ඔහු සියල්ල තේරුම් ගත් බවක් කියන්නාක් සේය. රාම් කිසිවිටෙක හැඟීම් මතුකොට පෙන්වන කෙනෙකු නොවේ. අනෙක් අතට මා සහ රාම් ඔවුන් කෙරෙහි අවධානයක් දක්වන්නේද යන්න ගැන නොතකාම සාරදා සහ රාජ් තොරක් නැති ප්‍රශ්න අසමින් නොනවත්වා කතා කරති. 'අම්මා ඒ බෝම්බයක්ද?' 'අප්පා මේ වැස්සේ වෑන් එක නවතියිද?', 'අපිට ඔයාගෙ යාළුවගෙ ගෙදර හුඟක් කල් නවතින්න වෙයිද?', 'මං හිතනවා මං පොතක් ගෙනාවා නම් හොඳයි කියලා', 'අපිට බඩගිනියි', ආදී වශයෙන් කියවන්නට වූහ. මද වේලාවකට පසුව රාජා සන්සුන්ව මෙසේ කීවේය. 'මං හිතනවා අප්පප්පා අපි එක්ක ආවා නම් කියලා' මම එවර, මගේ හදවත ඇතුළතින් කැබලි වෙමින් තිබියදී, ආපසු හැරී ඔවුන් දිරිමත් කරවන සිනාවක් පෑවෙමි.

මඩ වලවල් සහ ගොඩැලි නිසා වාහනය නිතර නිතර ගැස්සෙමින් ගමන් කරන විට, මට අප්පා, අම්මා, ගැන මා සමග කතා කළ කාලය වෙත මගේ සිත ගමන් කළේය. ඇය මට වයස පහේදී මිය ගියාය. නිව්මෝනියාව වැළඳීමෙන් දැඩි ලෙස රෝගාතුර වූ ඇය, සති කිහිපයක් වේදනා විඳීමෙන් පසුව මිය ගියාය. ඒ සියල්ල මගේ සිතෙහි බොඳ වී ගියාක් මෙනි. ඒ චිත්ත රූප මාලාවෙහි තිබුණේ හැඬීම්, කාංසාව සහ මා වටා සිටි වැඩිහිටියන්ගේ කලබලය පමණකි. අප්පා යළි කිසිදිනෙක විවාහ නොවූ අතර ඉතා ආදරයෙන් මා රැක බලා ගත්තේය. එතෙකුදු වුවත්, මවක නොමැතිව හැදෙන්නට වැඩෙන්නට ඉතා දුෂ්කර වූයේය. මගේ උපන් දින කේක් ගෙඩිය මත ඉටිපහන් දල්වන හැම අවස්ථාවකදීම මට ඇය නැති අඩුව දැනිණි. මා විවාහ වන අවස්ථාවේ මට ඇය නැති අඩුව දැනිණි. හැමටම වඩා මට අම්මා නැති අඩුව දැනුණේ, තමා තනිවූයේ යැයි සිතමින් අප්පා නැවත නැවත ඇගේ නම අඬ ගසමින් හැඬූ විටදීය. සමහර අවස්ථාවන්හිදි දැනුදු ඔහු එසේ කරනු මම දැක ඇත්තෙමි.

අප්පා අම්මා ගැන කතාකරන කලාතුරකින් එළඹෙන එබඳු දුලබ අවස්ථාවන්හිදී ඔහුගේ මුහුණ කිසිවිටෙක නොමැති ලෙසින් ආලෝකමත් වෙයි, ඔහුගේ දෑස් කඳුලින් දිලිසෙයි. ඔවුන් එක්ව නිවස ගොඩනැංවූයේ කෙසේදැයි කියන ඔහු දැන සිටි ප්‍රියතම කතාව කියන කල්හි ඔහුගේ හඬෙහි සතුට ඉපිලෙයි, බලාපොරොත්තු කඩ වූ අවස්ථා, ආශ්වාදනීය බව, නිවස ගොඩනංවන විට ඇති වූ චකිතය, එසේම බිත්තිවල වර්ණය කුමක් විය යුතු ද යන කරුණු අරබයා සිදුවූ කුඩා ආරාවුල්, එමෙන්ම නාන කාමර දෙකක් වෙනුවට තුනක් තිබිය යුතු ද යන ප්‍රශ්න මත ඇති වූ ආරවුල් ආදිය ගැන ඔහු මහත් තුටින් කතා කරයි. මගේ ප්‍රියතම කතාව අම්මා අලුතින් හාරන ලද වලකට වැටීම සහ කෝපයට පත් වූ අම්මා මුළු දවස පුරාම අප්පාගේ උදව් ප්‍රතික්ෂේප කරමින් කොර ගසමින් සිටි ආකාරයයි. හැමවිටම ඔහු ඒවා කියන කල්හි, නිවස ගොඩනැංවීමේ කතා වඩා දිග සහ විසිතුරු කතා බවට පත්වෙයි. 'අපි දෙන්නම තරුණයි, අපේ මුළු ජීවිතේම තිබුණෙ තව ඉදිරියට, ඉතින් අපේම ගෙයක් හදන එක මහ ප්‍රබෝධයක් වුණා' ඔහු කීවේය. 'ඒ මගේ ජීවිතේ ඇයත් එක්ක ගත කළ හොඳම කාලයෙන් එකක්. මේ ගේ හැදුවෙ ගඩොලුයි, සිමෙන්තිවලිනුයි විතරක් නෙවෙයි. මේ ගෙයි තියෙනවා ඔයාගෙ අම්මා ගැන සැමරුම් දහසක්'

අප යාපනය අවට ප්‍රදේශයේ සිටි අතර, අපි දැන් පොයින්ට් පේද්‍රුරු දක්වා යමින් සිටියෙමු. අවසාන වශයෙන් අප දැන් කිසියම් ප්‍රගතියක් ලබා ඇති බවත්, අප අන්තරාදායී තත්ත්වයෙන් මිදී ඇති බවත් පෙනිණි. රාජා ඉදිරියට පැමිණ සිටි අතර ඔහු මගේ උකුලෙහි තද නින්දක සිටියේය. සාරදා සිය රෙදි බෝනික්කා පපුව මත තබාගෙන පිටුපස අසුනෙහි හොඳින් දිගැදී සිටියි. මිනිසුන් කිහිපදෙනෙක් උතුරු කලාපයට පාපැදි වලින්, වාහන වලින්, හෝ සමහරු පයින් යමින් සිටිනු අපි දුටුවෙමු. වැස්ස නැවතී තිබුණේය. එහෙත් දැන් සිහින් පොද වැස්සක් නැවත ඇරඹී ඇත. එක් ගැහැනියක් කෑ ගසන දරුවෙකු ඔසවාගෙන යමින් සිටියාය, ඔහු ඇගේ ග්‍රහණයෙන් මිදෙන්නට නොනවත්වා දඟලමින් සිටියේය. ඇයගේ ස්වාමිපුරුෂයා යැයි සිතිය හැකි මදක් කුදු මිනිසෙක්, විශාල බෑගයක් ඔහුගේ උරයෙහි තබාගෙන, ඔවුන් පසුපසින් අමාරුවෙන් ඇවිද ආවේය. රාම් වාහනය නවතා ඔවුන්ව වාහනයේ කැඳවාගෙන යා හැකි බව කීවේය. ගැහැනිය එයට කැමැත්ත දක්වන බැල්මක් හෙළුෑ නමුත් මිනිසා සිය අත දිගු කර ඇය අදිමින් 'නෑ ස්තුතියි' කීවේය. වැස්සට තෙමී ගිය රතු සාරිය

ඇඳ සිටි ගැහැනිය සැබවින්ම බලාපොරොත්තු කඩ වූ බැල්මක් හෙළුවාය. රාම් නැවත රථය පණ ගන්වන විට මම ඇය වෙත දුක්බර සිනාවක් පෑවෙමි. මා සිතන්නේ ස්වාමිපුරුෂයා අප විශ්වාස නොකළ බවය. මට ඔහුට චෝදනා කළ නොහැක. හැම කෙනෙක්ම තමන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වඩ වඩාත් සැලකිලිමත් වන බව පෙනෙයි.

අප මාර්ගය දිගේ යද්දී, ඉදිරියෙන් දෙදෙනෙක් සිටිනු දුටුවෙමු, එක් අයෙක් ගසක් ළඟ හිටගෙන සිටි අතර අනෙකා මෝටර් සයිකලයක් ළඟ යමක් කරමින් ඇණ තබාගෙන සිටියේය. ඔවුන් ගැටළුවකට මුහුණ පා සිටින බව පැහැදිලිව පෙනෙන්නට තිබිණි. 'නවත්තලා මොකද කරන්නේ කියලා අපි බලමුද?' මම රාම්ගෙන් ඇසුවෙමි.

'හොඳයි, මං දන්නේ නෑ. ඒගොල්ලො සැකයි වගේ' රාම් හැමවිටම මෙන් සැක සහිතව කීවේය.

'ඉස්සෙල්ලා පවුල සැක කළේ නැත්තේ ඇයි රාම්?' මම නොඉවසිලිමත්ව ඔහුගෙන් ඇසුවෙමි.

'මොකද ඒ ගොල්ලො පවුලක්, ඒකයි හේතුව ළමයිනුත් එක්ක'

'හරි, ඒත් ඒ ගොල්ලන්ට උදව්වක් ඕන නම්! ඒ ගොල්ලොත් අපි වගේම පැනලා යනවා?' දෙදෙනා සමීපයට ළං වන විට මම ඇසුවෙමි, ඒ මිනිසෙක් සහ ගැහැනියක බව හඳුනාගත හැකි විය.

රාම් ආවේගයකින් රථය නැවතුවේය, අනතුරුව රථයේ නලාව හැඬවූයේය. මිනිසා ඉදිරියට පැමිණියේය. ඔහු මැදි වයසේ නූස්, ස්ථුල, රැළි හිසකේ සහ ගන රැවුලක් ඇති අයෙක් විය, ඔහුගේ කොළපැහැති කමිසය වැස්සට පෙඟී ගොසිනි. ගැහැනිය වඩා තරුණ බව පෙනී ගියේය. සිනාසෙමින් ඇය තම උරහිසෙහි තිබූ බෑගය සකස්කොට ගත්තාය, ඇගේ ඇඟට ඇලී තිබුණු රෝස පැහැති හැට්ටය ඇය ඇද්දාය ඇගේ පීච් පැහැති සාය ද ඇඟට ඇලී තිබුණු අතර, ඉන් ඇගේ කෙසඟ සිරුර මතු වී පෙනිණි. 'බයිසිකලේ ප්‍රශ්නයක්ද?' රාම් ඇසුවේය.

'ඔව්' අමුතු උච්චාරණයකින් මිනිසා පිළිතුරු දුන්නේය. ඒ නියම යාපනයේ දෙමළ බස නොවේ. 'ඒක නැවතුණා, තව අඟලක්වත් ඉස්සරහට

යන්නෙ නෑ. ඒක වැඩ කරන්නේ ඒකට ඕන හැටියටයි' ඔහු සිනාසෙමින් කීවේ මුදු ලෙසින් බයිසිකලයට පා පහරක් ගසමිනි.

'කොහාටද ඕගොල්ලො යන්නෙ?' රාම් ඇසුවේය.

'හරියටම කොහාටද දන්නෙ නෑ. බෝම්බවලින් බේරෙන්න යනවා' මිනිසා සිනාසෙමින් කීවේය. මම ඔහුට කැමති වූයෙමි. බෙහෙවින් බිය ජනක වේලාවක ඔහු බොහෝ සතුටින් සිටින බව පෙනුණේය. මම ගැහැනිය දෙස බලා සිනාසුණෙමි. ඇය පෙරලා සිනාසුණාය, මා රාම් දෙස බැලුවේ ඔවුන්ට අප සමග යාමට අවශ්‍යදැයි ඔහු ඇසිය යුතු බව මගේ බැල්මෙන් ඔහුට තේරුම් ගන්වනු පිණිසය. ඔහුට කල්පනාව ඇති වී. ඔවුන් අප සමග පැමිණෙන්නට කැමැත්තේදැයි ඇසුවේය. ඔවුහු එකපැහැරම කැමති වී වෑන් රථයට ගොඩවූහ.

අප නැවත හරි බරි ගැහුණු විට ඔහු 'මම රෝහිත' යැයි කීවේය. රාම් සහ මම එකිනෙකා දෙස බැලුවෙමු. සිංහලයෙක් ! ඔහු දෙමළ දන සිටියේය. ඇය අප දෙදෙනාගෙන් කතාවෙන් තොර අදහස් හුවමාරුව තේරුම් ගත්තාක් මෙන් ''මම මලර්' යැයි කඩිනමින් කීවාය.

'මම රාම් මගේ බිරිඳ වාසුගි'

'ඔයාලගෙ දරුවන්ට හුඟක් මහන්සි ඇති. අපි ඔයාලව දැකපු වෙලාවෙ ඉඳලා එයාලා ඇහැරුණේ නෑ' මලර් කීවාය.

'ඔව් මං හිතනවා මේ මුළු අත්දැකීමම ඒගොල්ලන්ට වදයක්' මම රාජාගේ හිස පිරිමදිමින්, ඔහුගේ කළු හිසකේ කැරලි සමග සෙල්ලම් කරමින් කීවෙමි.

'ඉතින් රෝහිත, ඔයා වගේ මිනිහෙක් මොනවද මෙහෙ කරන්නෙ?' මගේ ස්වාමිපුරුෂයා සෘජුවම ඇසුවේය.

'මං වගේ මිනිහෙක්? යි ඇසූ රෝහිත හෘදයංගම ලෙසින් සිනාසුණේය. 'ඔයා අහන්නෙ සිංහල මිනිහෙක් මෙහේ මොකද කරන්නෙ කියලා?'

'ඔව් මං හිතනවා එහෙම' සමාව අයදින විලාසයකින් කීවේය.

'හොඳයි, ආදරය, මං හිතනවා' ඔහු කීවේය. 'මා ළඟ ඉන්න මේ ගැණු ළමයා, මං එයා එක්ක විවාහ වෙලා' මම මලර් දෙස බැලීමට පසුපස හැරුණෙමි, ඇය ඔහු දෙස කෝප වූ බැල්මක් හෙලනු මම දුටුවෙමු. 'එයාට ඕන වුණා එයාගෙ පවුලෙ උදවිය බලන්න එන්න. අපි ඇත්තටම පදිංචිය කොළඹ මගෙ ගෙදර'

'ඉතින් මලර් ඔයාට පුළුවන් වුණාද පවුලෙ අය එක්ක වෙලාව ගත කරන්න?' මම ඇගෙන් ඇසුවෙමි.

'නෑ අපි මෙහාට ආපු හැටියෙම, පවතින තත්ත්වෙ අනුව අපට ටවුම ඇරලා යන්න සිද්ධ වුණා' ඇය තම රන් කුරුස පෙන්ඩනය එහෙ මෙහෙ කරමින් කීවාය. 'මං හිතනවා මගේ දෙමව්පියොයි, සහෝදරියි ආරක්ෂිතව ඇති කියලා'

මේ කතා ඇසීමෙන් මගේ සිත තව දුරටත් අවුල් වී යනු ඇතැයි බියට පත්වූ රාම් ඇගේ කනස්සල්ල ගණනකට නොගෙන, 'ඔයා කොහොමද ඔච්චර හොඳට දෙමළ දන්නෙ?' යි රෝහිතගෙන් ඇසුවේය.

'කොළඹ ඉන්න මගේ යාලුවෝ මට දෙමළ ඉගැන්නුවා. මලර් ඒක වඩාත් වැඩිදියුණු කළා' යි කී ඔහු ඇයගේ කම්මුල සිප ගනු, මම පසුපස බලන කණ්ණාඩියෙන් දුටුවෙමි.

මට සැණෙකින් අප්පා සිහියට නැගිණි, මගේ කුසෙහි පෙරලුමක් දැනෙන්නට විය. මා සාමාන්‍ය පෙළ විභාගය කළ කාලයේ හැමදිනකම මගේ කම්මුලට හාදුවක් දී, මා පාසල අසලට ඇරල වූ ආකාරයත්, පස්වරුවේ පාසල ඇරී ඔහු වෙත දිව යන මා වෙනුවෙන්, මගේ ප්‍රියතම අඹ අච්චාරු පැකට්ටුවක් ද අතෙහි තබාගෙන මා එනතුරු අප්පා බලා සිටි ආකාරයත් මට සිහිපත් විය. අනෙක් ගැහැනු ළමයින් මෙන් මා බයිසිකලය පැදගෙන යනු දකින්නට ඔහුට අවශ්‍ය නොවීය. මා බයිසිකලයෙන් වැටෙනු ඇතැයි ඔහු බිය වූයේය. දැන් අද මම මෙසේ ඔහු හැර යමි. 'රාම් මට අප්පා ළඟට ආපසු යන්න ඕන' මම හදිසියේ කීවෙමි.

'වාසුගි, ඔයා දන්නවනෙ යන එක පරිස්සම් නෑ' රාම් දරුවකුට කතා කරන්නාක් මෙන් මට පැහැදිලි කළේය.

'ඒත් මං යන්න ඕන' කඳුලින් දෑස් පුරවාගෙන මම ඔහුට බල කළෙමි. 'මට එයාව දාලා යන්න බෑ. මට බෑ. ඇයි මං එකඟ වුණේ එයාව දාලා එන්න. ඇයි?'

රාම් වේගය බාලකොට සුසුම් හෙලුවේය. 'වාසුගි මං දන්නවා ඒක අමාරුයි, ඒත් ඔයා හිතන්න ඕන අපේ දරුවො ගැන' මම නිහඬ වීමි. කුමක් කළ යුතු දැයි මම දැන නොසිටියෙමි. කෙසේ වුවද, මගේ චිත්තාභ්‍යන්තරයෙහි, මා කළ දෙය සාධාරණීයකරණය කිරීමට මට නොහැකි විය. මම ඉතා නරක දියනියක වීමි. හරි නම් මා දැන් සිටිය යුත්තේ අපායේ දැවෙමින් විය යුතුය.

'මහ නරක කාල මේවා' රෝහිත මද වේලාවකට පසුව නිහඬතාව බිඳ හරිමින් කීවේය. ඔහු සානුකම්පිතව සිනාසුණේය.

'වැඩකට නැති යුද්ධයක්...අනවශ්‍යම දෙයක්' රාම් කීවේය.

'මේ වගේ කාලවලට මිනිසුන්ට මහ අසරණ කමක් දැනෙනවා' රෝහිත කීවේය.

'මොනවද අපිට කරන්න පුළුවන් මිනිස්සු එකිනෙකා මරාගන්නවා බලා ඉන්න එක හැර' රාම් ඇසුවේය.

'ඒක ඇත්ත. මේ මුළු ක්‍රමයටම විරුද්ධව මගේ කැරලි ගැහීමේ ක්‍රියාව තමයි මලර් විවාහ කරගැනීම. ඇත්තටම මං එයාට ආදරෙයි'

රෝහිත ඇය දෙස බලා සිනාසී ඇගේ අත අල්ලා ගත්තේය 'එත් ඒක මගේ පවුලෙ අයවත්, මගේ ගමේ අයවත් තෙරුම් අරන් නෑ. කවුරුහරි අහන්න බලන්න කැමති නම් මගේ ප්‍රකාශනය මේක තමයි.

මලර් ඇගේ මුළු මුහුනම ඒකාලෝක කළ සිනාවකින් ඔහු දෙස බැලුවාය. මොහොතක නිහැඬියාවකට පසු ඇය මෙසේ කීවාය, 'මං හිතනවා අප්පයි අම්මයි හොඳින් ඇති'

'මට විශ්වාසයි, ඔවුන් හොඳින් ඇති' රෝහිත ඇයට සහතික වූයේය.

අපට යම් ආරක්ෂාවක් ඇතැයි අප සිතූ නෙල්ලිඅඩි හි සිටිනා මිත්‍රයකුගේ නිවසට අපි දුන් ළඟා වීමු, එය රෑ ජාමය විය. අපි හැමදෙනාම වෑන් රථයෙන් බැස්සෙමු, සීතලෙහි බොහෝ වේලාවක් දුර ගමනක් පැමිණි අපගේ සිරුරු හිරි වැටී තිබුණු අතර අපි වාහනයෙන් බැස අත්පා දිගහරිමින් හිරි අරින්නට වීමු. අඹ ගස්වලින් වටවී තිබුණු නිවස වෙත අපි ගේට්ටුව හරහා ගමන් කළෙමු. තවමත් අඩ නිදිමතින් සිටි සාරදා සහ රාජා සිය ඇස් පිරිමදිමින් ඉදිරියෙන් ගමන් කළහ. මට මුල්වරට රාම් මුණ ගැසුණේ. මේ නිවසේදීය. අපි දෙදෙනාම මෙහි විසූ අරුල්ගේ මිතුරන් වීමු. අරුල්ගේ උපන්දිනය වෙනුවෙන් පැවති රාත්‍රි භෝජන සංග්‍රහයකදී අප හමු විය.

එය දුටුමතින් ඇතිවූ ආදරයක් නොවේ, එහෙත් අවසාන වශයෙන් එය සිදුවිය. එය සිදුවූයේ මාස ගණනාවක් පැවති අලස අල්ලාප සල්ලාපවලින් පසුව, රාම් මට කැමති බවත්, සම්බන්ධතාවක් ඇතිකර ගැනීමට කැමැත්තෙන් සිටින බවත් පාපොච්චාරණය කිරීමෙනි. මමත් ඔහුට කැමැත්තෙන් සිටියෙමි. ඔහු එක්තරා ආකාරයකට අමුතු පුද්ගලයෙක් වූයේය. ඔහු වැඩිපුර අදහස් ප්‍රකාශ කරන්නේ නැත. එහෙත් මම අදහස් පල කිරීමකදී දෙදෙනාටම ගැලපෙන ලෙසින් කටයුතු කළෙමි. මා පැය ගණන් කතා කරනු ඇත, ඔහු පිළිතුරු දෙන්නේ වචන කිහිපයකිනි. ඒ ඔහු කෝපයකින් හෝ අවුල් වූ සිතකින් සිටින නිසා නොවේ, ඒ ඔහුගේ විදිහ විය. පළමුව මම ඒ ගැන කනස්සලු වීමි. එවිට ඔහු තමාගේ කථා බහ අඩුව සපුරන්නට යම් දේ කරයි, ඒවා බොහෝ දේ දනවයි. මට සම්මන්ත්‍රණයකට සහභාගි වීම සඳහා වරක් ඔහු කොළඹට මා සමග ගියේය, කරන්නට වැඩි දෙයක් නොමැතිව ඔහු මගේ සම්මන්ත්‍රණය අවසන් වනතුරු සිටියේය, ඇනතුරුව මා යාපනයට ඇරලුවේය. ඔහු කරුණාවන්ත මිනිසෙකු වූ අතර ඔහු මට ආදරය කළ බව මම දනිමි. එකිනෙකා දැන හඳුනාගෙන තුන් වසරකට පසුව, උපන් දින සාද, සංවත්සර සමරමින්, ඥාතීන් දැන හඳුනාග ැනීමෙන් පසුව, අවසානයේදී විවාහ වීමට තරම් අපගේ සම්බන්ධය ස්ථිරසාර වී ඇති බව අපි තේරුම් ගතිමු, අපි විවාහ වූයෙමු. එය අලංකාර උත්සවයක් විය, චාම් එහෙත් අලංකාර උත්සවයක් විය.

ගේට්ටුවෙහි සිට ඉදිරි දොරටුවට යන පාරෙහි රත්මල් පෝච්චි තබා තිබුණි. අප දොර ළඟට යන විට, එය විවර වූයේය. අරුල් සහ

ඔහුගේ බිරිඳ සීතා සිනාමුසු මුහුණින් පිටතට පැමිණියහ. අප එන හඬ ඔවුන්ට ඇසුණාට සැක නැත. අරුල් ඉදිරි පඩිපෙළට පැමිණ රාමාගේ අතින් බෑගය ගත්තේය. ඔහු පිටුපසින් සිටි සීතා අප සමග සිනාසුණාය. 'මේ රෝහිත සහ මලර්' අරුල්ට සහ ඔහුගේ බිරිඳ සීතාට ඔවුන් හඳුන්වා දෙමින් රාම් කීවේය. අපට ඔවුන් හමුවූ ආකාරය ඔහු පැහැදිලි කළේය. සාරදා සහ රාජා දූන් හොඳින් අවදි වී සිටි අතර නොසන්සුන්ව සිටියහ.

'කරුණාකරලා ඇතුළට එන්න' මගේ අතෙහි තිබුණ බෑගය ද ගෙන අරුල් කීවේය.

'කරුණාකරලා මොනවාහරි කමු' කෑම මේසය පෙන්වමින් සීතා කීවාය. 'කෑම සීතල වෙලා, ඒත් මං දන්නවා ඕගොල්ලො බඩගින්නෙ ඇති'

අරුල්, රෝහිත සහ රාම් පවතින තත්ත්වය පිළිබඳව ගැඹුරු සාකච්ඡාවක නිරතව සිටියහ. මලර්ට සිය තෙතබරිත ඇඳුම් මාරුකර ගැනීම සඳහා කාමරයක් පෙන්වමින් සීතා මලර්ගේ පවුල පිළිබඳව වගතුග විමසුවාය. මට එතරම් කුසගින්නක් නොතිබුණ නමුත් කුකුළු මස් කරියෙහි සුවඳ කෑමට ආරාධනා කරන්නාක් වැනි විය. 'ළමයිනේ ඕගොල්ලන්ට කන්න ඕනද?' මම ඔවුන්ගෙන් ඇසුවෙමි, එහෙත් සාරදා සහ රාජා යන දෙදෙනාම ඔවුන්ගේ ප්‍රියතම කාටූනයක් විකාශය වෙමින් තිබුණෙන් රූපාවාහිනී තිරයට ඇලී සිටියහ. කුසගින්න නිසා හෝ ඔවුන් දූන් රූපාවාහිනියෙන් ඉවතට ගත නොහැකිය. මම හිඳගෙන සිටි තැනින් නැගිට මේසය ළඟට ගියෙමි. රොටි, පැය කිහිපයකට පෙර මම අප්පාට රොටි සෑදුවෙමි. මම පුටුවක් ඇදගෙන, එහි හිඳගෙන වැළපුණෙමි. කිසිවෙක් මට බාධා කළේ නැත, එහෙත් පසුබිමෙහි කොඳුරන හඬ මට ඇසිණි. අප්පා වෙනුවෙන් මගේ හදවත රිදුම් කන්නට විය. ඔහු හැර දමා පැමිණීම ගැන මම මට වෛර කළෙමි, මට ආපසු යාමට වුවමනා විය. අවසානයේදී මගේ කඳුළු අඩු වී යන විට මගේ උරමත අතක් තිබෙනු දැනිණි. මම උඩ බැලූ විට රෝහිත දුටුවෙමි. මම ඔහුට මඳ සිනාවක් පෑවෙමි. ඔහු පුටුවක් ඇදගෙන මා ඉදිරියේ ඉඳ ගත්තේය. 'වෙච්ච දේ මම රාම්ගෙන් දැන ගත්තා. කනගාටු වෙන්න එපා, මම ඔයාට කියන්නෙ නෑ ඔක්කොම හරියටම හරි යයි කියලා. අඬන එක නවත්තන්න කියලා මං කියන්නෙත් නෑ. ඔයා මනුෂ්‍යයෙක්. ඔයාගේ හැඟීම් පළ කරන්න ඔයාට

කැමති දෙයක් ඔයාට කරන්න පුළුවන්' ඔහු පිඟානක් ගෙන රොටියක්, කුකුළු මස් ටිකක් සහ හොඳ සැරට ඇතැයි පෙනෙන සම්බෝල ටිකක්ද, බෙදා ගත්තේය. ''අවුරුදු දෙකකට ඉස්සෙල්ලා, මේ රට වෙනුවෙන් සටන් කරන්න ගිහිල්ලා මගේ සහෝදරයා මැරුණා. හමුදාවට බැඳෙන්න ඉස්සෙල්ලා එයා මගෙන් ඇහුවා බැඳුණට කමක් නැද්ද කියලා, මං එක පාරටම එකඟ වුණා. එතකොට ඒක පෙනුණෙ උතුම් දෙයක් හැටියට. එයා මැරුණට පස්සෙ මං මටම චොදනා කරගත්තා. ඊළඟට මං රටට චෝදනා කළා. රවුමකට චෝදනා කරගෙන යනකොට අවසානයෙදී ඒ චෝදනාව කැරකිලා ආවෙ මා ළඟටමයි. ඒත් ඔයා දන්නවද මට අවබෝධ වෙච්ච දේ? ඒ සියලුම වෛර කිරීම් සහ චෝදනා පලක් නෑ. අපි ඉන්නේ තේරුමක් නැති යුද්දෙක මැද හිරවෙලා, අපි ඔක්කොම මොන ආකාරයකට හරි ගොදුරු. දැන් හරි පස්සෙ හරි ඒ ගොදුර ඔයා හරි මම හරි වෙන්නත් පුළුවන්. මැරිලා ගිහින්. අන්න ඒ වගේ'

මේ සියල්ල මට කියන්නට ඔහු සැණෙකින් තීරණය කළේ මන්දැයි මට වටහාගත නොහැකිය, මගේ මුහුණෙහි රැළි නැගෙන විට මම ඔහු දෙස බැලුවෙමි. එය නිරර්ථක යුද්ධයක් බව මම වටහා ගත්තෙමි. එහෙත් මිනිසුන් මරණයට පත්වීම හැර තව බොහෝ දේ යුද්ධයෙහි තිබේ. කම්පනය, වරදකාරී බව, අසරණ බව, හුදකලාව, යන සියල්ල ඉතා ප්‍රබලය. මගේ පියා හැර දමා පැමිණීම ගැන මා දුෂ්කරත්වයට පත්විය යුත්තේ ඇයි? මා මේ ආකාරයට පරීක්ෂා කරනු ලබන්නේ කුමක් නිසාද?

පසුදින උදෑසන මම නොසන්සුන් වීමි. මා ආපසු ගොස් අප්පා හොඳින් සිටින්නේදැයි බැලිය යුතු විය. සිදුවන්නේ කුමක් ද යන්න දැන නොගෙන මට අලසව මෙහි සිටිය නොහැකිය. මම රාම් සොයා ගියෙමි, ඔහු ඉදිරි දොර අසල තේ තොල ගාමින් සිටිනු දුටුවෙමි. 'රාම් කරුණාකරලා ගිහිල්ලා අඩුතරමින් උත්සාහ කරන්න බැරිද මොනවද වෙන්නෙ කියලා හොයලා බලන්න? මට මෙහෙම ඉන්න බෑ තවදුරටත්' මම කීවෙමි.

'හරිහොඳයි' මොහොතකට පසුව ඔහු සුසුම් හෙළුවේය. 'ළමයි මෙහෙ හිටපුවාවෙ. අපි ගිහිල්ලා, බලලා ආපහු එමු' ඔහු නැගිටිමින් කීවේය. මම අපගේ කාමරයට ගොස් සූදානම් වීමි. සාරදා සහ රාජා ඔවුන් දමා යාම ගැන සිටියේ සතුටිනි, මන්ද ඔවුන් නැවත වරක් රූපවාහිනියට ඇලී සිටියහ. පෙරදින රාත්‍රියේ සිදු වූ සිදුවීම් මොහොතකට අමතකව ගොසිනි,

ඔවුන් නොමැතිව යාම ගැන ඔවුහු විරුද්ධ නොවූහ. ආපසු යාමට සහ සිදුවී ඇත්තේ කුමක් දැයි සොයා බැලීමට මගේ ඇති අවශ්‍යතාව අරුල් සහ සීතා තේරුම් ගත්හ. රෝහිත සහ මලර් ගමනෙන් අඩ දුරක් අප සමග එන්නට සූදානම් වූහ. ඔවුහු ඔවුන්ගේ බෑගය ගත්තේ, මලර්ගේ නිවසේ සියල්ල හොඳින් ඇත්නම් ඔවුන් ආපසු නොපැමිණෙන බැවිනි. ඔවුන්ට අවශ්‍ය ඕනෑම වෙලාවක තම නිවසට ඔවුන්ට පැමිණිය හැකි බව අරුල් සහතික වූයේය. අප කී ආකාරයට අපගේ සමුගැනීමේද නොකී බොහෝ දේ තිබිණි, අපගේ ප්‍රශ්න, බිය සහ ව්‍යාකූල බව පිළිතුරක් නැතිව තිබිණි. අපි වෑන් රථයට නැග මලර් සහ රෝහිත සමග පිටත් වූයෙමු. මගදී, ඔවුන්ගේ ඥාතියකුගේ නිවසකට මලර් සහ රෝහිත ඇරල වූ අපි නිහඬව යාපනයට රිය පැදවීමු. ඔවුන්, මේ ඥාතියා සමග ඇගේ දෙමාපියන් ගැන සොයා බැලීමට ඔහුගේ වෑන් රථයෙන් ගමන් කරනු ඇත.

අප ගමනෙහි යෙදෙන විට, මා කොතනින් හෝ අහුලාගත් ලණු කැබැල්ලක් අඹරමින් සිටියදී මගේ දෑත්වල ඩා බිඳු නැගිණි. එක් අවස්ථවකදී, මගේ කම්පනය හේතුකොට ගෙන වමනය ගතියක් ඇතිවූයෙන් අපට රථය නවත්වන්නට සිදුවිය. මම වෑන් රථයෙන් බැස උදයේ ආහාරයට ගත් සියල්ල වමනය කළෙමි. මා රථයට ආපසු පැමිණියේ හඬමිනි, මන්ද මා කෝපයටත්, අපේක්ෂා භංගත්වයටත් පත්ව සිටි හෙයිනි. රාම් මගේ අත අල්ලාගෙන සිටියේය. මා තේරුම්ගත් බව, ඔහු මට කියන ඔහුගේ ක්‍රමය එයයි. මගේ මිතුරිය රාධා දරු උපතේදී මියගිය විට, වයිරසයක් නිසා අප්පා මසක පමණ කාලයක් අසනීපයෙන් සිටින විට, රාම් මට දුන් පළමු මාලය නැතිවූ විට ඔහු කළේ එයයි. මගේ සිත වියවුල්ව තිබෙන විට මිනිසුන් මා සනසන්නට උත්සාහ කිරීම මම නොඉවසමි. රාම් එසේ කළේ නැත. ඔහු මගේ අත අල්ලාගෙන හිඳියි, මට අවශ්‍ය වන්නේ එපමණකි. ඒ ගැන මම ඔහුට ඇල්ම කළෙමි.

යාපනය නගරයට සමීපව බොහෝ නිවාස සහ මාර්ගවලට හානි සිදුවී තිබෙනු මම දුටුවෙමි. සමහර නිවාස සහමුලින්ම පිළිස්සී තිබුණි, සමහර නිවාසවල වැඩි කොටසක් විනාශ නොවී තිබිණි. කිසිවෙක් පෙනෙන්නට නැත. පාරෙහි යනෙන බයිසිකල් නැත, ගෙවතුවල සෙල්ලම් කරන ළමා කණ්ඩායම් නැත. එහි තිබුණේ භයානක නිශ්ශබ්දතාවක් පමණකි. එය විඳ දරාගත නොහැකි දර්ශනයකි. මුළු ජීවිත කාලය පුරා මට

හුරුපුරුදුව තිබූ දේ සහ ස්ථාන කළු, දූලි වැකුණු අඟුරු බවට පත් වී ඇත. එහෙත් අප නිවස ආසන්නයට යන විට විනාශය මදක් අඩු බව පෙනිණි, එය මට යම් බලාපොරොත්තුවක් දුන්නේය. අපගේ අසල්වැසි පෙදෙසට අප අවතීර්ණ වන විට මම අප්පාගේ ප්‍රියතම බල්ලා, වැටී තිබුණු ට්‍රයිෂෝ කිරි පැකට්ටුවක් ඉව අල්ලමින් සිටිනු දුටුවෙමි. ඔහුට ට්‍රයිෂෝ යන නම දුන්නේ අප්පාය, මන්ද ඔහුගේ එක් පාදයක් තුවාල වූයෙන් ඔහු අනෙක් පාද තුනෙන් නොන්ඩි ගසමින් ඇවිදින්නට වූ නිසාය. නිවසට ළඟාවන විට මම මගේ දෑස් වසා ගතිමි, මගේ උගුරට උග්‍ර පිතක් නැඟී ආවේය. දෙවසරකට පෙර, එක් රාත්‍රියකදී රාම් සේවයට ගොස් ආපසු නොපැමිණි අතර එදාද මේ පිත එසේ උගුරට ආවේය. එය යුද්ධය හේතුකොටගෙන යාපනයේ ආතතිය පිරි සමයක් විය. නවය පමණ වන විට, මගේ සිරුර දහඩියෙන් නෑවී ගියේය, එහාටත් මෙහාටත් ඇවිදිමින්, මගේ සාරියේ කොන ගැට ගසමින්, ගලවමින් මම නොසන්සුන්ව සිටියෙමි. එකොළහ වන විට ඔහු ආපසු පැමිණියේය. ඔහු මිතුරකුගේ නිවසට ගොස් තිබිණි. ඔහුගේ මිතුරාට කිසිවෙක් පහර දී තිබුණු අතර, ඔහු මිතුරා රෝහලට ගෙන යාමට උදව්කර තිබුණේය.

වෑන් රථය නවතනු මට දැනිණි, මම තවමත් මගේ දෑස් වසාගෙන සිටියේ මට කුමක් දකින්නට ලැබේද යන භීතියෙනි. රාම් ස්විචය ක්‍රියා විරහිත කළ අතර මම මගේ දෑස් විවර කළෙමි. අපගේ නිවසෙහි පිටුපස කොටස විනාශ වී ගොසිනි. ඉදිරිපස බොහෝ කොටසක් ඉතිරිව තිබිණි, විසල් ගෙවත්ත තවමත් රත්මල් සහ සපත්තු මල් වලින් පිරී පැවතුණේය. මම වෑන් රථයෙන් බැස, හති දමමින් 'අප්පා ඔයා කොහේද?' යි අසමින් ගෙය දෙසට දිව ගියෙමි. දොර මුළුමනින්ම ඇර දමා තිබුණු අතර දොර සුළඟට සෙමින් සෙලවෙමින් තිබිණි. මම ඉදිරි පඩි කලබලයෙන් නැග කළු චේවැල් පුටු තිබුණු වැරැන්ඩය පසුකර ගියෙමි. ඉදිරි දොර අවහිර කරමින්, ඒවා සාමාන්‍යයෙන් තිබෙන තැනින් බොහෝ දුරට වන්නට පුටු දෙකක් වැටී තිබුණේය. මම ඒවා පැත්තකට තල්ලු කර දුඹුරු පැහැති සෙටිය තිබුණු විසිත්ත කාමරයට ගියෙමි. වහලයෙහි උළු කැට සමහරක් බිම වැටී තිබුණේ, ෂෙල් වෙඩිවල බලපෑමෙනි. තවත් දේ විනාශ වී ඇත්දැයි බලන්නට මම වටපිට බැලුවෙමි. බොහෝ දේ එලෙසින්ම තිබිණි, නිවසෙහි තවත් ඇතුළට යන්නට මට බිය සිතිණි. තවමත් බලාපොරොත්තුවක් තබා ගැනීමට හැකි වුවද, මේ කිසිවක් අප්පා ජීවත් වන බව ප්‍රකාශ නොකරයි.

ඔහුට වැන් රථය එන හඬ නැසුණේද? ගණනය කළ නොහැකි වාර ගණනක් රාම්, දරුවන් සහ මම ගෙයින් පිටතට ගොස් ආපසු පැමිණ ඇත්තෙමු, එවිට වැන් රථයේ හඬ ඇසෙන අප්පා දොර ළඟ සිටියි. ඔහු දැන් නොපැමිණියේ මන්ද? ඔහු නින්දෙහි සිටින්නේද? ඔහු නින්දෙහි සිටීවායි මම කෙතරම් පැතුවෙම්ද?

මම අඩ අඳුරු කොරිඩෝවට ගියෙමි. මා ඉදිරියට යන විට දැන් මට එක්ව සිටින රාම් මගේ අතින් අල්ලාගෙන සිටියේය. එක් තැනකදී මම නතර වී ඔහු මගේ පිට පිරිමදින අතරතුර රාම්ගේ පපුවෙහි හිස තබාගෙන ඉකිබිඳින්නට වීමි. අවසානයේ මම කොරිඩෝවේ කෙළවරට ළඟා වීමි, ගමන නිමාවක් නැති බව පෙනිණි. එය දිව ගියේ කුඩා විවෘත අංගනයකටය. එහි ඔහුගේ වේවැල් පුටුවෙහි, රේඩියෝව කනේ තබාගෙන අප්පා සිටියේය. මම ඔහු වෙත දිව ගියෙමි. ඔහු මා දුටුවේය, ඔහුගේ මුහුණ විමතියෙන් සහ සතුටින් බැබළිණි. ඔහු නැගිට මා තරයේ වැළඳ ගත්තේය. මම අවසානයේ ඔහුගේ තුරුලින් ඉවත් වීමි, ඔහු මගේ ඉණෙන් අල්ලා ගත්තේය. 'අප්පා, ඔයා හොඳින් ඉන්න එක ගැන මට ගොඩාක් සතුටුයි' මම හැඬුවෙමි, මගේ මුහුණ දිගේ කඳුළු ගලා ගියේය. මම සහනයකින් සහ උද්වේගයකින් වෙව්ලන්නට වීමි. ඔහු සිනාසුණා පමණකි, මගේ පිටට තට්ටු කළා පමණකි. 'ඔයාට ටිකක්වත් බය හිතුණේ නැද්ද?' මම ඔහුගෙන් ඇසුවෙමි.

'බය? මං බය වුණේ ඔයා ගැන විතරයි දරුවෝ, ඒත් ඔයා ප්‍රවේසමින්නෙ. වෙන මොනවටද මම බය වෙන්න ඕන? මගේ ජීවිතේ බය වෙන එක නැවතුණේ ඔයාගේ අම්මා මැරුණු දවසේ, මගේ ජීවිතේ ඒ පැත්ත ඇයත් එක්කම මැරුණා' මම ඔහු දෙස ආයාචනාත්මකව සහ ශෝකයෙන් යුතුව බලා සිටියෙමි. ඔහු ඔහුගේ ගුවන් විදුලියට තට්ටු කළේය. 'මං ඊයේ අහ අහ හිටපු චැනල් එක මට හොයාගන්න බෑ, මොකක් හරි කරන්න' ඔහු සිනාවකින් යුතුව මගේ ආයාචනය මග හරින්නට මෙන් එය මා වෙත තල්ලු කළේය. මම එය පිළිවෙලකට සකස් කළ විට ගුවන් විදුලි යන්ත්‍රයෙන් පැහැදිලි හඬක් මතු වූයේය. 'මේ, යාපනය නගරයෙන් සහ අවට ප්‍රදේශවලින් ඉවත් වන ලෙස ජනතාවට කෙරෙන තවත් අනතුරු ඇඟවීමකි' සටන් නැවතත් ආරම්භ වී ඇත. මම අප්පා දෙස බැලුවෙමි, මගේ දෑස ඔහුට ආයාචනා කරයි. අප්පා සිය වේවැල් පුටුවෙහි ඉඳ

ගත්තේය. මම එක වරටම පොළවට බරවීමි. නැවත වරක් මෝටාර් හඬ ඇතින් ඇසෙන විට රාම් පැමිණ මා ළඟින් හිඳගෙන මගේ අත අල්ලා ගත්තේය.

***ශ්‍රැති වඩුගේ*** *මිශ්‍ර පවුලකින් පැමිණෙන්නියකි. ඇයගේ මව මඩකලපුවෙහි දමිළ කාන්තාවක වන අතර, ඇයගේ පියා මාතරින් පැමිණි සිංහලයෙකි. ඇය, ඔවුන්ගේ වෙනස් සංස්කෘතින් හා ජනවාර්ගිකත්වය දැක ඇත, අසා ඇත. එමෙන්ම අත්විඳ ඇත. ජනවර්ග දෙක පිළිබඳ ඇයට ගැඹුරු අවබෝධයක් තිබුණ ද, ඇයට යුද්ධය පිළිබඳ සත්‍ය අත්දැකීමක් නැත. ඇගේ ලිවීම සම්පූර්ණයෙන්ම පාහේ පෙළඹවීම ලබන්නේ, ඇය ස්වේච්ඡා සේවිකාවක වන යෞවන සමගි සන්ධාන ව්‍යාපාරයේ , 'ශ්‍රී ලංකා එකතුව' හරහා හඳුනා ගැනීමට සහ මුණගැසීමට වාසනාව ලද අයගෙන් අසා දැනගත් තොරතුරු ආදියෙනි.*

# කාව්‍යය

*රාධිකා කාලිරාජා*

## දෙණ තුළ

ටක් ටක්
පියන අරින්න කරුණාකර
වෙඩි උණ්ඩ මා සිඳ බිඳලුවද
මා තවම පණපිටිනි
නැහැවී ඇත මා රුධිරයෙන්
අඳුර මා බියකරයි
හුස්ම පොද හිර වෙයි මගේ
ආබාධිතයි මම
ඇවැසිය මට දීප්තිය
රැකුනොත් මා, රැකේ අනිකුන්ද

කරුණාකර උදව් කරනු මැන
ඇවැසිය ජීවත් වන්න
මමය දෙණ තුළ හිරවුනු සාමය
ටක්... ටක්...

## තුවක්කුවක් කතා කරයි

පැන්සලක තුඩ ලියයි කවි
මගේ තුඩින් සිඳලමි දිවි
ඔබ මා ගෙන යයි බිළිඳකු විලසින
එහෙත් මම ගනිමි ඔබේ හුස්ම පොද
මා අත නැත වරද කිසි
ගිනි බිඳුමට පෙර සිතුවා නම් ඔබ
මවකට දරුවකු අහිමි නොම වනු ඇත
දුවක කිසිවිට වැන්දඹු නොම වෙයි
ඇගේ පෙම්බර මැණියන්ට පෙර

බිළිඳකු තනකිරි ඉල්ලා නොහඬනු ඇත
මවගේ පණ නැති සිරුරෙහි එල්ලී
හැකි වේ නම් මට
මා තබන්නේ වෙඩි
අන් කිසිවකුට නොව
එහෙත් මටමය.

**නිදහස් දිනය**

මී වදයක මී මැස්සන් සේ සිටිත් අපමණ මිනිසුන්
ජාතිකත්වය, හැම හදවතකම දැල්වෙන පහනය
පා ගමනේ යති හමුදා සෙබළුන්
අත්පොළොසන් දෙති හැම දන උද්වේගෙන්
ඔසවති ධජය ජනපති අප නිර්මල දෑතින්
බලා සිටිමු අපි අසනුව ඔහුගේ පුබුදු වදන්
දෙබසින්ම ගැයෙන්නේ ගීයයි ජාතික
එකම පෙළක සිටිත් හැම පූජකවරු
සැම දෙන ගරුසරු දක්වති
රජයටදෙවියන් විලසට
මුර පොළ, මුර භටයින් ඕනෑ නොම වේ
ධජ පතාකයෙන් ඇළලෙයි සැරසුනු නගරේ
අපමණ පතොරම් මුදා හැරේ සුළඟේ
හැම මාදිලියෙම දරුවෝ රඟ දෙන
සියලුම ආගම් සමරන උළෙලකි
එසේය, සැම දෙනටම තිළිණය වේ මෙය

'යාපනය පුස්තකාලය අසලදී කලහකාරී පිරිසක් විසින් දෙමළ පිරිමි ළමයෙකුට වෙඩි තබයි'

රූපවාහිනියෙ ප්‍රකාශයෙන් ඒ කර්කශ
බොඳ කරවී මගේ නිදහස් සිහිනය

***රධිකා කාලිරාජා*** *යාපනයේ ඉපිද, ත්‍රිකුණාමලයේ හැදී වැඩුණාය. ඇගේ දෙමාපියන් ත්‍රිකුණාමලයේ වැසියන් වුවද යුද්ධය නිසා අවතැන්ව යාපනයේ, කොණ්ඩාවිල් කරා පැමිණියහ. ඇය මූලික අධ්‍යාපනය ලැබුවේ කොණ්ඩාවිල්හි දීය, එහෙත් උතුරු පළාතේ අස්ථාවර තත්ත්වය ඇගේ පවුලට ත්‍රිකුණාමලයට ආපසු යාමට බල කෙරිණි. ඇය ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සාමාන්‍ය උපාධියක්, ඉංග්‍රීසි විෂයයක් ද ඇතුළත්ව හදාරන්නීය. ඇය කවි ලිවීමට සැබැවින්ම කැමැත්තීය.*

# ගෙදර වැඩ

***නිෆ්රාස් රිෆාස්***

'මං මොකෙක්වත් නොවෙයි ඒත් පරාජිතයෙක්. මෝඩ, කොන්දක් නැති පරාජිතයෙක්. මගේ ජාතියට ලැජ්ජාවක්, මගේ ආගමට ලැජ්ජාවක්. මං මොන පාපයක්ද කළේ? ඇයි මං සිංහල පවුලක ඉපදුණේ නැත්තේ?'

මන්සූර් කඳුළු පිරි දෙනෙතින්, සිය අලුතින් රැවුල බෑ මුහුණ දෙස නාන කාමරයේ බිඳුණු කණ්ණාඩියෙන් බැලුවේය, බොහෝ රළු ලෙස ඔවුන් රැවුල කැපූ කම්මුල්වල මතු වූ රතු රේසර් පැල්ලම් දෙස ඔහු බලා සිටියේය. 'ඇයි මං මේ මුග්ධ රටේ උපන්නෙ?' ඔහු දවටගහ ජුම්මා පල්ලියෙන් මිල දී ගත් රුපියල් පනහේ විලවුන් බෝතලය දමා ගැසුවේ කණ්ණාඩියේ තවත් ඉරි තැලුමක් ඇති කරවමිනි. සමන් පිච්ච සුවඳ නාන කාමරය පුරා පැතිරී ගියේය. ජැස්මින් ඔහුගේ ප්‍රියතම සුවඳ විලවුන නොවේ, ඔහු කැමැත්තේ කුරුඳු සුවඳ විලවුනටය. එහෙත් ඔහුට මිලදී ගැනීමට හැකියාව ඇත්තේ සමන් පිච්ච සුවඳ විලවුන්ය. ඔහු කුරුඳු සුවඳ විලවුන් බෝතලය ගත්තේ නම්, ගිනිගෙන දැවෙන හිරු රශ්මියෙන් පිළිස්සෙමින්, රත්මලානට, සැතපුම් දහයක ගමන පයින් ඇවිද යන්නට සිදු වෙයි. 'ඇයි මම මේ මුග්ධ රටේ උපන්නේ?' ඔහු තමාගෙන්ම නැවත ඇසුවේය.

අද මුළු දිනයම, ආරම්භයේ සිටම සාප ලත් දිනයක් විය. පැය නවයක දීර්ඝ ජල කප්පාදුවෙහි අර්ථය වන්නේ මන්සූර්ට උදෑසන ස්නානය කළ නොහැකි බව හා උදෑසන ඇඳුම් මැදිය නොහැකි වන බවයි. දවස දැනුණේ ඒ 9 පාර මෙන් දීර්ඝවය. හැම විටම පොද වැටීමද, වතුර බිංදු පොළවට වැටී දුහුවිල්ල සමග මුසුවීමද සිදුවිය.

ඔහු රන් බඩු සාප්පුවක සේවය කළේය, විවිධ ප්‍රමාණයෙන් හා හැඩ වලින් ද, සාදන ලද රන්, රිදී සහ ප්ලැටිනම් මුදු, වළළු සහ කරාබු පිස දමමින්, පොලිෂ් කරමින් සහ සෝදමින් ඔහු දවසේ බොහෝ වේලාවක් ගත කළේය. ඔහු ඒවායේ වූ කිලිටි පැහැයේ සිට, ඒවායේ නියම බබළන දීප්තිය ගෙන දුන්නේ, දෙහිවල හන්දියේ ජංගම සෝදන මැෂිම මෙනි. නයෙකුගේ සිරුරෙහි ඇති තිත් බඳුව දෙහිවල ගාලු පාරේ දෙපැත්තේම

රන් බඩු වෙළඳසැල් දුසිම් ගණන් තිබේ. ජයසිංහ ජුවෙලර්ස් අධිපති, ජයසිංහ මුදලාලි සිය සාප්පුව ඉදිරිපිට තාවකාලික මඩුවක් ගසා ගැනීමට කුඩා ඉඩකඩක් මන්සූර්ට ලබාදීමට තරම් කාරුණික වූයේය. අල්ලපු ගෙදර දමයන්ති අක්කාගෙන් ඉල්ලා ගත් රතු ප්ලාස්ටික් වතුර බේසම, ලක්ස් සබන් කැල්ලක් හා, වයර් කිහිපයක් සහ බැටරි කිහිපයක් දුර්වර්ණ වූ අබරණ පිරිසිදු කිරීම සඳහා මන්සූර්, මෙහි තබා ගත්තේය. තාවකාලික මඩුව සාප්පුවේ නෛසර්ගික කොටසක් වූ අතර, එය හරියට වටලප්පමට, කරදමුංගු බඳු විය.

මන්සූර් පළාත් තුනකදී විවිධ පාසල් අටක උසස් පෙළ දක්වා ඉගෙන ගත්තේය. ඔහු උසස් පෙළ විභාගයේදී සාමාන්‍ය සාමාර්ථ තුනක් ලබා ගත්තේය. 'අල්හම්දුල්ලාහ්' (Alhamdulillah) ඔහු හැමවිටම සර්වබලධාරී දෙවියන් වහන්සේට තුති පිදුවේය. විශ්ව විද්‍යාලයෙන් පිටවන විවිධාකාර රැකියා විරහිත උපාධිධාරීන්ට වඩා ඉදිරියට යමින් අවුරුදු තිස්දෙකේදී ඔහු ස්වයං රැකියාවක් කිරීම නිසා මූල්‍යමය වශයෙන් හොඳ තැනක සිටියේය. ඔහුගේ වැඩ කරන දිනයක, වැඩ කරන වේලාව ඇරඹෙන්නේ, කුණු ලොරිය ඔහුගේ බෝඩිං නිවසට පැමිණෙන උදේ දහයටය, ඔහුගේ වැඩ අවසන් වන්නේ මිනිසුන් හොර රහසේ ඔවුන්ගේ කුණු අසල්වාසීන්ගේ ගේ දොරකඩ වල තබන රාත්‍රී අටට පමණය.

වේලාව රාත්‍රී අට පමණ වූ අතර ජයසිංහ ජුවලර්ස් දොරවල් වසා තිබුණි. මන්සූර් වළල්ලක් ගැනීම සඳහා ප්‍රමාද වී පැමිණෙන පරිබෝගිකයෙක් වෙනුවෙන් ඔහුගේ කුටිය තවමත් විවෘත කරගෙන බලා සිටියේය. අද පාරිබෝගිකයන් තිස්එක් දෙනෙක් පැමිණි අතර, ඔවුහු රත්රන් මිල ගණන් පරීක්ෂා කර, තවත් දිනකදී ප්‍රධාන සාප්පුවට පැමිණෙන බවට පොරොන්දු වූහ. කිසිවෙක්, එක දෙයක් හෝ මිලදී ගත්තේ නැත. අනෙක් අතට, මන්සූර් වාසනාවන්ත වූයේය. ඔහුට පාරිබෝගිකයන් දහතුන් දෙනෙක් සිටි අතර, ඔවුහු ඔවුන්ගේ රන්බඩු ඔහු ලවා පොලිෂ් කරගත්හ. ඔහුගේ දවසේ ආදායම රුපියල් අටසිය විසිපහක් විය. එය නරක නැත. මන්සූර් ඔවුන්ගේ මුතුන් මිත්තන් මෙන්ම උපන් ව්‍යාපාරිකයෙකි. ව්‍යාපාර කිරීමද, මුදල් ඉපයීමද ඔහුගේ ලෙයෙහි අඩංගුව තිබූ දෙයකි.

මේ අතරතුර, දූන් වැල්ලවත්තේ වාසය කරන, යාපනයේ උපන් දමිළ

ගුරුවරයෙකු වන සරවනන් මහතාගෙන් හැම ඉරිදා උදෑසනකම මරදානේ ටියුෂන් පන්තියකදී ඔහු ඉංග්‍රීසි ඉගෙන ගත්තේය. පසුගිය දෙසතිය තිස්සේ, මන්සූර් ඔහුගේ අලුත්ම රැකියාව ලෙසින්, කෑමට හෝ විවේකයක් ලැබීමට වේලාවක් නොලැබම සරස්වතී ලොජ්හි වේටර්වරයකු වශයෙන් සේවය කරයි. ඔහුට මාසික ටියුෂන් ගාස්තුව ගෙවීමටද මුදල් එකතු කරගැනීමට සිදුවී තිබේ. ඔහුගේ වත්මන් ව්‍යාපාරය ඔහුගේ ඕනෑ එපාකම් ඉටුකර ගැනීම සඳහා නොසෑහෙයි. එහෙත් ඔහුට වෙනත් විකල්පයක් නැත. ඉංග්‍රීසිවලට හොඳ ලකුණු ලබා ගතහොත් ඔහුට හොඳ රැකියාවක් සොයා ගැනීමට හැකි වෙයි. ඔහු ඉගෙනීමද, රැකියාවද දෙකම එකට කරගෙන ගිය අතර, පෑන සහ කඩදාසි හැමවිටම තමා සමීපයෙහි තබාගෙන සිටියේය. වැඩකරමින් සිටින විට ඔහු තමා උගත් පාඩම් හිසෙහි තබාගෙන ඒවා සමාලෝචනය කරයි, එමෙන්ම ඔහු සිය ව්‍යාපෘතිය ගැනද සිතයි. ඔහු ක්‍රමයෙන් වැඩ බොහොමයක් එකවර කිරීමේ ප්‍රවීනතාව ලැබුවේය. සමහර අවස්ථාවලදී ඔහු සිංහල පාරිබෝගිකයන් සමග ඉංග්‍රීසියෙන් කතා කිරීමට උත්සාහ කළේය. ඔහුගේ පෙම්වතිය කජීදා හැරුණුකොට ඔහුගේ පවුලේ කිසිවෙක් ඉංග්‍රිසි කතා කළේ නැත. තමාගේ අලුත්ම පැවරුම නිවැරදි කිරීම සඳහා ඇයට පෙන්වීමට ඔහු අදහස් කොටගෙන සිටියේය.

සරවනන් සර් ඔහුගේ ජීවිතයේ වැදගත් කෙනෙක් බවට පත් වූයේය. හොඳ ලකුණක් ගැනීමට ඔහු සතුටට පත්කළ යුතු යැයි මන්සූර්ට හැඟී ගියේය. වරක් මන්සූර්, ඔහුගේ මංගල මුද්ද අය කිරීමකින් තොරව පොලිෂ් කර දුන්නේය. අනතුරුව මන්සූර්, ඔහුගේ දියණියන්ගේ විවාහවලට අවශ්‍ය රන් ආබරණ ජයසිංහ ජුවෙලර්ස් වෙතින් වට්ටමක් සහිතව ලබා දුන්නේය. තමාගේ අලුත්ම පැවරුමට හොඳ ලකුණු ඇතැයි මන්සූර්ට සහතිකය, මන්ද එය සරවනන් සර්ගේ හදවතට බොහෝ සමීප දෙයක් වන බැවිනි.

මේ ඉරණම් සහගත ඇසළ පුර පොහෝ දිනයේ, ඇසළ සඳ පායා ආවේ දෙහිවල ගුවන්පාලම උඩින් ඇති සුදුපැහැති වීදි ලාම්පුවක් මෙනි. විචිත්‍ර වර්ණ කලාමැදිරියන් අඳුර හරහා දිළිසුණේ රතු සහ නිල් පැහැති නියොන් ආලෝකය සේය. දෙහිවල අහසෙහි හදිසි ගිගුරුමක් ඇසිණි. 'මේ මිනිහ කොහේද මන්දා' පාරිබෝගිකයා එනතුරු බලා සිටින මන්සූර් අඳුරු මග දෙස බලමින් කීවේය.

කෝපත් මුහුණක් සහිත වෙහෙසුනු පෙනුමැති යාචකයෙක් අඳුරෙන් මතු විය. පදික වේදිකාවෙහි ගනකමැති කඩදාසි දෙකක් ඇතිරූ ඔහු ඒ මතට වැටී, සිය දෙපා දිග හැරගෙන මන්සූර් සමීපයෙහි නින්දට වැටුණේය. මන්සූර්ගේ සුදු කුර්තාවේ වාටියෙන් බේරී වැටෙන වැහි බිඳු යාචකයාගේ කමිසයෙහි අවලක්ෂණ රවුම් රටා මැවුවේය.

'ටිකක් එහාට වෙන්න පුළුවන්ද?' ඔහු කාරුණිකව යාචකයාගෙන් ඉල්ලා සිටියේය.

'නෑ මට බෑ' යාචකයා ඔහුට කෑ ගෑවේය.

'මේ මං නිදාගන්න තැන, මං හැමදාම මෙතන නිදාගන්නවා' ඔහු බෙරිහන් දුන්නේය. මන්සූර්ට සාප්පු කඩතුරාව යට ඉන්නට කුඩා ඉඩක් පමණක් තබා, යාචකයා ඉඩකඩ අහුරා තවත් තල්ලු වූයේය.

'ඉතින් මට මොකද? මේ මං වැඩකරන තැන' මන්සූර් පෙරලා කෑ ගෑවේය.

'මං හිතනවා ඔහේ රෑට වැඩ කරන්නේ නෑ කියලා' යාචකයා නැවත කෑ ගසා ඔහුගේ දෑස් තදකොට පියා ගත්තේය.

මන්සූර්ට පිළිකුලක් දැනුනේය. පිළිකුල් සහගත යාචකයකු සමග තර්ක කිරීමට ඔහුට වුවමනා නොවීය.

ඔහු යාචකයා සිටි තැනින් තවත් මෑත් වී සිය පමා වී පැමිණෙන පාරිබෝගිකයා එනු ඇතැයි පාර දෙස බලා සිටියේය. වැස්ස තුරල් වන ලකුණක් පෙනෙන්නට නැත. වර්ෂාව ගැන තැකීමකින් තොරව යාචකයා ඉක්මනින් නින්දට වැටුණේය. ගාලු පාරේ ශබ්දය අඩුවෙමින් තිබිණි.

'ඩප්පන් ගංග්නම් ස්ටයිල්, ඩප්පන් ගංග්නම් ස්ටයිල්' මන්සූර්ගේ ජංගම දුරකතනය මහ හඬින් නද දෙන්නට විය. 'මන්සූර් ඔයා ගෙදරද?' කජිදා දුරකතන මගින් විමසා සිටියාය.

'මං තාම සාප්පුවේ' ඔහු වැහි වතුර බේරෙන ඔහුගේ මුහුණ පිස දැමුවේය. 'විනාඩි දහයකින් මම බෝඩිමට යනවා. මං කස්ටමර් කෙනෙක් එනකම් ඉන්නේ එයාගේ වළල්ල බාර දෙන්න.' වර්ෂාව සමග සටන් කරමින්, ඔහු හඬනගා කෑ ගෑවේය.

'මිනිහා..'

'මොකද්ද? ඒක හයියෙන් කියන්න පුළුවන්ද?' කජීදා ඇසුවාය.

'ඒ මිනිහාට අද වළල්ල ඕන. මං තව විනාඩි පහක් බලලා ගෙදර යනවා.' ඔහුගේ හඬින් නිදිමතෙහි සිටි යාචකයාට බාධා වූයෙන් යාචකයා ඔහු දෙස රවා බැලුවේය. මන්සූර් ඔහුගේ ගොරෝසු අත්ලෙන් වළල්ල පිරිමැදි අතර, ඔහුට යාචකයාගේ මුහුණ හරහා පහරක් ගැසීමට වුවමනා විය. එහෙත් ඒ වෙනුවට රන් වළල්ලෙහි තිබුණු සංකීර්ණ කැටයම් අල්ලා බැලුවේය. ඔහු ඇගේ අත් අල්ලා නොතිබුණු නමුත් ඒවා කජීදාගේ අත් මෙන් සිනිඳු ඒවා විය. මේ වළල්ල නීත්‍යානුකූල දැවැදි මුදලක් ලෙසින් කජීදාට ලබන වසරේ විවාහ වන දිනයේදී දිය හැකි නම් මැනවැයි ඔහු සිතුවේය. එහෙත් සොරකම් කරනු හැර,එවැන්නක් මිල දී ගැනීමට ඔහුට මුදල් නැත.

'මංගල්ලෙ හෙට, නැකැත් වෙලාව තියෙන්නේ උදේ හතට' දවසේ හත්වැනි පාරිබෝගිකයා, එනම් මනාලයා විය හැකි පුද්ගලයා ඔහුට කීවේය. මන්සූර් අවංක පුද්ගලයකු ලෙසින් පෙනී ගිය බැවින්, කාරුණික පාරිබෝගිකයෝ සිය වටිනා භාණ්ඩ ඔහු ළඟ තබා යාමට ඔහු කෙරෙහි විශ්වාසය පළ කළහ.

ඔහුගේ අවලස්සන කුරුලෑ කැලැල් වසා තබන, කළු කැරලි සහිත දිගු රැවුලක් ඔහුට තිබිණි. එය පෙනුණේ සොල්දාදුවකු සිය හකු පාඩාවෙහි ඇති තුවාලයක් වෙළුම් පටියකින් ඔතා ඇත්තාක් මෙනි. ඔහුද ඔහුගේ සුවඳ විලවුන් බෝතලය තරමටම සිහින්ය. සිහින් ශරීර නියම වයස පෙන්නන්නේ නැතැයි ඔහු සිතුවේය. එය හරියට ඔහුගේ මුහුණ ඔහුගේ සැබෑ වේදනාව නොපෙන්වන්නාක් මෙනි. ඔහුගේ තියුණු නාසය, විසල් ඇස් සහ රතු දෙතොල් පාරිබෝගික කාන්තාවන් ඔහු කෙරෙහි ආකර්ශනය කොට ගනියි. බොහෝ මුස්ලිම් ස්ත්‍රීපුරුෂයින් කරන්නාක් මෙන් ඔහු සිය දෑස් කළු පැහැති අඳුන්වලින් සැරසුවේය. එයින් ඔහුගේ ඇස්වලට සිසිලසද, සන්සුන් බවද ලබා දෙයි. ඔහුගේ ඇඳුම වූයේ හිස මත බලහත්කාරයෙන් තැබූ බිත්තර ආප්පයක් වැනි සුදු තොප්පිය සහ සුදු කුර්තාව හා පිජාමාවයි. ඔහු එය මඟුලට, මරණයට, හලාල් කෑම සොයාගෙන යන වෙළඳපොළට ආදී වශයෙන් හැමතැනම ඇන්දේය. ඔහුට ලංකාවේ ජීවත්වන අරාබිකාරයකු මෙන් පෙනුමක් ඇත.

ඔහු සුවඳ විලවුන් බෝතලය තැබූ ඉදිරි සාක්කුවේ පැල්ලමක් වැනි ලකුණක් තැබුවේය. එහි වූ තෙල හැමවිටම කුර්තා කමිසයට වැහුණේය. මිනිසුන් සමහර විට සිතුවේ ඔහු බෝම්බයක් තබන්නට තැත් කළ ත්‍රස්තවාදියකු බවයි. හෙතෙම ඇෆ්ගනිස්ථානයේ බෞද්ධ ප්‍රතිමාවන්ට බෝම්බ හෙළූ තලෙබාන්වරයා වැනි ත්‍රස්තවාදියකු බවය. 'ඒක විකාරයක්. මට මැද පෙරදිග ඒ වගේ කවුරුවත් එක්ක කිසිම සම්බන්ධයක් නෑ' පාරිබෝගිකයකු සිය සැකය පිළිබඳව ඔහුට සරදම් කළ අවස්ථාවේදී වරක් ඔහු සිනා මුහුණෙන් කීවේය. 'ඔයා හැමතිස්සෙම වැඩ කරන්න බැටරියයි, වයරුයි එක්ක' මිනිසා නැවත කීවේය. 'හොඳයි ඔහේට මුද්ද පොලිෂ් කරගන්න ඕනද නැද්ද' මන්සූර් පෙරලා ඇසුවේය.

වේලාව හරියටම පස්වරු 9.15 විය, එහෙත් රාත්‍රිය පෙනුණේ මධ්‍යම රාත්‍රිය ලෙසිනි. මන්සූර් ඔහුගේ කලිසම් සාක්කුවට අත දමා ඔහුගේ විලවුන් බෝතලය අතට ගත්තේය. සුවඳ විලවුන් බිඳක් සිය මැණික් කටුවට දමා එය අතගා ඔහුගේ ඇඟිලිවලින් රැවුල පීරාගෙන හොඳින් පිරිමැද්දේය. ඔහුගේ රැවුල දූන් සමන් පිච්ච සුවඳ හමන්නට විය. උදාසීන කමින් පෙළුණු හෙතෙම මුදල් පසුම්බිය ගෙන මුදල් ගණන් කළේය. ඔහු මුදල් නෝට්ටු පිළිවෙලකට තැබුවේය. අනතුරුව ඔහු සිය පිටුපස සාක්කුවේ රෝල් කර දමා තිබූ කඩදාසි ගොන්නක් ගත්තේය. ඔහු කියවන්නට උත්සාහ කළ නමුත්, වීදි ලාම්පු අඳුරු එළියකින් දල්වුණු නිසා එය කළ නොහැකි විය. ඔහු සිය දුරකතනය ගෙන එහි විදුලි පන්දම දල්වන්නට උත්සාහ කළේය. වේලාව රාත්‍රි 9.40 විය. 'ෂෙහ්.' ඔහු ප්‍රමාද වන පාරිබෝගිකයාට දොස් තැබුවේය. වැහිවතුර ඔහුගේ සිරුරින් බේරුණේය. රාත්‍රිය වඩා අන්ධකාර විය.

'ඩප්පන් ගංග්නම් ස්ටයිල්' නැවත ඒ කජීදාය.

'මං එනවා' ඔහු කෝපාවිෂ්ටව දුරකතනයට කෑ ගසා එය ක්‍රියාවිරහිත කළේය. පාරිබෝගිකයා පැමිණෙන තුරු බලා සිටීමෙන් ඔහු හෙම්බත්ව සිටියේය. දුරකතනයෙන් නපුරු අන්දමින් කතා කිරීම ගැන ඇය කෝප වනු ඇතය යන්න ගැන ඔහු සැලකිලිමත් නොවූයේය. වතුරෙහි පෙඟී සිටින යාචකයා තද නින්දේ සිටියි. මන්සූර්ද හොඳටම තෙමී සිටියේය. ඔහුගේ වතුරෙන් පෙඟී ගිය කුර්තාව අතරින් දූන් මන්සූර්ගේ රතු පැහැති යට ඇඳුම දැකිය හැකිය.

10.15 යි. දීප්තිමත් කහ පැහැති එළියක් ඔහුගේ සිරුරට පතිත විය. ඔහු වෑන් රථයක් පැමිණෙනු දුටුවේය. ඔහු ළඟට පැමිණෙන සුදු වෑන් රථය දෙස බැලුවේය. රථයේ ඉදිරිපස පහන් එළියෙන් ඔහුගේ රතු පැහැති යට ඇඳුම මිරිස් කරලක පැහැයෙන් දිස් වෙයි.

'හ්ම්... අන්තිමටම' ඇඟිලිවලින් සිය රැවුල පීරමින් ඔහු තමාටම කියා ගත්තේය. සම්පූර්ණයෙන්ම තෙමී සිටි මන්සූර් කෝපයට පත්ව සිටියේය, ඔහු වර්ෂාව මැදින්ම වෑන් රථය වෙත ගමන් කළේය. මිනිසුන් දෙදෙනෙක් වෑන් රථයෙන් බැස ගත්හ. මන්සූර්ට ඔවුන්ගේ මුහුණු දැක ගැනීමට හැකිකම තිබිණි. මිනිසුන් දෙදෙනාගෙන් එක් අයෙක්වත් ඔහුට වළල්ල දුන් පුද්ගලයා නොවීය. මේ වෙනත් මිනිසුන් දෙදෙනෙකි, එක් අයෙක් උසය, අනෙකා කොටය.

'අඩෝ තම්බියා' ඔහු වෙත ළඟා වෙද්දීම, කෝපාවිෂ්ට සිංහයින් මෙන් ඔවුහු කෑ ගැසූහ. 'මොනවද උඹ මේ වෙලාවෙ කරන්නේ?' ඔවුහු ඔහු සෙල්ලම් බඩුවක් මෙන් ඇද මුහුණට ගැසූහ.

මන්සූර් පාර දෙසට දුවන්නට වූයේය. දිගු කොණ්ඩයක් තිබූ උස මිනිසා, ඔහු පසුපස දිවගොස් කමිස කොලරයෙන් අල්ලා ගත්තේය. මන්සූර් ඔහුගේ අත ගසා දැමුවේය. එහෙත් මිනිසා ශක්තිමත් වූයේය. ඔහු මන්සූර්ගේ අත ඇද අල්ලාගෙන එය ඇඹරුවේය. සිහින් රැවුලක් තිබූ අනෙක් කොට මිනිසා, මන්සූර්ගේ රැවුලෙන් ඇද මුහුණට ගැසුවේය.

මන්සූර් උදව් ඉල්ලා කෑගැසුවේය. රතින් නැහැවී, ඔහු දෙස බලා සිනාසෙන ඓශ්වර්යා රායිගේ විශාල දැන්වීම් පුවරුව හැරෙන්නට අන් කිසිවෙක් නැත. සිය තෙත ගත කඩදාසියෙහි වැතිර බාගයට වසාගත් ඇසින් යාචකයා මේ සම්පූර්ණ දර්ශනය බලා සිටියේය.

'කරුණාකරලා මාව අතාරින්න' මන්සූර් දෑත් එක්කොට අනුකම්පාව අයැද සිටියේය. 'කරුණාකරලා' ඔහු සිව් වරක් එම වචනය කීවේය. උස මිනිසා ඔහුගේ කමිසයෙන් ඇද්දේය. මන්සූර් ඔහු තල්ලු කර දමා පලා යන්නට උත්සාහ කළද, කොට මිනිසා මන්සූර්ගේ වම් දණහිසේ පසුපසට පයින් ගැසුවේය. ඔහු ඇද වැටුණේය.

'අල්ලාහු අක්බාර්' මන්සූර් වේදනාවෙන් කෑගෑවේ දෙවියන්ගේ මැදිහත් වීමක් අපේක්ෂාවෙනි. 'අල්ලාහු අක්බාර්' කියමින් ඔහු නැඟී

සිටින්නට තැත් කළේය. 'මාව අතාරින්න' ගාලු පාරේ නිහඬතාව බිඳ දමමින් ඔහු කෑ ගැහුවේය. 'මං මොකද්ද කළේ? කවුද ඔහේලා ?'

ඔවුහු, ඔහුගේ තොප්පිය උදුරාගෙන එය ඈතට වීසි කළහ. තොප්පිය, සුදු පැහැති බුද්ධ ප්‍රතිමාව පාමුල වැටුණේ, පූජා කළ අරලිය මලක් පරිද්දෙනි. 'උඹලා මොකද කරන්නේ?' යි මන්සූර් කෑ ගැහුවේය.

ඔවුහු, ඔහු ඇද ශරීර පරීක්ෂාවක් කිරීමට උත්සාහ කළහ. 'මාව අල්ලන්න එපා' මන්සූර් ඔවුන් තල්ලු කිරීමට උත්සාහ කළේය, එහෙත් මිනිසුන් දෙදෙනා ඔහුට වඩා ශක්තිමත් වූයේය. ඔවුන් ඔහුගේ කුර්තාව ඉරා, නැවත මුහුණට පහර එල්ල කළහ. 'අල්ලා' මන්සූර් වේදනාවෙන් නැවෙමින් කෑ ගැහුවේය. ඔවුහු මන්සූර් සුදු වෑන් රථය වෙත ඇදගෙන ගියහ. මන්සූර් ඔවුන්ට පයින් ගැසීමට තැත් කළේය, එහෙත් ඔවුහු, ඔහු තල්ලු කළහ. ඔහු වෑන් රථයට දමා ගත් ඔවුහු ඔහු පිටුපස අසුනට තල්ලු කළහ.

'උඹලා කවුද?' මන්සූර් අසරණව කොඳුළේය.

'අපේ ප්‍රශ්නෙට උත්තර දීපන්. මේ වේලාවෙ එළියෙ උඹ මොනවද කරන්නෙ?' උස මිනිසා අණ දුන්නේය.

'ඇයි මං උත්තර දෙන්නෙ?'

ඔවුහු, ඔහුගේ ගෙල මිරිකූහ.

'මං බලා හිටියා'

'බලා හිටියා ?'

'ඔව් බලා හිටියා' මන්සූර් පෙරලා කීවේය.

'බලා හිටියේ මොකටද?'

'ඒක උඹලගේ වැඩක් නොවෙයි'

'ඔව් ඒක අපේ වැඩක් තමයි. ඒක අපේ... වැඩක් තමයි' කොට මිනිසා මන්සූර්ව ඔහුගේ රැවුලෙන් ඉදිරියට අද්දේය. ඇසට ඇස, නැහැයට

නැහැය, නිකටට රැවුල, අනතුරුව ඔහුගේ දකුණු කම්මුලට ගැසුවේය. රැවුල නිසා ඔහුට මන්සූර් හොඳින් අල්ලාගත හැකි විය, මන්සූර් අසරණ වූයේ, උගුලකට අසුවූ මීයෙකු සේය.

වෑන් රථයෙහි වූ ගුවන් විදුලියෙන් ජනප්‍රිය හින්දි ගීයක් වාදනය වෙමින් තිබිණි. 'ඕ ප්‍රියා... ප්‍රියා...' මන්සූර් නිවසේදී චිත්‍රපටය බලා තිබේ, නළුවා ඔහුගේ අහිමි වූ ආදරය වෙනුවෙන් වැලපෙමින් ගීය ගායනා කරයි. හදිසියේ, මුළු වෙලාවෙහිම නිහඬව සිටි රියැදුරා ගුවන්විදුලි යන්ත්‍රය ක්‍රියා විරහිත කළේය. වෑන් රථය නිහඬ වූයේ මුස්ලිම්වරු දිනකට පස්වරක් අසාන් (AZAN) ඇසෙන විට නිහඬව සිටින්නාක් මෙනි.

ඒ නිහඬතාව මැද මන්සූර් බිය නොවී ප්‍රශ්නයක් ඇසුවේය.

'ඔයගොල්ලො පොලිසියෙන්ද?'

'නෑ' රියැදුරා පිළිතුරු දුන්නේය. ඔහුගේ රතු ඇස්බෝල මුහුණෙන් එළියට පනින්නට ආසන්නව තිබිණි.

'එහෙනම් ඔයගොල්ලො කවුද?'

'මේ ඉඩමේ අයිතිකාරයො' තිදෙනාම කීහ.

'අයිතිකාරයො. මාත් අයිතිකාරයෙක්' මන්සූර් පිළිතුරු දුන්නේය.

'උඹ අයිතිකාරයෙක් නෙවෙයි' උස මිනිසා නැවත පහර දුන්නේය. මෙවර ඔහුගේ නැහැයෙන් ලේ ගලන්නට විය. 'අල්ලා, මට පිහිට වෙන්න' මන්සූර් ඉකිබින්දේය.

'බලන්න මේකගෙ රැවුල, පිළිකුල්' උස මිනිසා අනෙක් දෙදෙනාට කීවේය.

'ඔය ගොල්ලො මාව දන්නෙ නෑ'

'අපි දන්නවා' තමාගේ තට්ට හිස කසමින් කොට මිනිසා කීවේය. 'අපිට පෙන්නපන් හැඳුනුම්පත' ඔහු කීවේය.

'ඇයි මං පෙන්නන්නේ?'

'වහපන් කට. දූන් දීපන් හැඳුනුම්පත' උස මිනිසා ඔහුගේ කෙස්සේන් ඇද්දේය.

මන්සූර් කෝපයෙන් ඔහුගේ මුහුණට කෙළ ගැසුවේය.

'උඹ ගඳ බල්ලා' කොට මිනිසා යළි ඔහුගේ ගෙල මිරිකුවේය.

'ඒක ගනින් එලියට' උස මිනිසා නැවත ඔහුගේ රැවුලෙන් ඇද බලහත්කාරයෙන් ඔහුගේ පසුම්බිය ඇද අතට ගත්තේය. ඔවුහු, ඔහුගේ අනෙක් සාක්කුද ඇද බලා, ශ්‍රී ලංකා ජාතික හැඳුනුම්පත, සයනයිඩ් කරලක් මෙන් පෙනුණු කුඩා වීදුරු බෝතලයක්, රුපියල් අටසිය විසි පහත්, වැඩ නොකරන ජංගම දුරකතනයත්, පොඩිවුණු කඩදාසි රෝලක් හා රන් වළල්ලක් සොයා ගත්හ.

'මේ මොකද්ද?' කොට මිනිසා කඩදාසි දිග හැරියේය. අනෙකා වළල්ලද, දුරකතනයද ගෙන සිය පසුම්බිය තුළ දමා, හැඳුනුම්පත කියැවූයේය.

මන්සූර් කඩදාසිය උදුරා ගන්නට උත්සාහ කළේය. උස මිනිසා ඔහු අසුනට තල්ලු කර දමා, ඔහුගේ හැඳුනුම්පත කියවීමට පටන් ගත්තේය. ''නම, මන්සූර් අලි ෆක්රුඩීන්. උපන්දිනය 1982 සැප්තැම්බර් 12, උපන් ස්ථානය යාපනය''.

''යාපනය!'' අනෙක් මිනිසුන් දෙදෙනා එකිනෙකා දෙස බැලූහ.

'මං ඒක දූනගෙන හිටියා. යාපනේ තම්බියෙක්' කොට මිනිසා රථයේ වීදුරුවට ගැසුවේය.

තවත් දිගු නිහඬතාවක් වෑන්රථය තුළ පැතිර ගියේය.

'අපේ ඉඩමෙ උඹ මොනවද කරන්නෙ?' රියැදුරා විමසුවේය. හැඳුනුම්පත ගත් මිනිසා මන්සූර්ගේ මුහුණට නැවත ගැසුවේය. දෙවියන්ට කැප කළ එළුවකු ලෙසින් මන්සූර් මූර්ඡා වූයේය.

ඔහු සිහිය ලැබූ විට මිනිසුන්ගෙන් කෙනෙක් ඔහු සොලවමින් කෑගසනු දුටුවේය. 'නැගිටපන් අවජාතකයා'

'මේ මොකද්ද?' උස මිනිසා ඇසුවේය.

'ලියුමක්' ඔහු බොහෝ දුර්වලව සිටියෙන්, මන්සූර්ට කතා කිරීමට අපහසු විය.

'ආදරණීය ප්‍රභාකරන්' මිනිස්සු ලිපියේ පළමු පේළිය කියවූහ.

'ප්‍රභාකරන්?' ඔවුහු තැතිගත්හ. 'ආදරණීය ප්‍රභාකරන්, මේ මොන හරුපයක්ද? අවජාතකයා' මිනිස්සු ඔහුට යළි පහර දුන්හ. 'උඹ ඔත්තුකාරයෙක්ද?' උස මිනිසා ඔහුගේ කට බඳින්නට කිසිවක් ඇද්දැයි වැන් රථය සිසාරා බැලුවේය. රියැදුරු අසුන පිටුපස ඉරීගිය අසුන් පටියක් තිබෙනු ඔහු දුටුවෙන්, ඔහු කෝපයෙන් එය ගෙන, එයින් මන්සූර්ගේ කට බඳින්නට උත්සාහ කළේය. මන්සූර් එයින් බේරෙන්නට දඟලුවේය. උස මිනිසා, ඔහුගේ කෙස්සෙන් ඇද ඔහුගේ හිස එක් අතකින් පසුපසට තල්ලු කර, අනෙක් අතින්, ඔහුගේ මුව පටියෙන් බැඳ දැමුවේය. ඔහුගේ තොල් ලියුම් කවරයක් මෙන් එකිනෙක ඇලී තිබිණි. අනතුරුව උස මිනිසා, ජාතික රූපවාහිනියේ ප්‍රවෘත්ති කියවන්නෙකු මෙන් සටහන හඬ නගා කියැවූයේය.

'කොහොමද වාසෙදේසෙ ප්‍රභාකරන් මහත්තයා? හිතනවා ඔබ නිරෝගීව ඉන්නවා කියලා. කොහොමද ඔබේ පවුලේ අය? ඔබේ බිරිඳට දරුවන්ට මගේ ආදරය පිරිනමන්න. ඉතින් ප්‍රභාකරන්, ඔබ මවිතයට පත්වෙනවා නම් මා කවුදැයි කියා සහ ඇයි මා මේ ලිපිය ඔබට ලියන්නේ කියා. මම කොළඹින් මන්සූර්, ඒත් සැබැවින්ම මම යාපනයේ කෙනෙක්. මම ඔබට මෙය ලියන්නේ ඔබ මගේ වීරයා නිසයි. මිනිස්සු ඔබ හඳුන්වන්නේ ත්‍රස්තවාදියෙක් කියායි. දමිළයන් වුණත්, ඔබේ ලේ ඇති දමිළයන් වුණත් ඔබට වෛර කරනවා විය හැකියි. මම එය එසේ සලකන්නේ නෑ, මොකද මට නම්, ඔබ දිරිමත් මිනිහෙක්. ඔබ දශක තුනකටත් වැඩි කාලයක් ශ්‍රී ලංකාවේ යුද්ධයක් ගෙනියනවා. මෙය ඔබ කරන්නේ කොහොමදැයි මම හැබෑවට දන්නේ නෑ. තෝරාපත් කරගත් ජනාධිපති කෙනෙක් බඳුව නොබියව ඔබ මේ යුද්ධය ගෙනියන්නේ කෙසේද? බලවත් රජයක් ඇති රටකට එරෙහිව ඔබ සටන් කරන්නේ කෙසේද?

කොට මිනිසා, උස මිනිසාගෙන් ලියුම උදුරාගෙන එය නිහඬව කියවන්නට වූයේය. මන්සූර් ඔවුන් දෙස බලා සිටියේය, ඔවුන් ඔත්තු

කරුවෙක් සොයාගත් බව සිතන්නේය යන්න ඔහුට සහතිකය, එල්ටීටීයට සේවය කරන මුස්ලිම් ඔත්තුකරුවෙක්.

'පේන්නේ එයාට ප්‍රභාකරන් එක්ක කෙළින්ම සම්බන්ධකම් තිබිලා තියෙනවා කියලයි' රියැදුරා කීවේය.

'මම දන්නවා' ලිපියට උඩින් බලමින් කොට මිනිසා පිළිතුරු දුන්නේය.

'මම ඒක දැනගෙන හිටියා. මේ මුස්ලිම් එවුන්. පිළිකුල්. මුන් ඔක්කොම ද්‍රෝහියො. ඔක්කොම අරින්න ඕන සවුදියට.' උස මිනිසා කීවේය.

'සවුදි අරාබියට' රියැදුරා එකඟ වූයේය. 'කාරණයක් නැතුව මිනිස්සු එල්ලන රටට'

මන්සූර්ට ඔවුන්ට ඇත්ත කීමට වුවමනා විය, එහෙත් ඔහුගේ මුව වටා තරව බැඳ තිබූ අසුන් පටිය නිසා කිසිවක් කළ නොහැකි විය. ක්‍රමයට විරුද්ධව අභියෝග කළ ගන රැවුලක් තිබූ ප්‍රභාකරන්ගේ ධෛර්යය තමාට තිබුණේ නම් යැයි ඔහු සිතුවේය. ප්‍රභාකරන් මෙන්ම ඔහුගේ ප්‍රියතම දකුණු ඉන්දීය චිත්‍රපට නළු කමල් හසන් බඳුව විසල් රැවුලක් වවන්නට මන්සූර් කැමති විය හැකිව තිබිණි. පුත්තලම සහ බේරුවල කඳවුරුවලදී ඔහු, කමල් හසන්ගේ සියලුම චිත්‍රපට නරඹා ඇත. අද ඔහු කිසිදු චිත්‍රපටයක් බලන්නේ නැත, ඒ චිත්‍රපට බැලීම තහනම් බැවිනි, එමෙන්ම චිත්‍රපට බැලුවහොත් ඔබට දෙව්ලොවට ඇතුළත් විය නොහැකි වෙයි. 'ඒයි අවජාතකයා. අපි හරි. අපි දැනගෙන හිටියා උඹ කවුද කියලා  අපි හරි අපි හරි' උස මිනිසා සිය මිට මෙලවූ අතින් වහලයට ගැසුවේය.

ආයාචනාත්මක ශබ්ද නගමින් මන්සූර් සිය හිස ඒ මේ අතට හැරවූයේය. තිස් වසරකට පෙර, තමා යාපනයේ උපන් බවත්, විසල් නිවසක දෙමාපියන් හා බාල නැගනියන් දෙදෙනෙකු හා ජීවත් වූ බවත් ඔවුන්ට කීමට ඔහුට වුවමනා විය.

කොට මිනිසා ලිපිය හඬනගා කියවමින් සිටියේය. 'අප දෙදෙනාම

උපන්නේ එකම රටේයි ප්‍රභාකරන් මහතාණනි. එහෙත් අප එක්ව ජීවත් නොවන්නේ ඇයි? ඔව්, ඔබ මා සහ මගේ පවුලේ අය මා උපන් ගමින් එළවා දැමුවේය, එහෙත් ඔබ අප මරා දැමුවේ නැත. ඔබ යුද්ධ කළේ ඔබගේ ජනතාව වෙනුවෙනි. ඔබ නිර්භීත විය. ඔබ වැනිවමම මගේ ජාතිය වෙනුවෙන් සටන් කිරීමට මට ශක්තිය තිබුණේ නම් මැනවයි මම සිතනවා. ඔබ ඔබේ ජනතාවටත්, අපේ රටටත් මහඟු සම්පතකි. අපට එකතු වී සටන් කළ නොහැකි ඇයි?

'බයක් නැතුව කියන හැටි' උස මිනිසා ඔහුගේ කම්මුලට පහර දුන්නේය.

'ඒත් ප්‍රභාකරන් මහතාණනි, මේ සටන වටිනවාද?' මිටි මිනිසා කියවීම කරගෙන යයි. 'අපි සටන් කරන්නේ ඉඩම් කෑල්ලකට නොවේද ප්‍රභාකරන් මහතාණනි? මා වැරදි නම් නිවැරදි කරන්න. මා ඔබගේ පුතා වගෙයි, තවමත් ලෝකය ගැන ඉගෙන ගනිමින් ඉන්නවා. අපි එකිනෙකා සමග සටන් කරන්නේ ඇයි? ඒ බලය වෙනුවෙන්ද ප්‍රභාකරන් මහත්මයා? මට කියන්න බලය අපට සතුට ගෙන එන්නේ ද? නැතහොත් අප සටන් කරන්නේ භූමිය සඳහාද? භූමිය අපට සතුට ගෙන එන්නේ නම්, මගේ ආදරවන්තියගෙන් මට දායාදය ලෙස බේරුවල මුහුද අද්දරින් පර්චස් තිහක භූමියක් ලැබේ. ඒත් මා තවමත් සතුටින් නොවේ. ප්‍රභාකරන් මහතාණනි, අතීතයේදී බලය ඇතිව ලෝකය පාලනය කරන ලද බොහෝ මිනිස්සු සිටියහ. මම විවිධ පාසල් අටකදී, ඉතිහාස පාඩමේදී එය ඉගෙන ගත්තෙමි. ඒ බලවත් මිනිසුන් අද ජීවත් වන්නේද? නැත. ලෝකයේ රටවල් සිය ගණන් ඇත, එහෙත් අප මේ රටෙහි උපන්නේ කුමන හේතුවකටද? මා එසේ උපදින්නට තීරණය කළාද? ඔබ එසේ උපදින්නට තීරණය කළාද? නැත, මා මේ භූමියට ආදරය කරන්නේ මා එහි උපන් නිසාය. ඔබ සම්බන්ධයෙන්ද හේතුව එය විය හැකිය. මේ භූමියේ අප කරන්නට කැමති දෙයක් කිරීමට අපට අයිතිය තිබිය යුතුය. එය අපගේ භූමියයි'

'අපට විරුද්ධව යුද්ධයක් කරන්න සැලසුම් කරනවා... ආ?' උස මිනිසා ඔහුගේ මුවින්, අසුන් පටිය ඇද්දේය.

'මට රිද්දන්න එපා... කරුණාකරලා' මන්සූර් අමාරුවෙන් කතා කළේය. 'මට ඔහු සමග සම්බන්ධයක් නෑ. මං කියන්නේ ඔහු දැනටමත්

මැරිලා. යුද්දේ දැන් ඉවරයි, ඇයි ඔය ගොල්ලො මට වද දෙන්නෙ? මට යන්න දෙන්න'

'වහපන් කට!' උස මිනිසා තර්ජනාත්මක අත එසවූ විට මන්සූර් නිහඬ වූයේය.

කොට මිනිසා ලිපිය කියවාගෙන යයි. 'ප්‍රභාකරන් මහතාණනි, අප කරගෙන යන මේ යුද්ධය සැබවින්ම වටිනවාද? අප දවසක මිය ගිය විට, අපට සෙවන දෙන්නේ සොහොන පමණකි. එය ඉතා කුඩා ඉඩක් පමණකි. එසේ නොවේද? එදාට අපට කතා කළ හැකි නම්, මේ පොළවේ ජීවත්වන මිනිසුන් ලෙයින් සටන් කරමින් ජීවත්වීම ගැනද, අපගේ කාලය අපතේ යැවීම ගැනද නිසැකයෙන්ම අප, අපටම දෝෂාරෝපණය කරගනු ඇත. ප්‍රභාකරන් මහතාණනි, දැනට මෙපමණයි. ඔබට නිරෝගි සුවයත්, සතුටත් ප්‍රාර්ථනා කරමි. මනුෂ්‍යයන් වන අප ජීවිතයේ බලාපොරොත්තු වන්නේ එයයි. එබැවින් මම ඔබට එය ප්‍රාර්ථනා කරමි. නිරෝගී බව හා සතුට. ඔබගේ,

අවංක මන්සූර්.'

අවසාන පේලියේ යෙදූ ලොප් ලකුණ සම්බන්ධයෙන්, ඔහුගේ උපන් බිමෙහි අයිතිය සම්බන්ධයෙන් වූ සැකය බඳු සැකයක් තිබිණි.

'උඹට දොස් කියන්න බෑ. දෙමලුන්ටයි, මුස්ලිමුන්ටයි අපේ රටේ ජීවත්වෙන්නයි, අපේ ගෑනුන්ට උන් කසාද බඳින්නයි දුන්නට දොස් කියන්න ඕන අපේ තාත්තලට' මිටි මිනිසා කලකිරීමෙන් කීවේය.

ලිපිය අවසන් විය. එහෙත් ලිපියෙන් පසු තව පිටුවක් තිබිණි. සරවනන් ඉංග්‍රීසි මධ්‍යස්ථානය, මරදාන, ව්‍යාපෘති අංක 2 ඃ ඔබේ කල්පිත වීරයාට ලිපියක් ලියන්න. වචන ප්‍රමාණය 800. ඉදිරිපත් කළ යුතු දිනය සති දෙකකින්.

ඔවුන්ගේ මුහුණුවල ඇඳී ගිය වැටහීම දෙස මන්සූර් බලා සිටියේය. ලෝකයට සාමය ගෙන ආ මුහම්මද් තුමා ගැන, හෝ දිවයිනට සාමය ගෙන ආ මහින්ද රාජපක්ෂ ගැන ලියන්නට ඔහුට ඉඩ තිබිණි. එමෙන්ම සිය පවුලට සාමය ගෙන එන්නට සිය ආත්ම ගරුත්වය කැප කළ තමාගේ පියාණන් ගැන ලියන්නට ඉඩ තිබිණි. ඒ සියලු දෙනා ඔහුගේ වීරයෝය.

මේ ඔහුගේ ඉංග්‍රීසි පාඩමේ ගෙදර වැඩ විය. ඔහු සමත් විය යුතු විය. සරවනන් සර් ප්‍රභාකරන්ට කැමති බව ඔහු දැන සිටියේය. මෙසේ ලිවීමෙන්, ඔහුගේ වැරදි නොසලකා හැර සරවනන් සර් තමාට සම්පූර්ණ ලකුණු දෙනු ඇතැයි ඔහු සිතුවේය.

'පිස්සු' මිනිස්සු එකිනෙකා දෙස බැලූහ. 'වෙලාව නාස්ති කිරීමක්' එහෙත් ඔවුන් දැන් සමාව දෙන්නේ කෙසේද? එය පරාජයක් විය හැකිය. එය ලැජ්ජා සහගත පරාජයක් වනු ඇතැයි ඔහු දැන සිටියේය. ඔවුහු බහුතර කණ්ඩායමේ සිටි අතර, ඔහු සිටියේ සුළුතරයෙහිය. ඔවුන් සමාව දෙන්නේ කෙසේද? ඔවුහු කඩදාසිය ගුලිකර කවුළුවෙන් පිටතට වීසි කළහ. තෙත් ගාලු පාරෙහි සුදු කඩදාසි විසිර ගියේය. බෞද්ධ පිරිතක තැටියක් නිහඬතාව බිඳ හෙළුවේය. ඒවායේ අදහස කුමක්දැයි කිසිවකුට තේරුම් ගියේ නැත, පිරිත් කියැවූයේ නැති වී ගිය භාෂාවක් වන පාලි භාෂාවෙනි. සමහර වෙලාවන්හි ශබ්ද විකාශන යන්ත්‍ර භාවිත කිරීම තහනම් කළ නීතිය ඇතුළත් උසාවි නියෝගය තිබියදී, පිරිත නිහඬතාව බිඳ හෙළුවේය. එහෙත් සිංහල බෞද්ධ බහුතරය ප්‍රශ්න කරන්නේ කවුරුන්ද? ඔවුහු නීති හදති, ඒවා කඩති' යි මන්සූර් සිතුවේය.

කුපිත වූ මිනිස්සු ඔහුගේ පසුම්බිය ලයිටරයෙන් පුළුස්සා එය කවුළුවෙන් පිටතට වීසි කළහ. කොට මිනිසා ඔහු වෑන් අසුනේ බැඳ මූණට කෙළ ගැසුවේය. කෙළ, ඔහුගේ රැවුලෙහි පොල් පුඩිමක් වැනි ගන සුදු තට්ටුවක් සෑදුවේය. උස මිනිසා ඔහුගේ ගෙල ඇද, පිහියකින් මන්සූර්ගේ රැවුල කැපුවේය. රියදුරා ඔහුගේ මුහුණට වාහන සෝදන දියර ඉස, රළු රේසරයක් ඔහුගේ මුහුණෙහි දිව වූයේය. අනෙක් දෙදෙනා ඔහුගේ ඉතිරි ඇඳුම් උනා දැමූහ. මේ මුළු වෙලාවෙහිම මන්සූර් කිසිවක් කළේ නැත, ඔහුගේ සියලු සටන් ඔහුගෙන් පලා ගොස් තිබුණේය. ඔහු අවමංගල්‍ය සඳහා සූදානම් කරන මළ මිනියක් සේ අජීවී විය. ඔවුහු වෑන් රථයේ දොර ඇර ඔහු පිටතට විසි කළහ. ඔහු ජයසිංහ ජුවෙලර්ස් ඉදිරිපිට පදික වේදිකාවෙහි වැටිණි. උස මිනිසා මදකට බිමට බැස, ඔහුගේම මැණික් කටුවට සුවඳ විලවුන් ඉසගෙන, බෝතලය මන්සූර්ගේ යට ඇඳුම තුළට එබුවේය, අනතුරුව නැවත වෑන් රථයට නොපෙනී ගියේ සමන්පිච්ච සුවඳ ආශ්වාස කරමිනි. දේශයෙහි නීතිය කඩමින් හැම දෙනාම ශබ්ද විකාශන යන්ත්‍රවලින් සාමය සහ සමගිය පිළිබඳව නොදන්නා බසකින් දේශනා කරනු ඇසුණේය. වෑන් රථය යන්නට ගියේය.

මන්සූර් අලි ෆක්රුඩීන්, රැවුල බා, නිර්වස්ත්‍ර කොට, නව පෙනුමක් ලැබ ඔහුගේ රතු යට ඇඳුම හැරුණු කොට අන් කිසිත් සිරුරෙහි නොමැතිව පදික වේදිකාවේ වැතිර සිටියේය. රැවුල නොමැති, වළල්ල නොමැති, ජංගම දුරකතනය නොමැති, ඇඳුම් නැති තරුණ මිනිසෙක්. ඔහු පෙනී ගියේ ගාලු පාරේ වැතිර සිටින සිංහල මිනිසකු ලෙසිනි. අවසානයේ ඔහු සැබෑ ශ්‍රී ලාංකිකයකු වූයේය. බහුතරය මෙන්ම, යාචකයා මෙන්ම.

ඔහු හිස ඔසවා බැලූ කල්හි, සුදු වෑන් රථය කුඩා වනු දුටුවේය. යාචකයා ආරක්ෂිතව සුවසේ, ගොරවමින් තවමත් නින්දේය. තෙත කාඩ් බෝඩ් සයනය වේලී ඇත. මන්සූර් භූතයෙක් සේ නැගිට, ගෙදර යාමට කොර ගසමින් ඇවිද්දේය, සැතපුම් හතරක දුරක්. පහන් කණුවක් අසල වූ කොඩියක් ගලවාගෙන, වදහිංසා පැමිණ වූ සිය සිරුරෙහි ඔතා ගත්තේය. ගාලු පාරේ යමින් එමින් තිබුණු මොටර් රථ හා වෑන් රථවලට ඔහු දෙස බලන්නට වේලාවක් තිබුණේ නැත. ප්‍රධාන මංසන්ධිවලදී වීදි බල්ලෝ ඔහුට බුරා වැටුණහ. විනාඩි තිහකින් ඔහු රත්මලානට ළඟා වූයේය.

දූන් මන්සූර් නැවත නාන කාමරයේ කණ්ණාඩියෙන් සිය ප්‍රතිබිම්බය දෙස බැලුවේය, එය ඔහුට සිහිපත් කළේ යාපනය ඔහුගේ නිවසෙහි ළිඳය, ළිඳට ගල් විසිකරමින් එහි දියරැලි අතරෙහි සිය ප්‍රතිබිම්බය සිඳ බිඳ දැමූවේ කෙසේද යන්න ඔහුට සිහිපත් විය. ඒ යාපනයේ නිවස විශාල වූ අතර විශාල ගෙවත්තක්ද තිබිණි. එහෙත්, ඒ නිවස සෙල්ලම් නිවසක් මෙන් කුඩා වූයේ නම් මැනවැයිද, එවිට ඔහුට සිය සහෝදරියන් සමඟ මුළු දවස පුරා සෙල්ලම් කළ හැකි යැයිද ඔහු හැමවිටම සිතුවේය. මන්සූර්ගේ පියාට යාපනය කඩවීදියේ ස්වර්ණාභරණ සාප්පුවක් තිබිණි. එය මන්සූර් ජුවෙලර්ස් නම් විය. එම සාප්පුව නම් කළේ මන්සූර්ගේ නමිනි. එක් සිකුරාදාවක, යාපනයෙන් පිට වන්නැයි ඔවුන්ට නියෝග කරන විට ඔහුගේ වයස අවුරුදු පහක් පමණක් විය.

සිකුරාදා දිනය හැමවිටම ඔවුන්ට විශේෂ දිනයක් විය. ඔවුහු දහවල් ආහාරය සඳහා යාපනයේ කුකුළු මස් බුරියානි ඉවූහ, කුකුළු මස් ගෙන ආවේ ඔවුන්ගේ ගොවිපළෙනි. එය පවුලේ ලොකු දිවා භෝජනයකි. සිකුරාදාට ජුම්මා සඳහා සාප්පු වසා වේලාසන ගෙදර පැමිණෙති, ළමෝ පාසලෙන් කල්වේලා ඇතිව නිවසට පැමිණෙති. ඔවුහු යාපනය කොටුවට ගොස්, සැන්දෑ හිරු දහරේ රැකවරණය යට, රතු, කොළ සහ නිල් පැහැති

සරුංගල් යවති. ඒ ඉරණම් සහගත සිකුරාදා දිනයේ ඔහුගේ පියා දහවල් එකට පල්ලියට ගියේය. පල්ලිය අතුරු සිදුරු නැතිව පිරී තිබිණි. එය වඩාත් විසල් කළ යුතු වූ අතර භාරකාර මණ්ඩලය ඒ සඳහා මුදල් එකතු කරමින් සිටියේය.

පියා පල්ලියේ සිටියදී, පස් දෙනෙකුගෙන් යුතු පිරිසක් මන්සූර්ගේ නිවසට ඇතුළු වූහ. ඔහුගේ මව කුකුළු මස් කරියට මිරිස් එකතු කළා පමණකි, මන්සූර් සිය සොහොයුරියන් දෙදෙනා වන ෂෙහාරා සහ ෂැනුබා සමග ගෙවත්තෙහි සෙල්ලම් කරමින් සිටියේය. සැන්දෑ කාලයේදී අඹ අච්චාරු සෑදීම සඳහා, ඔහු ඉදිරි අංගනයේ වූ අඹ ගහට නැග අඹ සොයමින් සිටියේය. හදිසියේම මිනිස්සු ලෝහ ගේට්ටුව විවෘත කොට අංගනය ඇතුළට පැමිණියහ. ගස යට සිටි ෂෙහාරා සහ ෂැනුබා ගෙතුළට දිව ගියහ. අඹ ගසෙහි සිටි මන්සූර් තවමත් එලෙසම සිටියේය.

'කවුද ගෙදර?' මිනිස්සු දොරට තඩි බෑහ. සිය හිස වටා කළු සාටකය ඔතාගත්, මන්සූර්ගේ මව ඉදිරි දොර අසලින් මතු විය.

කණ්ඩායමේ නායකයා යැයි සිතිය හැකි, සුදු සරමක් ඇඳ සිටි කළු මිනිසා, යාපනය අහසට අත දිගුකර මන්සූර්ගේ මවට මෙසේ නියෝග කළේය, 'මෙතැනින් වහාම පිට වෙන්න'

'ඒත් කවුරුවත් ගෙදර නෑ' ඇය සන්සුන්ව ඔවුන්ට කීවාය. 'ඔබට පුළුවන්ද මගේ ස්වාමිපුරුෂයා පල්ලියේ ඉඳලා එනකල් ඉන්න'

'නෑ අපිට බැහැ දැන් පිටවෙන්න' අනෙක් මිනිසුන් සිව්දෙනා එකවර ඇයට ගුගුළහ.

'ඒත්... කොහාටද?' ඇය කාරුණිකව ඇසුවාය.

'ඒක අපි දන්නේ නෑ' එක මිනිසෙක් වට පිට බැලූ අතර, ඔහු මන්සූර් අඹ ගසෙහි සිටිනු දුටුවේය.

'ඒත්' ඔහුගේ මව විරෝධය පළ කළාය.

'ඒක නියෝගයක්, දැන් පිටවෙයල්ලා' නායකයා බල කළේය.

'කරුණාකරලා' දෑත් එක්කරමින් ඇය ආයාචනා කළාය.

'හොඳයි අපි පැය දෙකක් දෙන්නම්' මොහොතකට පසුව නායකයා කීවේය.

'පැය දෙකක්' ඔහුගේ මව නැවත ඉතා අමාරුවෙන් කීවාය.

'ඔව්, පැය දෙකක්. ඒ විනාඩි එකසිය විස්සයි' මිනිසා සරම බුරුල් කර, නැවත එය තදකොට ඉණට ඇඳ ගත්තේය.

'පැය දෙකයි' ඔහු නැවත කීවේය. 'එච්චරයි'

'ඒත්' ඔහුගේ මව නැවත විරෝධය පළ කළාය.

'දෙමළ තේරෙනවනෙ අපි කියපු දේ තේරෙනවා කියලා හිතනවා' මිනිසා කෑගෑවේය. 'ජීවත් වෙන්න ආස නම් මෙතනින් පිටවෙයල්ලා. ඒක තෝරගන්න එක උඹලගේ වැඩක්'

ආපසු යනවිට ඔවුහු ගේට්ටුවට මහ හඬින් ගැසූහ. බියෙන්, අඹ අත්තක් තදින් අල්ලාගෙන ඒ දර්ශනය මන්සූර් බලා සිටියේය. දිය වී යන සීනි බෝලයක් මෙන් ඔහුගේ මුහුණ දහඩියෙන් නෑවී තිබිණි. ඔහුගේ සාක්කු දෙකම රතු අඹ වලින් පිරී තිබුණේය. ඔහු සාක්කුවෙන් එක අඹ ගෙඩියක් ගෙන දුබල ලෙසින් ගේට්ටුව දෙසට දමා ගැසුවේ, ඒ මිනිසුන්ට දමා ගසන්නාක් මෙනි. විශාල ශබ්දයක් නගමින් වැටුණු අඹ ගෙඩිය පැලී විවර විය.

'මන්සූර් මෙහෙ එන්න' ඔහුට ගහෙන් බහින්නට සංඥා කරමින් ඔහුගේ මව කෑගෑවාය. 'දුවලා ගිහින් තාත්තව එක්කරගෙන එන්න'

කෙසේවුවද, ඔහු යන්නට පෙර, ඔහුගේ පියා නිවසට පැමිණියේය. ඔහුට ඒ වන විටත් පල්ලියට පණිවුඩය ලැබී තිබිණි. ඔවුන්ගේම ආරක්ෂාව සඳහා ඔවුන් උපන් බිමින් ඉවත්ව යන ලෙස සියලුම මුස්ලිම් මිනිසුන්ට ප්‍රධාන පූජක තැන උපදෙස් දී තිබිණි. මන්සූර්ගේ පියා කෝප වී සිටියේය. එතෙකුදු වුවත්, ඔහු අසරණ විය. ඔහුට සිය පවුලේ අයගේ ජීවිත පරදුවට තැබිය නොහැකි විය.

'මම මගේ ඔක්කොම රත්තරන් බඩු අපේ මිදුලෙ වැළලුවා. රන් පවුම් විසිහයක්' යාපනයෙන් පිටත්ව එද්දී අම්මා ලොරි රියදුරාට කීවාය.

'ඒ ගොල්ලො කිව්වා අපේ ඔක්කොම වටිනා බඩු අරගෙන පැය දෙකක් ඇතුළත පිටවෙන්න කියලා. එහෙම කිව්වේ කිසි බයක් නැතිවද'?

අම්මාගේ කතාව ඉදිරි කාලයේදී ඔහුට නිතර ඇසෙන්නට ඉඩ තිබෙනු ඇත.

'අල්ලා... කරුණාකරලා මගේ යාඥාවට උත්තර දෙන්න... ඒ මිනිස්සුන්ට දඬුවම් කරන්න. ඔවුන් නිරයෙ කුණුවෙන්න ඕන' ඇය හඬන්නට වූවාය. 'ආමෙන්'

'ඒක ගියාවේ. මං ඔයාට අලුත් රත්තරන් බඩු අරන් දෙන්නම්'

මන්සූර්ගේ පියා ඇය සනසන්නට කීවේය.

'රත්තරන් හම්බ කරන්න පුළුවන්. ජීවිතේ බෑ. අපිට ජීවිතේ දුන්නට දෙවියන්ට ස්තූති කරමු. මං රත්තරන් බඩු සාප්පුවක් දාලා ආවා, ඔයා වෙනුවෙන් හොඳට සරු වෙමින් තිබ්බචි රත්තරන් බිස්නස් එකක් දාලා මම ආවා' ඉදිරි අනාගතයේදී ඔහුගේ පියා බොහෝ වරක් මෙසේ කියනු ඇත.

ඔවුහු යාපනය අතහැර පැමිණ පුත්තලමෙහි නැවත පදිංචි කරවීමේ ගම්මානයක පදිංචි වූහ. මේ සංක්‍රමණයට මන්සූර් කැමති වූයේය. ඒ මිනිස්සු අම්මා මේ තරම් අසතුටට පත් කළේ මන්දැයි ඔහුට තේරුම් ගත නොහැකි විය. කුඩා පිරිමි දරුවෙකුට එය වික්‍රමයකි. ඔහු තවත් පවුල් පහක සාමාජිකයන් සමග කුඩා ලොරියක නැගී පැය නමයක ගමනක් පුත්තලමට පැමිණියේය. දිවයිනේ තව පෙදෙසක්, බූරුවන්ගෙන් පිරුණු ප්‍රදේශයක් ඔහු සොයා ගත්තේය. මන්සූර් මීට පෙර කිසිදිනෙක එතරම් බූරුවන් දැක තිබුණේ නැත. මන්සූර් සහ පවුලේ උදවිය එකොළෙස් අවුරුද්දකට ආසන්න කාලයක් නැවත පදිංචි කරවීමේ ගම්මානයෙහි ජීවත් වූහ. පසුව, සියල්ල වෙනස් විය. ඒ වන විට මන්සූර්ගේ වයස දහසයක් විය. ඔහුට කඳවුරේ මිනිස් මිතුරන් සිටියේ නැත. බූරුවෝ ඔහුගේ මිතුරන් වූහ. ඔහු ඔවුන්ට කතා කළේය, පාසල් වේලාවෙන් පසුව දිනපතා බූරුවන් ජලාශය ළඟට කැඳවාගෙන ගියේය.

'අම්මා, මං බූරුවන්ට කන්න එක්කරගෙන ගිහින් එන්නම්, පැයකින් ආපහු එනවා?' ඒ ඉරණම් සහගත දිනයේ ඔහු එසේ කීවේය.

'මන්සූර් නැහැ අද නෙවෙයි. මන්සූර් සමහරවිට හෙට. එතැන ප්‍රවේශම් නෑ. මට බෝම්බ වලයිතුවක්කු වලයි සද්දේ ඇහුණා.'

'ඒත්... අපිට ඒවා නිතරම ඇහෙන්නෙ නැද්ද?'

'අහන්න මගෙ පුතේ. මට ඔයාව නැති කරගන්න ඕන නෑ. අද නෙවෙයි, හෙට ඒ ගොල්ලො ගෙනියන්න එළියට'

'ඒත් අම්මා'

ඇය ඔහුගේ දෛනික ගමන මගහරින ලෙස කීවද මන්සූර් එය නොකළේය. ඔහුට බූරුවන් සතුටු කිරීමට ඕනෑ විය. එබැවින් ඔහු ජලාශයට බූරුවන් කැඳවාගෙන ගියේය.

ඔහු සතුටින් සිය මිතුරන්ට කතා කරමින් සිටියදී, ඔහුගේ ගම දෙසින් පිපිරුම් හඬ මාලාවක් ඇසිණි. ගන දුමකින් ප්‍රදේශය වැසී ගියේය.

මන්සූර් බූරුවන් දමා භීතියෙන් හඬමින්, පිස්සෙකු මෙන් ගම දෙසට දිව ගියේය. අම්මාගේ කෑගැහුම්, ෂෙහාරාගේ හැඬුම්, ෂනුබාගේ බයෙන් පිරුණ මුහුණ ඔහුට පෙනිණි. ඔහු එදින සැන්දෑවෙහි නිවසින් පිටතට එන විට, ඔහුගේ කුඩා නිවසෙහි, ගොම මැටි ගෑ බිම සිය පියා වැතිරී සිටිනු ඔහු දුටුවේය. 'අයියෝ දෙවියනේ මගේ පවුල රැක දෙන්න' ඔහු යාඥා කළේය. ඔහු කඳවුරට ඇතුළුව බිහිසුණු සන්ත්‍රාසය මැද නැවතුණේය. නිවාස ගිනි ගනිමින් තිබිණි, විරූපී වූ ගැහැණු පිරිමි මළ සිරුරු බිම තැන තැන වැටී තිබුණේ මස් කඩවල තිබෙන මස් කපන ලෑලි මත ඇති මස් මෙනි. ඔහු සිය නිවස වෙත දිව යද්දී, වහළය මත මිනිස් පාද විසිරී තිබෙනුද, ගස් මත අත් විසි වී තිබෙනුද දුටුවේය. ඔහුගේ නිවසට ළං වද්දී ඔහු 'උම්මා' යි කෑගැහුවේය. එහෙත් ඔහු දෑතින්ම සිය මුහුණ වසා ගත්තේය. ඔහුගේ නිවස තවදුරටත් එහි නොවීය. ඒ සියල්ල දූවිලි වී ගොසිනි. හමුදාවෙන් හෙළූ බෝම්බයකට ඔහුගේ මුළු පවුලම මියැදී, වැළලී ගොසිනි.

ඔහු දරුවෙකු සේ දින දෙකක් හඬා වැටුණේ ඔහුද එහි සිට ඔවුන් සමගම මිය ගියේ නම් මැනවැයි සිතමිනි.

'අම්මා කවදාවත් මට සමාව දෙන එකක් නෑ' යි දැන් ඔහුගේ එකම මිතුරන් හා, ඔහුගේ එකම පවුල වූ බූරුවන් අමතා ඔහු කීවේය. 'ඇය කවදාවත් මට සමාව දෙන එකක් නෑ'

මේ ඛේදවාචකයෙන් තෙසතියකට පසුව හමුදා ඒකකය, ජාතික ගුවන් විදුලියෙන් අමතා, එය අත් වැරැද්දක් බව කියමින් සිය කනගාටුව පළ කළේය. කඳවුරේ ජීවිත බේරාගත් අය රජයට චෝදනා කළ අතර, ඔවුන් තමන්ට කළේ කුමක්ද යන්න අමතක කර එල්ටීටීඊය වර්ණනා කළහ. 'ප්‍රභාකරන් කවදාවත් අහිංසකයින් මරන්නේ නෑ' යි සමහර දිවිගලවා ගත්තෝ කීහ. ප්‍රහාරයෙන් පසුව මන්සූර් තුළ සියලුම මිනිසුන් එනම් දෙමළ, මුස්ලිම් හා සිංහල මිනිසුන් කෙරෙහිද, එල්ටීටීඊය හා රජය ගැනද තිබූ විශ්වාසය තුරන්ව ගියේය. ඔහු ආගම කෙරෙහි භක්තිමත් වූ අතර, සිය රැවුල වැවුවේය, චිත්‍රපට බැලීම අතහැරියේය. ඔහුගේ අවසාන බලාපොරොත්තුව 'අල්ලා' වූයේය.

'සිංහල මනාලයා වූ මිනිසාට මම වළල්ල ගැන කියන්නේ මොකද්ද?' ඔහුගේ කැපුණු නිකට ඉතා ප්‍රවේසමින් අල්ලමින් ඔහු සිතයි. නැවත යාපනයට ගොස් අම්මා සිය රත්තරන් වැළලූ තැනින් ගොඩ ගැනීමට හැකි නම් මැනවැයි ඔහු සිතුවේය. දඹ රන් පවුම් විසිහයක්, රුපියල් ලක්ෂ දහතුනක රත්තරන් . වාසනාව සමග උපන් දරුවා කිසිවක් නොමැති අවසානයකට එළඹ සිටියි. ඉරණම.

රැවුල වවන්නට ඔහුට වසර දහයක් පමණ ගත විය, දැන් එයද අහිමි විය. ඔහුගේ මුහුණ කසන්නට විය. වසර අටකට පෙර තමා ඒ ලිපිය සැබවින්ම ලියා ප්‍රභාකරන්ට තැපැල් කළේ නම් මැනවැයි ඔහුට සිතිනි. ඔහු සිය තුවාල වූ මැණික් කටුවෙන් නාන කාමරයේ කණ්ණාඩියට ගැසුවේය. වේදනා දුන්, දඬුවම් දුන්, ලැජ්ජාවට පත් කළ ජීවය. සමන් පිච්ච විලවුනෙහි මිහිරි සුවඳ නාන කාමරය පුරා පැතිර ගියේය.

***නිෆ්රාස් රිෆාස්*** *ගාල්ලේ ඉපිද කොළඹ හැදී වැඩුණේය. කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන ඔහු බැංකුවක සේවය කරන අතර, ඉංග්‍රීසි සාහිත්‍ය, ව්‍යාපාර කළමනාකරණය සහ ලේඛන කලාව සහ මාධ්‍ය කළමනාකරණය යන විෂයයන් ඇතුළත් උසස් අධ්‍යාපනයෙහි නිරතව සිටියි. නිෆ්රාෂ් ලේඛකයකු වූයේ අහම්බෙනි, ඔහු දේශීය සඟරා සඳහා ලිපි ලියයි. ඔහුගේ කතාව ශ්‍රී ලංකාවෙහි පැවති යුද්ධය පසුබිම් කොටගන්නා අතර, ඔහුද කොටස්කරුවකු වූ අසමාන සමාජයෙහි නැගීම් බැසීම් ඔහුගේ චරිතය තුළින්ද පිළිබිඹු වෙයි.*

# ඒ මගේ නිවස විය, ඔවුහු මගේ පවුල විය

## මතක සටහනක්

*අයෝධ්‍යා ක්‍රිෂානි*

මා උපන් දා සිට ජීවත් වූ නිවස පිහිටා තිබුණේ කඳු මුදුනකය. කොළ පැහැගත් කඳු වළල්ලෙන් වට වූ දළදා මාලිගාව, නුවර වැව සහ නුවර නගරය අපට දර්ශනය විය. සහෝදරියන් දෙදෙනෙක් සඳහා සාදන ලද එය දෙමහල් නිවසක් වූ අතර නිවස තිරස් කොටස් දෙකකට බෙදා තිබුණේය. නිවසෙහි කොටස් දෙස එකම සැලසුමකට නිර්මාණය වී තිබිණි, විසිත්ත කාමරයක්, පහළ මාලයේ කාමර දෙකක්, ඉහළ මාලයේ කාමර දෙකක්, නානකාමර දෙකක්, සඳළුතල දෙකක් දෙපසම තිබුණු අතර, නිවාස දෙකම නුවර නගරයට මුහුණ ලා පිහිටියේය. නිවසෙහි දෙපසින්ම පිටතින් පඩිපෙළ දෙකක් තිබිණි. එක් එක් විසිත්ත කාමරයේ ආරුක්කු ස්වරූපයේ පුදසුනක් ආගමික කටයුතු වලට අවශ්‍ය දේ තැබීම සඳහා සාදා තිබුණි. අපගේ විසිත්ත කාමරයෙහි අපි මේරි මාතාවගේ ප්‍රතිමාවක් සහ බුදුන් වහන්සේගේ ප්‍රතිමාවක් දෙපසින් තැබුවෙමු. අපි දිනපතාම බුද්ධ ප්‍රතිමාවට මල් පුදා, පහනක් දැල්වීමු, මේරි මාතාව වෙනුවෙන් විදුලි ආලෝකය දැල්වීමු. මගේ පවුලෙහි උදවිය වාසය කළ උඩුමහලෙහි නිවසෙහි පැති දෙක සම්පූර්ණයෙන්ම බෙදා වෙන්කර තිබුණේ නැත. දෙපස එනම් දකුණු පස හා වම්පස සම්බන්ධ වූයේ පොදු මුළුතැන්ගෙට යනෙන දිගු කොරිඩෝවෙනි. කොරිඩෝව අප දුව පැන යන පෙදෙස විය. කොණ්ඩය කැපීමෙන් පසුව මගේ සහෝදරයා කොරිඩෝවේ බිත්තිවල සිය හිස තෙරපමින් එහා මෙහා දිව යයි. එය අපූරු සුවයක් දනවන බව ඔහු කීවේය.

අපගේ නිවසෙහි සෙනඟ පිරී සිටියහ, මගේ ආච්චි සීයලා, මගේ නැන්දලා සහ මාමලා නිතර අප සමග විසූහ. පහළ මාලයේ කුලියට දුන් එක කාමරයක කුලී නිවැසියෝද නිතර සිටියහ. මේ කුලී නිවැසියෝ, ඔවුන්ගේම විවිධ සංස්කෘතික පුරුදු හා ජීවන රටාවන්ගෙන් යුත් ඔවුන්ගෙ ම විශේෂිත පෞරුෂයන්ගෙන් යුත් අය වූහ. නිවස අපට අයත් වූයේ නැත. අපගේම නිවසක් සාදාගන්නා තෙක් අපට වාසය කිරීම සඳහා කොළඹ සිටින ඥාතීන්ගෙන් කෙනෙක් අපට මේ නිවස ලබා දී තිබුණේය.

අනෙකුත් ඥාතීන්ද නව ස්ථානයන්ට යන තුරු අප සමග නිවසෙහි සිටියහ. ඒ හැමදෙනාටම, නිවස හැර යන්නට කාලය උදා විය. ඒ එක් එක් අය වෙන්ව යන විට විවිධාකාර හැඟීම් දනවෙන්නේ ඔවුන් එකිනෙකා විවිධ ආකාරයෙන් අපගේ ජීවිත ස්පර්ශ කර තිබෙන බැවිනි. අඩුම තරමින්, හැම අවස්ථාවකදීම මට වෙනස් ලෙස ඒ වෙන්වීම් දැනිණි. අනතුරුව, අපටද වෙන්ව යාමේ කාලය උදාවිය. නිවස කිසිවිටෙකත් අපගේ නොවීය. එහෙත් එය මගේ ගෙදර විය.

අප ඒ නිවසෙහි ජීවත් වූ කාලය බොහෝ දේ සිදු වූ යුගයක් විය. එයින් බොහෝ දේ හොඳ දේ වූයේ නැත. එය 1980 ගණන් වල අවසාන භාගය වූ අතර, හත්හැවිරිදි වියේ සිටි දැරියක් ලෙස මිනීපෙට්ටිවල දැමූ මෘතදේහයන් දකිනු වෙනුවට, කඩුගන්නාව නිම්නයෙහි සහ ගංගාවල මෘත දේහයන් පාව යනු දුටු  බව මතකය. පාසලේ අපගේ පන්ති කාමරවල කවුළුවලින් පහල වීදිය දෙස බැලූ විට අපට තරුණ මිනිසුන් දැකිය හැකි විය. ඔවුහු අවිනිශ්චිතව බලා සිටියහ. සමහර විට ඔවුන් පෙරදී උගත් ශාස්ත්‍ර ශාලාවන් වූ, ඒ සිරගෙවලින් පිටතට ගොස් කරන්නේ කුමක්ද යන්න ගැන ඔවුහු අවිනිශ්චිතව සිටියහ. ජනතා විමුක්ති ව්‍යාපාරය (ජේවීපී) සහ රජයට එරෙහි ඔවුන්ගේ සන්නද්ධ අරගලය දකුණෙහි බිහිසුණු ලකුණක් සටහන් කළේය. උතුරෙහි ඉන්දීය සාම හමුදාව, ප්‍රජාවන් අතරෙහි ඉතිරිව තිබූ සාමයේ ශේෂයන්හි අවසානය ළඟා කරවූයේය. ඔවුන්ගේ මෙහෙවර වූයේ දමිළ විප්ලවකරුවන්ගේ කරුල්ල අවසන් කිරීමය. සියල්ල 'හොඳහිතින්' සිදුවූ ඒවාය. අප සියලු දෙන වටා භීතිය දක්නට තිබිණි. එහෙත් අපට තවමත් විසල් නිවස සහ බොහෝ කතා තිබිණි. භීතියේ කතා, ශෝකයේ කතා, වේදනාවෙහි කතා, පමණක් නොව රැකවරණයෙහි, සිනාවෙහි සහ ආදරයෙහි කතාද අප වෙත තිබිණි.

අප සමග සිටි බොහෝ ඥාතීන් අතර, ප්‍රියා නැන්දා සහ ඇයගේ ස්වාමිපුරුෂයා විශේෂිත අය වූහ. ඇය ත්‍රිකුණාමලයේ, මරදන්කඩවල නම් ප්‍රදේශයක වූ පාසලක සිංහල ගුරුවරියක වූවාය. ඇයගේ සුන්දර කළු පැහැය දිලුණේ දියවී යන තද පැහැ චොකලට්ටුවක් මෙනි. නිතර හොඳින් රැළි තැබූ සාරියක් හැඳ, ඇගේ දිගු කළු කොණ්ඩය පිළිවෙලට කරලක් වෙන්නට ගොතා සිටි ඇය ලාලිත්‍යයෙන් යුතු වූවාය. ඇගේ හඬ නොසැලෙන, උස් හඬ ඇති, පැහැදිලි, ගුරුවරියකට ඉතාම ගැලපෙන

හඬක් වූයේ යැයි මම සිතුවෙමි. මරදන්කඩවල සිටින ඔවුන් දකින්නට යාමට අපට හැමවිටම අවශ්‍ය විය, එහෙත් ඔවුන් කීවේ එහි යාම අනාරක්ෂිත බවයි, කෙසේ වුවද ඔවුන්ට අන් තැනකට යන්නට සැලසුම් තිබිණි. ඔවුහු සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂා තුනම හොඳින් කතා කළහ. වරක් මා ඇය සමීපයේ ඉඳගෙන සිටින විට, පිරිමින් සහ ගැහැණුන්ගෙන් සැදුන සන්නද්ධ කණ්ඩායම් මරදන්කඩවල ගම්මානයට පහර දීමට වරින් වර පැමිණෙන බැවින් රාත්‍රි කාලයන් කොපමණ දුෂ්කරද යන්න මට පැහැදිලි කර දුන්නාය.

'අපේ ගම්වලට පහර දෙනකොට ඒවයින් ගැලවෙන්න ළඟපාත කැලෑවට පැනලා ගිහින් ගස්මුදුන්වල රෑ ගත කරපු බොහොම අවස්ථා තිබුණා. අපේ ගේ තිබුණේ හුඟක් හුදකලා තැනක, අපේ අසල්වාසින්ගෙන් බොහොම ඈතක. සමහර වෙලාවට, අසල්වැසියො එනවා අපිට පහරදීම් ගැන ලැබෙන ආරංචි ගැන අනතුරු අඟවන්න.' ඇය සුසුම් හෙලා මොහොතකට නිහඬව සිටින්නේ, ඒ භයංකර මතකයන් අතරෙහි අතරමං වෙමිනි. 'සමහර වෙලාවට, පුරුද්දක් හැටියට අපි රෑට ගෙදරින් යනවා. එහෙම වුවමානවක් නැති වෙලාවටත්' ඇය සිනාසුණාය, මමද ඇය සමග සිනාසුණෙමි. 'අපි අවදානම ගන්න හුඟක් බයවුණා. ඒක අපි කොච්චර හොඳට සිංහල හරි දෙමළ හරි දන්නවද කියන ප්‍රශ්නයක් නෙවෙයි. රෑට වහපු දොරවල්වලට කවුරු තට්ටු කරයිද කියන එක කවුරුවත් දැනගෙන සිටියේ නෑ'

මා ඇයගෙන් ඇසූ එක් ප්‍රශ්නයක් වූයේ, 'ප්‍රියා නැන්දා, ඇයි ඔයාලා තවම එහෙ ඉන්නෙ, ආරක්ෂාව තියෙන වෙනත් පළාතකට මාරුවක් නොගන්නෙ ඇයි?' යන්නයි.

'ළමයි දාලා එන්න බෑ' ඇගේ පිළිතුර එය විය යුතුය. 'ඒ ගොල්ලන්ට ඇත්තටම ඉගෙනගන්න අවශ්‍යයි. අපි කැලෑවෙ රාත්‍රිය ගතකරන කොටත්, ඊළඟ දවසෙ ළමයි ඉස්කෝලෙ එනවා. ඒ ගොල්ලන්ට ඇත්තටම ඉගෙන ගන්න වුවමනාව තියෙනවා' ප්‍රියා නැන්දා නැවත එකතු කරනු ඇත. ඇගේ පාසල ගැන කතා කරන විටදී ඇගේ අඳුරු මුහුණෙහි සිනාවක් නැගෙයි.

ප්‍රියා නැන්දා සහ ඇගේ පවුල අවසානයේදී ත්‍රිකුණාමලයේ සිට කොළඹට සේන්දු වූහ. සිය දූවරුන්ගේ සහ පුතුන්ගේ අධ්‍යාපනයද,

ආරක්ෂාවද ගැන ඇය සැලකිලිමත් වූවාය. අනික් කරුණු වූයේ, දිනපතා තර්ජන මැද ජීවත්වීම විශාල හිරිහැරයක් වීමය. ඔවුහු ඒ භූමියට, මිනිසුන්ට සහ එහි ජීවිතයට ආදරය කළහ, එය එම ප්‍රදේශය අතහැර යාමට ඔවුන්ට අපහසුතාවක් ඇති කළේය. එහෙත් දිගින් දිගටම භීතියෙන් ජීවත්වීම අපහසු විය.

මා සම්බන්ධයෙන් ගත් කල, ප්‍රියා නැන්දාගේ කතා මා දුටුවේ බොහෝ දුරට කාල්පනික රටක සිදුවන ත්‍රාසජනක ක්‍රියාවන් ලෙසිනි. පසුව ශ්‍රී ලංකාවේ යුද්ධය තවදුරටත් දැඩිවන විට මගේ නැන්දා සහ ඇගේ පවුලේ උදවිය ගැන මට බොහෝ ගැඹුරින් හැඟෙන්නට විය. ඔවුන්ගේ තත්ත්වය වටහාගැනීමට අප උත්සාහ කළේ ඉතා මද වශයෙන් යැයි මට හැඟී ගියේය. අපට දැනගැනීමට අවශ්‍ය වූයේ සුළු වශයෙනි, අපට ජීවිතයේ අප වගේම වූ අරගල තිබුණේය. පාසල් යාමේ අසීරු කාර්යය, අප අකමැති ටියුෂන්, මගේ දෙමාපියන්ගේ මුදල් ප්‍රශ්න, තවදුරටත් දැරිය නොහැකි යැයි ඔවුන් කී ජීවන වියදම් ප්‍රශ්න යනාදී බොහෝ ප්‍රශ්න අපට තිබිණි.

අනතුරුව අපගේ පහල මහලේ කාමරයේ කුලී නිවැසියන් වූයේ ප්‍රේමකුමාර්ලාය. ප්‍රේමකුමාර් මහත්මිය ගුරුවරියක වූවාය, ඇයගේ ස්වාමිපුරුෂයා ඖෂධ සංයෝජකයකු වූයේය. පාසල නිම වී පැමිණීමෙන් පසුව නිවසෙහි සිටි එකම අය මම වීමි, මා දෙස ඇස ගසා සිටින්නට ගෘහ සේවකයෝ සිටියහ. දහවල් කාලයේදී මගේ පවුලේ අනෙක් උදවිය නිවසෙන් පිටත සිටියදී, එනම් මගේ දෙමාපියන් රාජකාරියේද, සහෝදරයින් විවිධ ටියුෂන් පන්තිවලද සිටියදී මම ප්‍රේමකුමාර් මහත්මිය අසල ගැවසෙමින් සිටියෙමි. ඇය සුන්දර, උසැති, සිහින් සිරුරැති ගැහැනියක වූ අතර නිතර සාරියක් ඇඳ නළලෙහි පොට්ටුවක් තබා සිටියාය. ඇය මගේ ප්‍රියා නැන්දා මෙන් කොණ්ඩය මනාව ගෙතුවාය. විශේෂ අවස්ථාවන්හිදී ඇය ඇගේ ගෙතූ කේශකලාපයේ මල් ගසන්නටත්, වඩා දීප්තිමත් සාරි අඳින්නටත් පුරුදුව සිටියාය. ඇය හිසෙහි මල් ගසන්නේත්, වර්ණවත් සාරි අඳින්නේත් මන්දැයි මා ඇසූ විට ඇය කීවේ, දෙවියන්ට යාඥා කිරීම සඳහා ඇය කෝවිලට යන බවයි. ප්‍රේමකුමාර් මහතා සිහින්, මධ්‍යම උසැති කෙනෙකු වූයේය. ඔහුට කුඩා මුහුණක්ද, කාන්තිමත් සිනාවක්ද, තිබිණි. එබඳු තියුණු සහ බැබළෙන දෑසක් මා කිසිදිනෙක දැක නැත.

ඔවුන්ගේ කාමරය හැමවිටම පිරිසිදුව, පිළිවෙලට, තිබිණි. පොලිෂ් කරන ලද පොළව දිලිසෙමින් තිබුණේය. තිනර් සුවඳ ගෙන ආවේ නැඹුල් බවකි. ඔවුන්ගේ චාරිත්‍රවාරිත්‍ර ගැන මා කෙතරම් උනන්දු වන්නේදැයි ප්‍රේමකුමාර් මහත්මිය දැන සිටියාය. ඔවුන් බිම ඉඳගෙන ඔවුන්ගේ ආහාර ගන්නා අකාරයෙන් මම වශී වූයෙමි. එය මගේ මව කිසිවිටෙකත් කරන්නට ඉඩ නොදෙන දෙයකි. ඔවුන් සමග, පසෙකින් බිම ඉඳගෙන ඔවුන්ගේ ආහාර රස විඳින්නට ඇය මට කාරුණිකව අවස්ථාව ලබාදුන්නාය. මා ඉංග්‍රීසි දැන සිටියේ ඉතා මද වශයෙන් බැවින් හා දෙමළ කොහෙත්ම නොදැන සිටි හෙයින්ද, ඇයට කතා කළ හැකි වූයේ ඉංග්‍රීසි හා දෙමළ භාෂාවලින් පමණක් වූ හෙයින්ද, අපට සන්නිවේදනය කළ හැකි වූයේ ස්වල්ප වශයෙනි. ඇගේ ප්‍රියතම කෑමක් සෑදීමට ඇය පුරුදුව සිටියාය, ඒ ගිතෙල් බත් හා ගිතෙල් එළවළු කරියයි. සියලු අතිරේක ගිතෙල් එයට විශේෂිත බවක් ගෙන දුන්නේය. ඇය ඉතා ආදරයෙන් මට ඒ විශේෂ කෑම පිළිගන්වයි, එවිට ඒ කෑම රස හා සුවඳට මා අකමැති වුවත් මට එය ප්‍රතික්ෂේප කළ නොහැකිය. එහෙත් මම වර්ණවත් හා රසවත් ව්‍යංජන සමග ඉඩ්ලිවලට ප්‍රිය කළෙමි. එයට මා බොහෝ ප්‍රිය බව ඇය දැන සිටි අතර හැමවිටම ඇය මට ඉඩ්ලි දුන්නාය. මගේ මවට ඒවා හදන්නට වේලාවක් නැතිවා සේම ඇය එහි වට්ටෝරුවද දැන සිටියේ නැත.

ප්‍රේමකුමාර් පවුල මහනුවර පදිංචියට නිසිතැනක් සොයාගන්නා තුරු සති කිහිපයක් අප නිවසෙහි නවත්වා ගන්නා ලෙස අපගේ අසල්වැසි කතෝලික පූජකවරයෙක් ඉල්ලීමක් කර තිබුණේය. ඕනෑම කෙනෙකුට කරන්නාක් මෙන් අම්මා සතුටින් ඔවුන්ට කාමරය ලබා දුන්නාය. ප්‍රේමකුමාර් මහතා සහ මහත්මිය ගමන් මළු කිහිපයක් සමග පැමිණි අතර, කුස්සියේ බඩු හෝ අඩුතරමින් වතුර බොන්නට කෝප්පයක් හෝ ඔවුන් ගෙන ආවේ නැත. ඔවුන් සියල්ල මිලදී ගත්තේ අප නිවසෙහි සිටියදීය. ඔවුන් සති කිහිපයකට පමණක් පැමිණි නමුත්, ඔවුන් බලාපොරොත්තු වූ රැකියා ස්ථාන මාරු ලබාගත නොහැකි වූ නිසා අප සමග මාස දෙකකට වැඩි කාලයක් ගත කළහ. ඔවුන් විවාහ වී වසර කිහිපයක් පමණක් වූ බැවින්, ඔවුන්ට දරුවන් නොසිටි අතර, ඔවුන් සරදම් ලෙසින් කියා සිටියේ මා දරුකමට හදා ගන්නා බවයි.

අපගේ අසල්වැසියන්, ඔවුන් තම අසල්වැසි පරිසරයේ සිටීම ගැන

සැලකිලිමත් වන තුරු සියල්ල හොඳින් සිදුවිය. හැම දෙනාගේම යහපත වෙනුවෙන් කටයුතු කරන ප්‍රධානියා වශයෙන් තමාව තමාම පත්කර ගත් එක් මිනිසෙකු සිටියේය. ඔහුගේ නම රොඩ්නි විය, ඔහුගේ පිළිවෙලකට නැති ඉරීගිය ඇඳුම් සහ නොමනා අභිනයන් යම් හේතුවක් නිසා මා කෝප කරවීය. පාසල නිම වී පැමිණෙන හැම දිනකම සෙවන සහිත දිගු මගෙහි, ලස්සන ඇසළ ගස් හා විශාල මාර ගස් සෙවනෙහි මා ඇවිද එන විට, මා මුණ ගැසීමට අකමැති එක් පුද්ගලයෙක් වන්නේ ඔහුය. මිනිස්සු ඔහු ගැන නොයෙක් කතා කියති. එහෙත් ඒවා සත්‍යදැයි මම නොදත්තෙමි. ඔහු නීල් පියතුමන් පාලනය කරන ගොවිපලෙහි මස් මරන්නෙක් බව ඔවුහු කියති. ඔහු හැමවිටම පිහියක් රැගෙන ගමන් කරන බවත්, ඔහුගේ කමිසයෙහි හැමවිටම ලේ බිංදු ඇති බවත්, ඔවුහු කියති.

එක් දිනක් මගේ මව සහ මම සිල්ලර බඩු කඩයට ගොස් ආපසු ගෙදර එමින් සිටියෙමු, අප අපගේ පටු මගෙහි, ප්‍රධාන පාරෙහි සිට හැරෙන්නට ඔන්න මෙන්න කියා තිබියදී, ප්‍රධාන පාරේ වංගුව ළඟදී අපට ඉදිරියෙන් ඔහු මතු වූයේය. අප එනු දැක, ඔහු ඔහුගේ ගමන ඉක්මන් කළේය. 'ආ, ආරියරත්න නෝනා, මට බරපතළ කාරණයක් තියෙනවා කතා කරන්න' ඔහු ඈත සිට අපට කෑගැහුවේය. මගේ මව නැවතී බලා සිටියාය.

ඔහු ළඟට එමින් 'අර ඔයගොල්ලන්ගෙ ගෙදර කුලියට ඉන්න උදවිය, ඕගොල්ලො හොඳට දන්නවද ඒ ගොල්ලන්ව?'

'ප්‍රේමකුමාර්ලා?. ඔව්, මම දන්නවා ඒගොල්ලන්ව' ඔහු දෙස තියුණු බැල්මක් හෙලමින්, මගේ මව අධිකාරී බලයකින් යුතුව පිළිතුරු දුන්නාය. 'ඒගොල්ලො මෙහෙ ඉන්නෙ කෙටි කාලෙකට. අනික, නීල් පියතුමා අපිට ඒ ගොල්ලන්ව අඳුන්නලා දුන්නෙ. ඇයි මොකද්ද ප්‍රශ්නෙ රොඩ්නි?'

'ආ! නෑ එහෙම මුකුත් ප්‍රශ්නයක් නෑ. ඒත් දන්නවනෙ, මේ දවස්වල අපිට කිසිකෙනෙක් විශ්වාස කරන්න බෑ. විශේෂයෙන්ම උතුරෙන් එන උදවිය. එයාලගෙ පසුබිම හොයා බලා ගත්තොත් හොඳයි, සමහර විට පොලිස් වාර්තාත්. ඔයාලගේ හොඳටමයි මං මේ කියන්නෙ. මේ දවස්වල ඕන දෙයක් වෙන්න පුළුවන්'

'ආ මං හිතනවා ඔයා ඕනවට වඩා හිතනවා කියලා.' මගේ මව කීවාය. 'ඒ ගොල්ලො හොඳ කරුණාවන්ත මිනිස්සු. මං ඒ ගොල්ලන්ව හොඳට දන්නවා, මං රොඩ්නි එක්ක කතා කරනවට වැඩිය එයාලත් එක්ක කතා කරලා තියෙනවා. ඔයත් එයාලා එක්ක කතා කරලා හොඳට දන හඳුනගන්න එක හොඳයි. ඔයා වගේ මිනිහෙක්, මං කවදාවත් හිතුවෙ නෑ ඔයා බයෙන් ජීවත් වුණා කියලා' ඇය මගේ අතින් ඇදගෙන, ඔහු පසුකර ගමන් කළේ කටුක බැල්මක් හෙලමින්, වසාගත් මුවින් යුතුවය. මා මගේ මව වූවා නම්, මා ඔහුට අතුල් පහරක් ගසන්නටද ඉඩ තිබිණි.

'ඒ ගොල්ලො දෙමළ මොනව කරනවද දන්නෙ නෑ' අප යන විට ඔහු කෑ ගැහේය.

මගේ මව බොහෝ කෝප වූවාය, ඇය රාත්‍රියෙදී කතාව මගේ පියාට කියනු මට ඇසිණි.

'මට පුදුමෙ රොඩ්නිට මේ පළාත ආරක්ෂාකාරිව තියාගන්න අදහස කොහෙන් ආවද කියලා?' ප්‍රේමකුමාර්ලාට මේ ගැන කීමේ අදහසක් තමා තුළ නැති බව ඇය මගේ පියාට කීවාය.

එහෙත් රොඩ්නි ඔහුගේ අදහස සඵල කර ගත්තේය, දින ගෙවී යද්දී, ඔහු කී දෙය ඇගේ සිතෙහි හොල්මන් කරන්නට විය. ඇය අපේ ආරක්ෂාව පිළිබඳව බිය වන්නට වූවාය. ඇයද ගුරුවරියක වූවාය. අපගේ කුලී නිවැසියන් කරන හැම දෙයම සොයා බලන්නට ඇය ගෙදර සිටියේ නැත. මේ සිතුවිලි ඇයගේ සිතට කරදර ඇති කළේය. අවසාන වශයෙන්, අසල්වැසියන්ගේ සිත් කරදරය ගැන ප්‍රේමකුමාර්ලාට කීමට අවශ්‍ය යැයි මගේ දෙමාපියන්ට හැඟී ගියේය.

දිනක් මා සඳලුතලයෙහි හිඳගෙන සිටියදී, ප්‍රේමකුමාර් මහතා නගරයේ සිට එනු මම දුටුවෙමි. මගේ මවද ඔහු එනු දුටුවාය, ඇය ඉක්මනින් ඔහුට කතා කිරීමට ගියාය. ඔහු ඔහුට ආවේනික අව්‍යාජ, යටහත්, විලාසයෙන් ඔහු ඇය සමග සිනාසුණේය.

'අපි මේ දවස්වල මුණගැහෙන්නම නැති තරම්' ගෙයින් පිටත පඩිපෙළ බැස එමින් මගේ මව කීවාය.

'ඔව්, ඔව්, ඒක ඇත්ත. ඒත් අපි අර තරුණ නෝනා මහත්මිය එක්ක පොඩි පොඩි අල්ලාප සල්ලාපවල යෙදෙනවා' සඳළුතලයේ සිටි මා පෙන්වමින් ඔහු සිනාමුසු මුහුණින් කීවේය.

සඳළුතලයේ සිටි මා එබිකම් කර බලන විට, මගේ මව නොසන්සුන්ව සිටිනු දුටුවෙමි. ඇගේ අඳුරු මුහුණ මා මගේ ජීවිතයේදී මින් පෙර දුටු දෙයක් නොවේ.

'මං දන්නේ නෑ මේක කොහොම කියන්නද කියලා' මගේ මව බොහෝ පසුබෑමකින් යුතුව කිවාය, ඇගේ දෑත් එක්කොට පිරිමදිමින් 'ඒත් මිනිස්සු කීපදෙනෙක් අපට කීවා අපේ පළාතේ ඔයගොල්ලො ඉන්න එක ගැන ඒ අයට ප්‍රශ්නයක් තියනවා කියලා ප්‍රේමකුමාර් මහත්තයා. මං හිතන්නෙ මිනිස්සු බයයි. මේ දවස්වල ඕන දේකට බයයිනෙ, අපි වටේටම තියෙන ප්‍රශ්න බැලුවහම'

ඇයට ඔහු දෙස බැලිය නොහැකි විය, ඇය කෙතරම් වික්ෂිප්ත වී ඇද්දැයි මට දැකිය හැකි විය. ප්‍රේමකුමාර මහතාට ඇගේ නොසන්සුන්කම පසක් විය. ඇය අපහසුකමෙහි නොතබා, ඔහු සිනාමුසු මුහුණින් පිළිතුරු දුන්නේය, 'මං කල්පනා කළේ ඇයි ඔයගොල්ලො මේ ගැන ඉක්මනට කතා නොකළෙ කියලා. නීල් පියතුමා මට දැනටමත් කියලා තියෙන්නෙ රොඩ්නි ගැනයි එයාගෙ කරදර වීම ගැනයි. ඔයගොල්ලො දන්නවනෙ, අපි මෙහාට ආවෙ කෙටි කාලෙකට. අපි අදහස් කරපු තැනට මාරුව හදාග න්න බැරි වුණා. ඉතින් අපි තීරණය කළා ඉක්මනටම මඩකලපුවට යන්න. අපි හින්දා ඕගොල්ලන්ට මූණ දෙන්න වෙච්ච කරදර ගැන ඇත්තටම හුග ක් කනගාටු වෙනවා' ප්‍රේමකුමාර් මහතා කීවේය.

'ඔයා අපිට කොහොමටවත් කරදරයක් නොවෙයි ප්‍රේමකුමාර් මහත්තයා' සුසුමක් හෙලමින් මගේ මව කීවාය. 'ඇත්තම කියනවා නම්, අපේ ආරක්ෂාවට වැඩිය අපි හිතන්නේ ඕගොල්ලන්ගෙ ආරක්ෂාව. මිනිස්සු නොදන්න අය ගැන බයයි, සමහර මිනිස්සු ප්‍රශ්නයක් ඇති කරන්න බලාගෙන ඉන්නවා'

ප්‍රේමකුමාර් මහතා නිහඬ වූයේය. මා කරන්නේ කුමක්දැයි බලන්නට මගේ මව උඩ බැලුවාය.

'ඒක බේදවාචකයක් ආරියරත්න නෝනා. ඉස්සර අපි ජීවත් වුණේ ගම්බිම් ගැන හිතලවත්, කොහාටද අපි අයිති කියල හිතලවත් නෙවෙයි. දැන් හැම විනාඩියේම අපි ඒ ගැන හිතනවා. දෙමළ උදවිය විතරක් නෙවෙයි, සිංහල අයත් එහෙම හිතනවා. මේකෙන් සිද්ද වෙන්නෙ එන්න එන්න හොඳ අතට හැරෙන එක නෙවෙයි. එන්න එන්න නරක අතට හැරෙන එක. අපි ලොකු සෙල්ලමක ඉත්තො.' ඔහු දර්ශනීය කඳුකරය දෙස ඕනෑකමින් බලා සිටියේය.

'ඒත් මොනවා වුනත් අපි අපේ සම්බන්ධය තියා ගනියි කියලා මට විශ්වාසයි. මේ ළමයි අපිට බලාපොරොත්තුව ඇති කරවනවා' මා දෙස බලා සිනාසෙමින් ඔහු කීවේය.

ඔවුන් පිටව යන දිනය වහා උදා විය. බඩු ඇසුරුම ඔවුන්ට ඉතා පහසු දෙයක් විය. ඔවුන් අප නිවසට එන විට ගෙන ආ කුඩා බෑගය රැගෙන ඔවුහු පිටත් වූහ. එහෙත් ඔවුහු වඩා සතුටින් සිටියහ. ප්‍රේමකුමාර් මහත්මිය ගැබිනියකව සිටියාය. ඒ අප නිවසෙහි වාසනාව යැයි ඔවුහු කීහ. ඔවුහු මඩකලපුවට ගියහ. උතුරෙහි නොව නැගෙනහිර, අලුත් නිවසකට ගියහ.

ඔවුහු මගේ ප්‍රියතම ආහාරය ඉඩ්ලිද, වඩා හුරුපුරුදු නොවන නම් ඇති රසකැවිලිද ගෙන වරක් අප දකින්නට පැමිණියහ. ඒ වන විට ඔවුහු දුවක ලැබ සිටියහ. ඇයට දරුවකු ලැබීමේ වාසනාව ලැබුණේ අප නිසා බව ප්‍රේමකුමාර් මහත්මිය කීවාය.

ඔවුහු අප බලන්නට පැමිණි දින නිමාවේදී, යළිත් අප දකින්නට ඔවුන්ට නොහැකිවනු ඇති බව ඔවුහු කීහ. එපමණ දුරක් ගෙවා පැමිණීම ඔවුන්ට ඉතා අසීරු වූයේය, ඔවුන්ගේ දරුවා සමග පැමිණීමද බොහෝ අවදානම් විය. මගේ මවටද ඔවුන් බලන්නට යාමට වුවමනා වූ නමුත් ඇය එයට බිය වූවාය, ඒ අවදානම ගැනීමට ඇයට අවශ්‍ය වූයේද නැත.

ඔවුහු පිටව ගිය කල මගේ හදවත සැලෙන්නට විය. එහෙත් ඔවුන් යා යුතු විය.

නුවර ඒ නිවස තුළ විසූ සියලු දෙනා-ඔවුහු පැමිණියහ, අපි බෙදාහදා ගත්තෙමු. ඉක්මනින් හෝ පසු වී හෝ වෙන්ව යා යුතු බව දැන සිටියෙමු. මතකයක් රැගෙන හෝ මතකයක් තබා වෙන්ව යනු ඇත.

මට ගෙදරක් මතකයේ ඇත. එය බොහෝ දෙනාට සෙවන දුන් ගෙදරකි. ජීවිතයට බොහෝ දේ ප්‍රදානය කළ ස්ථානයකි. අපිදු අවසාන වශයෙන්, එක් දිනයක අතහැර ගිය එකිනෙකා හමු වූ ස්ථානයකි!

***අයෝධ්‍යා ක්‍රිෂානි*** *ඉපදී හැදී වැඩුණේ මහනුවරය. සාහිත්‍ය පාඨමාලා හදාරන අතරතුර ඇය බොහෝ ලේඛකයින්ගෙන් පෙළඹුමක් ලැබුවාය. එකිනෙකාට ආදරය කිරීමටත්, සාමය ඇති කිරීමටත්, සාහිත්‍ය මිනිසාට උපකාර වන බව ඇය අවබෝධ කොට ගත්තාය. සෞන්දර්යෙහි නිර්ව්‍යාජ ප්‍රකාශනය, පාඨකයාට අනෙකාගේ අත්දැකීම් සංවේදනය කිරීමට උපකාරී වන බවට ඇය විශ්වාසය පළ කරයි. සමහර සිදුවීම් කල්පිත වුවද, ඇගේ කතාවට පාදක වන්නේ සැබෑ චරිතයන් හා සිදුවීම්ය.*

# රණශූරයින් දෙදෙනෙක්

## ඓතිහාසික ෆැන්ටසියක උපුටනයක්

### *වසික උඩුරාවන*

එය බුද්ධරාජගේ ජීවිතයේ හොඳම දිනය විය. ඔහු සහ ඔහුගේ මිතුරන් තරුණ ප්‍රීතිමත් අය වූහ, එමෙන්ම යම් ආකාරයක පොඩි මෝඩකමක්ද තිබෙන්නට ඉඩ තිබිණි. කලාවැව ඉවුර අබියස මිතුරියන් කිහිපදෙනෙකු සමග ඔවුහු හැකිතාක් විනෝද වෙමින්, ප්‍රබෝධයෙන් සිටියහ. කලාවැව, අනුරාධපුර නගරයේ දකුණු පස පිහිටි විශාලතම වාරිමාර්ග ජලාශවලින් එකකි. හදිසියේම, බුද්ධාරාජ වැවෙහි සොරොව්වක් අසලින්, දර්ශන පථය පිරික්සමින් ගල් පර්වතය අවට දෙස සියුම් ලෙස බලමින් ඉක්මනින් ගමන් කළ බව ඔහුට වැටහී ගියේය. ඔහු දහඩියෙන් නෑවී සිටියේය. මොහොතකට, වළාකුළු හිරු වසාගත් විට ඔහුට යම් අස්වැසිල්ලක් ලැබිණි. ඔහු ඔහුගේ උරහිස උඩින් ඕනෑකමින් බලමින් සිටියේය. ඔහුගේ මිතුරන් කොහිද? ඔවුන් අවට පෙනෙන්නට නැත්තේ මන්ද? බුද්ධරාජ සිය ළාමක දෑත් දෙස බැලුවේය. ඒවා ලෙයින් ගන වී ඇත. කුමක්ද... මේ මොන පාපයක්ද? සිය ඇඳුම් අතරින් මාංශපේශීන් පිම්බී එමින් තමා විශාල වෙමින් සිටින බව දැනුණු හෙතෙම යටිගිරියෙන් කෑගැවේය. අහසින් ලේ ගලා විත්, ඔහුගේ දෑත් මෙන්ම කලාවැවේ ජලකඳද රතුවන්නට පටන් ගත්තේය. මේ අපායෙන් පැනගන්නට, බලාපොරොත්තු රහිතව ලේ පිසදා හැරීමට උත්සාහ කරමින් ඔහු අහස දෙසට කෑගැවේය.

තලාව සන්සුන්ය. ඔහුගේ සිහින්, තරුණ ශරීරයද යථා තත්ත්වයට පත් විය. ඒ ඔහුගේ දෑත්වල ලේ සියල්ල සිඳී ගියාක් මෙනි. ඔහුගේ අත්!... ඔහුගේ කිරි කිරි හඬ නගන ඇඳෙහි ඉඳගෙන, සිය රැළි වැටුණු, කැලැල් සහිත මුහුණ සහ රැවුල පිරිමදිමින් ඔහු කාමරයේ මුල්ලක ගොඩ ගසා ඇති ඔහුගේම ආයුධ සන්නාහ දෙස බැලුවේය. ඔහු නැවත සිය අත් දෙස බැලුවේය. චෝල රුධිරය. එය සදහටම ඔහුගේ සිරුරෙහි ගෑවී තිබෙනු ඇත. සතුරාගේ ලෙය.

'දෙමළ මෘගයො' ඔහුගේ හඬ වෙහෙසකරය. 'අනේ දෙවියනේ. මං ඉවරයි'

ඔහු ඇඳෙන් බැසගත් විට, ඔහු නැවත වරක් සිය ආයුධ, ඔහුගේ අපූරු යකඩ රාමුවක් සහිත හමින් කළ සටන් ජැකට්ටුව සහ ඔහුගේ ඉතා බලවත් කඩුව දෙස බැලුවේය. කඩුව හැම දිනකම ඔප දමන්නේ, එහි ඇති ලේ සහ අතුණු ආදිය ඇත්නම් ඒ සඟවණු සඳහාය. ඒ ඇඳුම් සියල්ල ඔහු ඇඳ ගත්තේය.

ඔහු කූඩාරමෙන් මතුව, දැනටමත් සටනට සූදානම් වෙමින් අවට සිටින මිනිසුන් දෙස බැලුවේය. හැමතැනකම සොල්දාදුවෝ සිය ආයුධ ඔප දමමින්, මුවහත් කරමින් සහ පරීක්ෂාකර බලමින් සිටියහ. සමහරෙක් වාසනාව වෙනුවෙන් නිහඬව යාඥා කරමින් සිටියහ. ඔහුගේ නිලධාරීහු දැනටමත් අවට අණ දෙමින් සිටියහ. පරාජයට ඉඩක් තිබුණේ නැත.

ඇතුන්ගේ කුංචනාදය සහ ගර්ජනාව, හක් පිඹින හඬ සහ හොරණෑ හඬද රජරට වේලි ගිය තැනිතලා පුරා පැතිරී ගියේය. රාජකීය හමුදාව, සදාතන විභූතිය, සදාතන අසහනය හෝ සදාතන සාමය යන කුමක් හෝ එකක් ලබා ගැනීම සඳහා උතුරෙහි යුද්ධයට තල්ලු වී ගියහ.

'ඇත්ත, චෝල හමුදාව, රෝහණ රාජ්‍යයේ ඉඳලා ජම්බුකොළපටුන දක්වා බලකොටු අල්ලාගෙන. ඒත් අපි ඒවයින් වැඩි හරියක් විනාශ කරගෙන යනවා. අපිට බලකොටුවට යන්න බැරිවුණොත් මහ ලැජ්ජාවක්' ඔහුගේ අශ්වයා නොසන්සුන් ලෙසින් ඉදිරියෙන් ගමන් කරද්දී බුද්ධරාජ ඔහුගේ සහායකයින් දෙදෙනාට කීවේය. ඔහු දෙපස ගමන් කළේ සෙබළුන් දෙදෙනෙකි. ඔවුන් ජීවකගම සිට පැමිණි. යාචකයන් දෙදෙනෙකි, ඔවුන් යුද්ධයේ ඊනියා විභූතිය ගැන උමතුව සිටින මෝඩ තරුණයින් දෙදෙනෙකි. බුද්ධරාජ ඔවුන් දෙදෙනා දෙස අවඥා සහගත බැල්මක් හෙළුවේය. දැන්, ඔවුන් ඔවුන්ට හැකි පමණින් ඔවුන්ගේ භීතිය සඟවා ගැනීමට අරගල කරමින් සිටිනු පෙනෙයි.

ඔවුහු අණදෙන නිලධරයාට මහත් ඕනෑකමින් සවන් දුන්හ. 'ඒත් කවුද අපට කිව්වෙ මේ යුද්දෙ ඒ තරම් ලේසි වෙයි කියලා?'

කිසිවෙක් නැත.

එය සැබෑවක් වූයේය.

'රජුද අපගේ ගමනාන්තය දන්නවා ඇති.' තරුණයින් දෙදෙනාගෙන් වැඩිමහල් තරුණයා කීවේය. ඔහුගේ රැවුල වියළි සුළඟෙහි ලෙලදුන්නේය. පසුගිය සතියේ සිට ඔහු මිනිසකුට වඩා කැලෑ සතකු මෙන් පෙනෙයි. ඔහුගේ සම දහඩියෙන්, දූළිකුණු වලින් හා දුහුවිල්ලෙන් ගන වී ඇත. ඔහුට තමා ලෙසින් පෙනී සිටීමට අවශ්‍ය වූ නිසා තරුණයා රැවුල නොබෑ බව බුද්ධරාජ දැන සිටියේය. මේ නිවට ගැමියා ගැන සිතන විට පවා බුද්ධරාජ ගෙරවූයේය.

වැඩිමහලු සෙබළාගේ මනසෙහි මේ සටන සඳහා නම් කළ මිනිසුන් රැඳී සිටියහ. සොරුන්, නොහික්මුණු විප්ලවකරුවන්, හිටපු සොල්දාදුවන් සහ ඉඩම් අහිමි ගොවීන්, මේ සියලු දෙනා එක් පොදු අරමුණක් වෙනුවෙන් රුහුණේ සහ රජරට රාජකීය රණකාමීන් සමග එක්වෙති.

'පෙරේත, මෝඩ, කමකට නැති' මේ මිනිසුන් විෂයයෙහි ඔහු භාවිතා කළ වචන මේවාය. ඔහුගේ වෙහෙසකර දැස් දර්ශන පථය දෙස යොමු වෙද්දී ඔහු මේ වචන මිමිණුවේය. චෝල හමුදා දැන් පැමිණෙමින් සිටියහ. ඔවුන් විනාශයට පත් කළා වූ පැරණි අගනුවර සිට දැන් ඔවුහු වේගයෙන් පැමිණෙමින් සිටියහ.

'එහෙනම් දැන් ඔවුන් කදම්බ ගංගාව පහු කළා' නියඟයට ඔරොත්තු දුන් ළඳු බිමක සිය භට කණ්ඩායම නවතමින්, තම රැවුල පිරිමදිමින් ඔහු කීවේය. මේ වැඩකිරීමට පහසුම ප්‍රදේශය නොවන බව ඔහු දැන සිටියේය. මේ ළඳු බිම, පඳුරුවලින් සහ කටු අකුලින් ගහන වංකගිරිය, ඔහුගේ මිනිසුන් වසර දහස් ගණනක් සිය ගම්බිම් යැයි කියාගත් පෙදෙසය. කලෙක ඔහු මෙහි ජීවත් වූ මුළු කාලය ගැන සිහිවන විට, ඔහුගේ හදවත පැරණි නගරය වෙනුවෙන් වැළපුණේය. කාලයාගේ මීදුමෙන් වැසී ගොස් දැන් අහිමිව ඇති, ශ්‍රී විභූතිය හා සමෘද්ධියෙන් යුතු වූ අනුරාධපුර නගරය වෙනුවෙන් ඔහු වැළපුණේය. ජනප්‍රවාදයෙහි සඳහන් ලංකා රජවරුන්ගේ වාසභූමිය වූ මේ භූමිය දැන් පරදේශක්කාර හමුදා නායකයන්ගේ කඳවුරකට වඩා වැඩි දෙයක් නොවීය. එබඳු අතිශය බලවත් කණ්ඩායමක් පරාජය කිරීම පහසු කරුණක් නොවේ, එහෙත් ඒ උත්කෘෂ්ට, නිර්භීත, රුහුණේ විජයබාහු රජු ලංකාවේ විවිධ ප්‍රදේශවල කඳවුරු ගසාගෙන සිටි සතුරු හමුදාවන් පරාජය කිරීම සඳහා වෙහෙස නොබලා කටයුතු කරමින් සිටියේය.

පියවි යථාර්ථයට එළඹී ඔහු කෑගෑවේය. 'කලබල වෙන්න එපා. කලබල වෙන්න එපා' සිය අශ්වයා බිය ගන්වමින් ඔහු කෑගෑවේය. උෟ හේෂාරව කරමින් ඉදිරි පා ගුවනට එසවූයේය, එහෙත් ඔහු එය යසරඟට කළේ, සැදලය අදිමින්, සතාගේ කනට කොඳුරමිනි. බුද්ධරාජ, සියලු අණදෙන නිලධාරීන් සහ අනෙකුත් සියලු දෙනා සමග ඉදිරි පෙරමුණට ගියේය. එහි ළඟා වෙන චෝලයින්ගේ අඩිහඬ දෝංකාර දුන්නේ, තැනිතලා හරහා ඇතින් එන ගර්ජනාවක් මෙනි.

චෝලයන් දැනටමත් ඔවුන්ගේ ධජය දිගහැර ගෙන සිටියහ. එය ශතවර්ෂ ගණනාවක් ඔවුන් භාවිතා කළ කුලෝත්තුංග අධිරාජයාගේ ධජයයි. ගිනි තැඹිලි පැහැ පසුබිමෙහි ගොරවමින් සිටින කොටියකු සහිත කොඩිය ඉදිරි සේනාවන් අතර විවිධ තන්හි ලෙල දෙනු පෙනිණි. වියළි සෘතුව සපුරාම ක්‍රියාත්මකව තිබිණි, ප්‍රහාරකයින් හා ආරක්ෂකයින් යන දෙපසින්ම තබනා හැම අඩියක් පාසාම දූහුවිලි නැගෙයි. දැන් චෝල හමුදාව දෙපසට බිඳී යන්නට ආසන්නය, වම් ඛණ්ඩය හමුදාවේ ප්‍රධාන සේනාවේ සිටද, දකුණු ඛණ්ඩය වඩාත් ගන පඳුරු ලඳු දෙසටද වෙන්ව යාම ආරම්භ විය. බුද්ධරාජ ඔවුන් නිරීක්ෂණය කළේය. 'දකුණු ඛණ්ඩය උපස්ථ ඛණ්ඩයක්, එහෙම නේද?' ඔහුගේ සම්මත ආයුධ රැගෙන යන්නන්, අතිවිශාල කඩු ප්‍රමාණයක් සමග යන අශ්වාරොහකයින්ට ඉඩ දී අපහසුවෙන් අයින් වන විට ඔහු මොහොතක් සිතුවේය.

අශ්වාරොහක බලඇණිය වහා පෙළ ගැසුණහ. සක්හඬ ඇසෙන විට ඔවුහු ආක්‍රමණය ආරම්භ කළහ. ලංකාවේ හොඳම අශ්වාරෝහකයෝ සියලු දෙනාම, වන ලැහැබෙහි නැගී සිටියහ. ඔවුන් සිය බලගතු කඩු අතට ගත් කල්හි දූවිලි වලාවන් ගුවනෙහි ඇති කළ දූහුවිල්ල තවදුරටත් වර්ධනය කරවීය. ඔවුහු සතුරා දෙස රුදු ලෙසින් බැලූහ. සොළී හමුදාව මහත් උද්යෝගයෙන් පැමිණෙන ආකාරය බුද්ධරාජ සුපරීක්ෂාවෙන් බලා සිටියේය.

එය ඔහුගේ සිතට වැදුණේය. නියත වශයෙන්ම මෙතැන යමක් නිවැරදි නොවන බව ඔහුට පසක් විය.

මේ වන විට සිංහල අශ්වාරෝහක හමුදාව ඔවුන්ගේ විශාල කඩු පහත්කොටගෙන, සොළී හමුදාවේ ඉදිරිපෙළ සමග සටනකට ඇවිලී

සිටියහ. ඔවුහු විවිධාකාර ධජ යටතේ, විවිධාකාරයෙන් සටන් කළ නමුදු ඔවුන් සියලුදෙනාට එක් පොදු අරමුණක් තිබිණි. ඔවුන් කපනු ලැබූ විට ලේ ගලා යන්නට විය, එසේ ලේ ගලා යන විට, ඔවුහු එය ලේ ගංගාවක් බවට පත් කළහ. අශ්වාරෝහක හමුදාව පෙළින් පෙළට සැදෙමින් සොළීන්ට පහර දුන්නාහ. ඔවුන්ගේ කඩු සතුරාගේ සිරුරු පසාරු කළේය. කඩුවලින් අශ්වයින්ගේ බඩ පසාරු විය. මිනිසා සහ සතා ඉක්මන් කුරිරු ඝාතනයට හසුවූ පසුව ඔවුන්ගේ රුධිරය සහ අතුනුබහන් රතුවන් රුධිර දහරාවක විසිරී ගියේය. වරද කොතනදැයි සෙවීම සඳහා බුද්ධරාජ සිය මොළය වෙහෙසවමින්, සිය දෑස කුඩා කොටගෙන සටන දෙස බලා සිටියද, සාපකිරීම් සහ අණකිරීම් සංස්කෘත, දෙමළ, පාලි, හෙළ සහ අනෙකුත් භාෂා ගණනාවකින් ගුවනෙහි ගෝරනාඩු දුන්නේය. බුද්ධරාජ වරද කුමක්දැයි වටහාගන්නට මොළය වෙහෙසවමින් සිය දෑස් කුඩා කොට ගෙන බැලුවේය. එවිට ඔහුට එය වැටහී ගියේය.

'සිවපාලන්' යැයි දත්මිටි කමින් කෑගසාගෙන ඔහු ඉදිරියට ගියේය. සිංහල හමුදාවේ අන් අය ඔහු පසුපස සොළීන් වෙත හඹා ගියේ හෙණ හඬ නගමින්, පළිහවලට සහ කබාවලට හෙල්ලෙන් ගසමිනි.

ඒ සිවපාලන් නම් දුෂ්ටයා ඔහුගේ හමුදා මෙහෙයවන්නට එහි නොසිටියේය. දැන් බුද්ධරාජගේ අසතුටට හේතු වූයේ, සොළීන්ගේ ඉදිරිපෙළෙහි සිටින්නන්, ලංකාවේ ඉදිරිපෙළ පැමිණෙන්නවුන් හරි මැද වලක් හාරා තිබෙනු දැකීමෙනි. ඇත්ත වශයෙන්ම, එතෙකුදු වුවත්, සොළීහු ලාංකිකයන්ගේ දැවැන්ත කඩුපහර වලට හසුවූහ, එහෙත් එයින් සිදුවිය හැකිව තිබූ යහපත කුමක්ද? ඔහු අණ දෙමින් කෑ ගසමින් සිය හමුදා මෙහෙයවීමට හැකි සියල්ල කළේය. සොළීන්ගේ දකුණු බණ්ඩය තවමත් බලා සිටියි, ඔවුන්ගේ මොහොත උදා වනතුරු බලා සිටී. කෝපයෙන් යුතුව බුද්ධරාජ ඔවුන් දෙස ඇස් ගසාගෙන සිටියේය. තවමත් ඔවුන් යුද්ධයට නොඑළඹ සිටින්නේ මන්ද?

'සිවපාලන්, මේ මොන විදිහෙ සෙල්ලමක්ද?' දත්මිටි කමින් ඔහු කෑගෑවේය. ඔහු දැන් සටන් බිමට මහලු වැඩි යැයි බොහෝ දෙනා මෑතකදී කියා ඇත, ඔවුන් හැම දෙනා එසේ කියන්නට ඇත්තේ කුමක් නිසාදැයි ඔහුට දැන් දැකගත හැකි විය. සොළීන් සිය හමුදාව තුළට කඩා වැදෙනු බලා සිටි බුද්ධරාජගේ සිතට අතීත මතකයන් පැමිණ එහි බර දැනෙන්නට විය. එහෙත් මේ සිතමින් සිටින්නට අවස්ථාවක් නොවීය.

චෝල හමුදාවේ වම් බණ්ඩය, අවසානයේදී සිංහල හමුදාවේ වම් බණ්ඩය මුණ ගැසිණි. දන් දෙපාර්ශවයම, ජය හෝ පරාජයෙහි පැහැදිලි කඩඉමක් නොමැතිව එකිනෙකාගේ සෙබළුන් විසල් සංඛ්‍යාවක් වනසමින් සිටියහ. බුද්ධරාජ සිය ලෙෆ්ටිනන්වරයා සහ ඔහුගේ අනෙකුත් නිලධරයින් කොහිදැයි සෙවුයේය, ඔහු ඉදිරියේ එකා පිට වැටෙද්දී ඔවුන් කොහිදැයි ඔහුට සොයාගත නොහැකි විය. ඔහුගේ දෑස් ශෝකයෙන් පිරී, මොහොතකට ඔහු අන්ධව ගියේය.

* *

'මගෙන් ඈත් වෙයන් මෝඩයා'

ආයුධ හා මිනිසුන් යෙදවීම ප්‍රමාද වීමේ අසුභ ආරංචිය පණිවුඩකරුවෙක් මේ දන් ගෙන ආවේය. සිවපාලන් ඔහුට පා පහරක් ගසා එලවීමේ සතුට වින්දේය. ඔහු තමා වැනිම කෙනෙක් මිස, අන් කිසිවෙක් නොසිතන ඉතා කුඩා ගම්මාන පෙදෙසක වූ බ්‍රහ්මණතිත්ත නම් තැනක කඳවුරු සාදා ගත්තේය. ඔහු සිය ස්ථූල දේහය වෙස් ලෑල්ල ඉදිරිපිට ඇති පුටුවට බර කළේය. ඔහුට මුහුණ ලා සිටියේ ඔහුගේ සහෝදරයාය. ඔහු කාලකණ්නි පෙනුමැති, පුච්චානම් බස් දොඩන, ඔහුගේ බිරිඳගේ මුදු පහස කිසිවිටෙකත් හැර යාමට නොහැකි මිනිසෙකි. 'අපි ජීවත් වෙන්නෙ මෝඩ රළකගේ ග්‍රහණයට සම්පූර්ණයෙන්ම අහුවෙලා චන්ද්‍රසේකරන්' ඔහු කනිටු මිනිසාට කීවේය. ඔහුගේ කැළැල් සහිත මුහුණ සහ අන්ධ වූ වම් ඇස ඔහු කළ යුද්ධවලින් ඔහුට ලැබුණු එකම ජය පලකයන් විය.

'හොඳයි එහෙනම්... මම... අපිට පුළුවන් නම් යන්න මෙහෙන් .., ගිහින් කොහේ හරි ජීවත් වෙන්න,..මං විශ්වාස කරනවා..' ඔහුගේ සහෝදරයා එසේ කියන්නට පටන් ගත්තේය. එහෙත් නිවටයා නිහඬ කරවීමට සිවපාලන් ඔහුගේ අත එසවූයේය.

'අපිට එහෙම කරන්න බෑ. මිනිහාගේ යුතුකම තියෙන්නෙ එයාගේ රටේ මිනිස්සුයි, එයාගේ රටයි වෙනුවෙන්'

'ලෝකය අල්ලන්න වුවමනා කරන අධිරාජයෙක් පාලනය කරන රටක් ගැන මොකද කියන්නෙ?'

'අඩුතරමින් ඔහුට පිස්සු නෑ මගේ සහෝදරයා'

'නැත්තෙ... මොකක්? අපි අධිරාජ්‍යයෙන් අයින් වෙනවා නම්, අපිට තවදුරටත් අධිරාජයා යටතේ ඉන්න වුවමනාවක් නෑ සහෝදරයා' චන්ද්‍රසේකරන් කෑගෑවේය.

සිය බිරිඳගේ පවුලේ මුදල් සියල්ලම පාහේ රන්අබරණ හා සුවඳ විලවුන් වෙනුවෙන් වැය කළ, අසීමිත මුදල් ප්‍රමාණයක් සුවඳ විලවුන්, වෙනුවෙන් වැය කළ තම සහෝදරයා ගැන සිවපාලන් එතරම් තැකීමක් නොකළේය. ඇත්ත වශයෙන්ම, සමහර අවස්ථාවන්හිදී සිවපාලන් චන්ද්‍රසේකරන්ගේ නිවසට ගිය විට සිවපාලන්ට මුකවාඩම් බැඳගන්නට සිදුවන තත්ත්වයක් තිබියදී, සිවපාලන් කිසිවිටෙක තම සහෝදරයා එතරම් බරපතල ලෙස සැලකුවේ නැත. 'දැන් දැන් මගේ පුංචි මල්ලි, මට ඔයාට යමක් කියන්න ඉඩ දෙන්න' චෙස් ලෑල්ලේ සොල්දාදුවන්ගෙන් කෙනෙක් අල්ලාගෙන ඔහු කීවේය. 'යුද්ධය කියන්නෙ ගෙට හොඳයන්ගෙ සෙල්ලමක් නෙවෙයි. විශේෂයෙන්ම මගෙන් එහා පැත්තෙ ඉඳගෙන ඉන්න ගෙට හොඳයගෙ සෙල්ලමක් නෙවෙයි' ඔහු, ඔහුගේ සෙබළ ඉත්තා හඬ නගමින් චෙස් ලෑල්ල මත තැබුවේය. 'ඔහු වටා හුඟක් දේවල් සිද්ධ වෙනවා. ඇසුයි, හිතයි ඇරගෙන ඉන්නෙ නැති කෙනෙකුට, කවදාවත් සටන් කරන්න බෑ. මට හැමතැනම ඇස් තියෙනවා. සටන් බිමේ මිනිස්සු ඉන්නවා, විශේෂ රණකාමීන් මහ රාත්‍රියේ උදාරම් ලීලාවෙන් යනවා. ඒ ගොල්ලො දන්නවා ඒ ගොල්ලන්ගේ රාජකාරිය හරියටම. මට ඉන්නවා ඒ වගේ මිනිස්සු සිය ගණනක්, ඒ ගොල්ලො මට ගේනවා හොඳ ආරංචි. මේ සටන හොඳටම කෙරෙනවා. අපිට පුළුවන් පරක්කු වුණත්, මහතිත්තයට ගිහින් අපේ ආයුධ ලබාගන්න'

චන්ද්‍රසේකරන් සුසුම් ලෑවේය. 'ඔයා ඔයාගේ කාරණේ කිව්වා. දැන් නවත්තන්න නාටකීය වෙන එක අයියා.. කොහොමහරි මට කියන්න ජයග්‍රහණය ගැන ඔයාට කොච්චර විශ්වාසද? මොකක්ද එතන වෙන්නෙ'

'මං මගේ හිතින් දකිනවා දන්නෙ නැද්ද ඔයා?' ඔහුගේ දෙතොලෙහි දුෂ්ට සිනාවක් නැගිණි.

'මොකක්..?' චන්ද්‍රසේකරන් චෙස් ලෑල්ල දෙස බැලුවේය. 'දැන් එහෙනම් මම .....'

'ඔයා දන්නවනෙ' නොනවත්වා සිවපාලන් කතා කළේය. 'ඔයා කොහොමටවත් තේරුම් ගන්නෙ නැහැ. ඔයාගෙ දෙවෙනි අලියට මං පහර දෙනකල් ඔයාගේ රජ්ජුරුවො අනතුරේ කියලා. ඊට පස්සෙත් ඔයා මං ගැන එලෙව්වා මිසක ඔයාගෙ හිතෙන් දැක්කෙ නැහැ' ඔහු ඔහුගේ හිසට තට්ටු කළේය. 'යුද්ධය ඇස් බැන්දුමක් පුංචි එකෝ' ඔහුගේ ධෝතිය අදිමින්, සිවපාලන් තම පුටුවෙහි වඩාත් පහසුවෙන් ඉඳගත්තේය. ඔහු බුම්මාගෙන සිටින චන්ද්‍රසේකරන් දෙස බලා සිනාසුණේය. 'දැන් මොකද තව අතක් සෙල්ලම් කරමුද?'

'මට තාම තේරුම් ගන්න බෑ ඔයා ඇයි ඔයාගෙ මිනිස්සු එක්ක එතනට නොගියෙ කියලා,' ඊළඟ චෙස් අත සෙල්ලම් කිරීමට සූදානම් වෙමින් චන්ද්‍රසේකරන් කීවේය. ඔහු මොහොතක් නිසලව සිට, සිවපාලන්ගේ මුහුණෙහි වූ ප්‍රශ්නකාරී ස්වරූපය දෙස බලා සිටියේය. 'මං අදහස් කළේ නෑ ඔයාව සැක කරන්න. මං නිකන්..'

'මල්ලි යුද්දෙ කියන්නෙ නිකන් ඇස් බැන්දුමක් නෙවෙයි. යුද්ධය කියන්නෙ රේස් එකක්... රේස් එකක්' ඔහු චෙස් ඉත්තෙක් අල්ලාගෙන ඔහුගේ සහෝදරයාගේ ඉත්තන්ගෙන් එකෙකුට ඉන් තට්ටු කළේය. 'රේස් එකක් හැම තිස්සෙම දිනන්නෙ සන්සුන්ම සහ ශක්තිමත්ම හිතක්. මගේ හිත එරෙහියි බුද්ධරාජගෙ හිතට. ඒක එහෙමයි. කඩු කස්තාන, පළිහ, අශ්වයො, යුද්ධ රථ, අලි ඔක්කොම,ඒවා ඔක්කොම අපි දෙන්නගේ උදව්වට.'

'බුද්ධරාජ සහ මම..' සිවපාලන් සිතුවේය.

ප්‍රථම වරට මිනිසුන් දෙදෙනා හමු වූයේ ලංකාවේ නිරිතදිග, දක්ෂිණ දේශයේදීය. සිවපාලන් කොලනියට පත් කළ හොඳම අණදෙන නිළධාරින්ගෙන් කෙනෙකු යටතේ සොළී හමුදාව සමග ගොස් පැරණි කොටුව අල්ලා ගත්තේය. එය නිර්නාමික වූ අතර, මතකයෙන් ගිලිහිණි. කිසිවකුට එය එතරම් වැදගත් වූයේ නැත. එහෙත්, ඔවුන්ගේ නායකයා එහි වටිනාකමක් දුටුවේ නම්, එවිට සෙබලුන් එය ආරක්ෂා කිරිමට සූදානම්ව සිටියහ.

අවසානාවකට මෙන් මිනිසුන්ගෙන් බොහෝ දෙනා, තරුණයින්

වූ අතර පුහුණුව අවසන් කළ නවකයෝ වූහ. ඔවුන්ගේ නිළධාරීන්ගේ නායකත්වය හා අත්දැකීම් සහ ජයග්‍රහණය උදෙසා ඔවුන්ගේ යාඥාවන්ට, ඔවුන් සටන් කළ යුද සටන් බිමට ඔවුන් සූදානම් කරවීමට නොහැකි විය. අඩුම තරමින් කොටුව වටලෑම හෝ කළ නොහැකි විය.

දුනුවායෝ පෙළ ගැසුණහ, ගේට්ටු අවහිර කෙරිණි, න්‍යායාත්මකව සියල්ල හොඳින් සිදුවන බව පෙනෙන්නට විය. එහෙත් දුනුවායන් සමග සිටි සිවපාලන් එය පරාජය වන යුද්ධයක් බව තේරුම් ගත්තේය. ඔහු මරණය අද්දර සිටියදී, සිංහල සිංහයෝ ඔවුන්ගේ බලගතු භයානක නිය බඳු ඇමුණුම් කොකු ආරක්ෂක පවුරු වෙත දමා ගැසූහ. සතුරා උඩටම උඩටම නගිමින් සිටියහ, චෝල දුනුවායෝ සිංහලයින් වෙත අප්‍රමාණ ඊතල ප්‍රහාරයක් එල්ල කළද, සතුරා ඔවුන්ගේ හිස්වලට උඩින් පළිහ ඔසවා ඒවා තල්ලු කර දැමූහ. ප්‍රාකාර බිඳීමට යොදන යුද්ධෝපකරණ ගේට්ටුවට පහර දෙන අතරතුර, කුංචනාද කරමින් එන ඇත් සේනාව ඇතින් එන හඬ පැහැදිලිව ඇසිණි. ප්‍රහාරකයෝ ආරක්ෂයින් වෙත ගිනිදැල් සහිත ඊතල විද්දහ, මෙය දැන් තරමක වේලාවක් තිස්සේ සිදුවන්නකි. කොටුවෙහි විවිධ කොටස් ගිනි ගනිමින් තිබුණේය. ඇත් හමුදාව බලකොටුවට ළඟා විය. විශාල සත්තු ගේට්ටුව කුඩු පට්ටම් කොට බලකොටුව විනාශ කළහ. මහත් කලබලයෙන් හිස් ලූ ලූ අත දුවමින් චෝල හමුදාවන්ට ඇත්තු සිය දළවලින් පහර දුන්නහ.

ඔවුන්ගේ මිනිසුන් පලා යා නොදී රඳවා ගැනීමට උත්සාහ කරන කොටු පවුර මත සිටි චෝල අණදෙන නිලධාරීන්ට ඉතා අසීරු අවස්ථාවකට මුහුණ දීමට සිදුවිය. කොටුපවුරු සටනක් කිරීමට ඉඩක් නොතිබුණු අතර දෙපාර්ශවයෙන්ම සෙබළු මැරී වැටෙන්නට වූහ. ලංකා සෙබළුන් චෝල ධජය කපා දැමීමට උත්සාහ කරන අවස්ථාවේදී සිවපාලන් ද්වන්ධව සටනකට සැරසුණද, ඔහුගේ සතුරාගේ කඩුව ඔහු පෙති ගැසුවෙන්, අවසානයේදී එහි මිල ගෙවීමට සිදුවිය. ඔහුගේ නළලින් ලේ ගලා ආවේය, ඔහු බිම ඇද වැටුණි. 'කවුරුහරි මට උදව් කරන්න' ඔහු දුබල ලෙස කෙඳිරි ගාමින් බඩගාගෙන යාමට උත්සාහ කළේය, ගලා එන රුධිරය ඔහුගේ පෙනුම අවුල් කළේය, එමෙන්ම ඔහුට බාධා කළේය.

තව ඇමුණුම් කොක්කක් දියත් වූ අතර, සිංහල අණදෙන නිලධාරියෙක් තාප්පය උඩින් මතු විය.

ඔහු සිය වම් අතින් සුළඟෙහි ලෙල දෙන ධජයක් ආඩම්බරයෙන් අල්ලාගෙන සිටියේය. ඒ සමගම ඔහු වේදනාවෙන් කෑගසමින් සිය සහෝදරවරුන් සොයන, සිය ලේ ගලන මුහුණ අල්ලාගත් බිම වැටී සිටි චෝලයා දෙස බැලුවේය. අඩු තරමින් තිස් පහක් පමණ විය හැකි ඔහුට මල්ලව ශූරයකුගේ බලසම්පන්න ශරීරයක් තිබුණේය. තුවාල ලැබූ සිවපාලන්ට, ලාංකික අණදෙන නිලධරයා පෙනුණේ ඉතා නිවුණු, වැඩි කතාබහක් නැති, කෙනෙකු ලෙසිනි, එබඳු කෙනෙකුට සිය මග ඇති ඕනෑම බාධකයක් ඉවත් කිරීමේ හැකියාවක් තිබෙන්නට ඇති බව ඔහුට දැනිණි. ඔහු පෙනුණේ ඔහුගේ දිව්‍ය වාසයෙන් බිමට පැමිණි ශක්‍ර දෙවියන් සේය. මේ මිනිසා ඔහුගේ මිනිසුන්ට කෑ ගසමින් සිටියේය, එහෙත් ඒ ආදරයෙනි. ඔහුගේ දෑසේ වූ ඒ ආදරණීය හැඟීම ඔහුගේ සොල්දාදුවන් හැමදෙනාගේම දෑසින් පිළිබිඹු විය. ඔවුහු විශ්වාසී, දරුණු, කාර්යක්ෂම, සහ බලවත් අය වූහ. කොටුවෙහි නැගෙනහිර පැත්තෙහි සිටි ඔහුගේ මිනිසුන් දෙසට සිංහල අණදෙන නිලධරයා පරිපූර්ණ විලාසයකින් සිය කඟපත ලෙල දෙවනු සිවපාලන් දුටුවේය.

'යුද්ධය කියන්නේ හැබෑවටම මේකද? අහෝ, සිවගේ නාමයෙන්, මේ නම් මුග්ධ බවය. මේ නම් අවුල් ජාලයක්. මේ... මේ යුද්ධයක් නොවෙයි' සිය දෑතින් තමාගේ සිරුර ඉදිරියට තල්ලු කර ගන්නා අතරතුර ගල් පොලොවෙහි සිය ලේ පහරවල් වැගිරෙද්දී සිවපාලන් සිතුවේය.

ලාංකික සටන් දෙවියා ඔහු ඉදිරියේ සිට ගත්තේය. සිවපාලන් නැවත ඒ මිනිසා දෙස බැලුවේය. සිය දෑසෙහි ලේ මුසු බැල්මෙන් සියුම් ලෙස පිරික්සා බැලුවේය. අනතුරකට භාජනය වීමේ ඉඩකඩ ඇති, අසාමාන්‍ය කෙනෙක් ඔහු දුටුවේය. 'උඹ බොරු කාරයෙක්' ඔහු එක් දණක් තබා නැගී සිටිමින් කෑගෑවේය. 'ඔය.. ඔය... ශක්තියෙ ... අර... ඔහේගෙ නිතරම තියෙන පෞරුෂත්වය. ඒක කවදාවත් මොන යුද්ධයක්වත් දිනන්න ඔහේට උදව් වෙන්නෙ නෑ. මගේ මිත්‍රයා. අපි ඔහේලගේ දුක්ඛිත ලංකාව. ඒ තමයි... චෝල මණ්ඩලය. ඒක දැන් අපේ. රාජේන්ද්‍ර අධිරාජයාගේ නාමයෙන්'

'හොඳයි, දැන් එහෙනම් මොකද්ද ඔහේලගේ උපක්‍රමය?' සිය කලවයට කඩුවෙන් තට්ටු කරමින් සිංහල අණදෙන නිලධරයා ඇසුවේ ඔහු ඉක්මනින් ඉවරයක් කර දැමීමේ උනන්දුව ඇතිවය.

සිවපාලන් සිනාසුණේය . 'අනුමාන කරන්න'

සිංහල නායකයාට පසුපසින් සිට චෝල සහෝදරයකු වැරයේ පහරක් එල්ල කළ හෙයින් පසුපසින් විශාල බලයක් පැමිණියේය. දැඩි ප්‍රහාරයෙන් ඔහු දණින් වැටී පෙරලී ගියෙන් අණදෙන නිලධරයා කෑගැවේය. ජයග්‍රාහී ලෙස සිනාසෙමින් ඔහු විසින් ඇදගෙන ගිය සිවපාලන් අසල ඇද වැටීමෙන් ඔහුගේ මුවින් ලේ ගලන්නට වූයේය.

අණදෙන නිලධරයා වැටීමෙන් පසුව, සිංහල හමුදාවන්ගේ විශ්වාසය බිඳී ගියේය, චෝලයින් ඔවුන් කොටුවෙන් පන්නමින් පහර දුන්හ. චෝල අණදෙන නිලධරයා සිය හමුදාවන්ට ඔවුන් පලවා හැරීමට නියෝග දුන් අතර, පලා යන සතුරාට ඔවුහු පහර දුන්හ. බොහෝ දෙනෙක් සිරකරුවන් ලෙසින් අල්ලා ගනු ලැබිණි, එසේ අල්ලා නොගත් අය, සටන් බිමෙහිම තුවාලවලින් මියෙන්නට ඉඩ හැරියහ. නැවත වරක් චෝල ජයග්‍රහණය උදා විය. සමහර විට දැන් ඔවුන්ට කාලයකට විවේකීව සිටින්නට හැකිවනු ඇත.

සිවපාලන්ගේ මුහුණ තුවාලවලින් වේදනා දුන් අතර වයෝවෘද්ධ වෛද්‍යවරයා ඔහු සහ අනෙකුත් අය මේසවලට තබා බැන්දේය. ඔහු ආයුර්වේද ඖෂධ බොහෝ ප්‍රමාණයක් සූදානම් කළේය. දේශීය ඖෂධ හා ප්‍රබල වේදනා නාශක සියල්ල එකට එක්කොට තිබිණි.

'සිවපාලන් ඔයාගේ තුවාල බරපතලයි' වෛද්‍යවරයා කීවේය. 'ඒත් ජීවිත අනතුරක් නෑ. කාලයක් විවේක ගන්න කියලා මම ඔබට අවවාද කරනවා. අඩුතරමින් තුවාලවල සැරව නැහැ කියලා දැනගන්න කල්. ඇත්තටම මම....'

'මං ඔබට ඇහුම්කන් දේවි කියලා ඔබ හිතන්නෙ මොන කාරණයක් උඩද? මං කියන්නෙ, බලනවා වටපිට' වේදනාවෙන් කෙඳිරිගාමින්, ජීවිතය බේරාදෙන ලෙස ඉල්ලා දෙවියන්ට කන්නලව් කරමින්, තුවාල ලැබූ මිනිසුන් දිගෑදී සිටින ඇඳවල් දෙස ඔහු ඉඟි කළේය. 'ඒ හැමෝම මියැදෙමින් ඉන්නවා. මේ හැබෑ යුද්ධයක්ද? අවුරුදු ගණනකට කලින්, අර මෝඩ බේබදු රජ්ජුරුවො එක්ක අපි සටන් කළේ මෙහෙමද? ඒ කාලෙ, අපි අපේ මොළේ පාවිච්චි කළා. නැද්ද? හොඳයි, මෝඩයෝ රංචුවක් වගේ

සටන් බිමට දුවන එක අපි නවත්තන්න ඕන. වෙන මොකක් හින්දද, අද අපි පරාජයට මෙච්චර ළං වුණේ?'

ඔහුගේ අණදෙන නිලධරයා සිවපාලන් සිටි තැනට පැමිණි අතර ඔහු කතාවට ඇහුම්කන් දුන්නේය. ඔහුගේ මුහුණෙහි බලවත් කෝපයක ලකුණු සටහන් වන්නට විය. 'මොනවද උඹ කියන්නෙ පර ශුද්‍රයා?' ඔහු ගෝරනාඩු කළේය. 'උඹ දන්නවද කොහොමද අපිට මේ යුද්දෙ දිනන්න පුළුවන් කියලා. අපි අපේ මොළේ පාවිච්චි කරනවා, අපේ උපක්‍රම භාවිතා කරනවා. ඒත් ඒ ඔක්කොටම වැඩිය උඹේ මිනිස්සුන්ට, උඹේ සහෝදරවරුන්ට ආදරය කරපන් මෝඩයා! අනික් සැරේ, කතා කරන්න ඉස්සෙල්ලා හිතපන්'

'ඒත්, මගේ නායකතුමනි' ඔහුගේ මුහුණ වෙළුම් පටිවලින් බැඳ තිබුණු හෙයින් සිවපාලන් අවඥා සහගතව සිනාසුණේය. 'ඔබ දන්නවද ඇයි ඔබ මෙතනට ආවේ කියලාවත්? සාමාන්‍ය මෝඩයකුගේ තත්ත්වෙ ඉඳලා ඔබ දැන් ඉන්න තත්ත්වෙට උසස් වුණේ ඇයි කියලා?'

'ඔය ඇති...'

'මිනිස්සුන්ට සටන් කරන්න දිරිමත් කරන්න පෙන්වන ආදරය ප්‍රමාණවත් නෑ. මං කැමතියි මුළු හිතින්ම සටන් කරන මිනිහෙක් වෙන්න. අපේ කොටුව සුණු විසුණු කරන්න ආපු ලාංකික මිනිහා වගේ මිනිහෙක් වෙන්න. ඇයි නැතුව?'

මහා ගර්ජනාවකින් පසුව, අණදෙන නිලධරයා සිවපාලන්ගේ මුහුණට දැඩි ප්‍රහාරයක් එල්ල කළේ අනෙකුන්ද බියෙන් වෙව්ලුවමිනි.

නැවත විවර වූ තුවාලය ද ඇතිව, තරුණ රණශූරයා තවදුරටත් කතා කළේය. 'යුද්ධය කියන්නෙ මායාවක්... පොඩ්ඩෝ'

'සිවපාලන් ඔය ඇති' සිවපාලන්ට මේසයෙන් නැගී සිටීමට උදව් කළ මිත්‍රයෙක් කෑගැවේය. 'සර් මගේ මිත්‍රයා දන්නෙ නෑ එයා මොනවා ගැනද කතා කරන්නේ කියලා. ඔහු... ඔහු සමාව ඉල්ලනවා ඔහුගේ මෝඩකමට. ඉතින්...'

සිවපාලන් ඉවතට ගෙන යනු දුටු විට අණදෙන නිලධරයා

පරීක්ෂාවෙන් බලා සිටි අතර ඔහුගේ මුහුණ තවමත් වෙස්මුහුණක්ව පෙනිණි. ඔහු මේස පේළිය පසුකර ගෙන යන විට ඔහුගේ වැටලීම් ගැන සිතමින් කසු කුසු හඬ නගනු ඇසිණි. ඔහුගේ පළමු වැටලීම.

'හරිහාර්, මං හොඳින්' ඔහු මුදු ලෙසින් සිය සගයාට කීවේය. අනතුරුව ඔවුන් වාට්ටුවෙන් පිටතට එනවිට ඔහු ක්ෂණික හැරවුමක් ගත්තේ සිය පියවර හෙමින් දිවීමක් බවට පරිවර්තනය කරමිනි.

කොටුවේ අංගනය හරහා ඔහු පය ඉක්මන් කළ ගමනින් පැමිණි හරිහාර් 'බලපන්' යැයි කීවේය. 'ඔයා මොකක් කරන්න සැලසුම් කළත්, මට කියන්න පුළුවන් ඒක අවසාන වෙන්නෙ විනාශයකින් කියලා. කොහොම හරි, ඒක එහෙම නෙවෙයිද?' සිවපාලන් නැඹුරුව බැලූ ගොඩනැගිල්ල දෙස ඔහු බැලුවේය. 'ඒගොල්ලො කොහෙද හිරකාරයො තියාගන්නෙ? ඔයා මොනවද කරන්නෙ?' ඔහු සිය මිත්‍රයාගේ අත අල්ලා ගැනීමට උත්සාහ කළේය, එහෙත් සිවපාලන් ඔහු තල්ලු කර දැමුවේය.

ගොඩනැගිල්ලෙහි පැරණි සහ දුහුවිලි පිරුණු, මීයන් පොරකමින් සිටින, කුටි රාශියක් තිබිණි. බුද්ධරාජ එහි එක් කුටියක ඉඳගෙන සිටියේය, ඔහුගේ මුහුණ සහ අත් දරුණු ලෙස තුවාල වී තිබිණි. වේදනාව ඔහුගේ සිරුරේ පුපුරු ගසමින් තිබිණි. ඔහු නැගිට කුටියෙහි පිවිසුම අසලට ගොස් යකඩ කූරු අතරින් ඇස් දල්වා බලා සිටියේ, ලේ පිරුණු ඇස් ප්‍රදේශය විනිවිද බලමින් සිය ඇඟිලිවලින් කල්පනාවකින් තොරව අතගාමිනි. තමාගේ කුටිය දෙසට එන සිවපාලන් දුටු ඔහු 'නුඹ' යැයි ගෙරවූයේය.

'ආ! සැප පහසුද?'

බුද්ධරාජ ගෙරවූයේය.

සිවපාලන් කලබලයක් නොමැතිව කතා කළේය. 'එහෙම හිතනවා. හොඳයි. ඉතින් මට කියන්න, කොහොමද කියන්න ඔබට දැනෙන්නෙ ප්‍රහාරක හමුදාවක නායකයා වෙලා ඉඳලා ඔය දැන් ඉන්න තත්ත්වෙට වැටුණම? අලුත්ම පහළ තැනක්, ඔයාට ලැබෙන්න පුළුවන් අන්තිම පහළ තැනක්'

'මොනවද උඹට ඕන, මෝඩ කොල්ලෝ?'

සිවපාලන් විරිත්තුවේය. 'මට පේනවා නිදහස ඔබට කෙතරම් වුවමනාද කියලා මේ ආරක්ෂකයො මගේ මිත්‍රයො. ඒක සහතික වෙන්න පුළුවන්. ඒත් මං හිතනවා ඔබට මට දෙයක් කියන්න තියෙනවා කියලා. ඔබ කවුද?'

'ඒක උඹේ වැඩක් නෙවෙයි'

'හොඳයි' ඔහු සිය මුව වසාගත් විට තමාගේ මානය මදක් බිඳී ගිය වගක් සිවපාලන්ට දැනුණි. 'සාමාන්‍යයෙන් ඔබ යුද්ධය ගැන හිතන්නෙ මොනවද? ඔබ ඔබේ හදවතට හරි හිතට හරි ඇහුම්කන් දෙනවද? අණදෙන නිලධාරීතුමනි?'

පුදුම සහගත ප්‍රශ්නයෙන් විමතියට පත් වූ බුද්ධරාජ හිස ගස්සා පසෙකට ගත්තේය. ඔවුන්ගේ ඇස් මොහොතකට මුණ ගැසිණි. තරුණ චෝලයා ඒ මුහුණෙහි ගම්‍යමාන වූ යමක් දෙස උදාසීන බවකින්, බලාසිටියේය. බුද්ධරාජ පසුපසට වූයේය. ඔහු තමාගේ ඇඳෙහි ඉඳගන්නට ගියේ සිය එසවූ දෑත් දෙස බලමිනි. මොහොතකට පසුව, දොර අගුල කරකැවෙන හඬක්, තරුණ සොල්දාදුවකු ඇතුළු වන විට දොරෙහි ඇති වූ කිරි කිරි හඬක් ඔහුට ඇසිණි. චෝල ඔහු ඉදිරියට පැමිණියේය, බුද්ධරාජ, අවසානයේදී ඔහු දෙස බැලුවේය.

'මං මොකටද සවන් දෙන්නෙ කියලා ඔබ ඇහුවා. හොඳ ප්‍රශ්නයක්. බෙහොම කාලෙකින් මගෙන් කවුරුත් එහෙම අහලා නෑ. ඉතින් ඇයි මම ඔබට කිව යුත්තෙ? අපි එක පැත්තෙ නෙවෙයි! ඒත්...' ඔහු මොහොතකට නිහඬ වූයේය. ඔහුගේ ගොරෝසු ඇහිබැම එකට එක්විය. 'අහන්න, නුඹ නුඹේ ජීවිතය පරදුවට තබන්න ඕන. නුඹ අනෙක් අයගේ සපත්තුවලට බහින්න ඕන. ඔවුන් ඔවුන්ගේ අවි ආයුධ අතට ගත්ත හැම අවස්ථාවකම ඔවුන්ට ඇති වෙච්ච වේදනාව තේරුම් ගන්න. ඔබ දන්නවද මං කොයිතරම් තරුණයන්ට පුහුණුව දීලා තියෙනවද? කී දෙනෙක් ඔවුන්ගේ පළමු සටනේදීම මැරිලා තියෙනවද? ඒ සටන් කළේ අපි අපට කියාගත්තු ආකාරෙට... අපි අපේ භූමිය කියලා කියන එක නිදහස් කරගන්න. 'සිය රැවුල කසමින්, දූප්පත් ලංකාව ගැන බරපතල අන්දමින් සිතමින් ඔහු හුස්ම ගත්තේය. 'හොඳයි, මං පුදුමයට පත්වෙමින් ඉන්නවා අපිට පුළුවන්ද කියලා ලංකාව අපේ භූමිය කියලා තවදුරටත් කියන්න. ඒත් බලන්න, මං

ඒ මිනිස්සු ගැන හිතුවෙ නැත්නම්, ඔවුන් ආරක්ෂා කරගන්න උපක්‍රම දශලක්ෂයක් මම හදන්නෙ නැති වෙයි, ජයග්‍රහණය ලබාගැනීමට ඔවුන්ට උදව් කරන්න, මං එහෙම කරයිද?'

තරුණ සොල්දාදුවා බුද්ධරාජ දෙස බැලුවේ ඔහුගේ වචන උකහා ගන්නට උත්සාහ කරන්නාක් සේය.

'ඒත් ඉන්න, ඉතින් ඔබ කියනවා අති විශිෂ්ට උපාය දක්ෂයෙක් තමන්ගෙ මිනිස්සුන්ට ආදරය කරන්න ඕන කියලා. හදවතටයි හිතටයි කවදාවත් බෑ සටන්බිමකදී එකමුතු වෙන්න, ඔබ මුළා වෙලා. කාටහරි ආදරය කරන එක, කුමන දේකට හරි ආදරය කරන එක අවධානය වෙන අතකට හරවනවා. සටන්බිමේ උපක්‍රමවල ගණිතමය හැකියාවන් සූත්‍රනය කරනකොට ඒකාග්‍රතා බලය ඉවතට ගන්න දෙයක් ඒක. ඔබේ හතුරා රැවටීමත් සැලස්මෙ කොටසක්, නැද්ද? රැවටීම කියන්නේ යුද්ධයේම කොටසක් නොවෙයිද?'

ඔහු මදක් වෙව්ලා, ඔහුට ඉදිරියෙහි වූ බිත්තිය දෙසට හැරුණු විට සිංහල නායකයාගේ හැඟුම් ප්‍රකාශනයෙහි හිස් බවක් සිවපාලන් දුටුවේය. 'මං නිවැරදි වෙන්න ඕන, හරිද?' සිය හිසකේ අතරින් ඇඟිලි යවමින් ඔහු සිනාසුණේය.

'කවුද මේ කොල්ලා?' බුද්ධරාජ දැනගන්නට කැමති වූයේය. කොහොමද එයා කියන්නෙ එයාගෙ හිතේ කා ගැනවත් කිසිම විදිහකින් ආදරයක් නෑ කියලා. ඔහු මේ ගැන කතාකරන කොට ඔහු කියන්නෙ තමන් ගැනමද... භයානක සත්‍යය.? මේ ළමයා අණ දෙන නිලධරයෙක් වුණොත් සහ එහෙම වෙනදාට දෙවියො මාව බලාගන්න ඕන' ඔහු, පපුවෙහි දෑත් තබාගෙන සිටි චෝලයා දෙස සියුම් ලෙස බැලුවේය. ඔහු කෙට්ටු, පැතළි, මාංශපේශී ඇති නපුරු, එමෙන්ම මිනීමරන්නට බලා සිටින කොටියකු මෙනි. සුසුම් හෙළමින්, බුද්ධරාජ අවසානයේදී මෙසේ කීවේය. 'ඔව්, රැවටිල්ලයි යුද්ධයයි එකට යන්න ඕන තරුණයා'

චෝල සොල්දාදුවා නැවත සිනාසුණේය, එහෙත් උණුසුම් ලෙසින් පෙනෙන ඔහුගේ සිනාව පසුපස වූයේ මිනියක වැනි සීතලයයි. බුද්ධරාජ අපහසුවෙන් ඔහුගේ බර, ඇඳෙහි තැබුවේය. ඔහු ඉදිරියේ සිටින

තරුණයා වෙනස් වෙමින්, පරිවර්තනය වෙමින් තමා ඉදිරියේ සිටිනු පෙනිණි. සැණෙකින්ම තද රතු ඇස් ඇතිව, තම ආත්මය දෙස නෙත් යොමු කොටගෙන සිටින, මහසෝන් යක්ෂයා ලෙසින් බුද්ධරාජ ඔහු මවා ගත්තේය.

'හොඳයි'

බුද්ධරාජ යළි යථා තත්ත්වයට පැමිණියේය. චෝල සෙබළා යන්නට සූදානම්ව කුටියේ දොර අසල සිටියේය. 'නුඹේ හැඟීම් පැත්තකට දාන්න මහලු මිනිහෝ. යම් දවසක් ඒවි ඔබට නියම සොල්දාදුවෙක් වගේ සටන් කරන්න. මම විශ්වාසය තබන්නේ ඒ ගැන. හොඳයි, ඇත්තටම' සොල්දාදුවා කීවේය. 'මට පුළුවන් නුඹට එළියට යන්න දෙන්න, ඒත් ඔබ මේ අවට හිටියත් මට කමක් නෑ. පොඩ්ඩක්වත් කමක් නැහැ.'

වාතය වඩ වඩා සීතල වෙද්දී සුළඟ වේගවත් හා දැඩිවෙද්දී බුද්ධරාජ සීතලෙන් වෙව්ලමින් ඇඳෙහි සිටියදී ඔහු යන්නට ගියේය. ඔහුගේ නිදහසේ යතුරු ඒ තරුණ සෙබළා අතෙහි විය. දැන් කුමක්ද?

අවසානයේ, නින්ද තමා වෙත පැමිණේවායි ඔහු යාඥා කළේය.

***වසික උඩුරාවන*** *දැනට ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ ශිෂ්‍යයෙකි. ඔහු සාහිත්‍ය සහ ඉතිහාසය හදාරයි. අතීතය පිළිබඳ ඔහුගේ මෝහනය, ක්‍රි.ව. දහවැනි සියවසේ චෝලයින් ශ්‍රී ලංකාව අත්පත් කර ගැනීම පිළිඳ ජනතාවගේ ඇසින් කියැවෙන ඓතිහාසික නවකතාවක් ලිවීමට ඔහු පෙළඹවීය. එමෙන්ම ඔහු කාල්පනික ප්‍රබන්ධ කෙරෙහි කැමැත්තක් දක්වයි. මෙම කතාව කුමක් සිදුවන්නට තිබිණිද යන්න ප්‍රතිනිර්මාණය කිරීමකි.*

# ළැදැරියකගේ අරුණෝදය

### *ලාවන්‍යා පරමනාදන්*

වහලය අතරින් එහි දිගු කිරන විහිදමින්, තල් අතු උඩින් එබී බැලූ හිරු, එසේ එබී බැලීම දැන් නිමා කළේය. පෙරදින රැයේ වට මහ වර්ෂාවෙන් පසු අවට වාතය තවමත් තෙතමනයකින් යුක්තය. දවසේ අන් කවර වේලාවකවත් නොවූ පරිද්දෙන් මහ හඬින් සිවුරුහන් හඬ නගමින් හා තල් අතු උඩින් ගීතිකා ගයමින් කුරුල්ලෝ පියැඹූහ. අම්මා මට හඬ ගසන විට, මම මගේම ලෝකයේ තනිව මඩ කේක් සාදමින් සිටියෙමි. ඇගේ හඬ ආවේ කුස්සිය දෙසිනි. ඇගේ අඩි හඬ ළඟින් ඇසෙන්නට විය, මා දෙස බොහෝ උනන්දුවෙන් බලමින් මා ඉදිරිපසින් පෙනී සිටි අම්මා දෑත ඉණෙහි ගසාගෙන සිටියාය. 'ඔයාට ඇහෙන්නෙ නැද්ද මීරා කුට්ටි?'

ඇගේ ඇමතුමට පිළිතුරු දෙන්නට මගේ කැමැත්තක් නොමැති බව පෙන්වන්නට මා මගේ දෙතොල් සපාගෙන ඇය දෙස බැලුවෙමි.

ඇය දණ ගසා, මා ඇය වෙත ඇදගෙන, ඇගේ දෑත් මගේ උරහිස මත තබාගෙන කතා කළාය. 'ඔයා දන්නවද මීරා කුට්ටි, දවස් කීපෙකින් ඔයාගෙ අප්පා යාපනේට එනවා. එයා අපිත් එක්ක මාසයක් ඉන්න එන්නෙ. ඔයා එයාව බොහොම උණුසුම් විදිහට පිළිගන්න ඕන' මම ඇයගේ ප්‍රවෘත්තිය ගැන උදාසීනව, අම්මාගේ සිරුරට තෙරපෙමින් නැගී සිටියෙමි. ඇය මට නුහුරු දේ ගැන සහ මගේ ලෝකයට බොහෝ දුරස්ථ දේ ගැන කතා කරමින් සිටියාය.

අප්පා ආපසු පැමිණීම ගැන ප්‍රවෘත්තිය මට සතුටක් හෝ ශෝකයක් ගෙන ආවේ නැත. මගේ කුඩා ලෝකය සෑදී තිබුණේ අම්මා සහ මගෙනි. අප්පා නිරතුරුවම මේ ලෝකයෙන් බාහිර ඇත්තෙකු වූයේය. ඔහු මට ආගන්තුකයෙක්, හුදු සෙවනැල්ලක් පමණක් විය. මට වයස අවුරුදු හයක් වුවත්, ඔහු පිළිබඳ මතකයක් නොවීය. අම්මා මට ඔවුන්ගේ මංගල පින්තූර පෙන්වා තිබිණි. ඔහුට දීප්තිමත් ඇස්, සිහින් තොල්, ගන ඇහි බැම හා ගන රැවුලක් ද තිබිණි. ඔහු අම්මාගේ පැත්තකින් සිටි හැම ඡායාරූපයකම ඔහුගේ මුහුණෙහි දයාන්විත සිනාවක් තිබුණේය. මම මගේ දෙමාපියන්ගේ මංගල ඡායරූප ඇල්බමය දකින විට, අපගේ ඥාතීන් ඒ පින්තූර දෙස

බලන විට, අප්පාගේ මුහුණ මත මගේ දබරැගිල්ල තබා, ඔහුගේ ගන රැවුල අල්ලා 'අප්පා'යි කීමට කිසිවිටෙක පසු නොබෑවෙමි. අම්මාගේ මුහුණ එවිට කාන්තියෙන් බැබළෙයි.

ඔහු මට කෙතරම් ආදරය කළේද යන්නත්, මා ඔහුගේ දෝතෙහි තබාගෙන සිටින්නට ඔහුට වුවමනා වූ බවත් අම්මා නිතර මට කීවාය. මා අම්මාගේ ගර්භාෂයෙහි සිටින විට මගේ හෘද ස්පන්දනය අහන්නට ඔහු කෙතරම් ප්‍රිය කළේද? ඇයට දුවක ඕනෑ වූ අතර, මා උපන් විට, ඔහුගේ ඒ සිහනය සැබෑ විය. එසේ නම්, මේ අභාග්‍යසම්පන්න යුද්ධය අප සියලු දෙනා වටා තිබියදී සහ අපගේ ජීවිත පරදුවට තිබියදී ඔහු මා සහ අම්මා හැර ගියේ මන්ද?

වැලිගෙවල් සාදන අපේ සෙල්ලම කරමින් සිටින විට, යාබද නිවසෙහි මගේ මිතුරිය සමග පසුගිය මාසයේ ඇති වූ දබරය මට දැන් යළි සිහිවෙයි. දබරය ඇරඹුවේ අනූය. 'බලන්න මගේ ගේ තමයි හුඟක් ලස්සන ගේ' ඇය උසම වැලිගෙය පෙන්වන්නට වූවාය. 'මගේ තාත්තා හැම තිස්සෙම කියනවා මං ලොකු වුනහම මට අර වගේ විශාල ගෙයක් හදලා දෙනවා කියලා'

'තාත්තා' යන වචනය ඇසීමෙන් මගේ හදවතෙහි පුදුමාකාර කැළඹීමක් සහිත හැඟීමක් ඇති විය, මම කිසිවක් කතා නොකළෙමි. මගේ අපහසුතාව තේරුම්ගත් අනූ, මා කෝප ගන්වන්නට මෙන් කතා කළාය. 'මීරා ඔයා ලොකු වුණහම කොහොමද? ඔයාට තත්තා කෙනෙක් නෑ. ඉතින් කවුද ඔයාට ගෙයක් හදන්නෙ?' ඇයට පියෙකු සිටීම ගැන ආඩම්බරයෙන් යුතුව ඇය හිස සෙලවූවාය.

'මට තත්තා කෙනෙක් ඉන්නවා. අම්මා කිව්වා මට එයා ඉන්නෙ පිටරටක කියලා'

'ඕ ඔයාගේ තාත්තා ඔයාව දාලා ගිහිල්ලා'

හුස්ම මගේ පපුවෙහි හිරවනු මට දැනිණි. මම නැගිට ගෙදර දිව ගියෙමි. පසුව තවමත් කුස්සියේ සිටින අම්මා දුටු විට, අප්පා පැමිණෙන්නේ කෙසේදැයි මම ඇසුවෙමි.

'එයා කොළඹට එන්නෙ ගුවන් යානයක, ඊළඟට යාපනේට එනවා නැවක' අම්මා පිළිතුරු දුන්නාය.

'අප්පා එන්නේ බෝම්බ දාන ගුවන් යානයකද?'

අම්මා ගල් ගැසී සිටියාය. මගේ ප්‍රශ්නය ඇගේ දෑසට කඳුළු ගෙන ආවේය. ඇය පිටි අල්ලෙන් ඒ කඳුළු පිස දැමුවාය. ඇය උගුර පෑදුවාය. 'නෑ මගේ මීරා කුට්ටි. අප්පා බෝම්බ දාන ගුවන් යානයක එන්නෙ නෑ'

ඇගේ පිළිතුරෙන් මම සෑහීමකට පත් නොවීමි. මම මා උපන් දා සිටම ගුවන් යානා දැක ඇත්තෙමි. ඒවා අපේ ලස්සන නිල් අහසෙහි, එහි නිසංසල බවට බාධා කරමින් සැරිසරයි. රාත්‍රියේදී, රාක්ෂයෙක් මෙන් ගුවන් යානයක් අහස ආක්‍රමණය කරන විට, සඳ සහ තාරකාවන් කැබලි වී අප හිස මතට වැටෙතැයි සිතෙයි. මා දන්නා හැම වර්ගයකම ගුවන්යානා බෝම්බ ගෙනා බව මා දන්නා බැවින්, බෝම්බ නොදමන ගුවන් යානයක අප්පා පැමිණෙන්නේ කෙසේද?

ගුවන් යානා මට සිහිපත් කරන්නේ අපගේ නිවසෙහි අංගනයෙහි ඇති බංකරයයි. ආරක්ෂාව සැලසීම සඳහා සෑම නිවසකම මෙවැනි පොළව යට සාදන ලද ව්‍යුහයක් ඇත. රතු පස් යටට හාරා එහි උඩින් වැලි ගෝනි අසුරා තැබෙයි. අපට ගුවන් යානයක භයානක ගර්ජනා ශබ්දයක් ඇසෙන විට, අම්මා මා අතින් ගනියි, අපි අපට දිවිය හැකි උපරිම වේගයෙන් බංකරය දෙසට දිවගොස් එයට රිංගා ගනිමු. අපි එහි වැතිරෙමු, අම්මා ඇගේ ළැමට මා තුරුළු කර ගනියි, මගේ දෑත් ඇගේ බඳ වටා එතී ඇත. මව් කිකිළියක, අහසෙහි ගිජුලිහිණියකු ළංව එන අනතුරක් දැක සිය කුකුළු පැටවුන් තම පියාපත් අතරෙහි තබාගෙන ආරක්ෂා කරන්නාක් මෙන් අම්මා මා ආරක්ෂා කළාය. ශබ්දය ළඟින්ම ඇසෙන විට හා ගුවන් යානාව අප නිවස පසුකරන විට අම්මා මා තදින් අල්ලා ගනුද, ඇගේ පපුව තදින් උස් පහත් වනුද මට දැනෙයි. එබඳු ආකාරයට අම්මා මා වැළඳ ගැනීම ගැන මම හැමවිටම ආශා කළෙමි. ගුවන් යානයෙහි ගර්ජනා හඬ මැකී යන තුරු අපි එහි වැතිර සිටිමු.

විශේෂයෙන්ම අම්මා ගෙදර දොර වැඩ කටයුතුවල කාර්ය බහුලව සිටින විට, මම ඇය සමග විජ්ජා සෙල්ලම් කරමි. මම ඇය වෙත කඩිමුඩියේ

ගොස් යටිගිරියෙන් කෑ ගසමි. 'අම්මා මට ගුවන් යානයක් එන සද්දෙ ඇහෙනවා, යට බංකර් එකේ හැංගෙමු' එය සපුරාම මා පොඩිපට්ටම් කර දමනු ඇතැයි සිතා ගත්තාක් මෙන් ගුවන් යානයෙහි මහ හඬ නෑසෙන්නට මම දෑතම කනට තදකොට තබා ගනිමි. මගේ කතාව පිළිගත්තාක් බඳුව අම්මා හැසිරෙයි, මා කැමති අකාරයට ඈ හැසිරෙයි. අම්මා උදාසීන ලෙස පසුපසින් එද්දී මම බංකරයට දිව යමි. ඇය මගේ සරදමට රැවටුණා යැයි සිතා මම අතොරක් නැතිව සිනාසෙමි, ඇයද ප්‍රතිචාර ලෙස මෝඩ සිනාවක් පායි. සමහර අවස්ථාවලදී, මම මිතුරන් සමග බංකරයට පැනීම හා බංකරයෙන් ආපසු උඩට පැමිණීමේ සෙල්ලම කරමි.

අප්පාගේ නිරුපද්‍රිතව පැමිණීම අපේක්ෂාවෙන් යාඥා කරන්නට අම්මා මා සමග අම්මාන් කෝවිලට ගියාය. මගේ ආරක්ෂාව වෙනුවෙන්, මගේ අතෙහි ආශිංසනාත්මක නූලක් බඳින්නැයිද ඇය පූජකතුමාගෙන් ඉල්ලා සිටියාය. දෙහි මල් මාලාවක් පැළඳ සහ රතු සාරියක් ඇඳ සිටි, කළු ගලින් තැනූ විසල් අම්මාන් ප්‍රතිමාව බලන්නට ඇය මා සමග ගියාය. ප්‍රතිමාව බොහෝ ආයුධවලින් සන්නද්ධව තිබිණි, ඇගේ අත් දොළොසෙහිම කිසියම් ආයුධයක් තිබිණි. ඇය, ලෝකයේ සියලුම ජීවී වස්තූන් තුරුළු කරගන්නා විශ්ව මාතාව බවත්, ඇය 'ශක්ති' නම් වන බවත් අම්මා මට කීවාය. මම ඒ ශක්ති යන වචනයෙන් වසඟ වූයෙමි, මා එය උච්චාරණය කරන විට මා තුළ කිසියම් බලයක් දැනෙන්නට වූයේ ප්‍රචණ්ඩ දේවතාවියක සිහිපත් කරවමිනි. 'ශක්ති' යනු ලෝකයේ සියලුම ජීවීන් වැළඳගන්නා විශ්ව මාතාවක වැනි යැයි අම්මා මට කියා තිබිණි. මම 'ශක්ති' යන නමට මහත් ප්‍රිය වූ අතර මා ඒ වචනය කියන විට මා තුළ ශක්තියක් ඇති විය.

මේ දිනවල යුද්ධය නිසා විශාල අහාර හිඟයක් ඇත. රටේ අනෙකුත් ප්‍රදේශ වලට යාපනය සම්බන්ධ කරන සියලුම මාර්ග සම්බන්ධතා වසා දමා යාපනය හුදකලා සිරගෙයක් කොට ඇතැයි අම්මා කීවාය. එකම ගමනාගමන ක්‍රමය වූයේ නැවයි. මසකට දෙවරක් මිනිසුන් සහ බඩු රැගත් නෞකාව පැමිණෙයි. අහාර ද්‍රව්‍ය කළු කඩයෙන් මිලදී ගත හැකිය, බඩු මිල ඉහළ යාම පිළිබඳව අම්මා හැමවිටම මැසිවිලි නගනු මම අසා ඇත්තෙමි, එවිට අපට බඩු මිලදී ගත හැක්කේ අපගේ රන් බඩු විකුණුවහොත් පමණකි.

වරක් අප අපගේ ගමේ කඩයෙන් බඩු මිලදී ගනිමින් සිටින විට,

මගේ මාලය නැතිවන්නට ගියේය. මා පිටුපසින්, මගේ ගෙලට අතක් තැබිණි, ඒ අත මගේ මාලය කඩා ගත්තේය. මම යටි ගිරියෙන් කෑගැවෙමි. අම්මා ආපසු හැරී හොරාගේ මුහුණට තම අත් බෑගයෙන් ගැසුවාය. ඇය මා ඇයට තුරුළු කොටගෙන සිටියාය, මම ඇයගේ දෑසෙහි, විනාශයේ දෙව්දුව වන කාලිගේ දෑසෙහි වැනි රතු තද කෝපයක් රැඳී තිබෙනු දුටුවෙමි.

මට, අම්මා ශක්තියේ ප්‍රකාශනයයි, ඇය මගේ කුඩා ලෝකයේ ආකාර දෙකක ශක්තිය වෙනුවෙන් පෙනී සිටියාය. මා ආරක්ෂා කිරීම සඳහා ඇය මා ඇගේ දෝතට ගෙන බංකරයට දිව යන විට, ඇය, නිර්මාණයේ දෙව්දුව 'ශක්ති' නම් වූවාය, මට හානි කිරීමට උත්සාහ කළ සොරා පළවා හැරි ඇය, එවිටදී යක්ෂයා පලවා හැරීමට කිසිදිනෙක අසමත් නොවන විනාශයේ දෙව්දුව 'ශක්ති' වූවාය.

අවසානයේ අප්පා පැමිණියේය, එය නිවස පුරා මීදුම පැතිරුණු සහ සීත මද සුළඟක් හමා ආ ඉරිදා උදෑසනක් විය. මම තවමත් ඇඳෙහි සිටියෙමි. අම්මා මා අවදි කොට, 'එන්න මීනා කුට්ටි, අප්පා ඇවිල්ලා. ඇවිල්ලා අප්පව පිළිගන්න. එයා ඔයා දකින්න පුලපුලා බලා ඉන්නවා. ඉක්මන් කරන්නැ' යි උද්යොගයෙන් කීවාය.

මම ඇඳෙන් නැගිට නිදන කාමරයේ දොර දෙසට ඇවිද ගියෙමි, නිදිමත තවමත් ඇති දෑස බාගයට වැසී තිබිණි. ඡායාරූපවලින් මා දැක තිබූ දයාන්විත සිනාව රැඳුණු මුහුණින් යුතුව අප්පා විසිත්ත කාමරයේ සිටගෙන සිටියේය. ඔහු මීදුමෙහි සිටගෙන සිටින්නාක් බඳු විය. නිදිමත පිරුණු මගේ ඇස්වලට ඔහුගේ සිරුර පෙනුණේ අපැහැදිලි ලෙසිනි. ඔහු සිය දෑත මා වෙත දිගු කළේය, මා ඔහු වෙත ළඟා වන තුරු ඔහු බලා සිටියේය. ඔහුගේ මුහුණෙහි කිසියම් තේජස්වී බවක් තිබුණු අතර එය මා සම්පූර්ණයෙන්ම අවදි කරවිය. ඒ ඔහුගේ උඩු රැවුලය. පිළිවෙලට කැපූ ගන කළු රැවුල ඔහුගේ සිහින් තොල් උඩින් තිබුණේය. එතරම් තේජස්වී කේශ විලාසයක් මම මගේ ජීවිතයට දැක තිබුණේ නැත. නීදන් මාමාට තිබුණේ ඔහුගේ නාසය යට සිහින් රැවුලකි, කමල් මාමාට රැවුලක් තිබුණේම නැත. මම අප්පා සමීපයට යාමට පැකිලුණෙමි. අම්මා සෙමින් මා ඔහු වෙත තල්ලු කළ අතර මම ඔහු වෙතට වීසි වී ගියෙමි. අප්පා මා ඔසවාගෙන මගේ නළල සිප ගත්තේය. මම ඔහුගේ බඩට පයින් ගසා, මට නිදහස්

වීමට වුවමනා බව පෙන්වන්නට කැගැවෙමි. මම නැවතත් ඔහුට වැරෙන් පා පහරක් දුන්නේ, සැණෙකින්, අප දමා යාම ගැන ඔහු කෙරෙහි මා තුළ කෝපයක් ඇති වූ නිසාය. මම අම්මා වෙත කඩිනමින් ගොස් ඇගේ සාය පිටුපස සැඟවුණෙමි. මා ඔහු දෙස බැලූ විට, තවමත් අර ප්‍රියමනාප සිනාව මුවෙහි නගාගෙන ඔහු එහි සිටගෙන සිටිනු මම දුටුවෙමි.

'ඔයාගේ වෙහෙසකර ගමනින් පස්සේ ඔයාට හුඟක් මහන්සි ඇති කියලා මම හිතනවා. ගිහිල්ලා නාගන්න, මං උදේ කෑම ලෑස්ති කරන්නම්' අම්මා අප්පාට කීවාය.

ඇගේ හඬ තරුණ හා උද්‍යෝගිමත් බවක් දැනවීය. ඇය සුන්දර බවක් සහ ජීවයෙන් පිරීගිය බවක් පෙන්නුම් කළාය.

'ඔව් මං ආවේ මහ භයානක ගමනක්, දෙපැත්තෙම අයගෙ මුර පොලවල් මහ ගොඩක් පහුකරගෙන ආවා. මේ දවස් වල යාපනේට එනවා කියන එක මහ දුෂ්කර වැඩක්. ඒත් ඉතින් මගේ ආදරණීය බිරිඳයි, ලස්සන දරුවයි, බලන එක වටිනවා' යි කී අප්පා මද සිනාවක් පෑවේය, අනතුරුව අම්මාගේ උරහිසෙහි තම අත තබමින් අම්මා තමා වෙතට ළං කොට ගත්තේය.

උදෑසන ආහාරයෙන් පසුව, අප්පාට, විස්මයජනක දෙයක් මට පෙන්වීමට ඇති බව අම්මා කීවාය. ඔහු මට අම්මාගේ කාමරයට එන ලෙස කියා තිබුණි. ඇය මා එහි කැඳවාගෙන ගියාය. ඔහු සෙල්ලම් බඩු සහ චොකලට් ගොන්නක් මැද එරමිණිය ගොතාගෙන ඉඳගෙන සිටියේය, මීට පෙර කිසිදිනෙක නොදුටු සෙල්ලම් බඩු දැකීමෙන් සහ කිසිදිනෙක රසබලා නොතිබුණු චොකලට් දැකීමෙන් මම පුදුමයට පත්ව බලා සිටියෙමි.

'එන්න මීරා, එන්න ඔයාට ඕන දෙයක් ගන්න' ඔහු මා කැඳවූයේය. 'ඔක්කොම ඔයාගෙ. මං ඔක්කොම ගෙනාවෙ ඔයාට, මගේ රත්තරන් දරුවට' ඔහු දීප්තිමත් බවක් දෙනෙතෙහි ඇතිව කතාව අවසන් කළේය. අම්මාගේ මුහුණ බබළන්නට විය, මගේ පියා මගේ ආදරය ස්ථිර වශයෙන්ම දිනාගනු ඇතය යන බලාපොරොත්තුවෙන් ඇගේ සතුට දැල්වී තිබිණි.

ප්ලාස්ටික් හෙලිකොප්ටරය මගේ සිත් ගත්තේය. එහි කහ පැහැති බඳ, කළු රෝද, තැඹිලි පැහැති පසුකොටස සහ තටු දැකීමෙන් වශී වූ

මම මගේ ඇඟිල්ල ඒ දෙස දිගු කළෙමි. අප්පා සතුටින් බලා එය මා දෝතෙහි තැබුවේය. මම විගසින් මිදුලට දිව ගියෙමි. මා දිව ගියේ මගේ හෙලිකොප්ටරය ගෙන, එය මගේ හිස මත තබාගෙනය. මම එය හිස මත තබාගෙන නිවස වටා දිව්වෙමි. අපගේ සාමකාමී අහස ප්‍රචණ්ඩත්වයට හරවන මා දැක ඇති හෙලිකොප්ටර් යානා මගේ හිසට බොහෝ උඩින් ඉගිලී යයි. එහෙත් මෙහි මගේ අතෙහි තිබෙන්නේ මගේම හෙලිකොප්ටරයයි. එය කිසිවිටෙකත් බෝම්බ නොදමන අතර මට එය සමග සෙල්ලම් කළ හැකිය.

ඊළඟ දිනයේදී. මට මගේ ඇඟිලිවල සුමුදු සමට, අප්පාගේ ගන කළු රැවුල් ගස් ඇනෙන අයුරු හඟින්නට, අප්පාගේ රැවුල ඇල්ලීමේ බලවත් කැමැත්තක් මා තුළ ඇතිවිය. එක් පස්වරුවක, අප්පා හාන්සි පුටුවක වැතිරී සිටිනු මම දුටුවෙමි. මම ඔහු සමීපයට රහසින් ළං වූයෙමි. ඒ ආකර්ශනීය දෙය ඔහුගේ දිගු නැහැයට යටින් නිසලව වැතිර තිබෙයි. මගේ වෙව්ලන ඇඟිලි එය අල්ලන්නට ළං විය. අප්පාගේ සිනාවත් හා ඔහු මගේ අතින් අල්ලාගත් ආකාරයත් මා විස්මයට පත් කළේය. මම ඇඹරී ඉවතට වූයෙමි.

'ඔයාට අප්පාගෙ රැවුල අල්ලන්න ඕන? එන්න' ඔහු, ඔහුගේ මුහුණ මගේ මුහුණට ළං කොට විරිත්තුවේය.

මම කුමක් කරම්දැයි නොදන මිනිත්තුවක් පමණ සිටියෙමි. අවසානයේදී මම ඉවතට දිව ගියෙමි.

මට වුවමනා නම් මගේ මුහුණෙහි රැවුලක් ඇඳිය හැකි බව ඊළඟ දිනයේදී අප්පා මට කීවේය. මගේ මුහුණේ, ඔහු පිළිබඳව වඩාත් ආකර්ශනීයම වූ දෙය ඇඳීම පිළිබඳ අදහසින් මම සතුටු වීමි. මගේ නාසය යටින් පටන් ගෙන, මගේ මුවෙහි දෙකෙළවර දක්වා කළු පැන්සලකින් ඉරි දෙකක් ඇඳීමට මම ඉඩ දුනිමි. ඔහු මා කාමරයට කැඳවාගෙන ගොස් මගේ ප්‍රතිරූපය කණ්ණාඩියෙන් පෙන්වූයේය, 'බලන්න ඔයා කොහොමද කියලා' ඔහුගේ මුහුණෙහි පුළුල් සහ දඟකාර සිනාවක් රඳවාගෙන මහත් සතුටින් යුතුව ඔහු ඇසුවේය.

මම මෝඩ විකටයෙක් ලෙස සිනාසුණෙමි, මගේ මුහුණ මා ලැජ්ජා විරහිතව සිනා ගැන්වීය. ඉක්මනින්ම මම සිනා සාගරයක ගිලුණෙමි.

රැවුලක් සහිත මුහුණක් ඇති මිනිසකුගේ සෙල්ලම් බඩුවක් සාදන බවට අප්පා මට පොරොන්දු වූයේය. තල් ඇටවලින් සෙල්ලම් බඩුවක් සාදන්නේ නම් අනර්ඝ විය හැකි බව අප්පා කීවේය. මස් ඉවත් කළ විශාල තල් ගෙඩියක් සොයා ගත් අප්පා, එය සෝදා හිරු එළියෙහි වේලෙන්නට දැමුවේය. රැවුල ඇති බෝනික්කා ඉක්මනින් හදන්නැයි කියමින් මම ඔහුට කරදර කළෙමි. එය මගේ පරම මිතුරා කර ගැනීමට මට වුවමනා විය. කෙඳි, කොළ තරමටම වේලිය යුතු යැයි ද, එවිට හිසකේ පීරීම හා රැවුල ඇඹරීම පහසු වන බව කියමින් අප්පා මා සන්සුන් කළේය.

අප්පාගේ පැමිණීම අප නිවසෙහි වාතාවරණය වෙනස් කළේය. අම්මා වඩා සතුටින් සිටි අතර මා මීට පෙර දැක නොතිබුණු සැහැල්ලුවක් ඇය වෙතින් දුටුවෙමි. ඇයගේ නළලත මැද තිබූ අර ඉර අතුරුදන්ව ගියේය. නාන කාමරයට ගිය විට මට ඔහු නිවසෙහි සිටින බව වටහා ගැනීමට සාක්ෂි තිබිණි, එහි එක රාක්කයක් දැන් ඔහුගේ විලවුන් බෝතල, පවුඩර්, ෂැම්පු, සබන් සහ ෂේවින් ක්‍රීම් වලින් පුරවා තිබිණි.

දිනක් මම අම්මාගේ කාමරයේ මේසය මත ඔහුගේ මුදල් පසුම්බිය දුටුවෙමි. මම එය විවෘත කළෙමි. මගේ ඡායාරූපයක් හොඳ පරිස්සමින් එතුළ බහා තිබුණේය. මා මාස හතරක බිළිඳකුව සිටියදී ගෙන තිබුණු ඒ ඡායාරූපය අම්මා සවුදි අරාබියට යවන්නට ඇත. අප්පා බොහෝ දුර බැහැරක සිටියදී, ඔහු යන යන තැනට මා කැඳවාගෙන යන්නාක් මෙන්, නිතර මගේ ඡායාරූපය දෙස බලමින් සිටින ආකාරය මම සිතෙන් මවා ගත්තෙමි.

කාලය ගෙවී ගිය විට, අප්පාට මම ආදරය කරන්නට වීමි. මම ඔහු සමග හොරා පොලිස් සෙල්ලම කරන්නට ආසා කළෙමි, මට පොලිස්කරුගේ භූමිකාව අවශ්‍ය බවට මම හැමවිටම බල කළෙමි. මම නිවස වටා උඩගු ලීලාවෙන් ඇවිද්දේ, මා පසුපසට තබාගත් කෝටුව වනමිනි. සොරා සොයා ගැනීමෙන් පසුව, මම ඔහුගේ හිසට පහරක් එල්ල කර, උඩ පනිමින් කෑ ගසමි. 'මම සොරා සොයා ගත්තා' එහෙත් හිසට හොඳ පහරක් එල්ල වූ විට අප්පා සමහර විට වේදනාවෙන් කෙඳිරි ගෑවේය.

අවසානයේ මගේ හිතට වද දෙන ප්‍රශ්නය මම ඔහුගෙන් ඇසුවෙමි.

'අප්පා ඔයා මටයි, අම්මටයි හුඟක් ආදරෙයි නම්, ඇයි ඔයා අපිව දාලා ගියේ?'

ඔහු නිහඬව මදෙස මොහොතක් බලා සිට අනතුරුව මා ඔහුගේ උකුලෙහි තබා ගත්තේය.

'මීරා කුට්ටි, මට කවදාවත් ඕන වුණේ නෑ ඔයාගෙන් වෙන් වෙලා යන්න. මං ඔයාගේ අම්මව කසාද බැන්ද කාලේ, මං වැඩකරමින් හිටියේ කන්කසන්තුරේ සිමෙන්ති ෆැක්ටරියෙ. මේ භයානක යුද්ධයේ ප්‍රතිඵලයක් හැටියට, ෆැක්ටරිය වැහුවා, මට මගේ රස්සාව නැති වුණා. මට මෙහෙ කිසි රස්සාවක් හොයා ගන්න බැරි වුණා. ඉතින් මට ඔයාවයි, අම්මවයි දාලා යන්න සිද්ධ වුණා. ඔය දෙන්නට මෙහෙ හොඳින් ජීවත් වෙන්න සල්ලි ටිකක් හොයාගන්න මට පිටරටකට යන්න සිද්ධ වුණා. මං යාපනෙන් යනකොට ඔයා අම්මගෙ, බණ්ඩියේ හිටපු, පුංචි බබෙක්' ඔහු දිග සුසුමක් හෙලමින් කීවේය. ඔහුගේ දෑස් කඳුළින් පිරී තිබුණි.

මගේ දෑස්ද කඳුළින් බොඳ වී ගියේය. මගේ පියා මුහුදින් එතෙර ගොස් ඇත්තේ මා වෙනුවෙනි. මා වෙනුවෙන් ඔහු සවුදි අරාබියාවේ දුෂ්කර ජීවිතයක් ගතකොට ඇත. එය ඔහු කර ඇත්තේ මට හොඳ ජීවිතයක් ලබාදීමට හා මට දීප්තිමත් අනාගතයක් උදාකර දීම සඳහාය. මේ වෙන්වීම ඔහුටද වේදනාකාරී දෙයක් වූයේය.

අප්පා නිවසෙහි සිටින හැමවිටම, මම ඔහුගේ සිරුරෙහි වෙලීගෙන, හිඳගෙන සිටිමි. ආහාර ගන්නා විට හා කියවන විට මම එසේ ඉඳ ගැනීමට කැමති වූයෙමි. අප්පා, නිතරම මට විහිළු කතා කීවේය. මා සිනාසෙන විට, මගේ කම්මුල්වල සම රැළි වී සුසිනිඳු වෙයි, ඔහු මා සමීපයට ගෙන මගේ ඒ සුසිනිඳු සමෙහි ඔහුගේ මුහුණ තබමින්, මා තව තවත් සිනාගස්වමින්, මා සිනාසෙන ආකාරය බලමින් සතුටු වෙයි. මම ඔහුගේ රැවුල ඇල්ලීමට කැමති වූයෙමි, එහි ඇනෙන සුළු ගතිය මගේ සිනිඳු කම්මුලෙහි වැදෙන විට මම ඊට කැමති වූයෙමි.

අප්පා අප සමග මෙසේ මාසයක් පමණ සිටියදී, එක් උදෑසනක, ඔහු වැරැන්ඩයේ පුවත් පත කියවමින් සිටින විට, මම ඔහු ළඟ බිම හිඳගෙන, උදාසීන ලෙස මගේ හෙලිකොප්ටරයේ රෝද මගේ කම්මුල් මත යවමින්

සිටියෙමි, ජීප් රථයක් වැනි වාහනයක් වංගුව හැරී, අපගේ පටු මග ඔස්සේ වේගයෙන් ඉදිරියට එද්දී, අපගේ කන් බිහිරි කරවන හඬක් ශබ්ද විකාශන යන්ත්‍රයකින් ඇසිණි. එය දැන්වීමකි. හදිසි ප්‍රවෘත්තියක්! අප්පා පුවත්පත බිම දමා, ගේට්ටුව දෙසට ගියේ ඔහුගේ ඇහි බැම රැළි කරමිනි. වතුර කළය අතැතිව අම්මා දොර ළඟට දිව ආවාය. හැම කොනකින්ම දෝංකාර දෙන්නට වූ බැවින් ශබ්ද විකාශන යන්ත්‍රයෙන් දෙන පණිවුඩය කුමක්ද යන්න මට තේරුම් ගත නොහැකි වුවද, එය ඇසූ මගේ දෙමාපියන්ගේ මුහුණුවල වූ බැරෑරුම් පෙනුම, පණිවුඩය බරපතල එකක් බව කියන්නට සමත් විය. ඔවුන් ප්‍රවෘත්තියට සවන් දෙන විට, ඔවුන්ගේ මුහුණුවල එතෙක් තිබූ ප්‍රීතිය අස්වනු නෙලන සමයේ විසිරී යන කුණු රොඩු මෙන් විසිරී ගියේය.

ඒ අවස්ථාවෙහි මගේ දෙමාපියන් කිසිත් කතා නොකළ නමුත්, පසුව ඔවුන් ප්‍රවෘත්තිය ගැන කතා කරනු අසා සිටීමෙන්, එය පාසල් ක්‍රීඩාංගනය අසල පැවැත්වෙන මහජන රැස්වීමකට සහභාගී වීමට කළ නිවේදනයක් බව තේරුම් ගතිමි. ප්‍රදේශයේ අණ දෙන නිලධාරියාට ප්‍රදේශයේ ජනතාව හමුවීමට අවශ්‍යව තිබිණි. අඩු තරමින් එක් පවුලකින් එක් සාමාජිකයෙක් හෝ රැස්වීමට සහභාගී වීම වැදගත් විය.

'මං රැස්වීමට සහභාගි වෙනවා' අප්පා අම්මාට කීවේය. 'ඔයා ළමයව බලාගෙන ගෙදර ඉන්න'

'මේ යක්කු.... උන්ට මොනවද අපෙන් ඕන?' ගින්නෙහි ලූ රතිඤ්ඤා මෙන් අම්මා කෝපයෙන් පුපුරන්නට වූවාය. ගිය මාසෙ හැම පවුලකින්ම රන් පවුම් දෙක ගානෙ ඉල්ලුවා. කොහොමද දුප්පත් මිනිස්සු දරන්නෙ ඒක? මට වෙන කරන්න දෙයක් තිබුණේ නෑ දරුවගේ වළලු දෙනවා ඇර. ඒ ගොල්ලන්ට ඇත්තටම ඕන තමුන්ගේ ජනතාවට සේවයක් කරන්න නම් ඇයි මිනිස්සුන්ට විඳවන්න අරින්නේ? නිදහසට වෙන තේරුමක් නෑ!' යී කී ඇය මුළුතැන්ගෙයට ඉක්මනින් ගියාය.

පොඩි නින්දකට පසුව මා අවදි වූ විට, අප්පා දකින්නට නොසිටි අතර ඔහු නැවත අර විදේශ රටට ගොස් ඇතැයි බියජනක හැඟීමක් මා තුළ ඇති විය. මම අම්මා සොයා ගොස් ඔහු කොහිදැයි ඇසුවෙමි. ඔහු සිය සහෝදරයා හමුවීමට ඔහුගේ නිවසට ගිය බව අම්මා කීවාය. මම

නිවේදනය ගැනද, ඔවුන්ගේ සාකච්ඡාව සහ ඔවුන්ගේ කලබල වූ මුහුණු ද ගැන සිතුවෙමි, එසේ සිතු මට අම්මා බොරු කියන්නේදැයි සිතිනි. පසුව අම්මා නොසන්සුන්ව උඩට පහළට ඇවිදිනුද, නිරන්තරයෙන් ගේට්ටුව දෙස බලනුද, ඔහුගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටිනු ද දුටුවෙමි. ඔවුන් අතර සැබවින්ම සිදුවන්නේ කුමක්ද?

ආපසු පැමිණෙන විට අප්පා ඉතා වෙහෙසව සිටියේය, බලාපොරොත්තු සුන්වීමෙන් ඔහුගේ මුහුණ අඳුරු වී තිබුණේය. ඔහු වැරැන්ඩයේ සිට ගත්තේය, දරකොට වැනි වූ ඔහුගේ කකුල් වලින් ඔහුට එහා මෙහා විය නොහැකි විය. අම්මා ඔහු වෙතට පුටුවක් ගෙනාවාය, ඔහුට ඉඳගන්නා ලෙස ඇය සංඥා කළාය, එසේ කළ ඇය වතුර සෙම්බුවක් ගෙනෙන්නට ගියාය. ඔහු වතුර පානය කළ පසුව, දොර පඩිය අසල සිටගෙන මා කනස්සල්ලෙන් සිටිනු දුටුවේය. ඔහු ඇසක් කුඩා කර මා ගැන අවධානය දක්වන ලෙස අම්මාට ඉඟි කළ අතර, එවිට අම්මා ඇගේ බැල්ම මා වෙත යොමු කළාය. අම්මා එකඟතාවෙන් හිස සොලවමින්, 'මීරා'යි කීවාය. 'අප්පා ගෙනාපු සෙල්ලම් බඩු එක්ක සෙල්ලම් කරන්න. මං ඔයාට රෑ කෑම විනාඩි කීපෙකින් අරන් එන්නම්'

මගේ ළයෙහි නැගෙමින් තිබුණු නොසන්සුන්බවක් සමග මම ගෙතුළට ගියෙමි. මගේ දෙමාපියන් අතරෙහි කිසියම් බරපතල දෙයක් සිදුවෙමින් තිබෙන බව පැහැදිලිය. අම්මාට හිස සලන්නට හේතු වූ, අප්පා අම්මාට කළ සංඥාවෙහි තේරුම කුමක්ද? මගේ සෙල්ලම් බඩු සමග සෙල්ලම් කරන්නට නොව ඔවුන්ගේ සාකච්ඡාවට සවන් දෙන්නට මම හිත හදා ගත්තෙමි. මම සෙමින් යළි වැරැන්ඩය දෙසට ගොස් ඉදිරි දොර අසල සැඟවුණෙමි.

පළමුව කතා කළේ අම්මාය. 'මොනවද ඒ ගොල්ලො කිව්වෙ? මොකක් හරි බරපතල දෙයක් තියෙනවද?'

අප්පා කිසිවක් නොකියා හිස සෙලවූයේය.

'මොකද්ද? මොකද්ද ඒක?' අම්මාගේ හඬ ගොරෝසුය.

'කොල්ලො... මේ රස්තියාදුකාරයො, ඒගොල්ලන්ට ඕනලු එක පවුලකින් එක ළමයෙක්, ඒගොල්ලන්ට එකතු වෙලා ඒගොල්ලො වෙනුවෙන් සටන් කරන්න'

'අපිට ලොකු මහත් වෙච්ච දරුවො නැතිනම්...'

'එහෙනම් පියා යන්න ඕන'

අම්මා බියෙන් ගැහෙමින් බැලුවාය. සැන්දෑවෙහි පරවී ගිය නෙලුම් මලක් මෙන් ඇගේ හිස පහතට නැමී ගියේය. ක්‍රමයෙන් ඇය තමා පොළවට වැටෙන්නට ඉඩ හැරියාය. ඇය සිය දෝතෙහි හිස තබාගත්තාය, මුල්ලක තබා ඇති හාල් ගෝනියක් මෙන් ඇය නෙසෙල්වී සිටියාය. මගේ හිස ප්‍රශ්නවලින් කැළඹෙන්නට විය. මේ කොල්ලන් කවුද? අප්පා ඔවුන් සමග එක්වීම ඔවුන්ට අවශ්‍ය වන්නේ ඇයි? අප්පා ඔවුන්ට සම්බන්ධ නොවුණහොත් ඔවුන් කුමක් කරනු ඇද්ද?

ඊළඟ දින, නිල්වන් අහසෙහි සුදු පැහැ ඉරි ඉතිරි කරමින්, වළාකුළු බිඳගෙන අහස් යානයක් මහ හඬ නංවමින් එනු අපට ඇසිණි. අප්පා, අම්මාද සමඟ මා එකතුකොට ගත්තේය, අපි වහා බංකරයට ගියෙමු. 'මේ මොන පව්කාර ජීවිතයක්ද? මේ අනුකම්පාවක් නැති බලවේග දෙකකට මැදිවෙලා තැලෙන්නෙ පොඩිවෙන්නෙ කොහොමද අපි? එකක් අහසෙ අනික පොළොවෙ. මට දැනෙන්නෙ ගිරයට අහුවෙච්ච පුවක් ගෙඩියක් වගේ. බේරෙන්න ක්‍රමයක් ඇත්තෙම නෑ' මම ඇය දෙස බැලුවෙමි. අම්මා අදහස් කරන බලවේග දෙක කුමක්ද? වඩ වඩාත් ප්‍රශ්න මගේ සිතෙහි වැඩෙන්නට වූයේ මගේ සතුටටද, නිසල බවද රිදුම් දෙමිනි.

එදින රාත්‍රිය සාමකාමී වූ අතර මම බොහෝ වේලාසන නින්දට වැටුණෙමි. රෑ මැදියමදී මා අසල රහස් හඬවල් ඇසුණේ සිහිනයකදී මෙනි. අප්පා කිහිමින් 'හැමදාම තත්ත්වය තව තව නරක් වෙනවා. මේ භයානක ස්ථානයෙ විනාස වෙන්න ඉඩ ඇරලා, ඔයාවයි ළමයවයි දාලා මම කොහොමද යන්නෙ? සවුදියට ආපහු යන්න ඉස්සෙල්ලා මට ආපහු හිතන්න ඕන'

'මොකක් ගැනද මන්දා ඔයා කතා කරන්නෙ' අම්මා කොඳුළාය. 'ඔයා තව කීප දවසක් හිටියොත් ඒ ගොල්ලො ඇවිත් ඔයාව අරන් යයි. ඔයාට ඕනද ඒ වගේ වේදනාවක් අපට දෙන්න? මහාවීර දිනේට ඉස්සෙල්ලා ඔයා යාපනෙන් යන්න ඕන. ඔයා ගියාට පස්සෙ මොකක් හරි නරක දෙයක් සිද්ද වුණොත්, මං කවි අක්කලගෙ ගෙදරට රැකවරණය හොයාගෙන යනවා'

මම අඳුරෙහි මගේ දෑස් විවර කළෙමි.

ඊළඟ දිනයෙහි මා අවදි වූ පසු, අප්පා කෝපි කෝප්පයක් බොමින් සිටින වැරැන්ඩයට මම ගියෙමි, එහෙත් අප්පා එහි  සිටියේ නැත. මම අම්මාගේ කාමරයට වහා දිව ගියෙමි, ඔහුගේ බඩු තබා තිබුණු මේසය අස්කර තිබෙනු මම දුටුවෙමි. මුල්ලක තිබූ ඔහුගේ සූට් කේසය තිබුණේ නැත. මම කුස්සියට දිවගිය අතර අම්මා එහි සිටිනු දුටුවෙමි. 'කෝ එයා? කොහෙද ගියෙ?'

ඇය මා තරකොට අල්ලා ගත්තාය.

'ඔයා නැගිටින්න ඉස්සෙල්ලා අප්පා ගියා. ඔයා අඬයි කියලා සමු අරගෙන යන්න එයා කැමති වුණේ නැහැ, ඒක උසුලන්න ශක්තියක් එයාට නැහැ'

මම කඳුළු සලන්නට වීමි. අම්මා මා ඇයට තුරුළු කොට තබා ගන්නට උත්සාහ කළාය, එහෙත් මම ඇය තල්ලු කර දැමුවෙමි. අම්මා මා පසුපස සිටිමින් හඬනු මට ඇසිණි, 'හය මාසෙකට පස්සෙ අප්පා ආපහු ඒවි. අපි අප්පාට ලියලා අහමු අප්පගෙ සැප සනීප කොහොමද කියලා'

මම ඇය සමග මෙන්ම අප්පා සමගද කෝප වීමි. අප්පා මා හැර යන දිනය දෙදෙනාම මගෙන් වසන් කළහ. අප්පාගේ දෑතින් ජීවිතය ලබන්නට බලා සිටින, කාමරය මුල්ලක ඇති වේලී ගිය තල් ගෙඩිය මම දුටුවෙමි. එය ඇඳ පසෙක ඇත, ඒ සමගම පාට පැන්සල් හා පනාවක්ද ඇත, එහි ඇස් සහ ඇහිබැම ඇඳ තිබෙයි. මා බොහෝ කැමති රැවුල සහිත බෝනික්කා පිළිබඳ ඔහුගේ පොරොන්දුව කොයිබද?

රැවුල සහිත බෝනික්කා අසල මම මගේ පියා ලියූ සටහනක් දුටුවෙමි.

මීරා කුට්ටි,

ඔයාව නැවත හැර යන්නට සිදුවීම ගැන අප්පාට හරි කනගාටුයි. මං ඊළඟ සැරේ ආවම බෝනික්කා සම්පූර්ණ කරලා දෙනවා කියලා පොරොන්දු වෙනවා. අම්මාට හොඳ දරුවෙක් වෙන්න.

ආදරණීය තොත්තු අප්පාගෙන්.

සටහන රැගෙන, මම කවුළුව අසල ඉඳ ගැනීමට ගියෙමි. උණු කඳුළු මගේ කම්මුල් දිගේ ගලා විත් මගේ බ්ලවුසය තෙමුවේය. මගේ වේදනාව සම්බන්ධයෙන් මගේ දෙමාපියන්ට දොස් නොපැවරිය යුතු බව මම වටහා ගතිමි. දොස් පැවරිය යුත්තේ මේ මුග්ධ යුද්ධයටය. පෙරදී අප්පා මට අමුත්තෙකු කළේත්, දන් ඔහු නැවත මගෙන් වෙන් කළේත්, මේ යුද්ධයයි.

මදක් සන්සුන් වූවායින් පසුව, මම කවුළුව හැර පිටත ගෙවත්ත දෙස බැලුවෙමි. කොවුලෙක් විවේකීව අඹ ගසෙහි අත්තක හිඳගෙන මයුර ස්වරයෙන් ගී ගයන්නට පටන් ගත්තේය. අම්මා මා පසුපසින් සිටගෙන, ඇගේ අත මගේ උරහිසෙහි තැබුවාය. 'අරුණෝදයේ ගීතය' ඇය කීවේ කුරුල්ලා දෙස බලමිනි. 'කවදාහරි අපේ ජීවිතවලට සාමකාමී අරුණාලෝකයක් වැටෙයි. කවදාහරි දවසක මේ සාපලත් යුද්ධය නවතියි, අපිට සාමය උදාවෙයි.  අපි සතුටින් ජීවත් වෙයි, ඔයාගේ තාත්තත් එක්ක සතුටින් ඉන්න අපි ආයෙම එකතු වෙයි. වෙන්වීමක් ආයෙ කවදාවත් නොවේවි'

**දමිළ යෙදුම් විවරණය**

| | |
|---|---|
| අක්කා | සහෝදරිය |
| අම්මා | මව |
| අම්මාන් | සිව දෙවියන්ගෙ සහකාරිය, එනම් දෙවඟන |
| අප්පා | පියා |
| මාමා | මාමා |
| කුට්ටි සහ චෙල්ලම් | ආදරණීය යෙදුම් |
| මහාවීර් දිනය | යුද විරු දිනය |
| කාලි | විනාශයේ දෙව්දුව |
| ශක්ති | දිව්‍යමය ස්ත්‍රී බලය |

***ලාවන්‍යා පරමනාදන්*** *ඉපිද හැදී වැඩුණේ යාපනයේ පාරම්පරික දෙමළ පවුලකය. ඇය, දශක තුනක සිවිල් යුද්ධයේ පීඩා හිරිහැර අත් වින්දාය, යුද්ධය සහ හිංසාව .පිළිබඳ ඇය තුළ බලවත් පිළිකුලක් ඇත. යුද සමයේ ඇගේ අප්‍රසන්න අත්දැකීම් තුළින් මේ කතාව සහ චරිත ඉපදී ඇත.*

# ආදරය උදෙසා

## *ශලිනි අබයසේකර*

මා ඉපදුනු විට, අම්මා මා හැඳින්වූයේ 'විස්මිත බබෙක්' යනුවෙනි. ඒ, මා ඇගේ කුස තුළ සිටියදීම, මියෙන්නට ළංව සිටි නිසාය, මා උපදින්නටද පෙරම 'මියගොස්' සිටි නිසාය. මගේ සිරුරට වඩා විසාලව තිබූ මගේ සොයුරියගේ සිරුරින් මා යට වී තිබුණි. විනාඩි කිහිපයකින් මගේ හුස්ම නැවතී ගියේ නම් අම්මා නිවුන් දරුවන්ට උපත නොදෙන්නට ඉඩ තිබිණි. අක්කීට, තනිවම ජීවිතයට මුහුණ දීමට සිදුවිය හැකිව තිබිණි.

මගේ නිවුන් සොයුරිය පළමුව මෙලොවට පැමිණියද ඇය බොහෝ ආකාරයෙන් දුර්වල අයෙකු වූවාය. පාසලේදී හැමවිටම මා ඇය වෙනුවෙන් නැගී සිටිය යුතු විය. ඇය කුලෑටි, නිසල අයකු වූවාය. කෝපවන්නේ අඩුවෙනි. මම කටකාර වීමි. කෙලින් කතා කළෙමි. නිර්භීත වීමි. ශාරීරික අභ්‍යාස කිරිමේදී වරක් ඇය වැටුණු විට දැරියක් ඇයට සිනාසුණු කල්හි, මම කෝප වූයෙමි. මා කෝප වූ ආකාරයට මට ඉදිරිය පෙනුණේද නැත.

'හූ......හූ.........අපි ඔයාගේ යට ඇඳුම දැක්කා' හැමවිටම අප සරදමට ගන්නා, විශේෂයෙන්ම අක්කි සරදමට ගන්නා අර 'මෝඩ' ඉෂාරා සිනාසුණාය.

අක්කා රතු වූවාය, ඇගේ යටිතොල් සැලෙන්නට විය.

'අපි ඔයාගේ යට ඇඳුම දැක්කා. ඒක හරිම කැතයි. අපි ඔයාගෙ යට ඇඳුම දැක්කා. ඒක හරිම කැතයි' දැරිය ගීතයක් ගයන ස්වරයෙන් කියන්නට වූවාය. අක්කි අපහසුතාවට පත්ව මුහුණ වසා ගත්තාය.

සැණෙකින් සියල්ල රතු විය. මම ඉෂාරා ඉදිරියට පැන, ඇගේ කට හරහා සැර අතුල් පහරක් ගැසුවෙමි. මා කෝපයෙන් වියරු වැටී සිටිනු මට දැනිණි.

අනතුරුව සිදු වූයේ, අපගේ පන්ති භාර ගුරුතුමිය මා ඉෂාරා වෙතින් ඇදගෙන යාමය, එසේ ඇදගෙන යමින් 'ඔයා මොනවා කරනවා කියලද ඔයා හිතන්නේ?' යි අසමින් මගේ පසුපසට පහරක් දුන්නාය,

ඇය මා පැය දෙකක් අව්වෙහි තැබුවාය. එහෙත් මම එය ගණනකට නොගත්තෙමි. මම ඉෂාරාට කළ දෙයින් මගේ සොහොයුරිය ඇඬීම නතර කළාය.

ඒ මගේ නම වෙනස් වූ අවස්ථාවය. මම 'සටන් කරන්නකු' වීමි. මගේ කාර්යය වූයේ අක්කී ආරක්ෂා කිරීමය.

නිවුන්නුන්ට අන් අයට වටහා ගත නොහැකි බැඳීමක් ඇති බව මිනිස්සු කියති, එය සැබෑය. අප දෙදෙනාට දෙදෙනා කෙතරම් වටින්නේද යන්න පැහැදිලි කිරීම අපි බොහෝ කලකට පෙර අත්හළෙමු. එහෙත් එය නැවත වරක් ලිවීමට මම කැමති වීමි, අපගේ බන්ධනයෙහි කතාව හෝ අපගේ බැඳුණු ජීවිතයේ කතාව ලිවීමට කැමැත්තෙමි. නිවුන්නුන් දෙදෙනෙක් අතර ඇති ඒ සම්බන්ධය, කෙනෙක් ඉතා ගැඹුරට තේරුම් ගන්නවාක් වැනි සම්බන්ධයකි. අනෙක් නිවුන්නාගේ මුහුණ දැකීමෙන්, ඇය හෝ ඔහු කුමක් සිතන්නේද යන්න හරියටම කිව හැකි වන්නාක් මෙනි. එකිනෙකා කෙරෙහි අවධානය කොතෙක්ද යත්, අනෙකාගේ සුළු වේදනාවක් වුව ඔබට ගල් දහසක් ගසන්නාක් මෙන් දැනවෙයි. අනෙකා අසනීපයෙන් නම් ඔබටද අසනීපය දැනෙයි, ඇය සිනාසෙන්නේ නම් ඔබද ඇතුළතින් සිනාසෙන්නාක් මෙනි, ඔබ ඔබේ සිනාව ඇයගේ මුහුණින් දකියි. එය තේරුම් ගත නොහැකි සහ අරුම පුදුම හැඟීමකි. එය හරියට, ඔබට හැකිනම්, ඔබගේ ජීවිතය අනෙකා වෙනුවෙන් සතුටින් කැප කරන්නාක් මෙනි.

අතිශයින් එක සමාන නිවුන්නුන් වීමේ විනෝදාත්මක දෙය නම් එමගින් අනෙකුන් රැවටීමට හැකි වීමයි. අපි නිතරම අපගේ මිතුරන් රැවටීමු, සමහර අවස්ථාවන්හි අපගේ ගුරුවරුන්ද රැවටීමු. වරක් පාසලේ සැණකෙලියට පෙර අක්කාට සෙම්ප්‍රතිශ්‍යාව වැළඳුණේය. ඇයට එහි නිවේදන කටයුතු කිරීමට පැවරී තිබිණි.

'මං මොකද කරන්නේ' ඇය නොඉවසිලිමත්ව ඇසුවාය. කනිෂ්ට පාසලේ පාසල් නායිකාව ලෙස, මේ කාරිය ඇයට පැවරෙන්නට ඇත්තේ කලකට පෙරදීය. මම දඟකාර ලෙසින් සිනාසුණෙමි.

'ඔයා දන්නවනෙ... අපි දෙන්නම එකවගෙ... කට හඬත් එක වගේ'

'මොකද්ද ඔයා ඒකෙන් අදහස් කරන්නෙ?'

'ආව්, ඔයා හොඳටම දන්නවා මොකද්ද මං කියන්නෙ කියලා.

ඇගේ ඇස් විසල් විය. 'ඔයා ඇත්තමද කියන්නෙ?' මම සිනාසී ඇසුවෙමි. 'අහුවුණොත් එහෙම අපි?'

මම සිනාසෙන්නට වීමි.

ඇය මා වෙත පැමිණ ලොකු හාද්දක් දුන්නාය. 'ඔයා තමයි හොඳම හොඳ !'

දිනය උදා වූ කල්හි මා කලබලයට පත්වූ බව මම පිළිගනිමි. අක්කා ඇවිදීමේදී ඇයටම අනන්‍ය වූ උකුල එහා මෙහා පැද්දෙන ආකාරයක් තිබිණි. මම පැය ගණනක් ගෙය වටා ඇවිදිමින් ඒ ගමන් විලාසය පුරුදු වූ අතර, මගේ දෙමාපියෝ කුතුහලයෙන් ඒ දෙස බලා සිටියහ. මම කැටපත ඉදිරියෙන් සිටගෙන 'සුබ සන්ධ්‍යාවක් ! මම ඔබ සියලු දෙනා වාර්ෂිකව පැවැත්වෙන අපගේ දෙසැම්බර් සැණකෙළියට පිළිගනිමි' ගුරුවරු පැමිණ මා සමග දිගු සාකච්ඡාවලට මුල පුරනු ඇතැයි සිතා මම ඇගේ අහිංසක අභිනය පුරුදු පුහුණු වූයෙමි. මා එන්නට සූදානම් වූ අවස්ථාවේ දී අක්කී ඇසක් කුඩා කර 'සන්සුන් වෙලා මාව රඟපාන්න' යි කීවාය.

සියල්ල ඉතා හොඳින් සිදුවිය. මම වේදිකාවට අක්කාගේ ගමනින් ගියෙමි, මුදු ලෙස හා කාරුණිකව ශිෂ්‍යයින්ට හා ගුරුවරුන්ට කතා කළෙමි. එමෙන්ම නිවේදනය ඉතා හොඳින් කළෙමැයි සිතමි. අනතුරුව, මා ස්තුති කතාව කරද්දී මා මගේ නම තනතුර සඳහන් කළ යුතුද නැද්ද යන්න මගේ මතකයේ තිබුණේ නැත. ෂත් ! මට එය පැහැදිලි කර ගැනීමට නොහැකි විය. මට සිතන්නට වේලාවක් නොතිබිණි, සිදුවන්නේ කුමක්ද යන්න ගැන වැටහීමකින් තොරව, මගේ මුවින් වචන පිටවිය: 'මම, සමාධි ජයසේකර. කනිෂ්ට උප ක්‍රීඩා නායිකා, මේ අවස්ථාව සාර්ථක කරගැනීමට සහාය දුන් ඔබ සැමට ස්තුතියි' මුහුණු විස්මයෙන් මා වෙත හැරුණි. මම පසුපස බැලුවෙමි, මගේම මෝඩ වැරදීම ගැන තිගැස්සුණෙමි. පාසල් නායිකා සහ උප ක්‍රීඩා නායිකා යන නිල ලාංඡන කාලයකට අපගෙන් ගැලවූ අතර සියලු සති අන්ත ගමන් තහනම් විය.

සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව කාරණා වෙනස් විය. සැබැවින්ම, ඒ වෙනස වූයේ අප දෙදෙනාගේ තිබුණු බන්ධනයෙහි නොවේ. අප පෙර පරිදිම සමීපව සිටියෙමු, එහෙත් අප තවදුරටත් එකම පන්තියේ නොවීමු. අක්කී ජීව විද්‍යාව හැදෑරූ අතර මම කලා විෂයන් හැදෑරුවෙමි. 'කලාව? අනේ ඇයි? ප්‍රමෝදි කරන්නෙත් ජීව විද්‍යාවනෙ' නෑදෑයින්ගෙන්, ගුරුවරුන්ගෙන් සහ අනුන්ගේ දේවලට ඇඟිලි ගසන්නන්ගෙන් තොරක් නැතිව ඇසෙන මේ මත පල කිරීම්වලින් මම වෙහෙසට පත්ව සිටියෙමි. 'ජීව විද්‍යාව කරන්නෙ මෝඩයො, අන්තිමට වෙන විෂය ධාරාවකට මාරු වෙනවා'යි කියන්නට මට සිතිනි, එහෙත් ඒ අදහස් මම මටම තබා ගත්තෙමි. එය ඇසී අක්කි සිත රිදවා ගන්නවාට මම අකමැති වීමි, අනෙක, ඇයට වෛද්‍යවරියක වීමට කොතරම් වුවමනාද යන්න මම දැන සිටියෙමි. ඇය මැදියම් රාත්‍රිය වනතුරු ගණන් විසඳීමට උත්සාහ කරන අතර මම මැක්බර්ත් හෝ ප්‍රයිඩ් ඇන්ඩ් ප්‍රිජඩිස් (Pride and Prejudice) කියවා නින්දට වැටුණෙමි. එක් දිනක්, උත්තර පත්‍රයකට ලකුණු විස්සෙන් දෙකක් ලැබී ඇය හඬනු මම දුටුවෙමි.

'අනේ මෙන්න මෙහෙ එන්න' ඇය සතුටින් තබන්නට උත්සාහ කරමින් මම කීවෙමි. 'ඔයා බුද්ධිමත්. මං දන්නවා ඔයාට ඒක කරන්න පුළුවන්. දවසක මං එනවා මගේ පොහොසත් දොස්තර සහෝදරිය ළඟට බෙහෙත් ගන්න' එහෙත් ඇය සිනාසුණේ නැත. වෙහෙසට පත් සුසුමක් හෙලුවා පමණකි. 'මම දුර්වලයි' කාමරයෙන් මා පිටතට එන විට ඇය මිමිණුවාය.

ඇය තුළ වෙනසක් සිදුවනු මම ක්‍රමයෙන් දුටුවෙමි. මා උදෑසන අවදි වන විට, ඇය ස්නානය කරමින් ගී ගයනු ඇසෙයි.

'අන්තිම මොහොතේ' ඇඳ පැළඳගෙන පිටතට යන්නට පුරුදුව සිටි ඇය දැන් ග්‍රොසරියට යන්නට හෝ පන්තිවලට යන්නට සූදානම් වීමට පැය ගණන් ගත කළාය. ඇය බොහෝ වේලා කාමරයෙහි ගත කරයි. සමහර විට ඇය කාමරයේ දොර අගුළු දාගෙන සිටියි. අප එසේ කරන්නේ කලාතුරකිනි. හදිසියේම, ඇය ඇගේ මුහුණෙහි තිබෙන කුරුලෑවක් ගැන ප්‍රමාණයට වැඩි උන්නදුවක් දක්වන්නට වූවාය. කුරුලෑව ඉවත් කර ගැනීමට අප්‍රමාණ ක්‍රම සොයන්නට වූවාය, ඇය කෝමාරිකා මුහුණෙහි උලාගෙන නිවස වටා යාම ඉන් එකකි. එවිට ඇය පෙනුණේ ඇවිදින පතොක් ගසක්

මෙනි. ඇය හදිසියේම සිය බර ගැන උන්නදු වන්නට වූවාය. එමෙන්ම ළඟදීම ඇය ව්‍යායාම් සඳහා යන බවද කීවාය.

'එතකොට ඔයාගේ පන්තිවලට මොකද වෙන්නේ?' අම්මි කනස්සල්ලෙන් ඇසුවාය. 'ස්පීරෙටම දූන් ඔයාට ව්‍යායාම් කරන්න යන්න වෙලාවක් නෑ'

මා ද ව්‍යාකූලත්වයට පත් වූ බව මා කිව යුතුය. ඉතා පුංචි රිදුමක් මා සිතෙහි ඇතිවිය. සැමටම වඩා, අපි මෙතෙක් එක්ව සියල්ලම කළෙමු. ඇය සමග එක්වන්නැයි ඇය මගෙන් ඉල්ලා නොසිටින්නේ මන්ද? නැත්නම්, මගේ සිහින් සිරුර ගැන ඇය ඊර්ෂ්‍යා කළේද? මට ඇයගෙන් ඇසිය නොහැකිය, එහෙත් ඊළඟ සතියේදී ඇයගේ සැලසුම් ඉක්මනින් ක්‍රියාත්මක කරන අයුරු දුර්මුඛව බලා සිටියෙමි.

'මොකද ඔයාගෙ සහෝදරියට වෙලා තියෙන්නෙ' අම්මි සුසුම් හෙලුවාය. මට කළහැකි වූයේ අවුල් සහගතව මගේ හිස සෙලවීම පමණකි.

දිනක්, කතා පොතක් ගැනීම සඳහා මම ඇගේ දොර විවර කළෙමි, ඇය මට කෑගැසුවාය. 'ඔයාට තට්ටු කරලා එන්න බැරිද සෑම්?'

'මොකක්? ඔයා දන්නවනෙ මං කවදාවත් තට්ටු කරලා ආවෙ නෑ ඔයත් තට්ටු කරලා ආවෙ නෑ. ඔයාට මේ මොකද්ද ඇත්තට වෙලා තියෙන්නෙ?'

ඇය කිසිවක් කීවේ නැත, එහෙත් ඇය කෝපයෙන් සිටි බව පෙනිණි, ඒ, මා සැබවින්ම ඉතා වටිනා, සැබවින්ම අතිශය පෞද්ගලික තැනකට පැමිණීම නිසා ඇතිවූ කෝපයක් බඳු විය. එය, ඇයට මා සමග බෙදාහදාගත හැකි දෙයක් නොවීය.

ඒ සමගම ඇගේ දුරකතනය නාද විය, හදිසි පරීක්ෂාකාරී බවක් ඇගේ දෙනෙතෙහි පැන නැගිණි. ඇගේ ඇඟිලි ආරක්ෂිතව දුරකතනය වටා කරකැවුණද, පිළිතුරු දෙනු වෙනුවට ඇය එය විසන්ධි කළාය. ඇයගේ මුහුණ රතු වී ගියද, කුමක් නිසා, මේ අවස්ථාවේදී එසේ වූයේ දැයි මම නොදත්තෙමි.

'හොඳයි!' විශ්වාසය කඩ කළේය, යන හැඟීමෙන් යුතුව මම

කැගැවෙමි. 'කවදාවත් එන්න එපා මගෙන් උදව් ඉල්ලගෙන. මාව එච්චර නම් වටින්නෙ ඒකට කමක් නෑ.'

මා දොර අරින්නට සූදානම් වනවිටම මා පසුපසින් කිසියම් සෙලවීමක් ඇසිණි, ඇගේ අත මගේ උරහිස මත විය.

'සෑම්, කරුණාකරලා' ඇය කොඳුළාය. 'කේන්තිගන්න එපා. ඇතුළට එන්න. ඔයාට මට කතා කරන්න ඕන'

මා, ඇයට ගසන්නට අවශ්‍ය වෙලාවට ගැසීම පිණිස ඇති පන්චිං බෑගයක් නොවන බව කියන්නට සිතුණද, අඩ බියපත්, අඩ අපේක්ෂාවන් ඇති, ඇගේ මුහුණ දෙස බැලූ විට මගේ උගුරෙහි වචන හිරවිය. ඇය මගේ උපකාරය අවශ්‍ය නිවුන් සොහොයුරියයි, ඇයට උපකාර කරනු මිස අන් කුමක් කරම්ද?

මම ඇගේ ඇඳ මත හිඳගෙන ඇය දෙස බලා සිටියෙමි.

ඇය නොසන්සුන්ව සහ පැකිළෙමින් බොහෝ ලැජ්ජාවට පත් ව වචන සොයාගන්නට උත්සාහ කළාය. 'මම... මම... ඔයා එක්ක කතා කරන්න ඕන. මට ඔයාට කියන්න යමක්...'

'ඉතින් මට කියන්නකො'

'අනුමාන කරන්න බැරිද ඔයාට?'

මෙය කල් මැරීමකි. මම කෝප වීමි. 'ඔයා මට දැන් කියන්න, නැත්නම් හෙට පන්ති යන්න මගේ සාය දෙන්නෙ නෑ'

ඇය සිනාසුණාය, මගේ තර්ජනයෙන් මදක් හෝ නොසැලුණු ඇය මා වෙත ළං වූවාය. උද්‍යසන ඇය සිරුරෙහි තැවරූ පෙපර්මින්ට් ආලේපන දියරය සහ ඇගේ සිතෙහි ප්‍රබෝධය එකට මුහුවූ සුවඳ මට දැනෙන්නට විය. 'මට පෙම්වතෙක් ඉන්නවා' ඇය කොඳුළාය.

මම දිගැදී හිඳගතිමි. මෝඩයකු සේ ඇය දෙස දෑස් දල්වා බලා සිටියෙමි.

'මොකක්?'

'ම්... ම්... ඔව්' ඇය මාෂ්මෙලෝවක් තරම් රොස පැහැ වූවාය. මට තවමත් මොළය පෑදී නැත. මගේ සිතෙහි බොහෝ හැඟීම් ඇවිලෙමින් තිබිණි, විස්මය, අවිශ්වාසය, පුදුම සහගත බව, තැතිගැන්ම සහ වේදනාව!

'ඔයා මට කිව්වෙම නෑ'

'මට කනගාටුයි සෑම්. මට ඒක ඔයාගෙන් වසන් කරගෙන ඉන්න එක හුඟක් අමාරු වුණා. ඒත්... එහෙම කරන්න වුණා'

'මොකද්ද ඔයා අදහස් කරන්නේ?' මේ අබිරහස් පුද්ගලයා ගැන දැන ගන්නට මට බලවත් වුවමනාවක් තිබිණි, එහෙත් මා ඇය කෙරෙහි කෝප වූ බව දැනවීමට මට තවමත් අවශ්‍යව තිබිණි, මට එය සඟවාගෙන සිටීම ගැන මම කෝප වීමි.

'මං බයවුණා... එයා මට කිව්වා කාටවත් කියන්න එපා කියලා. ඔයාටවත්...'

'ඒත් ඇයි?' මම අවුලට පත්ව ඇසුවෙමි. ඒ සියල්ලටම වඩා, මා විශේෂයෙන්ම මගේ නිවුන් සොහොයුරියගේ රහස් ගැන කතා කරමින් ඇවිදින කෙනෙකු නොවන බව ඇය ඔහුට කිව යුතුව තිබිණි.

'එයා බයයි...අපි බයයි' අක්කා කොඳුළාය. 'මොකද එයා දෙමළ'

මම මගේ සොහොයුරිය දෙස බැලුවෙමි, ඇය ම දෙස බැලුවාය. අපි නිහඬව සිටියෙමු. මේ දිනවල අපේ පවුලෙහි දෙමළ තරුණයකු හා පෙමින් බැඳීම යනු කුමක්දැයි අපි දෙදෙනාම දැන සිටියෙමු. හිටපු හමුදා නිලධරයෙක් වූ තාත්ති, අතිශයින් ද්‍රවිඩ විරෝධියකු වූ අතර, සාරි මිල දී ගැනීමට දෙමළ සාප්පුවලට යාම තහනම් කර තිබුණේ එම මුදල් එල්ටීටීඊයට යනු ඇති බව කියමිනි. රටේ හොඳ රැකියා ලැබීමේ වරම රටේ සැබෑ ජන කොටස වන සිංහලයන්ට ලබා ගැනීමට බාධා කරන දෙමළ ජනයා රටට කරදරයක් බව දැඩි මතධාරි සිංහල බෞද්ධ පවුලකින් පැවත එන අම්මි සිතුවාය. මට දමිළ මිතුරන් සිටීම ගැන ඔවුහු සතුටු නොවූහ, ඔවුන් ගෙදරට ගෙන්වා ගැනීමේදීද, ඔවුන් ගැන වැඩිපුර කතා කළහොත්ද ඔවුහු කෝප වූහ.

'සති කීපයකට ඉස්සෙල්ලා මට එයාව මුණ ගැහුණා. එයා හරිම ප්‍රිය මනාපයි.' ඇය තෝන්තු වී ඇති බව පෙනිණි.

'අනේ, මට ඒක විශ්වාස කරන්න බෑ. ඔයාට කොල්ලෙක් ඉන්නවා?. ඒත් ඔයා මට කියන්න තිබුණා.'

යලිත් බුරුලක් නොපෙන්වීමට මම උත්සාහ කළෙමි, මගේ සොහොයුරියගේ මෝහනය වූ, ආදරයෙන් ගිලන් වූ මුහුණ දෙස බලමින් එසේ කිරීම අපහසු වූ නමුදු මම එසේ කළෙමි.

'අනේ කනගාටුයි සෑම්. කී පාරක් ඔයාට ඒක කියන්න මට ඕන වුණාද කියන එක ඔයා විශ්වාස කරන එකක් නෑ. ඒත් අපේ ආරක්ෂාවට යුද්ධෙ ඉවර වුණහම ඒ ගැන හැමෝටම කියමු කියලා එයා දිගටම කිව්වා'

'ඒක ඉවර වුණානෙ ඉතින්' මම නුරුස්සන ලෙසින් කීවෙමි.

ඇය මගේ කතාව නොසලකා හැර දිගටම කතා කළාය. 'මොකද්ද වුණේ කියලා ඔයා දන්නවද? එයා අවා, ජීව විද්‍යා පන්තියට එයාගේ සහෝදරියව බස්සන්න, මං පන්තියට එනකොට දැක්කා ඒ දෙන්නා පන්ති කාමරේ ඉස්සරහ කතා කර කර ඉන්නවා. එයා හරිම කඩවසම්. එයා කළුයි. ඔයා දන්නවනෙ මං කළු කොල්ලන්ට කැමතියි කියලා හරිද? එයා ඇඳලා හිටියේ ලා නිල් ටී ෂර්ට් එකකුයි, ඩෙනිම් කලිසමකුයි, ස්නීකර්ස් සපත්තු දෙකකුයි. පුංචි රැවුලකුත් තිබුණා. එයා හරිම ආදරණීය, සුන්දර විදිහට එයාගේ සහෝදරී අරුනියා දිහා බලලා හිනාවුණා. මං හිතුවා එයා ඇගේ පෙම්වතා කියලා. ඒ එක්කම මං ප්‍රාර්ථනා කරමින් හිටියා එයාට පෙම්වතියක් නොඉන්න ඕන කියලා. එයා හැමදාම ඇයව ඇරලවන්නයි, ආපහු එක්කරගෙන යන්නයි ආවා, මට දවසක් ඇහුණා ඇය ඔහුට අයියා කියලා කතා කරනවා. මම වඩා බලාපොරොත්තු තබාගෙන නොහිටියත් ඇයි එයා හැමදාම එන්නෙ කියලා මං හිතුවා. මං හිතන්නෙ, එයා එන්නෙ නංගිගෙ ආරක්ෂාවටම වෙන්න බෑ. මොකද සමහර දවස්වල ඇගේ දෙමාපියො ආවා ඇය එක්කරගෙන යන්න, එතකොටත් මෙයා ආවා. එහෙම ඇවිත් මං දිහා හුඟක් වෙලා බලන් ඉන්නවා. නැත්නම් මං එනකල් මග බලාගෙන ඉන්නවා එයා ආපහු යන්න'

'ඉතින් ඊට පස්සෙ' මම ඇයට ළංවීමි.

'දවසක් අරුනියා මා ළඟට ඇවිත් කිව්වා, 'මගේ අයියා ඔයාට හරිම කැමතියි. මට තේරෙන්නේ නෑ මොකක් කියන්නද කියලා. ඔයාට

හිතාගන්න පුළුවන් නේද?' 'මොකද්ද ඔයා අදහස් කරන්නේ?' මම ඇහුවා. එතකොට ඇය කිව්වා 'අයියා කිව්වා මේක ඔයාට දෙන්න කියලා' එය සටහනකි. ඒ සටහනේ තිබුණේ එයා කාලයක් මං දිහ බලාගෙන ඉන්නවා කියලා. ඇය කබඩය අත පත ගෑවාය. 'මං ඔයාට ලියුම පෙන්වන්නම්'

මා ඊට පෙර කිසිදිනෙක සැබෑ ආදර හසුනක් දැක තිබුණේ නැත. මම කතා කරන්නට බොහෝ තුටු වීමි.

ආදර ප්‍රමෝදි,

මෙය පරණ තාලේ වැඩක් බව මම දනිමි, මේ කුමක්දැයි ඔය විමතියට පත්වනු ඇති බවද දනිමි. මට පැහැදිලි කිරීමට ඉඩ දෙන්න. ඒ පළමු දිනයේ මා අරුණියා සමග සිටියදී, ඔබ පන්තියට පැමිණි අවස්ථාවේදී, ඔබ මා දෙස බලනු මම දුටුවෙමි. එමෙන්ම ඔබ කෙතරම් සුන්දරද යන්න මම දුටුවෙමි. අවංකවම, මට මගේ දෑස් ඔබ වෙතින් මුදාගත නොහැකි විය, ඒ මොහොතේ සිට මා මගේ නැගනිය ඇරලවීම යන කාරණාව හැර, වෙනත් කාරණාවක් සඳහා හැමවිටම ඔබගේ පන්තියට පැමිණීයෙමි. ඔබ දැකීමෙන් මම අපමණ සතුටට පත්වෙමි, කිහිපවතාවක් ඔබ මා වෙත පෑ සිනාව මට කවදාටත් වඩා වැඩි පූර්ණතාවයක් ගෙන දුන්නේය. පෙනුම පමණක් පදනම් කරගෙන මා තීරණවලට එළඹෙන්නේ යැයි නොසිතන්න. අවසානයේදී, මට එය සිතෙහි සිරකරගෙන සිටිය නොහැකි තැන, මම අරුණියාට මගේ හැඟීම් ගැන කී කල්හි, ඇය බොහෝ සතුටට පත්ව මට කීවේ, පන්තියේ සිටින සියලුම ගැහැණු ළමුන්ගෙන් ඇය විශේෂයෙන් කැමති තැනැත්තිය ඔබ බවයි. එමෙන්ම, ඔබ ඉතාම හොඳ, කරුණාවන්ත, ආදරණීය කෙනෙකු බවත්, ඉගෙනුමෙහි දුෂ්කරතා ඇති සිසුන්ට නිරන්තරයෙන් උපකාර කරන බවත් ඇය කීවාය. ඇය ඔබ ගැන එබඳු හොඳ දේ කීවාය, ඒ සියල්ල බලාපොරොත්තු රහිතව ආදරයෙන් බැඳී සිටින කෙනෙක් මා තුළ මට ඉතිරි කළේය.

අරුන්.

මම ඇය දෙස බැලුවෙමි. කුමක් කියම්දැයි මම නොදත්තෙමි. 'ඔයා මොකද්ද එයාට කිව්වෙ?' මම කොඳුළෙමි.

ඇය මදෙස බලා උරහිස සෙලවූයේ ඇයට සැබවින්ම වෙනත්

විකල්පයක් නොතිබුණු බව කියන්නට මෙනි. ඇයද නොබිඳිය හැකි ආලයකින් බැඳී සිටියාය.

මා අක්කිගේ පන්තියට ගිය විට මට පළමු වතාවට ඔහු මුණ ගැසිණි. ඔහු ඇය විස්තර කළ ලෙසින්ම උස්, පැහැයෙන් කළු සහ කඩවසම්, සුරංග නා කතාවන්හි එන තරුණයකු බඳු කෙනෙකු වූයේය. අක්කි උමතුවෙන් ආදරය කළ මද දමිළ උච්චාරණයක්ද ඔහුට තිබුණු බව අක්කි මට කීවාය. ඔහුගේ එක් වැලමිටක පැරණි තුවාලයක කැළලක් තිබිණි, ඔහු කීවේ එය පැසිපන්දු තරඟාවලියකදී ඇති වූ තුවාලයක කැළලක් බවයි.

'හායි' මම ලැජ්ජාවෙන් කීවෙමි. අවසානයේදී ඔහු හමු වූ නමුත් කුමක් කිව යුතුදැයි නොදත්තෙමි. මම සිනාසෙමින් සිටියේ, මගේ වචන ගලා නොඒම එමගින් පිරිමැසෙනු ඇතැයි සිතාගෙනය.

ඔහු හොඳ පහසුවෙන් සිටියේය.

'ඉතින් ඔයා ප්‍රාගේ සහෝදරී' ඔහු සිනාසෙමින් කීවේය. 'මං සතුටු වෙනවා අන්තිමේදී ඔයා මුනගැහිච්ච එක ගැන. ඔයා ගැන ගොඩක් දේවල් අහලා තියෙනවා'

ඔහු දිගු කළ අතට මම මගේ අත දිගු කළෙමි. ඔහුගේ පෙම්වතිය සමීපයේ සිටින එම රූපයම ඇති තැනැත්තිය දැකීමෙන් ඔහුගේ හැඟීම කෙබඳු වන්නට ඇද්දැයි සිතුවෙමි.

මගේ සිතුවිලි තේරුම් ගත්තාක් බඳුව 'ඔය දෙන්නා හරියටම එකම වගේ'යි කෑගැවේය.

අක්කි සිනාසුණාය. 'ඒකයි අපට නිවුන්නු කියන්නෙ. අරුන්' ඇය කතා කළේ රහසක් බඳු මුදු හඬිනි. ඇය ඔහුට ළං වූ අතර ඔහු ඇගේ බඳ මුදු ලෙස වෙලා ගත්තේය. ඔහු ඇය දෙස බලන විට ඔහුගේ බැල්මෙහි ඇති ආදරය මම දුටුවෙමි. 'ම්... ම්... මං බලාපොරොත්තු වෙනවා, යම් දවසක ඔය දෙන්නා අඳුරා ගැනීමේදී මට වැරදීමක් නොවෙයි කියලා'

'ආ... නෑ' යි මම සරදම් කළෙමි. ඔහු මගේ ඇස අල්ලා ගත් අතර, කීප මොහොතකට පසුව, අපි සියලු දෙනා කොක් හඬලා සිනාසුණෙමු.

ඔවුන් දෙදෙනා එක්ව සිටින විට ඉතා ප්‍රියාමනාප බව මා පිළිගත යුතු වෙයි. ඔහු හොඳ තරුණයෙක් බවද පෙනෙයි. මා අක්කි හමුවීමට යන අවස්ථාවලදී, ජීව විද්‍යා පන්තියේ ඉදිරිපිට පදික මාරුවේදී මහලු ගැහැණුන්ට, පිරිමින්ට පාර මාරුවීමට ඔහු උදව් කරනු මම නිතර දැක ඇත්තෙමි. එක්වරක් පන්තියේ ශිෂ්‍යයෙකුට තුවාල වූ විට අරුන් ඔහු රෝහලට කැඳවාගෙන ගියේය. ඒ දෙදෙනා, දෙදෙනාට කදිමට ගැලපෙන බව මට හැඟී ගියේය, ඇගේ මුදු, කාරුණික හදවතත්, ඔහුගේ නිරන්තරයෙන් උපකාර කිරීමේ ගුණය හා උණුසුම් සිනාරැල්ලත් සමග දෙදෙනා මනාව ගැලපෙයි.

අක්කා තවදුරටත් කිසිවක් මගෙන් සැඟවූයේ නැත, අපි තුන්යහළු රැනක් වීමු, ඇය, ඇගේ පෙම්වතා සහ මම. (අරුණියා බොහෝ වේලාවට අපගෙන් ඈත්ව සිටියාය, සමහර විට ඇගේ වැඩිමහලු සහෝදරයා වුවමනාවට වඩා ඇඟිලි නොගසන්නැයි උපදෙස් දී තිබෙන්නට ඇත) සැබවින්ම, මම ඔවුන්ගේ හැමදෙයකටම සම්බන්ධ වූයේ නැත. අරුන්, ආදරයේදී සියල්ල තමාටම අයිති කරගැනීමේ අදහසින් ක්‍රියාකරනන්කු බව පෙනී ගිය අතර, සිය පෙම්වතිය මුළුමනින්ම තමාටම අයත්ව තබාග ැනීමට ඔහුට අවශ්‍ය විය. වරක් අක්කා මට කී පරිදි ඔහු මෙසේ කියා තිබිණි. 'ඔයා මාව අතෑරලා ගියොත් මං ඔයාව මරලා මාත් මගේ ජීවිතේ නැති කරගන්නවා, මට ඔයා නැතිව කිසිදාක ජීවත් වෙන්න බෑ'. මෙය මුලින්ම ඇසූ අවස්ථාවේ මට කතාකර ගත නොහැකි විය, අරුන් සැබවින්ම එසේ කියන්නේ බැරෑරුම් ලෙසින් නම්, සැබවින්ම අක්කි පිළිබඳ බරපතල තත්ත්වයක් පෙනෙයි. ඔහු කෙතරම් බරපතල ලෙස සිතන්නේද යන්න මට සහතික නැත, අක්කා එයට සූදානම් ද යන්න ගැන මගේ සිතෙහි විස්මයක් ඇති විය. ආරම්භයේදී එය මට බොහෝ අසීරු වූ බව මම පිළිගනිමි, මට අක්කි සමග සාප්පු යාමට වුවමනා වී බැලූ විට ඇය සිය පෙම්වතා හමුවීමට යොදාගෙන තිබුණාය. මට ඇය සමග කතා කිරීමට වුවමනා වී සමහර විටෙක මා ඇගේ කාමරයට ගිය විට, ඇය දුරකතනයට ඇලී සිටිනු දකිමි, ඇගේ දෑස් තරු දෙකක් මෙනි, මා ආවාද නැද්ද කියා ඇය නොදනියි. සමහර විටෙක හේතුවක් නොමැතිව ඇගේ දෙතොලෙහි මතුවන මද සිනාවක් මම දකිමි, ඔහු කිසියම් මිහිරි දෙයක් කියන්නට ඇතැයි ද, ඇයට එය නැවත ප්‍රතිරාව කළ නොහැකි බවද දනිමි. මෙය කිසියම් දිනෙක සිදුවිය හැකි දෙයක් බව දැන සිටියද, දැන් ඇය අයත්

ඔහුටය. අප දෙදෙනා තවදුරටත් එක් බලගතු ඒකකයක් නොවන බව සම්පූර්ණයෙන් පිළිගැනීම තවමත් අසීරුය. ඇයට ඇගේ ජීවිතය හා ඇගේ ප්‍රීතියද තිබේ, මම එයට බාධා කරන්නට තරම් තැනැත්තියක නොවෙමි.

එහෙත්, ඇයට ඔහු නිසි ලෙස සලකන්නේද යන්න යන්න සමීපයෙන් සිට මා නොබලනු ඇතය යන්න එයින් අදහස් නොවේ. අක්කි සිත් කරදරයෙන් සිටින බව දුටු විට, මගේ පළමු ප්‍රශ්නය වන්නේ ඇගේ සිත රිදවීමට ඔහු කිසිවක් කීවේද යන්නය. එහෙත් ඇය ඔහු සමග සපුරාම සතුටින් සහ සමාදානයෙන් සිටින බව පෙනෙන්නට තිබිණි. එකම එක් අවස්ථාවක පමණක් නොසන්සුන් මුහුණකින් යුතුව ඇය කීවේ 'මං හිතනවා අරුන්ට ඇත්තටම හරියට තරහා යනවා කියලා'

'ඇයි?' මට මද සිත් රිදුමක් ඇති විය.

'නෑ, නිකන්... ඔයා දන්නවනෙ... පවන් මට කැමතියි. ඊයෙ එයා අරුන්ට කිව්වා අරුන්ට වඩා එයා මට ආදරේ කළා කියලා, අරුන්ට හොඳටම තරහ ගියා, අරුන්, පවන්ගේ ඔලුව පැලුවේ නැතුවා විතරයි'

'ඕ... දුප්පත් පවන්' මට සිනාව නවතාගත නොහැකි විය, පවන් අරුන්ට වඩා අඩියක්වත් මිටිය, ශක්තිමත් හා ගාම්භීර අරුන්ගෙන් තැලුම් කන පවන් මට චිත්‍රණය කොටගත හැකිය. 'ඔයා තවත් කොල්ලන්ව වසඟ කරගන්නෙ නැතුව ඉන්නවා නම් හොඳයි' මම සරදම් කළෙමි. 'ඒ ගොල්ලො හැමෝගෙම බෙලි කැපිලා යයි ! '

අප අපගේ උසස් පෙළ විභාගය කළේ කෙසේදැයි ලියන්නට මම වැඩි කාලයක් නොගනිමි, අවංකවම, මට සැබවින්ම දැන් ඒ ගැන කරදර විය නොහැකිය. කෙසේවුවද, යම් වැදගත් දෙයක් සිදුනොවීය. උසස් පෙළ විභාගයෙන් පසු කාලය විනෝදජනක විය. අපි පිහිනුමට, නැටුමට, පවුලේ චාරිකාවන්ට සහ වරු ගණන් සාප්පු සවාරි සඳහා කාලය ගත කළෙමු. මෑත අතීතයේ කරදර බොහොමයක් නොතිබුණ බැවින්, අප එක්ව යන්නේ නම් එසේ යාම ගැන දෙමාපියන් කරදර වූයේ නැත.

එක් දිනක් මගේ කාමරයේ දොරට තට්ටු කරනු ඇසුණු අතර අක්කි කාමරය තුළට පැමිණියාය. ඇය හති දමමින් සිටියාය.

'මොකද්ද?' ඇයට සමීපව ඇය දෙස බලමින් මම ඇසීමි.

ඇය දොර වසා එහි අගුලු දමුවාය, 'අරුන් ඇහුවා චිත්‍රපටියක් බලන්න එන්න කැමතිද කියලා' ඇය කීවාය.

'චිත්‍රපටියක්? ඔය දෙන්නා විතරක්? වාසනාවන්ත මෝඩියේ, කොච්චර රොමැන්ටික්ද?' ඊර්ෂ්‍යා සහගත හැඟීමක් ඇතිවීම මට වළකාගත හැකි නොවීය. ඇත්තෙන්ම මම ඇය ගැන සතුටු වෙමි, මම එසේ සතුටු වීමි, එහෙත් එය අසාධාරණ යැයිද මට හැඟී ගියේය. චිත්‍රපට බලන්නට යාමේ ආසාවෙන් සිටියේ මාය. අක්කි කැමති ඒවා සෝපාවේ වැතිර නිවසේදී බැලීමටය. ඒ මොහොතේදී මටද පෙම්වතෙක් සිටියේ නම් මැනවැයි සිතුවෙමි.

'නෑ, නෑ, අපි දෙන්නා විතරක් නෙවෙයි. මං එයාට කිව්වා ඔයා චිත්‍රපට බලන්න හරි ආසයි කියලා. එයා කිව්වා ඔයාටත් එන්න කියලා. ඒ ඔක්කොම එයාගෙ ගානේ....' ඇය කාන්තිමත් ලෙසින් කීවාය.

සිනමාහලේදී මම අක්කීට යාබද අසුනෙහි ඉඳගතිමි, අරුන්, ඇයගේ අනෙක් පසින් ඉඳගත්තේය. මේ අවස්ථාවේ අරුණියාද අප හා එක්වූවාය. ඇය මගේ දකුණු පසින් ඉඳගත්තාය. තරුණයෙක් බැරිවීමකින් හෝ පසුපස හැරුණොත් සහ අප සිටින දෙස බැලුවහොත්, අරුන් මගේ සොහොයුරිය තදින් තුරුළු කොට ගන්නේ, ඇය අයත් වන්නේ තමාටම, තමාටම පමණක් බව කියාපාන්නාක් සේය. වරින්වර, මගේ ඇස් කොනින්, අරුන්ගේ උරහිස මත අක්කි හිස තබාගෙන සිටිනු මම දුටුවෙමි, මම ඇයට චිත්‍රපටය පිළිබඳ යමක් කියන්නට හැරුණු විට, ඇය ඇගේ පෙම්වතා සමග රහස් මුමුණමින් සිටිනු දක්නට ලැබිණි.

'ඒයි ඔය දෙන්නා චිත්‍රපටය ගැන අවධානය යොමුකළොත් හොඳයි' කියමින් මම සරදම් කළෙමි. ඇය මා වෙත හැරී මට පහරක් ගසා, අනතුරුව මට දිව දිගු කර, තව තවත් අරුන්ට තුරුළු වූවාය.

'අයියෝ ඔය දෙන්නා ශෘංගාර චිත්‍රපටියකටත් වඩා නරකයි' මම මුහුණක් සාදාගනිමින් කීවෙමි.

ආලයෙන් උමතු වූ මගේ සොහොයුරිය සම්පූර්ණයෙන්ම සිය

පෙම්වතාට ඇලී ගැලී සිටියෙන්, අරුණියා සහ මම එක පසෙකට තල්ලු විමු. ඇය, අරුණියා හොඳ දැරියක බව මා කිව යුතුය. මා සහ අක්කා මෙන්ම ඇයද පිහිනීමට කැමති බව මම දැන ගත්තෙමි, එහෙත් ඇයට පිහිනුම සඳහා යන්නට කිසිවෙක් සිටියේ නැත. 'ඔයා අපිත් එක්ක එන්න' යැයි මා කීවේ දෙමළ ගැහැණු ළමයකු කැටුව යාම ගැන අපගේ දෙමාපියන් කැමති නොවන බව මොහොතකට අමතක වීමෙනි. අපගේ සබඳතාව ඔවුන් දැන සිටියේ නම්, එය එතරම් හොඳ නොවනු ඇත.

මම සාකච්ඡාව අපගේ අනාගත සැලසුම් වෙත යොමුකළ අතර, මගේ සිහිනය යම් දිනෙක ලේඛිකාවක වීම යැයි අරුණියාට කීවෙමි.

'වාව් ! ' ඇය ගරු සරු ස්වරයකින් කීවාය. උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා ඇයට ඉන්දියාවට යාමට අවශ්‍යව ඇති බව පෙනෙන්නට තිබිණි.

'එත් ඇයි?' මම ඇසුවෙමි. 'ඔයාට මෙහෙ යුනි යන්න පුළුවන් නේ?'

'අප්පාට මං මෙහෙ ඉන්න වුවමනා නෑ. අප්පා කියනවා මෙහෙ ආරක්ෂාව නෑ කියලා' ඇය සැක සහිත ලෙස වට පිට බැලුවාය. මේ විටින් විට ඇතිවන කලකෝලාහල යාපනයේ යුද්දෙ, අප්පා කියන්නේ මේ රටේ දෙමළ මිනිසුන්ට ආරක්ෂාව නෑ කියලා. එයාට ඕනකම තියෙන්නේ අරුන්වත් මා එක්ක අරින්න, ඒත් අරුන්ට ඕනකමක් නෑ යන්න. අන්තිම වතාවේ අප්පා ඔය කතාව කිව්වම අරුන්ට හොඳටම තරහ ගියා. ඇය අක්කි දෙස බැලුවේ, අරුන්ගේ ප්‍රතික්ෂේප කිරීම කුමක් දැයි යන්න හැඟ වීමට මෙන් අක්කි දෙස බලමිනි, අනතුරුව ඇය මා වෙතට නැඹුරු වී කොඳුළාය. 'එයා කියනවා සමහර වෙලාවට එයාට හිතෙනවා කියලා පැනලා ගිහිල්ලා එයාගෙම ජීවිතයක් ගත කරන්න, හේතුව මොකද අපේ දෙමාපියෝ මේ ඉන්දියාව සම්බන්ධ කාරණාව ගැන කටයුතු කරන විදිහට'

අරුන්ට රට හැර යන්නට සිදුවුවහොත් මගේ අක්කීට කුමක් සිදුවනු ඇද්දැයි මම සිතුවෙමි. ඇගේ සිනාපිරි මුහුණ හා ආදරයෙන් දැල්වෙන දෑස දෙස බැලීමෙන් හදිසියේම මම බියපත් වීමි. අපගේ දෙමාපියන් දන්නා හඳුනන කිසිවකු සිටීදැයි වටපිට බලමින් සිටීමට සිදුවීම හැරෙන්නට ගමන ඉතා හොඳ එකක් විය.

අපි දහවල් ආහාරය සඳහා පීසා අවන්හලට ගියෙමු. (තවත් තර්ජනයක්!) එහිදී බලාසිටීම විනෝදජනක කරුණක් වූයේ, අක්කීට ඉල්ලූ දෙයට වෙනස්ව වේටර් තැන චීස් පීසාවක් ගෙන ඒමෙන් අරුන් කෝපයට පත්වීමය.

අරුන් දුම්දමන තැටිය පසෙකට තල්ලු කරමින් කෑගැවේය, 'මට මේක එපා. මං ඉල්ලපු දේ ගේනවා'

අක්කි ඔහුගේ අත මත සිය අත තැබුවාය. 'ඒකට කමක් නෑකමක් නෑ. මට මේක හොඳයි'

'ඒත්...' අරුන් තවමත් සිටියේ කෝපයෙනි.

'නෑ නෑ... ඇත්තටම. මේක හොඳයි' අක්කී කීවාය. අනතුරුව ඇයගේ මුහුණ රතු විය. 'මං චීස් නැතුව පීසා එක ඉල්ලන්න හේතුව, මට කෙට්ටු වෙන්න තියෙන වුවමනාව. කෙට්ටු වුනහම මං වැඩිය හොඳට පේන හින්දා ඔයාට. මං ඇත්තටම චීස්වලට ආසයි'

'ඕ මගේ මෝඩ ප්‍රා...' අරුන් ඇගේ අත සියතින් වෙලා ගනිමින් ඇය තමාට සමීප කොට ගත්තේය. 'ඔයා දන්නවනේ ඔයා ආදරේ කරන විදිහටම මම ඔයාට ආදරේ කරනවා. ඔයා මොනවත් වෙනස් කරන්න ඕන නෑ තේරුණාද? මට ඔයා වෙනස් වෙන්න ඕන නෑ'

අරුණියා සහ මම එකිනෙකා දෙස බැලීමු.

දුප්පත් වේටර්වරයා, ස්වල්ප මොහොතක් රැඳී සිටීමෙන් පසුව ඔහු රැඳෙනාවාද නැද්ද යන්න කුමක්දැයි නිශ්චිත නොවූ බැවින්, අවසානයේ යන්නට ගියේය. එයින් පසුව, කෑම ගැනීම හොඳින් සතුටින් සිදුවූ අතර, අක්කිගේ මුහුණෙහි වූ අර සිනාව සිය මුහුණින් ඉවත්කර ගැනීමට නොහැකි වූ බව පෙනිණි.

අප නිවසට එන විට මදක් ප්‍රමාද විය, අම්මි කිසිවක් අසනු ඇතැයි මම සිතුවෙමි, එහෙත් ඇය කිසිවක් නෑසුවාය. නිවසට පා තබන විටම මගේ දෙමාපියන්ගේ සිනා දැකීමෙන් මගේ සිතෙහි වරදකාරී බවක් ඇති විය.

'ඒයි, අම්මියි තාත්තියි ගැන මොකද?' ඊළඟ දිනයේ ඇගේ ඇඟිල්ලෙහි වූ දිලිසෙන රිදී මුදුව මට පෙන්වා අවසන් වූ පසුව මම ප්‍රවේසමෙන් ඇසුවෙමි.

'ආ හැමදේම වෙලාවට ඒ ඒ විදිහට විසදෙයි ..' සාමයට බාධාවීම කිසිසේත් නොරුස්සනා අක්කී කීවාය.

'ඔයාට එහෙම කියලා නිකන් ඉන්න බෑ තේරුණාද? දැන්ම හරි පස්සේ හරි ඒ ගොල්ලො මේක දැනගන්න ඕන. ඒ ගොල්ලො මේක අහන්න කලින් ඔයා කියන එක හොඳයි.'

'මම දන්නවා' ඇය සුසුමක් හෙළුවාය.

'අරුන්ටත් ඕන මම අම්මලට මේක කියන එක. දවස් කීපෙකට ඉස්සෙල්ලා අරුන් එයාගේ දෙමාපියන්ට මේ ගැන කියලා තියෙනවා. ඒ ගොල්ලො එච්චර කැමැත්තක් නැහැ, ඒත් මාව මුණ ගැසීම තහනම් කරලා නෑ. එයාට කියලා තියෙන්නේ පරිස්සම් වෙන්න කියලයි, මේ දවස්වල තියෙන තත්ත්වෙ හිතේ තියා ගන්න කියල විතරයි. ඒක එහෙමයි... මං බයයි... අම්මයි තාත්තයි එයාට කැමති නූනොත් එයාගේ හිත හොඳටම බිඳෙයි... මගෙත් එහෙමයි... මං එයාට ආදරෙයි'

'මං දන්නවා අක්කි' මම ඇයට ළංවී තරයේ ඇය වැළඳ ගත්තෙමි. 'ඒක හින්දා තමයි අක්කි ඔයා ඒක ඒ ගොල්ලන්ට කියන්න ඕන. එතකොට කොහේදි හරි කවුරුහරි දකියි කියලා ඔයා බය වෙන්න ඕනත් නෑ. අම්මලට කිව්වම ඔක්කොම හරි යයි. ඒ ගොල්ලො තේරුම් ගනීවි'

ඒ සමගම මා තුළ සැකයක්ද විය. අරුන් දමිළයකු වීම... කුමක් සිදුවනු ඇද්දැයි මම නොදනිමි.

අපගේ උභතෝකෝටික ප්‍රශ්නය ඉක්මනින් විසඳෙන මගකට හැරිණි, චිත්‍රපටය නැරඹීමෙන් දින කිහිපයකට පසුව, දෙමාපියන්ගේ නිදන කාමරය වෙත අප කැඳවනු ලැබුණි. අක්කි බියෙන් වෙව්ලන්නට වූවාය. මම ඇගේ අත මිරිකමින් එහෙත්, සියල්ල වැරදී යනු ඇතැයි බියෙන්, කතා කිරීමට බොහෝ බිය වීමි.

අපගේ දෙමාපියන් ඇඳ මත හිඳගෙන සිටිනු දුටුවෙමු. තාත්ති

කෝපයෙන් සිටියේය. අම්මිගෙ ඉරියව් තේරුම් ගත නොහැකි විය. යම්දෝ නොයම්දෝයි අප දොර අසල ළත වීමු. මගේ ඇස් ගැහෙන්නට විය.

අනතුරුව හෙන ගෙඩිය පහත් විය. 'දෙන්නගෙන්ම මට අහන්න යමක් තියෙනවා' අම්මී කීවාය. අපි නිහඬව සිටියෙමු. 'ඔය දෙන්නගෙන් එක්කෙනෙකුට පෙම්වතෙක් ඉන්නවද?'

මම දෙනෙත පොළොවට යොමු කොටගෙන සිටියෙමි. කුඹියෙක් බිම තිබූ ගුලකට යමින් සිටියේය. ඌ වාසනාවන්තය.

'ළමයි උඹලා අපිට කියන්න ඕන' අම්මි කීවාය.

මේ සියල්ල මතුවන්නට පෙර අක්කි මෙය දෙමාපියන්ට හෙළි කළේ නම් මැනවයි සිතූ මගේ සිතෙහි ඇය කෙරෙහි මහත් දුකක් ඇති විය. මම සෙමින් හිස ඔසවා ඇය දෙස බැලුවෙමි. කතාව හෙළිකරන්නට මගේ එකඟතාව ලබා ගන්නට මෙන් ඇය මදෙස බැලුවාය. මම හිස සෙලවීමි.

'ඔව්' ඇගේ හඬ පුදුමාකාර ලෙස පැහැදිලිය. මට පෙම්වතෙක් ඉන්නවා, හුඟ කාලෙක ඉඳන් මට මේක අම්මට කියන්න ඕනකම තිබුණා. විශ්වාස කරන්න. එත් මට ඒක කවදද... කොහොමද කියලා හිතාගන්න බැරි වුණා. මට කනගාටුයි.'

මගේ දෙමාපියෝ එකිනෙකා දෙස බැලූහ. එහෙත් ඔවුන්ගේ මුහුණුවල හැඟීමක් නොපෙනිණි. කිසිදු අවුල් සහගත බවක් තිබුණු බව නොපෙනිණි. ඔවුන් හැමවිටම එසේය. ඔවුහු කැගසන, සිපගනු ලබන හෝ ඔබ විභාගය හොඳින් සමත් නම් ප්‍රමෝදයෙන් එහා මෙහා දුවන පනින අය නොවේ. ඔවුන් නිකමට මෙන් සිනාසෙනු ඇත.

'කොච්චර කල්ද?' තාත්තිගේ දැඩි කටහඬ මගේ සිතිවිලිවලට බාධා කළේය.

'මාස කිහිපයක්, මාස නවයක් විතර තාත්ති'

'උඹලා අපට කවදාවත් කිව්වෙ නෑ...' අම්මාගේ සිතෙහි කෝපයට වඩා තිබුණේ හිත පෑරුනු ස්වභාවයකි.

'මට කනගාටුයි අම්මි ඇත්තටම කනගාටුයි' අක්කි හැඬුම්බර වන්නට වූවාය. ඇත්තටම කියන්න ඕනකම තිබුණාඒත් මං බයවුණා අම්මි, මගේ උසස් පෙළ විභාගෙ ළංවෙනවාඒ ඔක්කොම හින්දා අම්මා හිත කරදර කරගනියි, තරහ යයි කියලා මං බයවුණා'

'ඔයා හිතනවාද දූන් මං තරහින් නෙවෙයි කියලා? මගේ හිත කරදර නෑ කියලා? සීතා නැන්දා දවසක් මට කතා කරලා මේක කිව්වම මට හැඟිච්ච දේ ඔයා දන්නෙ නෑ, එයා කිව්වා ඔය දෙන්නා පිරිමි ළමයෙක් එක්ක මැක්ඩොනල්ඩ් එකට යනවා දැක්කා කියලා. කළු රිටක් වගේ උස එකෙක්. හිතන්න මිනිස්සු මොනවා හිතයිද කියලා, ඔය දෙන්නා ඒ විදියට යනවා දැක්කම. අපිට කිව්වා නම්, අපිට සාකච්ඡා කරන්න තිබුණා, සමහර විට ඔහුට මෙහෙ එන්න කියන්නත් ඉඩ තිබුණා. මේ දවස්වල ඉන්න ගෑනු ළමයි තමන්ගේ තත්ත්වය ගැන හිතන්නෙ නෑ. අපේ කාලෙ, ඇත්තටම, අපි කවදාවත් පිරිමි ළමයෙක් එක්ක කොහේවත් ගියේ නෑ, අපි එක්ක විවාහ ගිවිසගන්න ඉස්සෙල්ලා'

'ඒකාගේ වයස කීයද? ඒකා මොනවාද කරන්නෙ' තාත්ති මැදට පැන ඇසුවේය.

ඔහු ගැන කතා කරන විට අක්කීගේ දෑස් දිල්වෙන්නට විය. 'එයාගේ වයස අවුරුදු විසිදෙකයි, වැඩ කරන්නෙ බැංකුවක. එයා සාමාන්‍ය පෙළ කළාට පස්සෙ ඉස්කෝලෙන් අස්වෙලා ගණකාධිකාරීවරයෙක් හැටියට සුදුසු කම් ලබලා, හැටන් නැෂනල් බැංකුවට බැඳිලා. එයා ඒකෙ වැඩ කරනවා අවුරුදු...'

'දන්නවද එයාගෙ පවුල් තත්ත්වය? එයාගෙ අනාගත සැලසුම්?' මගෙ මව අනතුරුව අතරමැදට පැන්නාය.

'ඔව්' අක්කි කීවාය. 'අරුණියා හරිම හොඳයි. එයාගේ සහෝදරී. ඇය ඉන්නෙ මගෙ ජීව විද්‍යා පන්තියෙ'

මගේ බැල්ම අම්මා වෙත යොමු විය. හෙළිදරව්ව ක්‍රමයෙන් ඇගේ මුහුණෙහි ඇඳී යනු මම දුටුවෙමි. එය සිදුවන්නට පෙර බිය අත්විඳින්නට මට කුඩා කාලයක් ලැබිණි.

'අරුණියා ??? ඒත් ඒක දෙමළ නමක්නෙ. ඔහු... ඔයා කියන්නෙ ඔහු දෙමළද?' ඇගේ මුහුණෙහි වූ පෙනුම බිය ගන්වන සුළු විය. එය හරියට, මෙතෙක් වේලා ඇය රස විඳි චොකලට්ටුව සැබවින්ම ගොම පිඩක් යැයි දැන ගත්තාක් මෙනි.

අක්කී පිළිතුරු දුන්නේ නැත. ඇය පිළිතුරු දුන්නද ඔවුන්ට එය නෑසෙනු ඇත. තාත්තාගේ අත්මිට මෙළවී තිබිණි. 'උඹට සිහිවිකල් වෙලාද?' ඔහු ගිගුරුවේය. 'අපි කියපු හැමදේම උඹලට අමතක වුණාද? මේ දෙමළ මිනිස්සු අපේ රට නැති නාස්ති කරලා විනාශ කරපු හැටි ගැන කියපු හැමදේම? එල්ටීටීඊය පවුල් ඇතුළට රිංගලා පවුල් විනාශ කරන්නෙ කොහොමද කියලා අපි කියලා දුන්නු දේවල්? අපි දන්න එකම දේ මේකා එල්ටීටීඊ ඔත්තුකාරයෙක් වෙන්න ඇති. මගේ දුව, මගේ දුව, ගිහිල්ලා සම්බන්ධයක් ඇති කරගන්නවා ඔහු එක්ක. සම්බන්ධයක්....' ඔහු කෝපයෙන් පුපුරමින් කතා කළේය.

මගේ පියා කෝපත්ව සිටිනු මා දැක ඇත්තේ අවස්ථා කිහිපයකදී පමණකි, ඒ කිසිදු අවස්ථාවක් මෙතරම් දරුණු නොවීය. අක්කා කතා කිරීමට බොහෝ බියෙන් බිම බලා ගත්තාය.

'මෙච්චරයි' මගේ පියා තිර හඬකින් කීවේය. 'අපි උන්ව විශ්වාස කරලා උන්ට ඕන තැනක යන්න දුන්නා. ඒත් මෙයින් පස්සේ තනිවම එළියට යන්න දෙන්නෙ නෑ. ඒක උඹටත් අදාලයි' මා දෙස බලා හිස සොලවා තාත්ති කීවේය. 'අපිට වුවමනා නැහැ උඹත් උඹේ සහෝදරී ගිය පාරෙ යනවා දකින්න' දොර තදින් වසාගෙන ඔහු කාමරයෙන් පිටතට ගියේය.

අම්මි එයට වඩා මදක් සානුකම්පිත වූවාය. දැන් ඉකිබිඳිමින් සිටින අක්කී ළඟට ඇය ගියාය. 'අපි මේ ගැන හරියට කතා කරමු පස්සෙ.'අක්කිගේ කෙස් රොදක් කන පිටුපසට කරමින් ඇය කීවාය. 'තාත්තට දැන් හොඳටම තරහ ගිහින්. යන්න ගිහින් මූණ හෝදගන්න හොඳ ළමයා වගේ, ඊට පස්සෙ රෑ කෑමට එන්න.'

කිසිවක් යහපත් අතට හැරුණේ නැත. දින කිහිපයකට පසුව අක්කීගේ කාමරයේ ඉකිබිඳින හඬක් ඇසුනු අතර, ඇගේ දෑස් ඉදිමී තිබෙනු මම දුටුවෙමි. ඇය පැය දෙකක්වත් හඬන්නට ඇතැයි මට පෙනිණි.

'ඒ ගොල්ලො මට කිව්වා ආයෙ එයාව මුණ ගැහෙන්න එපා කියලා'

ඇය රහසිගත ස්වරයෙන් කීවාය. අනතුරුව ඇය නැවතත් ඉකිබිඳින්නට වූවාය. ඔවුන් මදක් සන්සුන් වූ පසුව,මගේ දෙමාපියන් ඇය සමග කළ සාකච්ඡාව ඇය මට කීවාය. දෙමළ තරුණයකු හා විවාහ වීමට ඔවුන් කිසිදිනෙක ඇයට අවසර දෙන්නේ නැත. ඒ ජාතියට එරෙහිව ඔවුන් තුළ ඇති අගතිගාමී හැඟීම හැරුණු කොට, මේ දිනවල දමිළයින් සමග ඕනෑවට වඩා පයුරු පාසානම් අන්තරාදායක බවට ඔවුහු අක්කීට අනතුරු ඇඟවූහ. කොළඹ පාර්ලිමේන්තුවට නුදුරුව, අනපේක්ෂිත බෝම්බ දැමීමක් සිදුවිය, නොසන්සුන්කම පැතිරෙමින් තිබිණි. මහනුවර දළදා මාළිගය සමීපයටද බෝම්බය පැතිර ගියේය. සියලුම බෞද්ධයෝ එනයින් පැහැදිලිවම යුද මාවතකට පිවිස සිටියහ. හදිසියේම, මිනිස්සු දෙමළ කඩ සාප්පු වලට යාම නැවතූහ, සමහර කඩසාප්පු ගිනිතැබූ බවද දැනගන්නට ලැබිණි. මිනිස්සු මාර්ගයෙහි ගමන් කරන්නට බිය වූහ. ඇඳිරි නීතිය දමනු ඇතැයි යන රහසිගත කතාද ඇසෙන්නට තිබිණි. මගේ දමිළ මිතුරන් මට, දුරකතනයෙන් එතරම් ඇමතුවේ නැති බවද මම පසුව තේරුම් ගතිමි.

'මේ යුද්දෙ ඉවර වුණොත් විතරක් මටයි අරුන්ටයි කසාද බඳින්න පුළුවන් වෙයි කරදරයක් නැතිව....'

'ඔයා ඇත්තටම හිතනවද... ඒක ඉවර වුණොත් ... ඒ ගොල්ලො ඔයාට අවසර දෙයිද?'

අපි එකිනෙකා දෙස බැලීමු. අප දෙදෙනාම පිළිතුරු දැන සිටි නමුදු එය හඬනගා කියන්නට අපට අවශ්‍ය නොවීය.

මගේ සොහොයුරිය ගමන් බිමන් යාම දැකිය නොහැකි විය. ඇය ශාරීරික අභ්‍යාස කරන්නට යාම නැවතුවාය, නැටුම් පන්තියට, සිනමා ශාලාවට යාම නැවතුවාය, ඇය වේලී ගිය කොළයක් මෙන් වකුටු වී සිටියාය. ඇගේ දෑස්වල වූ කාන්තිය වියැකී ගියේය, ආහාර ගැනීම ඉතා අමාරුම දෙය ලෙසින් ඇය කෑම මේසයට ගියේ ඉතා අලස අන්දමිනි. මම වරක් අම්මිට කතා කිරීමට උත්සාහ කළෙමි, එක්වරක් අරුන් හමුවන්නට ඇයට අවසර ඉල්ලා ගනු සඳහා මා ඇයට කතා කළේ ඔවුන් ඇයට

සම්බන්ධය පවත්වාගෙන යාමට අවසර දෙනු ඇද්දැයි බලා ගැනීම සඳහා ය. එහෙත්, මා බලාපොරොත්තු වූ පරිදිම 'ඒ ගැන මා එක්ක ආයෙ කතා කරන්න එපා'යි ඇය කීවාය.

අක්කී, අරුන්ට සම්පූර්ණ කතාව කීවේ දැයි දැන ගැනීමට අවශ්‍ය වූ නමුත් මා එය ඇයගෙන් ඇසුවේ නැත. ඇය ඔහුට යමක් කියන්නට ඇතැයි මම දැන සිටියෙමි, මන්ද ඔවුන් තවදුරටත් හමුවූයේ නැත, එහෙත් බලාපොරොත්තුවක් නොමැති බව ඇය ඔහුට කීවේදැයි මට සහතික නැත. ඔවුන් පැන ගියහොත් හෝ එවැන්නක් නොකළහොත් මිස එබන්දක් ඇය කීවේ දැයි නොදනිමි. බලාපොරොත්තුවක් තබාගත නොහැකි බව ඔහු දැනගතහොත් කුමක් වනු ඇද්දැයි මම බියවීමි. මන්ද ඔහු ඇය කෙරෙහි කෙතරම් ස්ථිරසාර බලාපොරොත්තු තබා සිටියේද යන්න මා දන්නා බැවිනි.

දින කිහිපයකට පසුව, දඩිබිඩි ගා දුවන ශබ්දයක් ඇසී මම අවදි වූයෙමි. 'ගංගාරාම පන්සල ළඟ කලබලයක්' මගේ කාමරයට පැමිණ අම්මි කීවාය. 'ඒක ටිකක් බරපතලයි, තාත්තිට එන්න කියලා තියනවා එයාගේ පළපුරුද්ද හින්දා'. ඇය කනස්සල්ලට පත්ව සිටිය අතර, මගේ සිතද කනස්සලු විය. එහෙත් සිත සනසාගනු පිණිස මෙන්ම අම්මිගේ ද සිත සනසනු පිණිස මම හඬනගා කතා කළෙමි. 'තාත්තිට නිතරම ඔය විදිහට කතා කරනවනෙ නේද? තාත්තිට ප්‍රශ්නයක් නැති වෙයි' අම්මි තදින් මා අල්ලාගෙන 'දැන් ඔයා මුණකට හෝදාගන්නැ'යි කියමින් යන්නට ගියාය. නාන කාමරයට යන අතරතුර මට..මගේ සොහොයුරිය හමුවිය. ඇය සිරුරට තද වන සේ තද නිල් පැහැති ඩෙනිම් කලිසමක් සහ දෙහි කොළපාට සිල්ක් උඩු වැස්මක් ඇඳ සිටියාය. එයට හොඳින්ම ගැලපෙන කරාබු දෙකක් ඇගේ කෙහෙරොද අතරෙහි දිලෙමින් තිබුණි. ඇය අත කොළ පැහැති අත්බෑගයක් විය. ඇගේ දෙතොල් තොල් ආලේපන ගැල් වූ දීප්තියෙන් බැබළිණි. ඇගේ දෑසට පැරණි ජීවයෙන් මදක් ලැබී තිබිණි.

'අහන්න' ඇය හදිසියෙන් කොඳුළාය. 'අරුන් කිව්වා එයාට මා කොහොමහරි මුණ ගැහෙන්න ඕන කියලා. මුණ නොගැහුණොත් එයා මොකක් කරයිද කියලා එයා දන්නෙ නෑ කිව්වා. මං හුගක් කාලෙකින් එයාව දැක්කෙත් නෑ. දැන් තාත්ති ගෙදර නැති හින්දා, අම්මිටත් මං ගැන හොය හොයා ඉන්න වේලාවක් නෑ. මට ඕන ටිකකට එළියට ගිහිල්ලා එයාව මුණ ගැහිලා එන්න'

මගේ දෑස් විසල් විය. මෙය එතරම් හොඳ අදහසක් නොවේ.

'සෑම් ඔයා මට උදව් කරන්න ඕන. ඔයාට විතරයි පුළුවන්. අම්මිව කාර්යබහුල කරලා තිබ්බොත් මට හිමින් ලිස්සලා යන්න පුළුවන්. එයත් එක්ක එකතු වෙලා ඔයාගේ කාමරේ පිරිසිදු කරන්න එහෙම හරි, මොකක් හරි. ආවට පස්සෙ අම්මා ඇහුවොත් මං මොකක් හරි කියන්නම්'

මේ කලකෝලාහල සිද්ධ වෙනකොට මිනිසුන්ට අපිව මතක නෑ. මේක තමයි අපිට ලැබිච්ච හොඳම අවස්ථාව. එයා දැනටමත් ෆුඩ් සිටි එක ළඟ මං එනකල් බලාගෙන ඉන්නවා'

කුමක් කියම්දැයි මම නොදනිමි. මෙය දැනගතහොත් මගේ දෙමාපියෝ කෝපාවිෂ්ට වන බව මම දනිමි. මට අක්කී ගැන අනුකම්පා සිතිණි.

ගතවූ සති කිහිපය ඇය උගුලකට අසුව දුබලවෙමින් සිටින සතකු මෙන් පෙනී ගියේය. ඇය කීවාක් මෙන්, මෙය ඔවුන්ගේ අවසාන හමුව විය හැකිය.

මම ගැඹුරු හුස්මක් ගතිමි. 'හරි ඒත් හුඟක් වෙලා ගන්න එපා හරිද.'

'ඔයාට ගොඩක් ස්තුතියි, සෑම්' ඇය මා තදින් වැළඳ ගත්තාය. මට ඇගේ හෘද ස්පන්දනය ඇසිය හැකි විය. මට ඇගේ සතුට දැනෙන්නට විය, ඔව්, අනිවාර්ය පැණි සහ පෙපර්මින්ට් විලවුන් සුවඳ මට දැනිණි.

'ප්‍රෑම්... ප්‍රවේසමෙන් ' මම කීවෙමි.

මා ඇයගේ ඒ නම භාවිතා කරන්නේ මා බෙහෙවින් බැරෑරුම් අවස්ථාවකට පත්ව සිටින විට බව ඇය දනියි. ඇය මදෙස බලා සිනාසුණාය. 'මං ඔයාට ආදරෙයි නංගි'

ඇය ගියාය.

මම සුසුමක් හෙලා, මගේ කොටස රඟන්නට මුළුතැන්ගෙට ගියෙමි.

පැය දෙකක්ද ගත වූවාට පසුවද අක්කි නොපැමිණියෙන් මම නොඉවසිලිමත් වන්නට වීමි. ඇය සිය කාමරයේ චිත්‍ර අඳිමින් සිටින්නේය යන බොරුව තව දුරටත් එසේ අල්ලාගෙන සිටිය නොහැකිය. අම්මිද මමද මගේ කාමරය මුළුමනින්ම පිරිසිදු කරමින් සිටියෙමු. කිහිපවරක්, අවධානයෙන් කරන කාරිය කරන ලෙස මට කියා සිටින්නට ඇයට සිදුවූයේ මම කල්පනාවකින් තොරව ජනේලයෙන් පිටත බලමින්, අක්කි එන්නේදැයි විපරමින් සිටි බැවිනි. දැන් කාමරය සම්පූර්ණයෙන්ම පිරිසිදු කර හමාරය, අම්මි නොසන්සුන් වන්නට වූවාය.

'කෝ ප්‍රෑම්..?' ඇය නොරුස්නා ලෙසින් ඇසුවාය. 'මේ මුළු වෙලාවෙම එයා කාමරේ හිරවෙලා ඉන්නවා වෙන්න බෑ. දැන් ඔය ඇඳිල්ල නවත්තලා එයා ඇවිත් ඔයාට මේ පිරිසිදු කරන එකට උදව් වෙන්න ඕන' ඇය මා පැත්තකට තල්ලු කර අක්කිගේ කාමරයට ගමන් කළාය. ඇය දොරට තට්ටු කළාය. ප්‍රතිචාරයක් නැත. ඇය දොර විවර කළාය, අපි එක්ව කාමරය තුළට ගියෙමු. ඇත්තෙන්ම කාමරය හිස්ය, මගේ සිත මෙන්ම හිස්ය, මන්ද කිව යුත්තේ කුමක්දැයි කිසිදු අදහසක් මා වෙත නැත. තිර රෙදි මඳ සුළඟෙහි සෙලවෙමින් තිබිණි, තිබුණේ ප්‍රවේසමෙන් නැවූ රෙදි සහ සෘජුව තැබූ කොට්ටද සමගින් ඇඳ බොහෝ පිළිවෙලට තිබිණි.

'මේ මොකද්ද කියලා ඔයා මට කියනවද?' අම්මි සන්සුන්ව ඇසුවාය. ඇගේ හඬෙහි වූ අපවාදය දරාගත නොහැකි තරම් විය. අක්කීට යන්නට හැරීමෙන් මා නිවැරදි දෙයක් නොකළේය යන හැඟීම හදිසියේ මා තුළ ඇති විය.

තාත්තිගේ මෝටර් රථය පාරෙහි එන හඬ ඇසී අපි දෙදෙනාම තැතිගත්තෙමු. ඔහු ගෙතුළට ඇතුලු වෙනු අපට ඇසිණි. ඔහු ආපසු පැමිණීමෙන් අම්මාගේ මුහුණෙහි වූ බිය මදක් පහව යනු ඇතැයි මම සිතුවෙමි, එහෙත් අප ඔහු අප ඉදිරියට යන විට ඇගේ බිය තවමත් තිබිණි.

ඔහු ඉදිරි දොර ළඟ ඇති නිදන කාමරයෙන් තුවායක් අතට ගෙන, නාන කාමරයට ගියේය. 'වෙන දේවල් බොහොම නරකයි' සිය කමිසයේ දූවිලි පිසදමමින් සහ මුහුණෙහි දාඩිය පිසදමමින් ඔහු පහත් හඬින් කිවේය. අපි ඔහු පසුපස ගියෙමු. 'පන්සලට ගල්ගහපු දෙමළ කණ්ඩායමක් අත්අඩංගුවට අරගෙන. විරෝධතාවලට තව සමහරු ආවා. හරි කැත

විදිහට දේවල් සිද්ධ වුණා, හිටපු ගමන් කවුරුහරි එල්ලයක් නැතිව වෙඩිතියන්න පටන් ගත්තා. මිනිස්සු දෙතුන් දෙනෙකුට තුවාල වුණා. පොලිසියට ඇවිල්ලා කඳුළු ගෑස් ගහන්න සිද්ධ වුණා. ඔයා දන්නවනෙ කොහොමද මේ මිනිස්සු වැඩකරන්නේ කියලා... මල්කි?' මගේ මවගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු නිසා ඔහු මව දෙස බැලුවේය. 'මොකද්ද වෙලා තියෙන්නෙ මල්කි?'

අම්මාගේ ස්වරය කනට නෑසෙන තරම් විය. 'ප්‍රෑම් එළියට ගිහින්. මං දන්නේ නෑ එයා කොහේ ගිහින්ද කියලා'

'අද එයාගේ සිහිය විකල් වෙලාද? ඇයට වෙඩි වදින්න පුළුවන් දෙයියනේ' මගේ පියාගේ ස්වරයෙහි වූ බිය, කලෙක හමුදාවේ සටන් වැදුණු වීර මිනිසකුගේ හඬෙහි වූ බිය මගේ සිත දහස්වාරයක් බියපත් කරවන්නට සමත් විය. 'ඔයා දන්නේ නෑ ඇය කොහේ ගිහිල්ලද කියලා? ඇයි එයා එළියට ගියෙ?'

'අරුන්ට ඕන දෙයක් කරගන්න කියන්න.' මම එසේ සිතුවෙමි. මෙය විහිළුවක් නොවේ. 'එයා කිව්වා අන්තිම වතාවට අරුන්ව මුණ ගැහෙන්න යනවා කියලා' මම ඔවුන්ට කීවෙමි. 'ඒ ගොල්ලො මුණ ගැහෙන්න සැලසුම් කළේ ෆුඩ්සිටි එකේ, ඒත් මම දන්නෙ නෑ ඊට පස්සෙ කොහෙද ගියෙ කියලා'

'අපි දැන්ම ගිහිල්ලා එයාව එක්කරගෙන එන්න ඕන' ඔහුගේ දුරකතනය ගෙන ඔහු කීවේය. අනතුරුව ඔහු නතර විය. 'නෑ ඔය දෙන්න ඉන්න. මේ අවුල් ජාලෙට පැටලෙන්න ඕන නෑ. මං සුමේධ එක්ක යන්නම්' ඔහු සිය හොඳම මිතුරාට දුරකතනයෙන් ඇමතීමට ගියේය. මට ඔහු සමග යාමට දැඩිව වුවමනා විය, එහෙත් මම කතා කිරීමට බොහෝ සේ බියවීමි. දැනටමත් මා හානියක් කර ඇත. 'මම... මාත් එනවා හරිද?' තාත්ති පසුපසින් මෝටර් රථය වෙත යමින් අම්මා ඇසුවාය.

ඔහු ආපසු හැරුණේය. 'නොඑන එක හොඳයි' ඔහු කොටින් කීවේය. අනතුරුව ඇගේ බියපත්, කඳුළු පිරි දෑස දුටු ඔහුගේ සිත මොළොක් විය.

'ඔයා සැම් එක්ක ගෙදර ඉන්න මල්කි, ඒක එච්චර පරිස්සම් නෑ' මා

සවන් දී සිටින වග දුටු ඔහු නැවතුණේය. ඔහු ඇය ඉක්මනින් වැළඳගෙන අනතුරුව මගේ උරහිසට තට්ටු කළේය. 'කොච්චර වෙලා යයිද කියන්න බෑ. ඔයා ගෙදර ඉන්න. වෙන්නෙ මොනවද කියලා මං දන්වන්නම්'

ඔහු මෝටර් රථයට නගින තුරු අපි බලා සිටියෙමු. තත්පර කිහිපයකින් ඔහු ගියේය.

එකිනෙකට කුමක් කියම්දැයි අම්මි සහ මම නොදැන සිටියෙමු. මගේ කාමරයට ගොස්, මම මගේ දුරකතනය දෙස නෂ්ටාපේක්ෂාවෙන් බැලුවෙමි. අපි අක්කීට දුරකතනයෙන් අමතන්නට බෙහෝ උත්සාහ කළෙමු. එහෙත් අප කෝපයට පත් කරමින් ඇසුණේ, 'ඔබ අමතන දුරකතනය ප්‍රතිචාර නොදක්වයි. කරුණාකර පසුව අමතන්න' යන්නයි. මට අරුන්ව හෝ සම්බන්ධ කරගත හැකි නොවීය. මා අරුණියාට කතා කළ විට, ඇය බියපත් හදවතින් කීවේ සිය සහෝදරයා ගෙදර නොපැමිණි බව හා සිය මව්පියන් ඒ පිළිබඳව සැබවින්ම සිත කරදරයෙන් පසුවන බවය. මම තව වරක් අක්කීට අමතන්නට උත්සාහ කළෙමි, අනතුරුව බලාපොරොත්තු කඩවී දුරකතනය ඇඳට වීසි කර දැමුවෙමි.

අම්මි විනාඩි කිහිපයෙන් කිහිපය මගේ පියාට දුරකතනයෙන් කතා කළ අතර, ඔවුන්ට කිසිදු සතුටුදායක ආරංචියක් ලැබී නැති බව පෙනිණි. මට අරුන් කෙරෙහි මහත් කෝපයක් ඇති විය. මෙබඳු දිනෙක අක්කී නිවසින් බැහැරට ගෙන යාමේ භයානක කම ගැන ඔහු හොඳින් දැන සිටිය යුතුය. ඔහුට ඇය ගැන සැබවින්ම ආදරයක් ඇත්තේ නම් අද දින ඇයට ගෙදර සිටින්නට සැලැස්විය යුතුව තිබිණි. කුඩා, අවඥා සහගත හඬක් මා තුළින් මතුවිය. මම හඬන්නට පටන් ගතිමි.

අධික වෙහෙසට පත්ව, තාත්ති හවස හයට පමණ ගෙදර ආවේය. ඔහු කරුණාව අතහැර දමා ඇති බව ඔහුගේ මුහුණින් මට පෙනිණි. ඔහු බෙහෙවින් බිඳී ගිය බවක් පෙනිණි. මම කනගාටුවෙන්ද, බියෙන්ද දුබලව ගියෙමි. මගේ දෙමාපියන් කතාබහ නොකළ අතර දහවල් කෑම, මේසය මත විය. මා දෙවියන් විශ්වාස නොකළ නමුත් මට නොකඩවාම යාඥා නොකර සිටිය නොහැකි විය. 'කාරුණාකරලා ඇය ආරක්ෂා කර දෙන්න.... කරුණාකරලා' දුරකතනය නාද වෙන හැමවිටම අපි බිමට පැන්නෙමු. දොරට ගසන හඬක් ඇසෙන තුරු අපි බලා සිටියෙමු. ඇගේ

කම්මුල් වල ගැහුණ සිනාව ඇතිව ඇවිද එන ඇය 'කනගාටුයි මං ටිකක් පරක්කු වුණා'යි අහන්නට අපි බලා සිටියෙමු.

එහෙත් එබඳු කිසිවක් සිදුවූයේ නැත. කෑම ටිකක් උගුරෙන් පහළට යවා ගන්නේ කිසියම් 'ශක්තියක්' අවශ්‍ය වූ බැවිනි. තාත්ති නැවත පිටතට ගියේය. මෙවර අපද ඔහු සමග යායුතු බව ඔහුට ඒත්තු ගන්වන්නට අපි සමත් වීමු. විරෝධය පෑමට, ඔහු බොහෝ වෙහෙසව සිටියේය. සුමේධ මාමා මුළු වේලාවම අපි සමග විය. මෙවර පොලිසියද පැමිණියේය. අපි ෆුඩ් සිටිය ළඟ හැම නිවසක් අසලම නැවතුණෙමු. ඔවුන් නිතරම යනෙන කලබලය ඇතිවූ පන්සල ළඟ, සහ මැක්ඩොනල්ඩ් ළඟ අපි නැවතුණෙමු. එසේ නැවතුණු හැම තැනකදීම, ඇපි මිනිසුන්ගෙන් ගැහැණු ළමයෙක් සහ පිරිමි ළමයෙක් දුටුවේදැයි ඇසුවෙමු. මධ්‍යම උසැති මධ්‍යම ප්‍රමාණයේ පැහැපත් සෘජු හිසකේ ඇති ගැහැණු ළමයෙක් සහ උස, කළු, රිදී මාලයක් පැළඳි පිරිමි ළමයෙක් දුටුවේදැයි ඇසුවෙමු.

කිසිවෙක් ඔවුන් දැක තිබුණේ නැත. අරුණියා දුරකතකනයට පිළිතුරු දීම අත්හිටුවා තිබිණි. එහෙත් ඔවුන්ගේ නිවස සොයා ගැනීම අපහසු නොවීය. තාත්ති හමුදාවේ ඉහළ තනතුරක සිටියෙන්, තොරතුරු ගැනීම පහසුය. රාත්‍රි 10.30 ට පමණ අප ජයචන්ද්‍රන්ලාගේ නිවසට ගියේ මගේ තාත්තාගේ සම්බන්ධතා උඩ ලබාගත් මග පෙන්වීම අනුවය. සිවිල් ඇඳුමින් සැරසුනු පොලිස් නිලධාරියෙක්ද අප සමග පැමිණියේය. තාත්තාගේ මුහුණෙහි ඇති වෛරය මුසු නොඉවසිල්ල මට දැකිය හැකි විය. වේදනාවෙන් හා සාංකාවෙන් අම්මි බාගයට මැරුණාක් බඳු විය. එය මෝඩ අදහසක් බව දැන සිටියද, මම එහිදී අරුන් සමග සිටින අක්කි සොයාගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කළෙමි, ඇය එහිදී හමුවේවායි යාඥා කළෙමි. අපි පෝටිකෝව හරහා ගොස්, සීනුව නාද කර විනාඩි කිහිපයක් බලා සිටියෙමු. අනතුරුව නැවත සීනුව නාද කළෙමු. දෙපා අද්දවාගෙන එන හඬක් ඇසුණු අතර, අවුරුදු පනහක් පමණ ඇති කළු පැහැති මිනිසෙක්, දොර ඇර පිටතට පැමිණියේය.

'ඇයි මොකද?' ඔහු රාත්‍රියේ මේ වෙලාවෙහි බාධාකිරීම ගැන කෝප වූ බවක් පෙනිණි.

'කෝ ඔබේ පුතා අරුන්?' සිවිල් ඇඳුමින් සැරසුණු පොලිස්

නිලධාරියා ඇසුවේය. මිනිසාගේ ඉරියව් වෙනස් විය. ඔහු සැක සහිත ලෙස බැලුවේය. 'ඔබ කවුද?' ඔහු ඇසුවේය. 'මගේ පුතා වුවමනා මොකටද?'

පොලිස් නිලධාරියා හැඳුනුම්පත රැගෙන ඔහුගේ මුහුණට ළං කළේය. 'අපි පොලිසියෙන්, තේරුණාද? ඔබේ පුතාගේ සම්බන්ධයක් තියෙන ගෑණු ළමයෙක් අතුරුදහන් වෙලා. සිංහල ගෑණු ළමයෙක්' ඔහු අර්ථවත්ව කීවේය.

මිනිසා දැඩි වූ බව පෙනිණි. ඔහු අප එකිනෙකා දෙස බැලූ අතර ඔහුගේ දෑස් මා ළඟදී, සාමාන්‍ය ප්‍රමාණයට වැඩි වේලාවක් නතර විය. මගේ සිතේ බියක් දැනිණි, ඔහු කිසියම් දිනෙක අක්කි දැක ඇද්ද හෝ ඇගේ පින්තූරයක් දැක ඇත්දැයි මා තුළ හැඟීමක් ඇති විය. මම එසේ නොසිතුවෙමි. ඔහු එසේ දැක ඇත්නම්, මා ඇය යැයි ඔහු සිතන්නට ඇත. මම වටපිට බැලූ අතර සැණෙකින් අරුණියා සහ ඇගේ මව යැයි සිතිය හැකි ගැහැනියක, ජෙයචන්ද්‍රන් මහතාට පිටුපසින් සිටිනු දුටුවෙමි, ඔවුන්ගේ මුහුණු සුදුමැලිව, සැක සාංකා සහිතව තිබෙනු දුටුවෙමි.

'මම දන්නේ නෑ' ඔහු හදිසියේ කීවේය. අනතුරුව ඔහුගේ දෙතොල් වෙව්ලන්නට ද ඔහුගේ මුව භීතියෙන් ගැහෙන්නට ද විය. 'මම දන්නෙ නෑ මහත්තයා. මම දන්නෙ නෑ. අපි එයා එනකල් බලාගෙන ඉන්නවා උදේ එයා ගිය වේලාවෙ ඉඳලම. එයා තාම ආවේ නෑ. පණිවුඩයක්වත් එව්වේ නෑ. එයාගේ ෆෝන් එකෙන් අල්ලගන්නත් බෑ'

තාත්ති ඉදිරියට නැමී යමක් රහසේ නිලාධාරියාගේ කනට කෙඳිරි ගෑමෙන් පසුව පොලිස් නිලධරයා අරුන්ගේ තොරතුරු ලබාගත්තේය.

'මේ මහත්තයට ඕනලු ඔබේ නිවස ඇතුල බලන්න' පොලිස් නිලධාරියා කීවේ අරුන්ගේ පියාට කතා කිරීමට පෙරය. තාත්ති ඔහු පසුකර ගෙතුළට ගියේය. අම්මි පසුපසින් ගියාය, ඇගේ දෑසේ කඳුළු පිරී තිබුණි. මිනිසා කිසිවක් කීවේ නැත, ඔහු මගේ දෙමාපියන් ඔහුගේ කුඩා නිවසට ඇතුළු වනු බලා සිටියේය. අරුණියා සමග කතා කිරීමේ වුවමනාවක් නැති නිසා හෝ අක්කි පැටලී ඇති මකුළු දැලෙහි තවත් බොහෝ දේ මතකයට නගා ගැනීමේ කිසිවක් දැකීමට වුවමනාවක් නැති නිසා මම පිටත නැවතුණෙමි. අම්මිගේ හඬ අඳුර කපා හැරියේය. ඇය බිඳුණු හඬින් කෑගෑවාය. 'ප්‍රැමි... ප්‍රැමි... ප්‍රමෝදි.....' ඇය නිවස තුළට යමින් කෑගෑවාය.

ඊළඟ දිනයේ අපට තවමත් තොරතුරක් ලැබී නොතිබුණ අතරතුර, අක්කිගේ පින්තූරයක් ඇතුළත් දැන්වීමක් ගසා, ඇය පිළිබඳ තොරතුරක් වෙතොත් අපට දන්වන ලෙස දැන්වීමු. බිත්තියක මා බඳු කෙනෙකුගේ පින්තූරයක් මේ ආකාරයේ අලවා තිබීම පුදුමය දනවන කරුණකි.

දිනක් ගත වූ නමුදු අක්කි පිළිබඳ තොරතුරක් තවමත් නැත. තාත්තාට කරන විශේෂයක් වශයෙන් ඇගේ අතුරුදහන් වීම රූපවාහිනියේද විකාශය විය. එහෙත් කිසිවක් සිදු නොවීය. දිනකට දෙකකට පසුව, මෙය යුද්ධ කාලයේ අසන්නට ලැබුණු ප්‍රවෘත්තියක් බඳු විය. මගේ දෙමාපියන් හා මම යාන්ත්‍රිකව හැසුරුණෙමු. උසස් පෙළ ප්‍රතිඵල ඉක්මනින් ලැබෙන බවට වූ නිවේදනය පවා මා මේ අන්ධකාරයෙන් මුදවා ගත්තේ නැත.

තුන්වැනි දිනයේ, තාත්තිගේ මිතුරෙකුගෙන් හෝ අපට පණිවුඩයක් ලැබුණේ, පැයක් පමණ දුරකින් පිහිටි ජරාවාස වූ නිවසක් අසලට වහාම පැමිණෙන ලෙසය. මම බොහෝ සෙයින් ගැහෙන්නට වීමි. මෝටර් රථයට නැඟීමට පවා අපහසු විය. එම ස්ථානයට ළං වන විට පිරිසක් රැස්ව සිටිනු දුටුවෙමු. මම රථයෙන් බිමට පැන සෙනඟ අතරට දිව ගියේ, නිවසට ඇතුළුවන ස්ථානයට යාමට පොරකමිනි. අනතුරුව මම නැවතුණෙමි. බිඳී ගිය පොළව මත්තෙහි රෙද්දකින් ආවරණය කළ සිරුරක් තිබිණි. සිරුර මත දමා තිබූ ඇතිරිල්ලෙහි ලේ පහර කිහිපයක් තිබිණි. ඇතිරිල්ල ඉතා සෞම්‍ය ලෙස දමා තිබුණේ එය තදින් දැමුවහොත් සිරුරට රිදේ යැයි බියෙන් මෙනි. රෙදි කඩ ඉවත් කරන්නට පෙරම ඒ මගේ සොහොයුරියගේ සිරුර බව මම දැන ගත්තෙමි.

ඇගේ සිරුරෙහි තුවාල, කෙටුම් පහරවල් විය. ඇයගේ සිරුර ඉදිමී තිබුණු අතර, ඇගේ හිසෙහි වූ තුවාල තද රතු පැහැයෙන් කැටි ගැසී තිබිණි. ඇගේ වමත විස්මයජනක කෝණයකට පතිතව තිබිණි. ඇගේ ගෙතූ කොණ්ඩය අතරින් මට ඇගේ කරාබු දැකිය හැකිවිය. ඒවා ඔහු ඇයට දුන් කරාබු විය හැකිය. මම ඇය ළඟ වැටී ඉකිබිඳින්නට වූයෙමි. අනතුරුව හූල්ලන්ට ද වීමි.

දැන් බොහෝ නිසොල්මන්ව සහ ළඟාවිය නොහැකි, ඒ සුන්දර මුහුණ දෙස බැලූ විට, මම ඇයට මේ දෙය සිදුව ඇති බව උපවිඥානයෙන්

දැන සිටි බව අවබෝධ විය. එය හරියට අක්කී අවසාන වශයෙන් 'මං ඔයාට ආදරෙයි' කී විට ඇය අවසාන සමුගැනීම කළාක් මෙනි. ඇය එසේ කීවේ ඇය නැවත නොපැමිණෙන බව කියන්නට මෙනි, ඇයද එය නොදත් නමුදු, එසේ කියැවෙන්නට ඇත. අවසාන වශයෙන් අප නිවුන්නුන්ය, නැත අපි ඉස්සර නිවුන්නු වීමු.

අනතුරුව සිදුවූයේ කුමක්දැයි ලිවීම ඉතාම වේදනාකාරිය, අනෙක, එයින් ඇති ප්‍රයෝජනය කුමක්ද? එය අපට ඇය නැවත ලබා නොදෙයි. ඇයගේ සිරුර දෙස බැලූ සැනින් අම්මි සිහිසුන් වූවාය, තාත්තිගේ මුහුණ සුදුමැලි, අවලක්ෂණ මුහුණක් බවට පත්විය. දින දෙකකට පසුව මළගම සිදුකෙරුණු අතර, ඇඟිල්ලක් ගසන්නට ඉඩක් තිබුණේ නැත. පාසල් මිතුරන්, ගුරුවරුන්, හමුදා නිලධාරින්, ආදීන්ගෙන් කුඩා විසිත්ත කාමරය පිරී ගියේය. මරණය සිදුවී තිබුණේ බර ආයුධයකින් ගැසීමෙන් හිසට සිදුවූ තුවාලවලිනි. කිසිවෙක් හරිහැටි කිසිවක් දැන සිටියේ නැත. ඇය පසුකර යන කැරලිකෝලාහලකරුවන් ඇයට ගසන්නට ඇතැයි අපට උපකල්පනය කළ හැකිය. නිවසෙහි ඇයට එතරම් දරුණු ලෙස තුවාල කළ හැකි ආයුධයක් තිබුණේ නැත. අරුන්ද තවමත් අතුරුදන්ව සිටියි.

දින කිහිපයකට පසුව, අප සමග ජෙයචන්ද්‍රන් නිවසට ගිය පොලිස් නිලධාරියා පැමිණියේය. මගේ කාමරයේ හිඳිමින් ඔහු මගේ දෙමාපියන් සමග පහත් හඬින් කතාකරන සාකච්ඡාව මට යාන්තමට ඇසිණි. ඔහු කියන්නේ කුමක්දැයි මට තේරුම් ගත නොහැකි වූ අතර විසිත්ත කාමරයට යාමට මට හයියක් තිබුණේද නැත. එය ඉතා අසීරු විය.

ඔහු ගිය විගසම, දොරට තට්ටු කරන හඬක් ඇසුණු අතර අම්මා ඇතුළට පැමිණියාය. මව ඇඳෙහි හිඳගෙන ඇය කතා කරන තුරු මම බලා සිටියෙමි. ඇයද මගේ ඇඳෙහි ඉඳගත්තාය. 'ඒ ගොල්ලො ඔහුගෙ සිරුර හොයාගෙන'

'අරුන්ගෙ' මගේ ස්වරය වෙව්ලන්නට විය.

'ඔව් පුතා'

මම නැවත හඬන්නට වීමි. මට මා පාලනය කරගත හැකි නොවීය. එය දැන් දැරිය නොහැකි තරම්ය. ඔවුන් මරා දමා ඇත්තේ එක්වරද? ඇය

මියගිය ආකාරය ඔහු දුටුවේද? පළමුව මියගියේ ඔහුද? නැතහොත් මගේ පියා කී පරිදි ඔහු එල්ටීටීඊ ඔත්තුකරුවෙක්ද? ඔහු මරාගෙන මැරෙන්නෙක් විණිද? සියලුම ආකාරයේ උමතු හැඟීම් මගේ හිසෙහි කැරකෙන්නට විය. 'කොහෙන්ද හොයාගෙන තියෙන්නෙ එයාව?' මම කොඳුළෙමි.

අම්මි මා සමීපයට පැමිණ මගේ උරහිස ඇගේ දෑතින් වෙලා ගත්තාය. 'මරදාන කිට්ටුව. ප්‍රෑම්ගේ මිනිය තිබුණ තැන ඉඳලා පැය භාගයක් දුරදි හොයාගෙන තියෙන්නෙ.' සිරුර දුම්රිය ස්ථානයක අතහැර දමන ලද ගොඩනැඟිල්ලකට විසිකර දමා තිබූ බව ඇය කීවාය. පෙනෙන ආකාරයට, සිරුර බොහෝ සේ තැලී පොඩි වී තිබුණු අතර, එල්ලූ ලකුණුද ගෙලෙහි දකින්නට තිබිණි. බොහෝ ඇඟිලි සලකුණු සිරුර පුරා තිබී ඇත, කවුරුන් මෙයට සම්බන්ධ වීද යන්න සොයා ගැනීම අපහසුය. එහෙත් එක් දෙයක් සහතිකය. එය කළු පැහැති උස තරුණ දෙමළ මිනිසකුගේ සිරුරය. වැළමිටෙහි තුවාල කැළලක් ඇති මිනිසකුගේ සිරුරය.

සති දෙකකට පමණ පසුව දිනක්, ඇය මියගිය ආකාරය මගේ මනසෙහි නැවත විකාශය වීම නවතාගත නොහැකි වූයෙන්, මම නැවත ඇය මියගොස් සිටි ස්ථානයට එක්වරක් යාමට තීරණය කළෙමි. මම පැරණි නිවස දෙසට ගමන් කළෙමි, දැන් එහි දෙපැත්තේ තණකොළ වැවී ඇත. ගැහැනියක පැමිණ 'ආ පෙම්වතා එක්ක ආපු ගෑනු ළමයා ඔයාද' යි ඇසුවාය.

මට වැරදුනාදැයි සිතූ මම තියුණු ලෙසින් 'මොකද්ද' යි ඇසීමි.

ඇය තරමක් නොසන්සුන් වූ බව පෙනිණි. 'කනගාටුයි මාං කිව්වෙ, ඔයාද සුමාන දෙකකට ඉස්සෙල්ලා උස, කළු පිරිමි ළමයත් එක්ක ආවෙ? මං හිතනවා ඔයාට දැන් හොඳයි කියලා. මගේ හකුපාඩා ක්ෂණිකව තද විය. මේ ගැහැනිය කුමක් කියන්නීද? අක්කි මියගිය දිනයේ මේ ගැහැනිය ඇය දුටුවේද? ඒ මා යැයි ඇය සිතන්නේද? ඇය මියගිය ආකාරය මේ ගැහැනිය දුටුවේද?

'කියන්න මට ඔයා දන්න දේ' මම ගොත ගැසුවෙමි. 'මං ඇගේ සොහොයුරිය කරුණාකරලා'

කාන්තාව දැන් සැබෑවටම බියවූ බව පෙනිණි. 'නෑ මට කනගාටුයි. මං හිතනවා මට වැරදීමක් වුණා. ඒ වෙන කවුරුහරි වෙන්න ඇති'

'නෑ' මම කෑගැවෙමි. මගේ බලාපොරොත්තු සුන්විය. ඒ ගැන දැනගැනීමට ඇති මේ අවස්ථාව මගහැරිය නොහැකිය. 'ඔයා කතා කළේ මගේ සහෝදරී ගැන. එයා මැරුණා. මැරුණා!' එවර මම කොඳුළෙමි. මගේ දෑසෙහි කඳුළු මතුවන්නට ළංව තිබිණි. 'ඔයා මට කියන්න ඕන'

'මළා?' ගැහැණියගේ මුහුණ සුදුමැලි විය. 'ඔයා කියන්නෙ ඔහු ඇයව මැරුවද?'

'කවුද එයා මැරුවෙ' මගේ සිතුවිලි බොහෝ දිසාවන්ට දිව ගියේය. මගේ හිස පුපුරනු ඇතැයි මම සිතුවෙමි. 'කරුණාකරලා' මා ඇයට යැද්දෙමි. 'ඔයා මට කියන්න ඕන'

ගැහැනිය වටපිට බලන්නට වූයේ පලා යන්නට තැනක් ඇද්දැයි හොයන්නාක් මෙනි. එහෙත් සත්‍යය හෙළි කොට නොගෙන මා ඇයට යන්නට ඉඩ නොදෙනු ඇතැයි යන්න ඇය තේරුම් ගන්නට ඇත.

'මං නුවර ඉඳලා ආවේ' ඇය බියපත් හඬකින් කීවාය. 'ආවේ මෙහෙන් ගත්තු ගෙයක් ගැන හොයලා බලන්න. එතකොටයි මං දැක්කෙ මේ ඔයා වගේම ගෑනු ළමයා, අර පරණ ගෙදෙට්ට පිරිමි ළමයෙක් එක්ක යනවා. පිරිමි ළමයා හොඳටම තරහා ගිහිල්ලා කෑ ගගහ හිටියෙ. මං හිතනවා මට වචන ඇහුණා. 'මං දෙමළ හින්දා.' ගෑනු ළමයා අඬනවා පෙනුණා.

මම වඩ වඩාත් ව්‍යාකූල වීමි. බියවීමි.

'මට ඕන වුණේ නෑ මැදිහත් වෙන්න. මොකද පිරිමි ළමයා බොහොම කෝපයෙන් හිටියෙ. ඒක හින්දා මං හිතුවා ටිකක් වෙලා කාර් එකට වෙලා ඉන්නවා කියලා. ඒත් ඊළඟට, දෙන්නගෙන් එක්කෙනෙක්වත් එළියට ආවේ නෑ, පැය භාගෙකට පස්සෙ මං එතනින් ආවා. මගේ ස්වාමිපුරුෂාය කතා කරලා කිව්වා ඉක්මනට එන්න කියලා, මෙහෙ තත්ත්වෙ උණුසුම් වෙමින් පවතිනවා කියලා ප්‍රවෘත්තිවල අහන්න ලැබුණා කියලා. මං හිතුවා ජෝඩුව වෙන පැත්තකින් යන්න ඇති කියලා. වාහන තදබදේටයි, කලහාකාරීන්ටයි, අහුනොවී යන්න ඕන හින්දා මමත් ගියා. මං මටම හිතුවා මේ දවස්වල තරුණ පිරිමි කොහොමද මේ විදිහට ගෑනු ළමයින්ට සලකන්නේ කියල. මං නිතරම ගෑනු ළමයා ගැන හිතුවා එයා

හොඳින් ඇති කියලා බාලාපොරොත්තු වුණා. මං එයා ගැන හෙව්වෙ නැති එක ගැන මට දැන් හිතට හරි නෑ' ඇය කීවාය.

'ඔයා කාටවත් කිව්වෙත් නෑ' මම කොඳුළෙමි. 'ඔයා දන්නවද අපි එයාව කොයිතරම් හෙව්වද කියලා. ඇය මියගියේ කොහොමද කියලා හොයන්න අපි මොනතරම් මහන්සි වුණාද?'

'මං කොහොමද දැනගන්නෙ? මං මෙහෙ පදිංචි නෑ. මෙහෙ මරණයක් වුණා කියලා දන්නෙත් නෑ. තරුණ ජොඩු වාද විවාද වෙනවා මං නිරන්තරයෙන් දැකලා තියෙනවා. මං දැනගෙන හිටියෙ නෑ.......'

ඇයගේ කතාව මා කලබලයට පත් කළා පමණකි, එමෙන්ම අරුන් කිසි ලෙසකින්වත් අක්කීට ආදරය කළේ දැයි සිතන්නට වීමි. ඔහුගේ තර්ජනය සැබෑ වූයේද? වෙන්වන්නට අක්කි යෝජනා කළ නිසා ඔහු ඇය මරා දැමුවේද? එය සිදුවූයේ ඒ ආකාරයටද? ඇය මියගියේ එලෙසින්ද? මෙය දැන නොගතහොත් මා වියරු වැටෙනු ඇතැයි මට හැඟී ගියේය. මගේ සිතෙහි කෝපයක් සහ වෛරයක් ඇති විය. ඔහු සියල්ල විනාශ කළේය. සියල්ල !

මා නිවසට ගියවිට, මම දෙමාපියන්ට මා ඇසූ සියල්ල කීවෙමි. අපි පොලිසියට ගියෙමු. අපි එය හමුදාවේ තාත්තිගෙ මිතුරන්ට කීවෙමු. පොලිසිය ජෙයචන්ද්‍රන්ලාට කතා කළහ, එහෙත් ඔවුන්ට කීමට වෙනත් කිසිවක් නොතිබිණි. මම බොහෝ කෝප වීමි, එමෙන්ම වරදකාරී හැඟීමක් මා තුළ විය. මා අරුන්ට කෙතරම් උපකාර කළේද?, ඔව්, අපගේ ප්‍රීතිමත් පවුලට ඇතුළත් වීමට ඔහුට උපකාර කළෙමි, එමෙන්ම ජීවිතයේ මා බෙහෙවින් ආදරය කළ තැනැත්තිය කැඳවාගෙන යාමට උපකාර කළෙමි. අනතුරුව මගේ සිතෙහි අරුන් පිළිබඳ කණගාටුවක්ද උපන්නේය. මේ කාලකන්ණි යුද්ධය නිසා ඔහුටද ඇය අහිමි විය. අප සියලු දෙනාටම ඇය අහිමි විය. ඔහුට ඔහුගේ ජීවිතයද අහිමි විය.

අපගේ අහිමිවීම් හා අනෙකුත් සියලු දේ පිළිබඳ සිතෙහි ඇතිවූ කම්පනය සමනය කරගනු සඳහා අපි ගණනය කළ නොහැකි තරම් උපදේශන සැසි වාරයන්ට සහභාගි වූයෙමු. එහෙත් එයින් පලක් නොවීය. උසස් පෙළ ප්‍රතිඵල පැමිණි දිනයේ අම්මි සම්පූර්ණයෙන් කඩා වැටුණාය, අක්කි වෛද්‍ය පීඨයට ඇතුළුවීමට සුදුසුකම් ලබා තිබූ බව අපි දැනගතිමු.

මට නින්ද යන්නට නිදිපෙති දෙනු ලබිණි, එහෙත් නින්දෙහි මා බිය වන බව කිසිවෙක් දැන සිටියේ නැත. ඇය සිහිනයේදී මා වෙත පැමිණි ඇය රැක ගැනීමට ක්‍රියා නොකළේ මන්දැයි අසමින් හඬා වැටෙන විට මම තැති ගතිමි, දරුණු ලෙස තුවාල වී, කැලැල් ඇතිවී ඉදිමී ඇති ඇගේ සිරුර පොළවෙහි වැතිර තිබෙන අයුරු සිහිනයෙන් දකින මම භීතියට පත්වෙමි.

දැන් සිව් වසරකට පසුව, මට තවමත් වෙහෙස දැනෙයි. මේ වේදනාවෙන්, අහිමිවීමේ නිරන්තර හැඟීම් නිසා මම වේදනාවෙන් දැවෙමි. මෑතකදී උමතු ප්‍රීතිඝෝෂා මධ්‍යයේ ප්‍රභාකරන් මරා දැමූ බව නිවේදනය කරනු ලැබුණි. මිනිස්සු වියරුවෙන් කෑ ගසමින් පාරෙහි දුව පැන්නහ.

'ප්‍රභාකරන් මළා. අපි දැන් දිනුවා.' නගරය ගිනිකෙළිවලින් පිරී ගියේය, නොමිලේ කිරිබතින් සංග්‍රහ කළේය. එහෙත් කවුරු ගණන් ගනිත්ද?

බොහෝ කලකට පෙර මගේ සාමය මට අහිමිව ගියේය.

මම සඳ දෙස බලමි. රාත්‍රිය එළඹෙයි, විගසින් ඇය පැමිණ, එදින මා ඇයට යන්නට ඉඩ හැරියේ මන්දැයි නැවත නැවත අසනු ඇත. මට කෑ ගසා හඬන්නට ඕනෑ වනතුරු, මගේ හදවත ඉරා ඇයට දෙන තුරු ඇය හඬනු ඇත. එකම ඇඳෙහි හිඳ අප දෙදෙනා එක්ව සිනාසෙමින් සිටින්නට පුරුදුව සිටි ආකාරය, එක්ව දඩබ්බරවූ අකාරය, එක්ව ගී ගැයූ ආකාරය, ඇය මට සිහිපත් කරනු ඇත. මා අවදිව, මගේ දිනපොත රැගෙන, සියවැනි වතාවටත් මගේ නිවුන් සොහොයුරියගේ කතාව ලියන තුරු ඇය හොල්මන් කරනු ඇත. 'ආදරය උදෙසා'

***ශලිනි අබයසේකර*** *පැමිණෙන්නේ මහනුවරිනි. ඇය පේරාදෙණිය සරසවියේ මෑත කාලීන උපාධිධාරිනියකි. ළමයකු ලෙස පොතපත කියවීමට ඇගේ දෙමාපියන් ඇය පුරුදු පුහුණු කළ පසු, ඇය කියවීම සඳහා කැමැත්ත වර්ධනය කොට ගත්තාය, පසුව ඇය ගද්‍ය පද්‍ය යන දෙවර්ගයෙන්ම ලිවීම ඇරඹුවාය. තමාගේ දෛනික අන්තර් ක්‍රියාවන්හිදී ඉඳහිට අත්දුටු ආකල්ප සහ අගතීන් ඇතුළත් වාතාවරණයක ඇය ඇගේ කතාව ස්ථානගත කොට ඇත.*

# මට වැඩි දවසක් නැත

***සාම්බවී සිවාජි***

හිරු පිටත දවාලයි. එය කවුළුව හරහා එහි කෝපත් රශ්මිය එවයි. කලෙක මට උණුසුම දුන් රශ්මිය දැන් මා කෝප ගන්වයි. මම කවුළු අතරින් බලමි. සුතා ගේට්ටුව වෙත ගමන් කරයි. ඇගේ හිස සෙනග අතරෙහි සෙමෙන් නොපෙනී යයි.

වයස තිස්පහක මිනිසකු ලෙසින්, මට හැඬිය නොහැකිය. එතෙකුදු වුවත්, මගේ හදවත තුළ ඉපදෙන හැඟීම් මට පාලනය කොටගත නොහැකිය. මට මගේ කඳුළු පාලනය කොටගත නෙැහැකිය. මට විලාප තැබීමට වුවමනාය. 'මට මෙබඳු බරපතල දඬුවමක් ලබා දුන්නේ කුමක් නිසාද? ඒ මා, ඇයගේ දෙමාපියන්ගේ ආශිර්වාදය නොලබා සුතා විවාහ කර ගත් නිසාද? මම මැරවරයෙක් හෝ මිනීමරුවකු නොවෙමි. මම, මගේ පවුල සමග සතුටින් ජීවත්වීමට කැමති සාමාන්‍ය මිනිසෙක්මි. එහෙත්, මා තවදුරටත්, කිසිදා නොහැඬූ සුරේෂ් නොවෙමි, මම මහරගම පිළිකා රෝහලේ සිටින රෝගියෙක්මි.

මගේ දිගන්තය ආලෝකමත් කළ මගේ ආදරණීය බිරිඳ සූතා හැම සතියේම මා දකින්නට පැමිණෙයි. මගේ දරුවන්, රාජි සහ රමේෂ් නිරතුරුව මා නැවත ගෙදර එනතුරු බලා සිටිති, හැමදිනකම සූතාගෙන් ප්‍රශ්න වැලක් අසති. 'අම්මා අප්පා කොහේද? කවදද අප්පා එන්නේ?' ඔවුන්ගේ අහිංසක හදවත්, ඔවුන්ගේ පියා නැවත නොපැමිණෙන බව දන්නේ නැත. ලබන සතියේ සූතා පැමිණෙන විට, මා ජීවත්ව සිටිනු ඇත්ද?

මගේ දෑස් අළුපැහැති ඔරලෝසුවෙහි නවතියි, මගේ සිත ඇය හමු වූ සරසවි කාලය වෙත ආපසු යයි. ඒ 2000 ඔක්තොම්බර් මස දිනයක් විය, මම යාපනය සරසවියේ දෙවැනි වසරෙහි, ආර්ථික විද්‍යා විශේෂ උපාධිය හදාරමින් සිටියෙමි. අපි ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෝ, බංකු මත හිඳගෙන, ප්‍රථම වසරට නවක සිසුන්, විශේෂයෙන් සුන්දර ගැහැණු ළමයින් එනතුරු බලා සිටියෙමු.

පළමු වසරේ ළමෝ විශ්ව විද්‍යාලය පරිශ්‍රයට පැමිණියේ භීතියෙන් යුතුවය. පිරිමි සහ ගැහැණු ළමෝ හොඳින් හැඳ පැළඳ පැමිණි අතර ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යන්ගේ විමසුම් ඇස් මග හරින්නට උත්සාහ කළහ. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය කණ්ඩායමක් නවක පිරිසක් අල්ලාගෙන හිරිහැර කරමින් සිටියහ. පිරිමි ළමයකුට කමිසය ගලවාගෙන, ඔහු අසල වූ ගස වටා යන්නට අණ කෙරිණි. සමහර පිරිමි ළමෝ, විශ්ව විද්‍යාල පරිශ්‍රයෙහි බයිසිකල් පැද්දේ හෙල්මට් පැළඳගෙනය, එය නවක ශිෂ්‍යයින් අසීරු තත්ත්වයකට පත් කිරීමට විනෝද සොයාගත් අලුත් නවක වද ක්‍රමයකි. පුළුල් උරහිස් ඇති පිරිමි ළමයෙක් පරමේශ්වර කෝවිල ඉදිරිපිට තනි කකුලෙන් සිටියේය, ඔහුගේ දෑතම හිසට උඩින් තබාගෙන සිටියේ තාපසකයකු මෙනි. ගස වටේ යන පිරිමි ළමයාට කැමැත්ත ප්‍රකාශ කරන ලෙස ගැහැණු ළමුන් කණ්ඩායමකට අණ ලැබිණි.

මගේ මිතුරෝ එක් ගැහැණු ළමයෙක් හඳුනාගත්හ. 'ඒයි නිල් සල්වාරෙ මෙහෙ එනවා' ගැහැණු ළමයා හෙමින් අප වෙතට පැමිණියාය, ඇය සිය පොත් තදින් අල්ලාගෙන සිටියාය, ඇගේ නළලෙහි ඩා බිඳු නැඟී තිබිණි. ඇය ඉතා ලස්සනය. ඇගේ විසල්, රවුම් ඇස් බියෙන් උඩ පහළ ගියෙන්, තරමක් පිරුණු කම්මුල් සහිත ඇගේ මුහුණ මට සිහිපත් කළේ මා කුඩා කල පාඩම් පොත්වල දුටු සුරංගනාවන්ගේ පින්තූරයි. උණුසුම් හැඟීමක් මා තුළ දිදුලන්නට විය. මට ඇයගේ දෑස දෙස බලන්නට ඕනෑ විය.

තද හිතැති ජ්‍යෙෂ්ඨයකු ලෙස දන්නා හඳුනන විනෝද් 'මොකද්ද ඔයාගේ නම' යැයි ඇසුවේය.

'සු...තා..'

සුතා ඒ ආදරණීය නම මගේ සිතෙහි දෝංකාර දුන්නේය.

'ඔයාගේ පොත් ටික ඔලුවේ තියාගෙන ඇඟ උණුසුම් වන අභ්‍යාස දහයක් කරන්න. පොත් බිමට වැටුණොත් ඔයාට ඒ අභ්‍යාසය ආයෙම කරන්න වෙනවා, පොත් ඔළුව උඩ තියාගෙන නැවෙන එකත් ඔයාගේ අභ්‍යාසයට ඇතුළත් වෙනවා. දැන් ඔයාගේ වෙලාව, පටන් ගන්නවා. ඉක්මනට කරන්න'

සුතා ආයාචනාත්මක ලෙසින් බැලුවාය.

'එන්න ගෑනු ළමයෝ, ඔයා මේක නොකළොත් පොත් මහ ගොඩක් ඔළුවේ තියාගෙන මුළු පරිශ්‍රය වටේම දුවන්න වෙනවා' විනෝද් බල කළේය.

සුතා හඬන්නට වූවාය. මට මගේ මිතුරාට අත මිට මොළවා ගසන්නට සිතිණි.

'මචං එයාට යන්න අරින්න' මම විනොද්ට කීවෙමි.

'මොකක්? අපි නවක වදේ දෙන එක පටන් ගත්තෙත් නෑ. එන්න ළමයෝ, කරන්න කියපු දේ කරන්න' විනෝද් ගෙරවූයේය.

'සුතා ඔයා ඔයාගෙ පන්තියට යන්න' මට මගේ වචනය ඇදහිය නොහැකි විය.

ඇය ස්තුති පූර්වකව මදෙස බලා ඉක්මනින් යන්නට ගියාය. මම මගේ මිතුරන්ගේ බැල්ම මග හැර, වේලය මනාලිය පසුපස යන්නාක් මෙන් සුතා පසුපස ගමන් කළෙමි.

ඉක්මනින් මා සුතාගේ හිතවතා වූ අතර අවසාන වශයෙන් ඇගේ ප්‍රේමය යැද, ඇය හා ආදරයෙන් බැඳුණෙමි. අපගේ ආදර කතාව අප සරසවියේ චිර ප්‍රසිද්ධ  කරුණක් විය. 'සුරේශ්සුතා' අපගේ  නම් බංකු මත, මේස මත, සහ ගස් වල දැක ගත හැකි විය.

සුතා ඉංග්‍රිසි සාහිත්‍ය පිළිබඳ විශේෂ උපාධිය හැදෑරූ අතර, මට ඇගේ ලේඛක ලෝකය, ශේක්ස්පියර්, වර්ඩස්වර්ත්, ෆ්‍රොස්ට්, ෂෙලී සහ කීට්ස් හඳුන්වා දුන්නාය. මගේ ඉංග්‍රිසි දැනුම මද වූයෙන් මට ඇගේ ලෝකය තේරුම් ගැනීම දුෂ්කර විය. එහෙත් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගන්නට ඇය මට කරදර කළාය.

අපි නිතර අපගේ ප්‍රියතම නුග ගස යට ඉඳ ගතිමු, සුමුදු මද පවන අප වැළඳගනියි, පරෙවියන් අතු අග හිඳ ගී ගයති, ඇය මට උගන්වන විට ඇගේ කෙහෙරැළි එහා මෙහා යයි. ඇගේ කම්මුල් හිරු එළියෙහි දිලෙයි.

මම අකමැත්තෙන් ඉංග්‍රීසි අභ්‍යාස කළෙමි, මට ඒවා වදයක් සේ හැඟිණි.

'මේක කරන්න සුරේෂ්. ඇයි ඔයා ඔච්චර මුරණ්ඩු? කරුණාකරලා මේක කරන්න.' ඇය කියයි.

'සුතා අපිට ආදරේට තියෙන්නෙ විනාඩි තිහක් විතරයි. මං මේක ගෙදරදි කරන්නම් කරුණාකරලා'

ඇය ආදරයෙන් මගේ කන මිරිකයි. 'මේ පන්තියේ වැඩ. ඉක්මනට කරන්න' මගේ හිසකේ අදිමින්, කන නැවත මිරිකමින් ඇය කියයි.

ඒ ස්නේහවන්ත ස්පර්ශය වඩ වඩා ලැබීමට මම අභ්‍යාස කරමි.

විනෝද් හා ඔහුගේ කණ්ඩායම නිතර අප පසුකරගෙන යන අතර ඔහු විහිළු කරයි. 'මචං, ඇයි ශේක්ස්පියර්? Machan, why Shakespre? Come and shake bear.

අපි හඬනගා සිනාසෙමු.

සුතා හැම දිනකම විනාඩි පහළොවක් පමණ වේලා මට ඉංග්‍රීසි ඉගැන්වූවාය. ඇය කියවීම, ලිවීම, ශ්‍රවණය, සහ ව්‍යාකරණ ඉගැන්වූවාය. විගස, මට ඇයගේ ලෝකය තේරුම් ගැනීමට හැකිවිය. ඇය මට ඇය උගත් කවි සහ කෙටිකතා විස්තර කළේ ඇගේ දෑත් විහිදුවමින් ලොකු කරගත් දෑසින් සම්පූර්ණ හැඟීමෙන් යුතුවය. මම ඇය කතා කරන විට මහත් ඕනෑකමින් ඇයගේ දෑස් දෙස බලා සිටියෙමි, මම ශෙක්ස්පියර්ගේ ප්‍රසිද්ධ ශෝකාන්ත, විශේෂයෙන් 'රෝමියෝ සහ ජුලියට්' කතාවට ආදරය කරන්නට වීමි. සුතා මගේ ජුලියට් වූවාය. මම ඇය පුදසුනක තබා දෙව්දුවක ලෙසින් ඇයට වන්දනා මාන කළෙමි.

අපගේ සරසවි සමය අවසන් වූ පසුව, මම ලිපිකරුවකු ලෙස බැංකුවක සේවයට බැඳුණෙමි. සුතා ඇගේ ශාස්ත්‍රීය ජීවිතය දිගටම පවත්වාගෙන ගියාය. සිදුවිය හැකි පරිදි අප විවාහ වීමට තීරණය කළ විට ප්‍රශ්න පැන නැගුණේය.

අප ජීවත්වන්නේ කුල ක්‍රමය ඉහලින්ම සලකන සමාජයක බව

අමතක කොට මම ඇයට ආදරය කළෙමි. සුතා කුලයට මුල්තැන දෙන ඉහළ පන්තියේ හින්දු පවුලකට අයත් වූවාය. මා පහත් කුලයට අයත් වන බැවින් ඇයගේ දෙමාපියන් මේ විවාහයට කිසිකලෙක එකඟ වීමට ඉඩක් තිබුණේ නැත.

මගේ මුතුන් මිත්තන් ධීවරයෝ වූහ. මගේ සීයා මුහුදු ගොස් මසුන් ඇල්ලුවේය. අප්පා පේරාදෙණිය සරසවියේ ඉංජිනේරු ශිල්පය හදාරා පසුව කොළඹ පදිංචි වූයේය. අප කොළඹ ජීවත්වන විට මම කුලය හෝ වෙනත් බෙදීම් ගැන කිසිවක් නොදත්තෙමි. එහෙත් යාපනය මට ධීවර ජන කොටස පහළ කුලයකට අයිති බව ඉගැන්වූයේය. අපගේ ප්‍රහෙලිකාව කිසිදිනෙක විසඳිය හැක්කක් ලෙස පෙනුණේ නැත.

එක් දිනක් මට සුතාගෙන් ලිපියක් ලැබිණි.

ආදර සුරේෂ්,

අප්පාගේ මිතුරෙක් ඊයේ අප නිවසට පැමිණ අපගේ ආදර සම්බන්ධය ගැන අප්පාට දන්වූයේය. මා හිතන්නේ ඔහු යම් තැනකදී අප දැක ඇති බවය. අප්පා කෝපාවිෂ්ටව සිටියි. ඔහුගේ දෑස් ගිනිදැල් මෙනි. ඔහු මගේ කම්මුලට ගසා 'මෝඩි, උඹට අමතක ද උඹේ පැලැන්තිය? ඒ පහත් කුලේ එකා එක්ක සම්බන්ධයක් ඇති කරගන්න උඹ මොනතරම් බය සැක නැති වුණාද? මේක අපේ කුලෙත් එක්ක එක්කාසු වෙන්න හොඳට සැලසුම් කරපු උගුලක්. උඹ මගේ පවුලට අපකීර්තිය ගේන්නද හදන්නෙ? කවම කවදාවත් හිතන්න එපා උඹට ඒ සක්කිලියා කසාද බඳින්න පුළුවන් වෙයි කියලා'. ඔහු මට කිසිතැනක යාමට අවසර නොදෙයි, මට විවාහයක් කරදීමට ඔහු සැලසුම් කරයි. සුරේෂ් කරුණාකර මේ සම්බන්ධයෙන් කළහැකි කිසිවක් කරන්න.

සදා අදරැති<br>
සුතා.

මේ හදිසි සිදුවීමෙන් මගේ පළමු තැතිගැන්මෙන් මිදුනායින් පසුව, මම මගේ මිතුරන් සමග එක්ව සැලැස්මක් සකස් කළෙමි, ඒ සැලැස්ම ඇගේ මිතුරියක අත ඇයට යැවීමි. සතියකට පසුව අපි ඇගේ නිවස අසල වෑන් රථයක හිඳගෙන ඇය එනතුරු බලා සිටියෙමු. අඳුරෙහි, නිවසෙහි

ඉදිරි පාරෙහි සෙමින් කිසිවකු එනු මම දුටුවෙමි. ඒ සුතා විය. ගේට්ටුව අගුළු ලා තිබුණෙන්, අපි තාප්පයෙන් පනින්නට ඇයට උදව් වීමු. සුතා මා සිප ගත්තාය, ඇගේ දෑසින් කඳුළු කඩා හැලෙන්නට විය. අපි වෑන් රථයට නැග ඉක්මනින් එතැනින් ගියෙමු. ඊළඟ දින උදෑසන අපි විවාහ වීමු.

අපගේ විවාහය අවස්ථාවේදී, මම ඇගේ දෑස දෙස බලා පොරොන්දු වූයෙමි. 'ඔබ ඔබගේ දෙමාපියන්ට කුමරියක වූවාය. එහෙත් අදින් මත්තෙහි ඔබ මගේ රැජිනයි. මම මගේ මුළු හදින්ම ඔබට ආදරය කරමි. මා කිසිදිනක ඔබ හඬවන්නේ නැත'

සුතා සිනාසෙන විට ඇගේ දෑස් තරු මෙන් දිළිසුණේය.

මම ඇය මා වෙත ඇදගෙන සිප ගත්තෙමි. ඒ අවස්ථාවන් ගැන සිතන විට දැන් මා වේලී ගිය ගංගාවකි. මා දැන් සිටිනා ස්ථානයට පැමිණීමට මා කළ කෲරතර පාපය කුමක්ද?

මම මගේ දෑස් අළු පැහැ ඔරලෝසුවෙන් ඉවතට ගත්තේ, මේ වාට්ටුවේ, මා ඉදිරියේ සිටින තවත් රෝගියකු වන රනිල් කොහිදැයි සෙවීමටය.

පිළිකාවේ ව්‍යසනය ඔහු කෙරෙන් දිස්වෙයි. ඔහුගේ හිසකේ නැත. ඔහුගේ පුළුල් උරහිස් කියාපාන්නේ කලෙක ඔහු ශක්තිමත් මිනිසකුව සිටි වගයි. එහෙත් දැන් ඔහුගේ සම එල්ලී වැටෙයි, ඔහුගේ ඇස් ඉදිමී ඇත. ඔහුගේ දෙතොල් වේලී පුපුරා ගොසිනි. ඔහුට පසුගිය සතියේ කිමියෝතෙරපි ප්‍රතිකාරය දුන්නේය. ඔහුගේ අක්මාවටද පිළිකා සෛල පැතිරී ගොසිනි. ඔහුගේ තත්ත්වය මගේ තත්ත්වයට ද වඩා අවදානම්ය. මා රැකී සිටින්නේ ලේ පාරවිලයනය කිරීමෙනි. (ලේ දීමෙනි). ඔහු වේදනා වින්දද, මා සතුටෙන් තැබීමට හැමවිටම උත්සාහ කරයි. ඔහු මට හමු වී ඇති වඩාත් ප්‍රීතිමත් තැනැත්තාය. මා මෙන් නොව, ඔහු සිතන්නට කිසිවක් නොමැති අවිවාහකයෙකි. මා ඔහු හමුවුණු පළමු මොහොතෙහි, ඔහුගේ මුහුණ හැමවිටම හුරුපුරුදු බවක් දැනිණි, එහෙත් මෙහි පැමිණෙන්නට පෙර කිසිදිනෙක මට ඔහු හමුවී නැත.

ඔහු මගේ කඳුළු පිසදා ගන්නට මට ලේන්සුවක් දුන්නේය.

'ඔයා දවල්ට කෑවද?' මගේ අවධානය වෙනතකට යොමුකරන්නට රනිල් ඇසුවේය.

'මං කෑවොත් තව ටිකක් ජීවත් වෙයි. මගේ ඉරණම තීරණය වෙලා ඉවරයි. මට මේ කෑම ඕන නෑ'

'මේ බලන්න මනුෂ්‍යයෝ, මම කනවා ඔයාගේ කෑම පිඟාන.'

රනිල් සෙමින් මගේ පිඟාන රැගෙන කෑමට පටන් ගත්තේය. මම ඔහුගේ සරදම් කිරීම් නොසලකා හැරියෙමි.

ඔහුගේ ප්‍රීතිමත් බව ඔහු ලබාගත්තේ කොයින්ද? ඔහුද වේදනාවෙන් පෙලෙමින් සිටියදී, වෙනස් ජාතියකට හා ආගමකට අයත් මේ මිනිසා මා සතුටින් තැබීමට උත්සාහ කිරීම උපහාසය දනවන සුළුය.

'ආ...' රනිල් ඔහුගේ වතුර බෝතලය වහා ගෙන උගුරක් බීවේය. 'අමුමිරිස් කෑල්ලක් විකුණා'

'ඔයා කොළඹ ගිහිල්ලා තියෙනවද?' පිඟානෙහි ඇති අමුමිරිස් කෑලි ප්‍රවේසමෙන් තෝරා පැත්තක තබමින් රනිල් ඇසුවේය.

'ඔව් මං එහෙ පදිංචි වෙලා හිටියා. ඒත්...'

'ඒත්, මොකද්ද?'

මම සීලිම දෙස බලා සිටියෙමි. 1983 කැරැල්ලේන් පසු මම සිංහලුන්ට නොකැමැත්තෙමි. ඔවුන් දමිළ පවුල්වලට කළ කෲරකම් කිසිදා අමතක කළ නොහැකිය, බියෙන් පිරුණු රාත්‍රී කාලයේ, තීව්‍ර අසහනයේ වේදනාව ඉවසිය නොහැකිය.

රනිල් මගේ ප්‍රතිචාරය බලා සිටියි.

'ඔය ගොල්ලන්ගෙ මිනිස්සු අපිව කොළඹින් එලෙව්වා'

'මගේ මිනිස්සු... මට මගේ මිනිස්සු නෑ. ආගමක් නෑ, බලන්න කෙනෙක් නෑ, හිත් වේදනා නෑ'

'මං කතා කරන්නෙ ඔයගොල්ලන්ගෙ වර්ගය ගැන. ඔයාගෙ වර්ගයේ අය අපිව එළවලා දැම්මා'

'ඔව් එක ඇත්ත. ඒත් ඒක සංවිධානය කළේ සමහර පිළිකුල් සහගත දේශපාලනඥයො. චෝදනා කරන්න එපා අහිංසක මිනිස්සුන්ට. සිංහල මිනිස්සුන්ගෙන් ආරක්ෂාව ලබපු දෙමළ පවුල් කොච්චර ඉන්නවද? ඒ ගොල්ලො අහිංසක දෙමළ මිනිස්සුන්ට රැකවරණය දුන්නා'

'රැකවරණය? මොන කෙහෙල්මලද? අපිට කොහේවත් රැකවරණය ලැබුණෙ නෑ'

'ඔයාට සිංහල අසල්වැසියො හිටියෙ නැද්ද?'

'හිටියා. අපේ අල්ලපු ගෙදර හිටියෙ සිංහල අය. ඒත් දාමරිකයො අපේ ගෙට ඇවිත්, ගේ ගිනි තියනකොට ඒ ගොල්ලො නිහඬව සිටියා'.

රනිල් නැගිට, සින්කයෙන් අත සෝදා ගත්තේය. ඔහු මගේ ඇඳෙහි ඉඳගන්නට එයි. 'මට කනගාටුයි. ඔයා කොළඹ කොහේද හිටියෙ?'

රනිල්ට, මගේ අතීතය සොයන්නට වුවමනා වෙයි, මගේ වෛරය මුසු හැඟීම්වල දොරගුළු හරින්නට මම කැමැත්තෙමි. 'අපි සිටියෙ වැල්ලවත්තෙ'

රනිල් දෙතොල් සිරකොට නම ශබ්ද නගා කීවේය. මගේ සිත අතීතයට ඇදී යයි. මට ඔහු සිටිනු නොපෙනෙයි.

'මගේ අප්පා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙ ඉංජිනේරුවෙක්. අම්මා, අප්පා, මගේ සහෝදරී කවි, කුමාර් මාමා, මගේ අම්මගෙ සහෝදරයා සහ මම අපි හොඳ සුව පහසු ජීවිතයක් ගත කළා. අපේ අල්ලපු ගෙදර හිටියෙ ජයවර්ධන පවුල. ඔවුන් බොහොම දයාවන්ත, උපකාර කරන, හිතලා මතලා වැඩකරන උදවිය. අපි උත්සව සැමරුවෙ එකට. අම්මයි, දිනාලි නැන්දයි දෙගොල්ලන්ගෙ උත්සව කෑම හුවමාරු කරගත්තා නිතරම. ජයවර්ධනලා අපි එක්ක දීපාවලියි, පොන්ගල් සමරන එකයි කවදාවත් අත්ඇරියේ නෑ'

රනිල්ගේ දෑස් විසල් විය, ඔහු කිසිවක් මිමිණුවේය, එහෙත් මම මගේ කතාව කරගෙන ගියෙමි.

'මගේ එකම යාළුවා විජේ, ජයවර්ධනගෙ පුතා, රවුම් මූණකුයි, කැරලි ගැහිච්ච හිසකෙස් තිබ්ච්ච පුංචි තරබාරු පුතා. එයා මට වැඩිය

පැහැපත්. එයා චොකලට්ටුයි, කටදන ජාතියි කන්න හරි ආසයි. ඒකෙ ප්‍රතිඵලයක් හැටියට එයාට පුංචි බඩගෙඩියක් ලැබුණා. අපි එයාට විහිළු කළා. අපි එයාට කතාකළේ 'බඩගෙඩියා' කියලා. එයා මට වැඩිය අවුරුද්දක් බාලයි. විජේ අපේ ගෙදර ආවා සතියෙ දවස්වල. මං විජේගෙ ගෙදර ගියා සති අන්තවල. විජේ අපේ ගෙදරින් කෑවා. මං විජේලගෙ ගෙදරින් කෑවා. අපි පුංචි මැටි ගෙවල් හැදුවා. විජේට තිබුණා වළං සෙට් එකක්. අපි මඩ බතුයි, මඩ ව්‍යංජනයි හැදුවා. එයා ප්‍රීතිමත් නායකයෙක්. මඩ බතුයි, මඩ ව්‍යංජනයි හදනකොට එයා තමයි අණ දෙන ලොක්කා. එයා කියනවා 'සුරේෂ්, ඉක්මනට වතුර ගේන්න. නෑ දැන් දාන්න එපා. ඒක පස්සෙ දාමු' කියලා. 'විජේ මඩ ටිකක් දාන්න ඕන' මම අයදිනවා. ඒත් එයා ඉඩ දෙන්නෙ නෑ. එයාට මං හැම තිස්සෙම අවනත වෙනවා, මොකද එයාගෙ අණදීම පවා ප්‍රීතිමත්.'

'විජේගෙ නැන්දා, කුමුදිනි නැන්දා සමහර වෙලාවට අපට එකතු වෙනවා. එයා උදව් වෙනවා මඩ කේක් හදන්න. කුමාර් මාමයි, කුමුදිනි නැන්දයි සමහර වෙලාවට විජේවයි, මාවයි වැල්ලවත්තෙ මුහුදු වෙරළට එක්කන් යනවා. අපි ඒ ගොල්ලන්ගෙ අත්වල එල්ලිලා යනවා, අපි හරි ආස වුණා ඒ හැන්දෑ ගමන්වලට. අපි ප්‍රවේසමෙන් රේල් පාර පැනලා, වැල්ලවත්තෙ මුහුදු වෙරළට යනවා. ඒ වෙලාවෙ හැන්දෑ හිරු, හෙමින් හෙමින් නිසල මුහුද සිප ගන්නවා. වෙරළයි, ගල් තලාවලුයි මිනිස්සුන්ගෙ න් පිරිලා. වෙරළේ ඇවිදගෙන යන වයසක මනුස්සයෙක් හැමදාම අපට සුබ පතනවා. ළමයි කීප දෙනෙක් මුහුදෙ සෙල්ලම් කරනවා, එකිනෙකාගෙ මුහුණු වලට වතුර ගහ ගන්නවා, කුඩ ඉහළගෙන ඉන්න පෙම්වත්තු තුරුළු වෙලා ඉන්නවා, පඳුරු පිටිපස්සෙ. කුමාර් මාමයි, කුමුදුනී නැන්දයි ගලක් උඩ ඉඳගෙන කතා කර කර ඉන්න කොට විජේයි, මමයි වැලිගෙවල් හදනවා. කතා කරන අතරෙ ඒ ගොල්ලන්ගෙ ඇස් තියෙන්නෙ අපි ගාව. ඒ දෙන්න අත් අල්ලගෙන ඉන්නවා, සමහර වෙලාවට කුමා මාමා, කුමුදිනී නැන්දගෙ කෙහෙරොදක් කන පිටිපස්සට කරනවා. ඇය, ඒකට හරියන්න ඔහුගෙ කමිස කොලරය හරි ගස්සනවා'

'සැරයක්, ඒ දෙන්නා මෙහෙම ඉඳගෙන ඉන්න කොට, කුමුදිනි නැන්දා, හිටපු හැටියෙ අඬන්න ගත්තා. විජේයි මායි බය වෙලා එකිනෙකා දිහා බැලුවෙ, කුමාර් මාමා ඇගේ කම්මුල්වල තිබුණු කඳුළු අතින් පිහ

දමනකොට. අපි අනික් පැත්ත හැරිලා අපේ වැලි ගේ හදන්න හිත් යොමු කළා.'

'ඒ ඔවුන් එක්ක වැල්ලවත්ත වෙරළට ගිය අන්තිම ගමන. එයින් පස්සෙ අපට යන්න අවසර ලැබුණේ නෑ. අම්මා මට අනතුරු ඇඟෙව්වා. අප්පා ඔයා එක්ක තරහින් ඉන්නෙ, අප්පව අවුස්සන්න එපා.' අපගේ පවුල් පෙරදී මෙන් නොවන වග අපට හැඟී ගියේය. අප්පා සහ ජයවර්ධන මාමා කතා කළේ අඩුවෙනි.

කුමාර් මාමා අපට ලියුම් හුවමාරු කිරීමේ නව සෙල්ලමක් හඳුන්වා දුන්නේය. 'සුරේෂ් මේ ලියුම විජේට දෙන්න, එයා ඒක කුමුදුනී නැන්දාට දෙයි. ඈය හෙට උත්තරයක් එවයි විජේ අතේ, සුරේෂ් ඒක මට ගේන්න. මතක තියාගන්න මේක රහස් සෙල්ලමක්. මේ සෙල්ලමේ වැදගත්ම නීතිය ලියුම් කාටවත් පෙන්නන්න බෑ. ඒක රහසක්ව තියාගන්න.'

'ලියුම් ගෙනයන සෙල්ලම හරිම විනෝදජනකයි. අපි ලියුම් අරගෙන එහාටයි මෙහාටයි දුවනවා. එක දවසක්, මාලිනී නැන්දා, සාප්පු මාමාගෙ නෝනා මගෙන් ඇහුවා, 'සුරේෂ්, මොකද්ද කුමාරුයි කුමුදුනියි අතරෙ වෙන්නෙ? සම්බන්ධයක්ද? 'සම්බන්ධය' යන වචනය මට අලුත් වචනයක් විය. මම උරහිස සොලවා මගේ සැකය විජේට කියන්නට දිව ගියෙමි. මම 'සම්බන්ධය' යැයි කියද්දි විජේ ඇස් කරකවා 'මං දන්නෑ සුරේෂ්' කීවේය. විජේ හෙලාදකින්නට සිය තොල් පෙරලුවේය.

දින කිහිපයකට පසු, සිංහල සහ දෙමළ අලුත් අවුරුදු උදාවිය. අපි අලුත් ඇඳුම් ඇන්දෙමු, නිවෙස් මලින් සැරසීමු, අපේ මේසයේ රසකැවිලි සහ පළතුරු පිරී තිබිණි. අම්මා සහ දිනාලි නැන්දා රසකැවිලි හුවමාරු කරගත්හ. පසුව විජේ අප නිවසට පැමිණ, මා සමග රතිඤ්ඤා පත්තු කළේය. සියල්ල හොඳින් සිදු විය. හිටිහැටියේ ගිගුරුම් ශබ්දයක් ඇසිණි. ජයවර්ධන මාමා, කුමාර් මාමා සමග පෙනී සිටියේය. ඔහු කුමාර් මාමාගේ කොලරයෙන් ඇදගෙන අපගේ ඉදිරි පාරට පැමිණියේය. අම්මා ඔහු බේරාගැනීමට දිව ගියාය. ජයවර්ධන මාමා කෝපයෙන් කෑ ගසමින් කුමාර් මාමා අප වෙත තල්ලු කර දැමුවේය. 'මං වෙලාවට මිනිහව අල්ල ගත්තා.' 'මොකද්ද වුණේ?' පිටතට පැමිණි අප්පා ඇසුවේය. ජයවර්ධන මාමා පිළිතුරු දුන්නේය. 'එයා මගේ සහෝදරීට අයුතු දෙයක් කරන්න හැදුවා.'

'ඔයා කියන දේ පරිස්සමින් කියන්න මං ඈ එක්ක කතා කරමින් හිටියෙ' කුමාර් මාමා ඔහුගේ හඬ උස් කරමින් කෑගෑවේය. 'උඹ තක්කඩියා. උඹ කතා කර කරද හිටියෙ?' ජයවර්ධන මාමා ප්‍රතිඋත්තර දුන්නේය. අප්පා කෝපයෙන් කුමාර් මාමා දිහා බැලුවේය. ඊළඟට ජයවර්ධන මාමා දිහාට හැරුණේය. 'ඇයි ඔයා මෙතන කෑගහන්නෙ? ගිහිල්ලා, ඔයාගෙ සහෝදරීට අවවාද කරන්න. වැරැද්ද දෙපැත්තෙම තියෙනවා.' ජයවර්ධන මාමාගේ මුහුණ රතු වී තිබුණි, ඔහු නැවත කෑගෑවේය. 'උඹලා දෙමළ ප්‍රයෝග කාරයො. උඹලා හදන්නෙ අපේ පවුලට රිංග ගන්න. 'හා ! ' අප්පා ප්‍රති පිළිතුරු දුන්ණේය. 'අපිට උඹලගෙ පවුලත් එක්ක සම්බන්ධයක් ඕනා නෑ. කුමාර් උඹගෙ සහෝදරීට ආයෙ කරදර කරන එකක් නෑ. මං වග කියනවා ඒකට. උඹ ගිහින් උඹේ සහෝදරී බලා ගත්තොත් හොඳයි' ජයවර්ධන මාමා විජේගෙ අතෙහි වූ රතිඤ්ඤා උදුරා ඒවා විසි කළේය. අනතුරුව සිය පුතුගේ අතින් ඇදගෙන ඔවුන්ගේ නිවසට ගියේය.

විජේට හා මට එකිනෙකාට කතා කිරීමට අවසර නොලැබුණි. 'සුරේෂ්, ඒ සිංහල ගෙදරට යන්න එපා. හැම තිස්සෙම මතක තියාගන්න ඔයා සුළු ජාතිකයෙක් වෙච්ච දෙමළ ජාතිකයෙක් බව.' අප්පා මට නියෝග කළේය. 'ඔයාට කොහොමටවත් බෑ, ඔවුන් එක්ක මුහු වෙන්න. සාහසිකයො' ඒත් විජේ හොර රහසේ මා බලන්නට අපේ නිවසට ආවා. ඔහුගේ ඇස් බයෙන් පිරිලා තිබුණා. 'සුරේෂ්, තාත්ති කිව්වා මට ඔයා එක්ක කතා කරන්න එපා කියලා. එයා කුමුදුනි නැන්දාට කම්මුලට ගැහුවා. එයා හැමතිස්සෙම අඬනවා. එයාගෙ තත්ත්වෙ හරිම දුකයි. තාත්ති කියනවා කුමුදුනි නැන්දයි, කුමා මාමායි යාළුයි කියලා. හුවමාරු කරගත්තෙ ඒ ගොල්ලන්ගෙ ආදර ලියුම්. අතරමැදියෙක් වුණා කියලා තාත්ති මට හොඳටම බැන්නා. එයා කුමුදුනි නැන්දාව නුවර අරින්න හදන්නෙ, ඊට පස්සෙ සැලසුම් කරනවා නැන්දගෙ මස්සිනාට කසාද බන්දලා දෙන්න. මං හිතන්නෙ නෑ මට ඔයාව මුණ ගැහිලා ආයෙ සෙල්ලම් කරන්න පුළුවන් වෙයි කියලා. මට ඉඩක් හම්බ වෙච්ච ගමන් ඔයාව බලන්න එනවා. බායි! විජේ දුවගෙන ගියා, ගස් අතරින් ඔහුගේ හිස නොපෙනී යනවා මම බලාගෙන හිටියා. එයා ආයෙ කවදාවත් ආවෙ නෑ. ඒක තමයි අපේ අන්තිම හමුවීම. දින කීපෙකට පස්සෙ අප්පා, කුමාර් මාමාව යාපනේට ඇරියා'

'මාස කීපෙකට පස්සෙ උදාවුණා 1983 කළු ජූලිය, කොළඹ අපේ පැවැත්ම අවසන් කරපු කළු ජූලිය. සාප්පු මාමා උදේට ඇවිත් අපට අනතුරු ඇඟෙව්වා මුළු කොළඹම දෙමළ මිනිස්සුන්ට ගහනවා කියලා, දෙමළ අයගෙ ගෙවල් කොල්ල කාලා ගිනි තියනවා කියලා. අපි දොරවල් අගුළු දාගෙන මුළු දවසම ඇතුලෙ හිටියා. අපේ ගේ පිරිලා තිබුණා බයෙන් සහ කම්පනයෙන්. අම්මා දෙවියන්ටයි, දේවමාතාවන්ටයි දන්න ඔක්කොම මන්තර කියන්න පටන්ගත්තා. අපි පූජා කාමරේ එකට එකතුවෙලා හිටියා. ඒ මහා රාත්‍රිය, වෙලාව දෙකට විතර ඇති. අපේ දොරෙන් මහා ශබ්දයක් ඇහිලා අපි නැගිට්ටා. මම අම්මගෙ අත තදින් අල්ල ගත්තා. ආයෙම හයියෙන් පාරක් වැදුණා! මගේ හදවත ගැහෙන්න ගත්තා. මගේ සොයුරිය කවී අඬන්න පටන්ගත්තා. අම්මා එයාගෙ කට වහලා තදින් අල්ලා ගත්තා. අපිට ගොරෝසු පිරිමි හඬවල් එළියෙන් ඇසුණා. 'කවුද ඇතුළෙ? දොර අරින්න.' අවසාන නිවේදනය ඇහුණා, අපේ දොර පැලී විවර වුණා. මගේ අත් වෙව්ලන්න ගත්තා. උගුර වේලුණා, මම ඇස් වහගත්තා. මිනිස්සු කණ්ඩායමක් අපිව පරීක්ෂා කරමින් හිටියා. ඔවුන් කෑගැහුවා. 'එළියට වරෙල්ලා' අඩි හඬ ළඟින්ම ඇසුණා. දොර කැඩී ඇරුණා, මිනිස්සු අපි ඉස්සරහ හිනාවෙමින් හිටියා. ඔවුන් බලාගෙන හිටියෙ ගොදුරක් දිහා බලාගෙන ඉන්න දරුණු සිංහයො වගේ. ඒ හැමදෙනා ළඟම ලොකු යකඩ පොලු සහ කඩු තිබුණා. ඔවුන් අප පූජා කාමරයෙන් එළියට ඇදගෙන ආවා. විශාල, මහත මිනිහෙක් ඔහුගේ කඩුව අප්පගෙ බෙල්ලට තිබ්බා. අපි හයියෙන් ඉකිබිඳින්න ගත්තා. අම්මා දණගහලා අයදින්න පටන් ගත්තා. 'ෂ් ෂ් ෂ් ෂ් පලයන් එළියට' ඔහු අපට යන්නට ඉඟි කළා. එක මිනිහෙක් අප ගෙයින් එළියට රැගෙන ගියා, ගේට්ටුව ළඟ ඉන්න කියලා අපට කිව්වා. එයා අප මුරකරගෙන හිටියා. අනික් මිනිස්සු අපේ බඩු ඔක්කොම සාලෙ මැද්දට විසි කළා. ඒ උඩට භූමිතෙල් දැම්මා ඊට පස්සෙ ගිනි තිබ්බා. අපේ ඇස් ඉදිරියේ අපේ ගේ ගිනි අරන් අළුවිලි වෙලා ගියා. අපේ බඩු, වටිනා වස්තු නැත්තට නැති වුණා. මම විජේගෙ ගේ දිහා බැලුවා. ඔවුන් ගේ ඇතුළෙ හිටියා, ඒත් කවුරුත් අපි වෙනුවෙන් එළියට ආවෙ නෑ, විජේවත් ආවෙ නෑ. ඉතින් තත්ත්වය සමාන්‍ය අතට හැරුණට පස්සෙ, සැනසිල්ලයි, හුරුපුරුදු කමයි හොයාගෙන අපි යාපනේට ගියා.'

මම වත්මනට එළඹෙන විට රනිල්ගෙ බැල්ම මා වෙත යොමුව තිබිණි. ඔහුගේ දෑසෙහි කඳුළු දිලිසෙමින් තිබුණේය. ඔහු මා සමීපයට පැමිණ මගේ අත අල්ලා ගත්තේය.

'සුරේෂ්, මම ඔයාගෙ විජේ. ඔයාගෙ පුංචි කාලෙ යාළුවා, ඔයා අනතුරේ ඉන්නකොට ඔයාව වැළඳගන්න බැරිවෙච්ච යාළුවා. මගේ සුරතල් නම විජේ. රනිල් ජයවර්ධන තමයි මගේ ඇත්ත නම. ඉතින් මම ඔයාට මාව රනිල් කියලා අඳුන්නලා දුන්නා. මගේ දෙමාපියො මැරුණා අවුරුදු ගානකට ඉස්සෙල්ලා. මං තනියම හිටියා. කුමුදුනි නැන්දා එයාගෙ මස්සිනා බැන්දා. එයා හමුදා සොල්දාදුවෙක්. එයා යුද්දෙදි මැරුණා. කොහොමද කුමාර් මාමා?

මම නිරුත්තර වීමි. මට මගෙ කන් අදහාගත නොහැකිය.

'කුමාර් මාමා කවදාවත් විවාහ වුණේ නෑ' මම අවසානයේදී කීවෙමි. 'එයාට ආණ්ඩුවයි, බහු ජාතියයි එපා වුණා. එයා එල්ටීටීඊයට බැඳුණා. එයාට මොකක් වුණාද කියලා අපි දන්නෙ නෑ'

අපි කවුළුවෙන් එපිට බැලුවේ, අනාවරණය වූ ඒ සත්‍ය පසක් කොට ගනිමිනි.

පිළිකා රෝගින්ට උදව් කිරීම සඳහා පැමිණි ස්වේච්ඡා කණ්ඩායමක් අපගේ වාට්ටුවෙ අනෙකුත් රෝගීන් සමග සතුටින් කතා කරමින් සිටිති, දෙමළ මිනිසෙක්, සිංහල ගැහැනු ළමයෙක් හා මුස්ලිම් කාන්තාවක් එහි සිටියහ. මම විජේ දෙස බැලුවෙමි. ඔහු මද සිනාවක් පෑවේය, අපි දෙදෙනාම එකම දෙයක් තේරුම් ගනිමින් සිටියෙමු.

කුමාර් මාමාට සහ කුමුදුනි නැන්දාට විවාහ වීමට නොහැකි වූයේ ජාතිය පිළිබඳ ප්‍රශ්නය හේතුකොට ගෙනය. එකම ජාතියට අයත් වුවද මම සුතා සමග විවාහ වීමට අරගල කළෙමි. එහෙත් මරණයේ දොරකොඩ අබියසදී, අවසානයේදී, මිනිස්සු එක සමාන වෙති.

***සාම්බවී සිවාජි,*** *උඩුපිල් කාන්තා විද්‍යාලයෙන් අ.පො.ස (උ/පෙළ) ට ලියා අවසන් වී, විශ්ව විද්‍යාල ප්‍රවේශ ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටියි. දෙමළ සහ ඉංග්‍රීසි දෙබසින්ම කෙරෙන ඇගේ සාහිත්‍ය කටයුතු පාසල් සමයේ සිට ආරම්භ වුවකි. ඇය සාහිත්‍ය කෙරෙහි දැඩි ඇල්මක් දක්වන නිසා, උසස් පෙළ විභාගයේ එක විෂයයක් වශයෙන් ඉංග්‍රීසි සාහිත්‍ය විෂයට පෙනී සිටියාය. ඇගේ සමාජයේ පවත්නා සමහර සමාජ චාරිත්‍රයන්හි අඩුපාඩුකම් පෙන්වාදීමට ඇය කැමැත්තීය. ඇයගේ පුද්ගලික උනන්දුව අතරට කවි සහ කතා ලිවීම සහ වයලීන වාදනය ගැනෙයි.*

# සුරංගනා කතා

## *වින්ධ්‍යා බුත්පිටිය*

තාපස කකුළුවන් නිවෙස් සොයා යන්නාක් පරිද්දෙන් පිළිස්සී ගිය නගරය මැදින් අපි දඩිබිඩියේ දිව ගියෙමු. බ්‍රිතාන්‍ය සීතලය වෙනුවෙන් අප අතහැර ගිය අරධද්වීපයේ රස්නය අපගේ පිටවලට දැනෙන්නට විය. අප්පා සහ මම, දැන් නටඹුන්ව ඇති අපගේ නිවස සොයා ගත්තෙමු. එහෙත් එය නිවසක හෘදයංගම බව තවදුරටත් ගෙන දුන්නේ නැත, එහෙත් ඒ වෙනුවට අපහසු ඉංග්‍රීසි අකුරක් අපගේ දිවෙහි පැටලෙන්නාක් වැනි හැඟීමක් ඇති කළේය.

මා අම්මා සමග ඉදිරි පඩියෙහි හිඳගෙන සිටියදී, අප්පා දැඩි නිහඬකමකින් ගෙතුළට ඇතුළු විය. අප්පා කුරුලෑ පෙලක් ලෙසින් බිත්තිවල විසිරී ඇති බෝල් බෙයාරින් (ගුලා බෙයාරිම) පහරවල් වැදුණු තැන් එකිනෙක සිය වෙව්ලන ඇඟිලිවලින් අතගාමින් එන අප්පා දෙස මම බලා සිටියෙමි.

අපගේ අඹ ගස බොහෝ කලකට පෙර නැසී ගොසිනි, එය තිබූ තැන අද තිබෙන්නේ අඹ ගසේ විකෘති වී ගිය කොටයයි, එය පාමුල වැළපෙන රතු අරලිය මල් විසිරී ඇත.

බිත්ති, රතු ගඩොල් සහ අළු පැහැති සිමෙන්තිය මතු කරමින් ගැලවී ගොසිනි. නිල්පැහැති හුණු බිත්තිවල ගැලවී ගිය කොටස් වල පෙඳ බැඳී ඇත්තේ ඔබු දුවන ලද තුවාලයක් පරිද්දෙනි. වව්ලන් විසින් ගෙන එන ලද බීජවලින් වැවුණු කුඩා පැල ගෙහි වැවී ඇත්තේ ඉදිමුණු තුවාලයක් වෙලුම් කර ඇති අකාරයටය. කාමර දිරාපත්ව ගොස් ඇත, කොහොඹ යට ලී බිමට වැටී දිරා කුඩු වී පිළිස්සී ගොසිනි. මුහුදු සුළඟෙහි සැර ගතියෙන් සහ පෙට්‍රල් ගින්නෙන් කළු වී ගිය පිටත බිත්ති නිසා එය තවදුරටත් නිවසක් යැයි හැඟවූයේ නැත.

අප මෙහි වාසය කළ කාලයේ, අරුණෝදයෙහි මෙන්ම ගොම්මනෙහිදී, අම්මාගේ බොහෝ හිස්ද, බොහෝ අත්ද, ඇති ත්‍යාග ශීලී වූ හිමාලයානු දේව මණ්ඩලයට දැල්වූ තඹ ලාම්පුවලින් පොල්තෙල් සුවඳ හා සමන්පිච්ච හඳුන්කූරු සුවඳ දැනවෙයි. ඇගේ මාධූර්යෙන් යුතු යාඥාවන් අපගේ අංගනය රැස් වළල්ලක් ලෙසින් අලංකාර කරවීය.

මම දෛනික පූජා පිළිවෙත් වලට එතරම් අකමැති නොවීමි, එහෙත් මගේ සොහොයුරිය තරු, යාඥා කිරීමට සිදුවීම ගැන බොහෝ අකමැති වූවාය. ඇය පූජනීය වචන විශ්වාස කළේ නැත, අපගේ නළලෙහි රතු, කහ සහ අළු පැහැති ආශිර්වාද පොට්ටු තබන විට ඇය අසහනයට පත් වෙයි. අනතුරුව පරණ කිරිපිටි ටින් එකක සඟවා තබන පැණිවළලු අම්මා පිරිනමන විටද ඇගේ ප්‍රසාදයක් තිබුණේ නැත. තරුගේ මේ විරෝධය අම්මා දැන සිටියේ නම්, ඇය නොසන්සුන් වන්නට ඉඩ තිබිණි. කමලිනි මිරිස් කොටන හඬ හා අප්පා නාන හඬ එකිනෙකට විරුද්ධ රිද්මයෙන්, හැම උදෑසනකම අප යාඥා කරන විට ඇසිණි. ඉරු එළිය වැටුණු සාරි වැලෙහි රැලි ගැසී තිබුණේය. කෝවිල් සීනුව නාද වෙයි, හිරු අහසෙහි නැගී එයි.

අම්මා වෙතින් තවදුරටත් පැණිදොඩම් සුවඳ සහ සඳුන් පියරු සුවඳ එන්නේ නැත, ඒ වෙනුවට මල්වඩම්වල ඇති දම් පැහැති ඕකිඩ් සහ සුදු ලිලී සුවඳ ගලා එයි. අපි ඇය ගෙදර ගෙන ආවෙමු, පැගිරි දොඩම් සහ ගෝකුල් සඳුන් සුවඳ ගලා ආ අම්මා අද මොනර පිහාටු වර්ණයෙන් යුතු සේද කංචිපුරම් රෙද්දකින් එතූ භෂ්මාවශේෂ බඳුනෙහි බහාලූ අළු ලෙසින් අපි ගෙන ආවෙමු.

අප්පා සහ මම එකිනෙකාගේ සමාගමෙහි නුහුරු බවක් දනවයි, මුනිවත රකින, අවිනිශ්චිත බවක් එහි විය. එකිනෙකාට කතා කරන්නට කිසිවක් නොමැති වූ තත්ත්වය ලන්ඩන් නුවර ජීවත් වන කාලයේදී, යුතුකමකට කෙරෙන කෙටි දුරකතන කතාබහකට පරිවර්තනය වීම සිදුවිය.

අප දෙදෙනා අතර ඇත්වෙමින් තිබුණු දුරස්ථභාවයට මා පුරුදු වූ බව මට පැහැදිලි විය. එහෙත් මම Good Luck සයිබර් කැෆේ හි සේවය කරන කල මා අසීරුවෙන් තේරුම් ගත් දෙය වූයේ තුන්වැනි ලෝකයේ අන්තර්ජාලය හරහා මට කතා කළ හැකි කිසිවෙක් නොසිටි බවයි. අන් කිසිවෙක් අප තුළ දැල්වූ සිහින සමග, ප්‍රමාණයෙන් නොගැලපෙන වූල් ඇඳුම් ඇඳගෙන පළමු ලෝකයේ වෙරළට ගසාගෙන ආ, මා වැනි ඇවිදින මළමිනීවලින් මම අකමැත්තෙන් පවුමේ කාසි එකතු කර ගනිද්දී, මා තේරුම් ගත්තේ අප ගෙදරින් වියෝවීමේ දුකින් එකට බැඳී සිටි බවයි. අපගේ ඇතුළතින් කැටි ගැසුණු හා ගොරෝසු වී ගිය පිත්තාධික අච්චාරු මතකය සමග සහජීවනයෙන් සිටීමට අපි පුරුදුව සිටියෙමු. අතුරුදහන් වූ

ආදරණීය හැඟීම් අපගේ දෑස් කොන එක්විය, අමතක වී ගිය උරුම නම් දිව අග විය. හැම දිනකදීම දෙතොල්වල අවුල ඇතිව තිරයට ආමන්ත්‍රණය කරමු, දූවිලි ගැහුණු මුහුණු සහ අඳුරු ඇස් දරාගත නොහැකි මතකයන්ගෙන් කැලැල් වී ගියේය.

ජුඩේරාජ් මට අහම්බෙන් මුණ ගැසුණේ ඔවුන් අතරිනි. අපගේම රාජ්‍යයක් ලෙසින් හැඳින්විය හැකි ඊළාම් රාජ්‍යය ඔහුගේ හදවතෙහි දරුණු ලෙස ඇවිලෙමින් තිබූ දිව්‍යමය සංගීතයක් මෙන් ඔහුගේ දෙසවන්හි රැව් දුන්නේය. ඔහුගේ උද්යෝගිමත් කහපැහැති ඇස්, අපගේ මාතෘභූමිය වෙනුවෙන් හඬ නගන, අනාථයින් සිටින්නේදැයි 'Good Luck' පීරා බලන්නට ඇත. 'කරන්න වැඩ සොයනවද? කුලියට ගන්න ලාබ කාමරයක්? මම දන්නවා වෙම්බර්ලි වල ඉන්න අම්පාරේ ඉඳලා ආපු පවුලක්, ඒ ගොල්ලො ඔයාට ඉඩක් දෙයි. ඔයාගෙ පවුලෙ අයට මුදල් යවන්නද? කිසි ප්‍රශ්නයක් නැමගේ මිත්‍රයා සිවා ඒ ගැන බලාගනියි'

ජුඩේරාජ් අපි අතර ප්‍රබල ඥාතිත්ව දැලක් වියුවේය. වැල්වැටිතුරෙයි සිට කන්කසන්තුරය දක්වා, ඔහුගේ සහෝදරත්වය දෙන්නා වූ ආරක්ෂාව සොයාගෙන අපි ඔහු වෙත ගියෙමු. ඔහු අපට නිතරම කුඩා ගුහාවක් වැනි ටූටින් හි රාසා අවන්හල වෙතට ආරධනා කළේය, එහිදී අපට දුම් දමන කෑම ලැබෙයි.

අපගේ කණ්ඩායමේ නවකයින්ට ඔහු පවුම් විස්සේ නෝට්ටු ණයට දීමට ත්‍යාගශීලී වූයේය. 'ඔයාට මෙහෙ අඩිය ගහන්න පුළුවන් වෙනකල්. මං රස්සාවක් ගැන සරස්වතීට කතා කරන්නම්' අප කතා කරමින් ගත කළ ඒ සන්ධ්‍යා කාලයන්හි ඔහු අපගේ භූමිය සඳහා ඉදිරි පෙළ සටන් කළ බැවින්, ජුඩේරාජ්ගේ පවුලෙහි අන් සියලුදෙනා අපගේ සතුරන් විසින් වෙඩි තබා මරා දමා ඇති බව දැනගන්නට ලැබිණි. බිම් බෝම්බයක කැලි වීසිවීමෙන් ඔහුගේ වම් කකුලෙහි මස් ඉරී යාමෙන් පසුව ඔහු බෝට්ටුවකින් ඉතාලියට පැන ගොස් අනතුරුව බ්‍රිතාන්‍යට පැමිණියේය.

'මාව නැති කරන්න ඒ ගොල්ලන්ට බැරිවුණා, අපේ මිනිස්සු නැති කරලා දාන්නත් ඒ ගොල්ලන්ට බැරි වෙයි' ඔහුගේ බිඳුණු අත් මිටෙහි වූ තේ පැහැති හමෙහි නොනැසී සිටීමේ ජයග්‍රාහී රෝස පැහැති කැළැල්ද, ඔහුගේ නොන්ඩි ගැසීමද, ඔහුගේ පමණක් නොව අප ජනතාවගේ ද ජයග්‍රහණ

සලකුණු කළේය. 'ඔවුන් අප හැමෝවම මරයි ! අපි අපේ අයිතියට සටන් කරනවා. සිහල රාජ්‍යයේ කෲරත්වයෙන් නිදහස් වෙන්න පුළුවන් දෙමළ මිනිස්සුන්ගෙ භූමියක් වෙනුවෙන්'

විරෝධය පෑම සහ මාතෘභූමිය සම්බන්ධයෙන් ඔහු කාව්‍යාත්මක වූ අතර ඔහුගේ ඒ කතා ඇසීමට අපගේ ආශාව වර්ධනය විය.

ජුඩ්රාජ්, බෝට්ටු ජනතාවගේ අනුග්‍රාහක ශාන්තුවරයා වූයේය. ජුඩ්රාජ් මගේ සහෝදරියද සමග අපගේ සතුරාට එරෙහිව සටන් කළේය.

කතා කරන්නට විශේෂ කිසිවක් නොතිබූ බැවින්, මම මේ කතාව විශේෂයෙන් අපහසුව දනවන, යුතුකමක් සේ කරන කතාබහේදී අප්පාට කී විට අප්පා කෝපයට පත් වූයේය.

'බය නැතුව කියන හැටි' ඔහු ගෝරනාඩු කළේය, ඔහුගේ කෝපය දුරකතනය දිගේ ගලනය වූයේය. 'උන් ඈව අපෙන් උදුරාගත්තා'

විප්ලවකාරිය, තරු, ඔහුගේ ප්‍රියතම තැනැත්තිය වූවාය. 'ස්ත්‍රීවාදී විප්ලවකාරිය' ඇය, ඇයව එසේ හඳුන්වා ගත්තාය. ඇගේ දිගු කොණ්ඩය බේකර් බෝයි තොප්පිය යට නවා දමා තිබිණි. දෙවැනි ගනයේ බුද්ධිමතුන් විසින් විචාරය කරන පරණ පොත්වලින් පිරි අඳුරු සරසවි කාමරවලට ඇය බයිසිකලයෙන් ගියාය. රතු දේශපාලනය හා එකී මතවාදය ගැන ඇය කතා කළ අතර ඇගේ නෙතඳුන් ගෑ දෑස් දීප්තියෙන් බැබළිණි. ඒ වසරවලදී, අපගේ නිදිගත් නගරයට යුද්ධයේ ලෝහ මිශ්‍ර දුර්ගන්ධය දැනෙන විට, මිනිස්සු සහ පිරිමි ළමෝ රාත්‍රියෙහි සැඟව ගොස් 'කාර්යභාරයට' එක්වූහ. අනතුරුව එක් සන්ධ්‍යාවක අපට තරු අහිමි විය. විමුක්තිය පිළිබඳ සීනි තැවරූ පොරොන්දුව ඇය අපගේ නිවසෙන් පිටතට ඇදගෙන ගිය අතර, කැලෑවල සිදුවූ මිනිස් බලය සහිත යුද්ධ යාන්ත්‍රණයට ඇය එක්කර ගැනුණි. බොහෝ හිස් ඇති, බොහෝ අත් ඇති, ඒ මෘගයා සියල්ල පාගා, මකා, විනාශ කර දැමුවේය. තරුගේ ශස්ත්‍රාලීය නව මං පෙත වෙනුවෙන් අප්පා තුළ වූ මහත් සිහිනය 'කාර්ය භාරය' වෙනුවෙන් කැප කරන්නට සිදුවිය.

ඔවුන් මා පසුපස එන්නට පෙර අප අගනුවරට යා යුතු යැයි අප්පා තීරණය කළේය. තවදුරටත් නින්ද හා සතුට යනු කුමක් දැයි නොදත් අම්මා

මගේ සොහොයුරිය ගැන සඳහන් කරන හැම විටකදීම අප්පා බලවත් කෝපයකින් වෙව්ලුවේය, ඔහුගේ සමාධිය ලැජ්ජාවෙහි සහ කෝපයෙහි අවතාර විසින් පහුරා ගසනු ලැබිණි.

'ඒත් ඈ එසේ ඉන්නවා කියලා දැනගෙන අපි දාලා යන්නෙ කොහොමද? ඈට අපිව සොයාගෙන එන්න හිතුණොත් මොකද කරන්නෙ?' අම්මා වැළපුණාය. 'එයා තට්ට තනියම'

'අපි එයාව හැදුවේ අන්ධයෙක් වගේ, එයාගේ ෆැන්ටසිවලට ඉඩ දුන්නා, එයාගේ ඔය අනතුරුදායක අදහස්වලින් ඔලුව පුරවගෙන උඩපනින කොට අපිට ඒක නවත්තන්න තිබුණා. එයා සෙල්ලම් කරමින් හිටියෙ ගින්දර එක්ක. අපි එයාගෙ බුද්ධිය ගැන වර්ණනා කර කර හිටියා. දැන් එයා අපිට ලැජ්ජා කරලා. ඔයා හිතනවද මේ ඊනියා විප්ලවෙන් මොකක් හරි හොඳක් වෙනවා කියලා. අපේම මිනිසුන් මරන්න අපේ දුවට ඉඩදීම ගැන දෙවියො අපිට අහක බලා ගනීවි.' අප්පාගෙ වචන කෝපය සමග බාල වී ගියේය. 'ඇය අපිට සාපයක් ගෙනාවා. අපේ මිනිසුන්ට සාපයක්'

අම්මාගේ පිත්තල පහන් වල සහ සාරි බණ්ඩලවල ඔතා තිබූ ප්‍රතිමා බරින් කෙඳිරිගාමින් යන පැරණි කළු ටැක්සි කැබ් රථය පිටුපස අසුනෙහි අප සිර වී හිඳගත් විට කරදර ඉක්මනින් අවසන්ව යනු ඇතැයි අප්පා සහතික කළේය. අප රථයේ යන විට, මගේ මුහුණද, අත්ලද, දුහුවිලි පිරි පිටුපස වීදුරුවේ රැඳිණි. අප පසුකර එන අපගේ ගෙවත්ත එවිට පෙනුණේ, කොළ තණකොළ ලොව්ච්චියකින් යුතු සපත්තුමල්, රතු අරලිය සහ සුදු මල්ලිකා මල් පිපුණු, උතුරු දිග හිරු එළියෙහි බතික් පූජක ඇඳුමකින් සැරසුණු පූජක පෙළක් පරිද්දෙනි. අඹ ගසෙහි කොළ අතරින් රත් පැහැති කාන්තිමත් හිරුඑළිය පොළවට පතිත වෙයි, සැන්දෑ මද සුළඟෙහි ඉදුණු අඹ ගෙඩි සෙලවෙයි. ලවණ මිශ්‍ර වාතය, හිරු එළිය වැටුණු අඹ සහ ලේ රතු අරලිය මල් සුවඳ අතහැර එන නව ජීවිතයක් දෙස මනසින් බැලිය යුතු විය. අප ඒ සියල්ල අතහැර පැමිණියේ අවි අතට ගත්, අප වෙනුවෙන් සටන් කරන නොමේරූ තරුණ පිරිසක් අතට බලය දෙමිනි. සූදුරු සුවඳ ගෙනෙන, ඇඹුල් රසය ගෙනෙන ඉඩ්ලි සහ සමන්පිච්ච හඳුන්කුරු සුගන්ධය A9 සේද පටියෙහි නොපෙනී ගියේය.

කොළඹට අපගේ අස්ථීර පා තැබූ විට, උකටලී බවක් හා ශෝකයක්

අප හදවත් පහුරු ගාන්නට විය. යුද්ධය, උත්සන්න වන විට, රජය පහර දීම සඳහා කුලියට ගත් අය හැමවිටම අපගේ කොළඹ ඇනෙක්සියට කරදර කළහ, අප්පාගේ ලියවිලි ඉරා දැමූහ, අම්මාගේ අල්මාරිය අවුස්සා දැමූහ.

අපගේ නගරයේ මරණයන් පිළිබඳව දැනගත් විට, අප නිවස නිරන්තරයෙන් අම්මාගේ හැඬුමෙන් පිරී ගියේය. අප නගරයෙහි සිටි අය සමග දුරකතනයෙන් කතා කරන විට මගේ සොහොයුරිය ගැන අම්මා ප්‍රශ්න මුමුණන විට අප්පා ඇයට රවා බැලුවේය.

'එයා මගේ දරුවා' රිසිවරයේ යාන්ත්‍රික කනට කොට අම්මා සුසුමක් හෙළයි. 'කවුරුත් එයාව දැක්කා ද කියාලා නාහා ඉන්නෙ කොහොමද මං?'

'එයාව හොයන්න ඕන නෑ අනික එයා තවදුරටත් අපේ දරුවා නොවෙයි' විශේෂයෙන් කෙනෙකුට නොකීවද, අප්පා හඬනගා එසේ කියයි.

ඔවුන් දෙදෙනා අතර නිර්මාණය වූ දැවෙන පරතරය අතරෙහි, අප්පාට සහ අම්මාට මා අමතකව ගොස් ඇති බව පෙනිණි. මම අපගේ නිවස පසුකොට, රළ රැලි අතරෙහි සෙල්ලම් කරන්නට සහ කඩතොලු වූ කඳුවල නඟින්නට රේල් පීලි උඩින් ඉබාගාතේ වෙරළ දෙසට ලිස්සා යමි. කොළඹ ඒ කුඩා ඇනෙක්සියෙහි, අම්මා දුර්වල වන්නටත්, අප්පාට සෙම්ප්‍රතිශ්‍යාව හැදෙන්නටත් වූයෙන් මා නොමැති බව ඔවුන්ට නිච්චියක් වූයේ නැත. අම්මා කඳුළු පිරි දෙනෙතින් ඇගේ දෙවියන්ට යාඥා කරන අතර තුර, අප්පා අතිශය උද්යෝගිමත්ව පවුල් ගසෙහි අතුරිකිලිවලට ලියුම් ලීවේය, එමෙන්ම අකාරුණික තානාපති නිලධාරීන් අපට රන් ප්‍රවේශ පත්‍රයක්, එනම් වීසා ලබා දෙනු ඇතැයි සිතමින් ලිපි ලියුවේය.

'අපේ මිනිසුන්ට මේ රටේ තැනක් නෑ' යි අප්පා මට ලිපි ලිවීමට කියවමින්, කෝපයෙන් සක්මන් කරමින් කියයි. 'ඔවුන්ට ඕනෑ අපි හැමෝම මරන්න'

ඒ බැගෑපත් ඉල්ලීම් වල මතකය මගේ ඇඟිලි තුඩුවල බොහෝ කාලයක් රැඳී තිබිණි. 'මම මගේ බිරිඳගේ සහ දරුවාගේ ජීවිත ගැන බියවෙමි. දේශපාලනයට සහ ගිජුකමට බැඳ විලංගු දැමූ හාමතින් සිටින තිරිසනුන්ගේ කුඩුවලට මිනිස් මාංශ වීසි කරමින් අපි ජීවත් වෙමු. කොටියන්

සහ සිංහලයින්, ඔවුහු ලේ පිපාසිතව සිටිති, වැඩිකලක් යන්නට පෙර අප මරා දමනු ඇත. කරුණාකර අපට උපකාර කරන්න'

නොවැළැක්විය හැකි කැපකිරීමක් තරූ කළ බව අප දැනගන්නා විට අප කොළඹ වසර දෙකක් ගත කර සිටියෙමු. 'කාර්යභාරය' අපට පොරොන්දු වූ දෙය එළිපත්තෙහි තිබියදී නගරයෙහි ඇගේ තැලී පොඩි වී තිබූ ශරීරය දෙස අවසාන වරට බලන්නට යාමට අපට අවසර ලැබුණෙන් අපි ඈත උතුරට ගමන් කළෙමු. අප නිදහසේ සිටිය යුතු උපන් දේශයෙහි එකට ඇඹරූ උල් කටු සහිත කම්බිවලින් සීමා මායිම් පනවා තිබිණි. ගන, අඹ කහ පැහැති කබොලු ඇගේ හදවතක පෙනුම ගත් තැලීගිය මුහුණෙහි මෝදුවෙමින් තිබුණේය. ඇගේ බාහු, කඩාගෙන මතු වූ උණ්ඩ කැබලි ඇය කිසිදිනෙක නොපළඳින මංගල ආභරණ වන රූබි සහ සපායර් ලෙසින් දිදුලමින් තිබිණි. ඇගේ දිගු ඇසිපිය සහිත කොට්ටම්බා පැහැති දෙනෙත්වල ජීවය නොතිබිණි, 'කර්යභාරයේ' ගිනිදැල් අවසානයේදී නිවී ගියේය. අප්පා වැළපෙනු මා දුටු එකම අවස්ථාව එය විය. ඔහුගේ කඩමලුව ගිය පෙනුමද අතිශයින් සිත්රිදවන ඉවසීමද, තුවාල ලද සතෙකුගේ අතිශය බියකරු දොම්නස් සහගත වාතාවරණයක් පෙන්නුම් කළේය. හදවතින් සහ හිතින් වහා නිත්‍ය දුක්ඛිතකමකට කඩාවැටුණු අම්මා භයානක නිශ්ශබ්දතාවයකට අවතීර්ණ වූවාය. එසේ නැතහොත් අප්පා අපගේ නිවෙස හිමිකාරියගේ විමසුම්වලට සැනසිලි වදන් ලෙස කී පරිදි ඇගේ 'අසනීපය' ට ඇය අවතීර්ණ වූවාය. එය මළගමක් නොවිය, කටකතා නැගුණු ප්‍රශ්නවලට පිළිතුරු නොවීය. තරූ අප වෙත ගෙන ආවේ යැයි ඔහු විශ්වාස කළ අවනම්බුව ගැන නුරුස්සනා බවකින් යුතුව සිටි ඔහු පවුලේ අය සහ පැරණි මිතුරන් ඇසූ ප්‍රශ්න පිටුපා හැරියේය.

කඩිමුඩියේ කරනු ලැබූ තරූගේ ආදාහනයෙන් පසුව ආපසු පැමිණි පසු, අම්මාගේ පූජනීය වූ, බොහෝ අත් ඇති, බොහෝ හිස් ඇති, දේව මණ්ඩලය සොරාගෙන, ඒවා කෑලි වලට කඩා, ගෙවත්තෙහි පහළ විනාශ කර දමා තිබෙනු අපි දුටුවෙමු. බලාපොරොත්තු කැඩී බිඳී ගොස් අම්මා විලාප දෙන්නට වූවාය. අප්පා ඇයට කීවේ ඒ දෙවියන් මියගොස් බොහෝ කලක් ගත වී ඇති බවයි.

'කවුද අපිව ආරක්ෂා කරන්නේ?' යි අසමින් ඇය ඉකිබිඳින්නට වූවාය, ඇගේ දේව ප්‍රතිමාවන් පාමුල කොන්ක්‍රීට් පොළොවෙහි හිස ගසා

ගැනීමෙන් ඇගේ නළල සීරී තුවාල වී තිබිණි, ඇගේ නොපීරූ දිග කළු කෙස්වැටිය ලැජ්ජා ගෙන දෙන ආකාරයෙන් අවුල් වී තිබිණි.

'ඔයාගෙ දෙවියො අපි ගැන බලන්නෙ නෑ. අපි දැනටමත් සාපලත් මිනිස්සු' අප්පා ගෙරවූයේය.

අප්පාගේ සහ අම්මාගේ සිහින මා තුළ බහා, පිටකොටුවේ පදික වේදිකාවේ ගමන් මළු සහ ප්‍රමාණයෙන් ලොකු සීත ඇඳුම් සහිතව, ඉන් දෙසතියකට පසුව ඔවුහු මා එංගලන්තයට යැවූහ. සමුගැනීම සඳහා අම්මාගේ දෑසේ කඳුළු ඉතිරිව තිබුණේ නැත. තරුගේ අවතාරය ඇගේ මළානික බැල්මෙහි දැල්වෙමින් තිබිණි.

Good Luck හි මා වැඩ කිරීම ආරම්භ කළායින් තුන්මසකට පසුව, කෙටි දුරකතන ඇමතුමකින් මම අම්මාගේ මරණය ගැන දැන ගත්තෙමි. 'අම්මා මැරුණෙ අසනීපයෙන්. ඔයා කොළඹ එන්න කරදර වෙන්න ඕන නෑ. අපි කටයුතු ඉක්මනට ඉවර කළා' ප්‍රතිචාරයක් බලාපොරොත්තු නොවී අප්පා ශාන්ත ලෙසින් කීවේය. ශෝකය වහා මගේ හදවත දැදුරු කළ නමුත්, අම්මා අපට අහිමි වූයේ තරු අතුරුදහන් වූ රාත්‍රියේ බව අපි දැන සිටියෙමු. ශෝක කාලයේ දහවැනි දිනයේදී, චාරිත්‍රානුකූලව මම මගේ හිස මුඩු කළෙමි. ජුඩ්රාජ් ඔහුගේ දෙවියන් සහ ශාන්තුවරයින් මග හැර සිටියද, මා තුළ වූ භක්තිය නිසා නොව, අම්මා බලාපොරොත්තු වන්නට ඇතැයි සිතූ නිසා ටූටින් අම්මාන් කෝවිලට ගොස් තෙල් පහන් දල්වන්නට මා සමග පැමිණියේය.

සති කිහිපයකට පසුව, දින කිහිපයකින් තමා ලන්ඩනයට පැමිණෙන බව අප්පා දුරකතනයෙන් අමතා මට කීවේය, ඔහු රැකියාවක් සොයා ගන්නා තුරු ඥාති සහෝදරයෙක් සමග නවතින බවද කීවේය. මෙයින් මට මදිපුංචිකකමක් නොදැනුණෙන්, අප අමුත්තන් බවට පත්වෙමින් සිටින බව මට ක්‍රමයෙන් අවබෝධ විය. හීත්‍රෝ ගුවන් තොටුපලේදී අසන නීරස නිර්දේශිත ප්‍රශ්න කිරීම් වලට අප්පා ඔහුගේ පුරුදු පුහුණු කළ පිළිතුරු දුන්නේ කෙසේදැයි මට සිතාගත හැකිය. තමාට දේශපාලන රැකවරණය ලබාගැනීමේ ඔහුගේ උත්සාහය අවසානයේදී යථාර්ථයක් බවට පත්වූ අතර, ඔහුගේ විදේශ ගමන් බලපත්‍රයට ඉක්මන් අවසන් මුද්‍රාව තැබිණි. අමුත්තන් සිව්දෙනෙකු සමග මා සිටින පහළ මාලයේ අඳුරු කාමරයේ නවතින්නට හැකිදැයි ඔහු නොඇසීම ගැන මම කෘතඥ වූයෙමි.

'මෙහෙදි මට අහන්න ලැබෙන දේවල් අතරෙ, මං කැමති නැහැ මේ ලන්ඩන් ද්‍රවිඩ දේශපාලනයට, ඒ ගොල්ලො පෙන්නන්න හදන්නෙ ඒ ගොල්ලො යුද්දෙත් එක්ක ජීවත් වුණා වගේ'

තමාට 'ජැෆ්නා ග්‍රොසරි ස්ටෝර්ස්හි' මුදල් අයකැමිවරයෙක් ලෙස රැකියාවක් ලැබුණු බව කියන්නට දුරකතනයෙන් ඇමතූ විටක අප්පා මට කීවේය, ඔහුගේ ඉතා ස්වල්ප වූ බඩු භාණ්ඩ සහ අම්මාගේ අළුද, කාඩ්බෝඩ් පෙට්ටියක දමූ වරලත් ගණකාධිකාරී සහතිකද ගෙනැවිත් තිබිණි. ඒ වන විට ඔහු ලන්ඩනයට පැමිණ මාස කිහිපයක් වූ අතර, ඔහුගේ රැකියාවක් සෙවීම සහ වාසස්ථානය පිළිබඳ අසන්නට මට වුවමනාව තිබුණ නමුදු මට ඔහු ඇමතීමට අවස්ථාවක් උදා නොවීය.

'මේ මෝඩයො මොනවද දන්නෙ?' ඔහු හෙලා දකිමින් කතා කළේය. මැරිච්ච ඥාතීන්ට රූකඩවලට වගේ මුක්කු ගහමින් ඒ ගොල්ලන්ට වීරවරු කියනවා ! ඒක මහ ලැජ්ජා නැති විකාරයක්'

'තරු වීරවරියක්' ජූඩ්රාජ්ගේ උද්යෝගය ගිරවකු සේ මම අප්පා ඉදිරියේ කියා සිටියෙමි. 'එයා මැරුණේ මාතෘ භූමියේ නාමයෙන්'

ඒ සන්ධ්‍යාකාලයන්හි ජූඩ්රාජ් සහ මම අපගේ ජනතාවගේ ඉරණම වෙනුවෙන් වැළපුණෙමු. මගේ අභිමිවීම, බලවත් කෝපයකට පෙරලෙන බව මම විශ්වාස කරන්නට පටන් ගත්තෙමි.

'ඔයාගෙ සහෝදරීට හොඳට වචන හසුරවන්න පුළුවන්. එයා ව්‍යාපාරය එයාගෙ දෙවුරට ගත්තා. සැබෑ විප්ලවවාදී දේශාභිමානියෙක්.' ජූඩ්රාජ් ඇය වර්ණනා කළේය. 'එයා මෙහෙ ඉන්න අය වගේ බැටළුවෙක් නෙවෙයි' Good Luck හි සිටින අපේ අය ගැන සඳහන් කරමින් ඔහු සරදම් කළේය. 'තරු සහෝදරිය වරදක් කිරීමෙන් කෝප වූ දෙවඟනක් තරමට ප්‍රචණ්ඩයි'

මගේ සහෝදරියගේ දේවාත්වරෝපණයේ 'කාර්යභාරය' ට මම බෞතීස්ම ලැබීමි.

'ඇය ඊළාමය වෙනුවෙන් සටන් කළා. ඇය අපි වෙනුවෙන් සටන් කළා' ජූඩ්රාජ්ගේ අගනා මෝහනීය ජාත්‍යාලයේ ප්‍රතිඥාවන්හි නිර්භීතකම

මම දුටුවෙමි. 'ඔයා බයගුල්ලෙක්. තමන් ගැනම හිතන බයගුල්ලෙක්' මම අප්පාගේ කර්කශ බව ගැන අවවාද කළෙමි. අපගේ දුරස්ථ වීම දැන් මේ වන විට දෙපාර්ශවයේම අවලාදයක් බවට පත්ව තිබුණේය.

'මහ ලොකු හීන දකින උඹලා වගේ මිනිස්සු හින්දා තමයි අපේ දෙමළ මිනිස්සුන්ව මරලා දාන්න ඉඩ සලස්සලා තියෙන්නෙ' අප්පා කෑ ගැහුවේය.

මගේ චෝදනා කිරීමෙන් පසුව මද කලක් අප්පා සහ මම කතා නොකළෙමු. මාස ගණනාවක් ගෙවී යද්දී, අපගේ දැවෙන, ලේ ගලන මාතෘ භූමිය ගැන පුවත් ගෙනෙමින් අප අතර උද්යෝගයක් ඇති විය. ජූඩ්රාජ් මූලිකත්වය ගත් අතර, අපට පිහිට වන නගරයට අපගේ 'කාර්යභාරය' සම්බන්ධයෙන් අවධානය ඇති කිරීමට ඒත්තු ගැන්වීමේ කාර්යයක නියැලුණෙමු. මරණයේ හඬ ලන්ඩන් නුවර විදී වලට ද ඇසෙන්නට පටන් ගත්තේය.

අප රටෙන් පැමිණි තොරතුරු අපගේ කන්වලට දැනුණේ වසවිසක් මෙනි. අපගේ රටින් පැමිණෙන බිහිසුණු පුවත් තවදුරටත් දරාගැනීම මට අපහසු විය. යුද්ධය අවසාන බව කියැවෙන පුවත ඇසූ විට, අපගේ නායකයාගේ බලය සුන්කොට මරාදැමූ බව ඇසූ විට, මට මොහොතකට හෝ සහනයක් ලැබුණු බව සඟවා ගැනීම අපහසු විය.

'සුරංගනා කතා' ජූඩ්රාජ් Good Luck හි තෝන්තු වූ ප්‍රේක්ෂකයන් දෙස බලා කෑගැහුවේය. 'අපි එතැනට ඉතාම ළංව හිටියා, ඔවුන්  ඔවුන් උත්සාහ කරන්නේ අපගේ චිත්ත ධෛර්යය විනාශ කිරීමටයි. සුරංග නා කතා!' ජූඩ්රාජ් ගොතගසසු මා දුටුවේ ප්‍රථම වතාවටය, අප ඉදිරියේ පෙනුණු බිහිසුණු රූපවාහිනී වාර්තාවලින්, ඔහුගේ ප්‍රවේගකාරී දේශප්‍රේමය වික්ෂිප්තභාවයට පැමිණවීය. 'නායකයා ජීවත් වෙනවා! ඔහු මට කතා කළා.' ඔහු නැවත ඔහුගේ තැන්පත් කම ලබාගත්තේය, එහෙත් ඔහුගේ කකුලෙහි වෙව්ලිල්ල බොරු කීවේ නැත.

ලන්ඩනයේ යටිතලයෙහි ගුලිගැසී තිබුණු කෝපාවිෂ්ට මිනිස් හැසිරීම් 'ක්‍රියාමාර්ගය' තවමත් හුස්ම ගන්නා බව අපට කියා පෑවේය. නොගැලපෙන නොයෙකුත් කතා රහසේ පැතිර ගියේය, ශ්‍රව්‍ය දෘෂ්‍ය කැට කැබලිති ඉතා ප්‍රබල ලෙස බොරු කතා මවන්නට වූයේය.

'ජන සංහාරය!' වචනය පැන නැගුණේ දුර්මුඛව වූ මිමිණුම, ගුගුරන වාග්ලංකාරයක් බවට පත්කරමිනි. එසේ වූයේ ජුඩ්රාජ්, ගොරවන කොටින් සහිත රතු ධජ යටතේ මිනිසුන් සහ ගැහැණුන් පෙළ ගැස්වූ කල්හිය. 'නීත්‍යානුකූලව අපගේ වන්නා වූ භූමියට බාධා කරමින් සහ භූමියට ඇති අපගේ අයිතිය මකා දමමින්, දරුණු ගෑස් වර්ග යොදාගනිමින් සහ බෝම්බ ගසමින්, අපගේ ජනතාව සිය දහස් ගණනින් මරා දමා ඇත' ඔහු ජනහමුවීම්වලදී එසේ කෑගැවේය.

'සුරංගනා කතා! අපි අපේම මිනිසුන්ට ද්‍රෝහී වී අපගේම මිනිසුන් මරා දැමුවා' පිළිතුරු වශයෙන් අප්පා ගුගුරන ආකාරය මම මනසින් මවා ගතිමි.

අපගේ පරාජයෙන් පසු ගත වූ දිනවල, කිහිපවරක්ම අප්පාට දුරකතනයෙන් කතා කිරීමට මට සිතිනි, එහෙත් මා ප්‍රමාද වී වටහා ගැනීම පිළිබඳව ඔහුට තෘප්තියක් ලබාදීම මට අවශ්‍ය නොවීය.

යුද්ධය අවසන් වී මාස ගණනක් ගෙවී ගිය පසුව, එක් පස්වරුවක, මගේ ගමේදී කරුපයියා බාලේන්ද්‍රන් යැයි හැඳින්වූ තැනැත්තා, මට දුරකතන ඇමතුමක් ඇති බව හඬ නඟා කීවේය.

'හලෝ?' යැයි මා කීවේ අනෙක් පසින් කුමක් ඇසේදැයි බියෙනි.

'මහන්? අමිතේෂ්? සැතපුම් දොළහක් පමණක් ඈතින් පිහිටි හොවුන්ස්ලෝ නිදන කාමරයක ජීවත්වන අප්පා වෙත තවමත් රීසීවරයට කෑ ගසන පුරුද්ද තිබේ. දූපතේ පුරුදු ඔහු අතහැර නොයන අතර, ඔහු එය ගණනකට ගන්නේද නැත.

'ඔව් අප්පා. මං අමිතේෂ්. ඔයා හොඳින්ද?' මගේ ලොන්ග්මාන් ඉංග්‍රීසි ව්‍යාකරණය, ගොරහැඩි ලන්ඩන් භාෂා ඇදකුද වලින් විනාශ වීම ආරම්භ වී තිබේ.

අපිට ආපහු යන්න පුළුවන් ! මට ඇහුණා අපිට ආපහු යන්න පුළුවන් කියලා !' ඔහුගේ හඬෙහි සතුටක් මට කලකින් ඇසුණේ නැත, මම ව්‍යාකූල වීමි.

'කොහාටද ආපහු යන්නෙ අප්පා' මම සැකයෙන් ඇසුවෙමි.

'ආපහු අපේ ගෙදර යන්න මහන්. අම්මා හැම තිස්සෙම හීන දැක්කා වගේ අපිට පුළුවන් ආපසු අම්මව ගෙදර අරන් යන්න'

වියළි තල්කොළ අතරින් පැමිණි නිහඬතාව සහ සිනාව කලක් අපගේ භූමිය දැන සිටි කාලයක් තිබිණි, බයිසිකලයේ සීනු හඬ දැන සිටි කාලයක් තිබිණි. අප නිදාගත් වෙලාවට, අවදි වූ වෙලාවට හා සෙල්ලම් කරන වෙලාවට රැළි නැගෙන, බසින හඬ ඇසිණි. අවුරුදු ගණනාවකට පසුව, රාසා හිදී සුල්තානා දමූ උණු සව් කැඳ සුවඳ මට දැනිණි. ඒ සුවඳ, අපට අහිමි වූ දේවල මතකය යළි හෙමින් මතු කළේය. අපට අහිමි වූ අය පිළිබඳ මතකය මතු කළේය. අවතාර මගේ ගෙකොනෙහි මා සමග එක්වූයේය. අප එක්ව, අපගේ සිත්හි මහත් ආදරයෙන් තබාගෙන සිටින උෂ්ණ කලාප, ලන්ඩනයේ අඳුරු වළාකුළු වෙනුවට සිහියට ගතිමු. එය නිල් හුණු බිත්ති පමණක් නොවේ, සරුසාර අඹගස් හෝ නිල් මුහුද පමණක් නොවේ, එහෙත් එය සංකල්පීය සිරගෙයක වසන්නවුන් සටන් කළ සිහිනයයි. අපට 'සියරට' යන්න නොසැලකිලිමත් ලෙස අතහැර දැමිය හැකි නොවේ.

ඔහුගේ මුතුන් මිත්තන් සෑදූ බිත්තිවල පැය ගණනක් සිය ශෝකය පිරි අත්ල තාබගෙන සිටීමෙන් පසුව අප්පා මා සමග එක්වූයේය. 'ඔයාගේ අම්මා, ඈ මියගියේ ශෝකයෙන්' අප්පා අවසානයේදී කීවේය. 'ඈ වටා තිබුණු මහා ශෝකය ඇගේ හදවතයි හිතයි විනාශ කරල දැම්මා'

ඔහු අළු මංජුසාව රැගෙන ඇගේ අළු තම කුස ඉදිරියේ තබා ගත්තේය.

ඔහුට තව බොහෝ දේ අනාවරණය කරන්නට ඉඩදී මම බලා සිටියෙමි, එහෙත් ඔහු සාකච්ඡාව අවසන් කළේ කාරුණික අසල්වැසියන්ට කියූ සායනික කරුණු නැවත කීමෙනි. 'මියගියේ ශෝකයෙන් දන්නවද?' ඇය මුහුදෙහි ඈතට ගැඹුරට ඇවිද ගිය බවත්, තවදුරටත් ඇයට හුස්ම ගැනීමට නොහැකි වන තුරු, පෙණහළුවලට වතුර පිරෙන තුරු හුස්ම ගත් බවත් ඔහු මට කිසිවිටෙක අනාවරණය කළේ නැත. ඔවුන් ඇය සොයාගෙන ඇත්තේ දින බොහෝ ගණනාවකට පසුවය, මා මේ කරුණු එක්කොට ගත්තේ මා කෙරෙහි අනුකම්පාවෙන් කතා කළ අයගෙනි, ඉදිමී නිල් වී තිබුණු සහ මුහුදු පැලෑටි පටලැවී තිබුණු, කැබලිවලට ඉරී වැරහැලිව

ගිය කහ පැහැති කංචිපුරම් සාරියෙන් සැරසුණ ඇගේ දේහය කිඳුරියකගේ සිරුර මෙන් ධීවරයෙකුගේ දැලට පැටලී තිබුණේය, මා සෙල්ලම් කිරීමට පුරුදුව සිටි ගල්තලාවල ඇගේ සිරුර හැපී තිබිණි. ලන්ඩනයට පැමිණීමට පෙර දින ගණනාවක්, අම්මා ඇඳ යට තබාගත් සාරි බණ්ඩල තමා වටා තබා ගනිමින්, ඇගේ සහ තරුගේ නැවත පැමිණීම ආයාචනා කරමින් තමා හඬා වැටුණු බව අප්පා මට අනාවරණය කළේ නැත.

හරිත වර්ණ සාගරය සඳ කැන් වැටුණු රිදී පැහැය ගන්නා අතර, ඉතා කළු තරු ලප සහිත අන්ධකාරය රතු කැට සහ ලා නිල් පැහැති දිය සායම් ආකාශයේ කැලැල් ඇති කරන්නට පටන් ගත්තේය. කුණු තැවරුණු කැටමරන්, නැගෙන බහින ජල කඳෙහි වෙව්ලන්නට වූයේය, ගන වූ ලුණු තට්ටු දිය වූ ඔරුකඳෙහි, පතුරු ගැලවී ගොස් රැළි වී තිබිණි. කලෙක නලියන මසුන් සහ රැවුල් ගස් ඇති ඉස්සන් පිරී සිටි ලී බෝට්ටු බඳෙහි, දැන් ඇත්තේ යාත්‍රා බෙල්ලන් සහ කාවාටියන්ය.

අප සියලු දෙනා අප්පා සේවය අවසන් කොට ගෙදර පැමිණෙන තුරු බලා සිටියදී, තරු සහ මම මේ බෝට්ටුවල සෙල්ලම් කළෙමු. අම්මා අප දෙස බලා සිටියාය. කුඩා පා පද්දමින්, පුවත්පත් කඩදාසි තොප්පි ඇලයට දමාගෙන, දැස් දැතින් වසාගෙන, අප ගියේ එකැස්, බොරු කකුල් දැමූ මුහුදු කොල්ලකරුවන් මෙනි. දම් පැහැති තල් ගෙඩියෙහි මිශ්‍ර රසැති මෘදු මස, ළමයින් පමණක් දන්නා, හේතුවක් නැතිව මහ හඬ නගන සිනාවෙන් යුතුව අපි අපේ මුවට දමා ගතිමු. වැල්ලෙහි අප කරණම් ගසන විට හෝ ගුල්වලට යන කකුළුවන් පසුපස හඹා යන විට අපි සිනාසුණෙමු.

ඒ 'කාර්යභාරය' අපට පොරොන්දු වූයේ, අපගේ ප්‍රීතිමත් රහස, අපගේ අර්ධද්වීපයේ ගීතය ගැයෙන අපගේම වූ දේශයයි. නිවස්නයයි. එහෙත් එය සිදුනොවන බව මම දැන් දනිමි. අපිට පොරොන්දු වෙච්ච දේ එයයි, එහෙත් අර්ධද්වීපයේ අපේ ප්‍රීතිමත් රහස, ඒත් දැන් ඒක වෙන්නෙ නෑ කියලා දන්නවා.

බොහෝ කාලයක් අතහැර දමන ලද නිවස්නයන්හි සැකිලි තුළ විටින් විට දැල්වෙන පෙට්‍රොල් මැක්ස් ලාම්පුවල ඇන හිටින ආලෝකය තුළ රාත්‍රියේදී හිරු එළියෙන් පිළිස්සුණු වෙරළබඩ නගරයෙහි නෂ්ටාවශේෂ දෙස බලමින් සිටින්නට අප්පා හා මම අඳුරෙහි තව මොහොතක් අපට

ඉඩ ලබා දුනිමු. භූමිතෙල් අපගේ ලාම්පුව තුළට ජීවය පිඹියි. ලාම්පු දැල්ල කහපැහැයෙන් හා නිල්පැහැයෙන් රත් වූ වීදුරුවෙහි වැදෙයි. විදුලිබලය යනු, ආපසු පැමිණි අතලොස්සක් බලාපොරොත්තු නොවිය යුතු දෙයක් ලෙස දන්නා කඩවුණු පොරොන්දුවකි.

සුළඟින් හා ජලයෙන් කැල්සියම් දුහුවිල්ලට ගෙන ආ ප්‍රාග් ඓතිහාසික බහුපාදීන්ට දූන් උණ්ඩ කැබලි වැදී බිඳී ගිය මිනිස් ඇට කැබලිති නිසා අවහිර සිදුවී ඇත. මගේ පා ඇඟිලි වලින් වැල්ල හාරා කහ පැහැති කකුළුවන් මගේ පතුලෙහි දවටෙනු හඟින්නට හෝ බෙල්ලන් මගේ ඇඟිලි කොනහනු හඟින්නට මට දැන් නොහැකිය. උණුසුම් අර්ධද්වීපය වැල්ලෙහි වැළලූ, ශබ්ද නොනඟන බිම්බෝම්බ තල් අරඹ අවහිර කර ඇත.

එහෙත් අපි අවසාන වශයෙන් ගෙදර පැමිණ සිටිමු. අප්පා සහ මම අප කලෙක දන හඳුනාගෙන සිටි මිනිසුන්ගේ අවතාර සමග එක්ව වැළපුණෙමු. හැම දෙනාම ආපසු පැමිණ සිටින අය බලන්නට පෙට්‍රොල් මැක්ස් ලාම්පු දල්වූ නිවෙස් කරා යන්නට අතුරුදහන් වූහ. ජලයට බහින්නට පෙර අප්පා සිය කළු රබර් සෙරෙප්පු ගැලවූයේය. මම ඔහු අනුගමනය කළෙමි. මාතෘ භූමිය මගේ දෙකන් තුළ දෝංකාර දුන්නේ මේ නිවසේ මළකුණක් පරිද්දෙනි. ඉතා ප්‍රබල කනගාටුවක් පිටුවහල්ව සිටි කාලය තුළ මා වගා කරගත් කෝපය සෝදා හැරියෙන් මම මට හඬන්නට ඉඩ හළෙමි. ජූඩ්රාජ්ගේ දිරිගන්වන සුළු අනුශාසන, අප පාවා දුන් දේ සහ අප කැප කළ සියලු දෙනා සම්බන්ධයෙන් බලන කළ අර්ථ විරහිත බව පෙනෙයි. මම ඉතා පරිස්සමින් මගේ පා ඇඟිලි හිරු රශ්මියෙන් උණුසුම් වූ වතුරෙහි ගිල්වන කල්හි මගේ උගුරට ශෝකයේ මේ ප්‍රබල වේදනාව දැනෙයි.

අප්පා සහ මම එක්ව එක් කලෙක අපගේ නිවස්න තිබූ ප්‍රදේශයෙහි, නිශ්චල නිල් ජලකඳට අම්මාගේ අළු මුදා හැරියෙමු.

***වින්ධ්‍යා බුත්පිටිය,*** *ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සමාජයීය සමෝධානය ඉලක්ක කොටගෙන ප්‍රතිපත්ති වර්ධනයෙහි ලා වැඩකරන සමාජ මානව විද්‍යාඥවරියකි.*

# කාව්‍යය

## *ෂර්මදා සන්තිරසේගරම්*

### මනම්පේරි සමග

අඳුරු රැයේ
1971 අප්‍රේල් 4 වැනිදා,
ඇය,
ෆ්ලෝරන්ස් නයිටින්ගේල් වගේ
ඉක්මනින් එයි හතේ වාට්ටුවට
පොලිස් පරීක්ෂක වැතිර සිටිනා තැනට
පහර ලැබ
සැහැසි පිරිසකගේ
අද්භූත සහ ඔළමොළ
හිංසාවට පෙළඹී
කතරගම රූප රාජිනිය
දූෂණය කර මාරාදැමූ
ඒ ඉච්ඡා භංගය
පෙරළී
නැගී සිටීමකට
කැළඹීමකට

ආරාවුලෙහි දත්
මිනිස් මස ඉරා
තුවක්කු දිවෙන්
මිනිස් ලේ රස විඳියි

ඇය හුස්මක් වගෙයි
හිම වගේ නිර්මලයි
හිරු වගේ දීප්තිමත්
ඇගේ හඬ සේද සේ සිනිඳුයි
ඇය දොර විවර කරන කල
කාමරය නිහඬය

සමන්පිච්ච කුසුමක්
මඩෙහි වැටෙන්නට යනවා සේ
ඇය අඳුරු කාමරයට
ඇතුළු වෙයි

කොනක ඇති ආලෝකයෙන්
දකින්නී ඇය
පොලිස් පරීක්ෂක
වෙඩි වැදී
මියගිය

සව්මත් අත් ඇය වටා එතුණු විට
ඇගේ කෑගැසීමෙන්
නිහඬතාව බිඳී
එකිනෙකා අතින් අත
යනවිට නොනැවතී
ඇගේ
නිර්මල
සුදු
නිල ඇඳුම
රතු පැහැ
ගත්තේය

ඇය කෑගසා ඇසුවා
'යකුනේ, ලැජ්ජා නැතිද තොපට?'
එහෙත් කැරැල්ලට
ඇවැසිය
නැගී සිටීමක්.

## කාවාඩි

තාවිල් හඬ
නාදස්වරෙමෙහි සංගීතය
කාවාඩි උදෙසා නින්නාද වේ

පිරිසක් ගයති
අයෙක් කියති අරෝහරා

ළමෝ බලති ඔහු දෙස
යුද්ධයේ අණ දෙන්නා
කාවාඩියක්
ඔහුගේ උරමත වෙයි

ඔහු වෘෂභ සේ සවිමත්
උඩගු ලෙස පැද්දෙමින් ඇවිද යයි
ඔහුගේ ආඩම්බරය
දවයි
රතු ගිනිදැල්
ඔහු ඩා බිඳු හෙලයි
අපමණ තරමට

අහෝ දෙවියනි !
මම කොඳුරමි
ඔහු කළ සියලු පාපයන්ට
ගැලවීමක් යම් දවසක
ලැබේවා ඔහු හට.

**සමගි සන්ධානය**

නෑඹුල් තිල් මහනෙල් පිපේ සුසානයේ
නව කලාල මාවත් ගෙනයයි අප
නොදන්නා සිතිජයට
අලුතින් සෑදූ අංගනයන්හි
රන්වන් හිරු කිරණ වැටේ

සුදු බිතු මත සිංහයෙකුගෙ මුදු
සිත්තම සුදිලේ
නාගහ පාමුල
වැතිරී සිටිනා සිහ රුව උකුලෙහි
සිටියි අහිංසක බැටලුවෙක්

උඟු අප කුස පුරවයි
ප්‍රතිකාරයෙන් වේදනා නසති
අපට සිනාසෙන්නට, නටන්නට
දුවන්නට, පනින්නට, සැඟවෙන්නට
ගුරුහරු කම් දේ

අපි මෝටර් යාන්ත්‍රික විදුසර
මනාලියන් හැඩකරවන්නට
වෑල්ඩින්ද, මැහුම් ගෙතුම්
මේසන් වැඩ ඉගෙන ගනිමු
අපි ඉවසීම ඉගෙන ගනිමු
අපේ දරුවෝ සාමය වෙනුවෙන්
වැඩ බොහෝ කරනු ඇත.
මිනිස් ඝාතන නම් නොවේ
අපි කියමු එසේ

එවිට අපි බලමු එකිනෙකා දෙස
අපි බලමු අප අප දෙසම
ඔබගේ ලෙජරය ගෙන එන්න
විනිශ්චයේ දිනයේ දී
සැබෑ යුක්තිය ඉටුකරවා ගන්නට

## මරණයේ දිවයින

අපි සාමය සදන්නට හරි බරි ගැහෙමු
ඉරණමට එරෙහිව අපගේ එකම සන්නාහය

සාමයේ යාත්‍රාව වටා අපි ගැවසෙමු
මේ එවන්නේ ගිතෙල්
කවුරු හෝ ගෙනෙයි දර
දමන්න එය සාමයේ යාත්‍රාවට

වැන්දඹුවන්, අනාථයින්, ආබාධිතයින්
තවමත් බලා හිඳී නව නිවෙස් පතා
අතු සෙවිලි කළ වහලය අතරින්

අලුත උපන් දරුවා මතට වැටේ ජල බිඳු
වතුර බිඳු එකතු කරනු පිණිස
දරුවාගේ මව තබයි මැටි වළං
ඇගේ කම්මුල් මත කඳුළු ගලා එයි

සොහොන් බිම්
මිනිස් ඝාතන
අතුරුදන් වීම් සහ දූෂණ

ඉන්දීය සාගරයේ මුතුඇටය
මහපොළොවෙහි පාරාදීසය
මරණයේ දේශය
අම්මාන් දෙවඟන හා ඇගේ සන්නාහය
ඉදිරියේ
අපි ගිනි දල්වමු
ගිනි ජාලය දූල්වෙයි

අපි ගිනිදූල් හදන්නට පුරුදු වෙමු
ඉරණමට එරෙහි අපගේ එකම සන්නාහය

***ශර්මදා සන්තිරසේගරම්*** *උපත ලැබුවේ, හැදුණේ වැඩුණේ යාපනයේය. ඇය යාපනය විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි සාහිත්‍ය පිළිබඳ උපාධි අපේක්ෂිකාවකි. ඇය ඇගේ ළමා කාලයේ සිටම යුද්ධය අත් විඳ ඇත, ඇගේ කාව්‍ය මගින් වරප්‍රසාද නොලත් කොටසක වේදනාව ගොනුකර ගැනීමට ඇයට අවශ්‍යව ඇත.*

# ඉවසා දරාගැනීම

## *අරිවර්සි මුතුලිංගම්*

අපගේ ගමේ කෝවිලට මුරුගා දෙවියන් වැඳ පුදා ගැනීමට මිනිස්සු බුරුතු පිටින් පැමිණියහ. ඔහු ප්‍රාතිහාර්යයේ දෙවිඳුන් වූ අතර හැමදෙනාම ඔහුගේ නම දිනකට සිය වරක් ජප කළහ. අපගේ සියලු බලාපොරොත්තු මිය ගිය පසුව, ඔහු යළිත් ඒවා පණගන්වා තමාගේ අනුගාමිකයන්ගේ ජීවිතවලට නව පණක් ලබා දුන්නේය. ඔහුගේ කරුණාව හැමවිටම අප සමග විය.

දැනට විදේශ රටවල ජීවත් වන මෙහි පෙර ජීවත් වූ ගැමියන් ගේ උපකාරයෙන් කෝවිල විශාල පරිමාණයෙන් ගොඩනැගුවේය. කෝවිලෙහි නව ඉදිකිරීම් සහ ඔපවත් කිරීම් සඳහා ඔවුහු නොකඩවා උපකාර කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස, අපගේ කෝවිලෙහි ගෞරවය ඉහළ නැංවුණේ එහි විශිෂ්ට තත්ත්වය හා නිමවුමේ කලාත්මක බව හේතුකොට ගෙනය. ශිවාගේ ඇත් හිස සහිත පුතුගේ ප්‍රතිරූපය වූ, පිල්ලයාර් රුව, ඔහු බොහෝ දුක් සුවකරන ස්ථානය වූ කෝවිල් ජලාශයේ ඉවුරෙහි පිහිටා තිබිණි. කෝවිලේ සියලුම බිත්තිවල මුරුගන් සහ ඔහුගේ ශක්තීන් දෙකෙහි රූ ඇඳ තිබිණි, ඒ අනුව එහි ගිනිදැල් මැද නර්තනයෙහි යෙදෙන ශිවාගේ රුව සහ අර්ධ ශිවා නිරූපණය කෙරෙන අර්තානරිෂිවර, අර්ධ ශක්ති, ඔහුගේ බිරිඳගේ රුව දක්නට තිබිණි. එමෙන්ම ලන්ඩන් කෝටිපතියෙකුගේ මුදල් ආධාරයෙන් සාදන ලද ග්‍රැනයිට් ලිංගයක් සහ සුවිශාල නටරාජා ප්‍රතිමාවක්ද එහි විය.

දසතින් අනුගාමිකයන් පැමිණෙන මෝටර් රථ උත්සවයේදී අපගේ කෝවිලෙහි උදාර බව වඩාත් හොඳින් පෙනී ගියේය. මගේ ඥාති සොයුරු සංජීවන් සහ මම උත්සවය එළඹෙන තුරු බලා සිටියෙමු, උත්සවයට පෙර දිනවලදී උත්සවයට සූදානම් වීම බලනු සඳහා කෝවිලෙහි පටු මං හරහා එහා මෙහා නොඉවසිල්ලෙන් ඇවිද්දෙමු. සාන්තුවරයින් හැටතුන් දෙනෙක් ස්ථාපනය කිරීමට හා වේදිකාවක් මත ගලින් නෙළූ විශාල නන්දි පිළිමයක් සාදා තබන්නට සංජීවන්ගේ පියා මුදල් දුන්නේය. එය අගය කරන්නට අපි හැමවිටම එහි නතර වූයෙමු.

අපි ඇවිද යන විට උත්සවයට සූදානම් වීමේ කටයුතු ගැන අපගේ අදහස් පළ කළෙමු.

'ඔයා දන්නවද බාලා' සංජීවන් ඇසුවේය. 'මේ අවුරුද්දේ උත්සවේට මුළු දවසම ගත කරන්න මං සැලසුම් කරනවා. මං උදේම එනවා, හවස් වෙනකල් ඉන්නවා. ඔයා මොකද කරන්නෙ? ඔයත් එනවා නේද මාත්තෙක්ක?'

උත්සවය ගැන ඔහුගේ තොරක් නැති කතා අසා මම දැනටමත් වෙහෙසට පත්ව සිටියෙමි. ඔහු අන් කිසිවක් ගැන කතා නොකරයි. එහි කෙරෙන සියලුම වැඩ සුපරීක්ෂාකාරීව බැලීමට අපි එහි නතර වීමු.

'නෑ, නෑ, මට උදේ වරුවල එන්න බෑ' මම සරදම් ලෙස විරිත්තමින් කීවෙමි. 'උදේ වරු තියෙන්නෙ ඔයා වගේ ස්වාමිලට. මං එන්නෙ විනෝදය පටන් ගන්න කොට, හවස් වරුවට විතරයි'

'ඔයා දැනගෙන හිටියද?' පුංචි සිනාවකින් මගේ ඇනුම්පදය නොසලකා හැර ඔහු කීවේය. 'කෝවිල් පූසාරි මට කිව්වා මේ සැරේ බෙරකාරයොයි, සංගීත කාරයොයි ඔක්කොම එන්නෙ ඉන්දියාවෙන් කියලා'

මම නැවත ඔහු කෝප ගන්වන්නට උත්සාහ කළෙමි. 'ඔයා කරාටේ පන්ති යනවා. අනාගතයෙ කරාටෙ ශූරයෙක් වෙන්නත් ඔයාට ඕන. මං හිතන්නෙ නෑ ස්වාමි කෙනෙක් වෙන එක ඔයාගේ වෘත්තියක් එක්ක ඒක ගැලපෙයි කියලා' මම කවටකම් කළත් ඔහු එය ඉවසා දරාගෙන මගේ උරහිස මිරිකුවේය.

ළමා කාලයේ සිටම සංජීවන් මා අතිශය ඇලුම්කරන පුද්ගලයා විය, මන්ද ඔහු ඉතා මෘදු සහ කාරුණික අයෙකු වූ නිසාය. ඔහු මට වඩා වසර දෙකක් වැඩිමහල් වූ අතර, ඔහු කළ හැමදේම අනුකරණය කිරීම මට වුවමනා විය. මා මගේ කොණ්ඩය පීරීම මා විසින්ම කරනු ලැබීම ආරම්භ කළ විට, මම එය දකුණු පැත්තෙන් බෙදුවේ හරියටම ඔහු පීරන ලෙසිනි. සාහිත්‍ය සංගමයේදී, මා කතා කරන විට, මම ඔහු කතා කරන ආකාරය අනුකරණය කරමින් කතා කරන්නට මගේ කටහඬ සකස් කර ගතිමි. ඔහු ක්‍රීඩාව සහ අධ්‍යාපනය යන දෙකෙහිම සමත් වූ අතර, මම ඒවායෙන් දුර්වල වීමි.

අපගේ කෝවිලෙහි අශ්ව කරත්තය කැටයම් කොට තිබුණේ

සුප්‍රසිද්ධ ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්පියෙකි. අශ්ව කරත්තයෙහි අලංකාර සැරසිලි, එහි සෝබමාන ලෙස කැටයම් කළ කුළුණ, සුළඟෙහි ලෙලදෙන රතු ධජය, පිඹුරකුගේ ප්‍රමාණයේ කඹය යනාදි සියල්ල උත්සව කාලයේදී දැකීමෙන් මහත් විනෝදයක් ලැබෙයි. අශ්ව කරත්තය ප්‍රදේශය වටා යන විට, එයට ආබද්ධ කර ඇති ගිනිකෙළිවලින් නැගෙන කර කර හඬ සහ හඳුන්කූරුවලින් විහිදෙන දුම, රැස්ව සිටින්නන් ප්‍රහර්ෂයට පත් කරවයි, රිදී පලකයෙහි අසුන් ගෙන සිටින දෙවියන් දකින්නට මිනිස්සු ඉදිරියට තල්ලු වී යති. හැම දෙවියෙක්ම රතු රෙද්දකින් ඔතා, අප්‍රමාණ ආයිත්තම් වලින් සරසා ඇත.

මෝටර් රථ උත්සවය කාලයේදී සංජීවන් සහ මම වේට්ටි හැඳ, අපගේ නළලෙහි ශුද්ධ වූ අළු ගැවෙමු. ඔහු මට වඩා බොහෝ බැතිමත් අයකු වූයේය. ඔහු නිරාහාරව සිටි අතර, උත්සවයේ මුළු කාලය පුරා අනුභව කළේ එළවළු සහිත ආහාර පමණකි. මුහුණු සයක් සහ උරහිස් දොළහක් ඇති ආරුමුගසාමි, අනුගාමිකයන්ට පෙන්වූ විට, සංජීවන් උද්යෝගිමත් ලෙසින් යාදින්න කියවූ අතර 'හරෝ හරා මහා දේව' යන අත්වැල් ගායනයද කළේය. මුතු මැණික්වලින් සැරසූ විවිධ උත්කර්ෂවත් දේවරූප අනුගාමිකයන් විසින් සංගීත භාණ්ඩයන්හි ප්‍රශස්ත රිද්මයකට අනුව ගෙන යද්දී, සංජීවන් අධික ඝෝෂා නගන බැතිමතුන් සමග එක් වී 'කාර්තිකෙයා... අරෝහරා මුරුගා කාන්තා' යි හඬ නැගුවේය. ඔවුන්ගේ හඬ, ඔහුගේ සුපුරුදු සිනාමුසු මුහුණින් බිම බලන මුරුගා දෙවියන්ගේ රාජධානියටද ඇසෙන්නට ඇත.

කෑගහන ජනකාය අනුගමනය කරමින්, හඬනගන ඔහු අසල සිටින මගේ ආගම භක්තිය මද වීම ගැන ලැජ්ජාවක් මා තුළ ඇති විය. මගේ හැඟීම් වසන් කර ගැනීමට, මම ඔහුට මෙසේ සරදම් කරන්නෙමි. 'ඔයා අනාගතයේදී ලොකු ස්වාමි කෙනෙක් වෙයි වගේ පේන්නෙ'

ඔහු මා නොසලකා හැරි විට මම අවමන් සහගත ස්වරයෙන් මෙසේ කියමි. 'ඇයි ඔයා ඔයතරම් භක්තිවන්ත වෙන්නෙ? ඔයාට මොනවද ඒකෙන් හම්බවෙන්නෙ?'

'දෙවියන් වහන්සේ උදාරයි බාලා' ඔහු පිළිතුරු දෙයි. 'උන්වහන්සේගෙ බලයෙන් උන්වහන්සෙට අපව සතුරන්ගෙන්

බේරගන්න පුළුවන්, අපට විරුද්ධව නැගෙන දුෂ්කරතාවලින් බේරෙන්න ලොකු ශක්තියක් අපිට දෙනවා. දවසක ඔයාට මේ දේවල් තේරෙයි'

අප දෙදෙනා වඩාත්ම එකඟ නොවූ කාරණය උත්සව සමයේ කාවඩි සම්බන්ධයෙන් විය. ඉගිලෙන කාවාඩි සහ කුරුළු කාවාඩි නැටුමෙහි යෙදෙන මිනිසුන්ගේ දිවෙහි හා කම්මුල්වල කුඩා හෙල්ල පසාකර තිබිණි. අනෙක් කාවාඩි වර්ගවලදී අනුගාමිකයන්ගේ පිටෙහි කොකු ගසා තිබුණේය. ඒ කොකු වලට අමුණා තිබුණු කඹ තවත් කෙනෙකු අනුගාමිකයා ඇදගෙන ගියේය.

මේ නිග්‍රහය, ආගමක ඇති කෲර බව ගැන සිතන්නට මා පෙළඹවීය. 'මචං' මම මගේ ඥාති සොහොයුරාට කතා කළෙමි. 'ඇයි මේ මිනිස්සු තමන්ටම වද හිංසා කරගන්නෙ? මේ වේදනා විඳීමෙන් දිනාග න්නෙ මොනවාද?'

'ම්ම්ම්' ඔහු සුපිරි සුසුමක් සමග කියනු ඇත. 'ඔයාට තේරෙන්නෙ නෑ. මේ කාවඩි නටන අනුගාමිකයන්ට ඔයාටයි මටයි නැති බලයක්, අධිෂ්ඨානයක් සහ කැපවීමක් තියෙනවා'

'දෙවියන් සතුටු කරවන්න අපි අපිටම වේදනා කර ගන්නවා නම්, ඒක කෲර දෙයක් නෙවෙයිද?' එයට සතුටුදායක පිළිතුරක් සෙවීමට අරගලයක යෙදෙන සංජීවන් දුක මම සතුටක් වින්දෙමි.

'දවසක ඔයා දෙවියන් වහන්සේ ගැන හැමදේම තේරුම් ගනියි.' ඔහු අවසානයේදී කීවේය. කාවඩි සංකේතවත් කරන්නෙ අපගේ ජීවිතවලට අවශ්‍ය දරාගැනීමේ ශක්තියයි. මේ දරාගැනීමේ ශක්තිය එන්නේ විශ්වාසය තුළිනුයි. ඒක අපේ හිත අත්විඳින විශ්වාසයක්'

පසුව අපි අතිනත අල්ලාගෙන උත්සව භූමිය හරහා ඇවිද ගියේ සාරි සාප්පු සහ සීඩී සාප්පු වෙළෙඳ දැන්වීම් අඩංගු විශාල වර්ණවත් බැලූනයන් දෙස අත දිගු කරමින් හා මවිතය පාමිනි. කොලට්ටම් ලී නැට්ටුවන්ගේ දිළිසෙන සාය මෙන් ඒවා ලෙල දුන්නේය. එහි විවිධ සාප්පු, අවන්හල් සහ විජ්ජා දර්ශන තිබිණි. ඔවුන්ගේ වටිනා සාරි ඇඳ, ආභරණ සහ සිත්ගන්නා සුළු හිසකේ විලාසිතාවලින් සිය රූපශ්‍රීය වර්ධනය කොටගෙන ඇවිද යන කාන්තාවන් දෙස බලමින් අපිදු නිහඬව ඒවා අගය කළෙමු. කඩල

කරත්තවලින් දුම් දමූ අතර උණුසුම් වැලිවල බැදගත් කඩල ටිකක් මිල දී ගැනීම සඳහා අපි නතර වූයෙමු, සෙනඟ අතරෙහි ඇවිද යාමෙන් මම සතුටට පත්වූ අතර, සංජීවන් හැමවිටම මා යොමු කළේ මිථ්‍යාවන් සහ වීර කාව්‍යන්හි නාට්‍යමය ප්‍රඥප්තීන් තිබුණු ස්ථානය කරා යාමටය.

අවසාන උත්සවයෙන් දින කිහිපයකට පසුව අපේ ගම හදිසියේම වෙනස් විය. මෙතෙක් අප වටා තිබූ යුද්ධය එසේ තිබුණු නමුදු, එය තිබුණේ දුරස්ථවය. අවසානයේදී ඒ යුද්ධය අපගේ ගමටද පැමිණියේය. සොල්දාදුවන් පැමිණ තාවකාලික කාර්යාලයක් ගොඩනැගූහ. සියලු දෙනා, එකෙක් හැර, දැඩි පරීක්ෂාවට ලක් විය. නිහඬතාව ගම වෙළා ගනු ලැබීය. කෝවිල් සීනු නාදය වෙනුවට, නිරන්තරයෙන් ඇසෙන්නට වූයේ පාරෙහි ගමන් කරන සොල්දාදුවන්ගේ බර පාවහන් හඬයි, සුපරීක්ෂාකාරී ඇසින් යුතුව ගමන් කරන ඔවුහු තුවක්කු මානාගෙන සිටියහ.

දිනක් සංජීව මා දකින්නට පැමිණියේය.

'ඔයා දැනගෙන සිටියද බාලා, අද උදේ සෝදිසියකදී තරුණ ළමයි හුඟක් අත්අඩංගුවට අරගෙන කියලා? හැඳුනුම් පත්‍රයක් නැතුව පාරෙ යනකොට අපේ පූජාකර් ළමයා අල්ලගෙන'

'ම්ම්ම්' මම කනගාටුවෙන් මිමිණුවෙමි. 'ඒක තමයි අම්මා හැමතිස්සෙම මගේ පසුම්බියේ හැඳුනුම්පත තියෙනවද බලන්නෙ'

ඔහු සුසුම් හෙලුවේය. 'දැන් අපි බයයි අපේ ගෙමිදුල්වලින් අඩියක්වත් එළියට තියන්න. අර සොල්දාදුවන්ගේ උකුසු ඇස් අපේ ළමයි දිහාට යොමුවෙලා'

ඔහුගේ වචනවලින් සහ තැතිගත් බව දැකීමෙන් බියපත්ව මම පිළිතුරු නොදුන්නෙමි. අප වටා කරකැවෙමින් තිබෙන තර්ජනය වඩ වඩා ළං වන්නට විය, සොල්දාදුවෝ අපගේ ගම වටා එක්රැස්ව සිටියේ, ඔවුන්ගේ කොළපැහැති කැලෑ ඇඳුමින් සැරසී යුද ටැංකි වලින් ගමන් කරමිනි. ඔවුහු බීඩි උරමින්, පාරෙහි දෙපැත්තෙහිම පේලි ගැසී ඇණ තබාගෙන හෝ සිටගෙන සිටියහ.

ඔවුන්ගේ පැමිණීමෙන් බියපත්වූ මිනිස්සු අසල්වැසි නිවෙස්වල

මිනිසුන් සමග හෝ කතාබහ කිරීමට බියවූහ. දහවල සිට රාත්‍රිය එළඹීමේදී සිහින් අඳුරක් ගලා ආ අතර, හැම විටම සිදුවන්නාක් මෙන් අනතුරුව වහා අන්ධකාරය එළඹුණේය. එහෙත් දැන් රාත්‍රිය තද රශ්මියෙන් අපට සහනය ගෙන දෙනු වෙනුවට අප බිය කරවන්නට සමත් විය. ගමෙහි දොරවල් අඳුර වැටෙද්දී ආරක්ෂාව සඳහා වසනු ලැබිණි, බල්ලෝ නොකඩවා බුරන්නටත්, උඩු බුරලන්නටත් වූහ. හැම රාත්‍රියකදීම යම් තැනකින් ජීප් රථ දූවිලි වලාවන් නංවාගෙන ගම්මානයට පැමිණේ. විදුලි එළි, ගිනිමැල... ගිනිමැල සහ ඉදිරිපස ලාම්පු; කිරලුන්ගේ ශෝකී ගී රාවය, බල්ලන්ගේ උඩු බිරීමටද පෙර පළමු අනතුරු හැඟවීම කළේය. අපට රාත්‍රියේදී නිදාගත නොහැකි විය, අපි සැමවිටම සාලයේ පැදුරක ගුලි ගැසී සිටියෙමු. කාංසාව අපගේ ඇස් පියන්පත් විවර කර තැබුවේය, ජීප්රථ පැමිණෙන හඬ ඇසෙන විට අම්මා කෑම මේසය යට ඇති ලාම්පුවේ තිරය අඩු කළාය, එවිට අඳුරෙහි ඇති නිවස නොපෙනී යයි. වසර කිහිපයක් තිස්සේ දැන් ගම්මානයට විදුලි එළිය ලැබෙන්නේ නැත. අප ලාම්පුව භාවිතා කරන්නේ ආහාර ගැනීමට හා නිවස තුළ එහා මෙහා යාමටය. මේ වන විට අපි අඳුරෙහි ඇවිදීමට පුරුදුව සිටියෙමු, නිවසෙහි ඇති හැම භාණ්ඩයක්ම පුරුදු සලකුණකි.

එක් රාත්‍රියක මා නින්ද නොමැතිව ඇඳෙහි සිටියදී, අප්පා, අම්මාට කුස්සියේදී කිසිවක් කියනු මට ඇසිණි. මා සමග කාමරයේ සිටින මගේ කුඩා සොහොයුරියට බාධා නොවන්නට, මම නැගිට හෙමින් හෙමින් විසිත්ත කාමරයට ගියෙමි. මම ජනේලය අසලට ගොස්, සෙවණැලි සහිත තිරය පැත්තකට ඇද, පිටත බියෙන් පිරුණු දර්ශන පථයෙහි අඳුරු සටහන දෙස බැලුවෙමි. එහි කිසිවෙක් දකින්නට සිටියේ නැත. කොළවල සෙවණැලි පෙනුණේ ජනෙල් වීදුරුවේ චලනය වන මත්ස්‍යයින් මෙනි. අප්පා කුස්සියේ සිට මට මුදු හඬින් කතා කළේය, මා ඔහු වෙත ගිය විට ඔහු මට කොඳුළේය. 'ඔවුන් ඕනම තැනක ඉන්න පුළුවන්, ගේ පිටිපස්සෙ, පාර දිගේ. ඒක හින්දා කිසිකෙනෙකුට පේන්න ඉන්න එපා. ඔයා දන්නවද අද උදේ සංජීවන් අත්අඩංගුවට අරගෙන?'

ඔහුගේ වචන මගේ හිසට වැදුණු පහරක් බඳු විය.

'අප්පා, කොහොමද... කොහේදීද එයාව අත්අඩංගුවට අරන් තියෙන්නෙ?'

'එයා කරාටේ පන්තියේ ඉඳලා ගෙදර එමින් ඉඳලා තියෙන්නෙ. බෝම්බ පිපිරිල්ලක් ඇහිලා තියෙනවා කන්නතිඩ්ඩි හන්දිය පැත්තෙන්. ඒත්, වැරදීමකින්, ඔහු හිතලා තියෙනවා ඒක ඇහුණේ නාවලර් හන්දිය පැත්තෙන් කියලා, ඉතින් කන්නතිඩ්ඩි පැත්තෙන් එන එක ආරක්ෂිතයි කියලා හිතාගෙන එයා ඒ පැත්තෙන් ඇවිත්. ඔවුන් හැමෝම ගැන වියරුවෙන් ඉඳලා තියෙන්නෙ, ඉතින් එයාව අත්අඩංගුවට අරගෙන'

'ඒ මෝඩ ළමයා ගුරුතුමාගේ ගෙදර නැවතිලා, බෝම්බ පිපිරිල්ලෙන් පැය කීපෙකට පස්සෙ ආවෙ නැත්තෙ මොකද මන්දා?' ඇගේ හිස සොලවමින් අම්මා ඇසුවාය.

'ඇයි ඔයා ඔච්චර නොසැලකිලිමත් විදිහට කතා කරන්නෙ?' අප්පා පිළිතුරු දුන්නේය. 'ඇඳිරි නීතිය පටන් ගත්තෙ හවස හයට. එයා කොහොමද පැය කීපෙකින් ගෙදර එන්නෙ?'

නයෙකුගේ තියුණු දළයට හසුවූ මීයකු ඈතට පැන යන්නාක් මෙන් මගේ හදවත මිරිකී ගියේය. මම මහ හඬින් ඉකිබිඳින්නට වූයේ මිය යන්නට අරගලයක යෙදී සිටින වස කවන ලද බල්ලෙක් හිස සොලවන ආකාරයට මගේ හිස සොලවමිනි.

අපි ඊළඟ දිනයේ ඔහුගේ නිවසට ගියෙමු. එය මළගෙයක් බඳු විය. මිනිස්සු දුක්මුසු නිහඬතාවයකින් එක්ව සිටියහ.

අප දුටු විට සංජීවන්ගේ මව මහ හඬින් හඬන්නට වූවාය. 'ඕ... කඩවුලී... ඇයි අපිට මේ බිහිසුණු දේවල් වෙන්නෙ? මට ඔබේ දොරළඟ දේව පූජාවක් හදලා තියන්න තිබුණා. උඹලට මගේ පුතාගේ ජීවිතේ ඕන නම් අපි දෙන්නගෙ ජීවිතත් අරගන්න පුළුවන්' ඇය මද වෙලාවක් සුසුම් හෙලූ ඇය කතා කළාය. 'මේ වතාවෙ එයාගෙ කේන්දරේ හොඳ නැහැ. සෙනසුරු අන්තිම කොටුවෙ ඉන්නෙ, ඕන වෙලාවක මරණය සිද්ද වෙන්න පුළුවන්' ඇය නැවත ඉකිබිඳින්නට වූවාය. 'දෙවියො අපිට කිසිම කරුණාවක් දක්වන්නෙ නෑ'

ශෝකයෙන් සිටි ඔහුගේ පියා සියලු බලාපොරොත්තු අතැර මෙසේ කියමින් සිටියේය. 'අපිට සංජීවන් හම්බුවෙන්න තියෙන එකම අවස්ථාව ලැබෙන්නෙ දිව්‍යලෝකෙදි'

මෙය ඔහුගේ බිරිඳගේ ශෝකයට එකතු විය. දුක්වන්නට එපායි කියමින් අම්මා ඔවුන් දෙදෙනා අස්වසන්නට වෑයම් කළාය. දෙවියන් ඔවුන් එබඳු බලාපොරොත්තු සුන් තත්ත්වයකට පත් නොකරනු ඇත.

සන්ධ්‍යා පූජාවට කෝවිලේ සීනු නාදය ඇසෙන්නට වූයේය. සංජීවන්ගේ මව සූදානම් වීමට හදිසි වූවාය. 'මගේ හිත හදාගන්න මට කරන්න තියෙන්නෙ මෙච්චරයි'

මම ද ගෙදරට විගස ගොස් සූදානම් වීමි. ඇඳ පැළඳගෙන කෝවිලට පැමිණෙන්නැයි අම්මා කරන බලකිරීමකින් තොරව මා කෝවිලට යාමට සූදානම් වූ ප්‍රථම අවස්ථාව මෙය විය. මා කෝවිලට ගිය මොහොතේ සිට, එහි ඇති හැම දෙයක්ම මට සිහිපත් කළේ සංජීවන් සහ දෙවියන් පිළිබඳ ඔහුගේ බැතිමත් වදන්ය.

'බාලා ඇවිත් මේ සියලුම නවග්‍රහයන්ට යාඥා කරන්න' මා කැඳවමින් ඔහුගේ මව කීවාය. 'අපේ ඉරණමට ඔවුන් වග කියන්න ඕන. අපි රැකෙනවද නැද්ද කියන එකට, හොඳ හරි නරක හරි, ඒ ඔක්කොම රැඳෙන්නෙ ඔවුන් මත'

මම නවග්‍රහයින් වටා මුමුණමින් නවවරක් ගමන් කළෙමි. 'මගේ ඥාති සහෝදරයාගේ ආත්මය රැකදෙනු මැනවි' මම ඔහුගේ නමින් පූජා පැවැත්වීමි. අනතුරුව මම සන්දේශ්වරාර් වෙත ගියෙමි, මන්ද, කෝවිල වටා ඇවිද යන විට සංජීවන් නිතරම ඒ ගැන සඳහන් කළ බැවිනි. 'ඔහුට යාඥා කරන්න ඔයාට අමතක වුණොත්, අන්තිමේදී, ඔයාගේ සියලුම යාඥාවන් පලක් නැතිවෙලා යාවි.' මගේ ඇස් කඳුළින් පිරී ගියේ මට ඔහුගේ වචන සිහියට පැමිණි විට හා මේ ප්‍රතිමාව ඉදිරියේ ඔහු පසෙකින් මා සිටගෙන සිටියේ කෙතරම් සතුටින්දැයි සිතන විටය. සති ගණනක් ගෙවී ගියේය. ඔහු නිදහස් කරන බවට කිසිදු සලකුණක් නොවීය.

'ඒ ගොල්ලන්ගෙ එකම ළමයා වෙච්චි, ඔහු ගැන දෙමාපියන්ට මොනතරම් හීන තිබුණද?' මගේ දෙමාපියෝ හැමවිටම එකිනෙකාට කීහ. 'ඒත් දැන් ඔක්කොම ඉවරයි. එයා ජීවත් වෙනවද නැත්නම් කොහේ හරි මිනියක් වෙලා වැතිරිලා ද කියලා අපි දන්නෙ නෑ'

සංජීවන්ගේ පියා ඉහළ නිලධාරින්ගේ සහාය පැතුවේය. විවිධ

හමුදා කඳවුරුවල සහ රජයේ කාර්යාලවල කාලය ගත කළද, ප්‍රතිඵලයක් නොවීය. ඔහුගේ මව උමතු බවෙහි අද්දර සිටියාය. ඇය දහවල් කාලයේදී සිය පුතු සොයමින් පාරවල් පුරා ඇවිද ගියාය, හවස් කාලයේ ඇය කෝවිලෙන් කෝවිලට යමින්, ඔහුට අනුකම්පාව දක්වන ලෙස පිල්ලියාර්ට යාඥා කළාය. සංජීවන්ගේ ඉරණම පිළිබඳ සිතන විට මගේ සිත දම්වැලක පටලැවී ඇතිවාක් මෙන් දැනිණි.

නිදහස සහ සාධාරණයේ නාමයෙන් කරන මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ සහ කුරිරු වදහිංසා පැමිණවීම ගැන සිතන විට මම බොහෝ කෝපයට පත්වීමි. සතුන් මැරීමට, සමාජයක් සත්ව ඝාතකයින් යොදාගන්නාක් මෙන්, අහිංසකයින් මරා දැමීම සඳහා මේ කුරිරු අත් කුලියට ගනු ලැබ ඇත.

ඇඳිරි නීතිය ආරම්භ වූ පසුව, අහාර ලබාගැනීම ඉතා දුෂ්කර විය. එක් සන්ධ්‍යාවක, කෝවිලෙහි පොකුණ අසල ඇති සමුපකාර වෙළෙඳසලට මම අම්මා සමග ගියෙමි. හැමදෙනාටම එක් මෙහෙවරක් තිබිණි, ඒ හැකිතාක් හාල්, සීනි, පරිප්පු සහ එළවළු මිල දී ගැනීමයි. හාල් ගෝනි මහත් වේගයෙන් හිස්වූ අතර, එළවළු විනාඩි කිහිපයක් ඇතුළත අතුරුදහන් විය. අනෙක් දිනවල මෙන්, කෝවිල් පොකුණෙහි කිමිදෙන්නට, නාන්නට, පීනන්නට, ඇඳුම් සෝදන්නට හෝ අනෙකුන්ගේ පිට ඇතිල්ලීමට කිසිවෙක් සිටියේ නැත. සංජීවන් සහ මම එහි නාමින් විනෝද වූ හැටි මට සිහිවිය, අප දෙදෙනාම යළි යළිත් පොකුණෙහි කිමිදෙමින් නැවෙමු.

කිසිවෙක් සංජීවන්ගේ නම කියනු ඇසීමෙන්, මගේ සැමරුම් වලින් මගේ අවධානය ඉවත්ව ගියේය.

'අයියෝ මට තාම මතකයි එයා වේට්ටිය ඇඳලා නළලෙ ශුද්ධ වූ අළු ගාගෙන ඉන්න හැටි'

වයෝවෘද්ධ මිනිසෙකු කීවේය. 'ඇයි අහිංසකයා දිව්‍යලොකයට අරන් ගියේ?'

මම තැතිගෙන මිනිසා ඉදිරියට ගිය අතර, අම්මා මගේ මුහුණ දැක මා පසුපස ආවාය. 'සංජීවන් ගැන ඔයාට අහන්න ලැබුණෙ මොනවද?' මම කොඳුළෙමි.

අම්මාගේත් මගේත් වේදනාව දුටු මිනිසාගේ මුහුණෙහි වරදකාරී හැඟීමක් ඇති විය. 'මොනවද අහන්න ලැබුණෙ?' මම බල කළෙමි.

'බලධාරීන් කියනවා ඒගොල්ලො දින කීපෙකට ඉස්සෙල්ලා එයාව නිදහස් කළා කියලා' යි කී මිනිසා අප දෙස බැලුවේය. තවදුරටත් අන් කිසිවක් කීම අවශ්‍ය නොවීය, මන්ද එහි තේරුම කුමක්දැයි අපි සියලු දෙනාම දැන සිටියෙමු. සංජීවන් තවදුරටත් ජීවතුන් අතර නැත. ඔහු මරා දමා ඇත, ඔහුගේ සිරුර විනාශ කර ඇත.

අම්මා සහ මම අවුල් වී ගිය මනසින් ආපසු හැරුණෙමු.

අපගේ නිවසට ආපසු එන විට, අප පාරේ වංගුව හැරී එද්දී, මගේ පන්ති සගයකු වූ රන්ජන් ඔවුන්ගේ වැට අසල සිටගෙන සිටියේය. ඔයගොල්ලො දන්නවද අපේ කෝවිලේ තරුණ බ්‍රාහ්මණ වංශිකයා අත්අඩංගුවට අරගෙන' ඔහු අපට කතා කළේය.

ඔහුට කියන්නට මට කිසිදෙයක් තිබුණේ නැත.

ජීවිතය මට අරුතක් නැති දෙයක් බවට පත් විය. මනුෂ්‍ය සබඳතාවෙහි උණුසුමක් නොතිබිණි. කාලය ගෙවී ගියේය, කරන්නට වැඩි දෙයක් තිබුණේ නැත. අපි නිහඬ වූයෙමු. අපි අවදි වීම, ඉවුම් පිහුම්, නිදා ගැනීම ආදී සාමාන්‍යයෙන් කරන දේ කළෙමු, එහෙත් ඒ සඳහා අපගේ පාර්ශවයේ වැඩි වෙහෙසීමක් අවශ්‍ය විය. අප පහසුවෙන් වෙහෙසට පත්වූ අතර දීර්ඝ නිහඬතාවන්ට වැටුණෙමු. මට මේ ලෝකයෙන් ගැලවී යාම පිණිස පැන යාමට වුවමනා විය. එහෙත් එය බියගුල්ලකුගේ ක්‍රියාවකි. එමෙන්ම පිටුවහල් වීම අප අපටම ආගන්තුකයන් වීමකි, අපට අපගේ අනන්‍යතාව එනයින් අහිමි වේ.

එක් සන්ධ්‍යාවක අප කතාකරමින් වැරැන්ඩයේ ඉඳගෙන සිටියදී, ඈතින් වෙඩි තබන ශබ්දයක් ඇසිණි. පාරෙහි ඉක්මනින් පැමිණි අසල්වැසියෙක් කතා කර හමුදාව හා එල්ටීටීඊය සටනෙහි යෙදී ඇති බව කීවේය. දැනටමත් සමහර ගොඩනැගිලිවලට ෂෙල් වෙඩි වැදී ඇත. හමුදාව අපගේ ගමට පැමිණ ඇති බවටත්, ඉක්මනින්ම ගම සටන් බිමක් විය හැකි බවටත් කටකතා පැතිර ගිය අතර, හැමදෙනාම කෝවිලට යාමට සූදානම් වෙමින් සිටියහ. අම්මා ඇගේ රන් ආභරණ හා මුදල් සොයමින්

සිටි අතරතුර මට විස්කෝතු හා වතුර සූදානම් කරගන්නැයි කීවාය. අප්පා ඒවා රෙද්දක ඔතා අල්මාරිය පිටුපස සැඟවීය. ආහාර සහ ඇඳුම් කැඩුම් කිහිපයක් රැගෙන අපි ඉක්මනින් අපගේ නිවසින් පිටව ගියෙමු.

අප කෝවිල ළඟට පැමිණෙන විට, ඈතින්, නොනැවතී වෙඩි හඬ ඇසිණි, එමෙන්ම කෝවිලෙහි මහා වෙනසක් ඇතිවී තිබෙන බව අඳුරෙහි අපි දුටුවෙමු. අප පිවිසුම වෙත යන විට, කෝවිලෙහි ඉදිරි ගේට්ටුව පුළුස්සා ඇති බව දැකීමෙන් තැති ගත්තෙමු. අප ඇතුළට ගිය පසු කෝවිලෙහි වසන්ත මණ්ඩපය බිඳ වැටී තිබුණේය. ගරිල්ලන් පැමිණීම නැවැත්වීමට බිත්ති අළු බවට පත් කර තිබිණි. කැටයම් කළ කණු සහිත ඔවුන්ගේ ලස්සන මූර්තීන්, මුරුගා දෙවිඳුන් හා ඔහුගේ ශක්තීන් දෙක සහ ගින්නෙහි නර්තනයෙහි යෙදෙන ශිව දෙවියන් යන සියල්ල කඩා බිඳ විනාශ කර තිබිණි. ශිව මූර්තිය හා සාන්තුවරයින් හැටතුන් දෙනෙකුගේ මූර්ති තිබූ තැන්වල නොවීය. නිහඬතාව විස්මයජනක විය. අම්මාගේ කිරි ඉල්ලා අඬන බිළිඳකුගේ හඬ මැඩපවත්වනු ලැබිණි. අවසානයේදී කිසිවෙක් කුඩා චිමිනි ලාම්පුවක් දැල්වූයේය, පුදුම සහගත අඩ එළියෙහි මම නිහඬ මුහුණු විශාල ප්‍රමාණයක් දුටුවෙමි, කිසිදු හානියක් සිදු නොවූ අංගනයෙහි නග්න පොළොවෙහි සිය ගණන් මිනිස්සු එකිනෙකා අසල වැතිර සිටියහ. ඇගේ සැමියාට වෙඩි තබා මරා දැමීම ගැන ස්ත්‍රියක කෑ ගසා හඬන්නට වූවාය. සිදුවී ඇති විනාශය දෙස හිරිවැටී ගියාක් බඳුව දෑස් දල්වාගෙන, මම කෝවිල වටා යන්නට පටන් ගත්තෙමි.

දිනපතා කිරි ලීටර් ගණනින් නාවනු ලබන ශිව දෙවියන්, දැන් පාදකයෙන් ගැලවී විසිවී ගොස් බිම වැතිර සිටියි. ගින්දර දරා සිටි උඩ වම් අත වායුව සමග එක්ව ඇත. ගින්න යම් හැඩයක අවසානය හඟවයි. පාපය සංකේතවත් කළ යක්ෂයා මතින් සෝබමාන ලෙසින් ඔසවා තබාගෙන සිටීමට පුරුදු වූ ඔහුගේ වම්පාදය දැන් කැඩී ගොසිනි.

කිසිදු අවධානයක් නොදක්වා මිනිස්සු ප්‍රතිමාව පසුකර යති. මා දෙස බලා සිටින විකෘති සත්ත්වයෙක් සේ සඳඑළියෙහි අශ්ව කරත්තය නිසොල්මන්ව තිබෙයි. අපගේ ළමා කාලයේදී අශ්ව කරත්තයට නැග එහි කර ඇති කැටයම් බැලීමට හා ඒවා සමග සෙල්ලම් කිරීමට සංජීවන් සහ මම කෙතරම් ප්‍රිය කළෙමුද? අපගේ ප්‍රියතම දෙය වූයේ විශාල ලී අශ්වයායි. දැන් එහි ඉදිරි පා නොමැති අතර එය පසෙකට දමා ඇත.

එහි අලංකාර සැරසිලි රහිතව, මල්දම් සහ රතු කොඩි රහිතව, අශ්ව කරත්තය පෙනුණේ අතු පතර සිඳහෙලූ තල්ගසක් සේය. කාලි දෙවොලෙහි ඉතිරිව තිබූ එකම දෙය විශ්වයේ නිමවුම්කරු, ආරක්ෂක සහ විනාශකරුගේ නිත්‍ය බලය වූ 'ශක්ති' වූවාය. ඒ භයානක අන්ධකාරයේ ඇය ඇගේ කෝපයෙන් පිරි රතු ඇස්වලින් සියලුම පාපයන් සඳහා පෙනී සිටිමින්, ඇය මරා දැමූ ඇගේ යෝධයින්ගේ හිස් තර්ජනාත්මකව ලෙලවමින් ඇගේ ගෙල වටා හිස්කබල මාලාවක් පැළඳ ගනිමින් මා භීතියට පත් කරවූවාය.

අපගේ දේශයේ හැම අහුමුල්ලකම පන්සල් හා කෝවිල් තිබිණි. එහෙත් ඒවායින් කවර පලක්ද? පිල්ලෙයාර් කෝවිල ඒ කොනෙහි තිබියදීද, චෙම්මනි හන්දියේ හැම ආකාරයේම සංහාර සිදුවූයේය. අප විඳින්නා වූ වේදනාවන් ඉදිරියේ දෙවියන් අඳ බිහිරි වූවෝද? කොපමණ පිරිසක් කාවඩි රැගෙන ගියෝද? චේට්ටි හැඳ, කෝවිල් වීදි දිගේ, වන්දි ගෙවීම සඳහා පෙරලෙමින් කොපමණ පිරිසක් ගියෝද? ඔවුන්ගේ කාලි සදහට රැකගැනුම සඳහා අපගේ ස්ත්‍රීහු අම්මාන්ට කොපමණ පූජාවන් කළෝද? එහෙත් අපගේ දෙවිවරු හැම විටම නිහඬ වූයේ මන්ද? ඔවුන්ද වඩා කැමති වූයේ මරණයටද?

මා මේ ප්‍රශ්න මගෙන් ඇසූ විට, මගේ සිත කාවාඩි පිළිබඳ සංජීවන් කී වදන් කෙරෙහි දිව ගියේය, එය අපගේ ජීවිතයේ විඳදරා සිටීමේ අවශ්‍යතාව සංකේතවත් කළේ කෙලෙසින්ද? විඳ දරා සිටීම පැමිණියේ අපගේ විශ්වාසය තුළිනි. එය අපගේ සිත් ශක්තිමත් කළේය.

කොස්සක්, මුල්ලෙහි ඇති බව මම දැන් දුටුවෙමි. මම එය ගැනීමට ගියෙමි. මම එයින් මා වටා ඇති සුන්බුන් අතුගෑමට පටන් ගත්තෙමි. සමහර විට ඒ මා වෙනුවෙනි, එමෙන්ම ඒ මගේ ඥාති සහෝදරයාට ගරු කිරීමද වෙනුවෙනි.

### දෙමළ වදන් සඳහා විවරණය

| | | |
|---|---|---|
| ඉචාශක්ති, ගිරියාශක්ති | - | ශක්තිගේ ස්වරූපයන් |
| කාලි | - | අම්මාන් දෙවඟන |
| කාවාඩි | - | බාරහාර ඉටුකරගැනීම වෙනුවෙන් කරන පිළිවෙත් ක්‍රමයක් |

| | | |
|---|---|---|
| නඩේස්වරම්, තාවිල් | - | කෝවිල් උත්සවවල භාවිතා කරන සංගීත භාණ්ඩය |
| පදයියාල් | - | දෙවියන්ට කරන පූජා, ආහාර සහ පළතුරු වැනි |
| තාලි | - | විවාහයේදී හින්දු කාන්තාවන්ට දෙන පෙන්ඩනය. එයින් සංකේතවත් වන්නේ ඇය බිරිඳක බවයි |
| වසන්ත මණ්ඩපම් | - | කෝවිලෙහි ප්‍රධාන ශාලාව |
| වීදි | - | කෝවිල් පාර |
| වෙල්වි | - | සතුන් කැප කිරීම |
| වෙස්ටි | - | ඉණවටා අදින් සම්ප්‍රදායික දිග රෙද්ද |

***අරිවර්සි මුතුලිංගම්*** *උපන්නේ හා හැදුණේ වැඩුණේ යාපනයේය. දැන් ඇය යාපනය සරසවියේ ඉංග්‍රිසි සාහිත්‍ය හදාරමින් සිටියි. ආගම ධර්මයෙහි ප්‍රතිබිම්බය උගන්වන්නේ වේදනාව නැති කරගන්නේ විශ්වාසය තුළින් බවයි. එතෙකුදු වුවත්, අප අන්ධ ලෙස ආගම ඇදහිය යුතු නැති බවද ඇය විශ්වාස කරයි. ඇය යාපනයේ ගත කළ කාලයේදී ලබා ගත් අත්දැකීම් තුළින්, මේ කතාවේ අදහස් වෙනුවෙන් හැඩතල ලබා දී ඇත.*

# කාලිගේ බැල්ම

***සොනාලි වනිගබඩුගේ***

***එක***

විශ්වනාදන් ධර්මලිංගම් එල්.එල්.බී (යාපනය)
නීතීඥ
ප්‍රසිද්ධ නොතාරිස් හා දිවුරුම් කොමසාරිස්

අප නිවසින් පිටත, ගෙළයනට උඩින්, මගේ වඩා ප්‍රියතම ගස වන අඹ ගස් සෙවණෙහි, අළු පැහැති යකඩ ගේට්ටුව අසල ඇති උසැති කණුවෙහි එල්ලී ඇති සංඥා පුවරුව එයයි. සිය නීති පෙළපත සම්බන්ධයෙන් අප්පා බොහෝ ආඩම්බර වූයේය. ඔහුගේ අප්පා නීතිඥයකු වූයේය, ඔහුගේ අප්පාගේ අප්පා විනිසුරුවරයෙකු වූයේය. මා එහි හතරවන පරම්පරාවෙහි නීතිඥවරයකු වීමට සිටි අතර, ධර්මලිංගම් පරම්පරාවේ උරුමය ඉදිරියට රැගෙන යායුතු විය, ඔහුගේ උසත්, ලොකු රැවුලත් වෙනස් ආකාරයකට පෙන්නුම් කළද අප්පා හොඳ මිනිසකු වූයේය. ඔහු පිළිබඳ ප්‍රසන්නම දෙය වන්නේ ඔහු තමන්ගේ පවුල කෙරෙහි දක්වන ආදරයයි. ඔහුට අම්මා මුණගැසී ඇත්තේ ඔවුන්ගේ විවාහය සිදු වූ දිනයේදීය, එහෙත් ඔවුන් එකිනෙකාට දැක්වූ ආදරය වර්ධනය වූයේය, එමෙන්ම අනෙකාගේ අමුතු හැසිරීම් කෙරෙහි ලොකු අවබෝධයකින් කටයුතු කිරීමටත් ඉවසා දරා සිටීමටත් ඔවුහු පුරුදුව සිටියහ. ඔවුන්ගේ දීප්තිමත් අපේක්ෂාව මා වූයේය. බොහෝ දෙමාපියන් දූ වරුන්ට වඩා පුතුන්ට වැඩි කැමැත්තක් දැක්වූ නමුදු, ඔවුහු හැමවිටම අයියාට වඩා මට ආදරය කළහ. කෑම මේසයේදී ලොකුම මාළු කෑල්ලද, අඹ වාරයේදී වඩා රසැති හා වඩා ඉදුණු අඹද මට ලැබිණි. මගේ බොහෝ පාසල් මිතුරියෝ අවුරුදු දාසය හෝ දහ හත වන විට විවාහ වූහ, අප්පා සහ අම්මාට (මම මොමෝ කියා අමතන) මා වෙනුවෙන් වෙනත් සැලසුම් තිබිණි. මගේ උස අඩි තුනක් ව සිටියදී ද, අප්පා මට ඔහු උසාවි යෑමට ඇඳි ලෝගුව ඇන්දවූයේ යම්දිනක මා ඔවුන්ගේ ගැලවුම්කාරිය වන බව කියමිනි. මගේ ප්‍රමාණයටද, උසටද, වඩා දෙගුණයක් විශාල කළු ලෝගුවක් හැඳගෙන නිවස පුරා ඇවිදින මා පෙනුණේ විගඩමක් ලෙසිනි, එහෙත් අප්පා අඩම්බරයෙන් ඉපිලෙමින්, මා ඉපදී ඇත්තේ නීතිඥයකු වීමට යයි කියයි.

අයියා නිවසෙහි සිටියදී අපි සතුටින් සිටියෙමු, එහෙත් අප්පා අපට අයත් අනෙකුත් දේපල සියල්ල විකුණා අයියා බැරිස්ටර්වරයකු කරවීම සඳහා ලන්ඩනයට යැවුවේය. රුපියල් මිලියන හතරක් වියදම් කිරීමෙන් පසුව හා වසර පහක් ගතවීමෙන් පසුව, අයියා පිටු දෙකක ලිපියක් එවමින් නීතිය හැදෑරීම තමාගේ කැමැත්ත නොවන බවත්, කිසිදා එය තමාගේ කැමැත්ත නොවූ බවත් කියා සිටියේය. ඔහු ආපසු පැමිණියේ නැත. මුළු වසරක් පුරාම අම්මා දිනපතා හැඬුවාය. ඒ හැඬීම නැවතුනේ අයියා තමා මැන්චෙස්ටර් නුවර පදිංචි වූ බවත්, එහි සතුටින් සිටින බවත් සඳහන් සටහනක් සමග පාර්සලයක් එවීමෙන් පසුවය. වසර දෙකකට පසුව, කෙසඟ සුදුමැලි ගැහැණියක හා පැවති සරල කෝවිල් මංගල උත්සවයක පින්තූර ඔහු එවුවේය. ඒ සමග දුඹුරු පැහැති ඇස් ඇති වයස අවුරුදු දෙකක් පමණ පෙනෙන ලස්සන බිළිඳෙකුගේ පින්තූරද තිබිණි. එයින් පසුව, ලන්ඩනයේ ඔහුගේ පළමු වසරේ සිට, ඔහුගේ විවාහ උත්සවය සහ දරුවා පිළිබඳ තත්ත්වය අයියා අපට රහසක්ව තබාගැනීමේ කරුණ පසෙක තිබියදී, මොමෝ ඇගේ සාමාන්‍ය තත්ත්වයට පත් වූවාය.

අයියා අපට එවූ අවසාන සටහන අයියා බේකරියක වැඩ කරමින් සිටින ආකාරය දක්වෙන ඡායාරූපයකි. ඔහු මදක් වයසට ගොස් සිටියේය. එහෙත් පිටි අනන ඔහුගේ මුහුණෙහි ජයග්‍රාහී පෙනුමක් තිබිණි. අප කුඩා කාලයේ මා සහ අයියා සෙල්ලම් කළ හැටි මගේ මතකයට ආවේය. ඔහු කිසිවිටෙක පාන් ගෙඩියෙහි මැද කෑවේ නැත. ඒ වෙනුවට, ඔහු කුඩා බෝල, සාදා, ඒවා විවිධ හැඩවලට අනා, තමා බේකරිකාරයෙක් බව කීවේය. අයියාගේ කැමැත්ත කුමක්ද යන්න තේරුම් ගැනීමට මේ මුළු කාලයම ගත විය. හොඳයි, අඩු තරමින් දැන් ඔහු සතුටින් සිටියේය.

අප්පා කිසිවිටෙක අයියා පිළිබඳ කතා නොකළේය. අප්පාගේ සිතෙහි කුමක් තිබුණේ දැයි අපි කිසිවිටෙක නොදැන සිටියෙමු. අපගේ දේපල උකස්කර ණයට ගත් මිලියන සියල්ල ඔහු ගෙවන්නේ කෙසේදැයි අපි නොදැන සිටියෙමු. ඔහු හැඟීම් නිසා බිඳ වැටෙන්නේ නැත.

අප්පාගේ උරුමය ඉදිරියට ගෙන යාම සඳහා ගෞරවනීය නීතිඥ වෘත්තිය වෙනුවට බේකරිකරුවකු බවට පත් වීමේ අයියාගේ රංගනය අවසානයේදී, අයියා පමණක් අඩු වී, අපි සාමාන්‍ය ජීවිතවලට ස්ථාපිත වීමු. අපගේ වඩා වැදගත් භෞතික අයිතිය වූයේ, මා නිතර ආ ගිය

පුස්තකාලයට පයින් යන දුරින් පිහිටි, යාපනය නගරයේ පිහිටි පර්චස් හැත්තෑවක ඉඩමකි. ඉන් පර්චස් විස්සක, අප්පා ගෙවත්තක් සහිත අපගේ නිවස ඉදි කළේය. ඉතිරි පර්චස් පනහක ප්‍රමාණය මගේ දෑවැද්ද වශයෙන් දෙන්නට ඉතිරි කරගත් බව අප්පා කීවේය. ඔහු එහි තල් ගස් වැවුවේය, එයින් ලැබෙන සියලුම ආදායම් දේශීය බැංකුවක තැන්පත් කළේය. අපි එතරම් පොහොසත් අය නොවීමු, අපි තවමත් අයියාට ගත් ණය ගෙවමින් සිටියෙමු. අයියා එවූ සතයක් හෝ ප්‍රතික්ෂේප කිරීමට තරම් අප්පා මුරණ්ඩු වූයේය, අයියා තුන් මසක පමණක් වරක් පවුම් දෙසීයක් එවුවේය. ඒ සියලු මුදල් නෝට්ටු ඔහුගේ මැන්චෙස්ටර් ලිපිනයට ආපසු යැවිණි. අප්පා තමාට අහිමි වූ බව තේරුම්ගත් අයියා, කලකට පසුව ලියුම් එවීම සහ මුදල් එවීම නවතා දැමුවේය. ජීවිතය සාමකාමීව ගලා ගියේය, අප අලුත් අත්දැකීම් සොයා ගිය පවුලක් නොවූ බැවින් ප්‍රසිද්ධ සැවෝයි සිනමා ශාලාවේ චිත්‍රපට බැලීමට හෝ රූපවාහිනියේ ඇති තරම් දැන්වීම් දමන KFC අවන්හලෙහි කෑමට කොළඹ නොගියෙමු අපිට තවමත් සැපපහසු ජීවිතයක් ගත කළ හැකි විය, ඉතාම වැදගත් දෙය එයයි.

*දෙක*

'මෙලොව දෙවර්ගයක මිනිස්සු සිටිති. එනම් ලෝකය දෙවර්ග යකට බෙදන මිනිස්සු සහ එසේ නොකරන මිනිස්සු යනුවෙනි'

අප්පාගේ ජනප්‍රිය උපුටා දැක්වීම් වලින් එකක් වන එය ජෙරමි බෙන්තම් නම් නීති විශාරදයා සඳහන් කරන ලද්දකි. සිය විශාල හාන්සිපුටුවේ හිඳගෙන හැම පස්වරුකදීම විනාඩි තිහක නින්ද ගත කරන අප්පා ඒ අතරතුර මේ උපුටනය හඬ නගා කියවයි. ලොකු, මහත සූනබයකු වැනි බෙන්තම් වැන්නකු කෙරෙහි අප්පාගේ වශීකරණය කුමක්දැයි මට අවංකවම තේරුම් ගත නොහැකිය. ඔහුගේ ප්‍රකාශයන් මට නම් වැඩි හැඟීමක් ඇති නොකරයි. මට එයට වඩා හොඳ කියමන් කිව හැකිය. මේ උපුටනයන් දැක්වීමේ අප්පාගේ රහසිගත අභිප්‍රායක් ඇතැයි මම සිතුවෙමි, ස්ථූල බ්‍රිතාන්‍ය මිනිසුන්ගේ උපුටනයන් දැක්වීමේ ඔහුගේ කැමැත්ත මා උකහා ගනු ඇතැයි අප්පා බලාපොරොත්තු වන්නට ඇත. වාසනාවකට මා එසේ කළේ නැත.

සියලුම උපුටනයන්ට අතිරේක වශයෙන්, වර්ගවාදය සහ බෙදුම්වාදය දේශපාලන අභිලාෂයන් ඇතිව ජනතාව පාලනය කිරීම සඳහා සහ රැවටීම සඳහා යොදා ගන්නක් බව අප්පා මට ඉගැන්වූයේය. අප්පාට දේශපාලනය ගැන උනන්දුවක් තිබුණේ නැත, රටෙහි සමහර පළාත් විනාශ කර දැමීමට හේතු වූ සිංහල දෙමළ ප්‍රශ්නයේදී ඔහු පැත්තක් ගැනීම ප්‍රතික්ෂේප කළේය. රාත්‍රියේ රූපවාහිනී පුවත් වලින් අපි අර්බුදයෙහි අහුකොන් දැන ගත්තෙමු. අපි පුවත් බලන විට, අප්පා ඔහුගේ ජනප්‍රිය කාල්මාක්ස් උපුටනයක් දක්වයි, 'ආගම ජනතාව නිර්වින්දනය කරයි.'

සන්ධ්‍යා කාලයන්හි කාලි අම්මාන් කෝවිල පසුකරමින් ඇවිද යාමට මම පුරුදුව සිටියෙමි. මිනිසුන් බොහෝ යාඥා කරන්නේ කුමක් නිසාදැයි මම හැමවිටම මවිතයට පත්වීමි. අපි ආගම් භක්තිය වැළඳ ගත් පවුලක් නොවීමු, අපි වඩාත් අධ්‍යාත්මික පාර්ශවයට නැඹුරුව සිටියෙමු. එක් ආගමක් විශ්වාස කිරීමට නොහැකි තරමට අප්පා පොතපත බොහෝ කියවා තිබිණි. ආගම පිළිබඳ මා ඔහුගෙන් ප්‍රශ්න කළ අවස්ථාවලදී, ඔහු ඔහුගේ ස්ථූල මිනිසා බෙන්තම් කිවූ දෙයකින් දාර්ශනික මත ගෙන හැර පායි. 'තරු අල්ලන්න අත දිගු කරන ඔහු, තමාගේ පාමුල මල් ඇති බව අමතක කරයි' අනතුරුව මා එය තේරුම් නොගත් බව අවබෝධ කොටගෙන ඔහු එය දීර්ඝ වශයෙන් විස්තර කරයි. 'රාධෝ, මට ඔයයි ඔයාගෙ අම්මයි මා ළඟ ඉන්න කොට වෙන මොනවද ඕන?'

මේ සිතිවිලි මගේ සිතෙහි දරාගෙන, මම සාප්පු සහ කඩවීදි පසුකරමින් යද්දී අසල ඇති කඩයකින් කුකුළු මස් කොත්තු මිලදී ගැනීමේ කැමැත්තක් ඇතිවූ නමුත්, එහි සිටි සියලුම ගඳ ගහන පෙනුමැති මිනිසුන් මා දෙස බලා සිටි බැවින් එයට පසුබට වෙමින් සැතපුම් දෙකක් පමණ දුර ඇවිද ගියෙමි. එතෙකුදු වුවත් මා කාගේ දියණියදැයි ඔවුහු සියලු දෙනාම දැන සිටියහ, එබැවින් මට කිසිවක් කියන්නට ඔවුහු බිය වූහ. ඉදින් මම, හිස ඔසවාගෙන ගමන් කළේ, මා අප්පාගේ දියණිය වීම ගැන සතුටින් යුතුවය. බෙන්තම් නිවැරදි විය හැකිය. මගේ දෙපා මුල මල් ඇති බැවින් මා සතුටු විය යුතුය.

**තුන**

'ගන්න ගන්න වාසනා සම්පත ! කෝටිපතියෙක් වෙන්න ! '

ජයග්‍රාහී ලොතරැයි පතක් මිලදී ගන්න යැයි කියමින් හා ඊළඟ කෝටිපතියා වන්නැයි කියමින්, ලොතැරැයි වෙළෙන්දා නගන මහ ඝෝෂාව, හැමතැනම සිටින කොළඹ කාක්කන්ගේ ඝෝෂාව සමග එක් වී, ජනේල සහ දූවිලි පිරි ග්‍රිල් අතරින් රිංගවූ පෙට්ටි වලින් සාදන ලද තිරරෙදි හරහා දිව යයි. ඒකාබද්ධ අමිහිරි හඬක් සිහිනයෙන් තොර මගේ නින්දෙන් මා අවදි කරවූයේය. මා මගේ නෙත් විවර කළ විට, මහත මදුරුවෝ මා වටකොට සිටියහ, රාත්‍රිය පුරා උහු මගේ ලේ උරා බී ඇත. 'වරෙන් වරෙන්, අපේ ලේත් උරා බීපල්ලා. කොහොමහරි වෙන මොනවද අපෙන් අරගන්න තියෙන්නෙ' මම සිතුවෙමි.

වැල්ලවත්ත කාණුවෙන් නැගුණු කුණු ගඳ නිසා උදය ආහාරය ගැන සිතන්නට හෝ නොහැකි විය. අප්පාට සහ මට බෙදාගැනීමට අද පාන් ගෙඩියක්, පරිප්පු ව්‍යංජනයක් සහ බිත්තරයක් ලැබී ඇත. 'මොමෝ' යැයි මා තවදුරටත් නොසිතන, එහෙත් වඩා විධිමත් ලෙසින් අමතන්නේනන්, අපේ අම්මා තවදුරටත් හොඳින් ආහාර ගත්තේ නැත. ඇගේ මංගල මුදුව හැර වෙනත් අබරණ ඇය පළඳින්නේ නැත, කලෙක සජීවීව තිබූ ඇගේ මුහුණෙහි අද ඇති හිස් බැල්ම සමග ඇය ඇගේ වැඩකටයුතු ගෙන ගියාය. අම්මා ඇගේ පොට්ටු තැබීමද ඇය නැවැත්වූවාය. එය නොමැතිව ඇය වෙතින් හිස් බවක් දිස්විය.

ආහාර ගැනීම යනු දුන් මූසල කටයුත්තකි. අම්මාගේ රස නහර පිනවන කකුළු ව්‍යංජනයෙහි සුවඳ, යාපනයෙහි මිහිරි සුළං රැල්ලෙහි මුසුව අප්පාගේ නීති කාර්යාලයට පාව යයි. ඔහුට සිටින්නේ සේවාදායකයින් හතර දෙනෙකුට අඩු ප්‍රමාණයක් නම්, ඔහු ඔවුන්ට දහවල් ආහාරය ගැනීමට ආරාධනා කළේය, එය අම්මා කෝප ගැන්වූ පුරුද්දකි. එතෙකුදු වුවත්, අප්පාගේ සෙල්ලක්කාර වැඩවලට ප්‍රිය කළ අම්මා, නීති කටයුතු කරගන්නට ආ උදවියට බත් සහ කකුළු ව්‍යංජනය බෙදන්නේ කෝපය සඟවාගෙනය.

'රාධෝ, උදේ කෑම කන්න කරුණාකරලා' මගේ මුහුණෙහි ඇති බලාපොරොත්තු කඩවූ පෙනුම දකින ඇය, එය මා ඉදිරියේ ඇති කෑම නිසා ඇති වූ තත්ත්වයකැයි වරදවා වටහා ගනිමින් කියයි.

මම හිඳගෙන කෑවෙමි, මා තවදුරටත් කෑම රස වින්දේ නැත.

මම එලෙස ජීවිතයට පුරුදු වූයෙමි. හිස් අර්ථවිරහිත පැවැත්ම එය හරියටම පාන් සහ පරිප්පු ව්‍යංජනය ගිල දමන්නාක් මෙනි. අපි වසර දෙකකට පෙර අපගේ ගම් බිම් හැර ආවෙමු, දැන් අප්පා තවදුරටත් බොහෝ වැඩ ඇති නීති උපදේශකයකු නොවේ.

අප්පාගේ සියලුම පොත් පුළුස්සා දැමිණි. හැම නඩුවක් සඳහාම අප්පා ප්‍රයෝජනයට ගත් නීති ප්‍රඥප්තීන්, සීයාට අයිතිව තිබූ සාක්ෂි ආඥා පනත, කට්ක සංගමයේ සහ මුවර් සංගමයේ නායකයා ලෙසින් පාසලෙන් ලබා ගත් ජය එලක අපි දුටුවෙමු. අප්පා බොහෝ ආඩම්බර වන දිවුරුම් දෙන අවස්ථාවෙහි ගත් ඡායාරූපය ඒ සියල්ල කළු ගැසී ගිය, භූමිතෙල් ගඳ හැමූ ගිනිදැල් වලින්, නිවසෙහි තිබූ අනෙකුත් සියලු දේ සමග දැවී ගියේය.

මනිපුරි සාරිවලින් හා ඇගේ මවගෙන් ලද වළලුවලින් සැරසුණු අම්මා කලෙක බොහෝ සුන්දර කාන්තාවක වූවාය. පැරණි දෙමළ සාහිත්‍යයට ආදරය කළ අම්මා අද සම්පූර්ණයෙන්ම වෙනස් වූ අයෙකි.

අහිමිවීමේ බලපෑම අප්පා තුළින්ද පෙනෙන්නට තිබිණි. ඔහුගේ මුහුණ දැන් එල්ලී වැටෙයි, ඔහු දැන් ඔහුගේ දෛනික වැඩෙහි යෙදෙන්නේ කුදු ගැසී එමෙන්ම මුහුණෙහි සිනාවක් නොමැතිවය. දැන් සිටින්නේ මගේ පරණ අප්පාට වඩා සපුරාම වෙනස් කෙනෙකි. බ්‍රිතාන්‍ය, ලන්දේසි සහ පෘතුගීසීන්ට ලබාගත නොහැකි සරුසාර හරිත පරිසරය ගැන හෝ ජෙරමි බෙන්තම් වැනි නීති විශාරදයින් ගැන දැන් ඔහු කතා කරන්නේ නැත. මේ රටේ සිටි පැරණි විශිෂ්ට පාලකයින් ගැන කියවීම ඔහු නවතා ඇත. ලී කැටයම් දැමූ හාන්සි පුටුවේ ඉඳගෙන අකුරක් නෑර පුවත්පත් කියවූ ඔහු දැන් පුවත්පත් කියවීම නවතා දමා ඇත.

අප්පා මෙන්ම, නීතිඥවරයෙකු වීමේ මගේ සිහිනයන් ද බිඳී ගොසිනි. මට එයට කම් නැත. මා එය ගණනකට ගත්තද මට එය කරන්නට දෙයක් නැත. මගේ දෙපා මුල ඇති කුසුමක් වැනි මගේ අම්මා සහ අප්පා මට සිටීම ගැන මා කෘතඥ වන බව මම මටම කියා ගතිමි. ළඟ ඇති මොන්ටිසෝරි පාසලක සහායිකාවක ලෙස සේවය කිරීමෙන් මම ඔවුන්ට උදව් කරන්නට සහාය ලබා ගතිමි.

අප වාසය කළ ස්ථානයෙහි, රෙදි තිරයකින් වෙන් කළ කාමර

දෙකක් තිබිණි. මේ ඉඩකඩට අපි මසකට රුපියල් හාරදහසක් ගෙව්වෙමු. ඉතා කෙටි දැනුම්දීමකින් ලබාගත හැකි හොඳම තැන එය විය.

මා එතරම් ළමයින්ට බැඳුණු කෙනෙකු නොවේ, මොන්ටිසෝරි සහායිකාවක ලෙස මට කරන්නට තිබුණු ප්‍රධාන දේ අතරෙහි පොඩිවුන් වැසිකිළියට රැගෙන යාම, ඔවුන්ගේ වමනය සේදීම, සහ විවේක කාලයේදී ඔවුන්ගේ කෑම පෙට්ටි ඇරීම සහ වැසීම යනාදිය අයත් විය. මුළු මාසයටම මට රුපියල් පන්දහසක් ලැබිණි. අම්මා සහ අප්පා, නිතරම බුලත්විට හපන, නිරන්තරයෙන් ඉරුණු බැනියමක් ඇඳ සිටින තරබාරු සිංහල මිනිසෙකුට අයත් අසල ඇති කඩයට යාම හැර ගෙන් පිටත අන් තැනකට කිසිවිටෙකත් ගියේ නැත. මා එහි ගිය විට ඔහු සිය බුලත් කෙළ කටෙහි තුලනය කොටගෙන මා සමග හොඳින් කතා කළේය.

'ආ දුව, වනක්කම්' ඔහු දන්නා දෙමළ වචන කිහිපයෙන් ජනවාර්ගික සමගිය ජයගන්නට උත්සාහ කළේය. 'මොනවද ඔයාට ඕන?'

'නෙස්ප්‍රේ පැකට් එකක්' මම කුඩා කිරිපිටි පැකට්ටුවක් දෙස ඇඟිල්ල දිගු කර කියමි.

'ප්‍රශ්නයක් නෑ ශ්‍රී ලංකා' ඔහු ප්‍රීතිමත්ව කියයි.

ඔහුගේ සිත්ගත් වගන්තිය !

***හතර***

එදින මොන්ටිසෝරියෙන් පිටතට යන විට අසාමාන්‍ය ලෙස නොසන්සුන් බවක් මගේ සිතෙහි ඇති විය. මම පැංචන් කිහිපදෙනෙකුට සැර කළෙමි. ඔවුන්ගෙන් එක් අයෙක් හඬන්නට වූ අතර සිය දහවල ආහාරය වමනය දැමුවේය. අලුත් වමනය ගොඩ පිරිසිදු කිරීමට මා කරන්නට අකැමැතිම වූ දෙයකි. මගේ නිවසින් පිටව ගිය සහෝදරයා කිසි දිනෙක නොපැමිණෙනු මම අත් වින්දෙමි, මගේ නිවස ගිනිගෙන දැවී යනු දුටුවෙමි, මගේ පියා සහ මව අප විඳි වේදනාවේ ගිලී යනු දුටුවෙමි, අපගේ පවුලේ නම, අපගේ ජීවිත, අපගේ සිනාවන් යන සියල්ල අපගෙන් ඈත්ව ගොසිනි. මා සැහෙන්නට වේදනා විඳ ඇත, මම තවදුරටත් වමනය පිරිසිදු කරන්නට හෝ ඒවා අල්ලන්නට නොගියෙමි. මම එසේ නොකළෙමි.

මගේ උදව්වක් නොමැතිව, දරුවා වමනය කරන අවස්ථාවෙහිම මොන්ටිසෝරි විදුහල්පති එතැනින් ගියේය. මට දෝෂාරෝපණය කරනු ලැබිණි, අවමන් කරනු ලැබිණි. ඔවුන් මෙතෙක් ලද වඩාත් අදක්ෂම සේවකයා මා යැයි ඔහු කීවේය, පාසලෙහි හොඳ නමට අපකීර්තියක් වූ බවද, මේ ආයතනයට මා සුදුසු නොවන බවද ඔහු කීවේය. අනතුරුව පන්තිභාර ගුරුවරිය වෙත ගිය හෙතෙම ඔහු නැවත කිසිදිනෙක මොන්ටිසෝරියට 'ගමේ කෙල්ලන්' බඳවා නොගන්නා බව කියා සිටියේය.

සම්පූර්ණ කම්පනයකින් හා දුෂ්කරතාවකින් යුතුව මම ඔහුගේ ඇනුම්පද අසා සිටියෙමි, මට ඒ වෙනුවෙන් එකටෙක කළ නොහැකි නිසා උගුලකට අසුවූවාක් මෙන් හැඟීමක් ඇති විය. මගේ පසුතැවිල්ල පෙන්වන්නට මෙන් මට හිස නමාගෙන සිටියෙමි, මන්ද මම මගේ දෑස් එසවූයේ නම් ඔහු මගේ කෝපය දැකීමෙන්, මගේ පවුලට ඇති එකම අදායම් මාර්ගය වන මගේ රැකියාව අහිමි කොට මා ගෙදර යවනු ඇත.

මා එදින මොන්ටිසෝරියෙන් ආපසු යන විට, මට අපගේ ගෙවත්තෙහි තිබුණු කුඩා මිදි වැවූ ඉසව් සිහි විය, එම මිදි කෑමෙන් සියලු ප්‍රශ්න විසඳා හැරිය හැකි, අරුම පුදුම මිදිවැලක් වැවූ කුඩා ගැහැනු ළමයකු පිළිබඳව අප්පා මට කිය වූ ඉංග්‍රීසි කෙටිකතාවකින් පෙළඹුම් ලැබූ මම කුඩා කාලයේ අපගේ ගෙවත්තෙහි පිටුපස හොර රහසේ මිදි වැලක් වැවීමට පටන් ගත්තෙමි. මම ඒ මිදිවලට ආසා කළෙමි. සැනසිල්ලේ සිටින්නට මා ගියේ එතැනටය. කර්කශ රස සහිත මිදි, එහි ලා දුඹුරට හුරු රතු පැහැය සහ පිරිපුන් බව, ජීවිතය හා එහි හදිසි වෙනස්කම් පිළිබඳ ආවර්ජනය කරන්නට මට ඉඩ ලබා දෙයි. මා මිදි ගෙඩියක් කන හැම විටකදීම මගේ මුවට සිනාවක් නැගෙයි.

කොළඹ හිරු මා සහ මගේ ඇඳුම් පැළඳුම් සියල්ල දහඩියෙන් නහවයි. මෙහි මිදි වැවූ ඉසව්වක් නැත, එහෙත් මට හුදකලාව සිටින්නට දැඩි ලෙස වුවමනා විය. අපගේ කුඩා කුටිය මොන්ටිසෝරියේ සිට විනාඩි පහක පමණක් දුරින් පිහිටියේය, එහෙත් මට ඒ වෙත හැරෙන්නට අවශ්‍ය නොවීය. අපගේ ගිනිගත් නිවසින් පලා ආවාට පසුව සහ කොළඹ කුඩා කුටියට, ලොරියක පොදිගැසී ආවාට පසුව ප්‍රථම වතාවට ඇවිදින්නට යාමට මම තීරණය කළෙමි. දුරකතන කුඩුවකට මා ළඟා වෙද්දී මගේ හදවත ගැහෙන්නට විය, මම අම්මාගේ ජංගම දුරකතනයට කතා කළේ,

මේ මුළු කාලයටම කියන ප්‍රථම බොරුව කීමටය. 'අම්මා පැයක් පරක්කු වෙනවා....අතිරේක වැඩ තියෙනවා' මගේ ප්‍රකාශය පිළිගත් අම්මා එකඟතාව පළ කළාය.

හිත හදාගන්නට, සන්සුන් වන්නට, හඬන්නට, වැළපෙන්නට මම පැයක කාලයක් ගත්තෙමි... එහෙත් මා කොහි යන්නද?'

පැමිණි ඊළඟ බසයට මම නැගුණෙමි. මම කලබල නොවූයෙමි. යම් විස්මයජනක කරුණක් හේතුකොටගෙන මා බැසිය යුත්තේ කොතනින්ද යන්න මට දැනෙනු ඇතැයි සිතුවෙමි. මම බස් කොන්දොස්තරට රුපියල් දහයක් දී ඉවත බලා ගත්තෙමි. ඔහු උරහිස් සෙලවූයේය, ඔහු කතාවට උත්සාහ කළේ නැත. බස් නැවතුම් පහකට පසුව මම බැස ගත්තෙමි. මම ඒ වටා මද වේලාවක් ඇවිදිමින් සිට මගේ ස්ථානය සොයා ගත්තෙමි. දැන්වීම් පුවරුවේ 'භද්‍රකාලී අම්මාන් කෝවිල' යැයි සඳහන්ව තිබිණි. එම දෙවඟ නගේම කෝවිලක් යාපනයේදී මම සියක් වරක් පසුකර ගොස් ඇත්තෙමි, එසේ පසුකර ගියේ එදෙස නොබලා සහ ඒ ගැන නොසිතමිනි. එහෙත් අද පුදුම සහ හුදකලා කොළඹ නගරයේ, මේ කෝවිල මගේ ගැලවුම බවට පත්වන්නට ගියේය.

මට, මා දෙමළ චිත්‍රපටයක ආරම්භක දර්ශනයෙහි සිටින්නාක් මෙන් හැඟී ගියේය, සූර්යා ප්‍රධාන නළුවාය, වීරවරිය කෝවිලට ඇතුළු වෙයි, ඇගේ ලස්සන දෙපා කෝවිල් බිමෙහි තැබෙයි. සිත් වසඟ කරන සංගීතය පසුබිමෙන් වාදනය වෙයි, හොරණෑවෙහි හඬ සමග සංගීතය වඩ වඩා වේගවත් වෙයි. මම මගේ ධ්‍යානයෙන් මිදුණෙමි. දෙවඟනගේ ප්‍රතිමාව ඉදිරියේ රංචු ගැසී ඉඳගෙන සිටින කාන්තාවන්ගේ සාරිවල දීප්තිමත් රතු, නිල් සහ කොළ පැහැයන්, මිහිරි හඳුන්කූරු සුවඳ සමග හා කපුරු සමග මුහුවෙන විට, හා මගේ මුළු ජීවිත කාලයේම කතා කළ භාෂාව යන සියල්ල මා වටා විය. ඔවුහු මා ඇතුළට කැඳවාගෙන ගියහ. මම ගැඹුරු හුස්මක් ගත්තෙමි. පරිසරය එහි පරිපූර්ණත්වයෙන් හා එහි උත්කෘෂ්ඨ සුන්දරත්වයෙන් යුතුව මා වැළඳ ගත්තේය.

මට යාඥා කිරීමට අවශ්‍ය වූයේ සන්තුෂ්ටිය ලබාගැනීමට සහ කාලි දෙවඟනගෙන් මට අද දවස ලබාදෙන ඉල්ලා සිටීමටය. ශක්තියේ දෙවඟන කාලි. එතරම් දිගු කාලයකට මම යාඥා කිරීම සඳහා මගේ දෑත්

එක්කොට නැත්තෙමි.  එසේ කරන්නට මා දණ ගැසූ විට, මා හඬන බව වටහා ගත්තෙමි. තුන් වසරකට පෙර අප රාත්‍රී ආහාරය ගනිමින් සිටියදී අපගේ නිවසට පොලිස් නිලධාරීන් කඩා වැදුණු අවස්ථාවේදී හෝ මා හඬා වැටී නැත. අම්මා අප්පා සමග විවාහ වන විට ලැබුණු දෑවැද්ද වන හොඳම තේක්ක ලීයෙන් සාදන ලද කැබිනෙට්ටුවක පිළිවෙලට අසුරා තිබූ අපගේ ඡායාරූප සහ පිඟන් කෝප්ප ආදිය බිමට විසිකර දමා අපගේ නිවස කොල්ල කන අවස්ථාවේදීවත් මා හඬා වැටී නැත. අම්මා සහ මම තවමත් අපගේ නිදන ඇඳුම්වලින් සිටියදී, අප්පා ඔහුගේ සරම සහ කමිසයෙන් සැරසී සිටියදී අප එළියට ඇද දැමූ අවස්ථාවේදීද මා හඬා වැටී නැත. අපගේ කෑම මේසයට ඒ මිනිසුන් පෙට්රල් වත්කරන විටදීද මම නොහැඬුවෙමි. විසිවසරකට පෙර අප්පා සාදන ලද අපගේ නිවස, අප්පාගේ දෑතින්ම සකසන ලද ගෙවත්ත, ඒ සියල්ල ගිනිගෙන දැවෙනු අපි බලා සිටියෙමු.

ගිනිදැල්. මගේ නොපැහැදිලි ඇස්වලට, දෛනික පූජා සඳහා එක්වූ බැතිමතුන්ට දෙන කට්පුරම් දැවෙන සැර කපුරු පෙනෙන්නට විය. පූජාවට පැමිණ සිටි ගැහැණු මට ගිනිදැල්ලට ඇදෙන මෙරුන් සිහිකර දුන්හ. ඔවුහු අන්ධ ලෙසින් ප්‍රතිමාව දෙස බලාගෙන, දෑත තම හිසෙහි තබාගෙන, නොනවත්වා 'අරෝහරා' යි මහ හඬින් ගායනා කරති. අයියාර් තේරුම් ගත නොහැකි මන්ත්‍ර මතුරමින්, දෙවඟන වෙත ගිනිදැල්වමින් හා ඇය වෙත මල් විසිකරමින් සිටිද්දී, සමහරෙක් බිම වැතිර දේව වන්දනාව කළහ. ඒ සියල්ල දෙස බලා සිටි මට ඒවා ඉතා ප්‍රබල බව පෙනී ගියද, මා කළ යුතු නිවැරදි දෙය එය යැයි මට එතරම් විශ්වාසයක් නොමැති විය. මට දැන් සිතුණේ මා මෙහි නොපැමිණියේ නම් හොඳය කියායි. මට උපකාර පතා යා හැකි දෙවියෙක්, මට උපකාර කරන කෝවිලක් හෝ පූජකවරයෙක් නොවීය. මේ සියල්ල පිළිම පමණකි, මා තනිවී ඇත. මගේ දුබලතාවෙහි උපහාසාත්මක ලකුණු මම දළ ලෙසින් පිසදා හැරියෙමි. කඳුළු දෙමළ චිත්‍රපට වීරවරියන් උදෙසාය, ඒ ලස්සන තොල්සායම් සහ සාරි ඇඳගත් වීරවරියන් උදෙසා යැයි මම කෝපයෙන් සිතුවෙමි.

මම මුල්ලක ඉඳගෙන ප්‍රධාන වශයෙන් පූජාව අවසන් කොට කෝවිලෙන් පිටව යන ඔවුන්ගේ නළලෙහි ශුද්ධ වූ අළු ගා ගත් සහ පොට්ටු තැබූ කාන්තාවන් ඇතුළු මිනිසුන් සියයක් පමණ දුටුවෙමි.

කවුරුන් හෝ මා දෙස බලනු මට දැනිණි. මම වටපිට බැලුවෙමි. එහෙත් දෙවියන් යදින ගැහැණු සහ මිනිසුන් හැර අන් කිසිවක් නොදුටුවෙමි. 'කට අරින්න එපා' ගොරහැඩි කටහඬකින් මගේ කනට එසේ කොඳුරනු ඇසිණි. අන් හැමදෙනම දෙවියන් යදිමින් සිටි අතර, මම කෑ ගැසීමට බියවීමි. ඔහුගේ මිටින් තවමත් ඔහු මා අල්ලාගෙන සිටි අතර, මා මුහුණ බැලීමට බියවූ මේ මිනිසා, කෝවිලෙහි මිනිසුන් සහ ගැහැණුන් යදිමින් සිටි නිහඬ පෙදෙසට පියමන් කොට මා කාලි පිළිමය පසුකර කැඳවාගෙන ගියේය. මම අන්ධ ලෙසින් ඔහු සමග ගියේ දවස මා වෙත රැගෙන ආ චිත්තවේගයෙන් අවුලට පත්වෙද්දීය. මා අල්ලාගත් තැනැත්තා මට යන්නට ඉඩහළ අතර මම ඔහු දෙස බලන්නට කැරකුණෙමි. ඔහු වයස විසිහයක් පමණ වූ අතර, ඔහුගේ රැවුල සහිත මුහුණෙහි කෝපත් පෙනුමක් තිබිණි. ඔහුගේ අවුල් හිසකේ, ඔහුගේ පෙනුමෙහි වූ බියකරු බව අඩු කරන්නට සමත් වූයේ නැත.

'උඹලා සිංහලට ආදරේ ඇති අවජාතකයො' ඔහු පිම්බේය. 'ඒකෙන් අන්තිමේ උඹලා නවතින්නෙ නගරෙක මේ අප්‍රසන්න තැනවල. අපේ ඊළම ගැන උසාවියෙදී කතා කරන්න බයවෙච්ච මහා ධර්මලිංගම්ගෙ දුව මුණ ගැහිච්ච එක ඉරණම තමයි. මොකද නිකන් අන්දමන්ද වෙලා වගේ බලන්නෙ? ඇයි උඹ මා දිහා ඒ විදියට බලන්නෙ? මතක නැද්ද ප්‍රේක්ෂකාගාරෙ ඉඳගෙන මාවයි, අපේ මිනිස්සු දෙන්නෙකුයි අවුරුදු තුනකට ඉස්සෙල්ල හිරේ දානකොට ගරු සරු ලෙස අප්පා දිහා බලාගෙන හිටියා. මගේ මූණ මතක නැද්ද? උඹ වෙනස් වෙලා නෑ. උඹලගෙ මුළු පවුලෙන්ම පලි ගන්නවා කියලා මං දිව්රුවා, මට මෙතෙන්දි උඹව මුණගැහුණෙ දෙවියන්ගෙ කැමැත්තට'

මා ඔහු දෙස නෙත් දල්වා බලා සිටින විට, ඔහු කවුදැයි යන්න මගේ මතකයට ආවේය.

ඔහුගේ කුලය, ඇදහිල්ල, ආගම කුමක් වුවද, ඕනෑම කෙනෙකු අපගේ නිවසේදී පිළිගැනෙයි. අප්පා උනන්දුව දක්වන්නේ සත්‍යය කෙරෙහි පමණය. යාපනයේ සියලුම නීතිඥයින් පෙනී සිටීම ප්‍රතික්ෂේප කළ මතබේදාත්මක නඩුවකට පෙනී සිටීමට අප්පා උනන්දු වූයේ ඒ ප්‍රතිපත්තියට අනුවය. ඔවුන්ගේ බඳවාගැනීමේ වැඩ පිළිවෙලෙහි කොටසක් අනුව කෙරෙන, ළමයෙක් පැහැරගෙන යාම සම්බන්ධයෙන්,

එල්ටීටීඊ කණ්ඩායමේ සැක සහිත තිදෙනෙක් පිළිබඳ නඩුවක් උසාවිය ඉදිරියට ගෙන එනු ලැබිණි. අප්පා නිර්භයව අතුරුදහන් වූ ළමයා සහ ඔහුගේ දෙමාපියන් වෙනුවෙන් පෙනී සිටියේය, එමෙන්ම අප්පා නිර්භීතව අධිකරණයට කරුණු ඉදිරිපත් කළේය. චූදිතයන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥයාට, අප්පාගේ කරුණු වලට එරෙහිව කිසිදු අවස්ථාවක් ලැබුණේ නැත. දමිළ වෙමින්, එල්ටීටීඊයට එරෙහිව පෙනී සිටි අප්පා කෙරෙහි කෝපයෙන් යුතුව තරුණයින් තිදෙනා බලා සිටිනු උසාවියේදී අපි දුටුවෙමු. උසාවියේ ක්‍රියාපටිපාටිය යන දෙස මා බලා සිටින අතර තුර, එක් සැකකරුවෙක් අප්පා දෙසත්, පසුව මා දෙසත් බැලුවේ පසුව පළිගැනීම සඳහා අපගේ මුහුණු හොඳින් මතකයේ තබා ගැනීමට සේය. දැන්, අවුරුදු ගණනාවකට පසුව, මම මේ මුහුණ දෙස නෙත් දල්වා බලා සිටියෙමි.

ඔහු මගේ අත සැහැසි ලෙස අල්ලාගෙන සිටියද, ඔහුගේ දෑස් නොසන්සුන් ලෙස වටපිටාව වෙත යොමුවනු මම දුටුවෙමි. අපි සිටින්නේ යාපනයේ නොවේ, ඔහු පෙන්වන ආකාරයේ පාලනයක්ද ඔහුට මෙහි නැත. ඉදින් කණු කිහිපයක සෙවණැලි අතරෙහි සැඟව, පිටුපස සිටියේ වී නමුදු, මා කළ යුතු වූයේ කෑගැසීමය, එවිට, ඔහු කරදරයට පත්වනු ඇත. මගේ කට වසාගෙන සිට මට ඇති විය. මා නරඹා තිබුණු සියලුම දෙමළ චිත්‍රපටවල මගේ සිහියට ආවේ කිසිදු අවිශ්වාසයක් නොකළ අවජාතකයාට මම අත දිග හැර කම්මුල් පහරක් දුන්නෙමි.

'උඹ ලැජ්ජා වෙන්න ඕන උඹ ගැන' මම ඔහුට රුදු ලෙසින් කෑගැවෙමි. 'රටට එරෙහිව යන එක? උඹ කරන දේ උඹගෙ අම්මා අනුමත කරනවද? උඹට රැට නින්ද යනවද? මිනිසුන්ගෙ ජීවිත විනාශ කෙරිල්ලයි, ත්‍රස්තවාදියෙක් වෙනවයි වෙනුවට උඹේ පවුලට සැලකුවොත් නරකද? උඹේ සහෝදරයින්ට ඉගැන්නුවොත් නරකද? උඹට මල්ලිලා නැද්ද? උඹට ඕන ඒගොල්ලොත් ත්‍රස්තවාදියෝ වෙලා, ජීවිතේ ඉතිරි කාලේ හිරකූඩුවෙ ඉන්නවා බලන්නද? උඹට ඕන නැද්ද උඹේ අම්මා හිනාවෙලා සතුටින් ඉන්නවා දකින්න? උඹ ත්‍රස්තවාදියෙක් වෙච්ච හින්දා එයා හිනාවෙලා ඉන්නවද?'

ඔහුගේ ඉරියව් වෙනස් විය, ඔහුගේ ඇසෙහි බලාපොරොත්තු සුන්වූවාක් බඳු බැල්මක් විය. එය මා තව තවත් කෝපයට පත් කරවූවා පමණකි. 'ඔහේ කසාද බැඳලද? ඔහේට ඕනෙ ඔහේගේ බිරිඳ වැන්දඹුවක්

වෙනවා දකින්නද? දරුවො ගැන? ඔහේට දරුවො ඕන, ඊළඟට ඔහේ මැරිලා ගිහින්, දරුවො තාත්තා කෙනෙක් නැතුව හැදෙන්නද ඕන? බිරිඳ වැන්දඹුවක් වෙන්න? කවුද කන්න බොන්න දෙන්නෙ ඇයට? ඔහේගේ ත්‍රස්තවාදී සංවිධානය ඇයට විශ්‍රාම වැටුපක් දෙනවද? ඔහේට ගෞරවනීය මරණයක් අත්වෙනවද? තාත්තා කෝ කියලා ඇහුවම ඔහේගේ දරුවො දෙන උත්තරේ මොකද්ද? ඔහේ වගේ අමනයො හින්දා අපිට මේ රටේ සාමයෙන් පාරෙ සැනසිල්ලෙ ඇවිදගෙන යන්න බෑ. ඔහේලා දෙමළ ජනතාවට මහ අවමානයක්' එසේ කියා මම කතාව අවසන් කළෙමි.

මම වෙහෙසට පත්වීමි, මගේ ශක්තිය හීන විය, එය නිමා විය.

දැන් මිනිසා කතා කළේය. ඔහුගේ ස්වරය ශාන්තය, තැන්පත්ය. 'ඔයා දැන් ඉන්න තැන ගැන සතුටින්ද ඉන්නෙ? කෝ ඔයාගෙ ගෙවල්, ඉඩම්, තාත්තා අමාරුවෙන් හම්බකරපු සල්ලි? එයාගෙ රට ගැන එයාට දැන් කියන්න තියෙන්නෙ මොනවද? ඔබේ රජය ඔබව ආරක්ෂා කළාද? ඔබේ පියා දැන් හිනාවෙනවද? අම්මා කොහොමද? ඔයා පුරුදුවෙලා හිටිය සැපවත් ජීවිතය කොහොමද? ඔයාට කොහොමද? ඒ ඔක්කොම ගැන විස්තර කොහොමද?

මට පිළිතුරු තිබුණේ නැත. මගේ ජීවිතය නැවත ආවර්ජනය කිරීමෙන් මට මා පරාජය වී ඇති බව හැඟිණි. එය මට දුර්වල බවක්, ගොදුරු වී ඇති බවක් දනවන්නට හේතු විය. මා එදින උදය අහාරය හෝ දිවා ආහාරය ගෙන තිබුණේ නැත, ඒ සමග සිදු වූ සියලු දෙයද සමගින් මට ක්ලාන්ත ගතියක් දැනුණේය. මම යන්නට ඔහුව තල්ලු කළෙමි, එහෙත් අනතුරුව මට කරකැවිල්ලක් ඇති විය, මට සිහි නැති විය. මා වැටෙන විට ඔහු මා අල්ලා ගත්තේය.

මට සිහිය ලැබුණේ, පරීක්ෂා කරන මේසය මතදීය. මා උඩින් තිබූ විදුලි පංකාවකින් සුවපහසු සුළඟක් හමා ආවේය. මදක් ඈතින් ඉංග්‍රිසි බසින් කතා කරන හඬ මට ඇසිණි. 'මගේ පෙම්වතියට හොඳ වෙයිද ඩොක්ටර්' අර මිනිසාගේ හඬින් අසනු ඇසිණි.

'විවේකයකුත් එක්ක එයාට හරියාවි' වෛද්‍යවරයා පිළිතුරු දුන්නේය.

මම මගේ දෑස් හැරියෙමි, වෛද්‍යවරයා සහ මිනිසා දොර ළඟ සිටිනු දුටුවෙමි. මා ඉදිරියේ සිහින් ශරීරයක විවිධ කොටස්වල රූප සටහන් දකින්නට ලැබිණි. මා සිටියේ ඩිස්පෙන්සරියේය. වහා නැඟිටින්නට මම උත්සාහ කළෙමි, එහෙත් දූන් මා පසුපස සිටි ස්ථුල හෙදියක, මා පසින් මතුව, කාරුණිකව කතා කොට මට වැතිරෙන්නැයි කීවාය. 'ඔයා හුඟ වෙලාවක් විවේක ගන්න ඕන මැඩම්' ඇය කීවාය.

ඇය මුදු ලෙස මා කොට්ටයකට ළං කළ අතර මම ත්‍රස්තවාදියා දෙස නැවත බැලුවෙමි. ඔහු වෛද්‍යවරයාට අතට අත දී අනතුරුව මා වෙත පැමිණියේය.

'මට පුළුවන්ද... මට දෙනවද ඔයාගෙ සෙල්ෆෝන් එක ටිකකට. මට මගේ දෙමාපියන්ට කතා කරන්න ඕන'

'ඔයා පිට හිටියෙ විනාඩි දහයක් විතරයි' මට සහතික වීමට ඔහු කීවේය. 'අපි ඉන්නෙ කෝවිල ළඟ ඩිස්පැන්සරියෙ, ඔයා කලන්තෙ හැදිච්ච ගමන්ම මම ඔයාව මෙතෙන්ට ගෙනාවා' ඔහු මට දුරකථනය දුන්නේය, මම එය ගත්තෙමි, එහෙත් ඇමතුමක් නොගත්තෙමි.

මම නිහඬව විදුලි පංකාව කරකැවෙන ආකාරය බලමින් සිටි අතර, මගේ දෑසින් කඳුළු ගලන්නට විය, ඒ කඳුළු මගේ කන් වටා එකතු වී තිබිණි.

'මගේ නම රාජන්' ගරුසරු සහිතව මගෙන් ඈත්ව හිඳගනිමින් ඔහු කීවේය.

මට ඔහුට ස්තුති කරන්නට වුවමනා වූ නමුදු මම අපහසුවට පත්වීමි. ඉදින් මම මගේ දෑස් වසා ගතිමි.

ඔහු ත්‍රී විලර් රථයකින් මා ගෙදර කැඳවාගෙන ආවේය, පටුමගෙ හි කෙළවර නවතන ලෙස මම ඔහුට කීවෙමි. 'ඔයාට විශ්වාසද?' ඔහු ඇසුවේය. 'මං හිතන්නෙ නෑ ඔයා ඇවිදින්න පුළුවන් තත්ත්වෙ ඉන්නවා කියලා'

'නෑ' මම ස්ථිරසාර ලෙස කීවෙමි.

'ලේන් එකේ මුල කරුණාකරලා'

ඔහු අර සිත අවුල් කරවන බැල්ම යළි හෙලුවේය, පටුමඟට පැමිණි විට රථය නවතන ලෙස රියැදුරුට සංඥා කළේය. මා බැස ගත් පසු 'හෙට කෝවිලට එනවා' දැයි ඔහු ඇසුවේය.

මම වදනක් හෝ නොදෙඩුවෙමි. මම යන්නට ගියෙමි.

*පහ*

අප යාපනයේ සිටියදී අම්මා අප සියලුදෙනාගේ හඳහන් බැලුවාය. එක් දිනක් ඇය සිත කලබලයෙන් ගෙදර එනු මට මතකය. ඇය වචනයක් හෝ කතා කළේ නැත, එහෙත් ඇගේ මුහුණෙහි පුදුම බැල්මක් තිබිණි.

'මොකද අම්මා?' කාරණය කුමක්දැයි මම සරදම් ලෙසින් විචාළෙමි.

'අපි අලුත් තැනකට යනවා. අපි හැමෝම අමාරුවේ වැටෙන වැඩක් ඔයා කරනවා' අම්මා එසේ කීවේ චෝදනාත්මක විලාසයෙන් මා දෙස බලමිනි.

අප්පා සහ මම වත්තෙන් කඩාගත් නැවුම් කෙසෙල් ගෙඩි සමග රොටි කමින් සිටියෙමු, අම්මා එය කිවූ අභූත ආකාරයට අප්පා සහ මම සිනාසෙන්නට වීමු. මම ගොස් මගේ අදරැති නාටකීය අම්මා වැළඳගෙන, ජීවිතය කෙතරම් අපුරුදැයි මටම සිනා පෑවෙමි.

*හය*

මොන්ටිසෝරියෙහි සිට පැමිණීම ප්‍රමාදවීම සම්බන්ධව සමාවට කරුණු ලෙසින් මගේ බොරු කීම වඩ වඩා විස්තාරණය වන්නට විය. රාජකාරියෙන් පසුව, මම කෝවිලට යාමට බසය අල්ලා ගැනීමට දිව යමි.

කෝවිලේදී, කතාබහ වඩාත් සාමාන්‍ය දෙයක් ලෙසින් පෙනිණි. පූජාවෙහි ශබ්දය සහ දිව්‍යමය ආශිර්වාද ඉල්ලා සිටින අප්‍රමාණ හඬවල් අතරතුර අපි අපගේ හඬවල් අසමු. මම වෙනම රාජ්‍යයක් හෝ ඊළම කෙරෙහි විශ්වාස නොතැබුවෙමි, ළමා සොල්දාදුවන් බඳවා ගැනීම ගැන විශ්වාසය නොතැබුවෙමි. ඔහු බහුතර රාජ්‍යයක් හෝ බහුතර කොටසෙහි

කැමැත්ත පරිදි කිසිත් නොවිමසා සමාජයෙහි එක කොටසක් සම්බන්ධයෙන් කෙරෙන දේ ගැන විශ්වාසය පළ නොකළේය. එතෙකුදු වුවත්, අපගේ වෙනස්කම් තිබියදී, අපි සම්බන්ධතාවට මඟක් සෙවීමු. මා ඔහු සමග ගත කරන කාලය තුළ, මා අම්මා සහ අප්පාට එරෙහිව යන බව දැන සිටියෙමි. මම අපරාධකරුවෙකු විය හැකි කෙනෙක් මුණ ගැසෙන බව දැන සිටියෙමි. බන්ධනාගාරයේ රාජන් ගත කළ වසර කිහිපය මේ කාර්යභාරය සඳහා වන ඔහුගේ උද්යෝගය අඩුකර නැති බව දැන ගැනීමෙන් ඔවුහු භීතියට පත්වනු ඇත, ඔහු තවමත් එල්ටීටීඊ හට කණ්ඩයේ සිටියේය, දැන් මෙහි සිටින්නේ භයානක මෙහෙවරකට බවටද සැක නැත. ඔහුගේ මෙහෙවර කුමක්දැයි මම නැසුවෙමි, ඔහු මට කිසිවිටෙක එය කීවේද නැත. මට එය දැනගැනීමට අවශ්‍ය නොවීය. ඔහු සමග හිඳීම හරි යැයි සිතීම මට වැදගත්ම දෙය විය. මා උමතු වීගෙන එන විට, මට සියල්ල අහිමි වෙමින් යන විට මට මුණ ගැසුණු රාජන් මගේ ගැලවුම්කරුවා වූයේය. මදින් මද, කෝවිලේදී වූ අපගේ දීර්ඝ කතාබහ හරහා අපි එකිනෙකා හොඳින් හඳුනා ගතිමු. අපි ප්‍රධාන වශයෙන් ජීවිතය, දේශපාලනය, සිහින සහ අනාගතය ගැන සාකච්ඡා කළෙමු. එහෙත් ඒවා ගැන අප සිතූ ආකාරයන් බොහෝ වෙනස් විය. එහෙත් මේ වාද කිරීම් අප දෙදෙනා එකිනෙකාට ළං කරවීය. හත් වසරකට පෙර, ඔහුගේ බාල සහෝදරයා මඩකලපුවේ, ඔටාමාවාඩිහි ඔවුන්ගේ නිවස අසල වූ කුඹුරක මැරී සිටියදී සොයාගත් විට ඔවුන්ගේ ලෝකය බිඳී ගිය ආකාරය ඔහු මට කීවේය. ව්‍යාපාරයට බැඳීමට ඔහුට බලපෑවේ මේ සිද්ධියයි.

**හත**

එය සෙනසුරාදාවක් විය. මොන්ටිසෝරියේ විවිධ ප්‍රසංග පුහුණුවක් ඇති බව මම අම්මාට කීවෙමි. රුපියල් පහේ සන්සිල්ක් පැකට්ටුවකින් මම මගේ කෙස් කළඹ හොඳින් සේදුවෙමි. රාජන් සමන්පිච්ච සුවඳට කැමති වූ අතර, මම මගේ පඩියෙන් රුපියල් තුන්සිය පනහක් වියදම් කොට සමන්පිච්ච සුවඳ මුසු සුවඳ විලවුන් බෝතලයක් අසල ඇති සාප්පුවකින් මිලට ගෙන, මගේ සිරුරට ඉස ගත්තෙමි. ඔහුට වයස අවුරුදු පහේදී පමණ, ඔහුගේ ජනේලයෙන් පිටත තිබූ සමන්පිච්ච පැලයක් පිළිබඳ ඔහු මට කියා තිබුණි. ඔහු කුඩා කාලයේදී, සර්පයෙක් දෂ්ට කිරීමෙන් ඔහුට ඔහුගේ අම්මා අහිමි වී ඇත. හැම උදෑසනකම, භක්තිමත් ලෙස එක් සමන්පිච්ච

මලක් නෙලාගෙන ඔහුගේ අප්පා, අම්මාගේ ඡායාරූපය ඉදිරියේ තබන ආකාරය ඔහු මට කීවේය.

වැල්ලවත්ත පාරෙහි පසෙක ඔහු එනතුරු මා බලා සිටින විට, මගේ පෙනුම ගැන මම කලබලයට පත්ව සිටියෙමි. නගරය ජනාකීර්ණ වෙමින් තිබිණි. සමහර අය සුපිරි වෙළෙඳසැල් වලටද, තවත් සමහරු ලාබයට බඩුගැනීමට පාරෙහි සිටි වෙළෙඳුන් ළගටද යමින් සිටියහ. විනාඩි විස්සක් ගතවුවද ඔහු නොපැමිණියේය. මට ජංගම දුරකතනයක් තිබුණේ නැත, ඔහු කොහි ජීවත් වන්නේද යන්න මා නොදන්නා බව මට පසක් විය, ඔහු කොයිබට පැමිණෙන්නේද හෝ මා දැනසිටියේ නැත. මම තැති ගත්තෙමි, එමෙන්ම මම බියට පත් වූ අතර තනිව සිටියෙමි. ඔහු වෙත යන්නට මට ක්‍රමයක් නොතිබුණු අතර මම ඔහුගේ ආරක්ෂාව ගැන දුක් වූයෙමි. සයිරන් හඬ නගමින් මහත් ශබ්ද ඇති පාරෙහි ගිලන් රථයක් ගියේය. රථවාහන එයට යන්නට ඉඩ දුන්නේය. මට කළ හැකි වූයේ දෑස් දල්වා බලාසිටීම පමණකි. ඔහු මට ඔහුගේ දුරකතන අංකය නුදුන්නේ මන්ද? මා ඔහුට මගේ ලිපිනය නුදුන්නේ මන්ද? මට තිබුණු දෙය, එකම දෙය මට අහිමි කරගත නොහැකිය.

මගේ සිතිවිලි වලින් වෙහෙසට පත්ව, කාලය සහ අවකාශය පිළිබඳ අවබෝධය මට නැතිව, මම පාරෙහි සිටගෙන සිටියෙමි. මගේ මුහුණෙහි ගලායන කඳුළු පිළිබඳ අනවධානයෙන් සිටියෙමි. මගේ දුක්ඛිතකමෙහි ඇලී ගිය මම, ගිනි අවි දරූ ඔහුගේ ශක්තිමත්, රළු අතින් මා අල්ලන තුරු ඔහු මා ඉදිරියෙහි සිටගෙන සිටින බව නොදත්තෙමි. ඔහු මගේ අත ගෙන 'ඔයා හිතුවද මම එන්නෙ නෑ කියලා'යි ඇසුවේය.

ඔහු මගේ කඳුළු දැක පුදුම වූ අතර, මම ඔහුට කෑගැවෙමි. 'හොඳයි මට කමක් නෑ. මට පුළුවන් ලේසියෙන් වැල්ලවත්ත පොලිසියට ගිහින් කියන්න මගේ පෙම්වතා අතුරුදහන් වෙලා කියලා' ඔහු සිනාසී මගේ කෙහෙ වැටියෙන් ඇල්ලුවේය.

අපි බසයට නැග සාමාන්‍යයෙන් පූජක පක්ෂයට වෙන් කර ඇති බස් රියැදුරුගේ අසුනට පසුපස අසුනේ ඉඳ ගතිමු. අපි කතා නොකළෙමු, නිහඬව ගියෙමු. මට යාබදව සිටින ඔහුගෙන් මට ආරක්ෂාව දැනෙයි. මගේ රාජන්. බස් නැවතුමකදී බසය නැවතූ අතර, කහ සිවුරු හැඳ ගත්

බෞද්ධ භික්ෂූන් දෙනමක් බසයේ ඉදිරි දොරෙන් බසයට ගොඩ වූහ. මම ඉබේම නැගිට, මගේ අසුන පිරිනැමුවෙමි, ගෞරවයෙන් හිස නැමුවෙමි. රාජන් ඉඩ නොදුන් අතර, අවඥා සහගතව බැලුවේය. භික්ෂූහු දෙදෙනා ඉවසිල්ලෙන් බලා සිටියහ. මම මගේ අත දිගු කොට ඔහුට අසුනෙන් නැගිටින්නට බල කළෙමි. අපි ඊළඟ නැවතුමේදී කෑම කඩය අසල බැස තවමත් අත් අල්ලාගෙන සිටියෙමු.

අප පාරෙහි ගමන් කරන විට මේ ආකාරයට අත් අල්ලාගෙන සිටියේ පළමු වතාවටය, බෞද්ධ භික්ෂූන් වහන්සේලා දෙනමක් මේ ආකාරයට අප ළං කරවීමට හේතු පාදක වීම කෙතරම් සරදමක්දැයි මට සිතිණි. මා එය ඔහුට කී විට ඔහු රවා බැලුවේය, එහෙත් ඔහුද ප්‍රීතියට පත්ව ඇති බව පෙනිණි, මා ඔහුට සිනාසී, වැලමිටෙන් ඇන්න විට, ඔහු මට විරිත්තුවේය. ඉන්පසු අපි නිසොල්මන්ව ගමන් කළෙමු. මට මීට පෙර මෙබඳු ශාන්ත බවක් දැනුණේ නැත, නොදන්නා නගරයක මා එතරම් නොදන්නා, ඔහුගේ වෘත්තිය, මිනිසුන් තර්ජනයෙන් බියගැන්වීමට අවශ්‍යයෙන්ම සම්බන්ධ වී ඇති, යුද්ධයට පිරිමි ළමුන් හා මිනිසුන් පුහුණු කරවන, අනෙකුත් මිනිසුන් සමග සටන් කරන හා මිනිසුන් මරාදමන මිනිසකු සමග ගමන් කරමින් සිටියේ වී නමුදු මට ආරක්ෂිත බවක් දැනෙන්නට විය. කෙසේ වුවද, ඔහු කළ දේ මා කෙරෙහි බලපෑමක් ඇති කළේ නැත. මම දැනටමත් සාමාන්‍ය ප්‍රතිචාර සහ සාමාන්‍ය උද්වේගයන්ට ඔබ්බට ගොස් සිටියෙමි. මගේ ජීවිතය රඳා ඇත්තේ මෙරට පොලිසියට හා සන්නද්ධ හමුදාවන්ට අවශ්‍ය වන්නාවූ මිනිසකුගේ දෑතෙහි බව දැන ගැනීමෙන් මා බියට පත්වූයේ නැත. මම ඔහුගේ රළු අත්ල තද කොට අල්ලාගෙන සිටීම නතර කළෙමි.

ඉක්මනින් අපට බඩගිනි වූ අතර, අපි අප පසුකර ගිය 'සරස්වතී ලොජ්' නම්, එළවළු කෑම පමණකින් යුතු දෙමළ අවන්හලට ගියෙමු. ඒ වනවිට දහවල ආහාර වේලාව පසුවී බොහෝ වේලාවක් ගත වී තිබූ බැවින්, අප තෝසේ සහ සාම්බාර් හොඳි ඉල්ලූ නමුත්, වේටර තැන ඔහුගේ කොළඹ දෙමළ උච්චාරණයෙන් 'මැඩම්, අල කරිය විතරයි තියෙන්නෙ' යි කීවේය.

තෝසේ සමග අල කරිය ගනිමුයි මා යෝජනා කළ විට රාජන්ගේ මුහුණ ඇඹුල් විය. 'ඒක සිංහල කෑමක්' ඔහු සම්ච්චල් කළේය. මම වේටර තැන කැඳවා අල කරිය ගෙනෙන ලෙස කියා එය ගෙන ආ පසු, නිහඬව

'සිංහල අල කරියෙන්' මදක් ඔහුගේ 'දෙමළ තෝසේ' මතට සිනාසෙමින් දැමුවෙමි. කෝප වූ බවක් පෙන්වීමට උත්සාහ කරමින් එක වචනයකුදු නොදොඩා ඔහු සිංහල අර්තාපල් ව්‍යංජනය කෑවේය.

*අට*

අම්මා සහ අප්පා පසුගිය සතියේ මගේ සිනාසීම්ද, මගේ මිමිණිලිද, හඳුනාගෙන තිබිණි. මා රාජන් හමුවී පැමිණීමෙන් පසුව එදින අම්මා සමන්පිච්ච සුවඳ මුසු සුවඳ විලවුන් ඉව කළාය.

'අප්පා, අම්මා මට ඕගොල්ලන්ට කියන්න යමක් තියෙනවා' ඔවුන් සමග ඉඳගත් මම කීවෙමි. අනතුරුව, බොහෝ කලකට පසුව ප්‍රථම වරට මම කතා කළෙමි. තුන්හැවිරිදි වයසේ දරුවන්ට මා කෙතරම් ද්වේෂ කරන්නේද යන්න මම ඔවුන්ට කීවෙමි. අම්මා සිය මුහුණෙහි සැඟවුණු සිනාවක් ඇතිව අසාගෙන සිටියාය. දිනක මා මගේ නීති විභාගය කරන බව මම ඔවුන්ට කීවෙමි. අප්පා උනන්දුවකින් බැලුවේය. කතා කිරීමේ වැදගත්කම මම ඔවුන්ට කීවෙමි. අප එකට එක්වී සිටිය යුතු බව කීවෙමි. අනතුරුව, මම ඔවුන්ට රාජන් ගැන කීවෙමි. මා කතා කර අවසන් වූ පසුව අප්පා හිස සොලවා, අම්මා දෙස හා මා දෙස බලා අනතුරුව නැගිට, අම්මා හා ඔහු නිදන කාමරයට ඇතුළුව තිර රෙද්ද වැසුවේය. අම්මා, සිය මුහුණෙහි වූ තිගැස්ම සහිත බැල්මෙන් යුතුව, ඇය මීට පෙර කිසි දිනෙක කතා නොකළ දෙයක් කීවේය. 'කාලි මා. එනක්ක ශක්තිය තා! '

ඇය, මා රාජන් මුණ ගැසුණු කෝවිලෙහි දෙවඟනට කන්නලව් කළාය. මේ තත්ත්වයට මුහුණ දීමට අවශ්‍ය ශක්තිය ඇය දෙවියන්ගෙන් ඉල්ලා සිටියාය. එය සෝපහාසී විය හැකිව තිබූ නමුදු, ඒ වෙනුවට මා හඬන බව මම වටහා ගතිමි. ඇයද හඬන්නට වූවාය, අපි එකිනෙකා තදින් වැළඳගතිමු.

*නවය*

මම මටම සිනාසෙමින්, අපගේ කෝවිල ළඟ රාජන් එනතුරු බලා සිටියෙමි. රාජන් පිළිබඳ මගේ දෙමාපියන්ට පවසා මාස තුනක් ගතව තිබිණි. නිවසේ තිබුණේ නිශ්ශබ්දතාවකි. අප්පා කෑමට හැර කාමරයෙන් පිටතට නොපැමිණි අතර, ඔහුගේ ඇඳ යට පුවත්පත් ගොන්නක් තිබෙනු

මම දුටුවෙමි. ඔහු නැවත කියවීම ආරම්භ කර ඇතැයි මම අනුමාන කළෙමි. කිසිදිනෙක බැතිමත් නොවූ අම්මා, පුවත්පතකින් කපාගත් කාලි දෙවඟනගේ රූපයක් ඉදිරියේ යදින්නට වූවාය. ඔවුන් ඔවුන්ටම ආවේනික ගැලවීමේ ක්‍රම සොයාගෙන ඇති බව පෙනෙන්නට විය.

මා ගැන කිවහොත්, මම නැවත ජීවත් වීමට හේතුවක් සොයාගෙන සිටියෙමි. මට ලැබුණු හැම විවේකී අවස්ථාවකදීම මා ඉගෙන ගනිමින් සිටි නීති විද්‍යාල සටහන් රාජන් මට සොයා දුන්නේය. මොන්ටිසෝරියෙන් ඉවත්ව, නීති ආයතනයක පර්යේෂණ සහායිකාවක ලෙස සේවය කිරීමට මා ගත් තීරණය හොඳම තීරණය විය. මගේ මනෝභාව හැමවිටම හොඳින් ඇති බව මම තේරුම් ගතිමි, මම මගේ වැඩ ගැන බොහෝ සතුටු වීමි.

*දහය*

රාජන් සමග සැඟවෙන්නට මට තවදුරටත් හේතුවක් නැති නමුදු, ඔහු තවමත් බොහෝ ප්‍රවේසම් විය යුතු විය. අපගේ හමුවීම් ප්‍රවේසමෙන් සැලසුම් කළ යුතු විය, කාලයකට මට ඔහුගෙන් කිසිදු හේතු දැක්වීමක් නොලැබ ඔහු දකින්නට නොලැබෙන අවස්ථාද තිබිණි. ඔහු මට නොකීවද, ඔහුගේ නිහඬතාව මගේ ආරක්ෂාව වෙනුවෙන් බව මම දැන සිටියෙමි. සමහර දේ මා නොදැන සිටීම වඩා හොඳ විය. සමහර අවස්ථාවල ඔහු බොහෝ ප්‍රමාද වූයේය, සමහර අවස්ථවන්හිදි ඔහු කොහොමටවත් නොපැමිණියේය. එහෙත් ඔහුගේ කාර්යභාරය ඔහු මගෙන් ඈත්කර තබන බව මා දැන සිටි අතර එය මම පිළිගත්තෙමි. අනාරක්ෂිත ලෝකයක, මට ආරක්ෂාව පිළිබඳ හැඟීම ලබා දෙන්නේ ත්‍රස්තවාදියකු වීම කෙතරම් සරදමක්ද?

දැන් ඔහු ඔහුගේ, පිටේ එල්ලා ගත් මල්ලද සමග මගේ වීරයා සූර්යා, වඩා ශිෂ්ටසම්පන්න වීමට උත්සාහ දරමින් සහ අඩු රුදු බවකින්, රැවුල හා කොණ්ඩය කපා පිළිවෙලකට මෙහි සිටියේය. ඔහු කළ පුංචි වෙනස්කම් කළේ මා නිසා බව මම දැන සිටියෙමි, එය සිතට සතුටක් ගෙන ආවේය.

ඔහු සිනාවකින් යුතුව පූර්ණ බලාපොරොත්තුවකින් හා ආදරයෙන් මා වෙත පැමිණියේය. මම සිනාසෙමින් ඔහුගේ අත, මාතින් අල්ලා

ගත්තෙමි. යුද්ධය ඇති රටක සාමයේ හැඟීමෙන්, මම අපගේ කෝවිලට හැරුණෙමි, ඔහු මා පසුපස පැමිණියේය. අප දෙස දිගු කළ කාලි දෙවඟනගේ දෝත් තුරුලට යන්නට අපි දෙදෙනා ගේට්ටුවෙන් ඇතුල් වෙමින් සිටියෙමු.

***සොනාලි වනිගබඩුගේ*** *ඉපදුනේ සහ හැදීවැඩුණේ කොළඹය. වෘත්තියෙන් ඇය නීතිඥවරියක වන අතර, මූලික අයිතිවාසිකම් නීතිය වෘත්තිමය වශයෙන් ඇයට විශේෂිත වෙයි. ඇය රූපවාහිනී ප්‍රවෘත්ති මෙහෙයවන්නියකි. චිත්‍රපට නිර්මාණය, වේදිකාව සහ කාව්‍ය කෙරෙහිද ඇය කැමැත්ත දක්වයි. බහුවාර්ගික සමගිය සම්බන්ධයෙන් ඇය ප්‍රබල ලෙස පෙනී සිටින්නියකි, පුරවැසියන් අතරෙහි අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය ඇති කළ යුතු බවට ඇය විශ්වාසය පළ කරයි. ඇගේ කෙටිකතාවෙන්, සොනාලි මතවාදයන්හි සහ අදහස්වල ඇති විශාල වෙනස්කම් ජයගැනීමට බලයක් මානව චිත්තවේගයන්ට ඇති බව ගවේෂණය කරන්නීය.*

# මියගිය බිළිඳා

## පවන් මද්‍රි කලුගල

**මියගිය බිළිඳෙක් යනු බිහිසුණු දෙයකි.**

එය ඔබ පපුව තුරුල්ලෙහි සිටින, ස්පර්ශ කළ හැකි, බර දැනෙන, උණුසුම් සහ යන්තමින් නරක් වූ මී කිරි වැනි දුගඳක් හමන්නා වූ දෙයකි. එය හම ගැසූ බළලකු මෙන් ගුලිවී සිටියි. ඒ කුඩා සතෙක් වැනි උණුසුම් දෙයකි. ඉතා නිර්මල, බොහෝ අහිංසක, උහුට හුස්ම ගත නොහැකි බවට ඔබට දැනගත හැකිය.

ඇයට තවමත් ඔහුගේ බර පියයුරුවලට දැනෙයි. උණුසුම් සහ බිළඳු මුදු සමින් යුතු හුස්ම ගන්නා ජීවියකුගේ බර දැනෙයි. ගෙතූ සේද බඳු ඉතා සිහින් කෙස් රොද, අඳුරු එහෙත් උදෑසන හිරු එළියෙහි රන්පැහැයෙන් ඔප වැටී වර්ණ ගැන්වී ඇත. ඔහුගේ කුඩා ශරීරයෙහි හැඩය උණ්ඩියකට ගුලි ගැසී ඇත. ඔහුගේ සුරතල් සිනාව තවමත් ඇගේ සවනෙහි දෝංකාර දෙයි, ඔහුගේ බිළිඳු උගුරෙන් පිටවූ සතුට, ප්‍රමෝදයෙහි හඬ ගංගාවකින් නැගෙන දිය බුබුළු හඬ මෙනි. ඒ මුදු කෙහෙරැළි කදිම ලෙසින් හා සිනිඳු සරින් ඇගේ කම්මුල් පිරිමැද්දේය. පහළ අන්ධකාර අගාධයෙහි වූ ජලයෙහි නැගෙන දුමාරය මෙන් ඒ තුනී කෙහෙරැල් සැලෙන විලාසය ඇය සිතෙහි මවා ගත්තාය.

ඇගේ හමෙහි, සබන් පෙණ වේලී, අහිමි වූ යමක් පිළිබඳ නොපැහැදිලි හැඟීමක් ඉතිරි කළේය. සුදු පැහැති හා තැම්බූ සොසේජස් මෙන් හැකිලී ගිය හෝ පළතුරු වලින් බරවූ නත්තල් කේක් සෑදීම සඳහා ඇගේ ගුරුවරු ඇයට ඉගැන්වූ පරිදි රම්වල මිදි පෙඟවූ කල්හි මෙන් වූ ඇගේ ඇඟිලි දෙස ඇය බැලුවාය. බිළිඳා, හැමවිටම නත්තල් කේක් ප්‍රිය කළේය. මත් ගතියක් ඇති කරවන, ඉතා රසවත් කේක් දරුවාට සුදුසු නැති බව ඔවුහු අවවාද කළහ, එහෙත් ඇය කුඩා කේක් කැබැල්ලක් කොනහා ඔහුගේ මුවට දැමුවේ, ඒ මිහිරි, ඇලෙන සුළු කේක් කැබැල්ලෙහි රස මිහිර අත්විඳ දරුවා සතුටින් හා මහත් ප්‍රමෝදයෙන් උගුරෙන් කරන හඬ ඇසීමේ ආශාවෙනි. මිහිරි බව තැවරී ඇති පිරුණු කම්මුල් දුඹුරු පැහැ ටොෆියක් මෙන් සුවඳ හැමු හැටි සහ දත් නැති මුඛ සිනා පෑමට විවර වූ හැටි ඇය සිහි කළාය.

සීතල ගල මත තැබුණු ඇගේ පතුල් තෙත් විය. ඇගේ තෙමුණු හම පෙලමින්, බෙලි ගසෙහි කොළ අතරින් උණුසුම් හිරු රැස් පතිත වූයේය. එහෙත් ඇය වෙව්ලමින් සිටියාය. තෙතමනය සහිත මද සුළඟ දුහුවිලි වලාවන් නගමින් නැඟී ආවේය. හිරු එළියෙහි දිග, ඇල වූ රැස් දහර ඇතුළෙහි සිරවී, දූවිලි අංශු දරාගත් දූවිලි වලාවවන් අහස දෙසට යමින්, දෙව්ලොව කරා නැගෙන්නට විය. ළිඳෙහි සෙවෙල සහිත වටය සමග, රතු කුහුඹි පේලියක් ඔවුන්ගේ දෛනික ජීවිතයෙහි කාර්යබහුල භාවයෙන් කඩිමුඩියේ දිව ගියහ. ළිං ජලය සමග එක්වූ තෙත් සෙවෙල ඇගේ නිරාවරණ දෙපාවලට සිහිලසක් දුන්නේය.

පහළින් තිබූ කළු පැහැති දියළු අඳුරට, ළිදෙහි ඉවුරට ඇය හෙමින් එබිකම් කළාය. ඝන, තෙත තීන්ත මෙන් ජලය සුළියක් මෙන් කැරකුණේය. ළිද තුළ, මීවන පඳුරු බුරුතු පිටින් වැවී එල්ලෙමින් තිබුණේ අවුල් වී ගැටගැසුණු කෙස් සේය. කූරටියන් ජලයෙන් එහා මෙහා යුහුව හැසිරුණහ, වටයෙහි දිය මත්තෙහි අලස කුඩා දිය සුළි මතු වූයේය, ඒවා දියසුළි වශයෙන් ශූන්‍යයෙහි නොපෙනී ගියේය.

සන්සුන් සිනාවක් සේ, ගර ගර සිනාවක් නගන හඬ දිය යටින් ඇසිණි. ඇයගේ සිතට දුක දැනිණි.

ඇගේ පපුව මත තිබූ මහ බරක් ඉවත් කෙරිණි, අනෙක් බිළිඳා, ඇගේ බිළිඳා, අවසානයේදී සතුටින් බව ඇය දැන සිටියාය.

ඇය සින්කයෙහි රතු සහල් යොදමින් සිටියාය. රතු සහල්. ඔවුන් එයට කියන්නේ කැකුළු සහල් කියාය. ඕවලාකාර හැඩයේ අපූරු රෝස පැහැති ඇට. සහල් ලිප තබන්නට පෙර, සහලෙහි ඇති දූවිලි සහ වැලි යන්නට, හැම හාල් ඇටයක්ම දිස්න දෙන තුරු හා පිරිසිදු වනතුරු සේදිය යුතුය, ඒ සහල් ඇටවල රතු පාට ඉරි තිබේ. මේ සහල ඉදී බත බවට පත් වූ විට, එය එළවළු ව්‍යංජන සහ කුළු බඩු වලින් උකුකරන ලද මස් ව්‍යංජනය සමග පිරිපුන් පෝෂ්‍යදායී ආහාරයක් බවට පත් වෙයි.

ඇය මේ නිවසට පැමිණ ගතවී ඇත්තේ මාස කිහිපයකි. හමුදාව හා පොලිසිය ඔවුන්ගේ ගමට ළඟා වූ විට, කුඩා ගම්මානය තිබූ තැන තිබුණේ කළු වී, අඳුරු වී ගිය බිත්ති හා කණු පමණකි, අතු සෙවිලි කළ

නිවෙස් තවමත් දැවෙමින් තිබුණේ ගිනි ගන්නා ගිනිකඳු සේය. දැවී ගිය අළු මධ්‍යයේ සහ අඟුරු මධ්‍යයේ මන්දිරවල සුන්බුන් මැද මෘත දේහ තිබෙන අතර, ඔවුන්ගේ ගලා ගිය ලේ, කඩිති මෙන් දක්නට ලැබිණි.

ගින්නෙහි රශ්මියෙන් බාගයට වියලුණු සත්ත්ව ලේ සහ පිළිස්සුණු මස් ගඳ වාතයට එක්ව තිබිණි. මිනිස්සු, වයෝවෘද්ධ කාන්තාවන්, සුනඛයින්, ළමයින්, එල්ටීටීඊය එකඳු ජීවියෙකුට හෝ ජීවත්ව සිටින්නට ඉඩ හැර තිබුණේ නැත. ඇය වාසනාවන්ත බව ඔවුහු කීවෝය. කපාදමන ලද උදරයෙන් ලේ ගලන්නට වූ අතර, මළමිනියක් සේ ගල් ගැසී සිටියෙන්, ඇය මියාගොස් ඇතැයි සිතා කොටි ඇය හැර ගියහ. සොල්දාදුවන් ඇගේ නිවසෙහි සුන්බුන් අතරින් ඇගේ සිරුර ඔසවාගෙන ගිය කාරුණිකභාවය කෙබඳුද යන්න ඇයට තවමත් මතකයේ ඇත, ඇය හුස්ම ගන්නා බව වටහාගත් කල්හි, ඔවුන්ගෙන් සමහරෙක් දණින් වැටී වැළපෙන්නට වූයේ කෙසේද යන්න ඇයගේ මතකයේ ඇත.

ඇගේ ගර්භාෂයෙහි ලේ ගලන විට එය නැවැත්වීමට ඔවුන් උත්සාහ කරන විට ඇය කටු පොළවේ වැතිර සිටියාය. ඇයගේ දෑස නිමක් නැති කළු අහස දෙස යොමුව තිබිණි. තරු දූසිමක් පමණ තද, සීතල, රිදී පහන් සේ බැබළිණි. ඇයට වේදනාවක් දැනුණේ නැත. ඇයගේ දෑසෙහි පටලයක් මෙන් දුම බැඳී තිබිණි. ඝන අඳුරු පැහැති අළු ඇගේ පෙනහළු වලට වැද කැස්සක් සෑදුණ ද ඇය ඇය ඇසිපිය නොගසා බලා සිටියාය. නිවී යන ගින්නෙහි භය උපදවන තැඹිලි පැහැති දීප්තියෙහි අවසන් ගිනිදැල් අහස මහත් කෑදර කමකින් ලෙවකන්නාක් මෙන් ඇයට පෙනිණි. ඇය වටා වේලුණු පොල් අතු පිළිස්සී පිපිරෙන ශබ්දයද, ඉඳහිට, ගින්නෙහි යම් දේ පුපුරා යන හඬද ඇසිණි.

අවසානයේදී ඇගේ තුවාල හොඳින් සුව වූ පසුව, පැරණි සංත්‍රාසයෙන් ඈත්ව අලුත් ජීවිතයක් ආරම්භ කිරීම සඳහා ඔවුහු ඇය කොළඹට යැවූහ. කෙසේ නමුදු, ඇයට එහි කරන්නට තිබුණේ කුමක්ද? ගමේ දිවි ගලවාගෙන ඇති එකම තැනැත්තිය ඇය වූවාය. කලෙක මෙහි තිබූ පොල් අතු සෙවිලි කළ වහල සහිත මැටිගෙවල් පෙළ දැන් කොහිද? මියගියවුන්ගේ මිනී සහිත කළු වී ගිය පොළව දැන් එහි ඇත. ඉදින් දුර බැහැර මැදවච්චියේ සිට ඔවුහු ඇය මෙහි එවූහ, කාන්තාවන් සමහරෙක් ඇයට මේ නිවස සොයා දුන්නේ ඇයට හොඳ වැටුපකට වැඩකළ හැකි

බව කියමිනි. ඇයගේ නව නිවස වන්නට යන්නේ මේ නිවසයි. ඇය ළමයින්ට ආදරය කළ බව ඔවුහු කීහ, ඒ පවුලෙහි බලා ගැනීමට අවශ්‍ය වයස මාස දහඅටක දඟකාර බිළිඳෙක් සිටියේය.

ඇය සහල් ගරමින් සේදුවාය, අනතුරුව, අතිරික්ත, අපිරිසිදු මළානික රතු පැහැති වතුර ප්‍රමාණය බේරා එක්වරක් ගරයි. ඇය පයිප්පය ඇර, ලෝහ භාජනයට වතුර එකතු වන්නට සලසයි, භාජනයට පිරිසිදු වතුර තුන්කාලක් නැවත පුරවයි. අනතුරුව ඇය සිය අත් භාජනයට දමා, සහල් එයට දමා, එය හොඳින් සෝදයි.

එක්වරම ඇය කරමින් සිටි දේ නවතා පුදුම වී පහත බැලුවාය.

භාජනයේ වතුරමට්ටම, ඇගේ අත්වල මැණික් කටුව දක්වා තිබුණි. අඳුරු රත් අළු පැහැ ගැඹුරෙහි ඇගේ අත් වෙව්ලන්නට විය. නියමිත අනුපාතයට වඩා ඒවා ලොකු වී පෙනුණේය. ඇගේ අත් පෙනුණේ හම ගැසූ බූවල්ලන් මෙනි. ජලය රතුය, එය ගොරෝසු අපවිත්‍ර රතු පැහැයක් ගත්තේය. එය පෙනුණේ හරියට සෝදා හැරි රුධිරය මෙනි.

නිවසෙහි ස්වාමියා හා ස්වාමිදුව වැරැන්ඩයේ හිඳගෙන ඔවුන්ගේ උණු තේ කෝප්ප පානය කරමින් කතා කරනු, ඇය සිටගෙන වැඩකරමින් සිටි මුළුතැන්ගෙයට ඇසිණි. ඔවුන්ගේ ස්වරය පහත්ය, එහෙත් ඔවුන් නොදන, ඒ නිහඬ නිවසෙහි හඬ විහිදී යයි. ඔවුන් මෙසේ තනිව හිඳින විට කතා කළේ සිංහල බසින් පමණකි. ඔවුන් වෙනත් අය සමග සිටින විට කිසිවිටෙකත් සිංහලෙන් කතා කළේ නැත. ඔවුන් එවිට කතා කළේ ඉංග්‍රීසියෙනි. පාසලේදී යන්තම් අහුලාගත් වචන කිහිපයක ආධාරයෙන් ඇය ඒවා අමාරුවෙන් යන්තමින් පමණක් වටහා ගත්තාය. ඔවුන්ගේ ඝෝෂාකාරී වූ, මවා පෑ බොරු සිනාවක් සමග එක්වූ, බැඳුණු උච්චාරණය ඇගේ දෙසවන්වලට අමිහිරි බවක් ගෙන දුන්නේය. ඔවුන් බබාට කතා කළේද මේ මවාගත් හඬිනි, දරුවා සුරතල් කළේද ඒ විදේශ භාෂාවෙනි. එහෙත් දැන් ඇය බබා තොටිල්ලට දමා නිදි කරවා ඇති හෙයින්, ඔවුහු ඔවුන්ගේ මව් බසින් කතා කරති.

'ඇය නිශ්ශබ්ද කෙනෙක්' ස්වාමිදුවගේ උස්, කලබල සහිත හඬ ඈත සිට ඇසෙන කෘමියෙකුගේ හඬක් මෙන් සිහින් වූ අතර, එය අල්ලා

ගන්නට ඇයට කන දිගු කළ යුතු විය. 'ටිකක් අමුතු ගෑනු ළමයෙක්, ඔයා එහෙම හිතන්නෙ නැද්ද? එයාගෙ පාඩුවෙ ඉන්නවා, ඔලුව පහත් කරගෙන බිත්තිය අයිනෙන් දුවගෙන යනවා එයාගෙම හෙවනැල්ලට බයවෙලා වගේ. එයා ආපු දවසෙ ඉඳලා මට වචන දෙකක් කතා කරනවා ඇහිලා නෑ.'

ඔවුන් තමා ගැන කතා කරන බව වටහා ගැනීමෙන් ඇය මදක් යුහුසුළු වූවාය. ඔහුගේ පහත් ගෙරවුම් හඬින් ස්වාමියාගේ නොඉවසිලිමත් පිළිතුර ඇසිණි. 'අඩේ, ඉතින් මොකද එයා නිශ්ශබ්ද කෙනෙක් නම්? වැඩිය කතා කරන්නේ නෑ. ඉතින් මොකද? එයා හොඳ ගෑනු ළමයෙක්. කිසි කරදරයක් නොකර කියන දේ කරනවා. එයාගෙ පෙලැන්තියෙ අනික් අය වගේ නෙමෙයි, මාළු කොල්ලොත් එක්ක අඟර දඟර කරන්නෙ නෑ. කණ්ණාඩිය ඉස්සරහ දවසම ඉන්නෙ නෑ. ඒ වගේම බබාව හොඳට බලා ගන්නවා'

'ඒත් ඒක හරි පුදුමයි, මං කියන්නම්. එයා වචනයක්වත් කතා කරන්නෙ නෑ. බඩගින්නට කන්නවත් ඉල්ලන්නෙ නෑ. වෙන එකක් තියා මං එයාට කතා කරන කොටවත් මූණ දිහාවත් නොබලා ඔළුව පහත් කරගෙන ඉන්නවා. මං කී සැරයක් ඇයට කියලා තියෙනවාද? ''දෙයියනේ, ළමයො ඔච්චර ලැජ්ජ වෙන්න එපා, අපි ඔයාව කන්නෙ නෑ!'' කියලා. ඇය මදක් නැවතුණාය. 'හොඳයි, කියන්න තියෙන එකම දේ කතා කරනකොට ඇස්දෙක දිහ බලන්නෙ නැති මිනිස්සුන්ට මං කැමති නෑ. ඒගොල්ලො හැම තිස්සෙම සැක සහිත උදවිය. එයා කොහොමද ඔය විදියට ජීවත් වෙන්නෙ? කාටවත් වචනයක්වත් කතා නොකර? සමහර වෙලාවට ගෙදර නිශ්ශබ්ද භූතයෙක් ඉන්නවා වගේ. අමනුෂ්‍යයෙක්,' ගැහැණු ළමයා තම වෙව්ලිල්ල අදෘශ්‍යමානව සිතින් දැක, බැතිමත් කතෝලික කාන්තාවක සේ කුරුසිය ඇන්දාය.

'වී, අපේ දෙවියන්ගේ නාමෙට කරුණාකරලා විහිළුවක් වෙන්න එපා' ස්වාමියා කෝපයෙන් කීවේය. 'ගෑනු ළමයා එයාගෙ වැඩ කරනවා. එයාගෙන් වෙන මොනවද බලාපොරොත්තු වෙන්න පුළුවන්? පිළිසරණක් නොතිබිච්ච යුද්ධ පළාතක ඉඳලා ආපු ඒ ළමයට, මොන දේවල්වලට මූණ දෙන්න සිද්ධ වුණාද කියලා අපි දන්නවද? 'Women's Aid' එකේදී කියපු එකම දේ එයා යුද්ධයෙ ගොදුරක් කියන එක විතරනෙ, ඒත් මං හිතනවා

ඈ එලොව ගිහින් මෙලොව එන්න ඇති කියලා. බලන්න එයාගෙ මූණ දිහා. තරුණ ගෑණු ළමයෙකුගෙ මූණ ඒ වගේ වෙන්න බෑ... අනික ඉතින්, එයාට ඕන වෙලාවට එයා කතා කරනවා. කවුරුවත් අහල පහල නැති වෙලාවට බබාට කතා කරනවා මට ඇහිලා තියෙනවා. ඔහුට කොඳුරනවා, පොඩි එකා අහන් ඉන්නවා ඇස් ලොකු කරගෙන. බොහොම, ආදරණීය ස්වරයකිනුයි කතා කරන්නෙ'

එහෙත් ඒ වචන ඇසුනු විට තම පපුවෙහි තබාගෙන සිටින දරුවා කෝපයෙන් වෙව්ලූ බවක් ඇයට දැනිණි. දරුවා පූසෙක් දිග ඇරෙන්නාක් මෙන් දිගැරුණේය, එක්වරම ඒ බර වැඩිවුණාක් මෙන් දැනිණි. පුංචි අත් දෙකක් හෙමින් ඇගේ ගෙල වෙත ළං විය, සහල් බඳුන ශබ්ද නගා සින්කයට වැටුණේ බිම පුරා රතු සහල් ඉහිරුවමිනි. නිහඬතාව බිඳිමින් කටහඬවල් ඇසිණි, ඇය පැන ගියාය.

*

නිවසෙහි ඇයට දිනචර්යාවක් තිබිණි. නිවස අතු පතු ගා, ගෙවත්ත අතු ගා අඹ ගස්වලින් වැටුණු වේලුණු කොළ ගොඩ පුළුස්සා, අනතුරුව උකු ඉගුරු කිරි තේ දෙකක් සාදා ඒවා කෝප්ප දෙකකට දමා, ස්වමියා හා ස්වාමිදුව වැතිර සිටින කාමරයට ගෙන යයි. ඔවුහු මී පැණි මෙන් රස උකු, එමෙන්ම ඉඟුරු කැබැල්ලකින් රසවත් වූ ඔවුන්ගේ තේ සප්පායම් වෙති. මෙතරම් පැණි රසට ඇය කැමති නැත. ඇය බොන්නේ තේ කෝප්පයකි. එය ඇගේ වීදුරුවට දැමූ සිරුර ප්‍රබෝධමත් කරන තිත්ත රසක් ඇති රත් රන්වන් පැහැති වතුරකි. තේ කෝප්පය බීමෙන් පසුව ස්වාමිදුව, උදෑසන ආහාරය සූදානම් කිරීමේ ස්වාමිදුවගේ කටයුත්තට එළඹෙයි, එයින් පසුව මුළුතැන්ගෙහි ඇගේ කටයුතු අවසන් වෙයි. දිනයේ ඉතිරි කාලයේදී ඇගේ රාජකාරි දිවෙන්නේ බබා බලා කියා ගැනීම උදෙසාය.

දිනයේ ඇය වඩාත් කැමතිම දෙය වන්නේ රවුම්, පිරුණු කම්මුල් සහ රන්වන් දුඹුරු පැහැයෙන් යුතු හිසකේ සහිත සිහින් හිසක් ද ඇති රෝස පැහැති බෝල ගෙඩි බබා සේදීමය. හැමවිටම සිනාමුසු මුහුණින් සිටින මහත දරුවෙක් වූ ඔහු ඇනූ පාන් පිටි වැනි මුදු තට්ටු ඇති අත් සහිත සෞඛ්‍ය සම්පන්න දරුවෙක් වූයේය. ඇය ඔහු සිය දෝතින් ගෙන,

පියරු සහ බිළිඳු සුවඳ විලවුන් දමා, ඔහුගේ බණ්ඩියෙහි සිය මුහුණ හොවා ගනියි. ඔහු මහ හඬින් උමතුවෙන් මෙන්, කට වසාගෙන, හිස පිටුපසට කොටගෙන දත් නැති මුවින් සිනාසුණේය. සුදු පියරු දමූ ඔහු හම ඇය කිතිකවන විට සහ ඇය කිඹුහුම් අරින විට ඔහු පෙරටද වඩා හඬ නගා සිනාසෙයි. වරක් ස්වාමිදුව, පොඩි කළ අල, බිත්තර සහ කිරෙහි පෙඟවූ පාන් මිශ්‍ර කොට අමුතු කෑමක් බබාගේ උදේ කෑම වේල වෙනුවෙන් සූදානම් කළ අතර ඔහුට එය කවන්නට ඇය ඔහු ගෙවත්තට ගෙන ගියාය. අලවලින් මුදු වූ ඒ උකු තලපය ඔහුගේ මුවෙහි ලූ විට ඔහු සතුටින් සිනාසෙමින් කුරු කුරු ගෑවේය. අනතුරුව, ඔහුගේ කුස බැලුනයක් මෙන් පිරී ගියේය. ඔහුට නිදන්නට දරු නැළවිලි කියමින් ඇය ඔහු සිය උරයෙහි හොවාගෙන එනවිට ඔහු සතුටින් ඇඟිල්ල උරමින්, නිදිමත දෑසින් සිටියේය.

සමහර අවස්ථාවන්හිදී ඇය ඇගේ බිළිඳා ගැන සිතුවාය. ඒ ඔහුට නින්දෙහි යම් සහනයක් ලබා දෙන්නට උත්සාහ කරමින්, පැය ගණන් සිය දෝතෙහි තබාගෙන සිටි දරුවාය. එහෙත් ඔහුගේ පපුවෙහි වූ ඇදුම හේතුකොටගෙන ඔහුට නින්ද ලැබිය නොහැකි විය, ලොකු කරගත් දෑසින් යුතුව ඔහු ඇගේ උරහිසෙහි වැතිර සිටියේය, ඔහුගේ බේරුණු ඉල ඇට ඇගේ සිරුරෙහි ඇනෙන්නට විය. ඇගේ ළදරු සහෝදරයා, වහා බිඳෙන සුළු සිරුරින් යුක්ත වූයේය, ඔහුට තිබුණේ විශාල හිසක් හා ඉතා දුර්වල ශරීරයකි, කළු පැහැති රැළි වැටුණු සමකි. ඔහුගේ අවහිර වුණු නාසයෙන් හුස්ම ගන්නට  බොහෝ වෙහෙස වෙමින්, දින ගණන් ආහාර නොගෙන, ඇගේ මවගේ කිරි ඔහු ප්‍රතික්ෂේප කරමින් සිටියේය. එහෙත් ඔහුගේ බඩ ඉදිමී තිබිණි, එය ජම්බෝල ගෙඩියක් තරමට තද වූයේය, එය ශක්තිමත්, පිම්බී ගිය ගෝලයක් බඳුවිය. ගෑස් පිරී ඇති බැවින් ඔහුගේ බඩ ඉදිමී ඇති බව ඇගේ මව කීවාය. ඇගේ පියාගේ මරණයෙන් පසුව, අම්මා කිසිවක් කෙරෙහි සැලකිල්ලක් දැක්වූ බවක් නොපෙනිණ. කුසගින්නේ හඬා වැටෙන ඇගේ දරු කැල ගැනවත් ඇගේ සැලකිල්ලක් තිබුණේ නැත. යන්තම් නූලකින් ජීවිතය අල්ලාගෙන සිටින රෝගී බිළිඳා ගැන හෝ ඇය නොබැලුවාය. අම්මා ඒ සියල්ල අත් හළ පසුව, බාල දරුවන් ගැන බැලීමේ වගකීම ඇය භාර ගත්තාය. ඇය පවුලේ වැඩිමහල් දූරිය වූවාය.

දැන් ඇය වැඩකරන මුළු දවසෙහිම, නිරන්තරයෙන්, එය ඇගේ පිටෙහි එල්ලී සිටියි. ඇගේ උරහිසට උඩින් එබිකම් කරමින්, එහි බරින් ඇගේ

ගෙල බිමට නවමින් එල්ලී සිටියි. ඇගේ බිළිඳා. සමහර අවස්ථාවන්හිදී එය ඇගේ පපුවෙහි තුරුළු වෙයි, එසේ තුරුළුව පූසෙකු මෙන් ඇඟිලිවලින් හාරයි, සමහර අවස්ථාවන්හිදී ඒවා කෙතරම් තියුණුදැයි කිවහොත් එය දැනෙන්නේ හදවත හාරන්නාක් සේය. ඒ කෙසඟ අත්, ගස් අතුවල රිකිලි බඳුය, ඇයට අවශ්‍ය වුවද, ඇයට ඒවා කඩා දැමිය නොහැකිය. කෙසේ නමුදු, ඇගේ ගෙල වටා ඇති ඒ බැඳීම ඇයට කිසිදිනෙක බිඳ දැමිය නොහැකි බව ඇය දනියි. ඒ අත් බොහෝ බිඳෙන සුළුය, එතෙකුදු වුවත්, ශක්තිමත්ය.

දවසේ වැඩ අහවර වූ විට, ඇය සන්ධ්‍යාවෙහි රෙදි සෝදා අවසන් වූ විට, රාත්‍රියේ උයා පිහා අවසන්ව පිරිසිදු කොට අහවර වූ විට, බබා සෝදා ඔහු තොටිල්ලෙහි නින්දට දැමූ පසු ඇය පුංචි නිදියන ස්ථානයෙහි වැතිරෙයි.

රාත්‍රියේදී, ඇය තමාගේ දළ පන් පැදුරෙහි වැතිරගත් කල්හි, පැදුරෙහි රටා ඇගේ හමෙහි රටා මවයි, ඇගේ බිළිඳා ඇය වෙතට පැමිණෙයි, ඇය බිළිඳා සිය පපුවට තුරුළු කොටගනු ඇත. ඒ සීත, අන්ධකාරයෙහි එය එහි සීතල වූ නිල්පැහැති මුහුණ ඇගේ ගෙලෙහි තබාගන්නට, තුරුළු වන්නට වෙරදරයි. ඇගේ සිරුර දවසේ වැඩ නිසා වේදනා දෙයි. ඇගේ මාංශ පේශී තද වී ඇත, ඒවා විඩාව සමග එක්ව ඇත්තේ විවේක ගැනීම ප්‍රතික්ෂේප කරමිනි. එහෙත් සිහින් සීතල අත්ල ඇගේ හම මත තැබෙන්නේ, මුදු වතුර බෑගයන් දෙකක් සේ, ඇගේ මාංශපේශී වේදනාව ලිහිල් කරමිනි. කුඩා බිළිඳු හඬ අහන්නට ඇය සිය කන් දිගු කරයි, හඬ රහසක් තරමට දුබලය, ඇගේ සවනෙහි ඒ දෙතොල් තැබෙනු ඇයට දැනෙයි. බිළිඳකුගේ සෙවනැල්ල හැඩයේ අඳුරු පරාසයක් වටා සිය දෑත් යවා ඒ පරාසය තුරුළු කොටගත් ඇය තම දෑස් පියා ගත්තාය.

ඉන් අනතුරුව ඇය සිහින දකිනු ඇත. හැම විමට එකම සිහිනය.

අහස් තල අඳුරුය නොපැහැදිලිව පෙනෙයි. අහසෙහි විසල් වූ, දම් පැහැති පරාසය මත අපිරිසිදු කපු පුළුන් වැනි ඝන වලාවන් එක්වෙයි. රාත්‍රිය උණුසුම්ය, එමෙන්ම තෙත්ය. රස්නය, ඝන ඉටි පටලයක් මෙන් දැනෙයි. ඇය වැතිර සිටින්නේ කුඩා ඇඳකය, එහි තද කොහු මෙට්ටයෙහි රස්නයක් හා කසන සුළු ගතියක් මගේ හමෙහි ඇති කළේය. ඇය පසෙකින් ඇගේ කුඩා හය මස් වියැති කුඩා හුස්ම ගන්නා බෝලයක් වැනි සොයුරා

සිටියි. කුප්පි ලාම්පුවක එළියෙන්, කාමරයෙහි තෙරපී සිටින අඳුරු හැඩතල ඇයට දැකිය හැකි විය, ඇගේ මව, සහෝදරියන් දෙදෙනා සහ ඇගේ බාල සොහොයුරා ඒ අතර වූහ. ලාම්පුවෙහි පහන් තිරය පහත් කොට තිබුණේ ඔවුන්ට තිබූ සුළු තෙල් ප්‍රමාණය ආරක්ෂා කර ගැනීම සඳහාය. කෙසේ වුවද, ලාම්පුව රාත්‍රියෙහි දල්වා තිබිය යුතු විය. ඇගේ පියාගේ මරණයෙන් පසුව, අමනුෂ්‍යයින් දුරින් තබන්නට ඇගේ මව රාත්‍රියෙහි පහනක් දැල්වීමට පුරුදුව සිටියාය. එහෙත් දැරිය සිතුවේ පහන දැල්වූයේ බිය පලවා හැරීමට බවය, ඔවුන්ගේ කුඩා කටුමැටි නිවසෙහි පාළුව පලවා හැරීමට බවය. ඇගේ පියා ජීවත්ව සිටින කාලයේ ගහක් ගලක් මෙන් ශක්තිමත්ව සිටි අම්මා, දැන් අඳුරට බිය වන්නීය.

සිරුර විනිවිද යන රස්නය නිසා ඇයට නිදාගත නොහැකි විය. ඉදින් ඇය අවදිව, බිත්තිවල විශාල කළු ඇතුන් මෙන් පෙනෙන සහ සෙලවෙන අත්භූත සෙවනැලි දෙස බලා සිටියාය. අඳුරු එළියෙහි ඇයට සිය මවගේ බොහෝ ලේ ගිය, වෙහෙසකාර ඇදුම සහ සිය සහෝදරියන් නිදන විට නගන මුදු හඬවල්ද ඇසිණි. රාත්‍රි කාලයේදී මේ සියලු ශබ්ද අතුරින්, බබාගේ හුස්ම ගැනීමේ අමිහිරි හඬ, ඇගේ කනට සෝෂාකාරීම ශබ්දය ලෙස ඇසිණි. ඇය අසල වැතිර හිඳිමින්, ඇගේ කුඩා මුහුණ ඇගේ පපුවට තුරුළු කොටගෙන, ඔහුගේ අවහිර වූ නාසයෙන් හුස්මග ැනීමට ඔහු විසල් වෙහෙසක් දැරුවේය. ඔහුගේ නාස්පුඩුවල නිතරම සොටු වේලී තිබුණු අතර ඇය ඒ සොටු කුඩා කැබලි කඩා ඉවත් කළේ ඔහුට හුස්මගැනීම පහසුවන පරිද්දෙනි. එහෙත් ඔහු කිසිවිටෙක හැඬුවේ නැත, සාගින්දරෙන් සිටින විට පවා හැඬුවේ නැත, හුස්මගැනීමට අපහසු වූ විට පවා හැඬුවේ නැත.

අඩ අවදියෙන් සහ අඩ නින්දෙන් සිටි ඇයට ඇසුණු අමුතු ශබ්දවලින් ඇය අවදි කරවූවාය. නිදි නැති අමනුෂ්‍ය අඳෝනාවන් වැනි ඈතින් ඇසෙන යටිගිරියෙන් කෑ ගසන හඬ මාලාවක් හෙමින් ශබ්දය වැඩිවෙමින් ඇසෙන්නට විය. ඇය එක වැලමිටක් තබා වාරු වීය, තුනී මෙට්ටය ඇගේ මස හාරමින් තිබුණු අතර ඇය සවන් දුන්නාය. අමුතු පට පට හඬක් ඇසෙන්නට විය, සැනෙකින් රත්වූ වාතයෙහි කර්කශ ගඳක් හමා ආවේය. ඇය පසෙකින් කිසිවක් සෙලවිණ. බබාද අවදිව ඔහුගේ දිළිසෙන කළු දෑසින් ඇය දෙස බලා සිටියේය. ඇය සිනාසී ඔහු වෙත නැඹුරුව

ඔහුගේ කුඩා, රවුම් හිස සිප ගත්තාය. ඔහු ළං වූ අතර ඇය ඔහුට තම දබරැඟිල්ල දිගු කළාය. කුඩා අත ඒ වෙත ළං වූ අතර, ඒ මොහොතෙහිම දොර දෙපසට පැලී ගියේ, නිවස තැඹිලි පාට ආලෝකයක් බවට පත් කරමිනි.

ඇය ඒ සියල්ල දුටුවේ මන්ද චලනයෙනි. විනාඩි කිහිපයක් තුළ සිදුවූ දෙය සිහිනයේදී දීර්ඝ වශයෙන් ඇදී යයි. මොහොතකට, ඔවුන් ඇතුළට එන්නට පෙර, දොර කොඩ දීප්තිමත් ආලෝකයෙහි මිනීමරුවන ඡායා ලෙසින් පෙනිණි. ඇයට කිවනොහැකි කොපමණ අය සිටිත්ද, එහෙත් ඔවුන් සියලුදෙනාම බල්ලන්ගේ මෙන් දත් ඇති අපායේ යක්ෂයින් මෙන් රුදුරු අයයි. ඔවුන් කෑගසන කිසිවක් ඇයට තේරුම් ගත නොහැකිය. තැඹිලි පැහැති ආලෝකයෙහි ඇති රිදී දීප්තිය වැටී ඇය මෙට්ටයෙන් නැගී සිටීමටද පෙරම, ඇගේ මව නිසලව වැතිර සිටියදී, ඇය වටා තද රතු ලේ විලක් ගලා ගොස් තිබිණි. තවත් පිහිතල තුනක් දැන් කාමරයට දිගු වෙයි, ඇගේ කුඩා සොහොයුරන්, ජීවයෙන් තොර කඩමාලු බෝනික්කන් මෙන් වැටී සිටිති. අනතුරුව ඔවුන් පැමිණියේ ඇය වෙතය.

*

ඇගේ පපුවෙන් ඔවුන් බිළිඳා උදුරාගත් විට ඇය බලා සිටියාය. එදින ඇය කෑගැසුවේදැයි ඇයට මතක නැත, එහෙත් සිහිනයේදී, සෑම රාත්‍රියකදීම ඇය පැරණි දර්ශනය නැවත නරඹයි, ඇයට කිසිඳු ශබ්දයක් නැගිය නොහැකිය. බිළිඳාද, හැඬුවේ හෝ නැත. එක්කෝ ඔහුට හඬන්නට වේලාවක් හෝ නොතිබෙන්නට ඇත. අත් කරකවා පිටුපසට ගෙන එය බිත්තියට දමා ගැසිනි. පිහිය ඇගේම කුස හරහා යනු ඇයට දැනුණේ නැත.

දැන් යළිත් උදාවූයේ වසරේ එම කාලයයි. ලොකු අතුවල කොනෙහි වසා සිටි ගිනිකුරුල්ලන් මෙන් එරබොදු මල් පිපී දිලෙන්නේ අපූර්ව රතු පිහාටු සේය. කුඩා උල් වූ පිහාටු ගොන්න, පැහැදිලි නිල් අහසට විහිදී තිබෙයි. කොළ පැහැති අඹගස් වදුලෙහි සැඟවී කොහා පිබිදෙන ලෝකයට කුහූ හඬ නගයි, උගේ හඬ නිර්මල, සුමිහිරි හඬකි

කුඩා ළමෝ කොහාගේ හඬ අනුකරණය කරමින්, ගසෙන් ගසට දුව පනිමින් කැකෝ ගසති. ගෙවත්තෙහි ඇති අඹ ගසක් පැණි පිරුණු, රන්වන් පාටින් ඉදුණු අඹ වලින් බර වී තිබේ. අඹ ලොබින් පැමිණෙන කුඩා අසල්වැසි දගයන් පලවා හැරීමද ඇයට අයත් කාරියකි, ඉදුණු අඹ කඩන්නට පාරෙහි සිට අඹ ගස්වලට ගල් ගසන හා සමහර විට අඹ කෑමේ ආසාවෙන් දුඹුරු වඳුරන් මෙන් තාප්පයට නගින දගයන් පලවා හැරිය යුතු වෙයි. සමහර අවස්ථාවලදී පමණට වඩා ඉදුණු අඹ ගණ පොළොවට වැටී, පැණි බේරෙන අඹ කැබලි හා එහි ඉමිහිරි යුෂ ගස් යට ඉහිරෙයි.

වරක් මඳ කඩතොලුවීමක් හැරුණු කොට එතරම් තැලී නොතිබුණු අඹ ගෙඩියක් ඇය අහුලා ගත්තාය. අනතුරුව කුස්සියට වී ඇය නිසොල්මනේ අඹ ගෙඩියෙහි ලෙල්ල දැතින් ගලවමින්ද, එය සපමින්ද කන්නට වූවාය. අඹ ගෙඩියෙහි මුදු මදය කන විට දැනුණු හැඟීම! ඉරු රැසින් උණුසුම්ව තිබුණු අඹ ගෙඩියෙහි මත්කරවන යුෂය ඇගේ නිකටෙහි වෑස්සුණු අතර, නොදැනීම ඇගේ අත්වලට කාන්දු විය. ඇය මස් පිරුණු, කෙඳි සහිත, මුදු අඹ ගෙඩිය දෝතින්ම ගෙන එහ යුෂ උරා බිවූ අතර, අඹ මදය ඇගේ මුව තුළ දිය වී ගියේය. අනතුරුව ඇය සතුටු ප්‍රමෝදයෙන් යුතුව සිනාසුණාය.

නිවසේ සිටි උදවිය අලුත් අවුරුද්ද සැමරුවේ නැත. ඔවුහු ජනවාරි පළමුවැනිදා ඔවුන්ගේම අවුරුදු සැමරූහ, එදිනට එක්කෝ ඔවුහු සාදයක් පැවැත්වූහ, නැත්නම් පිටත ඇති එබඳු සාදයකට ගියහ. මාස ගණන් තබා සියලු දෙනා සූදානම් වන අලුත් අවුරුද්ද මෙන් නොව ඔවුන්ගේ අවුරුද්ද වෙනුවෙන් එතරම් විශේෂිත දෙයක් නැත. ඒ වෙනුවට ස්වාමිදුව ඇගේ ඉස්තරම් ඇඳුම් ආයිත්තම් වලින් සැරසී, එලෙසම ස්වාමියා ඔහුගේ ප්‍රසන්න කමිස වලින් සැරසී, ඔවුහු බිළිඳා ඇයගේ භාරයෙහි තබා මිතුරන් සමග දහවල් කෑම හෝ රාත්‍රී කෑම ගැනීම සඳහා පිටතට යති.

නිවසෙහි ඔවුන්ගේ උත්සවශ්‍රීය ඇති දිනය නත්තල් දිනයයි. ඔවුන්ගේ බෞද්ධ ගම්බිම් වලදී ඔවුහු කිසිවිටෙක මේ නත්තල් උත්සව කිසිදා දැක නැත. නත්තල් ගසෙහි එල්ලූ දීප්‍යමය විදුලි පහන් වලින් ඇයගේ ඇස් ගිණි කනා වැටිණි. ගස් අතුවල සිටින නයින් මෙන්, රිදී පැහැති අතු වෙනුවට දහස් ගණන් තද කොළ අතු රිකිලි ඇති අතුවලින් යුක්ත, පාහින ලද තද කොළ පැහැති කේතුවක් බඳු වූ කොට, ත්‍රිකෝණාකාර

කුරුමිට්ටෙක් ඊට පෙර කවදාවත් ඇය දැක නැත. වරක් ඇය සිය මුහුණ තද කොළ අතු ඉති ගොඩෙහි හොවාගත් අතර, ඇය කස්තුරි සුවඳ එමගින් වින්දාය, දළ අතු ඉනි වලට ඇගේ කම්මුල සීරී ගියේය. එහිද, කොළ පැහැ සුවඳක් තිබිණි. එහෙත් එය ලා කොළ පැහැති ගොයම්පැළ වලින් නිදහසේ හමා එන සුවඳ හෝ මුදු කහ කොළ පැහැති කෙසෙල් කොළවලින් හමා එන සුවඳ නොවේ. ගස ඇය තුළ ශෝකී හැඟීමක් ඇති කරවූයේය.

එහෙත් දැන් අවුරුදු ළඟාවෙමින් ඇත. ඇයට කොහාගේ ප්‍රීතිමත් කූජනයෙන් ඒ බව කිව හැකිය. අසල්වැසි නිවසෙහි අඹ ගසක ශක්තිමත් අත්තක, ගන දිග කඹයකින් ඔංචිල්ලාවක් බැඳ තිබෙනු ඇයට දැකිය හැකිය. අලුත් තීන්ත සුවඳ සුළඟෙහි පාවී යයි, වරක් ඇය අසල ඇති කඩයකට යන විට, අහම්බෙන් පාරෙන් විසිරී ගිය අලුත් තීන්ත කඩිත්තක් ඇයට දකින්නට ලැබුණි. කුඩා සාප්පුව නිල් පැහැයෙන් පින්තාරු කොට තිබුණෝය. රූපවාහිනියෙහි, තරුණ දැරියන් මල් වැටුණු ඇඳුම් ඇඳ, රබන් ගසනුද, ඔංචිල්ලා පදිනුද, ඇය යාන්තමට දැක ඇත. එබැවින් අවුරුදු ළඟ එන බව, දිනය කවදාදැයි නොදැන සිටි නමුත් හා දිනය කවදාද යන්න අසන්නට බියවූ ඇය දැන සිටියාය. ඇය නිවසේදී කිසිවිටෙක කතා කළේ නැත. ඇය කළේ තමාට පැවරූ වැඩකොටස ඉටු කිරීමය.

දිනක් ගිනිබිඳින පරණ හඬවල් ඇසී ඇය නින්දෙන් ගැස්සී අවදි වූවාය. ඇය පැදුරෙන් නැගිට්ටාය, ඇගේ දෙකන් තදින් අල්ලාගෙන නැගිට්ටාය, ඇගේ භයානක ව්‍යාකූල භාවයෙහි අතීතය සහ වර්තමානය මුසු වන්නට විය. ඇය වටා වූ සියල්ල පිපිරුම් හඬින් දෙදරා යනු, කන් බිහිරි කරවන අන්ධකාරය තුළ ඇසෙන්නට විය. ඒ බෝම්බය.....ඒවා යළිත් පැමිණ ඇත, කොටින්, ඔවුන් ගෙන යාමට ඔවුහු පැමිණෙමින් සිටියහ. වියරු වැටුණු දෑසින්, ඇය කළු අන්ධකාරයෙහි, පැදුර මත හිඳ තමා වටාපිටාව සොයාගන්නට වෑයම් කළාය. බිළිඳා. ඇගේ බිළිඳා. බිළිඳා එහි නොවීය!

ඒ ගිනිකෙළි පමණක් බව ඇය තේරුම් ගත්තේ විනාඩි කිහිපයක් ගත වූවාට පසුවය. මිනිස්සු සතුටින් ප්‍රමුදිත වී රාත්‍රිය පුරා රතිඤ්ඤා පත්තු කළහ. ඇය සිය දණහිස් ඇගේ පපුවෙහි තබාගත්තේ ඇගේ සිරුර වෙව්ලන කම්පනය වළකා ගන්නට උත්සාහ කරන්නාක් මෙනි. තිගැස්මෙන් ඇගේ මොළය හිරිවැටී තිබිණි, ඇයගේ හදවත කුණාටුවට

අසු වූ දුබල කොළයක් මෙන් සසල වෙමින් තිබිණි. සෙමින්, ඇගේ දෑස්, ගන අන්ධකාරයට අනුයෝජනය වෙමින් නිල් හා රතු දීප්තිය වටහාග න්නට පටන්ගත්තාය. ඇගේ හිසට උඩින් ඇති කුඩා කවුළුව හරහා ඇයට තරු වරුෂාවක් පිරී ගිය, රතු සහ පුළිඟු විහිඳුවන අහස දැකිය හැකි විය. නව වසර එළඹී ඇත.

උදෑසන, ඇයට රෙදි ගොන්නක් සෝදන්නට තිබිණි. ස්වමියා හා ස්වාමිදුව කොහේදෝ ගොස් ඇත, සති අන්තයට එක් වූ අවුරුදු නිවාඩු දෙකද සහිතව එය දීරඝ නිවාඩුවක් විය. ඔවුහු බිළිඳා නිවසෙහි තබා ගොස් තිබුණේ එදින කළ යුතු දේ ගැන පැහැදිලි උපදෙස් සමගිනි. ඇය බිළිඳා නින්දට දැමූ පසුව, රෙදි සෝදා අනතුරුව කෑම සූදානම් කළ යුතු විය. කුමක් හෝ කරුණක් නිසා, නිතරම සතුටින් හා ප්‍රීතියෙන් සිටින බෝල බබා එදින සිටියේ පුදුමාකාර ලෙස මුඩුම විලාසයකිනි. ඇය ඔහු සෝදා, පියරු දමා, ලස්සන කහ පැහැති ඇඳුම් අන්ද වූ නමුත්, ඔහු කිසිවක් කෑමද, නින්දට යාමද ප්‍රතික්ෂේප කළේය. දැන් ඇය නොනවත්වා හඬයි.

ඇයට වෙහෙස දැනිණි. ගිනි බිඳින්නාක් මෙන් ඇසුණු රතිඤ්ඤා හඬද, ඒවා අහසේ පුපුරා යාමද නිසා ඇය මුළු රැයම නිදි නොලැබුවාය. එය අවුරුදු වූ නමුත්, අලුත් අවුරුද්ද ගැන සිතීමෙන් ඇයට සතුටක් දැනුණේ නැත. ගෙදරදී නම් ඔවුහු අවුරුදු වෙනුවෙන්, මල් වැටුණු රෙද්දෙන් ඇඳුම් මැහීමෙන්, දියමන්ති හැඩයේ අලුවා සහ දෝසි සෑදීමෙන්, රන් පැහැති කැවුම් කරවෙන ගැඹුරු තෙලෙහි හෙමිහිට බැදීමෙන්, මාස ගණන් සූදානම් වෙති. ඇගේ කුඩා සොයුරු සොයුරියෝ සිනාසෙමින්, විශාල කහ පැහැති අවුළුපත් බැදෙනු බලාගෙන ඇය ඉඳගෙන සිටින තැනින් කොකිසක් උදුරා ගන්නට මාන බලමින් දිව යති. ඇයට වෙහෙසය, බොහෝ වෙහෙසය. දවසම කලහාකාරී ආකාරයෙන් සිටින්නට බවට බිළිඳා ද ඔහු තීරණය කර තිබේ.

මුහුණ ඉදුණු ජම්බු ගෙඩියක් මෙන් රත් පැහැ ගැනුණු බෙරිහන් දෙන බිළිඳා අස්වසන්නට උත්සාහ කිරීම ඇය අවසානයේදී අත හැරියාය. බෙලි ගස් යට, තණබිස්සෙහි ඇය පසෙකින් ඔහු තබාගෙන ඇය රෙදි සෝදනු ඇත. ඔහු අඬා ඇති වූ විට නින්දට යනු ඇත. ඇය බිළිඳා ඇකයෙහි ගසාගෙන, කිලිටි රෙදි බාල්දිය සහ බිළිඳාගේ රබර් පැදුරද ගෙන ළිඳ වෙත ගියාය.

බෙලි ගස යට හිරු එළිය වැටුණු අතර, පහළ වූ තණ නිල්ලෙහි කොළවල සෙවනැලි නටන්නට විය. ඇය ලස්සන බිළිඳා ඔහුගේ පැදුරෙහි හොවා, වැටී තිබුණු කොළයකින් ඔහුගේ අත් මිට කිති කැව්වේය. ඔහු මොහොතකට හැඬීම නවතා කොළයේ රටාවන් දෙස ද, ඔහුගේ රබර් පැදුරෙහි සෙවනැලි රඟදෙන ආකාරයද මෝහනයකින් මෙන් බලා සිටියේය. අනතුරුව විසල් දෑසින් වට පිට බැලුවේ ලොව නැවුම් හිරු රැස් උරා ගනිමිනි. එය මනරම් දවසක් විය. එහෙත් දූරිය එය දුටුවේ නැත, ඇය බොහෝ වෙහෙසව සිටියාය. සුසුමක් හෙළා ඇය සෝදන්නට තිබුණු කිලිටි ඇඳුම් කූඩය, රතු බේසමද සමග ගනිමින්, රෙදි සේදීම සඳහා නිරාවරණ දෙපයින් යුතුව ළිඳ දෙසට ගියාය.

යළිත් බිළිඳා උස් හඬින් හඬන විට, ඇය රෙදි 'සර්ෆ් එක්සෙල්' දමා, වැළමිටට තෙක් සිය දෑත් සබන් වතුරෙහි දමාගෙන රෙදි පොඟ වමින් සිටියාය. සැර සෝදන කුඩට ඇගේ හම පිච්චෙමින් තිබිණි. ඒ හඬ ඇගේ සිතිවිලි ඉරාගෙන පැමිණියේය, ඇගේ කල්පනාවෙන් ඇය තිගැස්මට ලක්කරන්නට ඒ හඬ සමත් විය. ඇය බිම බලාගෙන, රතු බේසමෙහි නැඟෙන සුදු පෙණ පිඩු දෙස බැලුවාය. ඇයගේ ආත්මයද, ඉරු එළියෙහි සබන් පෙණ කැකෑරෙන්නාක් මෙන් කැකෑරෙන්නට විය. හිරු එළිය ඇගේ අත්වල වූ සබන් වතුර වියළා දැමුවේ ඇගේ අත්වල ඇලෙන තෙතමනයක් තබමිනි. ඉහළින් වූ ගසෙන්, බෙලි ගෙඩියක් ගල් පොළොවෙහි වැටී, බෙලි කටුව දෙකට වන සේ පුපුරා ගියේය. එය හිස් කබලක් දෙකඩ වූවාක් බඳුවිය. බෙලි ගෙඩියේ බිඳුණු බෑවල කඩතොළු වූ කොන්වලින්, තැඹිලි පැහැති මදය පිටතට ආවේය, පොඩි වී ගිය බෙලි පල්පය!

ඇගේ වේදනා ගෙන දෙන ඉදිමුණු කන් දෙදරවන හඬකින්, බිළිඳා යටිගිරියෙන් කෑගහන්නට වූයේය. ඇගේ සායෙන් සබන් පෙණ පිස දමමින් ඇය නැගී සිටියාය. කෑගසන බිළිඳා සෙමින් අතට ගෙන ඔහු නළවාගන්නට ඇය උත්සාහ කළාය, ඇගේ දෑතෙහි තබාගෙන ඒ මේ අත පදවමින්, සෙමින් උඩට ඔසවා අල්ලා ගනිමින් ඔහු නළවන්නට ඇය වෑයම් කළාය. එහෙත් බිළිඳා නොනවත්වා හැඬුවේය. ඇගේ ඇතුළාන්තයෙන්, ඇගේ ආත්මය කැකෑරෙන්නට විය, ඇගේම බිළිඳා ඔහුගේ ශක්තිමත් දෑතින් පසුපසින් ඇගේ ගෙලෙහි එල්ලීගෙන සිටි අතර, ඔහුගේ සිහින් ඇඟිලි වහා ඇගේ හමට කාවදින්නට විය.

දරුවා සිය අතෙහි පද්දමින්, ඇය ළිඳ දෙසට ගමන් කළාය. ඔහු බරය, ඇගේ පපුවෙහි ඔහු සිටින්නේ සුදු පිටි වලින් සෑදූ පිටි ගුලියක් ලෙසිනි. ඇය ඔහුට ළිඳ තුළ වූ ජලය පෙන්වූවාය, පැහැදිළි කළු ජලයෙහි හිරු එළිය රඟ දෙන්නේ කෙසේදැයි ඇය පෙන්වූවාය. මීවන අතරින් කෘමීන් ඉගිලෙන ආකාරය ඇය පෙන්වා දුන්නාය. ඔවුන් දකින්නට සීරු මාරුවෙන් බැලිය යුතු වුවද, එහි මසුන් කිහිප දෙනෙක්ද සිටියහ. කුඩා මුදු මොලොක් කළු මත්ස්‍යයා ජලය මත්තෙහි වැටුණු කොළ ඇති තැන්වලට වහ වහා පීනා යයි. ඔවුන් සිටීම ළිඳට හොඳය, මන්ද කෘමි බිත්තර මාළුන් කා දමන බැවිනි.

ඇගේ අතෙහි බබා බරට සිටියදී, ඇය ළිඳ කොණට නැමුණාය. 'බලන්න බබා' ඇය, කළු සෙවනැල්ලෙහි පිළිඹිබු වන, ළිං ජලයෙහි ඔවුන්ගේ පිළිඹිබුව පෙන්වමින් කීවාය. 'බලන්න. අර මගේ පුංචි බබා. බලන්න කොච්චර ලස්සන බබෙක්ද කියලා' බිළිඳා, ඇගේ හඬ අසන්නට නැවතී, ජලයෙහි පිළිඹිබු වන එළිය දැක, එය බලන්නට හැඬීම නැවැතුවේය.

මත්ස්‍යයෝ හදිසියේම දිළිසෙන රිදීවන් දිය මතු පිටට පීනා ආවෝය, මාළුවා ජලය කලතමින් නැවත යටට පීනා ගියේය. ඒ දුටු පොඩි එකා සතුටින් සිනාසී ඇගේ අතින් පනින්නට උත්සාහ කළේය. ඇගේ හදවත කිරි ගැසුණේය, තමාගේම බිළිඳාගේ බර ඉසිලිය නොහැකි තරම් විය. ඇයගෙන් අම්හිරි, වියළි ඉකිබිඳුමක් මතු විය.

***පවන් මිදි කලුගල*** *කොළඹ විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි විශේෂවේදී උපාධිය හදාරන දෙවන වසරෙහි උපාධි අපේක්ෂිකාවකි. ඇය පළමු කොට කවියෙකි, මේ කෙටිකතා ලිවීමේ ඇයගේ පළමු උත්සාහයයි. ජීවිතය වාර්තාකර තැබීමේ අවශ්‍යතාවව හඟින බැවින් ඇය ලිවීම කරයි.*

# හෙළි නොවූ කතාවක්

***කැනිස්ටා ආර්ති ඩෙනිසියස්***

එය බැසයන හිරුගේ දීප්තිය සමග වැලි පස දිදුලන ලස්සන සන්ධ්‍යාවක් වූයේය. හමුදා කඳවුරෙන් ඈතක නොවන තැනක නැවතීමට හඬ නගාගෙන පැමිණි ට්‍රක් රථයෙන් බිමට බට තීක්ෂණ වටපිට පරිසරයෙහි නිහඬ බව දෙස බැලුවේය. සීතල නැවුම් වාතය ආශ්වාස කරද්දී ඔහුට ඔහු තුළ ඇති නිසල බව සහ ශාන්ත බව දැනී ගියේය. භූ දර්ශනයෙහි විශාලත්වය ඔහු පුදුමයට පත් කළේය.

'පාළු වී ගිහින්, ඒත් අගය කළ යුතුයි' ඔහු වටා ඇති විසල් ගහ කොළ, සැන්දෑ හිරුගේ රන්වන් පාටින් දිලිසෙන, මුදු, සිනිඳු වැල්ලට සහ පොළවට රැකවරණය දුන් ආකාරය බලමින් තීක්ෂණ හමුදා කඳවුර දෙසට ගමන් කළේය. මේ ඔහුගේ පළමු පත්වීම වූයේය. මූලික පුහුණුව ලැබීමෙන් පසුව කිලිනොච්චියෙහි පිහිටි ඉතා දුරබැහැර දුෂ්කර ගම්මානයක් වන මරුතොඩෙයි කඳවුරට ඔහු එවනු ලැබුවේය. 'මේ බලන්න තීක්ෂණ' ඔහුගේ පත්වීම දුන් අණදෙන නිලධාරියා ඔහුට මෙසේ කීවේය. 'අපි ඔබ යවන්නේ තුන් හතර අවුරුද්දකට පෙර ත්‍රස්තවාදින් බොහොම බලවත්ව තහවුරු කරගත් නැවත පදිංචි වූ ගම්මානයකටයි. ප්‍රවේසම් වෙන්න! ඔවුන් සියලු දෙනාටම, ඔවුන්ගේ ලේ වල විප්ලවකාරී නැඹුරුවක් තිබෙනවා. ඔබ හැම විටම නිරීක්ෂණයෙන් ඉන්නට ඕනෑ. තේරුණාද?'

වෙරළෙහි රළ හැපෙනු ඇතින් ඇසෙන මග ඔහු ඇවිද යන විට ඔහුගේ දෙසවනෙහි අණදෙන නිලධාරියා කී වචන රැව් දුන්නේය.

වයස දහනවයක් පමණක් වුවද, ඔහුගේ පවුලේ බර පිළිබඳ වගකීම උර මතට ගැනීමට තීක්ෂණට බල කෙරිණි. ඔහුගේ පියා බේබද්දෙකු වූ අතර, ඔහුගේ මව ඇඟලුම් කම්හලක දීර්ඝ වේලා වැඩකරමින් පවුල රැකගැනීමට කටයුතු කළාය. හයමසකට පෙර ඇගේ අතට කම්හලේ මැෂිමකින් හානි වූ අතර, කුඩා වන්දියක් ගෙවා ඇය ගෙදර එවනු ලැබිණි. පවුලේ වැඩිමලා වූ තීක්ෂණට, හමුදාවට බැඳීම හැර වෙනත් විකල්පයක් තිබුණේ නැත.

ඔහු පසුකර ආ කුඩා පැල්පත් හා නිවාසයන්හි සුදු සහ නිල් ප්ලාස්ටික් මුක්කු ලෑලිවල, ඒ පවුලට ආධාර කළ රාජ්‍ය නොවන සංවිධානයේ නම ප්‍රචාරය කර තිබුණේය. ඔහු හමුදා කඳවුරට ළඟා වන විට, ගේට්ටුවේ මුර කපොල්ලෙහි සෙබලුන් සමග කතා කරමින් ඔහුගේ වයසෙහිම තරුණ සොල්දාදුවන් දෙදෙනෙක් වූහ.

'හලෝ, ඔයා තීක්ෂණද?' තරුණ සොල්දාදුවන් දෙදෙනාගෙන් කෙනෙකු ඇසුවේය.

'ඔව්, ඔයා?'

'මම තරිඳු, මෙයා චමින්ද. ඊයෙ අපට දැනුම් දුන්නා තීක්ෂණ කියලා කෙනෙක් මෙහාට එනවා කියලා. අපි මෙතනට වෙලා බලා හිටියෙ ඔයා පිළිගන්න. ඔයා අපිත් එක්ක ඉන්නෙ'

තරිඳු සහ චමින්ද තීක්ෂණගේ ගමන් මළු ඔසවාගෙන ඔහු හමුදා කඳවුරට කැඳවාගෙන ගියහ. හමුදාව වටා බිත්ති බැඳීමට වැලි මළු භාවිතා කර ඇති ආකාරය දෙස බලමින් ඔහු ඔවුන් අනුගමනය කළේය. පිට්ටනියෙහි ජපන් රෝස මල් පිපී තිබුණු අතර, ඒවා පරිසරයෙහි ලස්සන වැඩි කරවූයේය.

'ඉතින් තීක්ෂණ, ඔයා මෙහාට අලුත් නිසා උපදෙසක් දෙන්න මට ඉඩදෙන්න. මිනිස්සුන්ට පෙන්නන්න ඕන දැඩි මූණක්. මුරපොළක් පහුකරගෙන කවුරු හරි යනවා දැක්කත්, හැඳුනුම්පත ඔයාට පෙන්නලා යන්න කියලා කියන්න අමතක කරන්න එපා'

මේ දැඩි අවවාදය කුමක් නිසාදැයි, නොදන්නා තීක්ෂණ හිස සැලුවේය.

'කවදාවත් ඒගොල්ලො එක්ක මිත්‍ර වෙන්න එපා' තීක්ෂණ ඔවුන් සමග නේවාසික කාමරයට පැමිණි විට තරිඳු කීවේය.

ඇඳක් සහ කුඩා ලොකරයක් තිබූ කාමරයේ කොනක් චමින්ද ඔහුට පෙන්වූයේය. 'ආයුබෝවන්'

ඔහු පැමිණ දින ගණනකට පසුව, තීක්ෂණ හමුදා කඳවුරෙහි

පිවිසුමෙහි මුර සෙබල තනතුරට අනුයුක්ත කළේය. හමුදාව තිබුණේ මාරුතොඩෙයි ගම්මානයේ ප්‍රසිද්ධ අම්මාන් කෝවිල ආසන්නයේය. සිකුරාදා දිනවලදී, මිනිසුන් සැලකිය යුතු සංඛ්‍යාවක් මාරුතොඩෙයි ගමෙහි හැම පෙදෙසකින්ම අම්මාන් කෝවිල වැඳ පුදා ගන්නටත්, පූජාවට සහභාගී වන්නටත් පැමිණෙති. මාරුතොඩෙයි අම්මාන් කෝවිල ඉතා බලවත් බවත්, පූජාව අවස්ථාවෙහි කෙනෙක් ඉල්ලා සිටින ඕනෑම දෙයක් ඔවුනට ලබාදෙන බවත් සාමාන්‍ය විශ්වාසය විය. යුද්ධය කාලයේදී අතුරුදහන් වූ පුතුන්ගේ මව්වරුන් බොහෝ දෙනෙක් අම්මාන් දෙවියන් වඳින්නට එහි පැමිණෙන්නේ, එමගින් ඔවුන්ගේ පුතුන් නැවත ඔවුන් වෙත ගෙන්වා ගැනීමට හැකිවේය යන බලාපොරොත්තුවෙනි. එහෙත් සිය පුතුන්ගේ නම් වලින් ඔවුන් විවිධාකාර පූජා පවත්වන නමුදු, එකදු මවකට හෝ සිය පුතුන් සොයාගත නොහැකි විය.

එය සිකුරාදාවක් වූ අතර, තීක්ෂණගේ පැමිණීමෙන් පසු උදා වූ පළමු සිකුරාදා දිනය වූයේය, අම්මාන් කෝවිලට යන මිනිසුන්ගේ විශාල සංඛ්‍යාව දැක ඔහු විස්මයට පත්වූයේය. ඔහුගේ දෙනෙත් සෙනඟ අතරෙහි සැරිසරන කල, ඒ දෑස් තරුණ කාන්තාවක අබියස නැවතුණේය. ඇය රැළි වැටුණු හිසකේ, කළු පැහැති රවුම් ඇස්, සිහින්, කළු පැහැයෙන් යුතු සහ උසැති තරුණ කාන්තාවකි. ඇය වසර දෙකකට පෙර පිළිකා රෝගයෙන් මියගිය ඔහුගේ සදාදරණීය සොහොයුරියට සමාන වූවාය. විස්මය දනවන ඒ සමානත්වය ඔහු තැති ගැන්වූයේය. ඒ මොහොතෙහි සිටම ඔහුට ඇය දෙස නොබලා සිටිය නොහැකි වූයේය.

සුධර්විලීට කිසිවකු තමා දෙස බලා සිටිනු දැනුණු අතර, වටපිට බලන විට ඇගේ දෑස් තීක්ෂණගේ දෑස් හා බද්ධ වූයේය. ඇයට ඇගේ ලෙය ගල්ගැසෙනු දැනිණි. 'මං මේ විදිහට ඇහැ ගැහෙන්නෙ මොකටද? මටත් වෙන්න යන්නෙ මගේ අතුරුදහන් වෙච්ච සහෝදරයට වෙච්ච දේද?' ඇය සිතුවාය. ඇගේ කළු මුහුණ වඩාත් කළු වූයේ හම යට රත්වූ ලෙය ගලා ඒමෙනි. ඇගේ බිය, කෝපය හා මුසුවිය. 'මේ සත්තු කාරණයක් නැතුව මාව හිරකරනවා. මටත් අතුරුදහන් වෙන්න සිද්ද වෙයිද?'

පූජා අවසන් වීමෙන් පසුව, සුධර්විලි සිය මවගේ අත ඇදගෙන නිවස කරා යන්නට වූවාය. ඔවුන් හමුදා කඳවුර පසුකර යද්දී, සුධර්විලි සිය මවගේ අත තදකොට අල්ලාගෙන යන විට ඇගේ අත ඉතා සීතල විය, ඇගේ හදවත ගැහෙන්නට විය.

එදින රාත්‍රියේදී අර සෙබලා ඕනෑකමින් බැලූ ආකාරය සිහි වීමෙන්, සුධාර්විලිට හරි හැටි නිදි ලැබිය නොහැකි විය. පිටත සීතල වූ නමුත්, ඇය දහදියෙන් තෙත් වූවාය. ඇයට ඇයගේ ඉරී ගිය පැදුරෙහි තවදුරටත් වැතිර සිටිය නොහැකි විය, ඇය නැගී සිටියාය, අනතුරුව මුළුතැන්ගෙයට ගොස් වතුර වීදුරු දෙකක් බිව්වාය. තවමත් ඇයට ඇගේ නොසන්සුකම සංසිඳුවාගත නොහැකි විය. ඇය දොර හැර පැල්පත පිටතට ගියාය. ඇය එහාටත් මෙහාටත් ඇවිදින්නට වූවාය, ඔවුන්ගේ කුඩා නිවසේ නිදන ඇයගේ මවට සහ සොයුරියට බාධා නොවන පරිදි ඇය හෙමින් මුදු ලෙස අඩි තබා ඇවිද්දාය. හදිසියේම ඇයට ට්‍රක් රථයක් එනු ඇසුණු අතර කටහඬවල්ද ඇසුණේය. සුධර්විලි ගෙපැළ තුළට ඉක්මනින් ගියාය, ඇය ඉක්මනින් ලාම්පුවෙහි දැල්ල අඩු කළාය. අනතුරුව ඇය ආපසු පැදුරට ගියාය. ඇය හිසෙහි පටන් පොරවාගෙන, නිදන්නට වෙහෙසෙමින් සිටියාය, එහෙත් ඇය දැන් සිටියේ පිටත සියලුම ශබ්ද කෙරෙහි විමසිල්ලෙනි. ට්‍රක් රථය ආපසු යාමෙන් පසුවද ඇය අවදිව සිටියාය.

'නෑ මං කිසි වරදක් කළේ නෑ. කරුණාකරලා මාව අතාරින්න. මගේ අම්මයි, මගේ පුංචි සහෝදරියි මෙහෙ තනියම ඉන්නෙ. ඒගොල්ලන්ට මාව ඕනෙ. මං ඔයා හිතන විදිහෙ නෙවෙයි'

එහෙත් ඇගේ ආයාචනා පල රහිත විය. ඇය දෙස බලා සිටි සෙබලා, තවත් දෙදෙනෙකු සමග විත්, ඇය ගෙපැලින් පිටතට ඇදගෙන ගියේය. ඇගේ මව ඔවුන් පසුපසින් කෑගසමින් ගියේ තරුණයින්ට ආයාචනා කරමිනි. සුධර්විලිගේ ආබාධිත සොහොයුරිය, වලාර්මදී දොර පසුපස සැඟවී ලොකු කරගත් දෑසින් ඇගේ සොහොයුරිය දෙස එබී බැලුවාය. සුධර්විලිගේ සෝෂා සහිත හඬ අඳුර පසාරු කොටගෙන ගියේය. 'එපා. මාව අතාරින්න. මං කිසිදෙයක් කළේ නෑ. මට එන්න බෑ උඹලා එක්ක. මට මගේ අම්මයි, නංගියි අතාරින්න බෑ'

'සුධාර්, සුධාර් බලන්න ඔයාගේ අම්ම මේ ඉන්නවා. රත්තරනෙ, ඔයාට හොඳයි නේද?'

ඇගේ මව නින්දෙහි සිටින ඇය සොලවමින්, ඇයගේ හිසට තට්ටුකරමින් සිටිනු සුධර්විලි නැගිටින විට දුටුවාය. ඇය මව දෙස දෑස් දල්වා බලා සිටියාය. ඇගේ සොහොයුරිය වලාර්මදී ඇය පසෙකින් තවමත් නින්දෙහි පසුවෙයි. දොර ආරක්ෂිතව වසා තිබේ.

'ඊයෙ රෑ නින්දට යනකොට ඔයා මුල්ලිවයිකාල්වල අන්තිම දවස් ගැන හිත හිත හිටියද?' තවමත් ඇයගේ හිස පිරිමදිමින් අම්මා ඇසුවාය.

සුධර්විලි හිස වැනුවාය. අර සොල්දාදුවා තමා අල්ලාගනු ඇතය යන බිය මවට අනාවරණය කිරීමට ඇයට වුවමනා නොවීය, දැනටමත් අවසනාවන්තව සිටින මවට තව දුරටත් රිදවීමට ඇයට අවැසි නොවීය.

සුධර්විලිට පාසල් යාමට සූදානම් වීමට වෙලාව දැනටමත් එළඹ තිබිණි. ඇය ඉක්මනින් ඇඳ ගත්තාය, ඇය නිවසෙන් පිටතට යද්දී, අර සොල්දාදුවා මුණගැසීම මග හැරීමට ඇගේ සිත හදා ගත්තාය. ඇය අම්මාන් කෝවිල සමීපයට යන විට ඇය ඇගේ දෙපාවලට යා හැකි ඉහළම වේගයෙන් ගමන් කළාය. ඔහු සිය ගිනි අවියද අතැතිව, හමුදා කඳවුරෙහි දොරටුවෙහි සිටියේය. ඇය ඔහු දෙස නොබැලූ නමුදු, ඇයට ඔහු තමා දෙස බලන බව දැනී ගියේය. ඇය සිය මුහුණ හැකිතාක් ශාන්තව තබා ගත්තාය, ඇගේ ඉරියව් අහිංසක හා නිර්මල වූයෙන් ඔහුට ඇය කෙරෙහි කිසිදු සැකයක් ඇතිකරගත හැකි නොවනු ඇත. කෙසේ වුවද, ඔහු ඇය නැවතුවේවත්, ඇගේ හැඳුනුම්පත පෙන්වන්නට කීවේවත් නැත. මුරපොළ පියමන් කර එන ඇයගේ සිතට මහත් සහනයක් දැනුණි.

ඇය පාසලෙන් ආපසු එන විට, ඇයට නැවත මුරපොළ පසුකර යන්නට සිදුව තිබිණි, අර සෙබලා එතැන සිටියේය. ඇය ඇවිද යන විට ඇයට ඔහුගේ බැල්ම දැනෙන්නට විය.

දින ගෙවී යද්දී, සොල්දාදුවා තුළ ඇය කෙරෙහි පව්කාර හැඟීමක් නැති බව ඇය තේරුම් ගත්තාය, රාත්‍රියේදී, ඇගේ පැදුරෙහි ඇය වැතිර සිටියදී, ඇය නිතර හැඟුම්බර ලෙසින් ඔහුට මෙසේ කියනු දැනිණි.

'සෙබල, ඔබ මා ගැන කිසිවක් දන්නේ නෑ. මං කියනවා ඔයාට විශ්වාස කරන්න කියලා මං අහිංසක, ඉගෙනීමට අවධානය යොමුකරන, ඉගෙන ගන්න ආසව තියෙන ශිෂ්‍යාවක්. ඒත් ඔබ හෝ ඔබගේ අය මුණ ගැහෙනකොට මට කොච්චර කටුක බවක් දැනෙනවද කියලා දන්නවද? ඔබලාගේ මිනිස්සු මගේ පියාවයි, මගේ ආදරණීය සහෝදරයවයි මැරුවා! අධම නුඹලා මගේ වැඩිමහල් සහෝදරයව හිරේ විලංගුවේ ඇරියා. නුඹලගෙ අත්වල තියෙන ඔය ගිනි අවි දැක්කම මගේ ලේ රත් වෙනවා,

මගේ ආදරණීයයන් මරපු බිහිසුණු අවි ආයුධ. නුඹලා කැත වෘකයො. මට ගිනි අවියක් තිබුණා නම්, මගේ ලේ පිපාසය සංසිඳෙන කම් මං උඹලට වෙඩි තියනවා. ගෞරවනීය ආදාහනයකටවත් ඉඩ නොලබපු මගේ ආදරණීයයන් සාමයේ සැතපෙන තුරු මම උඹලට වෙඩි තියනවා'

ඇයට හැම විටම ඇගේ සොයුරු නීදන් සහ චේදිකාව කෙරෙහි තිබූ ඔහුගේ බැඳීම සිහිපත් විය, එල්ටීටීඊයෙහි සිය මිතුරන් නළුවන් ලෙස යොදාගනිමින් 'කාර්යභාරය' සඳහා සහයෝගය දෙනු වස් කිලිනොච්චි බස් නැවතුම් පොළෙහි ඔහු වීදි නාට්‍යය පෙන්වූ හැටි ඇයට සිහිපත් විය. ඔවුන්ගේ නිවසෙහි බිත්ති නීදන් පාසල් කාලයේදී කථික තරඟ, නාට්‍යය හා සංගීත තරඟවලින් දිනාගත් පදක්කම්, ත්‍යාග සහ සම්මානවලින් පිරී තිබිණි. නීදන් චේදිකාවේදී කෙතරම් ව්‍යක්ත වූයේද? නාට්‍යය සඳහා ආවේශක පැදි ලියමින් සහ ගීත සඳහා ප්‍රබල ගී පද ලියමින් ඔහු කල් ගෙවූ හැටි ඇයට සිහිපත් විය.

මේවා ඔවුන්ගේ දිවියෙහි හොඳ කාලයේදී සිදුවූ අතර, යුද්ධයේ අවසාන අවධිය උදා වූ විට, ඔවුන්ගේ පවුල, ඔවුන් වටා සිටි අනෙකුත් අය මෙන්ම බොහෝ බරපතල දුෂ්කරතාවන්ට මුහුණ දුන්හ. ඔවුන්ගේ පවුලට වැදුණු පළමු ප්‍රහාරය වූයේ එක් උදෑසනක, ඇගේ බාල සහෝදරයා වූ තීපන් ඉගෙන ගනිමින් සිටි පාසලට ගුවන් ප්‍රහාරයක් එල්ල වී එම ගොඩනැගිල්ල දුමෙන් පිරී යාමයි. ඇයගේ පියා පාසලට දිව ගිය නමුත්, ඔහු එසේ දිව යන විට, බෝම්බ ප්‍රහාරයකින් ඔහු මිය ගියේය. ඔවුන්ගේ පවුලේ අනෙකුත් අයට රැඳවීමේ කඳවුරට යාමට බල කළේ ඇගේ සොයුරු තීපන්ට හෝ ඇගේ පියාට භූමදානයක් හෝ ඉතිරි නොකරමිනි.

ඔවුන් කඳවුරේ සිටියදී, හමුදා අණදෙන නිලධාරීන් කණ්ඩායමක් වැසියන්ගෙන් ප්‍රශ්න කිරීමට පැමිණියේය. ඔවුන් අතරෙහි සිටි, හොඳින් වැඩුණු, තරබාරු, ගොරෝසු රුවුලක් තිබූ මිනිසෙක්, ගවරුළක් මෙන් එහි ඉඳගෙන සිටි මිනිසුන් දෙස බලමින් උඩටත් පහළටත් ගියේය. ඔහු උගුර පාදා ඔහුගේ උස් ස්වරයෙන් කතා කළේය. 'උඹලා ඔක්කොම කවුද කියලා මං හොඳට දන්නවා, උඹලගේ හුඟක් දෙනා එල්ටීටීඊයට උදව් කරනවා. අයාලෙ යන බල්ලන්ව ඇදගෙන යනවා වගේ උඹලගේ සමහර අයව මං ඇවිත් ඇදගෙන යන්න ඉස්සෙල්ලා, එල්ටීටීඊය එක්ක සම්බන්ධකම් තිබ්බ්ච අය මෙතන ඉන්නවා නම් නැගිටලා පෝලිම් ගැහියල්ලා' ඔහු කෝපයෙන් බලා සිටින සෙනඟ දෙස බැලුවේය.

'මොන මෝඩ අණක්ද?'සුධර්විලී සිතුවාය. 'අපි ඔක්කොම එල්ටීටීඊය එක්කයි, මේ නිවටයා අපෙන් මොනවද බලාපොරොත්තු වෙන්නෙ?' සුධර්විලීට සිය උගුරෙහි රත්වීමක් දැනෙන්නට විය.

පෝලිම හැදෙන්නට විය. සියලුම තරුණ අය පාහේ බියපත්ව සහ බලාපොරොත්තු සුන්වූ පරිද්දෙන් එයට එකතු වූහ. නීදන්ගේ මව ඔහුට නොයන ලෙස සංඥා කළද, අනෙක් අය තමාට ඇඟිලි දිගු කරන්නට පෙර නීදන් පෝලිමට එක් වූයේය. වැලපිය නොහැකිව, ඔවුන්ගේ මව ගලක් සේ ඉඳගෙන සිටියාය.

එයින් පසු අවුරුදු හතරක් ගෙවී ගිය පසු, රතු කුරුස සංවිධානයට සහ රාජ්‍ය නොවන සංවිධාන වෙත ගිය සියලුම ගමන්වලින්, රජයේ ආයතනයන සහ හමුදා නිලධාරින් සමග කළ විවිධ හමුවීම් කිසිවකින් ඔවුන්ට නීදන් ගැන කිසිවක් සොයාගත නොහැකි විය. ඔහු ජීවත්ව සිටිනවාද, මියගොස්ද, රඳවාගෙන සිටිනවාද නැතිද යන්න ඔවුන් දැන සිටියේ නැත.

දින ගෙවී යන විට, දෙමළ මිනිසුන් තමා සිතූ පරිදි කෲර සහ භයානක අය නොවන බව තීක්ෂණ අවබෝධ කොට ගත්තේය. සෙබලුන්ට, කඳවුරෙන් කෑම ලැබීමට බොහෝ වේලා ගත වන බව තේරුම් ගන්නා බොහෝ මව්වරු, ඔවුන්ට කෝවිලෙන් ලැබෙන පූජා ආහාර තරුණයින්ට ලබා දුන්හ. මව්වරු වූ ඔවුන්ට, මේ තරුණයින්ට හාමතින් සිටින්නට ඉඩදිය නොහැකි විය. කෑම දීමට මව්වරුන්ට අමතක වුවහොත් තීක්ෂණ ඔවුන්ට කතා කොට 'අම්මේ, අම්මේ කෑම දෙන්න' යි ඔහුගේ මුවට අත තබා අභිනයෙන් කියන්නේ එවිට ඔහු ආහාර ඉල්ලා සිටින බව මව්වරුන්ට දැනගත හැකි පරිද්දෙනි. ඔහුගේ ආයාචනයට පළමුව ඔවුන් සිනාසෙන අතර අනතුරුව මව්වරු සිනාසෙමින් යුතුව ඔවුන්ගේ කෑම පිරිනමති.

කඳවුරෙහි පොඩි පොඩි වැඩ කරන්නට පැමිණි දෙමළ මිනිසෙක් සමග ඔහු බොහෝ මිත්‍ර වූයේය, කෝවිලට වැල නොකැඩී පැමිණෙන ගැහැණුන් ගැන ඔහු දෙමළ මිනිසාගෙන් ප්‍රශ්න කළ විට, ඔවුන් පැමිණෙන්නේ ඔවුන්ගේ අතුරුදහන් වූ පුතුන් ආපසු ගෙන්වාගනු පිණිස දෙවියන්ට කන්නලව් කිරීමට බව ඔහුට දැනගන්නට ලැබිණි. මෙය දැනගැනීමෙන්, ඔහුගේ පුහුණුව ලැබූ කඳවුර පිළිබඳ සිතන්නට ඔහු පෙළඹුණේය. එහි තමාගේම වයසේ

තරුණ දෙමළ කණ්ඩායමක් සිරකරුවන් සේ තබාගෙන සිටියේය. පුහුණුව ලබන සෙබලෙක් ලෙස, ඔහුට තිබුණේ ඉතා නරක කාර්යයන්ය, ඉදින් ඔහු නිතර යොදනු ලැබුවේ සිරකුටිවල සිටින තරුණයින්ගේ මළපහ ඇතුළත් අසූචි බාල්දි රැගෙන ගොස් ඒවා හිස් කිරීමේ කටයුත්ත කරන තරුණයින් කැඳවාගෙන යාමටය. ඔහු ඔවුන්ට අනුකම්පා කළ අතර, පසුකලෙක ඔවුන්ගේ නම්ද, ඔවුන්ගේ අතීත තොරතුරු මදක් ද දැනගත්තේය. තමා නිරීක්ෂණය නොවන බව සැක හැර දැනගත් කල්හි ඔහු ඔවුන්ට සිගරැට්ටුවක් ලබා දුන්නේය.

'භාෂාවයි, සංස්කෘතියයි ඇරුණම දෙමළ මිනිස්සුයි, සිංහල මිනිස්සුයි එක වගේ' ඒ ගැහැණුන් යනු එනු දකින ඔහු එසේ සිතුවේය. 'අපේ මිනිස්සු වගේම දෙමළ මිනිස්සුත් කරුණාවන්ත, ආදරණීය ජීවිත ගත කරයි. මූලික වශයෙන්ම අපිට එකිනෙකාට විරුද්ධ කිසිදෙයක් නෑ. කාණ්ඩ දෙක යුද්දෙට දැක්කුවෙ දේශපාලන බලවේග. ඒ අයගෙ දේශපාලන අරමුණු ඉෂ්ට කරගන්න කාරණා විකෘති කළේ, වැරදි විදිහට අර්ථකථනය කළේ දේශපාලනඥයො. අපි ඔක්කොම ඒගොල්ලන්ගෙ අතේ නැටවෙන රූකඩ, ඒගොල්ලන්ගෙ අභිමතාර්ථ ඉෂ්ට කරගන්න බිලි වෙන්නෙ අපි'

සමහර අවස්ථාවලදී ඔහුගේ සහෝදර සෙබලු ගම්මුන්ට කටුක ලෙස සැලකූහ. මිනිසුන්ට කුරිරු ලෙස සැලකූහ. වැසියන්ට සෙබලු සලකන්නේ කුමන ආකාරයෙන්ද යන්න බැලීමට අණදෙන නිලධාරීන් හෝ බ්‍රිගේඩියර්වරයා පැමිණෙන බැවින් එසේ සිදුවන බව තීක්ෂණ දැන සිටියේය. බලයේ සිටින අයට, සෙබලුන්, වැසියන් සමග සමීප වීම අවශ්‍ය වූයේ නැත. විශේෂ මුරපොළක සිටින සෙබලුන් වැසියන් සමග හොඳින් සිටින්නේ යැයි වාර්තා වුවහොත් ඔවුන් ඉක්මනින් මාරුකර යවනු ලැබේ.

මේ මනරම් දිවයින විනාශ කිරීමට හේතු වූ දේශපාලනය ගැන සිතන විට, තීක්ෂනට හැඟී ගියේ දෙපාර්ශවයේම නායකයින් විසින් තමන්ගේ අවශ්‍යතා ඉටුකරගැනීමට නිර්මාණය කරන ලද බොරු සහ බෙදීම් විනාශ කළ යුතු බවයි. එහෙත් ඔහු ඔහුගේ සීමාවන් දැන සිටියේය. ඔහුට දෙන නියෝග ඔහු පිළිපැදිය යුතු වූ අතර, එයට අමතර වශයෙන්, ඔහුට වැඩි දෙයක් කළ නොහැකි විය. මෙහිදී හමුවන මිනිසුන් දැන් මුහුණ දෙන අසීරු තත්ත්වයන් සමනය කර ගැනීමට සහාය දීම ඔහුට කළ හැකි කුඩා උපකාරය වූයේය. ඉදින් ආරම්භයක් වශයෙන්, ඔහුගේ නිවාඩු වේලාවලදී,

ඔහු මාරුතොඩෙයි ප්‍රදේශයේ කුඩා දරුවන් සමග සෙල්ලම් කළේ, ක්‍රිකට් ක්‍රීඩාවක් සූදානම් කිරීමෙන් හෝ ඔවුන්ගේ පාපන්දු ක්‍රීඩාවකදී තීරකයකු ලෙස කටයුතු කිරීමෙනි. බොහෝ වැසියන් සමග තීක්ෂණ මිත්‍ර වූ නමුදු, ඔහුට ඔහුගේ සොහොයුරියට සමාන තරුණ කාන්තාවගේ විශ්වාසය හෝ ආදරය දිනාගත නොහැකි විය. ඇය මුරපොළ පසුකර යන විට තවමත් ඔහු දෙස බැලීම මග හැර යයි. ඇය තමා කෙරෙහි බිය වනවා විය යුතු යැයිද ඇය අරබයා ඔහුට ඇති ඇය සිතන බලය ගැන බියවනවා විය යුතු යැයිද අවබෝධ කරගත් ඔහු ඇය දෙස බැලීමේදී පරීක්ෂාකාරී වූයේය. එහෙත් තමාගේ මියගිය සහෝදරිය සහ ඇය අතර ඇති සමානත්වය දකින කල, ඔහුගේ කැමැත්තටද එරෙහිව, ඔහුගේ දෑස් ඇය වෙත යොමු වෙයි. වරක් ඇය සැබවින්ම ඔහු දෙස බැලූ අතර, ඔහු වහා සිනාසුණේය. එහෙත් ඇය ඉවත බලා ගත්තාය, ඇගේ මුහුණ රතු විය.

ඔහුගේ නේවාසික සගයන් වූ චමින්ද සහ තරිඳු, ඔහු පුංචි පිරිමි ළමයින් සමග ක්‍රීඩා කිරීම මතකයෙහි තබාගෙන, වැසියන් සමග වුවමනාවට වඩා මිත්‍ර වීම ගැන ඔහුට අවවාද කළහ. 'ඔයා ඒක සැලකුවේ නැත්නම්, ඔයාව මාරු කරයි. මේ ප්‍රදේශවාසීන් එක්ක ඕනවට වඩා මිත්‍ර වෙච්ච සෙබලුන්ට වුණේ ඒකයි.' එසේ කියූ ඔවුහු නිතර එයට මෙබඳු කතාද එකතු කළහ. 'අපිට පුද්ගලිකව දෙමළ අයට විරුද්ධව කිසිදෙයක් නෑ. ඒත් යුද්ධය කියන්නෙ යුද්දෙ. දිනුවත්, පැරදුණත්. ඒගොල්ලන්ගෙ පැත්තකුත් තියෙනවා  අපේ පැත්තකුත් තියෙනවා' වාද කිරීම පලකට නැති දෙයක් බව තීක්ෂණ වටහාගෙන සිටි බැවින් කිසිවිටෙකත් ඔවුන් සමග වාද කළේ නැත. මේ කඳවුරේ සාමාන්‍ය අදහස එය වූ අතර, ඔහු තනිවම ඔහුගේ විශ්වාසයෙහි එල්බ සිටියේය.

එක් දිනක්, සුධර්විලි පාසලේ සිට ආපසු පැමිණෙන විට, තම කුඩා ඥාති සහෝදරයා වන රාජන් සමග, තමා දෙස බලන සෙබලා සෙල්ලම් කරමින් සිටිනු ඇය දුටුවාය. පසුව, ඇය සිය නැන්දාගේ ගෙපැලට ගියාය. රාජන් පිටත සෙල්ලම් කරමින් සිටි අතර, ඇය ඔහු වෙත යමින්, ඔහුට කෑගෑවාය. 'මොකද්ද ඔයාට වෙලා තියෙන්නෙ' ඇය ඔහු සමග යම් කරුණකට බොහෝ කෝපයෙන් සිටන බව දුටු, රාජන් අසල තිබූ කෙහොඹ ගස් අරඹට දිය ගියේය. ඇය ඉක්මනින් පන්නා ගොස් ඔහු අල්ලා ගත්තේය. ඔහු ඇගේ ග්‍රහණයෙන් මිදෙන්නට හඬමින් උත්සාහ කළේය. 'මොකද්ද?'

'ඔයාට සෙල්ලම් කරන්න වෙන කවුරුවත් නැද්ද?' ඇය කෑගැවාය. 'ඔයා දන්නවද ඔයා කා එක්කද සෙල්ලම් කරන්නෙ කියලා? ඒගොල්ලො තමයි මගේ ආදරණීය තාත්තව මැරුවෙ. ඔයාට මේ දේවල් තේරුම් ගන්න බැහැ. අඩු ගානෙ අනික් අයට ඇහුම්කන් දීලා ආත්මගරුත්වයක් ඇති දෙමළ මනුස්සයෙක් වගේ හැසිරෙන්න. ඔහොම ඉඳලා බලමු. දවසක ඒගොල්ලො ඔයා දිහාට හැරිලා ඒගොල්ලන්ගෙ තුවක්කු පත්තුකරයි. ආයෙම මට දකින්න ලැබුණොත්, ඔයා සොල්දාදුවොත් එක්ක සෙල්ලම් කරනවා, මං දන්නෑ මං ඔයාට මොකක් කරයිද කියලා.'

රාජන් ඇගේ ග්‍රහණයෙන් මිදී, මෝඩ සිනාවක් පා, ඔහුගේ උකුල ගස්සා, ඇයට සරදම් කර දිව ගියේය.

සුධර්විලී අමාරුවෙන් හුස්ම ගනිමින් වළාකුළු නැති අහස දෙස බලා සිටියාය. කුඩා කුරුල්ලන්ගේ කුරුළු ගීතිකා, ගස් අතරින් හමා එන මද සුළඟ සහ ඇගේ දෙපතුල්වලට මුදු පහස ලබාදෙන මෘදු පොළව යන කිසිවක් ඇයට කිසිදු සතුටක් ගෙන ආවේ නැත. 'මේ ලැජ්ජ නැති මිනිස්සු ඔක්කොම ගිහිල්ලා ඒ සොල්දාදුවො එක්ක කතා කරනවා' ඇය තමාටම කොඳුරා ගත්තාය. 'ඒ ඔක්කොම, අපි විඳපු වද වේදනාවන්, හිංසාවන්, බිහිසුණු මරණ ඒ හැමදේම අමතක කරන එක ඒ ගොල්ලන්ට එච්චර ලේසිද? ඔවුන්ට සිද්ධ වෙච්ච හැමදේම මිනිස්සු කොච්චර ලේසියෙන් අමතක කළාද? අපට බලවත් සේ හිරිහැර කළ අය, අර සොල්දාදුවා ඇඳ සිටි නිල ඇඳුමම ඇඳ සිටි බව රාජන්ට නොපෙනේද? ඒ පුංචි කොල්ලා ගොස් ඔහු සමග සෙල්ලම් කරන්නේ, ස්වාමියා දුටු කළ වලිගය වනමින් සිටින බල්ලෙකු සේය.

සොල්දාදුවා කෙරෙහි තමන්ගේ මිනිසුන්ගේ ඇති මිත්‍රත්වය සහ මේ මිත්‍රත්වය තමන් විඳි සියලු දුක් වේදනාවන්ට පාවාදීමක් බවත් සිතන විට, ඊළඟ දිනයේ මුළු පාසල් කාලය තුළම ඇය කෝපයෙන් දැවෙමින් සිටියාය. පාසල අවසන් බව හැඟවෙන සීනුව නාද වූ විට ඇය පාසල් බෑගයට සිය පොත් හා පැන්සල් පෙට්ටිද දමාගෙන නිවසට යන්නට වූවාය. ඇය අම්මාන් කෝවිල වෙත ළඟා වන විට, ඇයට හුරුපුරුදු කටහඬවල් ඇසෙන්නට විය. ඒ අර සොල්දුවා සමග හැංගි මුත්තන් සෙල්ලම් කරන රාජන් සහ තවත් පිරිමි ළමුන්ය. සුධර්විලී පැමිණෙනු දුටු රාජන් වරදකාරී හැඟීමෙන් යුතුව දිව ගොස් මුරපොළෙහි වැලිගෝනි පිටුපස සැඟවුණේය.

සුධර්විලී කෝපයෙන් රතු වූ අතර මුළු දවස පුරා වර්ධනය වෙමින් තිබුණු බලවත් කෝපය පාලනය කරගත හැකි නොවීය. 'උඹට ලැජ්ජ නැද්ද?' ඇය තම ඥාති සහෝදරයාට දෙමළ බසින් කෑගසා, ඇයට යා හැකි උපරිම වේගයෙන් ඇවිද ගියාය.

ඒ සියල්ල බලා සිටි තීක්ෂණ රාජන්ගෙන් 'කවුද?'යි ඇසුවේ පිරිමි ළමයාට ඔහුගේ සීමිත සිංහල දැනීමෙන් තේරුම්ගත හැකි ආකාරයටය.

'අක්කා'

'ඔයාගෙම අක්කා?'

'නෑ'

'නැන්දගෙ දුවද?'

'ම් ම් ම්'

'කොච්චර ළමයි ඉන්නවද?'

'තුනයි, සුධාර්, වලාර්, නීදන්'

නීදන්, සැණෙකින්, තීක්ෂණට, තමා පුහුණුව ලැබූ කඳවුරේ සිරකරුවෙක් වූ තරුණයින් අතර සිටි එක් අයෙකුගේ නම සිහිවිය.

'මල්ලී මොනවද නීදන් කරන්නෙ?'

'kaanealla'

'මොකක්?'

'kaanealla'

'මොකක්?'

'kaanealla' ඔහුගේ වචනය පැහැදිලි කරන අභිරහස පාමින් රාජන් ගෙදර දුවන්නට වූයේය.

ඔහු අදහස් කළේ කුමක්ද යන්න තීක්ෂණ තේරුම් ගත්තේය. නීදන් අතුරුදහන්ව ගොසිනි.

දින දෙකකට පසුව, රාජන් සුධර්විලීගේ නිවසට ගොස් දොරකඩ හිඳ ඇයට කෑගෑවේය.

'මොකද ඔයා මේ විදිහට කෑගහන්නේ' යි සුධර්විලී පිටතට පැමිණ ඇසුවාය.

ඔහු හතිදමමින් හා කලබලයෙන් සිටි බව ඇය දුටුවාය. ඔහු යමක් කියන්නට උත්සාහ කළේය, එහෙත් ඔහු වේගයෙන් හුස්ම ගනිමින් සිටි නිසා ගොත ගසමින් කතා කළේය. 'නීදන් අයියා, තීක්ෂණ අයියා මෙහෙ එන්න ඉස්සෙල්ලා හිටපු රඳවා ගැනීමේ කඳවුරේ ඉඳලා තියෙනවා... දැන් එයාව වව්නියාව පුනරුත්ථාපන කඳවුරට ඇරලා'

සුධාර්විලීගේ මවට නීදන් නම ඇසුණු විට, ඇය කඩිමුඩියේ ගෙපැලෙන් පිටතට ආවාය. 'රාජා, මොකද්ද කිව්වේ? නීදන් ජීවත්ව ඉන්නවා? මේව ඔයාට කිව්වේ කවුද?'

'ඇයි නැන්දා, තීක්ෂණ අයියා' රාජන් කීවේය.

'ඒත් කොහොමද එයා දන්නෙ එයා අපේ නීදන් කියලා?' සුධාර්විලී අවිශ්වාස කරන විලාසයෙන් ඇසුවාය.

'එක ක්‍රමයයි තියෙන්නෙ හරියට දැනගන්න' ඇයගේ මව කීවාය. ගෙපැළ තුළට ගිය ඇය නීදන්ගේ ඡායාරූපයක්ද රැගෙන ආවාය, අනතුරුව ඇය රාජන්ගේ අතින් අල්ලාගෙන ඔහු වහා හමුදා කඳවුර දෙසට ගියාය. ඔවුන් යන විට රාජන් ආපසු හැරී, 'සුධාර් අක්කා, තීක්ෂණ අයියා කිව්වා එයාගේ බාල නංගි ඔයා වගේමයි කියලා, අවුරුදු දෙකකට ඉස්සෙල්ලා එයා පිළිකාවකින් මැරිලා...'යි කෑගෑවේය.

සුධර්විලී ගොළුවී ගියාය. ඇය ඔවුන්ගේ ගෙපැළෙහි බිමට වාරු වුණාය.

එදා රාත්‍රියෙහි සුධාර්විලීට නින්ද ළඟා නොවීය. ඔහු පාන්දර යාමය වන තුරු නිදි මැරුවේය. අම්මා ආපසු පැමිණ කී දේ ගැන කල්පනා කරමිනි. තික්ෂණ ඇගේ සහෝදරයාගේ ඡායාරූපය හඳුනාගත් ආකාරයද, නීදන් දැනට රඳවාගෙන සිටින කඳවුර පිළිබඳවද, ඔවුන්ට එහි යා හැකි ආකාරය පිළිබඳවද ඇය කල්පනා කළාය. තොරතුරු ලබා ගත්තේ

කොහෙන්ද යන්න බලධාරීන්ට හෙළිදරව් නොකිරීමේ පොරොන්දුව ඔහු ඇගේ මවගෙන් ලබාගෙන තිබිණි. ඔහු කලබලයට පත්ව සිටි බවත්, අනෙක් සොල්දාදුවන් තම කතාව අසා සිටින්නේද යන්න පිළිබඳ සැකයෙන් ඔහු වට පිට බැලූ බවත් අම්මා කීවාය.

අවසානයේදී, හිරු රැස්දහර අන්ධකාර ලෝකයට පතිත වන විට, සුධර්විලී ඇඳ පැළඳ ගෙන පාසලට යන්නට ඉක්මණින් පිටත් වූවාය. ඇයට සිය යෙහෙළියට නොපෙනෙන්නට ඔහු සමග මොහොතක් කතා කරන්න අවශ්‍ය විය. ඇගේ නපුරුකම හා කෝපය වෙනුවෙන් ඔහුගෙන් සමාව ඉල්ලන්නට ඇයට අවශ්‍ය විය. ඇය ඇවිද යන විට, නව සැහැල්ලුවක් ඇයට දැනිණි. හිමිදිරියේ ගී ගයන කුරුල්ලන්ගේ හඬද, මුදු මද සුළඟද, ඇගේ පාවහන් පතුලට දැනෙන මුදු පොළවේ පහස ද ඇයට දැනෙන්නට විය. ඒවා ඇයට සතුටක් ගෙන දුන්නේය.

එහෙත් සුධාර්විලී මුර පොළට පැමිණෙන විට තීක්ෂණ එහි නොසිටියේය.

අනෙක් සොල්දාදුවන් ඇයට කීවේ ගම්වාසීන් සමග පමණට වඩා මිත්‍රවීමේ වරදට දඬුවමක් ලෙසින් ඔහු ඈත ගම්මානයකට මාරුකර යවා ඇති බවය.

***කැනිස්ටා ආර්ති ඩෙනිසියස්,*** *පසුගිය දශක තුන තුළ පැවති යුද්ධයෙහි රෞද්‍ර බව අත් විඳි සමාජයක් වූ යාපනයෙහි ඉපිද හැදී වැඩුණාය. ඇය මේ කතාවට දළ සටහන ලබාගත්තේ කොළඹ පැවති " නිර්මාණාත්මක ලිවීම" පිළිබඳ වැඩමුළුවෙහි ඇය කරන ලද ලිවීමේ අභ්‍යාසයකිනි. මෙම කතාව නිර්මාණයේදී, ඇය සිය ජීවිත අත්දැකීම් හා ඇය උපන් ප්‍රදේශයේදී යුද්ධයේ ගොදුරු බවට පත් වූ අයගෙන් ලබාගත් කරුණු ද පාදක වී ඇත.*

# විස්මිත රහස්

## පැතුම් පුංචිහේවා

අප හැමදෙනාටම කියන්නට අපගේම වූ කතා තිබේ. ඒ දීප්තියෙන් පිරුණු, විචිත්‍ර මතකයන් හෝ බොහෝ ගෙත්තම් ඇති, වෘතාන්තයන්ය. අප වටා විසිර ඇති දහසක් කතාන්දර, කිසි දිනෙක නොකී කතා, කිසිදා දිග නොහැරුණු කතා, කිසිදා සම්පූර්ණ නොවූ කතා මට දැකිය හැකිය.

කොල්ලුපිටිය කලෙක, රටේ අනෙකුත් ප්‍රදේශ සමග මේ ගමෙහි ඇති ලොකු නිවාස කිහිපය සහ අනෙකුත් නිවාස සම්බන්ධ කෙරෙන පටු කරත්ත පාරවල් මෙන්ම, පොල් රුප්පා හා කුරුඳු කැලෑ තිබුණු ලස්සන ගම්මානයක් වූ බව කිසිවෙක් විශ්වාස නොකරනු ඇත. මෙය ඉතිහාසයට එක්වූ කරුණක් බව මා දන සිටියද, අද කොල්ලුපිටියේ ගොඩනැගිලි සමග ඒවා ගැලපීම දුෂ්කර බව මම තේරුම් ගනිමි, එහි විශාල ගොඩනැගිලිවල විටින් විට දැල්වෙන කුඩා විදුලි බුබුළුවලින් අහසෙහි ආලෝකය වර්ණිත කරවයි.

කොළඹ කොටුවට මා ගෙනයමින් සිටි පැරණි බසයේ කවුළුවෙන් මා බැලූ විට සැන්දෑ වළාකුළු කොල්ලුපිටිය උඩින් පාවෙමින් තිබිණි. කාර්යාල අවසන් වන සන්ධ්‍යා හෝරාවන් නගරය ඉතාම කාර්යබහුල වන පැය කිහිපය විය. කොළඹට පිටස්තර නගරවලින් හා උපනගර වලින් කොළඹට පැමිණි, දරුවන් සිතුවේ කොළඹ ඔවුන්ගේ අවසාන ගමනාන්තය බවයි. එතෙකුදු වුවත්, ඔවුන්ගේ කුටිවල සහ කාර්යාල ඉඩ කඩවල පැය ගණනාවක් ගත කිරීමෙන් පසු, ඔවුන්ගේ පවුල්වල සෙනෙහස සොයා ඔවුන්ගේම උපනගරවල කුටුම්බයන්වෙත යාමට, කොළඹින් බැහැරවීම ඉක්මන් වෙති. මට කොළඹ ගැන කනගාටු සිතිණි, ඇය ඇගේ හදාගත් දූ දරුවන්ට බොහෝ ආදරය කළාය, ඇයගේම දරුවන්ට එනම්, ප්‍රභූන් වූ අහංකාර, වඳවී යාමට මුහුණ දී සිටින කොළඹ දරුවන්ට වඩා ආදරය කළාය.

බස්රථය කොල්ලුපිටිය නගරයේ පුරුදු නැවතුමක නැවතු විට මම ඒ ළඟ පිහිටා තිබුණු පැරණි කෝපි පාලරය සොයන්නට උත්සාහ කරමින් පිටත බැලුවෙමි. එකල, ඔබට මේ බස්නැවතුමේදී, පිරිසිදු ශ්‍රී ලාංකීය බැදපු

කෝපි ඇටවල සුවිශේෂිත සුවඳ විඳිය හැකි විය. කුඩා දරුවකු ලෙස, කොල්ලුපිටියේ කෝපි පාලරයට මා කෙතරම් කැමැත්තක් දැක්වූයේද යන්න මගේ මතකයේ ඇත. එහි සුපතල අයිස් කෝපි කෝප්පයක් බීමට මම එකල බොහෝ රුචි වීමි. පසුව, පන්ති අතරතුර මට කාලවේලාව තිබූ අවස්ථාවන්හිදී ඇවිදිමින් යද්දී සහ දිවා කෑම වේලාවන්හිදී මා ඇවිද යන විටදීද එහිදී අයිස් කෝපි කෝප්පයක් දෙකක් බීමට මම පුරුදුව සිටියෙමි. ජනප්‍රියත්වය ඉහළට යන විටදී හෝ ඔවුහු කිසිවිටෙක මිල ඉහළ නොදැමූහ. උස වීදුරුවක දමා ඇති අයිස් කෝපි එකක මිල රුපියල් තිහක් වූ අතර එය සැබෑ සංග්‍රහයක් විය.

බසයේ පිටත දෙස විනාඩි කිහිපයක් බලා සිටීමෙන් පසුව, මගේ සිත චංචල වෙද්දී මා තේරුම් ගත්තේ, කෝපි පාලරය තිබූ තැන දැන් කුඩා, අවලස්සන පේස්ට්‍රි සාප්පුවක් ඇති බවය. බස් නැවතුමේ සිටියදී දැනෙන බැදුණු කෝපි ඇටවල රසවත් සුගන්ධය තවදුරටත් දැනෙන්නේ නැත. හදිසියේ ඇතිවූ කාන්සාවකින් හා හදිසි පෙළඹවීමකින්, මම සෙනග පිරි බසයෙන් තල්ලු වී ගොස් බිමට බැස්සෙමි. කොල්ලුපිටිය නගරයේ බොහෝ වෙනස්කම් සිදුවී තිබුණද එය දර්ශනීය විය, එහෙත් අර කෝපි පාලරය නොමැතිව එය කිසිදිනෙක පෙර තිබූ තත්ත්වයට පත්වන්නේ නැත.

'මචං ඔයා දන්නවද? අවුරුදු කීපෙකට පස්සෙ, මේ නොදන්න විවිධාකර ගොඩනැගිලි, අලුත් කඩ හැදිලා, අලුත් මූණු ඇවිල්ලා මේ නගරය අවුලක් වෙනවා. ඒත් මෙතනින් අයිස් කෝපි එකක් බොන්න ලැබෙන්නෙ නැතිනම් කොල්ලුපිටිය නගරෙ කවදාවත් ඉස්සෙල්ලා තිබ්බ්ච තත්ත්වෙට එන්නෙ නෑ.' ඩෙනිස්ගේ වචන හා උපහාසාත්මක සිනාව ඒ ආකාරයටම මට තවමත් මතකයේ ඇත. ඔහු එසේ කීවේ අප දෙදෙනා අයිස් කෝපි දෙකක් බී කෝපිහලෙන් පිටතට ආ හැටියේමය.

'ඔව් මං දන්නවා, ඒත් මං හිතන්නෙ නෑ මේ පැරණි නගරය, ඔය නගර නිර්මාණකාරයින්ට ඇගේ පෙනුම ලේසියෙන් වෙනස් කරන්න දෙයි කියලා මං හිතන්නෙ නෑ' මම කීවෙමි. 'මේ කෝපි හලෙන් මගේ පළවැනි කෝපි කෝප්පය බොනකොට මං පුංචි ළමයෙක්. මට තාම මතකයි කවුන්ටරේ පිටිපස්සේ හිටපු කාන්තාවගේ මූණ'

'මතක ඇති කියලා මං හිතනවා මනමාලයා' යි කී ඔහු පෑ උපහාසාත්මක සිනාව ඉතා ස්වභාවික විය. ඔහු ඒ සිනාව ඔහුට වෙනත් ආත්මයකින් සාපයක් නිසා ලැබුණක් බව කියන්නට පුරුදුව සිටියේය. 'ආ! කට වහනවා ඩෙනිස් සාන්තුවරයා'

'පුංචි ළමයෙක් කාලෙත් ඔයා මනමාලයා තමයි. ඒක පිළිගන්න. හරිද යාළුවා. දැන් මට යන්න වෙලාව හරි. හෙට ඉඳලා මාව ත්‍රිකුණාමලේ නාවික කඳවුරට දානවා, ඒකෙ අදහස ඕගොල්ලන්ට මාව මාස ගාණකට මුණගැහෙන්නෙ නෑ. අවසාන වශයෙන්, මට අවස්ථාව ලැබෙනවා මගේ වදකාර යාලුවන්ගෙන් ඈත් වෙන්න, විශේෂයෙන් ඔයාගෙන්'

'ඇත්ත, ඇත්ත, මට දන්නන්න ආයෙ ඔයා කොළඹ එන දවස. ඒකෙන් කියන්නෙ නෑ මට ඔයා නැතුව බෑ කියලා හරි වෙන මොකක් හරි, ඉතින් දැන් යන්න, හැබැයි මට කියන්න එපා මගේ පොත නැතිවුණා කියලා එහෙම. ඒක කියවන්න.'

'මං ඔයා වගේ නොසැලකිලිමත් කෙනෙක් නෙවෙයි. පොතට බොහොම ස්තුතියි' මොහොතකට පෙර මා ඔහුට දුන් 'Ender's Game' නම් පොත ඔහු අතෙහි තබාගෙන සිටියේය. නැවතත් අර හාස්‍යමුසු වඳුරු සිනහව.

මේ යෝධ වඳුරකු වැනි මිනිසා, ඔහුගේ හාස්‍යය සහ උපහාසය වසන් කොටගෙන, බරපතල ස්වරයකින් සිය සේනාවන්ට නායකත්වය දෙන්නේ කෙසේදැයි සිතමින් මම විරිත්තුවෙමි. ඔහු ශ්‍රී ලංකාවේ යුධෝපායෙහි විශිෂ්ටයකු බව මම දනිමි, එහෙත් කිසිවිටෙක මට ඩෙනිස් නිලඇඳුමින් දැකිය නොහැකි විය.

ඩෙනිස් හිතාමතා උදාරම් ලීලාවකින් මට ආචාර කළේය, අනතුරුව ඔහු වෙරළබඩ පාර දෙසට ඇවිද ගියේය. අඩි කිහිපයක් පමණක් ඉදිරියට ගිය හෙතෙම නැවතී ආපසු හැරුණේය, එවිට අර සරදම් සිනාව ඔහුගේ මුහුණෙහි ඇඳී ගියේය. 'සදහටම, සදහටම ආයුබෝවන් මගේ යාළුවේ... අපි ආයේ මුණ ගැහුණොත්, අපි සත්තකින්ම හිනා වේවි. මුණ නොග ැසුණොත් මේ වෙන්ව යාම ඔන්න හොඳින් සිද්ද වුණා' ඔහු සිනාසෙමින් සිටියේය, එහෙත් ඔහුගේ කටහඬ ගැඹුරු විය.

'බෲටස් හා කැසියස් අතරෙ සටනට පෙර,.. ඇත්තට නාකි උංරෝ?. යුද්ධෙ දැන් ඉවරයි කියලා උඹට මතක් කරලා දෙන්න ඕනද? 'ඩෙනිස් ශේක්ස්පියර් උපුටා දැක්වීම ගැන මම ඩෙනිස්ට සිනාසුණෙමි. මේ මිනිසා විස්මය පුරවා රැගෙන එයි.

'ඔයා කවදාවත් දන්නෙ නෑ මිනිහො. ඔයා කවදාවත් දන්නෙ නෑ. ආයුබෝවන් සහෝදරයා' ඊළඟ මොහොතෙහි, ඩෙනිස් යන්නට ගියේය.

ඔහු මහල් දහයකින් යුතු ගොඩනැගිල්ලකින් බිමට පැන සිය ජීවිතය තොර කරගන්නට පෙර මා ඒ ඔහු දුටු අවසාන අවස්ථාවය.

මම ලිවීම අත්හළෙමි. රාත්‍රියක ඇති සාමය සහ ශාන්ත බව වටකොටගෙන ලේඛකයින් ඔවුන්ගේ පොත් ලියන බව පිළිබඳ ඔබ කියවා ඇත්නම්, ලේඛකයකු වීම ගැන ඔබ තුළ උසස් හැඟීමක් ඇති වන්නට පුළුවන. එහෙත් යථාර්ථය නම් ඒ ෆැන්ටසිය නිසා ඔබ ලේඛකයකු වන්නට යන්නේ නම් එය අමනෝඥ දෙයකි.

දැන්, ඔබ දැනටමත් සැක කළ පරිදි මම පොතක් ලියමි. එය හොඳින්ම අලෙවි වන පොතක් විය හැකිය, එමෙන්ම එය අසාර්ථක වන්නටද පුළුවන. මේවා ඉෂ්ට සිද්ධ වන්නේ කෙසේද යන්න ඔබ කිසිවිටෙක දන්නේ නැත. කෙසේවුවද, ඔබට ලිවීමේ උමතුවක් ඇත්නම් කම් නැත. ඔබේ සිතෙහි කරකැවෙන, සුළි බඳු වදන්, වාක්‍ය සහ හැඟීම් මෙන්ම ඔබේ සිතින් එළියට එන්නට වෙහෙස දරන හැඟීම් පිටතට දැමීමට ඔබට අවශ්‍යය. ළමයෝ, මට තවත් කෝපි කෝප්පයක් අවශ්‍ය යැයි සිතමි.

'යාපනයට පාර' යන වචන, යුද්ධයෙන් පෙර හෝ පසුව, යාපනයට කිසිසේත් නොගිය කෙනෙකුට අරුමෝසම් ගමනක් හෝ නිවාඩුව සඳහා යන ගමනක් හෝ මවා දක්වන්නට පුළුවන. සරමතාගේ නිවසෙහි ඇය සමග සෙල්ලම් කරමින් සුරංගනා කතා ඇසූ සන්ධ්‍යාවන් මගේ මතකයේ ඇත. සරමතාගේ පියා සහ මගේ පියා අඹ යහළුවෝ වූහ. ඒ ඩෙනිස් සහ මා මෙනි. මගේ නිවාඩුවෙන් අඩක් යාපනයේ ගත කරන්නට මා තෝරාගත් විට සරමතාගේ පියා සරමතා සමග අපගේ පවුලෙහි උදවිය දකින්නට අපගේ නිවසට එන්නට පුරුදුව සිටියේය. එහෙත් මේ වතාවේ මා යාපනයට යන්නේ නිවාඩුවක් ගත කිරීමට හෝ අරුමෝසම් සංචාරකයකුගේ සිහිනය

සැබෑ කරගැනීමට නොව, මා උතුරට යන්නේ, මගේ හොඳම මිතුරාගේ මරණය, මගේ හදවතෙහි ගැඹුරුම තැන්හි දරාගෙනය. මට අමුත්තක් දැනෙන්නේ, මට ඔහුගේ අන්තිම කැමැත්ත පරිදි මෙහෙවරක් කිරීමට ඇති නිසාය. අනෙක් මිතුරන් සමග එක්ව අප ගත කළ හැම නිවාඩුවකදීම එයට 'මෙහෙවර' සම්බන්ධ කරගන්නට ඔහු ආසා කළේය. එහිදී 'සැලසුම්' තිබුණු අතර ඒ සැලසුම්වලට අප ඇලී බැඳී සිටිය යුතු විය. සැලැස්මට ඇලී බැඳී සිටීමේ ඩෙනිස්ගේ උද්යෝගයට අප එක් නොවූවහොත්, අප ඔහු සමග ඇති කරගන්නා අසම්මුතීන් නිසා ගමන විනාශ වෙයි.

මගේ නැහැය කවුළුවට තෙරපාගෙන, පසුකර යන දර්ශනය නැරඹීමෙන් සතුටට පත්වීමේ මගේ බොළඳ හැසිරීමට බාධා වූයේ මගේ ශෝකයෙන් බර වූ හදවත නිසාය. එහෙත් යාපනයට යන පැරණි මාර්ග දැකීමට මම සතුටු වූයෙමි, බොහෝ කලකට පසුව කෙළවරක් නැති තල් ගස් පේළි දකිමින් යන්නට මම ප්‍රිය කළෙමි. වසර තිස්දෙකකට පසුව සර්මතා දැකීමට හැකි වෙනු ඇති බැවින් මම සතුටු වීමි.

මම ඇගේ ළමා මුහුණ සිහිපත් කරගැනීමට උත්සාහ කළෙමි, මේ ගමන එන්නට තීරණය කළ දා සිට බොහෝ වරක් මම එය උත්සාහ කළෙමි. එහෙත් පුදුම කරුණක් හේතුකොටගෙන, කාලයේ රළ අතරින්, මගේ ළමා කල සැමරුම් වලින්, ඒ කොටස් වෙරළෙන් සේදී ගොස් ඇත. සය අවුරුදු වියැතිව සිටි මා, මගේ ළමා කල මිතුරිය වූ ඇය කෙරෙහි වූ බැඳීම පිළිබඳ එකම මතකය, ඇය මට සරදම් කරන්නට කී 'කවදහරි ඔයා හොඳ බස් රියැදුරෙක් වෙයි' යන්නය. විවෘත පාර හිමි බස් රියැදුරෙකු වීම මගේ ළමා කල සිහිනය විය. මා කුඩා දරුවකුව සිටි කාලයේ, එය ඉතා විශාල බස්රථයක් පදවාගෙන knocking on heavan's door තනුව නාද කරමින් යන ගොපල්ලකුගේ පින්තූරය මවා ගැනීමක් වැනි විය.

සර්මතා ලොකු මහත් වූ ගැහැණියක ලෙස, මවක ලෙස මට සිතාගත නොහැකිය. ඇය වෙනස්ව සිටින්නට පුළුවන, එහෙත් ඇතුළතින් තවමත් ඇය මා සමග සෙල්ලම් කළ, උණුසුම්, ප්‍රමෝදිත පෞරුෂයක් තිබූ ගැහැනු ළමයාම විය යුතුය.

බසයේ අපි යාපනයට ළං වෙමින් සිටියෙමු. මම බසයේ කවුළුවෙන් පිටත බැලුවෙමි, ඇතින් කිරි කරුවෙක් බයිසිකලය පැද යනු දුටුවෙමි.

නැග එන හිරු රැස් දහර ඔහුගේ සිරුර මතට රතු එළියක් දෙමින් වැටී තිබිණි. ජෝතියක් ඇඳ සිටි වයෝවෘද්ධ මිනිසෙක් දුහුවිලි පොළොවට වතුර ඉසිමින් සිටියේය, ගැහැණු ළමෝ ඔවුන්ගේ ස්කූටර පැදගෙන ගිය අතර, සන සමන්පිච්ච මල්මාලා ඔවුන්ගේ කළු කෙහෙ වැටි සිප ගනිමින් තිබී අතර ඔවුන්ගේ සාරි දිදුලමින් තිබුණි.

බසය, අවසානයේදී යාපනය නගරයට සේන්දු විය.

කිසිවක් වෙනස් වී නැතැයි කියන්නට මා කැමැත්තේ වී නමුදු, එය සත්‍යය නොවීය. පෙර කල්හි මෙන් නගරයේ වංගු සහ සැබෑ ලස්සන තිබුණද, එය පැරණි නගරයේ ඡායාමාත්‍රයක් පමණක් විය. පැරණි ජනාවාස මැද නව වාණිජ ගොඩනැගීම් දකින්නට තිබුණු අතර ඒවා පිනිබර රැ යකින් පසු වේගයෙන් මතු වූ හතු මෙන් දිස්විය. තිබුණු ගොඩනැගිලි හා සසඳා බලන විට ඒවා අවලස්සන ගොඩනැගිලි විය. බොහෝ විට ඒවා නොගැලපෙන වර්ණ ගැන්වූ විශාල සිමෙන්ති ගල් විය. නගරයේ අවට තල් ගස් කඳන් වල වෙඩි උණ්ඩ වැදී ඇති වූ තියුණු පහරවල් දක්නට ලැබුණු අතර, ඒ තුවාල සුවවෙමින් පැවතුණු බව පෙනිණි.

'අයියා, නල්ලූර් කෝවිල බලන්න ඕන නම්, තවමත් වෙලාව තියෙනවා උදේ පූජාවට යන්න' මා ගමන් කරමින් සිටි ටුක් ටුක් රථයේ රියැදුරු කීවේය.

'හොඳයි, මං හිතනවා මං කෝවිලට පස්සෙ යනවා කියලා. මාව ළඟින් බස්සන්න, නගරසභා කාර්යාලය ළඟ මාව බස්සන්න' මා පෙර දින රැයේ කොළඹින් පිටව එන්නට පෙර සරමතාට කතා කළ විට, ඔවුන් නල්ලූර් කෝවිල අසල නව නිවසට ගිය බව ඇය මට කීවාය. 'පන්සල පහු කළාම හොයාගන්න අමාරු නෑ. ඒත් රියෝ අයිස්ක්‍රීම් වැන් එක ළඟ ඉන්න එපා ඒ ගොල්ලන්ගෙ පළවැනි පාරිබෝගිකයා වෙන්න. ඔයා තාම අයිස්ක්‍රීම් වලට ආසයි නේද  නැද්ද? කෙලින්ම අපේ ගෙදර එන්න' ඇය සිනාසුණාය. 'මගේ යාළුවේ, මට ඔයා නැතුව හරි පාළුවක් දැනුණා'යි රිසිවරය තබන්නට පෙර ඇය කොඳුළාය.

ඇගේ නව නිවසට දිවෙන පටුමගට හැරුණු විට අපේක්ෂාව සහිත කලබලයක් මා තුළ ඇති විය. යුද්ධය ආරම්භ වූ හැටියේම ඇගේ

දෙමාපියෝ ඇය රැගෙන රට හැර ගියහ. ඇය ශ්‍රී ලංකාවට පැමිණියේ පරිනත ගැහැනියක ලෙසිනි. මා දුටු විට ඇගේ ප්‍රතිචාරය කුමක් විය හැකි දැයි මම නොදනිමි.

මම දොරට තට්ටු කළ අතර, මොහොතකින්, එය සෙමෙන් විවර විය. කුහුලින් පිරි ඇස් කුට්ටම් දෙකක් දොර පසුපසින් එබිකම් කරනු මම දුටුවෙමි. අනතුරුව මට පා කිංකිණි හඬ ඇසිණි. සාලාව කෙලවර කොණෙහි සිට සරමතා මතු වූ අතර දරු දෙදෙනා සැඟවුණු තැනින් ඉවත්ව ඇය වෙත දිව ගියහ. ඇගේ විලුඹෙහි දමා තිබුණු පා කිංකිණි හඬ නැවතිණි. ඇගේ වළලු ගැටෙන හඬ නිහඬතාව බිඳ ලූ අතර, ඇය සිය බාලයා සිපගෙන, වැඩිමලාගේ කෙහෙරැල් පිරිමැද්දාය. කුඩා දැරියක ලෙසද ඇයට මවක මෙන් ගුණාංග තිබුණු බව මගේ මතකයේ ඇත. මම ඇයට කෑගැසූ අවස්ථාවලදී ඇය කිසිවිටෙකත් මා සමග දබර නොකළ අතර ලොකු ඉවසීමකින් ඇය මා සැනසුවාය.

'ඔයාව දකින්න ලැබිච්ච එක කොච්චර හොඳයිද?' දොර විවර කර ඇය එසේ කී අතර උණුසුම් ලෙසින් මා සිප ගත්තාය. 'මගේ දෙයියනේ, අවුරුදු කීයක් ගත වුණාද? ඔයා ලොකු මිනිහෙක් වෙලා' ඇගේ මුහුණ සතුටින් පිරීතිරී ගිය අතර, ළමයකු ලෙස ඇගේ ස්වභාවය මතකය ඔස්සේ මම දුටුවෙමි. 'මගේ මගෝඩියො දෙන්නා අඳුනගන්න. සම්ෂියි, නිතුයි. ඔය දෙන්නත් අනිල් මාමාට ආයුබෝවන් කියන්න' දරු දෙදෙනා තවමත් ඔවුන්ගේ කුතුහලය පිරි ඇස් වලින් මා නිරීක්ෂණය කරමින් සිටියහ. ඔවුන්ට ඇයගේ ඇස් උරුමව තිබිණි. කොට ගවුමින් සැරසී මා සමග සෙල්ලම් කළ දැරියගේ ලකුණු මා ඇය කෙරෙහි දුටුවද, සර්මතා වැඩුණු ගැහැණියකව සිටියාය. ඇගේ කෙටි බොකුටු කොණ්ඩය, කදිම සණ කොණ්ඩා කරලක්ව ඇගේ ඉණ දක්වා වැවී තිබිණි. මා සමග සෙල්ලම් කළ කෙසඟ දැරිය වටකුරු ගැහැණියකව සිටියාය. මේ දශක තුන තුළ ඇගේ නළලෙහි කණස්සලු ඉරි තුනක් ඇඳී තිබිණි. ඇය කදිම මවක වුවද ඇගේ උණුසුම් පෞරුෂත්වය එදා මෙන්ම විය.

'කෝ ඔයාගෙ ස්වාමි පුරුෂයා? මට එයා කවදාවත් මුණ ගැහිලා නෑ. ඒත් මට ඔයා ඊයේ රෑ එයා ගැන මට කිව්ව දේ වලින් මට එයාව මවාගන්න පුළුවනි' ගැටවරියක කාලයේදීද, ඇය තම ස්වාමිපුරුෂයා ක්‍රිස්ටෝපර් කොළොම්බස් වැනි ගවේශකයකු හෝ ජැක් ලන්ඩන් වැනි

ලේඛකයකු මෙන් විය යුතු යැයි සිතාගෙන තිබිණි, ඇය නිවසෙහි දෙව්දුව බඳුව සලකා ඇගේ ස්වාමිපුරුෂයා පරණ කාලයට අනුව ඇයට ආදරය කිරීම ගැන ඇය සැබවින්ම කැමති වූවාය. ඔහු සාම්ප්‍රදායික වටිනාකම් අගය කරන සාමාන්‍ය, විශ්වාසය තැබිය හැකි කෙනෙකු වීම ගැන සතුටට පත්වූ බව ඇය කීවාය.

'ආ ඔයා එයාට කැමති වෙයි. රාජේශ් සත්සුන් කෙනෙක්. එයා උදේ පූජාවට කෝවිලට ගියා. ඉක්මනින් එයි'

'මේ තරම් කාලෙකට පස්සෙ එයාව දකින්න ලැබීමම කොච්චර දෙයක්ද කියලා හිතාගන්න බෑ. මං කැමතියි මේක මිතුරු ගමනක් වුණා නම්. ඒත් අවසනාවකට වගේ ඒක එහෙම නෙවෙයි'

ඇගේ උද්යෝගය පහව ගියේ නැත, එහෙත් මදක් මැකී ගියේය, ඇගේ මුහුණ වඩා බැරෑරුම් ස්වරූපයක් ගත්තේය. 'ඔයාගේ යාළුවා ගැන මට ගොඩක් කනගාටුයි අනිල්. ඔයාට එයා කොයිතරම් වටිනවද කියලා මං දන්නවා. මට එහෙම දැනුණා ඔයා එයා ගැන කතා කළාම'

'ස්තූතියි. ඔයාට ලැබුණද මං එවපු තොරතුරු?'

'ඔයාට මතකද මගේ ඥාති සහෝදරයා? එයා මේ දවස්වල මෙහෙ ලොක්කෙක්. ඔයා මට දුන්නු අසම්පූර්ණ තොරතුරුවලින් එයා හරි තොරතුරු හොයාගත්තා. ඉතින් කොහොමද එයාට? ඔයාගෙ යාළුවගේ දූට කොහොමද?'

'හොඳයි, නිරූපමා දැනගෙන හිටියා ඩෙනිස් එයාව අරන් හදාගත්තා කියලා. ඩෙනිස් කසාද නොබැන්ද හින්දා, ඩෙනිස් එයාට එහෙම කිව්වා. ඇය ඊට වැඩි දෙයක් දන්නෙ නෑ. ඩෙනිස් ඇය ගැන ඊට වැඩි දෙයක් දන්නෙත් නෑ. ඔහු, ඇය හොයාගෙන තියෙන්නෙ අනාථ කඳවුරක රෝහලකින්. ඔහු අනුමාන කරලා තියෙනවා අම්මයි, දුවයි අහල පහළ ගමකින් ආවා කියලා. මැරෙන්නම ගිහින්. එයා ජීවිතේ රැකගත්තෙ ප්‍රාතිහාර්යයකින් වගේ'

'නිරූපමාගේ අම්මා ගැන තොරතුරු හොයන කොට, ඔයා කියන හැමදේම මගේ ඥාති සහෝදරයා තහවුරු කළා. ඩෙනිස්ගේ හදාගත්තු

දූවගෙ අම්මා තාම ජීවත් වෙලා ඉන්නවා. ඒත් මට වැටහෙන්නෙ නැහැ ඒ දෙන්නා මුණ ගස්සන අදහස හොඳ එකක්ද කියලා. මං කියන්නේ එයා ස්ථාවර නෑ, මගේ ඥාති සහෝදරයා කියන හැටියට ඇගේ මානසික තත්ත්වය බොහොම නරකයි'

'ඒත් ඒක ඩෙනිස්ගෙ අන්තිම කැමැත්ත සර්මතා. එයාට ඕන වුණා මං නිරූපමාගේ අම්මව සෙවීම. එයාට උරුමයෙන් අයිති වෙනවා ඩෙනිස්ගෙ සියලුම දේවල්, එයාගේ පවුලේ අයගෙ ආදරය පවා. ඒත් ඒ විතරක් ඇයට ඇතියි කියලා ඩෙනිස් හිතන්නේ නෑ. ඉතින් මං හිතන්නෙ නිරූපමායි තීරණය කරන්න ඕන එයාගේ අම්මා මුණ ගැහෙනවද නැද්ද කියන එක.'

'මට තේරෙනවා. යුද්ධය හුඟාක් පවුල් ඉහිරෙව්වා. ඒත් තව දෙයක් තියෙනවා ඔයා දැනගත යුතු. මගේ ඥාති සහෝදරයාගෙ තොරතුරුවලට අනුව, නිරූපමාගෙ තාත්තා හිටපු කොටියෙක්, ඉදිරිපෙළ කාඩරයෙක්.' කටකතාවලට අනුව, හමුදාව හා කොටින් අතර ඇතිවූ මහා සටනකදී ඔහු මිය ගිහිල්ලා. ඒ අනුකම්පා විරහිත සියලු දේවල් නැවත මතක්කිරීමෙන් පලක් වේ යැයි මම නොසිතමි.

ඇය නිවැරදි බව මම දැන සිටියෙමි. මා වටහාගත්තාට වඩා මෙය වේදනාකාරීය. 'ආයෙම මට ඒවා ගැන හිතන්න ඕනකමක් නෑ. අපේ ගෙවිලා ගිය කාලෙ අල්ල ගනිමු, ඔයාගෙයි මගෙයි.' සර්මතාගේ ලස්සන ඇස් දඟකාර ලෙසින් දිදුලන විට මට මා සමග සෙල්ලම් කළ මගේ පැරණි මිතුරිය දැකිය හැකි විය. මොහොතකට බොකුටු කොණ්ඩය ඇති කෙසඟ දැරිය පරිනත ගැහැණිය මතින් නැගී සිටියාය.

'ඔව් ඇත්තමයි, අපිට හුඟක් දේවල් කතා කරන්න තියෙනවා'

මගේ පැරණි යෙහෙළියගේ ලස්සන ඇස් දෙස බලන විට, මට කෙතරම් ඇය මග හැරී ගියේදැයි සිතිණි. ඒ හා සමගම මට සීතලක් දැනිණි. යාපනයේ සිටිමින්, අතීතය හාරා අවුස්සන්නට එපා යැයි කියන සර්මතාගේ අවවාද අසමින්, ඩෙනිස්ගේ බලාපොරොත්තු මා ඉටුකළ යුතුදැයි සිතුවෙමි, විශේෂයෙන්ම නිරූපමාගේ ජීවිතයේදී ඩෙනිස් අහඹු භූමිකාවක් බව දැන ගෙනත් මා  එසේ කළ යුතුදැයි සිතුවෙමි.

*

දැන් වෙලාව පෙරවරු 4.00 යි. නොනැවතී ලිවීම සහ නින්ද නොමැති වීම මා ක්ලාන්ත බවට පත් කරවීය. එහෙත් කතාව කීමට මා තුළ ඇති අභිලාෂය එයින් පහ කළ නොහැකිය. මම කොහි සිටියෙම්ද?

ආහ්! ඔව්, මගේ මිතුරා ඩෙනිස්ගේ කතාව. මේ කතාවේදී, ප්‍රධාන චරිතය වන ඔහු සියදිවි නසාගෙන මා හැර යන්නේ ඔහුගේ අන්තිම කැමැත්තෙහි භාරකරු මා බවට පත් කරමිනි. හොඳයි, එය ඩෙනිස්ගේ අන්තිම කැමති පත්‍රයේ කොටසක් නොවේ, ඔහුගේ හමුදා ගොනුවේ මට තැබූ හුදු ලිපියක්, ආමන්ත්‍රණය කොට තිබුණේ මගේ කතාවේ ප්‍රධාන චරිතය වන ඔහුගේ හොඳම මිතුරා වන මටය. ඔව්, ඩෙනිස් ඔහුගේ පුද්ගලික ජීවිතය ඔහුගේ නීතිමය කටයුතුවලින් වෙන්කර ගැනීමට හොඳින් දැන සිටියේය.

මෙය ලියන 'මම' මේ කතාව කියන 'මම' සමග පටලවා නොගන්න. අපට සමාන ගති ලක්ෂණ තිබෙන්නට ඉඩ තිබිණි, එහෙත් සහතික වශයෙන්ම අප දෙදෙනා වෙනස් ආකාරයේ පෞරුෂත්වයන් දෙකකින් යුතු පුද්ගලයෝ වීමු. ඔහුටද වටහාගත නොහැකි වූ කිසියම් අනියතාකාර හැඟීම්වලියක් හේතුකොටගෙන සියදිවි නසාගත් අප දෙදෙනාගේම මිත්‍රයකු සිටින්නට ඉඩ තිබිණි. ඒ මිතුරා මට කිසිවක් ඉතිරි කර නොයන්නට ඉඩ තිබිණි, එහෙත් මට කතාව ගොඩ නගන්නට අවශ්‍ය වූයේ මට හොඳ යැයි සිතෙන ආකාරයටය. කෙනෙකුගේ හිසෙහි කතා ගොඩනැගෙන ආකාරය ඔබට කිව නොහැකිය.

මගේ ආදරණීය පාඨකයිනි, අඩුතරමින් මට එක්දෙයක් සහතික වශයෙන් කිව හැකිය. සර්මතා මගේ සැබෑ මිතුරියයි. ඔව්, ඇයට විසල්, ලස්සන දිදුලන දෑසක් තිබේ. මගේ කතාව ලියාගෙන යන්නට පෙර මා තව කෝපි කෝප්පයක් පානය කළ යුතුය. නින්ද මා අල්ලාගන්නට තැත් කරයි, මගේ දෑස් පියන් පත් මට ද්‍රෝහී වෙයි.

අනිල්,

මෙය, ඔබට විස්මය දනවන බව මම දනිමි, එහෙත් මා කුමක් කියන්නද? මම හැම විටම ඔබට නිග්‍රහ කළෙමි, එහෙත් මගේ හොඳම මිතුරා ලෙස ඔබ කෙරෙහි විශ්වාසය තැබුවෙමි. ඔබ මේ ලිපිය කියවන්නේ නම්, එහි අදහස, මා ඔබට පෙර යන්නට ගිය බවයි. හා හා හා, මම ඔබ පරාජය කළා මෝඩයෝ ! මා උපහාසාත්මක වීමට උත්සාහ කිරීම නවතා බැරෑරුම් කාරණා පිළිබඳව අවධානය යොමු කළ යුතුය.

මගේ හදාගත් දියණිය නිරූපමාට මා කෙතරම් ආදරය කළේද යන්න ඔබ දනියි. මට ඇය වෙනුවෙන් අවශ්‍ය වූයේ ඉහළම දෙයයි. මගේ මව ඇයට නිරූපමා යැයි නම් තැබුවේ ඇගේ මියගිය හොඳම මිතුරියගේ නමිනි, ඇගේ මිතුරිය නිරූපමාද, නමෙන්ම කියවෙන පරිදි සියුමැලි, හිසේ සිට පාදාන්තය දක්වා කෝමල කෙනෙකු බව අම්මා කීවාය. කෙසේ වුවද, මගේ මව හැම විටම එහි අප වෙනුවෙන් සිටි බැවින්, තනි පියෙකු ලෙස, ඇය හදා වඩා ගැනීමේදී මට වැඩි කරදරයක් වූයේ නැත.

මම බොහෝ ගැහැණුන්ට ආදරය කළද කිසිවෙකු සමග සරණ බන්ධනයට නොබැඳුනු බව ඔබ දනියි. කලකට පසුව, ප්‍රමාද වී වැඩි යැයි මට හැඟී ගියේය, එහෙත් අනිල් තවමත් මගේම පවුලක් ගොඩනැගීම මට අවශ්‍ය විය. අනාථ කඳවුරු රෝහලේදී නිමක් නැති ඇඳවල් අතරෙහි මළ බැඳුණු යකඩ ඇඳක මියැදෙමින් සිටි මව සහ පුංචි නිරූපමා මා සොයාගත් විට පියෙකු ලෙස මගේ සැබෑ හැකියාව මම අවබෝධ කර ගතිමි. ඇය හඬන්නට නොහැකි තරමට දුබලව සිටියාය, ඇය සිහින් හඬකින් නැවත නැවත 'අම්මා' යි කීවාය. ඔබගේම දෑසින් දුටුවොත් මිස, ඒ දර්ශනය, ඒ හැඟීම ඔබට තේරුම් ගත නොහැකිය. මම සෙබළෙක්මි. සිය ගණන් ත්‍රස්තවාදී සිරකුටි ක්‍රියාකරවීමට මම උපා මාර්ග යොදා ඇත්තෙමි. එහෙත් මෙය..., එය ඉතා පුදුම සහගතය. ඒ දුර්වල ප්‍රාණියා මා අතට ගත් විට, ඒ දරුවාගෙන් මා වෙන් කළ නොහැකි බව මට එක සැණෙන් දැනිණි. එදින මම පියෙකු වීමි.

අනිල්, මා හමුදාව සමග වසර බොහෝ ගණනාවක් සිටි බව ඔබ දනියි. මම කෙලින්ම මිනිසුන් නොමැරුවෙමි, මම විනෝදයට මිනිසුන් නොමැරුවෙමි. පෞද්ගලික එදිරිවාදිකම්වලට මම මිනිසුන් නොමැරුවෙමි. එහෙත් මම මිනිසුන් මැරුවෙමි. මම යුද්ධයෙන් දිනන්නට ක්‍රමෝපායන් සකස් කළෙමි. එය මට ක්‍රීඩාවක් බඳු විය. එහෙත් අනෙකුත් මිනිසුන්

ආරක්ෂිතව තබන්නට හා මගේ රට ආරක්ෂිතව තබන්නට මම ඒ සියල්ල කළ බව සිතන්නට මම උත්සාහ කළෙමි.

ඔබ දුන් පොත, අර සයිබර්, ළමා බුද්ධිමතා පිළිබඳ ලියැවුණු Ender's Game ඔබට මතකද? මා එය කියැවීමෙන් පසුව, ඒ කතාවේ ප්‍රධාන චරිතය Ender Wiggins සේ සිතන්නට පුරුදු වීමි. ඔහු ළමා බුද්ධිමතකු හා ඉහළ පෙළේ හමුදා ක්‍රමෝපාය දක්ෂයකු වූයේය. එම කතාවෙහි, ලෝකය යැයි ඔවුන් දන්නා ලෝකය පිටසක්වල ජීවින් සමග තවත් විශාල යුද්ධයක අද්දර සිටියි. ඉදින් දූන්, Ender පිටසක්වල ජීවීන්ට එරෙහිව ගොඩනැගෙන මිනිස් හමුදාවේ කල්පිත ජාත්‍යන්තර සේනාවකගේ අණදෙන නායකයා ලෙසින්, ඔහුගේ පුහුණුවෙහි කොටසක් ලෙස පත් කරනු ලැබිණි. මානවයින් තුන්වැනි ආක්‍රමණය ආරම්භ කළේ ඉඩක් ලදොත් පිටසක්වල ජීවීන්, මානව වර්ගයා විනාශ කර දමනු ඇතැයි බියෙනි. එන්ඩර් නිර්දය සහ දරුණු වූ අතර, ඔහු පිටසක්වල ජීවීන් වඳවී යන තැනටම විනාශ කර දැමුවේය. චිත්තාකර්ශනීය කතාවක්, එහෙම නේද? හොඳයි, මෙහිදී වැදගත් කාරණාව නම්, ඔහු සටන් කරන්නේ වෙනත් සත්ත්ව විශේෂයක් සමග බව එන්ඩර් දැන සිටියේ නැත. සිතන්නට හැකියාව ඇති වෙනත් ජීවීන් කොටසක් සමග බව ඔහු දැන සිටියේ නැත. තමා අභ්‍යාස මෙහෙවරක සිටින්නේ යැයි ඔහු සිතුවේය. තමා අණදෙන පාසලේ සුපිරි පරිගණකය සමග සටන් කරමින් සිටින්නේ යැයි ඔහු සිතුවේය. සතුරා විනාශ කිරීමේදී ඔහු අනුකම්පා විරහිත වූයේ එබැවිනි.

දූන් ඉවසන්න කොල්ලො, මගේ කතාවේ අවසානයට මම දැන් එළඹෙමින් සිටිමි. ඔහු සැබෑව අවබෝධ කර ගැනීමෙන් පසුව තමාටම ද්වේශ කළේය. ඔහු නිසරු පිටසක්වල ලෝකයෙහි ජනයා පදිංචි කරවීමට යවන මානව නෞකාවකින් පිටසක්වල ග්‍රහලෝකයට ගියේය. ඔහු එහි ගිය කල්හි, ටෙලිපති ක්‍රමයට සන්නිවේදනය කළ ඒ පිටසක්වල ජීවීන් ඔහුට තබා ගිය සැඟවුණු පණිවුඩයක් ඔහු සොයා ගත්තේය. එක්වරක් නොව දෙවරක් ඔවුන් පෘථිවිය ආක්‍රමණය කිරීම ගැන ඔවුහු කනගාටුව පළකර තිබිණි. ඔවුන්ගේ ජාතිය වැනසීම ගැන ඔහුට ඔවුන් සමාව දුන් බව ඔවුහු කියා තිබිණි. ඔහු එය කළේ මන්දැයි ඔවුන් තේරුම් ගත් බවද, ඔවුන්ගේ ඉරණම ඔවුන් භාරගත් බවත් ඔවුහු කියා තිබිණි. ඒ පණිවුඩයෙහි මානවයන්ට ඔවුන් අමතක නොකරන්නැයි ඉල්ලා තිබුණේය. වඳ වී ගිය

වර්ගයන්ගේ පණිවුඩය තේරුම් ගැනීමෙන් පසුව, එන්ඩර් යුද්ධයෙහි නියම අරුත වටහා ගත්තේය. ඔහු ලිවීමට පටන් ගත්තේය. ඒ පිටසක්වල ලෝකය පිළිබඳව ලිවීම ඔහු ආරම්භ කළේය. ඔහු ඒ පිටසක්වල ලෝකයන්හි කතාව ලිව්වේය. ඔවුහු ද මහා චින්තකයෝ වූහ, මහා රණකාමීහු වූහ, එමෙන්ම ආදරණීය දෙමාපියෝ වූහ. පළවැනි ආක්‍රමණය සිදුවූයේ ඔවුන්ට මානව වර්ගයා සමග සංනිවේදනය කළ නොහැකි වූ නිසාය. ඔවුහු ටෙලිපති සංඥාවෙහි දරුවෝ වූහ.

එනිසා ඔවුන්ට මානව භාෂාවන් තේරුම් ගත හැකි නොවීය. කෙසේ වුවද, ඒ අභිමි වූ පිටසක්වල ජීවීන් පිළිබඳ කතාව එන්ඩර් ලියුවේය. ඔහු පොත ලිවීමට ආරූඪ නාමයක් භාවිතා කළේය, මියගිය තැනැත්තාගේ ප්‍රකාශක.

දැන්, කතාව හා මා ඔබේ පැරණි මිතුරා ඩෙනිස් අතර සම්බන්ධය කුමක්දැයි ඔබ අසනු ඇත. සම්බන්ධයක් නැත. වුවමනා වූයේ එය බෙදා හදා ගැනීමටය. එවිට මගේ සිත ඇතුළත කුමක් වන්නේද යන්න ඔබට තේරුම් ගත හැකිවනු ඇත.

දෙමසකට පෙර, මා යාපනයේ පරීක්ෂණ මෙහෙවරකට පත්කරනු ලැබීය. ඔවුන්ට විශ්වාසය ඇති බවට ජනතාවට හඟවන්නට දේශපාලනඥයින් මාධ්‍ය ප්‍රෝඩාවන් කරන බව ඔබ දනියි. තල් ගස් අපමණ සංඛ්‍යාවකින් යුත් පළාතට මා ගියේ වසර ගණනාවකට පසුවය. එහි මගේ වැඩ කටයුතු නිමවීමෙන් පසුව, බිඳුණු ආත්මයකින් යුතුව මම ගෙදර ආවෙමි. දැන්, ඒ පැරණි මතකයන් හෝ එබඳු දෙයක් යැයි නොසිතන්න. මගේ මෙහෙවර සිදුවූ අතරතුර, මට සමහර පැරණි හමුදා වාර්තා සහ ක්‍රමෝපාය සැලසුම්, වැදගත් එල්ටීටීඊ නායකයින් විනාශ කිරීමේ කුමන්ත්‍රණයක් පිළිබඳ වාර්තා පරීක්ෂා කිරීමට සිදුවිණි. ඔවුහු සිවිල් වැසියන් ලෙස වෙස්වලාගෙන දුර ඇති ගම්මානයක සැඟවී සිටියහ. හමුදාව, ගම්මානය ආක්‍රමණය කිරීමට තීරණය කළේය. අන්තයක සිවිල් වැසියන් ඉවත් කොට, ඉතිරි එල්ටීටීඊ කාඩරයන් අල්ලා ගැනීමට ඔවුහු උත්සාහ කළහ. විශාල සටනක් ඇති වූ අතර, දෙපාර්ශවයේම බොහෝ දෙනා මිය ගියහ. ඒ පැරණි වාර්තා නැවත නැවත පරීක්ෂා කිරීමේදී කිසියම් වැරැද්දක් ඇති බව මම දුටුවෙමි. ගම්මානයේ සිවිල් වැසියෝ ඉතිරිව සිටියහ. මා විශ්වාස කරන්න, එය සැබෑවට සිදුවන විට ඉන්ටෙල් හරහා ආරංචි මාර්ග ඔස්සේ තොරතුරු

පැමිණි අතර, ගම්මානයේ සිවිල් වැසියන් සාර්ථක ලෙස ඉවත් කළ බවට අපි විශ්වාස කළෙමු. එසේ සිතූ නමුත් කොටින් සමහර ගම්මුන්ට බලකොටු කියා තිබුණේ ඔවුන්ට පළිහක් වන්නට නැවතී සිටීමටය. අපි එය දැන නොසිටියෙමු. අප එය දැනගත යුතුව තිබිණි, එහෙත් අපි එය නොදැන සිටියෙමු. ඉන්ටෙල් තොරතුරු සාවද්‍ය වූ අතර, මමද වැරදි වූයෙමි. අපගේ රොකට්ටු යැවිය යුත්තේ කවදාද කොතැනටද යන්න මම තීරණය කළෙමි. ඒ සැලසුම් සැකසූ සේනා හසුරුවන්නා මම වීමි. ඒ ජීවිත මම විනාශ කළෙමි. ඔවුහු, තවත් දිනක් ජීවත් වන්නට ආසා කළ අහිංසකයෝ වූහ. දැන් එළඹෙන්නේ කතාවෙහි නරකම කොටසයි අනිල්. ඇගේ අලුත උපන් දරුවා සමග මට අනාථ කඳවුරේ දී නිරූපමාගේ මව හමුවූ විට, ඇය පැමිණියේ කොහි සිටදැයි ඇසූ විට, ඇය තොල් අතරින් නමක් මිමිණුවාය. ඒ දරුවාට තිබූ මගේ මහත් වූ ආදරය නිසා ඒ ගැන මා ඒ අවස්ථාවේ වැඩි අවධානයක් යොමු කළේ නැත. එහෙත් නම මගේ සිතෙහි රැඳී තිබෙන්නට ඉඩ තිබිණි, මන්ද මා පැරණි වාර්තා ගොන්න දෙස දෑස් දල්වා බලද්දී, ඇගේ ගමෙහි නම මම දුටුවෙමි. ඇය දිවි බේරාගත්තේ කෙලෙස දැයි මම නොදනිමි. ඇය දරුවාද සමග හරි වේලාවට ගම්මානය හැර එන්නට ඇත, ඇය තුවාල ලබා බේරෙන්නට ඇත. මම නොදනිමි. තොරතුරු තවදුරටත් බල නොපාන්නාවූ අවස්ථා සමහර විට අපගේ ජීවිතවල ඇති වෙයි. මට එය හැඟෙන්නට ඇත්තේ කෙසේදැයි ඔබට තේරුම්ගත හැකි දැයි සිතමි.

අනිල්, ගණනය කළ නොහැකි වසර ගණනාවක් ඔබ මට හොඳ මිතුරකුව සිටියේය. ඔබ හැමවිටම නිරූපමාගේ ආදරණීය 'අනිල් මාමා' වූයේය. ඇයගේ හොඳ මාමා වෙන්න. මට ඔබගෙන් තව උපකාරයක් අවශ්‍යය. ඔවුන්ගෙන් කවුරුන් හෝ ජීවත්ව ඇතොත් නිරූපමාගේ ඥාතීන් සොයා ගැනීමට උත්සාහ කරන්න. මගේ මවගේ ද, මගේ පවුලේ අයගෙ ද ආදරය, සදාකල් ඇයට ලැබෙන බව මම දනිමි. එහෙත් තම අක්මුල් සෙවීමට ඇයට වුවමනාව ඇතිවෙන දිනයක් එළඹෙනු ඇත. අනිල්, ඒ සම්බන්ධයෙන් කරුණාකර උදව් කරන්න.

දැන් මා වෙනත් කිසිවක් ඔබට පැහැදිලි කරන්නට යන්නේ නැත. මන්ද කාරණා හොඳ අතට හැරෙන්නේ නම්, මගේ නෞකාව කුණාටු රළ පෙළ පසු කර ක්ෂේම ස්ථානයකට යන්නේ නම්, ඔබ මේ වැකි කියවිය යුතු නැත. ඔබ දැන් මෙය කියවන්නේ නම්, එහි තේරුම, මා සදාකාලික නින්දට වැටී ඇති බවයි.

අනිල්, මට හැමවිටම කතාවක් ලිවීමට අවශ්‍ය විය. මගේ කතාව 'මළවුන්ගේ ප්‍රකාශක' ලෙස ලිවීමට මට අවශ්‍ය විය. එහෙත් එය දැන් ඇත්තේ ඔබ අතෙහි යැයි මම අනුමාන කරමි.

හැමවිටම මා මතකයේ තබාගන්න
ඩෙනිස්.

*

අරුණෝදයෙහි පළමු රැස් දහර පොළොව අල්ලා ගත්තේය, මද සුළඟ, මුදු බිඳෙන සුළු කොළ අවදි කරවූයේය. මා මේ ලියූ කතාවට ගැලපෙන සුදුසු අවසානයක් ගැන සිතන්නට මට අවශ්‍ය විය. එහෙත් 'ඩෙනිස්' යන වචනය ලිවීමෙන් පසුව අන් කිසිවක් සිතට නොඑයි. අවසානයේදී නිරූපමා ඇගේ මව හා එක්වෙනු ඇතිද? ඇගේ මසින් ලෝකයට පැමිණි දූරිය, ඇගේ මව විසින් හඳුනගනු ලැබිය හැකිද? ඩෙනිස් කතා කළාක් මෙන් සමහර විට ඇගේ මවද ඇයට 'මගේ පුංචි 'සිසාඩා' යි අමතනු ඇද්ද? කවුරු දනිත්ද? කථා නායකයා නිරූපමාට ලිපිය පෙන්වනු ඇද්ද? මම නොදනිමි. මා ඔබට කීවාක් මෙන්, දහස් ගණන් කතා අවට තිබේ, එහෙත් ඒවා කිසිදින කියා නැත, සමහර ඒවා සම්පූර්ණ කර නැත.

ලේඛකයෙක් ඔහුගේම කතාව කියන විට උපකල්පනය හා යථාර්ථය අතර ඇති සීමා මායිම කෙමෙන් මැකී යයි. නිරූපමාට ඇගේ හදාගත් පියාගේ ජීවිතයේ කුමක් සිදුවීදැයි කීමට හොඳම මග මේ යැයි සිතමින්, ඇයට මේ කතාව අවබෝධ කර ගැනීමට හැකි හොඳම මග මේ යැයි සිතමින්, දැන් මේ කතාව කියන, සැබවින්ම එය ලියන අනිල් මා විය හැකිය.

ඔහු මට තබා ගිය ලිපියෙහි අග'ඩෙනිස්' කුරුටු ගා තිබූ කවියකින් මම මේ පුංචි කතාව අවසන් කිරීමට අවශ්‍යය. කවුරු දනිත්ද? මම මේ කවිය සහ මගේ කතාවේ ඉතිරි කොටස මගේ ළමා කල මිතුරිය සර්මතාට යැවීමට ඉඩ ඇත. ඇය තේරුම් ගනු ඇත. ඇය කුඩා කාලයේදීද, ඇය නැණවත් තැනැත්තිය වූවාය. මේ පද යට සැඟව ඇති විස්මයජනක ඉඟිය තේරුම් ගැනීමට ඇයට හැකිවනු ඇත.

අප ගමන් නොකළ වීදි
අප විවර නොකළ කවුළු
අල්ලා නොගත් අත්වැල්
නැවත කිසිදා නොදකින සිහින
කිසිදා ජීවත් නොවූ ජීවිත
කිසිදා ඉටු නොවූ පැතුම්
කිසිදා නොදැල්වූ අග්නි
කිසිම කිසිදා නොලැබෙනු ඇත
ආදරය අපට.

**පැතුම් පුංචිහේවා** *ඔහුටම ආවේනික විලාසයකින් ලෝකය දෙස බලන වෘත්තීය ලේඛකයෙකි. ඔහු ත්‍රිකුණාමලය සහ බස්නාහිර පළාතේ උප නගරයන්හි හැදී වැඩුණු අතර එමගින් ඔහුට අර්ධ නාගරිකයකු ලෙසින් හැඩගැස්ම ලබන්නටත්, ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය පිළිබඳ දැනීමක් අවබෝධයක් ලබන්නටත් හැකියාව ලැබිණි.. ඔහුගේ මිශ්‍ර පදනම, කොළඹ ආනන්ද විද්‍යාලයේ උගැන්මට ලැබීමත් සමග එක්වීමෙන්, ඔහුගේ පරිකල්පන ශක්තිය පෝෂණය වූ අතර එය මෙම කතාවෙහි මූර්තිමත් වෙයි.*

# මැලවෙන කැකුළු

## *විදූජා රාජමෝහන්*

උඩුවිල් - මනිපායි පාර හැම විටම හිස්ය, උඩුවිල් කාන්තා පාසල ඇරුණු වෙලාවෙහි හැරුණු කොට එම පාරෙහි වාහන දකින්නට නැත. පස්වරු දෙකට අවසාන සීනුව නාද වූ විට ශිෂ්‍යාවෝ සිය බයිසිකල් රැගෙන පාරට ඉක්මනින් පැමිණෙති. දෙමාපියෝ සිය දරුවන් කැඳවාගෙන යන්නට පාසල ඉදිරිපිටට රැස්වෙති. අවසානයේ පාසලේ සීමා බන්ධනවලින් නිදහස් වන, නිල් සහ සුදු පැහැති පිනෆෝ උඩුවැස්ම සහිත ඇඳුම් ඇඳගත් දැරියෝ සිනාසෙමින් එහා මෙහා දිවූහ. ප්‍රාථමික පන්තිවල සිටින ශිෂ්‍යයින්ගේ මුහුණු, ඔවුන්ගේ දෙමාපියන්ගේ දර්ශනයෙන් පිබිදෙන අතර කෝලා බෙයාර් පැටවුන් ගෙලෙහි එල්ලෙන්නාක් මෙන් දෙමාපියන්ගේ ගෙලෙහි එල්ලෙති. ලස්සන මල්වතු මධ්‍යයේ පිහිටි හොඳින් නඩත්තු කළ නිවාසවලින් පාර සුසැදී තිබිණි. ඒ වීදියේ අතු සෙවිලි කළ වහළක් දැකීම හෝ මැටි ගෙයක් දැකීම ඉතා දුලබය. ඒ හැම නිවෙසක්ම වාගේ හොඳින් වර්ණ ගන්වා, වීදුරු දොරවල් සහ දැව ගෘහ උපකරණ තබා තිබිණි. සුප්‍රසිද්ධ උඩුවිල් කාන්තා පාසල (දකුණු ආසියාවේ නේවාසික පහසුකම් ලැබූ පළමු කාන්තා පාසල) සමග මේ සුඛෝපභෝගී නිවාස ගමට වැඩි අලංකාරයක් එක් කළේය. මේ නිවාස සහ පාසලට අතිරේකව, උඩුවිල්, මානිපායි පාරෙහි මිල අධික ඉලෙක්ට්‍රෝනික සහ විදුලි භාණ්ඩ, ගෘහ උපකරණ ආදිය ඇතුළත් නවීන භාණ්ඩ අලෙවි කරන සිත්ගන්නා සුළු ගොඩනැගිලි විය. මේ බොහෝ නිවාස අයිති වූයේ මේ ප්‍රදේශයේ ජීවත් වන අයටය.

හංසිගේ පවුලේ අය වාසය කළේ උඩුවිල්හිය, ඇය එවකට පස්වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලැබුවාය. ඇය ප්‍රීතිමත්, පැහැපත් සමක් ඇති, දීප්තිමත් දෑසින් යුතු සහ හැමවිටම සිනාමුසු මුහුණින් සිටින දැරියක වූවාය. ඇය තමාගේ පොහොසත් පවුල් පසුබිම පිළිබඳ පුරාජේරු කීවේ නැත. ඇගේ කාරුණික, මෘදු ගතිගුණ නිසා ඇගේ බොහෝ පන්ති මිතුරු මිතුරියන්ට ඇය සමග මිතුරු වීමට අවශ්‍ය විය. එහෙත් ඇය ගැහැණු සහ පිරිමි (ප්‍රාථමික පාසලේ ඉගෙනුම ලැබීමට අවසර ලද) ළමුන් සමග දුරස්ථ බව තබාගෙන සිටියාය. මන්ද ඇයගේ පුංචි හදවතෙහි කොනක ප්‍රාර්ථනාවක්

තිබුණු අතර අන් කිසිවකු එය දැනගැනීම ඇයට අවශ්‍ය නොවීය. ඇගේ දෙමාපියන් ඇයට බොහෝ ආදරය නොකළේ යැයි ඇය සිතුවාය. ඇගේ පාසල් සගයින් ඔවුන්ගේ දෙමාපියන් ගැන නිතර කතා කළ අතර, දෙමාපියන් සමග ඔවුන් කළ අපූරු දේ පිළිබඳව සහ දෙමාපියන්ගෙන් ඔවුන් ලබන සුරතලය හා ඔවුන්ගේ ආදරබර වචන පිළිබඳව කතා කළහ. හංසිට දෙමාපියන්ගේ ආදරය පිළිබඳ ඒ සමාන කතා තිබුණේ නැත. ඇය ඇගේ මිතුරන්ගෙන් ඈත්ව සිටියේ මේ දුෂ්කරතාව නිසාය.

ඇගේ අම්මා සහ අප්පා ඔවුන්ගේ මුළු ජීවිතයම කැප කළේ වැඩ සඳහාය, ඔවුන්ගේ දියණිය සම්බන්ධයෙන් ඔවුන් කළේ ආහාර සහ ඇඳුම් පැළඳුම් සැපයීම පමණකි. එහෙත් හංසිට ඔවුන්ගෙන් එයට වඩා දේ අවශ්‍ය විය. ඇයට අම්මා ඇගේ අතින් තමාට කෑම කැවීම අවශ්‍ය විය, අම්මා තමාව නැලවීමට දරු නැළවිලි ගායනා කිරීම අවශ්‍ය විය, එමෙන්ම ඇය නින්දට යද්දී සුරංගනා කතා කියනු ලැබීම අවශ්‍ය විය. එහෙත් ඔවුන්ගේ ඒකායන කැපවීම ඇත්තේ මුදල් ඉපයීම සඳහා බව ඉක්මනින් ඇය අවබෝධ කර ගත්තාය.

වරක්, පාසලේදී, ක්‍රීඩා කරන පැයේදී වැටීමෙන්, හංසිගේ අතෙහි අධික වේදනාවක් ඇති විය. රාත්‍රී කෑම වේලාවේදී අම්මා ආහාර බෙදමින් සිටියදී, හංසි අප්පාගෙන් තමාට කෑම කවන ලෙස ඉල්ලා සිටියාය. වියවුල් වූ ගතියකින් සහ කනස්සල්ලකින් මෙන් බලමින් ඔහු ඇගේ ඉල්ලීම නොසලකා හැරියේය. 'ඔයා පොඩි ළමයෙක් නෙමෙයි. ඔයාගේ වැඩ ඔයාම කරගන්න ඕන. අනික් අයට කරදර නොකර' අම්මා කීවාය. තමාට, ඔවුන්ගේ ආදරය සහ අවධානයෙහි අවශ්‍යතාව ප්‍රකාශ කිරීමට හංසිට නොහැකි වූයෙන්, ඇය බලාපොරොත්තු සිඳී ගොස් ඉකිබිඳින්නට වූවාය. 'අනේ ළමයෝ' අම්මා කෑගැවාය. 'දැන් ඔයා මොකද අඬන්නේ? අප්පාට ඔෆිස් එකේ ගොඩාක් ප්‍රශ්න තියෙනවා. එයා වෙහෙසවෙලා ඉන්නෙ කියන එක තේරුම් ගන්න උත්සාහ කරන්න.' හංසි රාත්‍රී ආහාරය නොගෙන මේසයෙන් නැඟිට, 'ඔය දෙන්නටම ප්‍රශ්න තියෙනවා, මං ගැන බලන්න වෙලාවක් නෑ' යි කියමින් යන්නට ගියාය.

ඇගේ එකම අස්වැසිල්ල වූයේ, ඇගේ හැඟීම් තේරුම් ගත් ඇගේ ආදරණීය අම්මච්චිය. හංසිට, අකිල් නමින් කුඩා සහෝදරයෙක් සිටියේය. එහෙත් ඔහු වයස අවුරුදු තුනක් පමණක් වූ අතර, පාසලේ සිදුවූ දේ

පිළිබඳ ඇගේ විහිළු කතා බෙදාහදාගන්නට හෝ ඔවුන්ගේ දෙමාපියන් ගැන කතාකරමින් එක්ව දුක්වන්නට හෝ හොඳ සහායකයෙක් වූයේ නැත.

*

ඒ වාරයේ වාර විභාගය දිනයක හංසිට මකනයක් ගෙන ඒමට අමතක විය. අවාසනාවකට මෙන් එය චිත්‍ර විභාගය වූයේය. ඇය කොළය දෙස බලා ඇසිපිය ගැසුවේ කුමක් කරන්නදැයි නොදනය. අනතුරුව ඔහු විභාග පරීක්ෂකවරයකුගේ අවධානය ලබාගැනීමට එදෙස බැලුවේය. ඔවුහු ඕපාදූප කියමින් කාර්යබහුලව සිටින බව ඇයට පෙනිණි. කුමක් කරන්නේදැයි නොදන හංසි ඉකිබිඳින්නට වූවාය. කිසිවෙක් තමාගේ උරහිසට තට්ටු කරනු දැනී ඇය හැරී බැලුවාය. ඒ ඇගේ පන්තියේ අරුන්ය, ඔහු ඇගේ ප්‍රශ්නය තේරුම් ගත්තාක් බඳුව මකනය දිගු කොටගෙන සිටියාය. ඔහු සිනාසී හිස සැලුවේය, ඇය කෘතඥතා පූර්වකව සිනාසී ඔහුගේ මකනය අතට ගත්තාය.

පළමුවන ශ්‍රේණියේ සිට ඔවුන් දෙදෙනා එකම පන්තියේ ඉගෙනුම ලැබුවද, ඇය අරුන් සමග එකදු වචනයක් හෝ කතා කර තිබුණේ නැත. ඔහු පන්තියේ සිටි සාමාන්‍ය ළමයෙකුට වඩා උස මහත වූයේය, බොහෝ උස හා මහත සිරුරක්, කළු හමක් හා හැමවිමට ඔහුගේ සිතිවිලි හෙළි කරන කතා කරන ඇස් ඔහුට තිබුණේය. ක්‍රීඩා උත්සව කාලයේදී දිවීමේ හා උස පැනීමේ ක්‍රීඩාවලදී බොහෝ ජවසම්පන්න සහ කඩිසර වූ හෙතෙම හැමවිටම පළමු වැනියා වූයේය. හෙමින් ඉගෙනගන්නා අයකු වූ ඔහු ඔහුගේ අධ්‍යාපන කටයුතු ඉතා හොඳින් කළේ නැත.

විභාගය අවසන් වූවායින් පසුව, හංසි අරුන්ට ස්තුති කොට, ඇගේ නිවසට එන්නැයි ආරාධනා කළාය. අරුන් ඇයගේ ආරාධනාව පිළිගත්තේය.

මද වේලාවක්, ඔවුන් දෙදෙනා කතා කළ යුත්තේ කුමක්දැයි නොදන නිහඬව ගමන් කළහ. 'අරුන්, අපි දෙන්නා අවුරුදු පහක්ම එකට ඉගෙන ගත්තට මං ඔයා ගැන කිසිදෙයක් දන්නෙ නෑ. ඇයි මට කියන්නෙ නැත්තෙ ඔයාගෙ පවුල ගැන? ඔයාගෙ දෙමව්පියො ඔයාට ගොඩක් ආදරෙයිද  ඔයත් එක්ක හුඟක් වෙලාව ගත කරනවද ඒ ගොල්ලො?' අවසානයේදී හංසි මහත් ඕනෑකමකින් ඇසුවාය.

අරුන් ඔහුගේ පවුල ගැන කතා කිරීමට අදිමදි කළ බවක් පෙනුණු අතර, ඔහු අඩිය ඉක්මන් කළේය. එහෙත් හංසි ඇයට එය කියන්නැයි බල කළාය, අවසානයේදී ඔහු 'මගේ... මගේ තාත්තා අවුරුදු දෙකක් තිස්සෙ අසනීපෙන්. අම්මා ක්ෂය රෝගයෙන් පෙළෙනවා. මගේ වැඩිමහල් සහෝදරයා පවුලට උපකාර කරන්නෙ. එයා නැතුව අපිට ජීවත් වෙන්න බෑ. මං පවුලෙ දෙවැනි ළමයා හින්දා, මටත් හුඟාක් වගකීම් තියෙනවා. ඉස්කෝලෙ ඇරිලා ගියාට පස්සෙ බලා ගන්න මට බාල සහෝදරියො හතර දෙනෙක් ඉන්නවා.' අරුන්ට අපහසුතාවක් ඇති බව පෙනිණි, ඔහු කතාව නතර කළේය.

හංසී දුගී දුප්පත්කම ගැන නොදත් නිසා. සහ අරුන්ගේ පවුලෙහි දුෂ්කරතා කෙබඳුදැයි තේරුම් නොගත් නිසා 'ඔයාගෙ දෙමාපියන්ට, රෝහලෙන් ප්‍රතිකාර ගන්න පුළුවන්නෙ' යි කීවාය.

අරුන් හිස සොලවා නිහඬව ගමන් කළේය.

'මොකද්ද ඔයා ආසම දේ? චොකලට්ද? අයිස්ක්‍රීම්ද?' හංසි ඇසුවාය. ඒ දෙකින් එකකවත් රස කිසිදිනෙක බලා නැති අරුන් පිළිතුරු දෙන්නේ කෙසේදැයි නොදන ඇසිපිය ගැසුවේය.

'මට ගෙදර චොකලට්ුයි අයිස්ක්‍රීමුයි තියෙනවා. ගෙදරට ගිය ගමන් මං ඒ දෙජාතියම ඔයාට දෙන්නම්' හංසි කීවාය.

පොරොන්දු වූ සංග්‍රහය ගැන සතුටු වූ අරුන් හිස සෙලවූයේය, ඔවුහු ඇගේ ගෙදරට දුවන්නට වූහ. හංසි ගෙදරට මිතුරකු කැඳවා ගෙන ආ පළමු අවස්ථාව මෙය වූ අතර ඇය බොහෝ කලබල වූවාය.

ඇගේ මිණිබිරිය පැමිණෙන තුරු අම්මච්චි නිවසෙහි ඉදිරිපිට බලා සිටියාය, හංසි අපිරිසිදු කමිසයක් හා පාවහන් පැළඳ රස්තියාදුකාරයකු සේ පෙනෙන පිරිමි ළමයකු සමග එනු දැකීමෙන් ඇය කැළඹී ගියාය. ඔහුගේ හිසකේ හොඳින් කපා නොතිබුණු අතර ඒවා උරහිස දක්වා වැටී තිබුණේය. ඔහු පාසල් ටයි පටිය හෝ මේස් පැළඳ සිටියේ නැත. හංසි සහ අරුන් ගේට්ටුව වෙත ළඟාවන විට අම්මච්චි ඔවුන් දෙස බලා කෝපයට පත් ස්වරයකින් ප්‍රශ්න කළාය. 'හංසි මේ පිරිමි ළමයා කවුද? ඔයා එයාව දන්නෙ කොහොමද? ඔයා එයාව මෙහෙ එක්කරගෙන ආවෙ ඇයි? එයාට මොනවද ඕන?'

බොහෝ වටිනා නිවස හා මහළු නෝනා මහත්මියගේ කෝපය පිරුණු ප්‍රශ්න අරුන්ට ආපසු හැරී දිව යන්නට වුවමනාවක් ඇති කළේය. ඔහු එසේ යන්නට ඉඩ තිබිණි, එහෙත් හංසි ඇගේ අතින් ඔහුගේ අත අල්ලාගෙන සිටියාය. හංසි අම්මච්චි දෙස රවා බැලුවාය, ඇය ප්‍රථම වතාවට යහළුවකු නිවසට කැඳවාගෙන පැමිණීම ගැන ආඩම්බරයෙන් සිටියාය. 'මේ අරුන්' ඇය කීවාය, අනතුරුව ඔවුන් හොඳ මිතුරන් වන්නට හේතු වූ සිදුවීම ඇය අම්මච්චිට විස්තර කළාය, ඇගේ ඇස් බැබළෙන්නට විය.

අම්මච්චි මුළු කතාවටම සවන් දුන්නාය, එය ඇගේ සිතට කාවැදිණි. තම මිණිබිරියට එබඳු උපකාර කරන පන්ති මිතුරකු සිටීම ගැන සතුටු වූවාය. එහෙත් ඉරියව්වකින් හෝ වචනයකින් හෝ ඇය ඇගේ හැඟීම් පළ නොකළාය, මන්ද මේ පිරිමි ළමයාට ගෙතුළට පැමිණීම සඳහා ඉඩ දීමට ඇය අදහස් කර නොතිබුණ බැවිනි. 'තම්බි, කොහෙද පදිංචිය?' ඇය අසා සිටියාය.

'ළඟම පටුමගේ ඉන්නෙ ආච්චි. එච්චර දුර නෑ. මං හිතනවා මට මෙහෙ එන්න පුළුවන් හංසි එක්කයි, එයාගෙ පුංචි සහෝදරයා එක්කයි හැන්දෑවට සෙල්ලම් කරන්න.

'අනේ තම්බි ! හවස් කාලෙ හංසි එයාගෙ පුද්ගලික පන්ති හින්දා හරියට වැඩ' අරුන්ට බාධා කරමින් අම්මච්චි කීවාය. 'මං හිතනවා ඔයත් පාඩම් කරන්න ඕන, ලෑස්ති වෙන්න ඕන ශිෂ්‍යත්ව විභාගෙට. ඉතින් ගිහින් පාඩම් කරන්න.'

අරුන් එය වටහා ගත්තේය. මේ වියපත් නෝනා මහත්මිය ඔහුට සලකන්නේ හීන කුලයේ කෙනෙකුට මෙනි, ඇය ඔහුගෙන් බේරෙන්නට මගක් සොයයි. ඔහු හංසිට බලාපොරොත්තු කඩවූ ලෙසින් 'ආයුබෝවන්' කීමෙන් පසු යන්නට ගියේය.

සිය අම්මච්චි සමග කෝප වූ හංසි වචනයකුදු නොදොඩා සිය කාමරයට ගියාය. අම්මච්චි ඇ පසුපසින් පැමිණ මෙසේ කීවාය. 'මගේ රත්තරන් දරුවො, එන්න මා ළඟින් ඉඳගන්න'

හංසි මුහුණ දික් කොටගෙන ඇය වෙත ආවාය.

'ඇයි මගෙ රත්තරන් මිණිපිරියෙ ඔයා දුකින් ඉන්නෙ? ෆ්‍රිජ් එකේ අලුත් ඇපල් වගයකුයි, චොකලට්ටුයි තියෙනවා. මං ඔයාට ඒවා ගේන්නද?'

ඇගේ යාප්පු නොසලකා හරිමින් හංසි කෑගෑවාය. 'අරුන්ව පිස්සු බල්ලෙක් වගේ එලවලා දැම්මේ ඇයි? අර චොකලට් එයා එක්ක කන්නයි මං සැලසුම් කළේ. මට ඕන වුණා එයාව මගේ පුංචි මල්ලිට අඳුන්නලා දෙන්නත්. ඒත් ඔයා ඔක්කොම විනාශ කළා. මං ඔයාගෙ චොකලට්ටුයි, ඇපලුයි ඉතින් අල්ලන්නෙවත් නෑ'

'ඕ....! හංසි රත්තරනෙ. ඒ වගෙ දේවල් තේරුම් ගන්න ඔයා හොඳටම පුංචි වැඩියි. ඔයාට ඇහුණෙ නැද්ද එයා කියපුවා. එයා ඉන්නෙ අල්ලපු පාරෙ. ඇත්තටම, ඒක කොලනියක්. ඔයාට තේරෙන්නෙ නැද්ද කොලනිය කියන්නෙ මොකද්ද කියලා. කොලනිවල ඉන්න මිනිස්සු අශිෂ්ටයි. ඒ ගොල්ලො ජීවත් වෙන්නෙ ම්ලේච්ඡයො වගේ. ඉස්කෝලෙ යාළුවො සීමා වෙන්න ඕන ඉස්කොලෙ හතරමායිමට විතරයි. ඒ මෝඩයව ගෙදර එක්කරගෙන ආවේ ඇයි? මං කියන දේ අහලා හොඳ ළමයෙක් වෙන්න' අම්මච්චි කටුක ලෙස කීවාය.

අම්මච්චිගේ ස්වරයෙන් බියට පත්වූ හංසි නිහඬව සිටියාය.

එහෙත් පසුව, හංසි සහ අරුන් පාසලේදී ඔවුන්ගේ දහවල් ආහාරය සහ අනෙකුත් දේ බෙදා හදා ගත්හ, එක්ව සෙල්ලම් කළහ, පුස්තකාලයට එක්ව ගියහ, ඔවුහු හොඳ මිතුරන් බවට පත්වූහ. අධ්‍යාපනය කෙරෙහි ඇති ඔහුගේ අවධානය නංවාලන්නට හංසි උත්සාහ කළ අතර ඔහු සිය අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් ඇති රුචිය වර්ධනය කළ බවක් පෙන්නුම් කළේය. ඔහු තමාගේ පෙනුම වෙනස් කළ අතර එමගින් ඔහු පිරිසිදු බවක් පෙන්නුම් කළේය, සියල්ල හංසිට පින්සිදු වන්නටය.

අවාසනාවකට මෙන් හංසිට සහ අරුන්ට කාලය හරස් විය. රජයේ හමුදා 'රිවිරැස' නමින් මෙහෙයුමක් දියත් කළේය. 'දීප්තිමත් අනාගතයක් පැමිණේ' යන්න වචනයෙහි තේරුම වුවද එය මිනිසුනට අඳුර ගෙන ආවේය.

එල්ටීටීඊ සංවිධානය, යාපනය අර්ධද්වීපයේ සියලුම පුරවැසියන් සංවිධානයට මුදල් හෝ රත්තරන් පරිත්‍යාග කරනු ඇතැයි බලාපොරොත්තු

වූහ. එය අනිවාර්යය විය. එසේ නැතහොත් ඊනියා නිදහස් අරගලයට හැම පවුලකින්ම එක් පිරිමි දරුවෙක් කැප කිරීමට සූදානම් විය යුතු විය. හංසිගේ පවුල පොහොසත් වූ නිසා, ඔවුහු මුදල් දී, ආරක්ෂිතව සිටියහ. එහෙත් හංසි, අරුන්ගේ පවුල ගැන සිත් කරදර කොට ගත්තාය. ඔවුන්ගේ මව්පිය දෙදෙනාම අසනීපයෙන් සිටි බැවින්, ඔවුන්ට මුදල් දීම අපහසු බව ඇයට සහතිකය.

දින දෙකකට පසු ඇයට අරුන් මුණ ගැසුණු විට, ඔහු අසතුටින් සිටින බව පෙනී ගිය අතර, ඔහුගේ දෑසෙහි වූ දීප්තිය නැති වී ගොස් තිබිණි. කොටින්ට මුදල් හෝ රත්තරන් දුන්නේදැයි අසන්නට පසුබෑ හංසි අවසානයේදී කෑගෑවාය. 'අරුන්, ඔයා ඇයි මෙච්චර දුකෙන් ඉන්නවා පේන්නේ'

මද වේලාවක් නිහඬව සිටි ඔහු අනතුරුව කතා කළේය. 'ඇයි ඔයා මා එක්ක මිත්‍ර වෙන්න හදන්නෙ? මාව බල්ලෙක් වගේ එලවලා දාපු ඔයාගෙ අම්මච්චි ළඟට ගිහිල්ලා කාලෙ ගත කරන්න'

ඔහුගේ ස්වරයෙහි වූ වෛරී බව නිසා හංසිගේ සිත අවුල් විය. වචනයකුදු කතා නොකොට ඔහු යන්නට ගියේය.

ඊළඟ දිනයේ, බෝම්බ දැමීම හා ෂෙල් වෙඩි ගැසීම ආරම්භ වූ අතර ඇයට ගෙයින් පිටතට යාමට අවසර නොලැබිණි.

දෙසතියකට පසුව, ඇගේ දෙමාපියන්ගේ සාකච්ඡාවලින්, අරුන් සහ ඔහුගේ කොලනියේ සිටි බොහෝ පිරිමි ළමයින්ට ඊනියා නිදහස් සටන් කරුවන් සමග එක්වන ලෙසට බලකර ඇති බව හංසි දැන ගත්තාය. ඔහු නොගියේ නම් අරුන්ගේ වැඩිමහල් සහෝදරයා, පවුලේ එකම උපයන්නා, අත්අඩංගුවට ගනු ලැබිය හැකි අතර, එල්ටීටීඊ ය මගින් මරා දමනු ඇත. මෙය ඇසූ හංසි බියට පත්වූවාය. අම්මච්චි අරුන් සමග වූ ඇගේ සම්බන්ධය ගර්හාවට ලක් කළ බැවින්, ඔහු සම්බන්ධ ඇගේ සාංකාව ඇය සමග බෙදා හදා ගැනීමට නොහැකි විය, ඇය බොහෝ සිතිවිලිවලින් පීඩා වින්දාය. 'අවුරුදු දහයක පුංචි පිරිම ළමයෙක් තුවක්කුවක් ගන්නෙ කොහොමද? එයාගෙ දෙමව්පියොයි, වැඩිමහල් සහෝදරයයි, එයාට යන්න ඉඩ ඇරියෙ කොහොමද? අපි අන්තිමට මුණ ගැහිච්ච වෙලාවෙ එයාට තරහ ගිහින්

තිබුණෙ මේ කාරණේ හින්දද? එයා හැමදේම මට කිව්වා. ඇයි මේකත් නොකිව්වෙ? එයාගෙ පවුලෙ දුප්පත්කම කියන්න එයාට ලැජ්ජා හිතුණද එයා මට කිව්වා නම්, මට අප්පට කියන්න තිබුණා එයාට උදව්වක් කරන්න කියලා. කොටි අරුන්ට හරියට කන්න දෙයිද? ඒ ගොල්ලො අරුන්ව සටන් බිමට අරියිද? එයා කවදා ආපසු ගෙදර එයිද? මං ආයෙම එයාව දකින්නෙ කවදද?'

ඇගේ කම්මුල් දිගේ කඳුළු ගලා ආවේය. ඇය හඬන්නේ මන්දැයි ඇගේ කුඩා සහෝදරයා අකිල් ඇසුවේය, එහෙත් එය ඔහුට කියන්නට නොහැකි නිසා ඇය ඔහු සමග සෙල්ලම් කරමින් සිත වෙනතකට යොමු කළාය. දින ගෙවී යද්දී, අරුන් පිළිබඳ මතකය ඇගේ සිත කොනක නිදන් විය. ඔහු ආපසු පැමිණෙනු ඇතැයි ඇය බලාපොරොත්තු වූවාය, ඔහු පැමිණෙන ඒ දිනය ඉක්මනින් උදාවන තුරු ඇය බලා සිටියාය.

පාසල්, අවතැන් වූ වැසියන්ගේ ආරක්ෂක කඳවුරු බවට පරිවර්තනය වූ බැවින් හංසි ගෙදර නැවතුණාය. ඔවුන්ගේ දෙමාපියන් වැඩ කළ කාර්යාලද වැසූ බැවින් ඔවුහුද ගෙදර සිටියහ. ඇය සතුටු වූයේ දෙමාපියන් ඇයට ගෙදර වැඩ කරන්නට හෝ ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන්නට බල නොකළ නිසාය, එහෙත් ඇයට ඇයගේ මිතුරා නැති පාළුව තදින් දැනිණි. ඇගේ කුඩා සහෝදරයාගේ දඟකාරකම් නිසා ඇගේ සිත් කරදර සහ වර්ධනය වන ආතතිය අමතක කර දැමීමට සමහර අවස්ථාවලදී හැකි විය. විදුලි බලය නොතිබුණ නිසා රූපවාහිනිය බැලීමට හෝ ගුවන් විදුලියට සවන්දීමට නොහැකිවීම නිසා ඔවුහු නව ක්‍රීඩාවන් සොයාගත්හ. ඔවුන්ට සැබවින්ම Tom and Jerry සහ Mr Bean නැරඹීමට නොහැකි විය. ඒ සඳහාද බැටරි හිඟයක් තිබිණි, එල්ටීටීඊ සංවිධානය ෂෙල් හා බෝම්බ නිපදවීම සඳහා බැටරි යොදාගනු ඇතැයි බියෙන් හමුදාව බැටරි සැපයුම සීමා කර තිබුණේය. ඉක්මනින්ම, විදුලි කේතලය සහ ග්‍රයින්ඩරය වැනි විදුලියෙන් ක්‍රියාකරන යන්ත්‍ර ඔවුන්ගේ සෙල්ලම් බඩු බවට පත් විය. හංසිගේ සහෝදරයා අවුරුදු තුනක් පමණ වූ නිසා, ක්‍රීඩා සංවිධානය කිරීමේ මුල්තැන ඔහු ගත්තේය. ඇයට අවශ්‍ය පරිදි ඇය නීති රීති වෙනස් කළාය. ඇගේ සහෝදරයා ක්‍රීඩා නීති ගැන ඇසුවහොත්, ඇය දක්ෂ ලෙස ඔහු වෙනතකට යොමු කළාය. ඔවුන්ගේ බොහෝ ක්‍රීඩා අවසන් වූයේ හංසි ජයග්‍රහණය කිරීමෙන් හා කුඩා සහෝදරයා හැඬීමෙනි. අම්මා කුඩා

සහෝදරයාට බැණ වැදුණේ, හංසි සමග සෙල්ලම් නොකරන ලෙසත්, එසේ සෙල්ලම් කොට පැමිණ, පැමිණිලි නොකරන ලෙසටත් අවවාද කරමිනි. එහෙත් ඊළඟ මොහොතේදී, ඔහුට සියල්ල අමතක වී තවත් සෙල්ලමක් කරන්නට හංසි වෙතට යයි. සමහර විට, හංසි තමාට බොහෝ මහන්සි බව කියමින්, ඔහු තමාට ඇවටිලි කරන තත්ත්වයට පත් කරයි. බොහෝ විට ඔවුන්ගේ අම්මච්චිට තීරක වශයෙන් සිටිමින් ඔවුන්ගේ ප්‍රශ්න විසඳීමට සිදුවේ.

හංසි තවමත් අරුන් ගැන බෙහෙවින් සිතුවාය. දිනක්, ඔහු තමා සමග සෙල්ලම් කරනුද, හදිසියේම ඔහු ළිඳකට වැටෙනුද ඇය සිහිනයෙන් දුටුවාය. සිහිනයෙන් අවදි වෙමින් හංසි කලබල වී කෑගැවාය. ඇය බොහෝ සේ හඬමින්, රාත්‍රිය නිදි නැතිව ගෙවුවාය.

පසුදා උදෑසන අම්මච්චි ඇගේ පැනසොනික් රේඩියෝව දැමූ විට, යාපනයේ එල්ටීටීඊ සංවිධානය හා ශ්‍රී ලංකා හමුදාව අතර උග්‍ර සටන් ආරම්භ වී තිබෙන බව කියැවෙන රජයේ ප්‍රවෘත්තියක් ඔවුන්ට අසන්නට ලැබිණි. යාපනය අර්ධද්වීපයේ ඇඳිරි නීතිය පැනවෙන්නට ඉඩකඩ තිබිණි.

ජනතාව වහා තමන්ගේ වටිනා දේවල් පමණක් රැගෙන යාපනය නගරයෙන් පිටව යන්නට වූහ. ඔවුහු තෙන්මරච්චි, වඩමරච්චි සහ වන්නියට අවතැන් වූහ. ඔවුන්ගේ අසල්වැසියෝද බොහෝ දෙනෙක් පිටව ගියහ, හංසිගේ පවුල ඇතුළත් කිහිප දෙනෙක් නතර වූහ. අවතැන් වීම දැරීමට ඔවුන්ගේ අම්මච්චි වයෝවෘද්ධ වැඩි බැවින්, හංසිගේ දෙමාපියෝ යාපනය හැර යන්නට පසුබට වූහ.

ඉක්මනින්ම ඔවුන්ට ඈතින් බෝම්බ පුපුරන ශබ්ද ඇසෙන්නට විය. ඒ හඬ ඇසෙන හැම වාරයකදීම, හංසි සහ කුඩා සහෝදරයා බියෙන් කෑගැසූහ. අසල්වැසි මිනිසුන් කිහිප දෙනෙකු සමග අසල ඇති කෝවිලක කාලය ගත කරන්නට පවුල පටන් ගත්හ. මෙසේ රැස්වීමෙන් හංසි හා කුඩා සහෝදරයා බියට පත්වූයේ ඔවුන් වටා සිටි මිනිසුන්, චිත්‍රපට කතා මෙන්, භයානක කතා කියන්නට වූ බැවිනි. බෝම්බයක් එක් අයෙකුගේ හිසට වැටී, ඔහුගේ හිස කෑලි කෑලි වලට බිඳී ගිය බවද, මිනිසුන්ට බඩගින්න හා පිපාසය සන්සිඳුවා ගැනීමට කෑම හෝ ජලය නොමැති බැවින් ඔවුන් ජරාවාස වූ පොකුණු වලින් ජලය ගෙන ඔවුන්ගේ සාරිවලින් ඒවා පෙරා

ගන්නා බවද ඔවුහු කීහ. සරණාගත කඳවුරුවල මිනිස්සු මැලේරියාව, ඩෙංගු වැනි ආසාදිත රෝග වලින් පෙලුණහ.

දින ගෙවී යන විට, ෂෙල් වෙඩි සහ බෝම්බ හඬ ළංව ඇසෙන්නට විය. හංසිගේ දෙමාපියන් තවදුරටත් කෝවිලට නොගියේ, එහි සිටින මිනිසුන් යුද කතා අතිශයෝක්තියෙන් කියන කල, දරුවන් බියපත් වන බැවිනි. ඔවුහු බංකරයක් සෑදීමට තීරණය කළහ. පළමුව, බංකරය හෑරීමට මිනිසුන් සොයා ගැනීම අපහසු විය, අවසානයේදී, එක් උදෑසනක අප්පා උදළු සහ අනෙකුත් පස් හාරන උපකරණද සමග මිනිසුන් පස්දෙනෙක් කැඳවාගෙන ආවේය. ඔහු ඔවුන් ගෙය පසුපසට කැඳවාගෙන ගොස් මුඩු පොළොවෙහි ඔවුන්ට හෑරීමට තැනක් පෙන්වා දුන්නේය.

ඔවුන්ගේ රැවුල්, කළු හම, කිලිටි සරොම්, සහ නිරාවරණ උඩුකය නිසා මුලදී හංසි සහ කුඩා සහෝදරයා ඔවුන්ට බියවූහ. පසුව, ඒ මිනිසුන් අභිගුණ්ඨකයින්ය යන අදහස ඇති වූ අතර රහසේ ඔවුන් දෙස බලා, ඔවුන්ගේ අභිගුණ්ඨක පැවැත්ම ගැන කතා හදමින් සිනාසුණහ. එතෙකුදු වුවත්, ගිනි අවියෙන් සහ බෝම්බයෙන් ඔවුන් ආරක්ෂා කර ගැනීම සඳහා ශක්තිමත් බිත්ති සහිත බංකරයක් සාදමින් මිනිසුන් තමන්ට සේවයක් සලසන බව අම්මා ඔවුන්ට කීවාය. ඒ මිනිසුන්ට සිනාසීම ගැන හංසිගේ සිතෙහි වරදකාරී හැඟීමක් ඇති විය. ඔවුන් වැඩ කරන විට, ඇගේ පියාද සමග එහි හිඳිමින් ඇය ඔවුන්ට වතුර බෝතල් දුන්නාය. ඔවුහු වළ හෑරීමෙන් පසුව, පොළව සහ බංකරයේ පැති මට්ටම් කළහ. එය පොළව යට සෑදූ නව නිවසක් ලෙස පෙනුණු අතර 'අපිට කවදද පුළුවන් බංකරේට බහින්න' යැයි අප්පාගෙන් ඇසුවාය.

'ඔයාට කැමති ඕන වෙලාව රත්තරනෙ' ඔහු ඇය දෙස බලා සිනාසෙමින් කීවේය.

හංසි සහ සහෝදරයා ප්‍රීතියෙන් යුතුව බංකරයට පැන්නහ, එහි කෑම පුස්ගඳක් වැනි ගඳක් දැනෙන්නට වූයෙන් දෙදෙනා වහා ගොඩට පැමිණියහ. 'බංකරේ ගඳක් තියෙනවා. අපි ඒකට සුවඳ විලවුන් ඉහින්න ඕන. එතකොට විතරයි අපිට ඒකෙ පහසුවෙන් ඉන්න පුළුවන්' ඇගේ කුඩා සහෝදරයා අප්පාට එසේ කීවේය.

ඇගේ කුඩා සහෝදරයාගේ අහිංසක බව දැක අප්පා සිනාසුණේය. 'සුවඳ විලවුන් ඕනෑ නෑ ළමයා. මේ දඟකාර ළමයව දැක්කම ගඳ පැනලා යයි'

අප්පාගේ සිනාව ඇසීමෙන් හංසි බොහෝ සතුටට පත් වූවාය. ඒ වන විට අප්පාගේ ඒ සිනාව ඇසී බොහෝ කලක් ගත වී තිබිණි.

දින කිහිපයකට පසුව බංකරය හදා අවසන් විය, එක් රාත්‍රියක ගිගුරුමක් පරිද්දෙන් ෂෙල් වෙඩි දැමීම හා බෝම්බ දැමීම හදිසියේ ඔවුන්ට ඇසෙන විට ඔවුහු නින්දෙහි සිටියහ. ඇගේ අප්පා සහ අම්මා ඔවුන් සියලු දෙනාම පහසුවෙන් බංකරයට බැසගත්හ, එහෙත් අම්මච්චිට එය අපහසු විය, ඇය ඔසවාගෙන ඒමට හංසිගේ අප්පාට සිදු විය. සියලු දෙනාම බංකරයට ඇතුළු වූ පසුව, බියෙන් යුතුව ඔවුහු එකිනෙකා දෙස බැලූහ.

ෂෙල් වෙඩි හඬ හා බෝම්බ හඬ බියකරු වූයෙන් ඔවුහු මුළු රාත්‍රියම බංකරයේ සිටියහ. හංසිට කිසියම් සහනයක් දැනුණේ, ඇයට තම දෙමාපියන් සමග සිටීමට සහ වැඩි ආදරයක් ලැබීමට සහ අම්මාගේ සුරතලය ලබන්නටද හැකි වූ නිසාය. භයානක තත්ත්වය යටතේදී ඇගේ දෙමාපියෝ, අවසාන වශයෙන් ඇය සහ ඇගේ සොයුරා සමග කාලය ගත කරති.

එයින් පසුව අහස් යානා ශබ්දය ඇසුණු ඕනෑම විටකදී, ඔවුහු බංකරයට දිව ගියහ. කාලය ගෙවී යන විට, හංසි සහ ඇගේ කුඩා සහෝදරයාට බංකරය හැංගි මුත්තන් සෙල්ලම් කරන්නට හොඳ තැනක් ලෙස සොයාගත්හ. යම්කිසි දඟකාර වැඩක් කළහොත් දෙමාපියන්ගෙන් බේරී සැඟවෙන්නට ද බංකරය ප්‍රයෝජනයට ගත්හ. ඉතා ඉක්මනින්ම ඔවුන්ගේ සියලුම සෙල්ලම් බඩු බංකරයට ගෙන යනු ලැබීය, එමෙන්ම දෙදෙනාම වැඩි වේලාවක් ගත කළේද බංකරයේය. මන්ද එය වැඩිහිටියන්ගේ මැදිහත්වීම් නොමැති ස්ථානයක් වූ බැවිනි.

කාලය ගෙවී යන විට, බෝම්බ හා ෂෙල් වෙඩිවල ගිගිරුම් හඬ අම්මච්චිට දරා ගන්නට නොහැකි තත්ත්වයක් උදා විය. ඇය නොකඩවා මැසිවිලි කියන්නට පටන් ගත්තාය. 'දෙවියො හැමදෙනාටම සම්පත් දෙනවා, ඔවුන් ඒවා භාවිතා කරන්නෙ හොඳ විදිහටද නැද්ද කියලා

පරීක්ෂා කරලා බලන්න.' ඇය එසේ කියා සිටින්නට වූවාය. 'අපිට මේ දුක් කන්දරාව දීපු හැමෝටම ඒ අයගෙ කෘෘරකම්වලට දවසක බරපතල දඬුවම් ලැබෙයි. භීමන් වගේ හරි අර්ජුන වගේ වික්‍රමාන්විත වීරයෙක් ඉපදෙයි මේ පිසාචයින්ට තිත තියන්න.'

දැන් බඩු භාණ්ඩ ගැනීමට, විශේෂයෙන්ම කිරි පැකට් සහ දරුවන්ගේ අඩුම කුඩුම ගැනීමට සාප්පු එහි නැත. අනෙක් ගම්මානවල හා නගරවල සමහර කඩ සාප්පු තිබුණද, යුද්ධය ක්‍රමයෙන් වැඩිවීමත් සමග භාණ්ඩ මිලද වැඩි විය. එමෙන්ම, ඇඳිරි නීතිය පනවා තිබීම නිසා, මේ කඩ සාප්පුවලට යාම ඇගේ පියා ප්‍රතික්ෂේප කළේය. දැන් කාලයක් තිස්සේ වෙළෙඳ භාණ්ඩ පැමිණියේ නැව් මගිනි, නෞකාවන්ට තවදුරටත් නිතිපතා ප්‍රවාහනයේ යෙදීමට නොහැකි විය. යුද්ධය මෙයාකාරව පැවතුණහොත් සාගින්දරෙන් සිටින්නට වනු ඇතැයි ජනතාව බියට පත් වූහ. යාපනය අර්ධද්වීපය, ලංකා මවගෙන් වෙන්වූ නිසරු බිමක් ලෙස පෙනෙන්නට විය.

ඔවුන්ගේ නිත්‍ය කිරිකරු යන්නට ගිය පසුව, ආහාර වේලට පෙර කිරි බොන්නට පුරුදුව සිටි හංසිගේ සොහොයුරා, කිරි නොමැතිව ආහාර ගැනීම පිළිබඳව ලොකු කලබලයක් කළේය. ෂෙල් වෙඩි, බෝම්බ සහ කාලතුවක්කු ගිගුරුම් හඬින් ඔහු බියට පත්වන බව ඇය තේරුම් ගන්නා තුරුම ඔහුගේ නිරන්තර හැඬීම ගැන අම්මාගේ කෝපය වැඩෙමින් තිබුණේය. එයින් පසුව අප්පාට වාහනයක් සොයා යන්නට අම්මා බල කරන්නට වූයේ එවිට ඔවුන්ට ආරක්ෂිත යම් ස්ථානයකට යා හැකි වන බැවිනි. අවසානයේදී කළ යුතු වූ හොඳම දෙය එය බව ඔහු ඒත්තු ගත්තේ, විශේෂයෙන්ම ඔහුගේ සහෝදරයාගේ සහ සහෝදරියගේ පවුල්ද ආරක්ෂිත ප්‍රදේශයකට ගොස් ඇති බව දැන ගැනීමෙන් පසුවය.

අම්මච්චීද ප්‍රදේශය හැර යාමට සතුටු වූ අතර තමාට ගමන යා හැකි බව හංසිගේ දෙමාපියන්ට ඒත්තු ගැන්වූවාය.

පදිංචියට යන්නේ කවර ඉසව්වකටදැයි කිසිදු පෙර සැලැස්මක් නොමැතිව, අප්පා ඔවුන්ගේ බඩුබාහිරාදිය ප්‍රවාහනය සඳහා ලොරියක් වෙන් කරවා ගත්තේය. දෙමාපියන් සමග ගමනක් යන්නට ලැබීමෙන් හංසි සතුටට පත්වූවාය. මෙය ඇයට අලුත් දෙයක් හා සිතෙහි උද්දීපනයක් ඇති

කරවන දෙයක් විය. ඔවුහු මහ රාත්‍රියේදී ගමන ආරම්භ කළහ. රියදුරා නොදන්නා මාර්ග ඔස්සේ රථය ධාවනය කළේය. ඔවුන් යන මග මිනිසුන් ගස් යට හා මහජන ගොඩනැගිලිවල කෑම පිසිනු ඔවුන් දුටුවෝය. සමහර මිනිස්සු, අන්ධකාර රාත්‍රියේ මහ හඬින් විලාප දෙනුද, හඬ නගා දෙස් දෙවොල් තබන්නටද වූහ. අනෙක් අය යන්නේ කොහිදැයි නොදන ඈත පෙදෙස්වලට පා ගමනින් යමින් සිටියහ. මිනිසුන් සුරතල් සතුන් අතහැර ගියෙන්, සත්තු පාර පුරා ඇවිදිමින් සිටියහ. ඇගේ සොහොයුරා ඉක්මනින් අම්මාගේ උකුලෙහි නින්දට වැටුණු නමුත් හංසිට නිදාගත නොහැකි විය. ඔවුන් මුරපොළක් පසුකර පැමිණි අතර, සොල්දාදුවන් කිසිදු හේතුවක් නොමැතිව තරුණයින් දෙදෙනෙකු බිම දමා, පා පහර දෙනු දුටුවහ. තවත් මුරපොළකදී, සෙබලෙක් මිනිසකුට වෙඩි තබනු ඔවුහු දුටුවෝය. මේ දසුන් නොපෙනෙන්නට, හංසිගේ මව හංසිගේ මුහුණ සැඟවූවාය. එහෙත් අම්මාගේ සහ ආච්චම්මාගේ කතා බහ තුළින් සිදුවූයේ කුමක් දැයි ඇය වටහා ගත්තාය.

'මේකද දෙමළ මිනිසුන්ගේ ඉරණම? අපිට සාපයක් වැදිලද?' වෙව්ලුම් ස්වරයෙන් අම්මා ඇසුවාය.

'ම් ම් ම් ම්, වෙන කාටවත් දොස් කියන්න බෑ අපටම මිසක්' අම්මච්චි උපහාසාත්මකව කීවාය. 'එල්ටීටීඊ ය අපේ මිනිසුන්ට විමුක්තිය දෙනවා ඔවුන්ව ඈත පළාත්වලට යවලා'

'මෝහාන්, අපි කොහෙද යන්නෙ?' ඉකිබිඳිමින් හංසිගේ මව ඇසුවාය. 'තීරණය කරලද තියෙන්නෙ අපි කොහෙටද යන්නෙ කියලා, නැත්නම් ඩෙංගු, මැලේරියා මදුරුවො කකා ගස් යට ජීවත් වෙන එකද මගේ ළමයින්ගෙ ඉරණම?'

හංසිගේ අප්පා ඇගේ අතට තට්ටු කළේය. 'අපි යන්නෙ මගේ සහෝදරයා අශාම්ගේ ගෙදර.'

අවසානයේදී ඇගේ පියාගේ සහෝදරයාගේ නිවස ඇති වඩමාරච්චියට ඔවුහු ළඟා වූහ. ඔවුන් මෙහි පැමිණ ඇත්තෙ කලාතුරකිනි, මන්ද එය ඔවුන්ගේ නිවසින් බොහෝ දුර බැහැර ප්‍රදේශයක් බැවිනි. ඔවුන් පාර හොඳ හැටි දැන සිටියේ නැත, එය සඳ නැති අන්ධකාර රාත්‍රියක් වූ

බැවින් ඔවුහු අතරමං වූහ. ඔවුන්ගේ අප්පා නොයෙක් මිනිසුන්ගෙන් පාර ඇසූ අතර අවසානයේදී එක් අයෙක් ඔවුන් අදාල නිවසට යොමු කළහ.

එය කාමර තුනකින්, මුළුතැන්ගෙවල් දෙකකින් හා විශාල ශාලාවකින් යුතු තරමක් විශාල නිවසක් වූයේය. ඔවුන් දොරට තට්ටු කළ විට, සිත්තප්පා දොර විවර කළ අතර සියලු දෙනා එහි රැස්ව සිටිනු දකීමෙන් ඔහුගේ මුහුණ මළානික වූයේය. 'ඕගොල්ලො මෙහෙ ආවෙ පදිංචියටද? මේ අන්ධකාර රාත්‍රියේ මගේ ගේ සොයා ගත්තෙ කොහොමද?'

ඔහුගේ ආගන්තුක සත්කාරය නොමැති හැසිරීමෙන් අප්පා තැති ගත්තේය. 'නෑ අශාම්, අපි ආවෙ රැයක් නතර වෙන්න විතරයි. රෑ වෙච්ච හින්දා මගේ ළමයින්ට ඉන්න හොඳ තැනක් සොයා ගන්න බැරිවුණා' ඔහු ආයාචනාත්මක ලෙසින් කීවේය.

'එහෙනම් ඕගොල්ලො හෙට යනවද?' අනුකම්පා විරහිතව සිත්තප්පා ඇසුවේය. 'මේක පුංචි ගෙයක්, මං හිතන්නෙ නෑ අපි ඔක්කොටම මෙහෙ සැපපහසුවට ඉන්න පුළුවන් කියලා'

අම්මච්චි කෝපයෙන් කොඳුරන්නට වූවාය, එහෙත් හංසිගේ අම්මා එක් බැල්මකින් ඇය නිහඬ කරවූවාය. සිත්තප්පාගේ බිරිඳ කුඩුකේඩු බැල්මක්ද ඇතිව දූන් දොර අසලට පැමිණියාය. හංසිගේ අම්මා ඇය දෙස බලා සිනාසුණද, එය නොසලකා හැර 'ඕ කලා, ඔයාගේ අම්මවත් මෙහෙ එක්කරන් ආවද? ඔයාට එයාව ඔයාගෙ සහෝදරයා ළඟ දාලා එන්න බැරිවුණාද? අපිට මෙහෙ තියෙන්නෙ එක කුස්සියයි. ඕගොල්ලො ඔක්කොටම ඒකෙ කෑම උයන්නෙ කොහොමද? මගෙ සහොදරයගෙ පවුලෙ අයත් මෙහෙ ඉන්නවා. කාමර ඉතිරි වෙලා නෑ' යි කීවාය.

'අපිට කාමරයක් ඕන නෑ. අපිට ශාලාවේ ඉන්න පුළුවන්, අපිට වෙන තැනක් සොයාගන්න පුළුවන් වුණාම යනවා' හංසිගේ අම්මා පසුබාමින් කීවාය.

ඔවුන් සමග එහි ජීවත් වන අනෙක් පවුලද පැමිණ ඔවුන් දෙස වචනයකුදු නොදොඩා බලා සිටියහ.

'හොඳයි. වෙන තැනක් හොයා ගන්නකල් ඕගොල්ලන්ට මෙහෙ ඉන්න පුළුවන්'

*

කාලය ගෙවී ගියද, ඔවුන්ට වාසයට අන් තැනක් සොයා ගත නොහැකි විය. ගබඩා කාමරය ලෙස භාවිතා කෙරෙන පිටුපස වූ කාමරයක් ඔවුන්ට දෙනු ලැබිණි. හංසිගේ සිත්ති පූරණී ඇගේ දරුවන්ට හංසි හා අකිල් සමග සෙල්ලම් කරන්නට ඉඩ දුන්නේ නැත. ඇගේ දරුවන් ඔවුන් සමග කතා කරනු හෝ දුටුවේ නම්, ඇය ඔවුන්ට පහර දුන්නාය, නැත්නම් ඇය ඔවුන්ව කාමරයකට දමා වැසුවාය. ඥාති සහෝදරයින් හංසි හා අකිල් සමග සෙල්ලම් කිරීමට කැමති වූ නමුදු පසුව ඔවුහු සෙල්ලම් කරන්නට ඔවුන්ව කැඳවා ගැනීමට බිය වූහ.

හැම උදෑසනකම ඔවුන්ගේ අප්පා නිවසක් සෙවීම සඳහා පිටව ගිය අතර එය අසාර්ථකව ආපසු පැමිණියේය. වෙනත් ගෙයකට මාරු වන්නැයි හංසි හා අකිල් හැමවිමට අම්මාගෙන් ඉල්ලා සිටියහ. හංසි නිරන්තරයෙන් අරුන් ගැන සිතූ අතර ඔහු හොඳින් සිටින්නේ යැයි දැන ගැනීමට ප්‍රාර්ථනා කළාය, ඇගේ ජීවිතයේ මේ දුෂ්කර අවස්ථාවෙහි ඇගේ මිතුරා සිටින්නේ නම් මැනවයි ඇය මහත් ආශාවෙන් බලාපොරොත්තු වූවාය. ගුවන්විදුලියෙන් යුද්ධය ගැන වාර්තා අසන විට ඔහු ජීවත්ව සිටින්නේද නැද්දැයි ඇය සිතුවාය. අරුන් බේරා දෙන්නැයි ඇය දෙවියන්ට යාඥා කළාය.

ඇගේ සිත්ති පුරණී සිය දරුවන්ට හා ඇගේ සොහොයුරාගේ පවුලේ අයට රස ආහාර ලබා දුන් නමුත් ඇය හංසිට හෝ අකිල්ට කිසිවිටෙකත් කිසිවක් දුන්නේ නැත. හංසිගේ සිත්ති ආහාර පාන අඩුවීම හා මිලගණන් ඉහළ යාම පිළිබඳ කෑගහන්නට පටන් ගත්තාය. ආහාර හිඟකම හේතුවෙන් සමහර විටෙකදී හංසිගේ පියා හිස්බඩ නිදාගත්තේය. කිසිවෙක් හංසිගේ අම්මච්චිට ගරු කළේ නැත. ඇගේ වයෝවෘද්ධකම නිසා ඇය අපහසුවෙන් ඇවිදින විට, අනෙක් පවුල් දෙකේ අය ඇයට සිනාසුණහ, ඇගේ ඇවිදීමේ අමාරුව ගැන හා නිතර කෙඳිරිගෑම පිළිබඳ ඔවුහු හඬනගා කතා කළහ.

එක්දිනක්, හංසිගේ දෙමාපියෝ ඥාති නිවෙසකට ගියේ එහි නැවතීමේ හැකියාවක් ඇද්දැයි සොයාබැලීමටය. වැහි සමය ඇරඹී තිබිණි, එබැවින් ඔවුන්ගේ පැමිණීම ප්‍රමාද විය. හංසි සහ ඇයගේ කුඩා සහෝදරයා

හඬන්නට වූහ, ඈතින් ඇසුණු ෂෙල් වෙඩි හා බෝම්බ හඬ නිසා ඔවුන්ගේ බිය වැඩි විය. අම්මච්චි ඔවුන් නලවා ගැනීමට උත්සාහ කළාය. හංසිගේ සිත්ති පුරණි ඔවුන්ගේ කාමරයට පැමිණ, ශබ්දය නිසා ඇගේ දරුවන්ගේ නින්දට බාධා වන බව කියමින් දොස් තැබුවාය. 'උන් ළමයිද, වෘකයොද?' ඇය කෑගෑවාය. 'ඇයි උන් කෑමොර ගහන්නෙ?'

කිසිදු ප්‍රතිචාරයක් නොදක්වූ අම්මච්චි හංසිට හා ඇගේ සොහොයුරාට කවා ඔවුන් නින්දට දැමුවාය. අකිල් නින්දට යැවීමට ඇයට හැකි වුවද, හංසි අම්මා සිහිකර හඬන්නට වූවාය.

ඇගේ සිත්තප්පා අශාම් තට්ටු නොකොට කාමරයට කඩා වැදුණේය. 'ඇයි උඹ ඔච්චර හයියෙන් අඬන්නෙ? කවුරුහරි මළාද?' ඔහු කෑගෑවේය. 'මේක උඹලගෙ තැනක් නෙවෙයි ඔච්චර සද්ද කරන්න. මේවද උඹලගෙ දෙමාපියො උගන්නලා තියෙන සිරිත් විරිත්? ආයෙ සැරයක් උඹේ සද්දෙ ඇහුණොත්, මං මොකක් කරාවිද කියල මම ම දන්නෙ නෑ'

හංසි ඔහුගේ කෝපය දැක බියට පත් වූ අතර, තවත් හඬ නගමින් විලාප දෙන්නට වූවාය. ඇයගේ සිත්තප්පා ඇයගේ උරහිස් අල්ලාගෙන සෙලවූයේය. එයින් ද ඇය නිශ්ශබ්ද නොවූ විට, ඔහු වටපිට බලා සමීපයේ තිබූ පොතක් ගෙන, ඇගේ පසුපසට එයින් ගහන්නට පටන් ගත්තේය. 'ළමයට ඉන්න අරින්නැ' යි අම්මච්චි කෑගසා ඔහුගෙන් පොත උදුරා ගත්තාය. තමා කළ දෙය ගැන මොහොතකට තැතිගැන්මෙන් බැලූ ඇගේ සිත්තප්පා, ආපසු හැරී, වහා කාමරයෙන් පිටව ගියේය.

අම්මච්චි හිස පිරිමදිමින් සිටියද, නින්දට වැටෙන්නට පෙර පැය ගණනාවක් හංසි ඉකිබිඳ හැඬුවාය.

ඇගේ දෙමාපියෝ ප්‍රමාද වී පැමිණියහ. සිදුවූ දෙය අම්මච්චි ඔවුන්ට කී කල්හි, තම දරුවන්ට අත්වී ඇති දුක්ඛිත ඉරණම පිළිබඳව සිතමින් හංසිගේ මව හැඬුවාය. 'මං කවදාවත් මගේ ළමයින්ට ගහලා නෑ. ඒත් දැන් අර අහංකාර මිනිහගෙන් ළමයි ගුටි කාලා. දුප්පත් හංසි! එයා එළියට ගියොත් බෝම්බ සද්දෙට බයයි. ගේ ඇතුලෙත් දැන් ඇය ඇගේ සිත්තප්පාට බයයි. මං ඉඩ තියන්නෙ නෑ මගේ ළමයි තවදුරටත් මෙහෙ ඉන්න අරින්න'

හංසිගේ අප්පා ඇය තමා සමීපයට කොටගෙන ඇගේ හිස තම පපුවේ තබාගෙන ඇය අස්වැසුවේය. ඇගේ දෙමාපියන්ගේ හඬ ඇසී, හංසි පිබිදී කතා නොමැතිව ඔවුන් දෙස දෑස් දල්වාගෙන බලා සිටියාය. 'හෙට අපි මෙහෙන් යනවා රාණි නැන්දලගෙ ගෙදරට. දූන් නිදාගන්න. මං කාටවත් ඉඩදෙන්නෙ නෑ ආයෙ කවදාවත් මගේ ළමයෙකුට ගහන්න'

ඊළඟ උදෑසන, හංසිගේ පවුල නික්ම ගියහ.

සිත්තප්පාට හෝ අන් අයට කිසිදු අමනාපයක් නොපෙන්වීමට තීරණය කළ ඔවුහු ඔවුන්ගේ ආගන්තුක සත්කාරය පිළිබඳව කෘතඥතාව පළ කළහ. ඔවුන්ගේ සමුගැන්ම මිතුරු ලීලාවෙන් සිදුවූ අතර, අවශ්‍යම වූ අවස්ථාවක ඔවුන්ට වැටී සිටින්නට තැනක් දීම ගැන අම්මා සහ අප්පා සිත්තප්පාට සහ ඔහුගේ බිරිඳට ස්තුති කළහ. ඔහුට හෝ ඔහුගේ පවුලේ කිසිවෙකු ළඟට යාමට බියවූ හංසි ඈතින් සිටියාය. පෙරදින රාත්‍රියේ සිදුවූ දෙය නොදන, ඇගේ සොහොයුරා ඔහුව සිපගෙන සමුගත්තේය. සිත්තප්පා අකිල්ගෙ හිසට තට්ටු කළේය, වරදකාරී හැඟීමෙන් ඔහුගේ මුහුණ වෙළී තිබිණි.

ඔවුන්ට වාහනයක් කුලියට ගැනීමට නොහැකි වූ අතර, එතරම් ඈතක නොවූ රාණි නැන්දාගේ නිවසට ඇවිද යාමට ඔවුන්ට සිදුවිය. කෙසේවුවද ඒ අවස්ථාවේ වැසි වැටෙන්නට වූයේය, අම්මච්චිට වර්ෂාවෙහි සහ මඩෙහි ඇවිද යාම දුෂ්කර බව පෙනිණි. ඇයගේ පියා බර ගමන්මළු බයිසිකලයේ තබාගෙන සිටියේය, පියාගේ කමිසය පසුපසින් අල්ලාගෙන හංසි ඔහු පසෙකින් සෙමින් ගමන් කළාය. ඇගේ සහෝදරයා කුඩය යටින් අම්මාගේ අතෙහි ගමන් කළේය. පැයකින් ඔවුහු ඔවුන්ගේ නව නිවසට ළඟා වූහ. එය අයත් වූයේ ඔවුන්ගේ අම්මාගේ ඥාති සොහොයුරිය රාණි නැන්දාටය. නිවසෙහි ප්‍රධාන බිත්ති පමණක් සාදා තිබුණි. නිවසෙහි ඇතුළත, කාමරවලට වෙන්කර තිබුණේ නැත. කාමර බෙදීමට කාඩ් බෝඩ් භාවිතා කර තිබුණේය. ඇයගේ දෙමාපියන් මීට පළමුව මෙහි නැවතීමට ඔවුන්ව කැඳවාගෙන නොපැමිණීමට හේතුව මෙය විය. ඔවුන් නිවස ඇතුළත දුටුවිට, හංසි සහ ඇගේ සොයුරා හැඬුහ. 'අම්මා, අපි කොහොමද මෙතන ඉන්නෙ? අපිට කිසිදෙයක් නිදහසේ කරන්න බෑ. මං කොහොමද මගේ ඇඳුම් මාරු කරගන්නෙ?'

අම්මා ඇයව නිශ්ශබ්ද කරවූවාය. 'නිශ්ශබ්ද වෙන්න හංසි, ඔයා මේ නොහික්මුණුකම ඉගෙන ගත්තෙ ඔයාගෙ ඉස්කෝලෙන්ද? අපිට උදව් ඕන වෙලාවේ උදව් කරපු මිනිසුන්ට කෘතඥ වෙන්න.' හංසි ඇගේ නොහික්මුණු කම ගැන සමාව ඉල්ලූ අතර රාණි නැන්දා එයට කම් නැතැයි කියමින් හිස සෙලවූවාය. හංසිගේ හිසට තට්ටු කරමින් 'ඔයා ළමයට බණින්නෙ ඇයි කලා?' යි ඇසුවාය.

ඇගේ මවගේ ඥාති සහෝදරිය හා ඇගේ ස්වාමිපුරුෂයා මුළු හදවතින්ම ඔවුන් පිළිගත්හ. රාණි නැන්දා නිතරම අකිල් සියතෙහි තබාගෙන සිටි අතර ඔහු කරකැවුවාය. ඇය ඔවුන්ට බොහෝ කතා සහ විසුළු කතාද කීවාය. අවසානයේදී ඔවුන්ට පහසුවක් දැනෙන තැනක සිටීමෙන් පවුලේ උදවිය සහනයක් ලැබූහ.

එහෙත් කාලයක් ගත වන විට උණුසුම් පිළිගැනීම බිඳ වැටෙන්නට විය. ඇගේ නැන්දාගේ සැමියා බීමත් වන්නට පටන් ගත්තේය. දවල් කාලයේදී ඔහු නිහඬ, සාමාන්‍ය පුද්ගලයෙකු වූයේය. එහෙත් රාත්‍රියේ රා පොළට ගොස් පැමිණීමෙන් පසුව ඔහු ආණ්ඩුව විවේචනය කරන්නටත්, නිදහස ඉල්ලන සටන් කරුවන්ට සහයෝයෙන් මහ හඬින් කතා කරන්නටත් වූයේය. ඔහු නිතරම ප්‍රමාද වී නිවසට පැමිණියේය, එසේ පැමිණ දොරට තදින් ගසයි. ඔහු අශ්ශීල අන්දමින් කතා කළේය. ඔහු හංසිට සහ අකිල්ට, නිවසට කරදර කිරීම සහ ප්‍රමාණයට වැඩියෙන් කමින් මුදල් නාස්ති කරන බව කියමින් සාප කළේය. ඔහු හංසිගේ අම්මාට හා අම්මච්චිට පරුෂ වචන කීමටද පටන් ගත්තේය. අවසානයේදී එක් රාත්‍රියක අම්මච්චිගේ කෝපය ඇවිස්සී ඇය කෑගසන්නට වූවාය. 'උඹට පිස්සුද? කාරණයක් නැතුව කෑගහන්නෙ ඇයි?'

'රාණි ඇයි ඔයා නිශ්ශබ්දව ඉන්නෙ?' හංසිගේ මව, රාණි නැන්දාට ආයාචනා කළාය. 'මිනිහව නිශ්ශබ්ද කරවන්න. බලන්න, මගේ ළමයි එයාට බයයි.'

'මේ අපේ ගෙදර' රාණි නැන්දා එකටෙක කීවාය. 'එයාගෙම තැන ඉන්න කොට එයාට අයිතිය තියෙනවා එයා කැමති විදියකට හැසිරෙන්න. ඔයාගෙ ළමයි බය නම්, වෙන තැනක් හොයාගන්න එක හොඳයි'

එම අවස්ථාවෙහි ඇගේ මාමා හංසිගේ මවට කම්මුලට ගසන්නට උත්සාහ කළේය. මෙතෙක් නිහඬව සිටි ඇගේ අප්පා, මාමගේ අතින් ඇද, පිටුපසට කරකවා ඔහුව තල්ලු කර දැමුවේය.

ඒ සිදුවීමෙන් පසු ඥාතීන්ගේ කමකට නැති කම හංසිගේ දෙමාපියෝ වටහා ගත්හ. 'ලෙය, වතුරට වඩා ඝන නැතැයි කියමින් ඔවුහු සිනාසුණහ. අම්මච්චි හඬ නගා වයිරාවර් දෙවියන්ට යාඥා කරමින් තමාට නැවත තමාගේ නිවසට යන්නට සහාය දෙන්නැයි ඉල්ලා සිටිමින් යාඥා කළාය. අම්මාද තමන්ට අත්වූ ඉරණම ගැන හඬා වැලපුණේ 'අපි කොච්චර ප්‍රවේසමෙන්ද අපේ ළමයි හැදුවෙ, ඒත් ඒ එකක්වත් පලක් නෑ. ඒ ගොල්ලො කවදාවත් නොදැකිය යුතුය, නෑසිය යුතුය කියලා මං හිතපු දේවල් ඒගොල්ලො අහනවා දකිනවා. මේවා කොයි විදියට ඒගොල්ලන්ට බලපායිද කියලා මං දන්නෙ නෑ.' ඉන්නට වෙනත් තැනක් සොයා ගන්නැයි ඇය හංසිගේ පියාට යැද්දාය. 'ඔයාට ගෙයක් සොයාගන්න බැරිනම්, අනික් අසල්වැසියන්ගෙන් ගන්න පුළුවන් දේවල් ඉල්ලගෙන පුංචි පැළක් හදාගෙන අපි සාමයෙන් ඉඳිමු'

අවසානයේදී හංසිගේ පියා ඔවුන්ට වෙනත් තැනක් සොයා ගත්තේය. ඔහු තමා හා එක්ව සේවය කළ කමලන් වෙත ගියේය. ඇගේ පියා ඔවුන්ට මුහුණ දීමට සිදුවූ සියලු දේ පැකිලීමකින් තොරව ඔහුට විස්තර කළ අතර, කමලන් ඔහුගේ නිවසට පැමිණෙන ලෙස ඔවුන්ට ආරාධනා කළේය. ඔහුගේ පවුලේ සාමාජිකයින් බොහෝ කාරුණික වූ අතර ඔවුන්ව උණුසුම් ලෙසින් පිළිගත්හ. කමලන්ගේ බිරිඳට දරුවන් නොසිටි අතර ඇය හංසි හා ඇයගේ සහෝදරයාට බෙහෙවින් ආදරය කළාය.

ඔවුන් සිය නිවසෙන් පිටව පැමිණ දෙසතියකට පසුව රජය ඇඳිරි නීතිය ඉවත් කළේය, හංසිගේ දෙමාපියන්ගේ තෙන්මරච්චිවල කාර්යාලයෙහිද රාජකාරී නැවත ආරම්භ විය. යහපත් ස්ථානයක සිය පවුලේ උදවිය දමා යන්නේය යන විශ්වාසය ඇතිව ඔවුහු නැවත සේවයට ගියහ. හංසි නිරතුරුව අරුන් පිළිබඳ සිහින මැව්වාය, දහවල් කාලයේදී, ඇය නිතර ඔවුන් එක්ව සෙල්ලම් කළ ආකාරය ගැන සිතුවාය. ඔහු සමග දහවල කෑම බෙදා හදාගත් ආකාරයත් විහිළු කතාවලට සිනාසුණ ආකාරයත් ඇයට සිහිවිය. යුද්ධය අවසන් වූ විට අරුන් දකින්නට තමාට ඉඩ ලැබෙනු ඇතැයි ඇය තවමත් සිතුවාය.

මාස හයක් ගෙවී ගියේය. රජය හා සටන්කාමීහු අවි බිම තැබීමට එකඟ වූහ. මිනිස්සු තමන්ගේ නිවෙස්වලට පැමිණීමට පටන් ගත්හ. හංසිගේ පවුලද උඩුවිල් බලා යාමට සූදානම් වූහ. කමලන්ගේ පවුලේ උදවිය ඔවුන්ට සමු දුන්නේ, හොඳ ළමයින් වීම ගැන හංසි සහ ඇගේ සහෝදරයා අගය කරමින් හා නැවත පැමිණෙන්නැයි ඔවුන්ට ආරාධනා කරමිනි.

ඔවුන් උඩුවිල් බලා ගමන් කරද්දී හංසි සිය දෙමාපියන් දෙස බැලූ අතර ඇයට ඔවුන් ගැන ආදරයක් සහ කෘතඥතාපූර්වක හැඟීමක් ඇති විය. ඔවුන්ගේ පවුල බලා කියා ගැනීමට හා ආරක්ෂා කරගැනීමට ඔවුන් අරගල කළ අකාරයත්, අවසානයේ හංසිට සහ අකිල්ට ආරක්ෂිත නිවසක් සොයාගත් අකාරයත් ඇයට සිහිවිය. ඔවුහු ඇයට ආදරය කළහ. හංසි ඇගේ දෙමාපියන් මැද ඉඳගෙන සිටියෙන්, වරින් වර ඇගේ දෙමාපියන් සිපගත්තාය. ඔවුහු පෙරළා ඇය වැළඳ ගත්හ.

ඔවුන් සිය නිවස පැමිණි අවස්ථාවේදී, ඔවුන් දුටුවේ, වාසනාවකට මෙන් ෂෙල්වෙඩි හා බෝම්බ වලින් බලපෑමක් ඇති නොවී තිබුණු සිය නිවසයි. මවක දරුවකු සුරතල් කරන්නාක් මෙන්, අම්මච්චි මුදු ලෙස සියලුම බිත්ති අල්ලා බැලුවාය. පුටු, මේස සහ මල් සැරසිලි යන සියල්ල බොහෝ සෙයින් දූවිලි වැදී තිබිණි, කිසිවෙක් 'Tigers', Thamileelathaayakam' සහ 'Thamileelam' වැනි දෙමළ සහ ඉංග්‍රිසි වචන හුණුකූරුවලින් පිටත බිත්තිවල ලියා තිබුණි. ගෙවත්තෙහි තිබුණු තණකොළ, ගස් තරමට උසට වැවී තිබුණේය. වැරැන්ඩයේ පරාලවල කුරුළු කූඩු සාදා තිබුණේය.

හංසිගේ දෙමාපියෝ ඊළඟ දිනයේ සේවය සඳහා ගියහ. හංසිද දැන් අවි බිම තබා ඇති නිසා අරුන් හමුවන්නට හැකිවනු ඇතැයි මහත් බලාපොරොත්තු ඇතිව පාසල් ගියාය. එහෙත් ඔහු පාසලේ සිටියේ නැත. ඇය අනෙක් මිතුරන්ගෙන් ඔහු පිළිබඳව විමසූ නමුත් කිසිවෙක් ඔහු කොහිදැයි දැන සිටියේ නැත. පාසල් වේලාවෙන් පසුව, හංසි අරුන්ගේ නිවසට ගියේ එහි ඔහු සිටින්නේදැයි බැලීමටය. නිවස බෝම්බ සහ ෂෙල් වෙඩිවලින් විනාශ කොට තිබිණි. කොළනිය පාළුවට ගොස් තිබුණු අතර ඔහු පිළිබඳ අසන්නට ඇයට කිසිවකු සොයාගත නොහැකි විය.

ඇය වටා පෙනෙන්නට ඇති විනාශය දෙස බැලූ විට හංසිගේ සිත අඳුරෙන් පිරී ගියේය. 'අරුන් සහ මට, අප වින්දා වූ සොම්නස කවදා හෝ නැවත විඳීමට හැකි වනු ඇති ද?' ඇය සිතුවාය. ප්‍රශ්නයට පිළිතුරු නැත.

***විදූජා රාජමෝහන්*** *ඉපදී හැදී වැඩුණේ යාපනයෙහිය. ඇය උඩුවිල් කාන්තා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවකි. ඇය දැනට යාපනය සරසවියේ ඉංග්‍රීසි සාහිත්‍ය හදාරන උපාධි අපේක්ෂිකාවකි. ඇගේ නිර්මාණ ශක්තිය පාසලේදී හැඩ ගැසිණි, එමෙන්ම ඇගේ දෙමාපියෝද ඇගේ නිර්මාණ ශක්තිය හැඩගැස්වීමට දායක වූහ. ඇගේ කතාව සහ චරිත ඇගේ පරිසරයෙන් උකහා ගත් ඒවාය.*

# කාව්‍යය

## *එලිසබෙත් අල්පොන්සස්*

### සත්‍යයේ ලේඛකයා

ශෝකය හා කම්පනය ගැන
මම ලීවෙමි කතාවක්
අන්තර් ඥානයෙන් සන්නද්ධව
අවසාන භාවාත්මක බෝම්බය
ප්‍රකාශනය සඳහා
නිකළැල් ලාලසාව
ජාත්‍යන්තර ගෞරවය ලැබුමට

එහෙත් මේ 2009 මැයි මාසය
සියලු භාවයන් හිස්ව ගොසිනි
සිහින් කළු හිස් මුහුණු සැරිසරයි
අනුකම්පා නැති තිගැස්මට බියව
නිහඬතාව කතා කරන්නේ
කිව නොහැකිව බිහිසුණුකම් ගැන

යුක්තියෙහි න්‍යායක් නැත
සංකීර්ණ විග්‍රහයක් නැත
මිනිසුන් වැතිර සිටිති
නොනැවතී ලේ ගලයි
ඉටිකොළ ඇතිරිලි මත

තුන්ලක්ෂ පනස්දාහක්
කතා මත්තෙහි පරාජයේ
මම මගේ ජය පෙරහැරෙහි
සිහිනය සදන්නෙමි

පසිඳු බව පිළිණ දෙන
මේ කවි පද
ගිලිහෙයි මගේ දිවෙන්

නොලියවුණු කොළයක පොතක
සත්‍යය නම් වූ දෙයක් ඇත
භාෂාවෙන් ඔබ්බට
ඒවා නොමළ මිනිසුන්ගේ
මතකයෙහි සැරිසරයි

මගේ සිත හිරිවැටී
වටහාගත නොහැකිය මට
හෙමින් හෙමින් හැඟුම්
එයි මා වෙත නැවත
ෂෙල් වෙඩි පුපුරා එන ගිනිදැල් සේ
සත්‍යය
එය මා වෙත නැවත පැමිණ
මගේ ලියන අත දවාලයි

මම ඇස් රැක ගනිමි
ගිනි කණ වැටෙන දීප්තියෙන්

## නම් ගම් නැති කතුන්

දුම්රිය නැවතුමේ
කතක් තනිවම
ඇගේ සෙබළ පුතු එනතුරු
බලා සිටී
ඒ දුම්රිය කිසිදා නොඒ

දුම්රිය පාරෙහි
කතක් තනිවම
දුම්රිය එනතුරු
බලා සිටී
ඇගේ හුදකලා දිවියෙහි
නිමක් දකින්නට

කොළඹ තුනේ
ඩුප්ලිකේෂන් පාරේ
කතක් බලා සිටී
ඇය හප කොට
පාර අයිනට වීසිකර යන්නට
බෙන්ස් රථයක් එනතුරු

කතක් සුන්බුන් මතින්
ඉවතට ඇවිද යයි
දූන් ෂෙල් වෙඩි වැද
සුණු විසුණු වූ
ඇගේ ළමා කල නිවස හැර
යන්නට තැනක් නිනව්වක් නොමැතිව

රටෙහි මහමෙර වූ ලියෝ
මේ ලෙයින් තෙමුණු බිමේ
හුදකලා තැනැත්තියෝ වෙත්

***එලිසබෙත් අල්පොන්සස්*** *උතුරෙහිත්, දකුණු සිරි ලකෙහිත්, විදේශයන්හිත් වාසය කළ නමුත් ඇය කොතැනකට හෝ අයත් නැති බව සිතයි. ඇගේ කවිවලින් ඇය ශ්‍රී ලංකා සමාජය තුළ ඇති ප්‍රතිවිරෝධතා සෙවීමට සහ තේරුම් ගැනීමට දුෂ්කර යථාර්ථයන් හා අනන්‍යතා මෙන්ම ඒවා අතර ඇති සම්බන්ධතා ගවේෂණයට උත්සාහ දරයි.*

# ස්තූතිය


| | | |
|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ | : | ශ්‍යාම් සෙල්වදොරේ |
| ව්‍යාපෘති සම්බන්ධීකාරක | : | අම්රිතා පීරිස් |
| ව්‍යාපෘති සහායක | : | ශිරෝමි පීරිස් |
| වැඩමුළු සමපහසුකම් සලස්තින්නිය | : | නයෝමි මුණවීර |
| යාපනය සම්බන්ධීකරණ නිලධාරි | : | රියොෆිලා ඇල්ප්‍රඩ් |
| සංස්කාරක | : | ශිවී ජයසිංහ |
| සැලසුම් සහ සංහිතා වින්‍යාස | : | මයිකා තෙන්නකෝන් |
| වෙබ් සැලසුම් හා කළමනාකරණය | : | Shift Solutions |
| ඉංග්‍රීසි පිටපත මුද්‍රණය | : | තරංජි මුද්‍රණාලය |

ඔවුන්ගේ සහාය සහ ව්‍යාපෘතිය කෙරෙහි විශ්වාසය තැබීම සම්බන්ධයෙන් රාජකීය නෝර්වේජියානු තානාපති කාර්යාලයේ ඩැග්නි මෙජොස් සහ මල්රාජි වන්නිආරච්චිටද, ඇමරිකානු මධ්‍යස්ථානයේ ක්‍රිස් ටීල් සහ සමන්ති ද කොස්තාටද අපගේ ස්තූතිය පල කිරීමට කැමැත්තෙමු. අපගේ ව්‍යාපෘතියට නිවස්නක් සපයා දුන් ජාතික සාම මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ ජෙහාන් පෙරේරා හා ඔහුගේ කාර්ය මණ්ඩලයේ සුමංගලී අටුලුගම, ඩබ්.කේ. රූපිකා චාන්දනී සහ රසිකා සෙනෙවිරත්නටද අපගේ ස්තූතිය පිරිනමමු. අපගේ සංස්කෘතික චාරිකා සාර්ථක කරගැනීමට උදව් උපකාර කළ අංජලේන්ද්‍රන්, ජගත් වීරසිංහ, ඩේවිඩ් රොබ්සන්, ජෙෆ්රි බාවා අරමුදලෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය, සපුමල් පදනමෙහි රොහාන් ද සොයිසා සහ කාර්ය මණ්ඩලය, අම්ර්තාංජලී සිවපාලන් සහ අයතුරෙයි ශාන්තන්. යාපනය වැඩමුළුවේදී ඔහුගේ ඉදිරිපත් කිරීම කළ ටී. ශානාදනන්ට අපගේ අප්‍රමාණ ස්තූතිය පිරිනැමෙයි. එමෙන්ම ව්‍යාපෘති යෝජනාව සකස් කිරීමේදී උදව් කළ ස්ටීව් ක්‍රීච්ට සහ ශාවිල්කා සමරසිංහගේ මග පෙන්වීමට සහ දිරිදීම වෙනුවෙන් ඇයටද, ඉංග්‍රීසි බසින් මුද්‍රිත කෘතිය නිම කිරිමේදි සහාය දුන් මදාරා රන්මුතුගලටද ස්තූතිය පළකරමු.